
For E-Pusthakalaya
UPUL SHANTHA SANNASGALA
තේජා

For E-Pusthakalaya

# 1

'මං කියන හැම දෙයක්ම විශ්වාස කරන්න – නේත්‍රා. මං මහ පොළොව වගේ ඔයාගේ දුක දරා ගන්නම්. ඔයා දන්නවද? ඔය ඇස් දෙකෙන් ඉහිරෙන්නෙ මල් සුවඳ. ඔහොම බලද්දි මට දැනෙන්නේ තාරකා රංචුවක් තිලි වැස්සට පෙහිලා මගේ ආත්මය ඇතුළෙ සැරිසරනවා වාගේ. ඔයා අහිංසකයි. සඳ වගේ අහිංසකයි. ඉස්කෝලේ යන කාලේ මට ඔයාව ලැබුණා නම් ...? ඒත් මං පිං කරලා නෑ. එහෙම වුණානම් මං කොළඹ අතෑරලා නුවරට එනවා. ඔයාලගේ ගෙවල් ළඟ තියෙන ඔලිඳ ඇළට පැනලා ඔය සඳ මූණට පැන් ඉහිනවා. දෙණියේ අන්දර දෙවටෙදි නැවතිලා සුදු ගවුමෙ තුත්තිරි ගලවනවා. ඔය සෝඩි ටිකිරි පාවල බොරළු ඇනෙන්න නොදී මගේ ඇඟට වාරු කර ගන්නවා. ආදරේ හැටි එහෙම තමයි ... ඇයි මං විශ්වාස කරන්නෙ නැත්තේ? මගේ පපුව විවර කරන්න පුළුවන් නම්; මං ඔයාට පෙන්නනවා. ඔයා හිත්ද මගේ පපුව ආදරෙන් පිරිලා තියෙන හැටි. එහෙනම් මං දන්නවා, ඔයා මාව සිප ගන්නවා දහස් වතාවක් ... ඇයි මට පිස්සෙක් වගේ කියවන්න දීලා බිම බලාගෙන ඉන්නෙ ... කියන්න ... එක වතාවක් කියන්න. මං ඔයාට ආදරෙයි විශ්ව කියලා ...

ඔහු එක දිගට ම කියා ගෙන යයි.

'බැහැ'

මම තරයේ කීවෙමි. මම බෙහෙවින් බිය වීමි. තිගැස්සුණෙමි. ජීවිතයට බලාපොරොත්තු දෙන්නේ කොහොම ද? මම හඬා ඇත්තෙමි. සුන්දර ප්‍රේමාතුර මගේ ජීවිතය බොහෝ දේ ඉල්ලද්දී මම කම්පා වීමි. සිතුවිලි සිතට රිංගා ගන්නට පොර බදද්දී මම වඩාත් බිය වීමි.

For E-Pustakalaya

ආත්ම අතහැරීමක් ... බිලිහි ගිය කල ... දෙදෙනා එක් එකතු කළ හැකි ද?

'මගේ හිතේ ආදරය නැතිව නෙමෙයි විශ්ව. මගේ හිත දන්නවා ආදරය සුන්දරයි කියලා. ඒත් සුන්දරත්වය කියලා ගිහි ගොඩක් බඳු ගන්න මට බැහැ. සමාවෙන්න. මට මගේ පාඩුවේ ඉන්න දෙන්න. ඔයා කතා කරද්දී ලස්සන පෙම් කවියක් වගේ තමයි. ඒත් මට බැ ඒකට හවුල් වෙන්න.'

වඩාත් රළු ලෙස විශ්ව ප්‍රතික්ෂේප කිරීමට මට අවැසි වී ය. මම මගේ සිත පාලනය කොට ගත්තෙමි. නන්නාඳුනන තැනක, පිරිමියෙකු සැණෙකින් ප්‍රතික්ෂේප කරන්නේ කොහොම ද? ඇරත් විශ්ව ....

මා අද දින කළේ කො තරම් නොදැමුණු ක්‍රියාවක් ද? විශ්ව සමඟ නන්නාඳුනන කාමරයක තනිවෙන්නට ... මම මගේ ම ආත්මය සමඟ විපිළිසර වීමි. එහෙත් මට මගේ ජීවිතය පිළිබඳ කලකිරීමක් නැත. ජීවිතයට මුහුණ දීම පිළිබඳව මා තුළ බලාපොරොත්තුවක් ඇත. මම එකී බලාපොරොත්තුව ජීවත් කරවමි. අද සවස ද මගේ නෙතින් කඳුළු කැට කීපයක් ගලා ගිය බව සැබෑවි. එහෙත් මට සැම දා හඬන්නට නොහැකි ය.

'විශ්ව මට යන්න දෙන්න. ඔයාට මට වඩා හොඳ කෙල්ලක් ලැබෙයි. ඔයා බිරිඳ කර ගන්න ඉන්න ගැණු ළමයත් එක්ක සතුටු වෙන්න. ඔයාට ඕන දේවල් එයාගෙන් ඉල්ල ගන්න. හුහුරු දේකට මාව පොළඹවන්න හදන්න එපා... පව්. කවමදාකවත් මට බැහැ ඔයාට එකඟ වෙන්න. මට හිතෙනව ඔයා ළඟ උණුසුමයි කියලා. මට බැහැ ඒක විඳින්න. මට විඳවන්න වෙයි. ඇයි මාව වහලියක් කරන්න හදන්නේ. ඔය කකුල් දෙක අල්ලල වැඳල කියන්නම්. මට කරදර කරන්න එපා. ඔයාගේ ජීවිතේ සෙල්ලක්කාරයි. ඒත්, මට මගේ ජීවිතේ සෙල්ලමක් නෙමෙයි.'

මම තව දුරටත් ඔහුට බැගෑපත් වීමි. වඩාත් සැර පරුෂ ලෙස විශ්වට කතා කිරීමේ සියුම් වෛරයක් වැනි හැඟීමක් තිබුණත් මම දෙවන වතාවටත් සිත පාලනය කොට ගත්තෙමි. කළ මෝඩකම් දුක් ඉකි අලි රැනකට වත් ආපසු වර්තමානයට ගෙන ඒමට නොහැකි



ය. විශ්ව සමඟ මේ ගමන පිටත් වූයේ කෙසේ හෝ ඔහුගෙන් මගේ ආත්මය නැවත නිදහස් කරන ලෙස ඉල්ලීමට යි. මාගේ ගණිකාවක මෙන් සිට මේ මහගිරිදඹ තරණය කළේ පල්ලමක් හමු වේ ය යන බලාපොරොත්තුව සිත් කොණක තෙරපී තිබූ නිසා වුවත්. දැන් හමු වී ඇත්තේ ප්‍රපාතයක්, අගාධයක් නොවේ ද?

'මම මේ ඔයාව රවට්ටන්න කවි භාෂාවෙන් කතා කරනවා නෙවෙයි. ඒත් ඔයාට ම තේරෙන්නේ නෑ, ඔය වයස කොච්චර සුන්දර ද කියලා. ඔයා හරියට නාපුරු ගීතයක් වගේ. ඇයි ඔය හැඟීම් ඔක්කොම කළු වලාවක් වගේ හංගාගෙන ඉන්නෙ. ආදරේට වැස්සක් වගේ ඇද හැලෙන්න ඉඩ දෙන්න. උදේට පිපුණෙ නැත්නම් රෑ පිනි වැටුණ ම මල් විකසිත වෙන්නේ නෑ.... තේරුනා. ඔයා ඔයාගේ හැඟීම් කටු කම්බි ගහලා කොටු කරලා. තනි වුණාම අඩයි. ඒත් දුක තුනී වෙන්නෙ නෑ. වෙඩරු වගේ උණුවෙලා යනවා. ඇයි මං ඔයාට ජීවිතේ දෙන්න හදද්දී බහුබූත කතා කරන්නේ.'

'මං කතා කළේ ඇත්ත.'

මම කීවෙමි.

'ඒත් ඒක මගේ පැත්තෙන් බොරුවක්.'

'මට බලපාන ඇත්තක්.'

'එක්කෙනෙකුට විතරක් බලපාන දෙයක් ජීවිතේ ඇත්ත නෙමෙයි.'

'ලෝකේ තර්කයට ම සීමා වෙන්නෙ නෑ විශ්ව. ඔය ගෝල්ලන්ගේ ජීවිතවලට බලපාන්නේ නැති කොච්චර දේවල් අපේ ජීවිතවලට බලපාල තියෙනවා ද?'

ඉන් එහාට විශ්ව කතා කළේ නැත. ඔහු මගේ උරහිසින් අල්ලා මගේ ශරීරය ම ඔහුගේ සමීපයට ගත්තේ ය. එය වඩා රළු ග්‍රහණයක් වීමෙන් මම බිය ගතිමි. සිහින් දහඩිය බිඳු කීපයක් නළලතට නැගුණත් මම මිණි සෙල් රුවක මෙන් නොසැළී සිටියෙමි. ඔහුට ඉඩ දීමට ද නොහැකි ය. ප්‍රතික්ෂේප කිරීමට ද නොහැකි ය. ජීවිතය ණය ගැති වූ තරම්?

විශ්ව මාගේ සිරුර පුරා ම හාදීම් විකසිත කිරීමට ඔහුගේ තියුණු හැඟීම් සංවේදනය කරන බව ඉම වටහා ගතිමි. මම වඩාත්

For E-Pustakalaya

[illegible] ඉල්ලා සිටිනවාවත් [illegible] වී. ඔහු මගේ ආත්මයේ සෑම අංශුවක් ම ඉල්ලා සිටිනවාවත් [illegible] මට ලය සැනැල්ලු කර ගැනීමට අවැසි වූයේ නැත. සුසුමින් [illegible] දිලක් [illegible] හැඟීම් කළෙමි. කඳුළින් කඳුළු හෙළා [illegible] තද කොට ගතිමි. මගේ නෙතින් ගලා ගිය කඳුළු ඔහුගේ [illegible] දුවවෙන්නට වී ය. කෙස් රොද අතර ඇඟිලි තුඩු එහෙ [illegible] කරවූ විශ්ව, මෘදු ලෙස මගේ මුහුණ සිප ගත්තේ [illegible] වේගයෙන් මගේ ළැම උස් පහත් වන්නට වී ය. එහෙත් මම [illegible] තැනූ තුළ නොකළෙමි. නිකටෙන් අල්ලා මගේ මුහුණ එසවීමට විශ්ව තැත් කළේ ය. අහිංසක ආශාවක් හද තුළ කෙරපෙමින් තිබුණත් මම ඉඩ නොදුන්නෙමි. සිහින් ඉකි ගැසීමට තිගැස්සෙන මගේ සිරුර ඔහු සිරි මැද්දේ වෙව්ලන අතැඟිලිවලිනි. විඩාපත්ව ලෙල්ලක් සේ [illegible] යන මගේ සිරුර සිර කොට අල්ලා ගැනීමට විශ්වට [illegible] වී ය. මම මොහොතක් ඉඩ දුනිමි. මොහොතක් ජීවිතය අත් [illegible]දෙයි.

[illegible] කැළඹීමකින් මගේ දෙකොපුල් රත් පැහැ ගැන්වෙන්නට [illegible] සිතැති උණුසුම් කළා මිස මොහොතකටවත් මට මිදෙන්නට [illegible] ඉඩ දුන්නේ නැත. මම ඉකි ගසමින් ඒ මේ අත බැලිමි. [illegible], ආශාව, සංසාරය හා වෛරය මුසු හැඟීමකින් විශ්ව තිගැස්සෙන්නට වී ය. මම හති දැමීමි. අඩවන් වූ දෙනෙතින් ඔහු මගේ නළලතේ සිට දෙපා දක්වා ක්ෂණික බැල්මක් හෙළුවේ ය. මගේ සියල් සිරුර ම බියකින් ද ආශාවකින් ද යුතුව තිගැස්සෙන්නට වී ය. ඇසිපිය හෙළීමට නොහැකි තරමට ම දෑස අඩවන් වී ය. හාදු වැස්සකට ඉඩදෙමින් මගේ මුහුණ ඇලයට හරවන්නට මට සිතේ. ඔහුටත් පෙර – මටත් හොරා – මගේ සිරුර යහනේ උඩුබැලිව පසපවා ලන්නට සිතේ. මම දෙනෙත විහිදුවා විශ්ව දෙසට නොතේරුම් බැල්මක් හෙළීමි.

'ඇයි මට ඉඩ දෙන්නැත්තෙ? මං ඔයාට කරදරයක් කරන්නෙ නෑ. මං කොච්චර ආශාවෙන්ද හිටියෙ?'

විශ්ව බැගෑපත් කලබලකාරී ස්වරයෙන් කීවේ ය.

'දැන් ඇති.'



ඔහුගේ දෑසින් කළ බරපතල ඉල්ලීම මට ඉවෙන් මෙන් වැටහිණ. මම දෑත පපුවට තද කොට ගතිමි. හැඟීම් බොහෝ සියුම් සංවේදනායන් දකවන විට මගේ දෙපා වාරු නැති බව තේරුම් ගත් මම බිත්තියට වාරු දුනිමි. මා පිළිවදන් දුන්නේ නැත. නළල් තලාවේ සිට මගේ ගෙල දක්වා හාදු වැස්සක් වැටෙමින් තිබිණ. විශ්වගේ දෙතොල් මගේ ගෙලෙහි මදකට නැවතිණ. හාදුවලින් මගේ ගෙල රත් පැහැ ගැන්වෙන්නට ඇත.

හැඟීම් පීමා පවුරු බිඳ ඉවතට යන්නට ඉඩ දිය යුතු නැත. මොහොතකින් මම වෙර යොද ඔහු පසෙකට තල්ලු කළෙමි. ග්‍රහණයෙන් මිදුණු මම විශ්ව දෙසට ප්‍රතාපවත් බැල්මක් හෙළීමි.

'තමුසෙ පිස්සෙක්'

මම දැඩි හඬින් කීවෙමි.

'ඔව් මට ඔයා හින්ද පිස්සු හැදිගෙන එනවා.'

'මං ගෙදර යන්නෙ නැද්ද?'

මම ගොත ගසමින්, කැළඹුණු හඬින් කීවෙමි.

'මං කරදරයක් කරන්නෙ නෑ.'

'කරපු කරදර ඇති. ආයෙත් අත තියන්න එපා මගේ ඇඟට.'

සැපු හා දැඩි ස්වරයකින් එසේ කියා, මම පැණෙකින් දොර ළඟට පැන ගතිමි. දොරගුලු හැරියෙමි. අතැඟිලි මායිමේ තිබූ අත් බෑගය පුරතට සිර කොට ගතිමි. මළ පුඩුවකට හසු වී ඉන් බේරුණු වන සතෙකු මෙන් අතුරු පාර දිගේ දිව ගෙන ආවෙමි. ආපසු හැරී බලන්නට මට වුවමනාවක් තිබුණේ නැත.

මම මහපාරේ හිතක් බවට පත් වීමි. ගල්කිස්ස නගරයේ එහෙට මෙහෙට රුවා ඇදෙන මිනිස් පෙරහැරේ හිතක් වීමි. පරඬැලක් මෙන් වැනි වැනී ඒ මේ අත ගමන් කළෙමි. අතුරු පාර අවසන ගාලු පාරට පැමිණ මම ජයග්‍රාහී බැල්මක් අතුරු පාරේ එහා ඉමට හෙළීමි. ගාලු මුසල පාර, විශ්ව තමා කැඳවා ගෙන ගියේ සමුද්‍රාසන්න පාරේ එහා කෙළවරේ අවන්හලකට බව සිතේ ධාරණය කොට ගත් මම ගල්කිස්ස හන්දිය දෙසට ගමන් කළෙමි.

For E-Pusthakalaya

ජීවිතය කැහැල්ල නැත. එය දරන්නට බැරි තරම් බරකි. මම ගල්කිස්ස හන්දියෙන් කිරිබත්ගොඩ බසයකට නැග එම කෙළවරේ අසුනකට ජීවිත බර වාරු කළෙමි. තුවාලයක් මෙන් ආත්මය වේදනාවකි. ජීවිතය සිතක් බවට පත් වූ සඳලුකි. අසංතෘප්ත සිත ත් කය ත් බරකි. පීඩාව කාගේ හෝ මතින් - කාගේ හෝ පිටින් සැනසෙන තෙක් පිට කර ගත යුතු ය. අසරණ සිත විනාශකාරී හැඟීම්වලින් පිරෙන්නට වී ය. ආවේගකාරී හිස බසයේ යකඩ ගොඩේ හප්පා ගන්නට සිතේ. අසංවර හිත - අසංතෘප්ත හිත උගුල්ලා බසයෙන් එළියට වීසි කරන්නට සිතේ. පාර අද්දර ඉන්නා සෙල්ලක්කාර තරුණයෙකුට රවන්නට - ඔහුට තිත්ත කුණුහරුපයෙන් බණින්නට සිතේ. පණ ගන්වා ඇති බසයේ එංජිම නගන ශබ්දය අබල දුබල යැයි සිතූ මම ළමතු දෑසින් වීදුරු දෙස බැලීමි. මට අවැසි වේගය වත් - මට අවැසි ආවේගය වත් සිසිවකුට නැත. මා ළඟ රොක් වෙමින් පවතින ජවය සිසිවකුට පාලනය කර ගත නොහැකි ය. සහනය වත්, මෘදු බව වත්, සංහිඳියා වත්, සැනසිල්ල වත් සිසිවකු ළඟ නැත. සියල්ල ම එකතු කොට - වැඩි කොට - බෙද - අඩු කළ විට ඉතිරි වූයේ තනිකම හා අසරණකම පමණි.

බම්බලපිටියට ටිකට් පතක් ගත් මම එය ගුලි කොට අත් බෑගයට එබුවෙමි. බසය ගමන් අරඹන විට ළය පැහැල්ලු වී සුසුමක් පිට වී ය. පපුව පසාරු කොට ගිය ගිනියම් උණ්ඩයක් සීතල වී යනවාක් මෙන් මට දැනිණ. මම බසයේ කවුළුවෙන් එ පිට බැ වෙමි.

සත්තකින් ම විශ්ව මගෙන් ඉල්ලා සිටින්නේ සැබෑ ආදරය ම ද? නැත. එසේ වීමට තමාගේ ජීවිතයේ ඉඩකඩක් වටපිටාවක් කොයින් ද? බසය කොළඹ නාගරයේ වංකගිරියට කොට කොටා ගාටමින් තිබිණ. මම මගේ ජීවිතය නවතා ලන්නට තැත් කළෙමි.

විශ්ව මට උරුම කරන්නට උත්සාහ කරන්නේ ජීවිතයේ කුමන ඵලය ද? ආදරය... සැබෑ ආදරය.... සුන්දර සිහිවටන... ආදරයේ උරුමක්කාරයා... මම මගේ ගෙල අත ගා බැලීමි. ගෙල දෙසින් සිහින් දැවිල්ලක් දැනෙයි. අත් බෑගයෙන් කන්නාඩි කැබැල්ල ගෙන මුහුණ ත්, දෑස ත්, ගෙල ත් බැලීමට තිබූ අවැසිකම මම මැඩ ගතිමි.



කාලයේ වේගයටත් වඩා වැඩියෙන් මගේ ජීවිතය තීරණාත්මක කඩඉම් පසු කරමින් තිබිණ. මම ඉදිරි අසුන වෙතට හිස බර කළෙමි. දෑස පියා තද කළෙමි. කඳුළු ගුලි ගලා හැළුණේ නැත. දෑස වියළී තිබිණ. තිලංකාර දෑසේ විශ්වගේ පියාගේ රූපය බැරෑරුම් පෙනුමකින් ප්‍රතාපවත් ලෙස පෙනී සිටියේ ය. විශ්ව කළ ක්‍රියාව ඔහු දැන ගතහොත් එයින් ලැබෙන ප්‍රතිචාරය මට සිතා ගැනීමටත් නොහැකි ය. ඔහු දෑස ගිනියම් කොට මට රවනු ඇත. ගොරවනු ඇත. මා අළු දූවිලි බවට පත් කරනු ඇත. විශ්ව විසින් මා උදුරා ගන්නට තැත් කරනු ඇතැ යි සිතා මේ කතාව මරණයකින් කෙළවර කරනු ඇත. විටින් විට විශ්වගේ පියා කී කතා මගේ දෙසවනේ දෝංකාර දෙන්නට වී ය.

'නේත්‍රා. මට ඔය ළමයට වැඩිය ලොකු පුතෙක් ඉන්නවා. ඔය ළමයගේ වයසේ ගෑනු ළමයි මගේ ළඟ තවත් රස්සාව කරනවා. සල්ලි, කුලමල, බලය මේ හැම දෙයක් ම මට මගේ පරම්පරාවෙන් ලැබිච්චා. මට බිරිඳක් ඉන්නවා. මට ඔයාගෙන් කම්සැපත ඕන නැහැ....'

විශ්වගේ පියා එක දිගට ලෙන්ගතු හැඟීමකින් ආමන්ත්‍රණය කරන බව වටහා ගත් සැණින් මම කතා කළෙමි.

'සර් මම....'

'මම කියන දේ ඉස්සෙල්ලා අහගෙන ඉන්නවා. මම මගේ ජීවිතයේ ඕනවාටත් වැඩිය කම්සැප විඳපු මිනිහෙක්. මට ඔය ළමයගෙන් ඒවා ඕන නැහැ. මම මේවා කියපුවම ඔය ළමයා රස්සාව දාල යන්න ඕන නැහැ. මේක බලපෑමක් නොමෙයි. ඉල්ලීමක්. බල පෑම් කරල ඉල්ලන දේවල් තාවකාලිකයි. මම ඔයාගේ ගෙදර තියෙන ප්‍රශ්න එක දවසින් විසඳල දෙන්නම්.'

'අනේ සර්, මට කරදරයක් නැතුව මගේ රස්සාව කරන්න ඉඩ දෙන්න.'

මම එ දවස ඔහුට බොහෝ බැගෑපත් වීමි.

'එකට රස්සා දහයක් දෙන්නම්. ඒ මොකටවත් ලබා ගන්න බැරි දෙයක් ගැන මම කියන්නේ. මිනිස්සු වයසට යද්දී ශරීරය මෝරනවා. හිත තරුණ වෙනවා. ආදරය බොළඳ වෙනවා. මම නේත්‍රාට ආදරය කරනවා. මගේ කාමරයේ වීදුරු ජනේලය ළඟ මේසයෙන්

අභියෝගයන් කෙළවෙන්න එපා. මට හැම තිස්සෙම ඔයාව දකින්න ඕන.

මම හිස ඔසවා ජනේලයෙන් එ පිට බැලුවෙමි. ජීවිතය හාත්පස නැලවෙමින් තිබිණ. කොහේ දෝ කොහේ දෝ සිට හමන රළු පවන පුහුණුවට කඩුළු අභියි. මම කෙස් රොද කන්පෙති අතර සැඟවීමට උත්සාහ නොකළෙමි. සරාගී කාර්ණ කටුක නගරය මගේ දෑස මායිමේ බොඳ වෙමින් තිබිණ. කලු ඇඳෙන වසන්තයට මම මගේ කඳුළු කළවම් කළෙමි. එහෙත් කටහඬක් මැලි මැලි අත ඇසෙන්නේ නැත. මිනිස් මල් සුවඳ කොහේ සිට මැලුම් හෙළන මිනිස් වෙසක් නැත. සැඟවිණි ද? ඇත්තට ම ගැණුකම කොච්චර නම් අසරණ ද?

'මම මේ රස්සාව දාලා යනවා සර්. මම පුංචි කාලේ නුවර වැව රවුමේ හිඟා කාලත් තියෙනවා. දවසක් මිනිහෙක් දුන්න බත් පාර්සලයක් කාලා ඉතිරි වෙච්ච කොලේ වැවට දැම්ම කියල පොලිස්කාරයෙක් මට පයින් ගැහුව. මං උඹට උගේ අම්ම මතක් කරල බැන්න. ඌ මට මගේ අම්ම මතක් කරල බැන්න. ඊට පස්සෙ මං කලේ උගේ පස්සෙන් එළව එළව සින්න කුණුහරුපයෙන් බනින එක. මට පොඩි කාලේ ඉඳන් මේවා උරුම වෙලා තිබුණා. දවසක් සල්ලාලයෙක් නුවර ස්ටේෂම ගාව ඉඳන් මහ පාර දිගේ මාව ඇදගෙන ගියා. මම කලු ගලකින් ගහල උගේ ඔළුව පැළුවා. මම කුණු බක්කි ඇහිඳන් කාල නැගුණේ. බඩින් බාගයක් කාලා ජීවත් වුණේ. පේමන්ට් එකේ සිමෙන්තියේ 'අ' යන්න ලිව්වේ. ඒත් මම අද වෙනකම් මගේ ජීවිතයේ පිරිසිදුකම රැක්කා.'

'ඒ නිසා ම නොවෙන්නම් මම ආදරේ කිව්වේ. මගේ වයසේ මිනිහෙකුට පුංචි කෙල්ලෙක්ගේ ආදරය කොයි තරම් සුන්දරද? කොයි තරම් වටිනව ද? සෝමාගේ වයසෙ කෙල්ලෙකුට ඒක තේරෙන්නෙ නෑ. මගේ වයසෙ පිරිමියෙකුට තමයි ඔය වයසෙ කෙල්ලකගේ අගේ තේරෙන්නෙ. සෝමා කැමති නම් විශ්වාස කරන්න. මගේ ජීවිතේ මේ වෙනකොට වටිනා ම වස්තුව ඔයා.'

මම බොහෝ වේලාවක් ජනේල කවුළුවෙන් එ පිට බලමින් සිටියෙමි. වැල්ලවත්ත පාලම පසු වෙනවා මට මතක ය. මට මගේ ජීවිතේ දුක, කඳුළු, වේදනාව සදාකාලික උරුමයන් ද? විශ්ව ත්, විශ්වගේ පියා ත් මගේ ඇස්, ඉස්, මස් ඉල්ලා සිටින්නේ ඇයි?



මස් කඩේ කොක්කක එල්ලා ඇති කිකිළියක මෙන් මා නිහඬ විය යුතු නැත. මම ජීවිතයේ මඩ කළලයක එරී සිටියෙමි. සියොළඟ ම වේදනාවෙන් මිරිකෙමින් තිබිණ. ඇද වැටී මිය යා නොහැකි ය. වැටි වැටී ගමන් කළ යුතු ය. බසයේ සිටි සලෙලූන් ඉඟි කරන බව මම වහා වටහා ගතිමි. ඔවුහු දැසින් අත්තටු ගසති. මගේ ජීවිත පව්කඳ ලෝකයට මේ තරම් බරක් වී ද?

විශ්වගේ මව කාර්යාලයට විත් තමාට බැණ වැදුණු දින ඇති වූ ලැජ්ජාව කාර්යාලය ජීවිතය එපා කරවූ තරම්? සියල්ලෝ ම වපරැසින් තමාට ඔච්චම් කළ හැටි. විශ්වගේ මව එ තරම් රුදු පෙනුමක් ආරෝපණය කොට ගත්තේ කෙසේ දැයි මට නම් සිතා ගන්නට නොහැකි ය. ගිලන්ව ඔත්පලව ගිය කලෙක මෙන් මම මගේ හිස මේසයේ ගසා ගෙන ගසාගෙන ගිය හැටි....' මගේ නළල ඉරී තැළී යනවාක් මෙන් මට දැනිණ.

'පාරේ යන වල් බැල්ලියෝ කන්තෝරුවලට ගත්තම අපටත් නව නින්ගිරාවයි. මුන් දැන ගන්න එපායැ හම්බ කරගෙන කන තැන ආරක්ෂා කරන්න. මේසේ දාගෙන ඩිරෙක්ටර්ගේ කාමරේ ළඟට. උඹ මෙහේ රස්සාව කළොත් ගිහිං අර මහා පුටුවේ වාඩි වෙයි. වල්කම් කරන්න ඕන නම් මහ පාරට බැහැපං. නැත්නම් රස්සාව දාලා උඹට ඕන දීපංකරේක පළයං. ආයෙත් මාව මේ ඔෆිස් එකට ගෙන්න ගන්න හදන්න එපා.'

ඇගේ හඬ ශෝකාකුල එකක් නොවී ය. එහි තිබුණේ අහිමි වී යන දෙයක් රැක ගන්නා රැජිනකගේ මෙන් ප්‍රතාපවත් බවකි. මගේ පපුව පැළී විවර වී රිදෙනු මට ම දැනෙන්නට වි ය. කෲර ගිජු ලිහිණියන් රැනක් මා වටා සැරි සරනු ඇතැ යි මට සිතෙයි.

රථවලින් නැඟෙන කළු දුමාරය දැවෙන අමු සොහොනක පුළුටු ගඳ නාසයට ආඝ්‍රාණය කළේ ය. නගරයේ ඝෝෂාව ළතෝනියක් මෙන් ඇසෙන්නට වි ය. දුහුවිලි සුලි සුළඟ පාට වරුණ නගරයේ වාලුකාවෙන් පියඹා ගියේ ය. මම බසයේ ඉදිරිපස දොරටුව වෙත් ගමන් කළෙමි.

'ඉස්සරහා හෝල්ට් එකේ බහිනවා.'

පොකැට්ටුව ඉරී පඩිපත හැළුණු අසරණියක මෙන් මම බසයෙන් බැස ගතිමි. එමි පැත්තේ අලුත් රථ වාහන ගාලට මෙ පිට බස් නැවතුමේ මලකඩ කණුවට හේත්තු වුණෙමි. විශ්ව, විශ්වගේ පියා, මව, ගෙදර ජීවිතය, මේ ආදී සියල්ලක් ම මයිතේ විත්ත රූප ගන්වන්නට වී ය. දුකට පත් දෑස මත සඳුන් දිය ඉසින්නට කෙනෙක් නැත. ගොහොරු මඩ කළලයක සුරත් පියුමක් වී පිපෙන්නේ කවදා ද? කෙඳි වලාවක් වත් නැති සරා කල්පත් අහසේ අලුත් තාරකාවක් වී පිපෙන්නේ කවදා ද? දැලි කුණු තවරාන, හොටු පෙරා ගෙන, ජංගි කොටයක් ඇඳගෙන ඉන්නා ළදැරියක් - නව යොවුන් වියට පත් වූ විට කො තරම් අසරණ ද? ලෝකයා එක් එක් කාලවල දී ජීවිතවලින් කාලයට අනුරූප දේ ඉල්ලා කෑ ගසන හැටි? පොර බදන හැටි? හඬන හැටි? වැළපෙන හැටි?



# 2

කුඩා දරුවෙකුගේ වේදනා සහගත මර ළතෝනියකින් මම කැති ගතිමි. අහසින් පොළොවට වැටුණෙමි. මගේ ළමා කාලය මගේ දෑස ඉදිරියේ ප්‍රතිනිර්මාණය වෙනවා වත් ද? උඩුකය නිරුවත් වූ අවුරුදු පහක පමණ කුඩා දැරිවියක් හඬමින් සිටියි. ඇගේ ශරීරයේ තැන් තැන්වල තුවාල කැළැල් ය. දූවිලි සෙම් සොටු සියොළඟ වසා ගෙන ය. කෝටු පහර කැමෙන් රත් පැහැ වූ ඉරි කැළැල් රුධිර නාලිකා මෙන් ඇගේ සිරුර පුරා මතු පිටට නෙරා ඇත. මේ සිහන දැරියගේ සහෝදරයා යැයි සිතිය හැකි අවුරුදු දහයක පමණ පිරිමි දරුවෙක් කෝටුවකින් දැරියට පහර දෙයි. පහර දෙන විට දැරිය හැඬීම නවතයි. ඒ විට ඇගේ අයියා සිහිත්තියගේ හිස ගෙන උකුළ මත තබා හිස අත ගායි. පහර දීමෙන් රත් පැහැ වූ තැන් පිරි මදියි. ඔහු අරාජික දෑසින් වටපිට බලයි. සෙනෙහස නොඅඩුව ලබන දැරිය මොහොතකින් සුසුම්ලයි. ඉකි ගසයි. නැවත මහ හයියෙන් හඬයි. ඒ විට භාරකාර අයියා නැවත කෝටුව ගෙන සිහිත්තියට තඩි බායි. ඇය නිහඬ වෙයි. සුසුම්ලයි. ඉකි ගසයි. හඬයි.

මොහොතක් මේ සිදුවීම බලා සිටි මම උකුසු ඇසින් වටපිට බලා සිහිත්තියට ළං වුණෙමි. ඇ හඬන්නේ කුස ගින්නට ද? රෝගයකට ද? අව් රශ්මියකට දැයි දන්නා කෙනෙක් නැත. සැණෙකින් මම දෑත බිම ඔබා සිහිත්තිය ඩැහැ ගත්තෙමි. උරහිසට හේත්තු කොට උණුසුම් කළෙමි. මගේ පපු කුහරයේ සිට වේදනාවක් මතුපිටට ගලා එමින් තිබිණ. මම කඩිනමින් වටපිට බලා දැරිවිය ද රැගෙන දකුණුපස අතුරු පාරට වැටුණෙමි. මහත් සෙනෙහසකින් දැරිවිය තුරුලු කොට ගෙන මුහුද දෙසට වැටී ඇති අතුරු පාරේ පළා ගියෙමි. මම මගේ ම ආත්මය රැගෙන පළා යනවා යැයි මට සිතිණ. මම හැකි තරම්

වේගයෙන් මුහුදු සීමාවට ළඟා වූයෙමි.

මුහුදේ රළ ගෙඩි වේගයෙන් නැගිණ. සැණින් බිඳිණ. ඊටත් වැඩි වේගයෙන් ජීවිතය කිඳෙමින් තිබිණ. සීත සුළඟ හැමුවේ නැත. ගහකොළ මැළවිණ. පවන රළු වී ය. පොළොව වියළිණ. පොලිස් ස්ථානය කම්පනය කරවමින් ගාලු පාරේ රථ පෙරහැර ඇදෙන්නට ඇත. මම තුෂ්ණීම්භූත වී සිටියෙමි. මා වටා තිබුණේ කහ පාට කාකි සූට් හා රතු පාට උකුසු ඇස් පමණි. තෙත් බවක් තිබුණේ මගේ උණු කඳුළුවල ය. දෙකොපුල හරහා ගලා ගිය ලුණු රස මට දැනිණ.

මම නිලංකාර දෑසින් වටපිට බැලීමි.

'ඇත්ත කියපං. නැත්නම් දානවා උසාවි. බොරු කිව්වොත් දත් කැඩෙන්න ගහනවා. කියපං දරුවා උස්සගෙන කොහෙද ගියේ?'

මා කළ යුත්තේ කුමක් දැයි මම නොදැන සිටියෙමි. නොදැනුවත්ව ම මම මගේ ජීවිතය අගාධයකට තල්ලු කරමින් සිටිනවා වත් ද? පොලිස් කූඩුවල සිටි අසරණයෝ මදෙසට ශූන්‍ය වූ බැල්මක් හෙළා ගත් වන ම සිටිති. තවත් සාමාජිකාවක් තමන් අතරට පැමිණියා යැයි ඔවුන් සිතනු ඇත. මම උකුසු ඇස්වලින් මිදී පොලිස් කූඩුව දෙසට දෑස යොමු කොට සිටියෙමි. මොහොතකින් මා ද ඔවුන් තුළට ම ගාල් කරනු ඇත. ඇතුළත කාමරයක සිට පොලිස් ස්ථානාධිපතිවරයා හඬ නගා කෑ ගැසුවේ ය.

'එස්. අයි. පෙරේරා....'

'යර්ස් සර්...'

'අර ළමයව ඉස්පිරිතාලෙට යැව්වද?'

'ඔව් සර්...'

'ඔය ගෑණිගේ අතට බෙහෙත් ටිකක් දාලා ඉන්නවා.'

'එපා මට මේක විඳගන්න පුළුවං'.

මම පොලිස් ස්ථානාධිපතිවරයා දෙසට හැරෙමින් කීවෙමි. මගේ මුළු දකුණත ම හිරි වැටෙමින් තිබිණ. ඒ නිසා දෝ ඇඟිලිවල වේදනාව අඩුවෙන් දැනෙයි. අතේ ඇඟිලිවල තුවාල නොපෙනෙන්නට මම ලේන්සුවෙන් ඒවා වසා ගතිමි. දැරිවියගේ දත් පහර ඇට කටු දක්වා



ම ඇඟිලි සිදුරු කොට තිබිණ. දැරිවියගේ මුවින් අත පිටතට ගන්නා විට සුදු හම පැදී මතුපිටට ලේ විදිමින් තිබිණ. ලේන්සුව ලේ බිංදුවලට රත් පැහැ වී ලෙයින් පෙඟී තිබිණ. ගවුමේ තැන් තැන්වල ලේ බිංදු තිබුණත් මම ඒවා සඟවා ගැනීමට උත්සාහ නොකළෙමි.

පෙරේරා නමින් හැඳින්වූ නිලධරයා කුරිරු සහ කටුක ප්‍රශ්න වැලක් මගේ ආත්මයට දමා ගසමින් සිටියේ ය. මම පිළිතුරු නොදී සිටියෙමි.

'උඹ හුරතල් කරන්ඩ බෑ. ඇත්ත කියපං.'

ඔහු වඩාත් රළු ලෙස මොර ගෑවේ ය. මේ කතාවේ මුල මැද අග ඔහු ඉදිරියේ වැමෑරීමට මට වුවමනා නැත. මම බිම බලා ගතිමි. හාත්පස කැළඹෙමින් තිබිණ.

'උස්සපං ඔළුව. කෙලින් මගේ දිහා බලාගෙන උත්තර දීපං. උඹල පොලිසියට ආව ම පත්තිනි අම්මල. උඹ මීට ඉස්සර වෙලා අපිට මාට්ටු වෙලා නැහැ. එක්කෝ උඹ පාරේ වේසකම් කරන්න බම්බලපිටියට අලුතෙන් බැහැපු එකියක්. එහෙම නැත්නම් ළමයි හොරෙන් උස්සන ජාවාරම්කාර එකියක්. කියපං කෝකද ඇත්ත?'

මම පිළිතුරු නොදී ගල් ගැසුණෙමි.

'ඒ දෙකම නෙවේ නම් .... උඹට පිස්සුද?'

'මට පිස්සු වෙන්ඩ ඇති.'

මම ගත් කටට ම කීවෙමි. මගේ කතාවෙන් ඔහු වඩාත් කිපුණේ ය. පය පොළොවේ හප්පා නැඟී සිටි ඔහු මගේ කෙස් රොදෙන් අල්ලා ඉහළට එසවූවේ ය.

'වේසි... තෝ හිතුවද මෙතන වේසා මඩුවක් කියල. පී.සී. මේ ගෑණි දානවා ලකප් එකට. මේකිට ගහන්න ඕන හෝස් පයිප්පෙන්. පිටේ හම එළියට එන්න. පොලිසියට අහුවෙලත් අහන ප්‍රශ්නෙට උත්තර දෙන්න බැහැ.'

ඔහු පුටුවට පයින් ගසා නැගිටුවේ ය. ඊ ළඟ ප්‍රශ්නය තීරණාත්මක ය.

'ඇත්ත කියනවද? කූඩුවට දාන්නද?'

'මම ඇත්ත නමයි කිව්වේ.'

'කියපං මොකටද උඹ පාරේ හිටපු ළමයෙක් උස්සගෙන ගියේ?'

බිම පෙරළී හඬන්නට තරම් සිත් කුහරය පැරී තිබුණත් මම කෑ ගසා නොහැඬුවෙමි. සිත ඉරී තැළී තිබිණ. පසුව වේදනාවෙන් මිරිකෙන්නට වී ය.. මම හැඩුම්බරව එහෙත් ආවේගයෙන් මෙසේ කීවෙමි.

'මට පිස්සු වෙන්න ඇති. මං වගේ කෙනෙක්, ඔය වගේ වැඩක් කළාම පේන්නේ එහෙම තමයි. අපි ඉපදිලා තියෙන්නේ දඬුවම් විඳින්න තමයි. සර් කැමති දඬුවමක් දෙන්න. මම ඒක විඳින්නම්.'

මම පුටුවේ නොසැළී වාඩි වී සිටියෙමි. මගේ ජීවිතේ බුද්ධි ඵලය යට යමින් හැඟීම් ඵලය මතු වෙමින් තිබිණ. නිලධාරියා නැවතත් ප්‍රශ්න කරද්දී මම කෙටි පිළිතුරු දුන්නෙමි.

'උඹේ ගම කොහේද?'

'නුවර... මහනුවර....'

'මහනුවර කියන්නේ දිස්ත්‍රික්කයක්... ගම...?'

'නුවර... කටුගස්තොට- මාතලේ පාරේ...'

'වයස...?'

'අවුරුදු විසි දෙකයි....'

'නම.....?'

'නේත්‍රා....?'

'ඉතිරි ටික...?'

'නේත්‍රා සරස්වතී ද සිල්වා'

'සරස්වතියි.... සිල්වයි.... තිකං රාබුයි කැවුමුයි වගේ.... ගැළපෙන්නේ නැහැ.... ඇත්ත කියපං....'

'ඇත්ත නම තමයි කිව්වේ. පොඩි කාලේ කිව්වේ සරස්වතී. තාත්ත සිල්වා. මගෙ නම නේත්‍රා'

'මේකිට ඇත්තටම පිස්සුද කොහෙද?'



පෙරේරා නමින් හැඳින්වූ පොලිස් නිලධාරියා පැනෙන් මගේ නිකට ඔසවන ගමන් කීවේ ය. මම සමච්චලයට පත් වී සිටියෙමි. ඔහු මානසිකව තෙහෙට්ටු කිරීමේ කුරිරු ආශාවක් මසිතේ නළියමින් තිබිණ.

'බුද්ධාගමේද?'

'ඔව්...'

'සිංහලද ?'

'වෙන්ඩ ඇති.'

'ඇයි උඹ ජාතක වෙච්ච එකා දන්නෙත් නැද්ද?'

'නැහැ'

යනුවෙන් කීමට මට අවැසි වුණත් මම නිහඬ වුණෙමි. ඔහු මට පහර දෙතැ යි මම බිය වීමි. පොලිස් ස්ථානයේ බිත්ති මා වටා බමන්නාක් මෙන් වී ය. මා වෙනුවෙන් එකදු මිනිස් පුළුටක් වත් පෙනී සිටින්නේ නැති හැටි. මසිතේ මා වෙනුවෙන් ම අලුත් ශක්තියක් ඉපදෙමින් තිබිණ. විටෙක සිත තැති ගත්තත් මම පොලිස් නිලධාරියා දෙස බලා ගත් වන ම බලා ගෙන සිටියෙමි.

'ඉස්කෝලේ කීයට ගියා ද?'

'ඇඩ්වාන්ස් ලෙවල් කළා'

'කොහේද ඉස්කෝලේ ගියේ?'

'නුවර මහාමායාවට'

'පූහ්... උඹ හරි ඇඩ්වාන්ස් බඩුවක්නේ. කියපං. මෙහේ මොකද කරන්නේ....?

'මොකුත් නැහැ'

'මොකුත් නැතුව තමයි රාජකාරිය කරනව ඇත්තේ. කවුද උඹේ බෙල්ල හැඳුවෙ? කියපං දවසට කීයක් හොයනවද? කොයි ලොජ් එකේද ඉන්නේ?'

ඔහු නැවතත් හැඟෙන් [illegible] නිසට එසවුවේ ය. මම සර්වාංගය ම පිළිස්සී යාමට තරම් නී [illegible] බැල්මක් හෙළා තදින් හුස්මක් ගතිමි. පියක් නෙරපී තිබුණු සියලු පීඩාවන් ඉවුරු බිඳ ගලා හැලෙන්නට වි ය.

'රාලහාමි... මං දුප්පත් එකියක් තමයි. ඒත් මාව පණ පිටින් මෙතන දූෂණය කරන්න හදන්න එපා. ඔහේටත් නංගිලා එහෙම ඉන්නවද? ගෙදර ගෑණියෙක් එහෙම ඉන්නවද? අඩුගානේ වදපු අම්ම කෙනෙක් ඉන්නවා නේද? මං ඒ හිහන කෙල්ල උස්සගෙන බීච් එක පැත්තට දිවවේ උහුළගෙන ඉන්න බැරි තරම් ඒ ළමයා මහ පාරේ දුක් විඳපු හින්දා. ඇයි මාව නරක ගෑණියෙක් කරන්න හදන්නේ?'

මට තව දුරටත් ඉවසා සිටීමට නොහැකි ය. පිරිමින් සමූහයක් මගේ ඇඳුම් එකිනෙක අහවර කොට මා නිරුවත් කරනවා වැනි හැඟිමකින් මම කිළිපොළා ගියෙමි. පොලිසිය දෙවනත් වන්නට මම කෑ ගැසුවෙමි. පුටුව තල්ලු කොට නැඟී සිටියෙමි. තුවාල අත පරඬැල් වන්නට තරම් වේගයකින් මම මගේ ම පපුවට ගසා ගත්තෙමි.

'මීට වැඩිය හොඳයි මාව මරා දාපල්ලා.'

තත්පර කීපයක් සියල්ලෝ ම නිහඬව සිටිය හ.

මම විකල් මනසින් සිහිබුද්ධිය එළවා ගන්නට තැත් කළෙමි. උණ සන්නිපාතයට ඔළුව විකාර වී තිබී ගැහි ගැහී දහදිය දමා උණ බහිනවාක් මෙන් මගේ නළල දෙපැත්තෙන් දහදිය වෑහෙන්නට වි ය. දෙතුන් වරක් තදින් හුස්ම ගත් මම අමාරුවෙන් කෙළ බිඳක් ගිල ගතිමි. පැය කීපයක් මා කළ කී දේ පොලිසියෙන් කෙළවර වෙක් ම මම පිස්සියක මෙන් කටයුතු කළ බව මට ම අවබෝධ වෙමින් තිබිණ. ගල්කිස්ස පැත්තට යමු යැයි විශ්ව කී විට මම එකහ වීමි. කාමරයට ගිය විටත් මහ භයියෙන් ඔහුට සිනා සීමි. මම ඔහු සමච්චලයට පත් කළෙමි. ඔහු කවි භාෂාවෙන් කතා කරන විට 'මෝඩයා ... පව්....' වැනි හැඟිමක් පමණි මා තුළ තිබුණේ. මම කාමරයට ගොස් ඔහුටත් පෙර යහනේ වාඩි වීමි. ඔහු දෙතොල තතන තතනා කියන විට මම දහදිය දමමින්, මුහුණ රතු කර ගනිමින්, බොළඳ වචන වෙව්ලමින්, තතන තතනා කියන විට මම වඩාත් සිනා සීමි.



'නේත්‍රා භයියෙන් හීතලවෙන්න එ [illegible] පිටට ඇහෙයි....'

'ඇහිද්දෙන්. අපි දෙන්නා විතරනෙ ඉන්නෙ.'

'මං කියන දේ අහන්න. ඔයා හරි ලස්සනයි. හරිම හරි ලස්සනයි.'

මම මුලින් මුලින් ඔහු කළ කී දේට සිනා සෙමින් සිටියෙමි. ඔහු මුලින් ම මගේ දකුණතේ මාපටැඟිල්ල ගෙන එහි නියපොත්ත පිරි මැද්දේ ය. මගේ අත්ල හොඳින් දිග හැර ඒ මත ඔහුගේ අත්ල තැබුවේ ය. ඇඟිලි එකිනෙක හිමි හිමින් පිරි මදින්නට වි ය. ඒ විටත් මම ඔහුව සමච්චලයට ගත්තෙමි.

'හුඟ කාලෙකින් නියපොතු කපන්න බැරිව ගියා.'

මගේ වචනවලට ඔහු තුළ ප්‍රසාදයක් තිබුණේ නැත. මොහොතකින් බොළඳ වචන පසෙක තැබූ විශ්ව ඔහුගේ පිරිමි ශරීරයේ ආධිපත්‍යය බලයක්ව පාවිච්චි කරන්නට සූදානම් වි ය. සැණෙකින් මගේ ගෙල වටා දැත දැමූ ඔහු මා තුරුලු කොට දෙතොල උරා බීවේ ය. මම නැඟී සිටියෙමි.

'පිස්සා'.

මම නැඟී සිටිමින් කීවෙමි. එහෙත් බැරෑරුම් බවක් මට දැනුණේ නැත.

ඔහු අසරණ ලෙස කතා කළේ ඉන් පසුව යි.

'මං කියන දේ අහන්න නේත්‍රා'

යනුවෙන් ඔහු දිග ම දිග හැලි කියා ගෙන කියා ගෙන ගියේ ය. ඔහු සමච්චලයට පත් කිරීම පසෙක තබා මම සැබවින් ම ඉන් පසුව ඔහු සමඟ කතා කළෙමි.

කාමරයෙන් මිදුණු මම කිරිබත්ගොඩ බසයකට නැගුණේ මොන කෙහෙල්මලකට දැයි මට දැන් සිතා ගැනීමට වත් නොහැකිව සිටිමි. බම්බලපිටියට ටිකට් පතක් ගත්තේ ද බම්බලපිටියෙන් බැස්සේ ද ස්ථිර අරමුණකින් නොවුණත් – මැජෙස්ටික් [illegible]ප්පු සංකීර්ණයේ විසිතුරු බලමින් නිකරුණේ පැය කීපයක් [illegible] ත කළ හැකි ය යන සිතුවිල්ල මා තුළ තිබිණ.

'කෝ ඇත්ත නොකිව්වොත් කකුල් දෙකෙන් බාල්කෙ එල්ලලා කොට ගහන්නේ.'

For E-Pusthakalaya

'උඹලට ඕන එකක් කරපල්ලා ..... පර බල්ලෝ ..... උඹලා ඔක්කොම යක්ෂයෝ....'

මම මගේ ම හිස බදා ගෙන විලාප දුන්නෙමි.

'මිස්ට පෙරේරා...'

ස්ථානාධිපතිවරයාගේ හඬට සියල්ලෝ ම කීකරු වූ හ. මගේ විලාපය ඉකියක් බවට පත් වි ය.

'ඔය කෙල්ල මෙහාට එවනව'.

අණ ලැබුණු සැණින් මම ස්ථානාධිපතිවරයාගේ කාමරයට ඇතුළු වෙමි.

මට තව දුරටත් කතා කිරීමට ඔහු ඉඩ දුන්නේ නැත.

'මෙන්න ඔය ළමයගේ පර්ස් එක. මං තොරතුරු ඔක්කොම හොයා ගත්තා. ප්‍රශ්නයක් නෑ... ඊත් උදේ වැඩට නොගිහිං කොහෙද ගියේ...?'

'ගල්කිස්සේ....'

'බම්බලපිටියේදී ළමයෙක් උස්සගෙන කොහෙද ගියේ?'

මට තව දුරටත් වසන් කරන්නට දෙයක් ඉතිරි වී තිබුණේ නැත. අත් බෑගයේ තිබූ ලිපිනයට ඔහු කාර්යාලයට කතා කරන්නට ඇත. සියල්ල හෙළි කළ යුතු ය. එහෙත් විශ්ව සමග ගිය ගමන නොකිව යුතු ය. මේ හැර මම සියල්ල ම පාපොච්චාරණය කළෙමි.

'මම උදේ ගල්කිස්සෙ ගියේ මගේ යාළුවෙක් එක්ක. බම්බලපිටියේ බැස්සෙ මැජෙස්ටික් සිටි එකට යන්න හිතාගෙන. මම ඒකයි පොලීසියට මෙහා පැත්තේ හෝල්ට් එකෙන් බැස්සෙ.'

'ළමයෙක් උස්සගෙන ගියේ මොකටද?'

'මගේ මෝඩකමට වෙන්න ඇති. මමත් දුප්පත් එකියක්. මං බස් එකෙන් බහිද්දී හෝල්ට් එකේ පොඩි ළමයි දෙන්නෙක් හිටියා.



එතන හිටපු පොඩි ගෑණු ළමයා හොඳටෝම අඬනවා. ඒ පිරිමි ළමයා කෝටුවක් තියාගෙන ඒ දැරිවිට කෝටුමස් කරලා.'

'උස්සගෙන ගියේ?'

'උහුලගෙන ඉන්න බැරිකමට. ඒ දරුවෝ දෙන්න ළඟ වැඩිහිටි කවුරුවත් හිටියේ නෑ. පිරිමි ළමයා තමයි පොඩි දරුවා බලාගන්න හිටියේ. මං හිතන්නේ ඒ අයියයි නංගියි. මොන හේතුවකටද මන්දා පොඩි දරුවා අඬනවා. බඩගින්නට වෙන්නත් පුළුවන්. උහුලගන්න බැරි ලෙඩකට වෙන්නත් පුළුවන්. නංගි අඬද්දී ඒ අයියා ඇඬිල්ල නවත්වන්න දැනගෙන හිටියේ දැත බඳලා කෝටුවෙන් ගහන එක. ගුටි කද්දී දැරිවි ඇඬිල්ල නවත්වනවා. අඬන්නේ නැති නංගිට ඒ අයියා ආදරේ. ඇඬිල්ල නවත්තපු ගමන් ඔළුව උකුළ උඩ තියාගෙන ආදරේ කරනවා. හුරතල් කරනවා. මූණ ඉඹිනවා. උණුහුමයි ආදරෙයි දැනෙද්දී ඒ දැරිවියට ආයෙත් ඉකි ගැහෙනවා. ඇඬෙනවා. ඊට පස්සෙ උහුලගෙන ඉන්ඩ බැරි තරමට ඒ දරුවා අඬනවා. අඬද්දී ඒ අයිය දන්නෙ කෝටුවෙන් දැත බඳලා ගහලා අඬන එක නවත්වන්න. නංගිව උකුළෙන් බිමට දාලා ආයෙත් දැත බඳලා කෝටුමස් කරනවා. ගහද්දී ආයෙත් ඇඬිල්ල නවත්වනවා. එතකොට උකුළට ගන්නවා. මේක බලා ඉන්න බැරිතැන මම පොඩි දරුවා උස්සගෙන අතුරු පාර දිගේ මූද පැත්තට දිව්වා.'

'අත හැපුවේ කොහොමද?'

'වඩාගෙන දුවද්දී මට දැනුණා දරුවට හොඳටම උණ කියලා. මූළු ඇඟම රස්නෙයි. දරුවගේ ඇඬිල්ල නැවතුණා මං වඩාගත්තම. මගේ බෙල්ල බදාගත්තා. තුරුල් වුණා. මම මගේ අත කට ඇතුළට දැම්මා. එළියට ගද්දි හිල්වෙන්න හපලා...'

'හොඳයි .... හොඳයි. බුදු වෙන්න ඉන්න මිනිස්සුත් දේවදත්තලා වෙනවලු පොලිසියට ආවම.... ඔය ටික කලින් කිව්ව නම් ඉවරයිනේ. මම මිස්ට ඉලංගකෝන් දුල්ලෑවට කතා කළා. දැන් එයි. ආවම යන්න පුළුවන්....'

ස්ථානාධිපතිවරයා වෙනත් කාර්යයක නියැළෙන්නට වීමෙන් මම ඔහුට ස්තුති කොට කොරිඩෝරයට පැමිණියෙමි.

For E-Pusthakalaya

ඉලංගකෝන් දුල්ලෑව ... විශ්වගේ පියා... මා ඔහුගේ සේවිකාවක් නොවෙ ද?' පොලිසියෙන් පළා යාමට මට [illegible] වි ය. ඊට අවස්ථාවක් බලන්නටත් පෙර විශ්වගේ පියා පොලිසියෙ දොරකඩ බෙන්ස් රථය නැවතුවේ ය. ස්ථානාධිපතිවරයා සමඟ මොහොතක් කතා කළ ඔහු [illegible] අසළට එත් ම... මම නැඟී සිටියෙමි.

'නේත්‍රා දැන් ඉතිං යමු.'

මම ඔහුට කීකරු වීමි. ඔහුගේ පසු පසින් වැටුණෙමි. කාරයේ [illegible] පස දොරටුව මුලින් විවෘත කළ ඔහු මදෙසට අනුකම්පා සහගත බැල්මක් හෙළී ය.

'නඟින්න...'

මම රථයට ගොඩ වීමි. අහසින් පොළොවට, පොළොවෙන් අහසට මෙන් දැනිණ. දකුණු පසින් රථයට නැඟුණු ඉලංගකෝන් දුල්ලෑව රියැදුරු අසුනේ ආරක්ෂිත පටිය තද කොට ගත්තේ ය.

'ඔයා බෙල්ට් එක දාගන්න නේත්‍රා. හදිසියේ බ්‍රේක් ගැහුවොත් [illegible].'

'කමක් නෑ. මැරෙනකම්ම ඔළුව වදිනවා නම් තමයි හොඳ.'

මම මුරණ්ඩු ලෙස කීවෙමි.

'මම හදන්නේ ඔයාව ලස්සනට ජීවත් කරවන්න. අද අපි මේ ප්‍රශ්නේ කෙළවරක් කරගනිමු. ඉස්සෙල්ලා අතට බෙහෙත් ටිකක් දා යමු.'

සැපදායක වංගුවකින් රථය ගාලු පාරට පේන්දු වි ය.

'අද උදේ වැඩට එන්නෙ නැතුව කොහෙද ගියේ?'

'ගියේ ගල්කිස්සේ සමුද්‍රාසන්න පාරේ හෝටලේකට. මිස්ටර් දුල්ලෑවගේ පුතා විශ්ව තමයි මාව හෝටල් කාමරයට ගෙනිච්චේ...'

මට ඉකිරිය කියා ගන්නට ලැබුණේ නැත. රියේ බ්‍රේක් පහරට මගේ හිස ඉදිරියට විසි වී ගොස් 'ඩග්' යන හඬින් වැදිණි. මම [illegible] තද ගත්තෙමි.



මද්දහන් ගින්දර මට හොඳට මතක ය. කටු පුද්පා ගත් ඉර පායා තිබුණා මතක ය. මම දෑස් පියන්පත් තද කොට ගතිමි. නෙත් කෙවෙනි තුළට කළුවර එකතු වි ය.

'නේත්‍රා.... නේත්‍රා..... ඔයාට මොකද?'

'මොකුත් නෑ....'

ඉලංගකෝන් දුල්ලෑව මගේ කම්මුල් දෙකට සිහින්ව තට්ටු කළේ ය. ඒ ඇඟිලි රළු ද නැත. මෘදු ද නැත. මම යාන්තමට දෑස විවර කළෙමි. මා ඉදිරියේ බොඳ රූපයක්ව සිටියේ ප්‍රතාපවත් ඉලංගකෝන් දුල්ලෑව ය.

'ඔයාගේ නළල ගෙඩි ගැහිලා.'

'ධනපතියොත් එක්ක දඩුමොනරවල ගියාම එහෙම වෙනවා.'

'ඇයි හැම දෙයක්ම ඔයා අසුබ විදිහට හිතන්නේ?'

'සුබ විදිහට හිතන්න දෙයක් මගේ ජීවිතේ සිද්ධවෙලා නැති හින්ද?'

'ඇයි මගේ ළඟ ඔයාට හොඳ හිතක් තියෙන්න බැරිද?'

'පුළුවන්.... ඒත්... අවස්ථාවාදිව..... අපිව හපයක් වෙලා මහපාරට වැටෙනකල් විතරක්.... ඊට පස්සේ වාහනයකට අනුවෙච්ච කප්පක් තරම්වත් ගණන් ගන්නේ නෑ. කාට හරි කියල රෝද දෙක හෝදල දානව.'

'නේත්‍රා හදන්නෙ මගේ හිත රිදවන්න....'

මට කුරිරු සතුටක් දැනිණ. උපන් ද සිට සිත රිදවා ගෙන ඇත්තෙමි. මා නිසා සිත රිදවා ගත් කෙනෙක් වෙත් ද? ඔහුගේ සිත පෑරී ඇත් නම් සත්තකින් ම මට එය සතුටකි. හාල්මැස්සන් නිසා තල්මසුන් තැළී පොඩි වන්නේ නැත. නුවර ගුඩ්ෂෙඩ් එක අයිනේ ස්ටීවන් අයියා කී සුරාංගනා කතාවක් මට සිහි වේ.

'මය තල්මහගේ බඩේ ඉන්නවා මෝරෙක්. මෝරගේ බඩේ බලයෙක්. බලයගේ බඩේ හුරුල්ලෙක්. හුරුල්ලගේ බඩේ හාල්මැස්සෙක්.

හාල්මැස්සගේ බඩේ කුණිස්සෙක්. කුණිස්සගේ බඩේ ක්ෂුද්‍ර ප්‍රාණියෙක්. ඔකට පුතේ කියන්නෙ කැටෑ නීතිය. අපි හරියට කුණිස්සෝ වගේ. අපි දන්නෙත් නෑ අපි ඉන්නෙ තල්මහගේ බඩේ කියලා...'

මට ස්ටීවන් අයියා හොඳට මතක ය. මේරි අම්මා. මොහොමඩ්, ප්‍රේමක්කා, ජෝ මල්ලී ... මේ චරිත සියල්ල මගේ ජීවිත තක්සලාවේ දිසාපාමොක්ලා නොවේ ද? පුංචි කාලේ කුණු බක්කි අහුළපු හැටි. මාලිගාවට එහා පැත්තේ අවන්හල ළඟ පිළුණු බත් කන්න පෝලිමේ හිටපු හැටි. ඊට පස්සෙ දඳො වීදියේ ලොතරැයි වික්ක හැටි. ඒ කිසිදු සිද්ධියක දී මා නිසා කිසිවෙකු සිත රිදවා ගෙන නැත. මට අම්මා ත්, තාත්තා ත්, සිහි වි ය. මගේ පපුව හොස් ගා පත්තු වි ය.

'එක්කෝ ඔයා විහින් නැතිවෙන්න හදනවා. නැත්නම් අපෙන් පළිගන්න හදනවා.'

දුල්පැව චෝදනා ස්වරයෙන් කීවේ ය.

'මට පළිගන්න ඕන තමයි.'

මා එසේ කියූ විට එය අවට දෝංකාර දුන්නා දැයි මා දන්නේ නැත. එහෙත් බොහෝ වේලාවක් මගේ ආත්මය දෝංකාර දෙන්නට වි ය. කාර්යාලය නිහඬව තිබිණ. මහා පාලු මූසල පෙනුමකින් හාත්පස මැලවී තිබිණ.

'ඔයා ඔහොම කතා කරද්දී මට ආදරයක් හිතෙනවා. මට ආසයි තරක හිතක් නැතුව ඔය සුදු මූණ ඉඹින්න...'

'ඇයි මගෙන් මස් රාත්තලම ඉල්ලන්නේ.'

'මං පොරොන්දු වෙනවා ලේ බිංදුවක්වත් හොල්ලන්නේ නැතුව....'

'මාව මස් කරනව කියලා.'

මම කඩා පැන්නෙමි.

'ඔයාට ආදරේ කියන එක තේරෙන්නේ නෑ.'



'ඔය කියන ආදරේ තේරුම් ගන්න මට ඕන නෑ. උදේට පුතා හෝටලේට අරන් යනවා. හවසට තාත්තා කාර්යාලයට අරං එනවා. ඔයගොල්ලන්නට වගේම තමයි අපිටත් පංචස්කන්දයක් කියල එකක් තියෙනවා. සෙල්ලම් බඩු නෙවිනෙ.... රස්සාව වෙනුවට මට මෙතන වෙන නාඩගමක් නටන්න වෙලා....'

මම එක එල්ලේ උත්තර දුන්නත් එක එල්ලේ ඔහුගේ මුහුණ නොබැලුවෙමි. දුල්ලැවගේ පෞරුෂය බිඳී ගියා දැයි මට දැන ගැනීමට නොහැකි වූයේ එ හෙයිනි. ඒත් ඔහුගේ මුහුණ රතු වෙන්නට ඇත. පුංචි ඇස් දිලිසෙන්නට ඇත. අවංක ත් නැති වංක ත් නැති ඔහුගේ ඉරියව් මම අනුමානයට සිතා ගතිමි.

# 3

සිහින් කැරකිල්ලක් දැනුණෙන් මම මගේ නළල අත ගා බැලුවෙමි. නළල ඉදිමී තිබිණ. ගෙඩි ගැසී තිබිණ. අතේ වේදනාවට සිරුර කිළිපොලා යයි. නළලේ උලා තිබුණු 'බාම්' වර්ගයක සුවඳ මම ආඝ්‍රාණය කළෙමි. මගේ උඩුකය ම සෙත බරිත වී තිබිණ. බ්ලවුසය ශරීරයට ඇලී ගොස් ය.

'මම කොහොමද මෙතෙන්ට ආවේ?'

'මමත් එක්ක. ඔයා කලන්තෙ දැම්මම සිකුරිටිට කියල උඩට උස්සන් ආවෙ. ඇයි ඉතින් බෙල්ට් එක දාගන්න කිව්වම දාගන්නවයැ. ඔළුව වැදුණෙ ඩෑෂ් බෝඩ් එකේ. කලබල වෙන්න දෙයක් නෑනේ. මෙතන අපිට අලුත් තැනක් නෙමෙයි. මේක අපේ ඔෆිස් එක.'

'ඇයි මගේ ඔළුව හැප්පුවෙ, මරන්නේ නැතුව...'

'මම මිනීමරුවෙක් නෙමෙයි. ඒත් මාව මිනීමරුවෙක් කරන්න එපා..'

'ඔය වගේ සල්ලිකාරයින්ට මිනී මරන එකත් සුළු දෙයක් කියල මං දන්නවා. ඒත් මං මැරෙන්න බය නෑ.'

'මං සිටියෙ ඔයාට නෙමෙයි.'

'මට කියල විශේෂයක් ඔයගොල්ලන්ගේ තියෙන්න විදිහක් නෑ.'

'තියෙනවා, සත්තකින්ම මං කවදහරි නෝනාට ඒක ඔප්පු කරලා පෙන්නනවා. මං මගේ ජීවිතේ වගේ ඔයාව ආරක්ෂා කරනවා...'

ඔහු මගේ හිස අත ගෑවේ ය. සත්තකින් ම එය ළෙන්ගතු ය. මම කීකරු වීමි. ඔහුගේ දෑසේ තිබුණේ රාගයක් ම නොවේ. වචනවලට දැමිය නොහැකි ඉල්ලීමකි. මෝරා ගිය අසරණකමකි.



'මට මේක විසඳගන්න වෙන්නෙ මගේම පුතා එක්ක. එයා කළේ සමාව දෙන්න බැරි වරදක්. එයා ඔයාව අවුල් කළා. මගේ පුතා උණත් එයාට ඔයාව විනාශ කරන්න දෙන්න බෑ. පාරෙ ඉන්න හිඟන දරුවෙක් අරං ඔයා කොහෙද ගියේ? පිස්සු වැඩක්නේ නෝනා?'

ඔහු මගේ තුවාල වූ පරඬැල් අත ගෙන පිරි මැද්දේ ය. ඉර ගිලී බොහෝ වේලා ගත වන්නට ඇත. රෑය සහ අඳුර පිළිබඳ බිය මට තිබුණේ නැත. දෙතෝදහසක් ගැවසෙන කාර්යාලය ශූන්‍ය මුඩු බිමකි. තව ටිකකින් සඳ නැගෙනු ඇත.

'ඔය ගොල්ලන්ට ඒ දුක දැනෙන්නෙ නෑ. ඒ දරුවට හොඳටම උණ. මම වඩා ගත්තම මට දැනුණෙ, ගිනි මැලයක් වගේ. පපුව සද්දේ ගොර ගොර ගානවා. මං ටික දුරයි ගියේ .... බෙල්ල කඩා වැටුණා. මගේ උරහිසට. ඇඟ පණ නැතුව ගියා. දත් ඇඳි පුට්ටු වුණා. මං දැනගත්ත 'පිට්' එක හැදිලා කියලා. ඒකයි මං අත දැම්මෙ කට ඇතුළට ... ඒ ළමය නොදැනුවත්වම අත හිල්වෙන්න මාව විකුව... ඒ වෙලාවේ තමයි පොලීසියට අහුවුණේ...'

මම හිස පහත් කොට ගෙන කීවෙමි. තරප්පුව දිගේ ඉහළ මහලට එන හුරුපුරුදු සපත්තු සද්දයක් ඇහුණේ එ විට ය.... විශ්ව. මම ගල්හිත වීමි. ඉලංගකෝන් දුල්ලෑව නැඟී සිටියේ ය.

'උඹ මොකටද මෙහෙ ආවේ?'

දුල්ලෑව විශ්ව ඉදිරියට ගියේ ය. විශ්ව සන්සුන් ලෙස අසළ පුටුවේ වාඩි වී ය. ඔහු උත්තර දුන්නේ ගණනකට නොගෙන ය.

'අප්පච්චිගේ නාඩගම් බලන්න.'

'උඹට ඕන දේවලුත් තියෙනවා. එපා දේවලුත් තියෙනවා. උඹ දැනගනින් ඉස්සෙල්ල උඹ කවුද කියලා.'

දුල්ලෑව බෙරිහන් දුන්නේ ය. විශ්ව තවමත් සන්සුන් ය.

'අප්පච්චිට සුදුසු දේවලුත් තියෙනවා. නුසුදුසු දේවලුත් තියෙනවා. අප්පච්චි ඉස්සෙල්ලා දැනගන්ඩ තමන්ගේ වයස මොකක්ද? ඉන්න කොතනද? කතා කරන්නෙ අප්පච්චිගෙම පුතාට කියල.'

'මං ඉන්නෙ මගේ තැන. මෙව මං හම්බ කරපුවා. මගේ ජීවිතේට ඇඟිලි ගහන්ඩ උඹට අයිතියක් නෑ. උඹට දීලා තියෙන රාජකාරි ටික උඹ කරපං.'

විශ්ව පරාජය භාර ගත්තේ නැත.

'මං ඉන්නෙ අපේ අප්පච්චිගේ තැන. මං අප්පච්චිගේ එකම පුතා. ඒත් අප්පච්චිට අයිති රාජකාරිය මොකද කියලා මට දැනගන්න අයිතියක් තියෙනවා. මගේ අම්මා වෙනුවෙන්...'

'එයාට මං අඩුවක් කරලා නෑ.'

මම නුවුවෙන් නැඟී සිටියෙමි. බෑගය අතට ගතිමි. රාත්‍රියට දැස විනිවිද යැවීමි. මම මගේ අසරණකම ශක්තියක් කොට ගතිමි.

'මේක කවුරුවත් විශ්වාස නොකරන කතාවක් වෙයි. මං යනවා ආයෙ මෙතන පස් පාගන්නෙ නෑ.... ඒත් මේ ලෝකේ ගෑණු කට ඇරපු දට හුඟක් පිරිමින්ට කටවල් වහගන්ඩ වෙන බව දෙන්නම මතක තියා ගත්තොත් ඉස්සරහට හොඳයි.'

විශ්ව වහා නැඟී සිටියේ ය. ඔහු මගේ අතින් අල්ලා ගත්තේ ය.

'නේත්‍රා කොහේ යන්නද? යන තැනකට යමු මාත් එක්ක.'

'මං කෑ ගහනව මිනී මරනවා කියලා.'

මගේ ස්වරයේ වූ දැඩි බවින් තැති ගත් විශ්ව වහා මගේ අත අත් හැරියේ ය. වෛරයෙන් ගිනියම් කර ගත් දෑස දුල්ලෑව දෙසට හරවා බමවන්නට වී ය.

'තාකි පරයන්ට මනමාල විසේ ගහලා තියෙන්නේ. මට උඹට අප්පච්චි කියන්නත් ලැජ්ජයි.'

විශ්ව ළඟ ම තිබුණු පුටුවට පයින් පහර දුන්නේ ය.

'බෑනැපිය ගහලයා මෙතනින් එළියට. උඹට මං මගේ කිසි දෙයක් දෙන්නේ නෑ. උඹ මට ඕන විදිහට නොහිටියොත්.'

'අප්පච්චි හිතන්නෙ මං තවම කාමරේ ඇතුලෙ හුජ්ජ කරගන්න පොඩි එකා කියලා. මට මිය දේවල් හැමදම බල බලා ඉන්න බෑ. මටත් පිරිමිකමක් කියල එකක් තියෙනවා.'



විශ්ව තරමක් හික්මුණු හඬින් කීවේ ය.

'උඹේ පිරිමිකම උඹ – උඹට ඕන කෙල්ලෙකුට පෙන්නපං. මේ අහිංසක කෙල්ල අතෑරලා.'

'අප්පච්චි ඕන කුපාඩිකමක් කරගන්න වෙන ගෑණියෙක් එක්ක. මං නේත්‍රාට ඇත්තටම ආදරේ කරනවා. මං කවදහරි නේත්‍රා බඳිනවා.'

දුල්ලෑවට එසේ කියූ විශ්ව මදෙසට හැරුණේ ය.

'මං යනව නේත්‍රා. ඒත් මතක තියාගන්න මං කවදාකහරි ඔයා මගේ ළඟට ගන්න විත්තිය. මැරෙන්න මොහොතක් තියල හරි ඔයා මගේ බිරිඳ කරගන්න විත්තිය.'

සඳ බැස යන්නට හිතලා වත් නැත. තාරකා දිලෙන්නේ රාත්‍රියට පිපෙන්නට මෙන් ය. කළුවර ඇස් ලබන්නේ එහෙම ය. අඳුර රාත්‍රියට අත වනමින් සිටියි. සඳ පොළොවට එබුණේ නැත. මට පෙනුණේ වෙඩි වැදුණු යෞවනියකගේ සඳ මුහුණකි. මම අහසේ තැන තැන විසිරී තිබුණු තාරකා ලේ බින්දු දෙස බැලීමි. කළු වලාකුළු රහසේ ඔත්තු බලන්නට ඇත.

පෙණහැල්ල සැහැල්ලු වන තෙක් මහා හයියෙන් හිනා වෙන්නට මට ඕනෑ වි ය.

'යන තැනකට යමු මගෙත් එක්ක.'

ඉලංගකෝන් දුල්ලෑව නැවතත් ආයාචනය කළේ ය.

දෙපා ළඟ පතිත වන්නේ මනෝරම්‍ය ප්‍රේමය නොවන බව මම දැන සිටියෙමි. උස මහත හැඩි දැඩි ප්‍රතාපවත් පෞරුෂයක සිහින් ස්වරය මම අවිශ්වාස කළෙමි. ඔහුගේ මුහුණේ සිහින් නෙත් ඔහුගේ අභ්‍යන්තරය විනිවිද යාමට ප්‍රමාණවත් වූ කවුළු දොරක් නොවී ය. ඔහු මගේ දිගු නෙතට එබී බැලී ය.

'යමු බෝඩිමට මම ගිහින් දාන්නම්.'

ගාලු පාරේ ප්ලොරසන්ට් එළි තාරකා රංචු පරාජය කළේ ය. ඒත් ඒවා දේවතා එළි නොවී ය. රාත්‍රියට හෙමින් නිවෙන්නට ඉඩ දිය යුතු ය. සෙමින් සෙමින් ගෙවී යන අනන්ත හෝරාවට

For E-Pusthakalaya

මම ඉව දුනිමි කාලයට හා අවකාශයට සාපේක්ෂව දුල්ලැට මා පසු පස නතර වෙමින් සිටියේ ය.

කතා කරන්නට කිසිවක් ඉතිරි නොවන විට සොබා දහම අපේ පිහිටට එයි. චික්මින් පාරට වාහනය හරවන ගමන් ම දුල්ලැව සොබා දහම සාක්ෂිකරුවෙක් කොට ගත්තේ ය.

'පෝය ළඟයිද නේත්‍රා...?'

මම මුනිවත රැකිමි. ත්‍රීවීලරයක් බෙන්ස් රථයට ඉස්සර කළේ ය. චික්මින් පාර අයිනේ මන්දිරයක මුරකරුවෙක් තුවක්කු කළේ සීතල මුහුණට වාත්තු කරමින් නිදි කිරමින් සිටියේ ය.

එහෙත් වෙඩි උණ්ඩයක උණුසුමින් ඔහුගේ හදවත දැවෙනවා විය හැකි ය. පහන් කණු යට හාත්පාදනන ගැහැණු තොරිස්සුම් බැලුම් හෙළමින් සිටිති. ඉදිරියෙන් ආ වාහනයක එළියට දුල්ලැවගේ දිලිසෙන තොල් සහල මම හදුනා ගතිමි.

'මේ වාහනයක සැප මට දැනෙන්නෙ නෑ නේත්‍රා. මට දැන් සල්ලිවල වටිනාකමක් නෑ. රාත්‍රියට අඳුරේ උණුසුමක් නෑ. මට මගේ කියල දුවෙක් නෑ. මට මගේ ආත්මයත් නැති කරන්න එපා. මට කියන්න ඔයාට මගේ ජීවිතෙන් මොනවද ඕනකරන්නෙ කියල.'

නොදැනුවත්ව ම මම ඔහුට එකඟ වෙමින් සිටියෙමි. වෙනත් කළ හැකි දෙයක් මට නොතිබුණා නොවේ. එහෙත් මගේ යටි සිත ඔහුට ඉඩ දීමට පෙලඹිණ. විශ්ව හා පියා අතර ඇවිළෙන ගින්නෙහි කොටස්කාරියක වීමට මම අපේක්ෂා නොකළෙමි. ලෝකයා පිළිනොගත්තත් මම ඔවුන්ගේ අර්බුදයේ ප්‍රධාන භූමිකාව වී සිටියෙමි. ඉලංගකෝන් දුල්ලැව පිළිබඳ සුවිශේෂයක් ද මසිතේ ශේෂ වෙමින් තිබිණ. මසිත ඔද්දල් වී ය. එය ප්‍රේමයක් නම් නොවේ. ඔහු ප්‍රේමය ඉල්ලා සිටියේ ද නොවේ. මම පිළුණු වෙමින් පැවති රාත්‍රියට දෑස් යොමු කළෙමි.

'මට ඕන මෘදු සිතකුයි, ස්ථිර විශ්වාසවන්තයෙකුයි විතරයි.'

මම ඔහුගේ මුහුණ නිරීක්ෂණය කරමින් කීවෙමි.

දුල්ලැවගේ මුහුණ ප්‍රබෝධවත් වනවා මම දුටිමි. ඔහු කෙරේ බොහෝ සේවක සේවිකා වන්ගේ තිබූ බිය මසිතේ ඔහු කෙරේ හට ගත්තේ නැත.



'නේත්‍රාට පුළුවන් සදකාලිකව මං ළඟ ඉන්න. ඔයාගේ විශ්වාසය මං රකින්නම්. ඒත් මෘදු සිතක් මං ළඟ තියෙනවද කියල තීරණය කරන්න කාලයට ඉඩදෙමු.'

කාරය කිරුළපන පාර පසු කොට දකුණට හරවා කොහුවල දෙසට ඇදෙන්නට වි ය. ටයරය කාපට් පාරේ ගැටෙන විට නැගෙන 'සට සට' යන හඬ මිස වෙනත් හඬක් දෙසවන පතිත වූයේ නැත. මසිත සුදුහම පැදුණු තුවාලයකට අයිස් කැටයක් තිබ්බාක් මෙන් රිදුම් දෙන්නට වි ය. මට අවැසිව තිබුණේ තුවාලයට උණු වතුර වත් කරන්නට ය. එයින් දැනෙන තාවකාලික සහනයට ඇළුම් කරන්නට තරම් මසිත විස්සෝප වී තිබිණ.

'දැන් නේත්‍රා කල්පනා කරන්න එපා. ටික දවසක් බෝඩිමේ ඉන්න. විශ්ව ගෙදර ගිහිල්ල මොන ජංජාලයක් නැටුවද කවුද දන්නෙ?'

ඔහු කාරය නවතන ගමන් කීවේ ය. වැලි යි රට කජු යි එකට දැමූ ගිනි කබලක් මෙන් මගේ හිස් කබල රත් වන්නට වි ය. අයිස් ගොඩක සිටි මාළු කුරියෙකු මෙන් මම කාරයෙන් බැස ගතිමි. හුදෙකලාව බෝඩිත් කාමරයට රිංගන විට තිවැසියෝ මදෙස වපරැසින් බැලූවේ වෙසඟනක් ගෙට ගොඩ වන විට ඇති වන පිළිකුල් හැඟීමකින් මෙනි. මම දොර වසා දෑත පපුවට ගුලි කොට මසිත ම පාලනය කොට ගතිමි.

මේ ප්‍රභාතයේ සූර්ය මහෝදය යි. තුරුපත් අතරින් හිරු කිරණ රේඛා යහන මත දිග ඇදෙන්නට වි ය. මම යහනින් නැගිටින්නට කම්මැලි වීමි. දෙල්ගසේ වසා සිටි කුරුලු පැටවුන්ගේ 'කිචිබිචිය' මට අවකාශයට අඩ ගසන්නාක් මෙන් වි ය. අවකාශයේ සිහින් අරුණැල්ල මම දෑසට අවශෝෂණය කොට ගතිමි. උදයක සුවඳ විඳින්නට මට ඕනෑ වි ය. පාවහන් නැතිව තැවුම් පොළොවේ ඇවිදින්නට මට අවැසි වී ය. සීතල අයිස් වතුර වැටෙන දිය කඩිත්තකට අල්ලා හිස පොහවන්නට සිතිණ. සත්තකින් ම ස්නේහවන්ත යෞවනයෙකුගේ පුළුල් උරතලයක මුහුණ හොවා ගෙන සිටින්නට ද මට ඕනෑ වි ය. මම කවුළුව විවර කළෙමි. 'සරාප්' යන හඬින් ගෙහිමි කාන්තාව ඉඳුල් වතුර කොරහක් කරපිංචා ගහ මුලට හැළුවා ය. මසිත පිළුණු වි ය.

දින කුහක් සමඟ මම කාමරයේ හුදෙකලා ව සිටියෙමි. මට විඳ ගන්නට සිදුවුණේ වේදනාව සමඟ මිශ්‍ර වූ සීතල පමණි. හිමිදිරියේ සිරෙන ප්‍රභාතය ගොම්මන් කළුවර ත් සමඟ වියැකී යයි. කළුවර ත් සමඟ අනියත බියක් හදගැබේ දෝංකාර දෙයි. ටිකින් ටික මම එයට හුරු වීමි. විජේවගේ ලිපිය ලැබුණේ ඒ අතරතුර ය.

තෝත්‍රා.

සමහර විට මා සතුට කරන පළමු සහ අවසන් ආමන්ත්‍රණය මය වන්නට පුළුවන්. මය වයසෙ කෙල්ලෙක් ඉස්සරහ ආයාචනා [illegible] න්න තරම් මගේ හිත පහත් තත්ත්වයකට පත්වුණේ ඇයි ද [illegible] පුළුඉත්කාවක් තුටව හැන්න වලව්වකින් ඉඩකඩම් [illegible] මගේ අම්මටයි අප්පච්චිටයි තව්ව පුළුවන්. කුරුඳුවත [illegible] කොළඹ නගරෙ හැම වංකගිරියක්ම දන්න මට කෙල්ලෙක් හොයා ගන්න එක කඩේකින් බීම බෝතලයක් ගන්නව වගේ වැඩක්. ඒත් මගේ පිපාසය ඇද හැලෙන ගංගාවකට සන්සිඳුවන්න බෑ. මට ඕන දිය කඩිත්තක්.

මම ඔයාව හෝටල් කාමරයකට එක්කගෙන ගියෙ ඔයාව අනාථ කරන්න නොවේ. ඔයාව තනි කරගෙන හුඟක් දේවල් කියන්න. ඒත් ... මට මාව පාලනය කර ගන්න බැරි වුණා. අප්පච්චි මාව එංගලන්තෙට යැව්වෙ මැනේජ්මන්ට් කෝස් එකක් කරවල අප්පච්චිගේ ව්‍යාපාර දියුණු කරවන්න. ඉන්ජෙක් කරන්න කියලයි මට හිතෙන්නෙ. මං ඒ දේ හරියට කරගෙන ආව. ඒත් මට දැන් මගේ ජීවිතේ එපාවෙලා. ලංකාවට ඇවිල්ල ඉස්සෙල්ලාම ඔෆිස් එකට ආව දවසෙ මගේ ඇහැට අහුවුණේ ඔෆිස් එකේ තිබ්බ ෆයිල් ගොඩ නෙවේ. අප්පච්චිගෙ වෙක්ෂොත නොවේ. කෙලවරේ මේසෙක පුංචි තිතක් වගේ හිටිය ඔයා. මතකයි නේද ඔයා දිහා මං හුඟක් වෙලා බලාගෙන හිටිය? මම උත්සාහ කළා ඔයාව මගේ ඇස්වලට දියකර ගන්න. ඒත් ... මට ඒක කරන්න හම්බ වුණේ නෑ. මම දැක්කා පුංචි කඳුළු කැටයක් ඔයාගෙ ඇහි පිල්ලමක බරවෙලා තිබුණ. මට අදත් ඕන ඒ ඇයි කියල හොයා ගන්න.

ඔයා හිතයි මං ආයෙත් කවි භාෂාවෙන් කතා කරනව කියලා. ඔව් මං ආසයි එහෙම වෙන්න. මට දැන් අමුවෙන් කුණුහරුප කතා කරලා එපා වෙලා. එංගලන්තෙ අවුරුදු ගානක් හිටපු මට ගැණු



අරුමයක් නෙමෙයි. ගැණු ශරීරය අරුමයකුත් නෙමෙයි. ඒත් මට තෝත්‍රා අරුමයක්. පුදුම ලස්සනක්. ගැණු එහෙම කිව්වම අහංකාර වෙනවා. ආඩම්බර වෙනවා. කමක් නෑ – ඔයා ආඩම්බර වෙන්න. අහංකාර වෙන්න. ඔයා හරිම නැවුම්. මං පිස්සු හැදිල වගේ ඔයා පස්සෙන් එළවන්නෙ ඒකයි. මගේ පව්කාරකම, ඔයාට මේව නොතේරෙන එක. ඔයාගේ පව්කාරකම ඔයා අප්පච්චිට රවටෙන එක.

ඒත් අප්පච්චි හුඟක් දුර ගිහිල්ල. මට හිතුණ අප්පච්චි මට වැඩිය දක්ෂයි කියල. දැන් මං මගේ අප්පච්චිට වෛර කරනව. මං දන්නෙ නෑ මේක කෙළවර වෙන්නෙ කොතනින් ද කියල. ඒත් .... මට කෙළවරක් දකින්න ඕන. මගේ ජීවිත ඉලක්ක ඔක්කොම ඔයා ළඟ කේන්ද්‍රගත වෙලා ඉවරයි. මට දැන් ජයගන්න දෙයක් තියෙනව. ඒ තෝත්‍රා මගේ ළඟට ගන්න එක. මං මේ ලියුම ලියන්න ඔයාට තර්ජනය කරන්න නොවේ. හොඳින් හරි නරකින් හරි මගේ ඉලක්කය ජයගන්න බව ඔයාට මතක් කරන්න.

අප්පච්චි කොච්චර දුර ගිහින් ඉන්නවද කියල මම දන්නෙ නෑ. ඒත් අප්පච්චි දැන ගන්න ඕන මගේ වේගය අප්පච්චි පරාජය කරන්න පුළුවන් එකක් කියල. සමහර වෙලාවට මේකෙ තීරණාත්මක සාධකය මගේ අම්මා වෙන්නත් පුළුවන්. මං මේ එක්කම අම්මටත් ලියුමක් ලියනවා. අම්මා තීරණය කරයි අප්පච්චිට දෙන දඬුවම මොකද්ද කියල. එතකොට අප්පච්චිට තීරණය කරන්න වෙනව එයාට වැඩිය වටින්න එයාගේ බිරිඳ ද, එයාගෙ ව්‍යාපාරෙ ද, එයාගෙ ගරු නම්බුව ද එහෙම නැත්නම් එයාගෙ එකම පුතා වෙච්ච මම ද කියල. මොකටවත් සම්බන්ධ නැති තෝත්‍රා කියල තීරණය කළොත් විතරයි එයා දිනන්නෙ. එදාට මම හිතා වෙද්දි අප්පච්චිට අඬන්න වෙනවා. මං කැමති නෑ මගේ අප්පච්චි අඬනවාට. ඒත් මං කැමති මේ සිද්ධියෙදි මගේ ඇහේ කඳුළු අප්පච්චිගේ ඇහේ තියෙනව දකින්න.

මං විජේ,

මම ලිපිය හොඳින් කියවා කොට්ටය යට තැබුවෙමි. ස්ථිර ලෙස ම මේ සිද්ධි මාලාවේ වග උත්තරකාරිය වනවා හැර මට කරන්නට පැමිණිල්ලක් ඉතිරි වී තිබුණේ නැත. මා පැමිණිලි කරන්නේ කාට ද?

කලු නූප්පා ගත් සූර්යයා අහස දිග් විජය කරමින් සිටියේ ය. මුහුණේ තුන් පැත්තෙන් ම දහදිය වගුරුවා ගත් විශ්වගේ පියා බෝඩිමේ ගේට්ටුව අහ විස්මිත්තව සිටිනු මා දුටුවේ ඒ විට ය. බෝඩිමේ හිමිකාරිය සමඟ දොඩමලු වන ඔහු දෙසට ගමන් කල මම තුන්වැන්නියක් වීමි. සැණෙකින් මදෙස වපරැසින් බැලූ ඇ ඇඳිවත පිහා නැවත අඩිමින් බෝඩිමේ පිළිකන්න පැත්තට ගමන් කළා ය.

'නේත්‍රා, ඉක්මනින් බෝඩිම මාරු කරන්න. විශ්ව එයාගේ අම්මට ලියුමක් එවල. හැම දෙයක් ම කල්පනාවෙන් කළේ නැත්නම් ඔයාට අනතුරක් වෙන්න පුළුවන්. ඉක්මනින් බඩු ටික ලෑස්ති කරගන්න.'

'බෑ.'

'මේ වෙලාවේ මුරණ්ඩු වෙන්න එපා. මේ වෙලාවේ ඔයා ආරක්ෂා කළේ නැත්නම් මට මගේ මුළු ජීවිතේත්ම ඒකට වන්දි ගෙවන්න වෙනව.'

'මට පුළුවන් හැමදේකටම තනියෙන් මුහුණ දෙන්න.'

'ඔයා එනවද නැද්ද?'

'කවුද දන්නෙ මාව මරන්න ගෙනියනවද කියල?'

'මං හදන්නෙ ඔයා මරණෙන් බේරගන්න.'

'ඒ කියන්නෙ අම්මල, පුතාල, තාත්තල මාව මරන්න කුමන්ත්‍රණය කරල. ඒත් මං ඒකට ලේසියෙන් ඉඩ දෙන්නෙ නෑ. ඔයගොල්ලන්ට වගේ මට රකින්න දෙයක් නෑ. හුගක් දේවල් රැකගන්න මාව බිලිදෙන්න පරම්පරාවෙ සල්පිළි ගැලවෙන්න පුළුවන්. ඒ නිසා කරුණාකරල මෙතනින් යන්න.' කියනවා. එදට දුල්ලෑව

පසුවේ කෙතමතයක් වුණත් නොවුණත් දුල්ලෑවගේ ඇස්වල කඳුළු පිපුණේ ය. පුංචි ඇස්වල කඳුළු. මම බිම බලා ගතිමි.

'නේත්‍රා...'

'ඇයි...?'



'මං ඔයාව ආරක්ෂා සහිත තැනක නවත්තන්නම්... එන්න....'

'මට බෑ.... මට බෑ....'

තරමක වේගයෙන් මම කිවෙමි. පසුවට වැටුණු උණ්ඩයක් එළියට ඇද දමන්නාක් මෙන් මට නිදහස් වීමට ඕනෑ වි ය. ළය සැහැල්ලු කර ගන්නට ඕනෑ වි ය. මුසල හෙවණැලි පොළොවට වැටෙන්නට පෙර තීරණයක් ගැනීමට මට ඕනෑ වි ය.

'නේත්‍රා....'

'කියන දේ අහල එන්න....'

'මොන මළ සොහොනකට මාව ආයෙත් ගෙනියනවද කවුද දන්නෙ....? බෝඩිමේ මිනිස්සු හිතාගෙන ඉන්නේ මං ඔයගොල්ලන්ගේ අතින් අත මාරුවෙන නරක ගෑණියෙක් කියලා. දැන් ටික දවසකට ඉස්සර විශ්ව ඇවිත් මගදි මාව කාරෙකට දාගන්නව බෝඩිමේ ඇන්ටි දැක්කා. එදාම රෑ මෙහෙට ගෙනත් දානවත් දැක්ක. දැන් ආයෙත් කළුවර වැටීගෙන එද්දී මාව ගෙනියන්න හදනවා. ඇයි මාව සල්ලං වෙච්ච ගෑණියෙක් කරන්න හදන්නෙ. ඔය ඇස්වල කඳුළු තියෙනව දැක්කම මට දුකක් හිතෙනවා තමයි. ඒත් මට මේ වෙලාවෙ මෙතනින් එළියට අඩියක් වත් තියන්න බෑ...'

'විශ්වගේ අම්මා මොන තීරණයක් ගනීද කියල මං දන්නෙ නෑ....'

'මං මේව ඔක්කොම කියනවා පොලීසියට.'

'ඇයි ආදරේ බිංදුවක්වත් නැතුව කථ ...?'

'මට කියන්නෙ මිස්ට දුල්ලෑව වගේ ගතළිස් පහක විතර මිනිහෙක්ගෙ පෙම්වතිය වෙන්න

'ඔව්...'

'මට එච්චර පිස්සුවක් නෑ.....'

ඔහු මගේ අතින් අල්ලා ගත්තේ ය.

'ඔව්... ඔයා හින්ද මටයි පිස්සු....'

'තාත්තයි.... පුතයි දෙන්නම අංගොඩ ගෙනියන්න වෙයි වගේ...'

නොගෙන සිටියෙමි. අලුත් මන්දාරමක් මා සොයා

මම ගණනකට නොගෙන සිටියෙමි. ඉඩෝරයට ඉරිතලා ගිය වෙල් යායක් එන බව මම සිතා ගතිමි. ඉඩෝරයට ඉරිතලා ගිය වෙල් යායක් මෙන් දැස සුසුරු ගසන්නට වී ය. දුල්ලැවගේ ඇඟිලි වෙව්ලන බව මට වැටහිණි. කඩ මණ්ඩියේ සිට පා පැදියක ගිය කොලුවෙක් අප දෙසට උරුහන් බැලී ය. දෙල් ගහේ සිටි කපුටෙක් බෙන්ස් රථය මතට තව් වසුරු පිඩක් හළා පියැඹුවේ ය. බෝඩිමේ ඇන්ටි දෙවරක් සාලයේ දොර විවර කොට 'දඩාං' ගා වසා ගත්තේ ය. හිසේ බුරුල් වී තිබුණු කොණ්ඩ කටුවක් ගලවා මම නැවත ගසා ගතිමි. ඈත සිට තනිවෙච්ච ඉද්ද මලක් මදෙස බලා සිනා සෙන්නට වී ය.

'මේ ලියුමත් කියවලාම තීරණයක් ගන්න....'

මම වටපිට නොබලා ම ලිපිය ගෙන කියවන්නට වීමි.

මේක තමයි විජේ අම්මට එවලා තිබුණේ.'

'ආදරණීය අම්මාට...

මම දැන්ම ඔය ගෙදරට පය ගහන්න බලාපොරොත්තුවක් නෑ එදා මං ඔෆිස් එකෙන් පිටවෙලා ආවෙ මේසේ විසඳුමක් හොයා ගන්න. මං හොඳින් ඉන්නවා. අම්මා මං ගැන හිතලා දුක් වෙන්න එපා.

අම්මාට පුදුම ඇති ඇයි මේ කොහේවත් යන කෙල්ලෙක් හින්ද මං මැරෙන්න හදන්නෙ කියලා. මං මේ අම්මාට ඇත්තමයි කියන්නේ. මට නේත්‍රා විවාහ කරගන්න හිතෙන වාර අනන්තයි. අම්මා තිගැස්සෙන්නෙ අම්මත් දන්නවා ඒ කෙල්ලගේ මොකක්දෝ කියාගන්න බැරි ආකර්ෂණයක් තියෙන බව. අම්මා හොඳට බලන්න. ළඟට ගියත්, දුරට බැලුවත් නේත්‍රා වාත්තු කළා වාගේමයි. ඇඟි පිල්ලමක් ගැහුවත් වචන දාහක් කතා කළා වගේ. මං දවසක් හොඳට බලා හිටිය එයාගේ ඇඟේ පාට, සොබාදහම එහෙම ලස්සන දෙන්නෙ ඇයි කියල මට හිතා ගන්න බෑ. අම්මම හිතන්න එච්චර ලස්සන කෙල්ලෙක්ගේ ඇස් කෙලවරේ දිලිහි දිලිහි කඳුළු කැටයක් තියෙනවා දැක්කම මගේ වයසෙ කොල්ලෙක්ගේ හිත තිගැස්සෙන්නෙ නැතුව තියෙයි ද?

මං හොඳටම දැනගෙන හිටිය නේත්‍රා වගේ කෙනෙක් මාව විවාහ කරගන්නවාට අම්මල කැමැති නොවෙන බව. ඒත් මං ඊට



ඉස්සෙල්ල නේත්‍රාගෙන් ඇහුව. එයා බෑ කිව්වා. මං දවසක් ඔෆිස් එකේ පඩිපෙළ බහිද්දී අතින් ඇල්ලුව 'තමුසෙට පිස්සුද...?' කියල ඇහුවා. ඒත් මං කල්පනා කළා.... මට තමුසෙ කියන්න තරම් බලයක් නේත්‍රාට ආවෙ කොහොමද කියලා.

නුවර පේව්මන්ට් එකේ හිටපු කතාව නේත්‍රා කියන්නෙ මෝස්තරේට. නේත්‍රාගෙ තාත්තා ගාල්ලෙ අම්බලන්ගොඩ කෙනෙක්. ඒ ගොල්ලන්ගෙ අම්මා නුවර මහයියාවේ. ඉස්සර කටුගස්තොට පාලමට මෙහා තමයි ඉඳලා තියෙන්නෙ. පාලමට මෙහා තියෙන පංසලට දකුණු පැත්ත පොල් අතු අටෝගෙන. පස්සෙ ඔය ගෙවල්වලින් මේ අය එළවල දමල. නේත්‍රාගේ තාත්තා නුවර මාකට් එකේ ඉස්සර අන්නාසි විකුණල තියෙනවා. නම ධන්කත් සිල්වා. ඒ කාලේ මේ අය මාස තුන හතරක් පේව්මන්ට් එකේ ඉඳලා තියෙනවා තමයි. ඊට පස්සෙ තමයි මාතලේ පාරේ පදිංචි වෙලා තියෙන්නෙ.

දැන් ඔය පේව්මන්ට් එකේ කතාව කියන්නෙ මොන හේතුවක ද කියල මං දන්නෙ නෑ. අම්මලා නොදන්නව වුණාට මං දවසක් හොරෙන් ගිහිං නේත්‍රාගේ අම්ම තාත්තටත් කතා කළා. මේක [illegible]නේත්‍රා දන්නෙත් නෑ. අහිංසක මිනිස්සු. මං ඇත්තටම හිතා ගත්තා නේත්‍රා බඳින්න ඕන කියලා. ඒත් ඒ කෙල්ල මට පුංචි ඉඟියක් [illegible] නෑ.

අපිට අපේ අප්පච්චි උතුම් කෙනෙක් විය යුතුයි කියලා මං පුංචි කාලේ හිතුවා. ඒත් මං දන්නවා දැන් අප්පච්චිලා පිරිසිදු චරිත නෙමෙයි කියලා. ඒකට කමක් නෑ. ලෝකේ එහෙම තමයි. මට ඒක තේරෙනවා. ඒත් මට නොතේරෙන දේකුත් තියෙනවා. මට ඕන ඒ ගනුදෙනුව බේරා ගන්න.

මං එදා ඔෆිස් එකට යද්දී රෑ අටත් පහුවෙලා. නේත්‍රා ළඟ තියාගෙන අප්පච්චි හිටියේ. අම්ම කලබල වෙන්න එපා මෙහෙම කිව්වම. ඒ සම්බන්ධය දුර දිග ගිහිල්ල කියල මට දැන් තේරෙනවා. මට දැනුණෙ මං කොච්චර අසරණයිද කියලා. මට දිනාගන්න බැරි වෙච්ච කෙල්ල අප්පච්චි ළඟටම අරගෙන.

එක්කෝ අම්මල තීරණය කරලා නේත්‍රා මගේ ළඟට අරං දෙන්න. නැත්නම් මං එයාව බලෙන් හරි මගේ ළඟට ගන්නවා. මං පිරිමියෙක්

ForEPothakaloya

මේ ලෝකේ ඉන්න දෙන්නෙ කියල පෙන්නන්න. නැත්නම් මං ඒකිට මේ ලෝකේ ඉන්න දෙන්නෙ නැ.

අම්ම තීරණයක් ගන්න. අප්පච්චිට මේ සම්බන්ධය දිගටම ගෙනියන්න දෙනවද නැද්ද කියලා. පරම්පරාව, සල්ලි, ව්‍යාපාර, පවුල් ජීවිතේ ඔක්කොම බිම් බෝම්බයක් ගැහුව වගේ නැතිවෙලා යයි. මට දැන් අප්පච්චිගෙ මූණ බලන්න බෑ. මට ගෙදර එන්නත් බෑ. නේත්‍රා නැතුවත් බෑ. ඒකි මට ගණන් උස්සන්න හදද්දී මං තවත් ළං වෙනවා. මේ ලියුම අම්ම අප්පච්චිට පෙන්නුවත් මට කමක් නෑ. මං හොඳින් හරි නරකින් හරි නේත්‍රා ලබා ගන්නවා. අම්මා ඉක්මන් තීරණයක් ගන්න.

මං,

පුතා - විශ්ව.

මම ලියුම කියවා ගුලි කොට ගතිමි.

'ඕක මට දෙන්න ....'

දුල්ලෑව කීවේ ය.

'මේක මටයි වැදගත් වෙන්න....'

'ඌ හදන්නෙ ඔයා මරා දාන්න....'

'මට හිතෙන්නෙ එහෙම නෙමෙයි....'

'ඔයා හිත හිතා ඉද්දී පෙරහැර යයි....'

'විශ්ව හදන්නෙ මට ආදරේ කරන්න. මං ඇත්තටම දැනගෙන හිටියෙ නෑ විශ්ව මට ඇත්තටම ළෙන්ගතුයි කියලා. මට විශ්ව ගැන දුක හිතෙනවා. එයා මං ගැන හොයලා. එයා මෙච්චර මට ආදරෙයි කියල මං දන්නව නම් මං කියනවා මමත් ආදරෙයි කියලා. මං හිතුවෙ කොලුකමට මාව රවටන්න හදනව කියලා. මට දැන් හිතෙනවා හොයාගෙන යන්න. ඉන්න තැනකට ගිහිල්ල කියන්න. මං විශ්වට ආදරෙයි කියලා...'

මට තවත් බොහෝ දේ කියන්නට ඕනෑ වී ය. එහෙත් ඉඩක් ලැබුණේ නැත.

'විශ්වගේ අම්ම මෙලහටත් ඔයාව හොයනවා ඇති....'

'ඇයි...?'



'මේ ගනුදෙනුව ඔයත් එක්ක බේරගන්න...'

'ඒත් මං ඉක්මනින් විශ්ව හොයාගන්න ඕන...'

'ඇයි..?'

'එයත් එක්ක කසාද බඳින්න'

'නේත්‍රා මට හතුරුකම් කරන්න එපා....'

'මට දැන් විශ්ව හොඳටම විශ්වාසයි....'

'මං ඔය ලියුම ඔයාට පෙන්නුවෙ ඌ ඔයාව මරන්න හදන බව කියන්න....'

'ආදරේට මිනිස්සු මිනී මරන්නේ නෑ. මිස්ට දුල්ලෑව යන්න. මං මගේ තීරණය ගන්නම්....'

මම පිළිකන්න පැත්තෙන් රිංගා බෝඩිමට ඇතුළු වීමි. සැණෙකින් දුල්ලෑවගේ රථය ඉගිළෙනවා මට ඇසිණ. මම ඉක්මන් වීමි. අතට අහුවෙන රෙදිපෙරෙදි ටික බෑගයට ඔබා ගතිමි. කාමරයේ දොර වසා මිදුලට පැන්නෙමි.

'ඔය ළමය කොහෙද මේ නොකියම යන්නෙ...?'

මම මොහොතකට නිරුත්තර වීමි.

'මම හදිසියකට ගෙදර යනවා. මං මේ එළියට බැස්සෙ ඇන්ටිට කියන්න....'

'මටත් තේරෙනවා දැන් මොකක්ද එහෙකට හදිසියක් තියෙන බව. අයාලේ යන ගෑණු ළමයි මෙහෙ තියාගන්ඩ බෑ. ඔය ළමය ගෑණු ළමයෙක් නේද...? ඒත් හැසිරෙන්නෙ එහෙම නෙමෙයිනෙ. උදේට පුතාත් එක්ක යනවා. රෑට තාත්තා ගෙනත් දානවා. මෙතන හිටපු ගමන් කාර් නවත්තනවා. නාකි මනමාලයෝ මහප්‍ෂාරේ අතින් අල්ලන් ඉන්නවා. ඔය වැඩේ කරන්න බෑ. මීට පස්ස වෙන බෝඩිමක් හොයා ගන්න....'

'මං ලබන සතියේ බෝඩිම අස්කර ගන්නම්. දැන් හදිසියකට ගෙදර යන්න වෙලා....'

'හා... හා... හදිසි නම් යන්න. නාකි මනමාළයා මග බලාගෙන

ඇති...'

මගේ කටට ද හොඳ වචන දෙකතුනක් ආවත් මම කට ප්‍රවේසම් කර ගතිමි. ගොම්මන හොල්මන් කරද්දී මම කඩුල්ල පැන පාරට පිවිසියෙමි. වෑන් රථයක් 'බ්‍රාස්' ගා තිරිංග තද කොට කඩුල්ල ළඟ නතර කළේ ය. මම කඩුල්ලෙන් එළියට දැමූ පය නැවත ආපස්සට ගතිමි. හැඩිදැඩි පිරිමි සිව් දෙනෙක් වෑන් රථයෙන් බිමට බැස්සෝ ය. මම ආපසු හැරී දුවන්නට සිත්වී, එහෙත් සිටි වන ම සිටියෙමි. විල්ටගේ මව ඉදිරි අසුනෙන් බිමට බැස්සා ය. හැඩි දැඩි පිරිමි කුරුමානම් අල්ලමින් මා වට කරන බව ඉවෙන් මෙන් වටහා ගත් මම බෑගය බිම දමා දුවන්නට වීමි. එහෙත් තත්පර කිහිපයකින් ඔවුහු මා අල්ලා ගත්තෝ ය. මම කෑ ගැසීමි.

'මෙන්න මිනී මරනවෝ ..... මාව ගෙනියනවෝ..... මාව බේරාගන්නෝ...'

'කට වහපිය .... නැත්නම් තෝ මරනවා මෙතනම....'

මම දඟලන්නට තතනද්දී හැඩි දැඩි අතක් මගේ නාසය ත් කට ත් වසා ගන්නවා මට මතක ය.

'පිටිපස්සෙ දොර ඇරපන්, දාපං ඕකිව වෑන් එක ඇතුළට.' වැනි ගොරෝසු හඬවල් කිහිපයක් ඒ සමඟ ම මා වටා ඇසෙන්නට වී ය. මරණ බය නොවුණත් මම වැරෙන් දඟලන්නට වීමි. පිරිමි දෙතුන් දෙනෙක් මගේ ශරීරයෙන් අල්ලා මිරිකා ඔසවා ගෙන යන්නට දඟලන විට මම වෙර වීරියෙන් ඔවුනට පයින් ගැසීමි.

අකුණු ගැසූ තරම් හයියෙන් වැස්සේ නැත. ගෝරනාඩුවට මිස ගෙරවිල්ලට බිය විය යුතු ද නැත. අසනි වැස්සක් දෙපත් කපා ගෙන ඇද හැළෙතැ යි සිතුවත් වැහි බිංදුවකුදු වැටුණේ නැත. විනාඩි කීපයකින් සියල්ල සන්සුන් වී ය. බෝඩිමේ ඇන්ටි මුලින් ම වින්නය කැසපට කවා ගෙන කඩුල්ල දෙසට ආවේ තමන්ගේ ම දියණියක වෙනුවෙන් පෙනී සිටින අම්මා කෙනෙකු ලෙස යි.

'අකැරපල්ල ඔය කෙල්ල....'

'කරුණාකරල මහේ ඔතනින් අයින් වෙන්න. වැඩිය දඟලන්න ආවොත් මහේලටත් කරදර වෙන්න පුළුවනි.'

හැඩිදැඩි මිනිසා ගෝරනාඩු කළේ ය. මිසිස් දූල්ලෑව වෑන් රථයෙන් බිමට බැස්සේ නැත. පිරිමි තුන් හතර දෙනෙකු සමඟ ඇවිත් කිරීමට නොහැකි නිසා දෝ බෝඩිමේ ඇන්ටි දෙවනුව මගේ කටහඬ පරයමින් කෑ ගැසුවා ය.

'මෙන්න .... මේ කෙල්ල උස්සන් යන්න හදනවා. වරෙල්ලා... මෙන්න මෙතන මිනී මරන්න හදනෝ....'

දෙතුන් වරකට වඩා බෝඩිමේ ඇන්ටිට විලාප තබන්නට සිදු වූයේ නැත. එක දෙක ආ බයිසිකල් ගේට්ටුව ළඟ නතර වී එහි සිටි පිරිමි මිදුලට පැන්නෝ ය. මුලින් මුලින් එහෙන් මෙහෙන් කොකම් පාමින් සිටි ගැහැණු ද කොණ්ඩා වලු ගොතා ගනිමින් ගෙවත්තට පිවිසුණෝ ය. විනාඩි කීපයකින් වණ්ඩි මෙල්ල වන ලකුණු දිස් වී ය. මිසිස් දූල්ලෑව කීප විටක් ම තම ලේන්සුවෙන් මුහුණ පිස දමනු මම බලා සිටියෙමි. ඉන් පසු බෝඩිමේ ඇන්ටි සියල්ල දිග් විජය කළා ය.

'මේ කෙල්ල කවුරු වුණත් ඉන්නෙ මගේ ගෙදර. මොකක් හරි ප්‍රශ්නයක් තියෙනවා නම් ඒක බේරුම් තේරුම් කර ගන්න ඕන. මගේ මිදුලට ඇවිල්ල වණ්ඩි පාට් දාන්න උඹලට බෑ. කකුල් කඩල අරින්නේ මීට පස්සෙ හතර මායිම පැන්නොත්...'

බෝඩිමේ ඇන්ටිගේ කතාවට මම ආඩම්බර වීමි. මිසිස් දූල්ලෑවගේ හිස නිකටෙන් ඔසවා ඇගේ ඉරියව් බැලීමට ඇත් නම් යැයි මට සිතිණි. මම අඩියක් දෙකක් බෝඩිමේ ඇන්ටි දෙසට සමීප වීමි. එය සහනයකි. ඇය සහනයකි.

'උඹල මහ ලොකු සල්ලිකාරයෝ වෙන්න පුළුවන්. තොපේ සල්ලි අපේ බල්ලොවත් කන්නේ නෑ. උඹලට කවුද යකෝ ලයිසන් දුන්නෙ මිදුල්වලට පැනල ගෑණු උස්සගෙන යන්න... උඹලගෙ හතර හන්දි බිඳිනවා මේ කොල්ලෝ එකතු වුණොත්....'

ඇය වටපිට පිරිමි දෙස ආඩම්බරයෙන් බැලුවා ය.

'තමුසෙ දන්නවද ඔය ගෙදර නවත්තගෙන ඉන්න වේස ගෑණි කවුද කියලා...'

'තමුසේ....' යැයි කීම නිසා ඇය තවත් කේන්ති ගත්තා ය.

'තමුසෙ.... ඇයි මං උඹලගේ අම්මගේ අතපල්ලෙන් වැටිල ද? කතා කරන්න ඉගෙන ගනින්.... පඩත්තරයා....'

ඇය වණ්ඩියාට වණ්ඩි පාට් එකක් දැම්මා ය. මම නැවතත් මිසිස් දුල්ලැව දෙස බැලීමි. ඇය මගේ නෙත් සීමාවට හසු වූයේ නැත. එහෙත් නැති ගත් ස්වරූපය ඇගෙන් ගිලිහී නොගියේ ය. රියැදුරා වැන් රථය පණ ගැන්වූවේ ය. හෙමින් පල්ලම් බසින අතර තැඩි දැඩි පිරිමියා කට ඇරියේ ය. ඒ වටපිටේ සෙනඟට ඇහෙන්නට ය.

'ඔය ගෙදර නවත්ත ගෙන ඉන්නෙ වේස ගෑණියෙක්.... මෙ මිනිස්සු ඒවා නොදන්න හින්ද හොඳයි....'

මට පොළොව පළාගෙන යන්නට සිත් වි ය. මම බිම බලා ගතිමි. බෝඩිමේ ඇන්ටි කවුල්ල ළඟට ම ගොස් උත්තර දුන්නා ය.

'වාහනවලින් එක එකා එනකොට මං හිතුවා ඒකට තමයි කියලා. කොපේ මහ එකත් දැන් ඇවිල්ල ගියේ.... ගිහිං ඌට කියාපල්ල... උගේ පුතාට කියාපල්ල.... එක එක කුප්පායම් අස්සේ රිංගන්න එපා කියා... හෙවිල්වලටයි රටවයි නම් මහ ලොකු ළමාතැනිලා. ගෙදර මිනිහ පිට යනවා නවත්ත ගන්න බෑ. තූ ඊතරක් අසමජ් ජාති පරයෝ...ඔය ඉස්සරහ ඉන්න මහ ගෑණිට කියාපිය මිනිහා එක්ක හරියට බුදිය ගන්න කියලා....'

වැන් රථය ඒ සැණින් දුහුවිලි අවුස්සා ගෙන ඉගිළුණේ ය. මම ගෙදරට රිංගා ගතිමි. බොහෝ වේලාවක් යනතුරු මිදුලේ සෙනඟ කුජු කුජු ගානවා මම අසා සිටියෙමි.

'ඔව්.. ඔව්... උදේට උදේට එනවලු.... පාරට බහින්නෙ පත්තිනි අම්මල වගේ... ඕක තමයි ජොබ් එක.... බැලූවම නම් උඩරට මෙනැනිලා. කොහොමද සෙල්ලම....'

ආදී කතා මම ඉවසිල්ලෙන් අසා සිටියෙමි. ඇතැම් දේ කියන්නේ කාට ද, කුමක් ද යන වග පැහැදිලි වූයේ නැත. පැය භාගයක්



පමණ එකිනෙකා කොඳුරනු පමණක් ඇසිණ. මම කාමරයේ දොර තදින් වසා අගුළු දැමුවෙමි.

මහ සෙනඟක් ඉදිරියේ නිරුවත් වූවා නම් දෝත එකතු කොට මුහුණ වසා ගැනීමට තිබිණ. පිරිමියෙකු බලහත්කාරකමක් කරන්නට තැත් කළා නම් ඔහුගේ ගෙල මිරිකා මරාගෙන මැරෙන්නට තිබිණ. එහෙත් ලෝකය ම 'වේස ගෑණියෙක්' යැයි කී විට ලෝකය ම කා දමා විනාශ කරනවා හැර කුමක් කරන්න ද? මගේ ම ගෙල කපා ගෙන ප්‍රසිද්ධියේ මිය යාමට තරම් මම පීඩාවට පත් වීමි. වරදක් නොකර ලෝකයා ඉදිරියේ වරදකාරියක වීම තරම් ගැහැණියකට තවත් පාපයක් කොයින් ද? කන්‍යාවියක් අපිරිසිදු යැයි කීම ත්, පතිනියක් වෙසඟනක් යැයි කීම ත්, අම්මා දුරාචාරයේ යෙදෙනවා යැයි කීම ත් විඳීමට අපහසු ම සිත් වේදනා බව මට තරයේ සිතට කා වද්දා ගත්තෙමි.

බෝඩිමෙන් හැකි ඉක්මනින් පිට විය යුතු බව මට වැටහී තිබිණ. එහෙත් අභිනිෂ්ක්‍රමණය සඳහා මම පෙරනිමිති බලමින් සිටියෙමි. බෝඩිමේ ඇන්ටි මා සමඟ ඉන්නේ උරණ වීමෙන් ද ලෙන්ගතුකමින් ද යන ප්‍රශ්නය මසිතට වදයක් ම වී ය. විටෙක හැතිරියක දෙස බලන බැල්මෙන් මා කෙරේ කෝප වූ ඈ තමා බේරා ගැනීම සම්බන්ධයෙන් ක්‍රියා කළේ මවක ලෙසිනි. එහෙත් මසිතේ ප්‍රහේලිකාව ඉතිරි වී ය. ඇය පොලිසියට දැන්වූව හොත් අලුත් ප්‍රශ්න කීපයක් ම පැන නඟිනු ඇත. නුවරට ගොස් මේ සියල්ල අම්මාට කිව යුතු යැයි මම තීරණය කළෙමි.

ඇඳුම් බෑගය ත් සමඟ පාරට පිවිසිය හොත් බෝඩිමේ කිසිවෙක් ඒ පිළිබඳව සැක සිතනු ඇත. අත්‍යවශ්‍ය ලියකියවිලි කීපයක් පමණක් මම හැට්ටය අස්සේ සඟවා ගතිමි.

යන්තම් කළුවර වැටී පැය භාගයක් යන්නට ඇත. තවත් ස්වල්ප වේලාවක් මම මිදුලට පැන ගහකොළ අතගාමින් සිටියෙමි. ගේට්ටුව වසන්නට මෙන් ගේට්ටුව අතගාමින් තවත් තත්පර කීපයක් සිටියෙමි. අත්‍යවශ්‍ය දෙයක් මිල දී ගැනීමට මෙන් සිලි සිලි බෑගයක් ද ගෙන හන්දියේ කඩය ළඟට ගියෙමි. සැණෙකින් හන්දියෙන් පිටකොටුව

For Pothkalaya

බසයකට ගොඩ වූ මම පිටකොටුවේ දී නුවර බලා යන නාගරාන්තර ශීඝ්‍රගාමී රථයක කෙළවරේ අසුනකට බර වූනිමි.

දැස පියා තද කොට ගත් මම බොහෝ වේලාවක් නිසොල්මනේ ඉන්නට තැත් කළෙමි. ළඟ ම වාඩි වී සිටි තරුණයා නිදිකිරමින් සිටි. මුලින් ම ඔහුගේ හිස මගේ උරහිසේ ගැටුණේ ය. කෑගල්ල කන්ද නගින විට ඔහු මර නින්දකට වැටුණකාක් මෙන් සිහින්ව ගොරවන්නට ද වී ය. එහෙත් ඔහු වැළමිටෙන් දෙතුන් වරක් මගේ උකුළට අනිනු දැනීමෙන් මම ඔහුගේ මර නින්ද තේරුම් ගතිමි. මම ඔහුගේ උරහිසට අතින් සංඥා කොට ඔහු පිබිදුවෙමි.

'ඔයා නිදාගත්තම ඔයාගේ වැළමිට මගේ උකුළට අනිනවනේ.... නිදා ගන්නව නම් ඔය වම් අතත් නිදිකරව ගන්න. ඔයා නිදි. අත ඇහැරගෙන මට වද දෙනවා...'

'සමාවෙන්න' වත් නොකියා ඔහු අසුනේ අනෙක් කෙළවරට වී ය. ඉන් පසුව නුවර යන තෙක් එම තරුණයා කුල දරුවෙක් වූයේ ය. මම සැනසිල්ලේ කල්පනා කළෙමි.

නුවර කැප්පෙටිපොළ ශාලාව ඉදිරිපිට බස් රථය නතර කළේ ය. මම කඩිමුඩියේ රථයෙන් බැස ගතිමි. රාත්‍රී දහයට ආසන්න වෙමින් තිබිණ. ඔරලෝසු කණුව ඉදිරිපිට මුස්ලිම් කඩයෙන් මම තෝසේ දෙකක් ද, වඬේ කීපයක් ද මිල දී ගතිමි. කුරුණෑගල බසයක නැඟී කටුගස්තොට බැස මාතලේ පාර දිගේ ගෙදරට දිව ගියෙමි.

'අම්මා... අම්මා.... අම්මා...'

දනිපනි ගා අම්මා දොර හැරියා ය. තාත්තා නිදිගැට කඩමින් ඇ පසු පසට වී සිටියේ ය.

'මොකද මගේ පුතේ හොඳටම රෑ වෙලා?'

'බස් එක පරක්කු වුණා.'

'ඉඳගනින්. ඉඳගනින්...'



අම්මා තකහනියේ කේතලය ලිප තැබුවා ය. තාත්තා කමිසයේ බොත්තම් දමා ගනිමින් දොර ළඟට ගොස් කළුවරට එබුණේ ය.

'මම රෑට කන්ඩ ගෙනාවා. තාත්තා දැන් කඩේ යන්ඩ ඕන නෑ.'

තාත්තා කඩේ යන ගමන නවතා දොරකඩ ම ඉඳ ගත්තේ ය.

'දුල්ලෑව මහත්තයාගේ පුතා ඇවිල්ල මේ දැන් හැන්දෑවෙනේ ගියේ.'

'ඒ මොකටද මෙහෙ ආවේ?'

'අස්ගිරියේ ආපු ගමන් කිව්වෙ?'

'තව කවුද ආවේ?'

'තනියම'

'කීයටද ආවේ?'

'තුන හමාරට හතරට විතර'

'ගියේ?'

'පැයක් හමාරක් හිටියා'

'මොනවද කිව්වෙ?'

'නිකං පවුලෙ විස්තර කතා කළා තාත්තා එක්ක.'

'මොනවද උඹ නිකං පොලිසියෙන් වගේ ප්‍රශ්න අහන්නේ?'

'නෑ නිකං'

'ටිකක් අසනීප ගතියකින් වගේ තමයි හිටියේ. මලානික වෙලා වගේ...'

'ඒ ගොල්ලන්ගේ ගෙදර අයට පොඩි අසනීපයක් තියෙනවා තමයි.'

මට තවත් දේ කියා ගැනීමට ඕනෑ වී ය. එහෙත් විශ්ව ඉක්මනින් මුණ ගැසී කතා කොට තීරණයක් ගත යුතු ය. අම්මා සමඟ කතා

කිරීමේ දී ප්‍රවේසම් විය යුතු ය. පැයක් පමණ අම්මා කතාබහ කොට නින්දට සැරසුණෙන් තාත්තා කතා කළේ නැත. මම අම්මාට කිට්ටු වී තාත්තා කතා නොකරන්නේ ඇයි දැයි ඇසීමි. අම්මා කණට කොඳුරා කීවේ දෙබරයක් ගිනි තබන ආරංචියකි.

'උඹ විශ්ව මහත්තයාගේ තාත්තා එක්ක ඇයිහොඳයි පවත්වනව කියන්නේ. කාර් එකේ යනව එනවලු. රට රට එක එක තැන්වල ඉන්නවලු. තාත්තා කොහොමත් හිතා හිටියේ නෙට ගිහිල්ලා උඹව එක්ක එන්න.'

'ඉතිං අම්ම ඒව විශ්වාස කරනවද?'

'පුතෙක් තමන්ගේම තාත්තා ගැන එහෙම කිව්වම විශ්වාස නොකර පුළුවන්ද? පුතා තාත්තා ගැන කියන කතා ඇහුවම අම්මා කෙනෙක් දුව විශ්වාස කරයිද?'

'අම්මට අම්මගේ දුව විශ්වාස නැද්ද?'

මම අම්මාගේ උරහිසක් අල්ලා සෙළවීමි. තාත්තා ගිනි පුළිඟු දෙකක් මෙන් ගොරක ගෙඩි ඇස්වලින් මදෙස බැලුවේ ය. මම තාත්තාගේ දෙපා අල්ලා වැඳ වැටීමි.

'මට සමාවෙන්න තාත්තෙ'

තාත්තා කකුලෙන් මා තල්ලු කළේ ය. මම පොළොවට ම බර වී සිටියෙමි.

'උඹ ඇයි අපිට වහ ටිකක් දුන්නෙ නැත්තෙ? එක එකත් එක්ක බුදියගෙන ගෙට ආවම තේව කොහොමද මෙහෙ තියාගන්නෙ. තොපි ඔක්කොම එක්ක මේව අළුලී වෙලා යන්න ගිනි තියනවා මිසක්. උඹ මතක තියාගනින් දුවේ උඹ පොඩි කාලේ.... උඹේ අම්මයි මායි කන්න බොන්න නැතුව හිටිය. රට කහට එකක් බිල නිද ගත්ත. වේල් දෙක තුන හාමතේ හිටිය. උඹත් එක්ක මහ පාරේ අගුපිල්වල ගුඩ්ෂෙඩ්වල බුදිය ගත්ත. උඹල අම්ම කවදාවත් තව මිනිහෙක් ගත්තෙ නැ. උඹ හැදුණෙ දළදා හාමුදුරුවෝ වැඩ ඉන්න රටේ. ඇයි උඹට බැරි උඹේ අම්ම වගේ ගෑණියෙක් වෙන්න.'

මහ පොළොව භාරා ගෙන යට වෙන්නට නොහැකි ය. අම්මාට තාත්තාට මේ සියල්ල කියන්නට ආවේ දෙවියන්ට බුදුන්ට කියා



මෙන් සහනයක් ලබන්නට ය. මෙසේ තාත්තාගේ ප්‍රකෝපය අභවර වූයේ නැත.

'උඹ පහේ ශිෂ්‍යත්වෙ පාස් වෙච්ච දවසෙ අපිට රටක් රාජ්‍යයක් දිනුව වගේ දැනුණේ. උඹව මහාමායාවට ගන්න බෑ කිව්ව දවසෙ මං මිනිහෙක්ගෙ බෙල්ල මිරිකන්න ගියා. උඹට කියෙන ආදරේට.... උඹ එයිට වැඩිය හොඳයි උඹේ අම්මයි තාත්තයි මරා දැම්ම නම්...'

හැඩුම් එන්නට ආසන්න වීමෙන් දෝ තාත්තා කතාව නතර කළේ ය. තාත්තා ත් අම්මා ත් නිහඬව ම කළුවරට ඉඩ දී බලා සිටියෝ ය. කළුවරට කෑ ගසා බොහෝ දේ කියන්නට – කළුවර නොදන්නා බොහෝ දේ කියා දෙන්නට මට ඕනෑ වී ය. මම හෘදය වස්තුවට ඉඩ දී මුව වසා ගෙන සිටියෙමි. තාත්තා හෙමින් කතාව පටන් ගත්තේ ය.

'උඹ කොළඹ රස්සාවට යනවට මං කැමති වුණේ උඹත් අම්මා වගේ හැමදම දුක්විඳින්න ඕන නැති හින්දා. අපි උඹ ලොකුමහත් කරේ උඹෙන් කන්න – බොන්න – යැපෙන්න හිතාන නෙමෙයි. උඹ දුක් වින්ද තරමට – උඹට සැප උරුමවෙන්න ඕන කියලා අපි හිතුවෙ. උඹ ඇඩ්වාන්ස් ලෙවල් පංතියේ ඉද්දී උඹව රැජිනක් වගේ අපි දැක්කෙ. උඹව දකින කවුරුවත් කිව්වෙ නෑ උඹ පේමන්ට් එකේ හැදිච්ච එකියක් කියලා. උඹ අපිට දේවතාවියක් වගේ පුතේ....'

තාත්තා කවම දාක වත් නැති තරමට කතා කරන්නේ ඇයි දැයි මට සිතා ගැනීමට පුළුවන. තාත්තා බොහෝ විටෙක වැඩිපුර කතා කරන කෙනෙක් නොවේ. එහෙත් ඔහු අවස්ථා දෙකක දී දොඩමලු වන බව මම අත්දැකීමෙන් දනිමි. ඉහවහා ගිය සතුටක් දැනුණු විට තාත්තා වැඩිපුර කතා කරයි. නැත්නම් දරන්නට බැරි පීඩාවක දී – දුකක දී ඔහු නොනවත්වා කතා කරයි. තාත්තා මේ මහ රෑ කතා කරන්නේ සතුටකට නොවන බව නම් මම දනිමි. ඉතින් තාත්තා මේ කතා කරන්නේ දුක දරා ගන්නට බැරිව ය.

එක ම එක දුවක් ආදරයෙන් හැදූ තාත්තා කෙනෙක් දුව අනාචාරයේ හැසිරුණා යැයි සිතා දුකින් හඬමින් කතා කරන විට ඒ දුව තාත්තාගේ දුක කෙසේ නිවන්න ද? තාත්තා කෙසේ සනසන්න ද?

තාත්තා දිගින් දිගට ම කතා කරනු අසා සිටින්නට – දරා හිඳින්නට නොහැකි ම තැන මම කතා කළෙමි.

'තාත්තා ඔය කියන දේවල් ඔක්කොම මම දන්නවා. තාත්තාගේ හිතේ තියෙන දුකත් මම දන්නවා. මම මේ මොහොත වෙනකල් වරදක් නොකළ බවත් මම දන්නවා.'

'ඒ වුණාට උඹ ආයෙත් කොළඹ යන්න ඕන නෑ.'

අම්මා ද තාත්තාගේ දුක වෙනුවෙන් ඉදිරියට පැන්නා ය.

'අම්මල විරුද්ධ වෙලා මං ඉස්සරත් වැඩ කළේ නැනේ. දැනුත් එහෙම තමයි.'

අම්මා ත් තාත්තා ත් බොහෝ වේලාවක් අවවාද උපදෙස් දෙමින් දුක කීවෝ ය.

සතුට කනස්සල්ලෙන් ද, කනස්සල්ල කලකිරීමෙන් ද නිමා වෙමින් තිබිණ. දුක කඳුළ වී බොඳ වි ය. කඳුළ ඉතිරි වි ය. කඳුළේ තනියට සිටියේ තද අඳුර පමණි.

කඳුළ ත් මම ත් අඳුර ත් තනි වූමු.

තනිව ම විඳවූමු.

මම නැඟී සිටියෙමි. තාත්තා වැළඳ ගතිමි. මගේ තාත්තා දෙතුන් විටක් සිප ගතිමි. තාත්තාගේ කඳුළු මගේ මුහුණේ දිය වෙන්නට වි ය. අම්මා ඉකි ගැසුවා ය. මම මහත් වේගයකින් තාත්තා සොලවමින් කෑ ගැසුවෙමි.

'තාත්තේ.... මං එහෙම නරක විදිහට හැසිරුණේ නෑ.... තාත්තේ.... දළදා හාමුදුරුවන්පල්ල... මගේ අම්මපල්ල... මගේ පපුව පැළිල මාව මැරිල පළයන්.... මං තාත්තලාට අම්මලා ට හතුරුකමක් කළේ නෑ...'

සැණෙකින් අම්මා ද පැමිණ මා වැළඳ ගත්තා ය. අපි බොහෝ වේලාවක් කඳුළු ත් සමඟ එකිනෙකා වැළඳ ගෙන සිටියෙමු.

මට අඳුර සමඟ කතා කරන්නට දෙයක් තිබුණේ නැත. මම අඳුරට බිය වී සිටියෙමි. තාත්තා අම්මා වෙනුවෙන් උපන් කඳුළුත් සමඟ මම යහනට වැදුණෙමි. දෑස වියළී තිබිණ. තාරුකා අහසේ කඩා වැටෙන්නට ඇත. මම අම්මාගේ චිත්තය තුළට ගුලි වූයෙමි.



බොහෝ වේලාවක් මට නින්ද ගියේ නැත. මම මගේ ම දෙකම්මුල් පිරි මදින්නට වීමි. උණුසුමක් තිබුණේ නැත. සීතලක් තිබුණේ ද නැත. මම පපුවට දැත තද කොට ගතිමි. උණුසුම ත් සීතල ත් අතර හදවත ගැහෙන්නට වි ය. දෙපා වැහෙන්නට චිත්තය ඔතා ගත් මම බොහෝ වේලාවක් කල්පනා කරමින් සිටියෙමි. මා නොදන්නා වේලාවක මට නින්ද යන්නට ඇත.

For E-Pusthakalaya

# 4

ඉර පායා ආවේ කොයි වෙලාවේ දැයි මට නිශ්චිත නැත. එහෙත් ඉර පායා තිබිණ. අම්මා කාමරයට එනවිට ත් කාමරයට එළිය වැටී තිබිණ. තාත්තා ගෙදර සිටියේ නැත.

'අම්මෙ තාත්තා කෝ?'

'තාත්තා ටවුමට ගියා. මේ දවස්වල මාර්කට් එක ඉස්සරහ පළතුරු විකුණනවා. තාත්තා හිතේ අමාරුවෙන් ඉන්නෙ. උඹ ටිකක් කල්පනාවෙන් වැඩ කරපං. මොනවා උණත් අපිට උඹ විතරයි ඉන්නේ.'

'මම වැරැද්දක් කළේ නෑ අම්මෙ. විශ්වයි එයාගේ තාත්තයි දෙන්නාම හරි හොඳයි.'

'දෙන්නාම හොඳයි... මොනවද බං දෙන්නාගෙම තියෙන හොඳ?'

'මං කිව්වෙ අම්මල හිතන ජාතියේ කරදරයක් මට දෙන්නාගෙන්ම නෑ කියලා.'

'උඹ උඹේ තරමට හිතපං. උඹට ඒ රස්සාව එපා නම් ගෙදර හිටපං. තවමත් උඹට කන්ඩ බොන්ඩ දෙන්න අපිට වාරු තියෙනවා.'

අම්මා ගෙනා තේ එක මම උගුරට දෙකට බී ගත්තෙමි. අම්මාට තාත්තාට කළ යුතු බොහෝ යුතුකම් තිබිය දී මට මගේ ජීවිතය තීරණය කර ගත නොහැකිව වංකගිරියක අතරමං වී සිටියෙමි.

උදෑසනක පහන් බවක් මට තිබුණේ නැත. මම ඔද්දල් වී ගිය සිතින් යුතුව එළිපතළියේ ඇවිදිමින් සිටියෙමි. මසිතට අවැසි වී තිබුණේ හුදෙකලාව යි. අම්මාට ත් හොරෙන් බොහෝ දේ කල්පනා කිරීමට මට ඕනෑ වී ය. අම්මාට හොරෙන් ගැබ් ගත් ගැහැණියක මෙන් මම වසන් වී සිටියෙමි.



හුරුහුරුදු හිරු එළිය පවා හොර හොරා අත්විඳින විට සිතට නුහුරු ආනන්දයක් දැනේ. පුංචි පිනි බිංදු වැටී තිබුණු මල් ගස්වල හිස් අත ගාමින් මම ආදරයෙන් මොහොතක් සක්මන් කළෙමි. රෑ තුන් හිස් පැය මේ දළු මල් හිස් පෙරුම් පුරන්නට ඇත. කවුරුත් නොසිතුවත් ඉස්සි ඉස්සී තුරු හිස් හිරු එළිය ම සිඹින හැටි. කහපාට මලක් ළඟ දම්පාට සමනළයෙක් හැල්මේ පැණි උරමින් සිටී. සක්මන නවතා මම දෑස ම එක්තැන් කළෙමි.

ජීවිතේ අත්විඳින්නට කෙ තරම් දේ තිබේ ද?

විශ්ව ගෙවත්තට පැන්නේ එ විට යි. මට පළා යන්නට ඕනෑකමක් තිබුණේ නැත.

'තාත්තා ගෙදර නෑ. අම්ම කුස්සිය පැත්තෙ. දුව විවේක සුවෙන්. මං හරි නේද?'

'විශ්ව ඔයා....?'

'ඔව් නෙත

ඔහු බොහොවයා මට සමීප වී ය. ඔහුට සමීප වීමට මට ඕනෑ වී ය. මම පියවරක් ඉදිරියට තැබීමි. ඔහුගේ හුස්ම පොද වැටන තරමට ළං වීමි. බොහෝ කාලයක් ආත්මය ඉල්ලා සිටි උණුසුම ද මේ?

'මං ඔයාව හැම තැනම හෙව්වා.'

'මං දන්නේ නෑ.'

'ඔයා නොදන්න ගොඩක් දේවල් තියෙනවා නේත්‍රා.'

'සමහර දේ දැන ගන්න මට දැන් ඕනෑකමක් නෑ. මට සැකයි මාව මරා දන්න හදනවද කියලා.'

'කවුද ඔයාට එහෙම කරන්න හදන්නේ.'

'ඔයාගේ තාත්තා. ඔයාගේ අම්මා. ඇයි ඔයා. කවුද දන්නෙ ඔත්තු බලන්න ආවද කියලා?'

'මං මගේ පණ තියෙන කල් ඔයාට එහෙම වෙන්න දෙන්නේ නෑ.'

For E-Pustakalaya

‘ඔයාගේ තාත්තා මට කිව්වෙත් එහෙම තමයි.’

‘ඔයාට මාවද විශ්වාස නැත්තා ද?’

‘මං දන්නෙ නෑ විශ්ව.’

‘නේත්‍රා මට ඔයත් එක්ක රණ්ඩු වෙන්න බෑ. අපි තීරණයක් ගනිමු. මේක ඔයාගේ ගෙදර. මම අමුත්තෙක්. අපි අම්මලාට කතා කරමු.’

‘තමන්ගේ දුව බිලි දෙන්න අම්මලා කැමති වෙන්නෙ නෑ නේද විශ්ව?’

මට අවශ්‍ය වී තිබුණේ විශ්ව සමඟ ආදරය ගැන කතා කරන්නට ය. එහෙත් උපකර දුන්නා විනා මට මා කියූ දේ ගැන ම තිතාවවක් තිබුණේ නැත.

සොරොව් ඇරියාක් මෙන් කියා ගෙන කියා ගෙන යන්නට මට දහසක් දේ තිබේ. තෙරපී තෙරපී නළියන දේ දෝරේ ගලන්නට නිවස පුරා විශ්වගේ අතින් ඇදගෙන ගොස් කෑ ගසා කියන්නට සිතේ. එහෙත් මල්වර දැරියක පෙම්වතා හමු වූ කුළුදුල් මොහොතේ මෙන් මම ගොළු වී සිටියෙමි. ආගන්තුක බවක් ද ශෝකී ආනන්දයක් ද මගේ ඇස්වලට එකතු වන්නට ඇත. මම එහෙවී ඇස්වලින් විශ්වගේ මුහුණ දෙස බැලීමි.

‘අපි ගෙට යමුද නේත්‍රා?’

මට මා ගැන ම ලැජ්ජා සිතිණ. විශ්ව වඩ වඩාත් ළං වන විට ඈත් වන්නට තැත් කරන්නේ මා නොවේ ද? එහෙත් මා විශ්වට ප්‍රේම කරන බව දැන ගත හොත් විශ්වගේ පියා කුමන තීරණයක් ගනු ඇද්ද?

‘සමාවෙන්න. මට අමතක වුණා. එන්න. එන්න ගෙට.’

මම දකුණත ඔහුට පාමින් කීවෙමි. සහත් සිනා රැල්ලකින් ඔහු මදහස පෑවේ ය. මම ඔහුට මඳ සිනහවකින් සංග්‍රහ කළෙමි.

‘අම්මේ මෙන්න.... ඇවිල්ලා....’

මම කුස්සිය පැත්තට හිස හරවා කෑ ගැසීමි.



‘ඇයි ආවෙ කවුද කියල කියන්නෙ නැද්ද?’

‘මං දන්නෙ නෑ. කොහොමද කියන්නෙ කියලා.’

‘විශ්ව කියන්න.’

මම නැවතත් අම්මාට කතා කළෙමි.

‘අම්මේ මෙන්න විශ්ව මහත්තයා ඇවිල්ලා.’

‘තවම මහත්තයා වෙලා නැනේ?’

විශ්ව විහිළුවක් කළේ ය.

මම බිම බලා ගතිමි.

‘මේ ඔක්කොගෙන්ම අන්තිමට මමම රැවටෙයි.’

‘ඔයා හිතන්නේ මං මේ උදේ දවල් රෑ නැතුව ඔයාගේ පස්සෙන් එළවන්නේ ඔයාව රවටන්න කියලද?’

‘නෑ. එහෙමමත් නෑ.’

‘එහෙනම්’

‘මට හිතාගන්න බෑ.’

‘මං ඔයාට ආදරේ කියලා හිතාගන්න බැරිද?’

‘පුළුවන්.’

‘එහෙනම්?’

‘ඇත්තටමද කියල හිතාගන්න බෑ.’

‘මං ඔයාගේ නළලේ අත තියලා දිවුරන්නම්. මං සත්තකින්ම ඔයාට ආදරේ කරනවා.’

විශ්ව මා දෙසට අත දිගු කළේ ය. මම පසු පසට වීමි. අම්මා සාලයට පැමිණියා ය.

‘මේ මහත්තයා ඊයෙත් ඇවිල්ලනේ ගියේ?’

‘මට අම්මලත් එක්ක ටිකක් කතා කරන්න ඕනකම තිබුණේ. ඒත් නේත්‍රා නොහිටි නිසා මං කතා කළේ නැත්තෙ. තාත්තා හිටිය නම් තමයි හොඳ’.

For E-Pusthakalaya

'මොනවද මහත්තයාට දැනගන්න ඕන.'

'නේත්‍රා ගැන ටිකක් කතා කරන්න තියෙනවා.'

'තාත්තා ඉන්න වෙලාවක කතා කළොත් තමයි හොඳ. මට ඕවට සම්බන්ද වෙන්න බෑ මහත්තයෝ. එක්කෝ මහත්තයාට පියසුං. නැත්නම් අපිට මේව තේරෙන්නේ නෑ. මෙහෙම ගියොත් මිනියක් මැරිල තමයි මේක නවතින්නේ.'

අම්මා අන්තිම වාක්‍යය කීවේ විශ්වට කරන අනතුරු ඇඟවීමක් ලෙසිනි.

අම්මාගේ තිබුණේ නොරිස්සුම් බවකි. අම්මාගේ නොරිස්සුම් බව මට තේරුම් ගැනීමට නොහැකි වි ය. අම්මා හරියකට විශ්ව දෙස බැලුවේ වත් නැත.

'මම නේත්‍රා බඳින්න හිතාගෙන ඉන්නෙ. නේත්‍රාත් කැමතියි. අම්මා තාත්තා කැමති නම් ඉක්මනින් මේක ඉවරයක් කරමු.'

'මම තවම කැමති කිව්වෙ නෑ අම්මෙ?'

මම මැද්දට කඩා පැන්නෙමි.

අම්මාට දහදිය දමා තිබිණ. අම්මා චීත්ත පොට්ටා දැක පිස ගත්තා ය.

'මහත්තයා හදන්නේ මේ කෙල්ල බය කරල බැඳගන්න ද?'

'බය කරන්න නේත්‍රා පොඩි ළමයෙක් නෙවිනේ අම්මෙ?'

'ඔය වැඩේ කෙරෙන වැඩක් නෙවි මහත්තයා. මහත්තයලාට තියෙන්නෙ වෙන මොකද්ද වුවමනාවක්. මං මේ කෙල්ලගේ අම්මා. මහත්තයලා හැරෙන කොට මං දන්නවා මොකාටද එන්නෙ කියලා.'

අම්මා බැණ වදින්නට ආසන්නව සිටියා ය. විශ්ව අම්මාගේ කට අවුස්සා ගනිතැ යි මම බිය වීමි.

'අම්මා විශ්ව කියන දේත් ටිකක් අහන්න.'

මම මැද්දට පැන්නෙමි.

'උඹ කට වහපං. උඹට තේරෙන කෙහෙල්මලක් නෑ. මං දන්නව තම්බි අමුඩෙ ගහද්දි තාන්නෙ බාල්දි කීයද කියලා. ඊයේ පෙරේද



වෙච්ච සිද්දි දකිද්දිම මං දැනගත්තා ගොනා හැරෙන්නෙ පොල් පැළේට තමයි කියලා. අපිත් මහත්තයා හොඳට ගෙන්දගම් පොළොවෙ පය ගහල ඉන්නේ. මේකි පොඩි කාලේ හැදුවේ ජේමන්ට් එකේ කාෂ්ටක අච්චෙ. එළිවෙනකල් මදුරුවෝ කනවා. ඒත් මේ කෙල්ලට අපි පොඩි කාලෙවත් අඩන්න ඉඩ දුන්නෙ නෑ...'

'අම්මේ....'

මම අම්මා පාලනය කිරීමට සිතා සිහින්ව ආයාචනා කළෙමි. ඒත් අම්මා දිගට ම කතා කළා ය.

'අපි කොහොමත් තීරණය කරලා ඉන්නේ මේ කෙල්ල ආයෙ මහත්තයලා ළඟ වැඩට එවන්නේ නෑ කියලා.'

'නේත්‍රාට වැරැද්දක් වෙලා නැනේ?'

'තවම නෑ. ඒත් වැරැද්දක් වෙන්න ඉස්සර තමයි එහෙම කරන්න හදන්නේ. අපිට ගොඩ ගහන්න සල්ලිබාගේ ඕන නෑ, මහත්තයා. මේ කෙල්ල නරක ගෑණියෙක් කරලා ගියේ මහත්තයාමයි.'

'මම?'

විශ්ව පුටුවෙන් නැගිට ඇසුවේ ය. ඔහු පුටුවෙන් නැගිට්ටා නොව නැගිට්ටුණේ ය.

'ඔව් අපි දන්නව මහත්තයා මිනිහෙක් සරම උස්සන කොට හුජ්ජ කරන්න ද? දුවන්න ද කියලා.'

විශ්ව පුටුවේ නැවතත් වාඩි වි ය. මට ම ලැජ්ජා සිතිණ.

මම අම්මා සමීපයට නොහොත් විශ්ව දෙසට ඇදුණෙමි.

'මේ කෙල්ලට මොනව කරන්න හදනවද කවුද දන්නෙ? ඊයේ මහත්තයාමනේ කිව්වෙ මහත්තයාගේ තාත්තාත් එක්ක දුව යාළුයි කියලා.'

අම්මා ආවේශ වූවා ය. මට අම්මා පාලනය කිරීමට නොහැකි වි ය.

'මහත්තයා යන දේවාලෙක යන්න. ඊයේ ඇවිත් කිව්වා මේකි තාත්තාත් එක්ක මඟුල් නටනවා කියලා. ඒ තිස්සේ තැන් තැන්වල

ලගිනවා කියලා. දැන් මෙකි ඉස්සරහ තිකං බොනුකුං දානවා. කරුණාකරලා දොට්ට බැහැලා යන්න.'

විශ්ව නැගිට්ටේ ය. පියවර දෙක තුනකින් මිදුලට බැස්සේ ය. මම පසු පස වැටුණෙමි. අම්මා දොරකඩ නතර වූවා ය. කඩුල්ලෙන් පනින්නටත් පෙර තාත්තා ඇසින් මතු වූයේ ය. තාත්තාගේ ගමන ඉක්මන් වී ය. 'ඩිග්' යන හඬින් තාත්තා කඩුල්ලෙන් ඉන්නක් ගලවා කඩා ගත්තේ ය. මම තුෂ්ණීම්භූත වීමි.

'නේත්‍රා...'

විශ්ව ළෙන්ගතු ලෙස මා ඇමතුවේ ය.

'බය වෙන්න එපා විශ්ව. මං ඉන්නවා.'

විශ්ව මගේ අත අල්ලා ගත්තේ ය. මම ඔහුගේ අත අල්ලා ගතිමි. තාත්තා අප දෙසට පැන්නේ අඩියට දෙකට ය.

තාත්තා ත් අම්මා ත් හැසිරෙන්නේ උමතුවෙන් දැයි මට තේරුම් ගත නොහැකි වි ය. විශ්ව නැවත පැමිණිය හොත් ඔහු එළවා දැමීමට දෙදෙනා ම කතිකා කර ගෙන සිටි බව නම් මට දැන් ප්‍රත්‍යක්ෂ ය. අම්මා ත් තාත්තා ත් තමන්ගේ දුව වෙනුවෙන් - දුව බේරා ගැනීම වෙනුවෙන් අරගල කිරීමට සැරසෙති. එහෙත් මා බේරා ගත යුත්තේ කාගෙන් ද? මා දැන් පෙනී සිටිය යුත්තේ කා වෙනුවෙන් ද?

තාත්තා රාක්ෂයකු මෙන් කෝප වී ඇත්තේ කුමක් නිසා දැයි මම නොදැන සිටියෙමි. බොහෝ විට ඉවසිලිවන්තව උපේක්ෂාවෙන් ජීවිතය දෙස බැලූ තාත්තා, පොලු කැබැල්ලක් ද රැගෙන අප ඉදිරියට කඩා පනින විට ඔහු වැළැක්විය නොහැකි බව මම දැන සිටියෙමි.

'තාත්තේ....'

'තෝ පළ අහකට.'

තාත්තා මා තල්ලු කර දමා විශ්ව වෙත හැරුණේ ය.

'මගේ කෙල්ල විනාශ කරන්න ආපු යක්ෂයා. මං තොගේ හතර හන්දි කඩනවා. තොපිට පුළුවන් අපේ පවුලම විනාශ කරන්න. ඊට ඉස්සෙල්ල මම උඹව නැති කරනව. මම මේ කෙල්ල අපා දුක්



විඳල හැදුවේ උඹ වගේ බැල්ලිගේ පුතෙක් අතින් සල්ලං වෙන්න නෙමේ යකෝ....'

තාත්තා පොලු මුගුර උස්සා පහර දෙන විට ම මම ඉදිරියට පැන්නෙමි. එහෙත් විශ්ව මට වඩා ඉස්සර වි ය. ඔහුගේ හිසට පළමු පහර වදිනවා ත් සමඟ ම අපි දෙදෙනා ම එකට ඇද වැටුණෙමු. නැවතත් ඉහළට එසවූ මුගුර පහත් වන්නට පෙර මම විශ්වගේ හිස බදා ගත්තෙමි. උණු ලේ ගුලි මගේ ඇඟිලි අතරින් බේරෙන්නට වි ය.

'එපා.... තාත්තේ එයාට ගහන්න එපා. අපි දෙන්නම මෙතන මරා දාන්න.'

සැණෙකින් මම තාත්තාගේ අතේ පැල්ලුණෙමි. මගේ දෑතේ තිබූ ලේ බිංදු තාත්තාගේ රළු දෑතේ තැවරිණ. තාත්තා ක්‍රියාත්මක වෙන්නට පෙර මම වෙර යොද තාත්තා බදා ගත්තෙමි. තාත්තාගේ දැස ගිනියම් වී තිබිණ. තාත්තා වෙව්ලනවා මට දැනිණ. ඔහු දහදියෙන් තෙත් වී සිටියේ ය. මුවින් පිළිකුල් මත්පැන් ගඳක් වහනය වී ය. තාත්තාගේ බෙල්ල වටා දෑත යැවූ මම ඔහුව වැළඳ ගෙන කෑ ගැසුවෙමි.

'මට ජීවත් වෙන්න දෙන්න තාත්තේ. විශ්ව වැරැද්දක් කලේ නැහැ. අම්මයි තාත්ත යි කැමති නම් මම දැන් වුණත් විශ්වත් එක්ක යනව. තාත්තල දන්නෙ නැති වුණාට මම දන්නව විශ්ව මට ආදරෙයි කියල.'

තාත්තාගේ දෑසින් සට සට ගා කඳුළු කඩා හැලිණ. දෙතොල වෙව්ලවමින් තාත්තා ඉකි ගැසුවේ ය. ඔහු කතා කළේ වේදනාවෙන් ද, කෝපයෙන් ද, ආදරයෙන් දැයි මට වැටහීමක් තිබුණේ නැත.

'උඹ ඇර මට වෙන වස්තුවක් නැහැ දුවේ. මමයි අම්මයි ජීවත් වුණේ උඹ හින්දා. ඒත් දැන් මූන් එකතු වෙලා උඹට මොනවා කරන්න හදනවද කියල උඹවත් දන්නේ නෑ. මූන්ගේ මහ එකත් එක්ක උඹ නිදියගන්නව කියල මේකාමයි ඊයේ කිව්වේ. එහෙව් එකත් එක්ක උඹ දැන් දීග යන්න හදනවා. උඹට ඕනනම් පළයන්. හැබැයි උඹේ අම්මගෙයි, තාත්තගෙයි මළමිනි දෙක උඩින් තමයි උඹට යන්න වෙන්නෙ. උඹට කරදරයක් වුණොත් අපිට බලං ඉන්න බැහැ. එක්කෝ

For E-Pustakalaya

ඉ- ඉස්සෙල්ල මැරෙනවා. නැත්නම් මුන් එකෙක් දෙන්නෙක්ව මරා -දාලා එල්ලං ගස් යනව.'

තාත්තා ගෙය දෙසට ඇදුණේ මහ පොළවේ බර පයට ගත්තාක් -මෙන් මහත් වෙහෙසකිනි. අම්මා පැමිණ තාත්තා වාරු කර ගත්තා ය. විශ්ව අතකින් හිස බදා ගෙන නැගිට්ටේ ය. මම ඔහු සමීපයට ගියෙමි. ඔහුගේ කමිසය පුරා ලේ බිඳු තැවරී තිබිණ.

බොහෝ දෙනෙක් මාකලේ පාරේ සිට වත්ත දෙසට එබුණත් කඩුල්ල පැන වත්ත දෙසට ආවේ නැත. මම විශ්වගේ අතේ එල්ලුණෙමි. ඔහු මා වැළඳ ගත්තේ ය. ගෙල වටා අත යැවූ මම ඔහුගේ හිසේ තුවාලය දෙසට එබුණෙමි. උණු ලේ ගුලි 'ගොඩ... ගොඩ' ගා හැළෙනවාක් මෙන් වි ය. මම ඔහු වාරු කර ගෙන පාරට පිවිසීමි.

'බය වෙන්න එපා විශ්ව. මම ඔයාව තනි කරන්නේ නැහැ. ඔයාට මෙහෙම වෙන්න තරම් වැරැද්දක් ඔයා කළේ නැහැ. දැන් ඉතින් මටත් මගේ පපුව ඇතුළේ තියෙන හැඟීම් ඔක්කොම ඔයා ඉස්සරහ හෙළි කරන්න වෙනව.'

'නේත්‍රා...'

ඔහු කීවේ ඒ පමණකි. ඒ වචනවල තිබුණේ පිරිමියෙකුගේ ආයාචනයක් ද, අධිෂ්ඨානයක් දැයි මට වැටහීමක් තිබුණේ නැත. ත්‍රීවීලරයකට අත දැමූ මම විශ්ව සමඟ එයට ගොඩ වීමි. ගෙය දෙස බැලීමට මට වුවමනාවක් තිබුණේ නැත.

'නුවරට ... හොස්පිට්ල්...'

එසේ කියූ මම විශ්වගේ හිස ගෙන උකුළෙහි හොවා ගතිමි.

ශෝකය ද උණුසුම ද බිය ද කියා නොදත් අලුත් කුහුලකින් මගේ හදවත ගැහෙන්නට වි ය.

'නේත්‍රා...'

දෑස අඩවන් කොට විශ්ව කෙඳිරි ගෑවේ ය. ඔහු මාගේ දෑත ම පිරි මදින්නට වි ය. මම ඉන් වැළකී ඔහුගේ මුහුණ පුරා සිනිඳුවට සුරතින් පිරි මැදීමි. ත්‍රීවීලර් රථයේ රියදුරාට අප ගැන තීනව්වක් තිබුණා දැයි මා දන්නේ නැත. ඔහු රථය පැදවූ වේගයට සමාන්තරව මගේ හදවත හිගැස්සෙමින් තිබිණ. මම සෙමින් විශ්වට කතා කළෙමි.



'ඔයා අම්මට එවල තිබුණ ලියුම මම කියෙව්ව. ඒක මට ගෙනත් දුන්නේ ඕගොල්ලන්ගේ තාත්ත. ඒක කියෙව්වම මට හිතුණ ඔයා මට ඇත්තටම ආදරෙයි කියල. මම හිතාගත්ත ඔයා මුණ ගැහුණ දවසක මේ සේරම කියන්න. ඔයා මගෙත් එක්ක කතා කරපු හැම දවසකම මම නිහඬව හිටියේ බයට. ඕගොල්ලන්ගේ සල්ලිවලට, බුදලයට, පරම්පරාවට. ඒවත් එක්ක බලද්දී මම නිකම්ම නිකං එකියක්. එහෙම හිතද්දී මගේ හිතේ තිබුණේ වෛරයක්. පළිගන්න වගේ චේතනාවක්. හැබැයි ඒක ඉරිසියාවක් නෙමෙයි. ඔයාගෙ හිතේ මෝදුවෙන ආදරයකට ඒවා හරස් වෙනව කියල හිතුණම මට තිබුණේ කියාගන්න බැරි වේදනාවක්.'

'ඔයා හරි හොඳයි නේත්‍රා. අපි මෙහෙමම කොළඹ යමු.'

'බැහැ. මම ආවේ ඔයාට බෙහෙත් අරන් දෙන්න. ඊට පස්සේ මම ගෙදර යනව. ගෙදර ගියාම තාත්තා මට මොන දඬුවමක් කළත් මම ඔයා එක්ක ආවේ තාත්තා කරපු වැරැද්දට වන්දි ගෙවන්න. ඔයා ඒක වැරදි විදිහට අවබෝධ කරගන්න එපා විශ්ව.'

මම ඔහුගේ දෑසට එබී කතා කළෙමි. එය බෙහෙවින් දීප්තිමත් දෙනෙතකි. පිරිපුන් පිරිමිකම ඔහුගේ දෑස දැලෙන් වැගිරෙමින් තිබිණ. මගේ මුහුණේ සැඟ වී ඇති රහසක් සොයන්නාක් මෙන් විශ්වගේ දෑස නළියන්නට වි ය. මම විශ්වගේ දෑසේ විදුලි සැර වැදුණාක් මෙන් අහක බලා ගෙන සිටිමි.

'නේත්‍රා... තීරණයක් ගන්න. මගේ කාර් එක ඩ්‍රයිවර් යවල ගෙන්න ගන්නව. තාත්තගේ බුදලේ නැතුවට අපිට ජීවත් වෙන්න මගේ ළඟ සල්ලි තියෙනව. අදම යමු මගෙත් එක්ක.'

මට ඔහු වෙත කියා ගැන්මට බොහෝ දේ තව ඉතිරිව තිබිණ. පරණ බස් නැවතුම පසු කර රෝහල දෙසට රථය ඇදෙමින් තිබිණ. මම නොනවත්වා කතා කළෙමි.

'මම ඔයාට ආදරෙයි විශ්ව. දැන් මම ඔයාගේ හිසේ අත තියල දිවිරන්නම් දළදා හාමුදුරුවන්පල්ල මම ඔයාට ආදරෙයි කියල. ඔයා මගෙත් එක්ක කතා කරපු හැම දවසකම, හැම මොහොතකම ඒ හැඟීම මගේ හිතේ තිබුණ. එද ගල්කිස්සේ හෝටලයකට යන්න

කතා කළාම වුණත් මම ආවේ ඒ හින්ද. ඒත් මට හිතෙන්නෙ ඔයා ඒක වරදවා තේරුම් ගත්තා. මම ඉඩදුන්න නම් ඔයා මට මහා විනාශයක් කරනවා...'

'නෑ.... මං ඔයාට ආදරය කරන්නයි හැදුවේ....'

'ඔයා ආදරේ කියල කියන්නේ ගෑණියෙක් එක්ක නිදිය ගන්න එකට නම් ඒ ආදරේ මට එපා. සත්තකින්ම මගේ ආදරය තියෙන්නෙ මගේ හදවතේ. ඒක පුදුම සහගතයි. ඒ ආදරේ තේරුම් ගන්න ඔයාලට බෑ. ඔයාගේ තරුණ වයස ගෙවුණේ යුරෝපේ. ඒ හින්ද වෙන්න ඇති. මං කියන්නේ සල්ලිවලට බුදලයම, පරම්පරාවම ගන්න බැරි උත්තරීතර හැඟීමක් ගැන. මං වගේ කෙල්ලෙකුගේ හිත් පතුලෙ තියෙන ඒ උත්තරීතර හැඟීම තේරුම් ගන්න ඔයාලට බෑ.'

'නේත්‍රා...'

ඔහුටත් කියා ගන්නට බොහෝ දේ තිබිණ. රෝහල ළඟ ම නිසා මම ඔහුට ඉඩ නොදී කතා කළෙමි.

'මට තවමත් ඔයා ගැන තියෙන්නෙ කුකුසක්. කමක් නෑ මං ඔයාට ඇත්තටම ආදරෙයි. ඒක කවදාහරි දවසක ඔයා තේරුම් ගනීවි. ඒත් මට ඔයාව බඳින්න බෑ. ඔයත් එක්ක එන්න බෑ. ඔයාගේ පරම්පරාවට සම්බන්ධ වෙන්න බෑ. මං මගේ අම්ම තාත්තා කියන දේ අහල ඉන්න ඕන. සමහර විට මේ සිද්ධි මාලාව ඉවර වෙද්දී මාව පිස්සියෙක් වේවි. කමක් නෑ ඔයා කොහොම හරි මගේ හිතට ඇතුල් වුණා. මං නොදැනීම ඔයාට ආදරේ කළා. එච්චරයි.'

ත්‍රීවීලරය රෝහල් ගේට්ටුව ළඟ නතර කෙරිණ. විශ්ව මුදල ගෙව්වේ ය. මම ඔහුගේ අතින් අල්ලා ගත්තෙමි. ප්‍රධාන ගේට්ටුවෙන් ඇතුළු වී ඕ. පී. ඩී. එක පැත්තට ඇවිද ගියෙමු.

'නේත්‍රා මං කොහොම හරි ඔයාව දිනා ගන්නවා.'

'කොහොම හරි කොහොමද ඒක කරන්නෙ. ඔයාට මගේ හිත දිනාගන්න පුළුවන්. ඒත් කවදාකවත් ඔයාට මාව දිනාගන්න බෑ. එහෙම වෙන්න මේ අහස පොළව එක් වෙන්න ඕන. එතකොට මට



පුළුවන් ඔයාගේ තුරුල්ලෙ ඉන්න. උණුසුම් වෙන්න. එතකල් ඒක හීනයක් විතරයි විශ්ව.'

මම ඔහුගේ ඇඟිලි තුඩු සිරි මදිමින් කීවෙමි. ඔහුගේ දෑත උණුසුම් වී තිබුණත් ඇඟිලි තුඩු සීතල වී ය. මම තවත් කතා කළෙමි.

'මතුපිටින් ගොරහැඩි විදිහට හැසිරුණාට අපේ හිත් හරි බොළඳයි විශ්ව. සමහර වෙලාවට ආදරේ ඉල්ලල කෑ ගහනව. ගැහැණුකම හින්ද කියාගන්න බෑ. ගැණුකම හින්ද ආදරේ හිඟා කන්නත් බෑ. අපි අපේ පීඩාව යටපත් කරගෙන ඉන්නෙ. ඒත් ඇත්තටම ආදරේ මුණගැහුණු දවසට ඒ හැඟීම් දෝරේ ගලනවා. වැව් සොරොව් බිඳගෙන ගලා හැළෙනවා. අන්න එදාට ඌ පිනිවලටත් මල් පිපෙනවා.'

'කොච්චර සුන්දරද නේත්‍රා?'

විශ්ව සුසුමක් සේ කීවේ ය.

විශ්ව ආපසු හැරී ඔහුගේ දෝතට මගේ මුහුණ ළං කර ගත්තේ ය. අපට හුදෙකලා වීමට ඉඩ ලැබුණේ නැත. තාත්තා, අම්මා සමඟ තවත් කීප දෙනෙක් රෝහල් ගේට්ටුව හැර ගෙන අප දෙසට කඩා වැදුණෝ ය. මම කළබල නොවීමි. කුමකට කළබල වන්න ද? අම්මා මගේ කෙස් වැටියෙන් අල්ලා ගත්තා ය. කම්මුල හරහා තාත්තා පහරවල් කීපයක් ගැසුවේ ය. මම ඉවසීමි. තාත්තා වැළකීමට මට ඕනෑකමක් තිබුණේ නැත. මම දඬුවම් ඉල්ලීමට මෙන් කම්මුල පෑවෙමි.

'නේත්‍රා.'

විශ්ව ඉදිරියට පැන්නේ ය.

'ඔයා බෙහෙත් දාගන්න. ඊට පස්සෙ කොළඹ යන්න. ආයෙත් මාව හමුවෙන්න එන්න එපා.'

මම ඔහුට කීවෙමි.

'මං උඹල ඔක්කොම නැතිකරල හරි නේත්‍රා ගන්නවා.'

විශ්ව කතා කරද්දී ම තාත්තා කඩා පැන්නේ ය.

'පළයං මිනිහෝ යන්න.'

මම තාත්තා ත් අම්මා ත් සමඟ ත්‍රීවීලරයට නැඟී රෝහලින් පිටත් වීමි. ආපසු හැරී බැලීමට මට ඕනෑ වූයේ නැත. මම දෑස තද කොට ගෙන අසුනට වාරු වීමි.

හදවත අඳෝනා නැඟී ය. හිස බමන්නට වි ය. අම්මා ත් තාත්තා ත් දෙපැත්තේ සිට ඇනුම්, බැණුම්, අවවාද, තර්ජන, ආයාචනා දෙන්නට වූ හ. මම දෑස මිරිකා ඉතිරිව තිබූ කඳුළ ත් දෙකම්මුල් දිගේ වැටෙන්නට සැලැස්වීමි.



# 5

හැන්දෑ වෙද්දී තිල් අහස පුරන් වි ය. කාල හෝරාවට ත් හොරෙන් අන්ධකාරය දිය වී කඳු මුදුන්වලින් බිමට බැස්සේ ය. කොළඹට ඉස්සර නුවර කළුවර වෙනැ යි මට සිතිණ. ඉර සැඟවී මොහොතකින් වලාකුළු ගැබ්බර වී අහස ගොරවන්න වී ය. තරු රාසි සැඟවිණ. මම වරලස ලිහා කෙස් රොද අතර ඇඟිලි තුඩු යැවීමි. එය හිසට සනීපයකි.

මගේ හිස මම ම පිරිමදිනවාට වඩා ආදරය තෙරපෙන පිරිමි ඇඟිලි තුඩු ටිකක් හිස පුරා ඇවිදිනවා නම්?

ජනෙල් කවුළුවෙන් යාත්තමට හඳ පෙනෙයි. ඇය වලා පොටකින් මුහුණ වසා සිටියා ය. මම වරලස ගස්සා පිට මැද්දට එළා ගතිමි. තාත්තාගේ ඇඟිලි පහරවලට ත්, විශ්ව වෙනුවෙන් හැඬූ කඳුළුවලට ත් ඉදිමී තිබුණු මුහුණ මම සඳ එළියට දී ගෙන සිටියෙමි. සැණෙකින් කාමරය කළුවර වෙයි. සඳ වලා රොදකට වැසෙන්නට ඇත.

සඳ ත් මගේ ජීවිතය වගේ ම යි.

කළුපාට හුළඟක් අහස පුරා හමා ගියේ ය. මා කාමරයට ආවේ ඉන් පසුව යි. මම දත් දෙපෙළ කිටි කිටියේ තද කොට ගත්තෙමි. හෙණ ගහන විදුලි සැරට අහසේ සෞම්‍ය රේඛා මැකී යන්නට ඇත. සීතල වැහි බිංදු වැරෙන් විත් ජනෙල් පියන් පත්වල වදියි. මගේ සිතේ තෙරපී තිබුණේ කඳුළු හළන්න තරම් සිත රිදෙන පීඩාවක් නොවෙයි. එහෙත් දෙකම්මුල් දිගේ උණු දිය කඳුළු වැගිරිණි. දෑසින් කඳුළු කඩා පතින විට යටි සිතේ වියරු බවක් කැකෑරෙන්නට වි ය.

මා හඬන්නේ කුමක් සඳහා ද?

කළුවර ත් සමඟ උණුසුම පිළිබඳ මගේ ගැහැණු සිත අවදි වන්නට වි ය. ආදරය, සෙනෙහස පමණක් නොව යටි සිතේ ශෘංගාරය ද මට වධ දෙන්නට වි ය. විටෙක මම යහනේ නිදා ගත්තෙමි. ඒ මේ අත පෙරළුණෙමි. එක ඉරියව්වක ඉන්නට මගේ සිත මගේ කයට ඉඩ දුන්නේ නැත. මම ඇඳේ වාඩි වුණෙමි. ඇඳ විට්ටමට කොට්ටය හේත්තු කොට ගත්තෙමි. දෙදණ ළං කොට නිකට ඒ මත තැබිමි. දෙපා දැතින් ම තුරුලු කොට ගත්තෙමි. නිරුවත් දෙපා වසා ගහන විදුලි සැර කාමරයට වැටෙත් ම කාමරය එළිය වෙයි. දෙපා දිලිසෙයි.

ආදරය යටි සිතේ හැප්පත් වූ විට ශෘංගාරය සිතට වද දෙන හැටිත

මම අඳුරේ ම විශ්වගේ රුව සිතේ මවා ගතිමි. මම විශ්වට ආදරය කළා ද? එසේ නොවේ නම් ආදරය අවැසි වූ මගේ ආත්මයට විශ්ව ඇතුළු වුවා ද යන්න මට ම තේරුම් ගත නොහැකි ය. එහෙත් කුල-මල පංති-සීමා බිඳ දමා ඔහු මගේ ආදරය සොරා ගෙන ගොස් ඇතැ යි මට සිතෙයි. මොහොතක් කල්පනා කරන විට, කාලයක් පුරා යටි සිතේ පීඩාවකට තිබුණු හැඟීම් ගොන්නක් ඉවුරු පෙරළා උතුරා යන බව මට ම දැනෙයි. ඉවසන්නට බැරි තරම් පීඩාකාරී වූ යටි සිතේ පිපුම් හැඟීම් දෙගොඩ තළා ගලන [illegible]ය පාලනය කළ හැක්කේ කාට ද? මගේ සිතේ තෙරපෙන සියලු හැඟීම්වල එකතුව විශ්වගේ සිරුර පුරා මුදා හරින්නට මට සිතෙයි. විශ්ව සංයමයෙන් දොඩන ප්‍රේමය ත්, දැසින් ඉල්ලන ආදරය ත්, සැණෙකින් කළබල වන කය ත්, මගේ සිරුර පුරා මුදා හරිනවා නම්?

සක්‍රසින් ම ඔහුට ඉඩ දෙන්නට මට සිතෙයි.

ඇත්තෙන් ම විශ්ව වෙනුවෙන් මා සූදානම් බව මේ මොහොත වන තෙක් මම ද නොදැන සිටියෙමි. එසේ සිතන විට ම මගේ හද ගැස්ම වැඩි වෙයි. කය හිගැස්සෙයි. ඇගේ සනීපයට සිරුර පුරා හිඟදු පිපෙයි. ගල්කිස්සේ හෝටල් කාමරයකට ඔහු මා ගෙන ගිය දින මා පාලනය වූ අපූරු පිළිබඳව දැන් මට ම පුදුම සිතෙයි. මා ඔහුට ඉඩ නොදුන්නේ සදාකාලිකව ම ඔහු මට නොලැබෙතැ යි යන බිය නිසා නොවේ ද? ඔවුන්ගේ පන්තිය, කුලය, බලය



ආදිය පිළිබඳව යටි සිතේ තිබූ හීනමානය මවිසින් ම ආඩම්බරයකට පෙරළා ගත්තා නොවේ ද? එසේ නොවේ නම් විශ්වගේ ඇස්වලට හිගැස්සෙන්නේ නැති ගැහැණු සිතක් තිබෙන්නට පුළුවන් ද?

මම ඔහු පිළිබඳව ම සිතා පෙණහලු සැහැල්ලු වන තරමට මහා සුසුමක් ඉහළට ඇද්දෙමි.

විශ්ව සල්ලාලයෙකැ යි මම මුල දී සිතුවෙමි. ඔහු කාර්යාලයට පැමිණි මුල් දිනවල ම දැසින් මදෙසට විදුලි කොටන බව මම දැන සිටියෙමි. මම ඒ දවස බිය වීමි. ඔහුගේ නෙත් මායිමට හසු නොවන්නට මම ඉටා ගතිමි. ඔහු කතා කරන විට මම බිම බලා ගත්තෙමි. රාජකාරි කටයුතු ගැන යමක් කී සැණින් ඉවුරු කොට දුනිමි. දිනක් ඔහු ලිපිගොනුවක් ගෙනෙන්නට කියා මගේ නිකටෙන් ඉස්සුවේ ය. මම ඔහුට කඩා පැන්නෙමි.

'ඇයි එහෙම කළේ?'

'නේත්‍රාගේ ලස්සන ඇස් දෙක බලන්න'

ඔහු ආදරයෙන් කීවේ ය.

'ඕන කෙල්ලෙක්ගේ ඕන එකක් බලාගන්නවා. මගේ ඒවා බලන්නේ නැතුව'

එසේ කියූ විගසින් මම ඔහුගේ කාමරයෙන් පිට වීමි. මා කළ දේ ගැන දැන් මගේ සිතට සිතුවිලි දෙකක් නැගේ. එකක්, එසේ කළාට මා කැමති ය. කෙල්ලක් කොල්ලෙකු ඉස්සරහා ලාභ නොවිය යුතු හෙයිනි. අනික, දැන් මට දුක සිතෙයි.

ඔහුට ඕනෑ හැටියකට බලා ගන්නට මගේ දැස විවර කළා නම්? දැන් මෙ තරම් පීඩාවක් නැහැ නොවේ ද?

කොහොමත් විශ්වගේ තිබුණේ විසේකාර හැසිරීමකි. ඔහු කතා කළ වචන හා හැසිරීමේ එකඟතාවක් නම් නොතිබිණ. දිනක් මම කාර්යාලයට පැමිණෙන විට නියමිත වේලාව ප්‍රමාද වී තිබිණ. මම පහත මාලයේ සිට කඩිසරව ඉහළ මාලයට තරප්පු දිගේ ගමන් කරමින් සිටියෙමි. විශ්ව තරප්පිය සකසමින් ම ඉක්මනින් තරප්පුව බසිමින් සිටියේ ය. මා පසු කර ඔහු පිටත් වූ සැණින් ම ඔහු මගේ තට්ටම මිරිකුවේ ය. මම හැරී බලා ඔහුට රැව්වෙමි.

'ඇයි රිදුණාද?'

'නෑ. මං බැලුවේ මොකාද කියල කෙල්ලන්ගේ පස්ස මිරිකන කුපාඩියා.'

'කුපාඩිකමකට නෙවිනේ නේත්‍රා. ආදරේටත් එහෙම කරනවනේ.'

'යකාගේ ආදරයක් තමයි ඒක.'

'ඔයාගේ යකත් ඇවිස්සෙනවා නම් කොච්චර හොඳද?'

මෙ වැනි හේතු නිසා මම විශ්ව සල්ලාලයෙකැ යි සිතුවෙමි.

එහෙත් මම දැන් එම විසේකාර හැසිරීමට ප්‍රිය කරමි.!

විශ්වගේ පියා කෙරේ මසිත නැඹුරු වී නොතිබුණා ම නොවෙමේ. මේ හේතු යැයි වෙන් කොට පෙන්විය නොහැකි මකුළු දැලකින් ඔහු මා වෙළා සිටියේ ය. ඔහු මා වෙළීමට තැත් කළ කිසිදු බැඳීමක් ශක්තිමත් නැත. දැන් සියල්ල පිළිබඳව මට සැනසිල්ලේ හිතන්නට පුළුවන. විශ්ව එංගලන්තයේ සිට ලංකාවට එන විට මම රැකියාවට ගොස් මාස තුනකි. එකී කාල සීමාව තුළ විශ්වගේ පියා කළ කී දේ පුදුම සහගත ය. කාර්යාලයේ දී ඔහු මහා තේජවන්ත පිරිමියෙකු වුව ද දැස් පුංචි කොට කතා කරන විට මහත් අනුකම්පාවක දැනෙයි. මුලින් මසිතේ තිබුණේ ඔහු වෙනුවෙන් අනුකම්පාවකි. එහෙත් ඔහු විටක සැප්ව ම මට ආදරේ කරන බව කී විට මං [illegible] වීමි. එහෙත් ඔහුගේ සිරුර වැරැද්දකින් වත් මාගේ සිරුරේ ස්පර්ශ වුව හොත් ඔහු දහස් වරක් සමාව ගනී.

ඔහු බොහෝ විට විනීතාචාර ඇත්තෙක් වි ය. ඒ නිසා ම මම ඔහුට බිය නොවීමි. එහෙත් පසුකාලීනව ඔහු මට වධයක් වි ය.

'මම ඔයාව කාටවත් ලබාගන්න දෙන්නේ නෑ.'

ඔහු බොහෝ විට එසේ කීවේ ය.

'ඒත් මං යන්නේ මට ඕන කෙනෙක් එක්ක.'

'මට ඔයාගේ ජීවිතේ කොටසක් අයිතියි නේත්‍රා. ඒක මට අහිමි කරගන්න බෑ. සමහර වෙලාවට ඒක නිරාමිස සුවයක්...'



'නිරාමිස කියලා කණට කොඳුරලා එහෙම තමයි පිරිමි පටන් ගන්නේ. පස්සේ ආටා නාටිය නටල කස්තිරම ඇල්ලුවම තමයි ගෑණු පාරට වැටෙන්නේ.'

මා එසේ සිතූ මුත් ඒ සිතුවිලි මුවින් පිට නොකළෙමි.

විශ්ව මුණ නොගැසුණා නම් සමහර විට මා මිස්ට දුල්ලැවගේ අනියම් බිරිඳ වීමට ත් ඉඩ තිබිණ. එසේ සිතන විට මගේ පපුව 'හොස්' ගා පත්තු වෙයි. මුලින් මුලින් මම දුල්ලැව කෙරෙහි මහත් බියක් දැක්වීමි. බිය කලෙකින් ගෞරවය සමඟ මුසු වි ය. බියට ත් වඩා ගෞරවයට මම ඔහුට කීකරු වීමි. දුල්ලැව එකී කීකරුකම ම මෙවලමක් කොට ගත්තේ ය.

'නේත්‍රා දුරින් වාඩිවෙලා ඉන්න එපා. මේ ඔෆිස් එකේ නේත්‍රා දුරින් ඉන්න හොඳ නෑ.'

මම මුල දී ඔහුගේ ප්‍රකාශවලට ඇහුම්කන් දුන්නා විනා පිළිතුරු නොදුන්නෙමි.

'ඔයා රැලි ගවුමට තමයි ලස්සන.'

අලුත් ප්‍රශ්නයට පිළිතුරු නොදී මම එ දින පරණ ප්‍රශ්නයට ප්‍රශ්නයක් දුල්ලැවට යොමු කළෙමි.

'මිස්ට දුල්ලැව මම අනිත් කට්ටියත් එක්කම එහා මේසේ හිටියට කමක් නෑ නේද?'

'මං කිව්ව දේට ඇයි නේත්‍රා මට ප්‍රශ්නයක්? ඔය ළමයට තේරෙන්නේ නෑ.'

ඔහු හෙමිහිට කීවේ ය.

මම බිම බලා ගතිමි.

'ඈත හිටියත් ඔයා මට ලස්සනයි. හැබැයි ළඟින් හිටියම සැපයි. දැන් තේරුණාද?'

මම බිම බලා ගත් වන ම එ තැනින් පිටවීමි. දුල්ලැව වෙතින් ඉවත්ව ගිය විගසින් ම මගේ හදවතට නොවැටහෙන තිගැස්මක් - උණුහුම් ප්‍රශ්වාසයක්ව පිට වෙන බව මට ම වැටහිණ. නවාතැනට

ගිය විට ත් මේ අමුතු - නුහුරු - නිගැස්ම මට නොදැනුණා ම නොවේ. මේ නිසා ම නොහිතා ම - නොකැමැත්තෙන් ම - නොතේරී ම - දුල්ලෑව පිළිබඳ නිතර නිතර සිතන්නට මට සිදු වි ය.

එක ම පිරිමි චරිතයක් ගැන දිගින් දිගට ම සිතන්නට ගත් විට තමා නොදැනුවත්ව ම එකී චරිතය ළඟට - සමීපයට - කිට්ටුවට - ආත්මය ඇදී යන බව දුල්ලෑව ගැන සිතීමෙන් ම මම තේරුම් ගතිමි. විශ්ව තුන්වැන්නෙකු ලෙස මැදිහත් නොවන්නට අද වන විට ත් මම මට ත් හොරා දුල්ලෑව වෙතට බොහෝ සමීප වීමට ඉඩ තිබිණ.

නැවුම් ආනන්දයක් නොදැනෙන එකී සිතුවිලි පිළුණු දුර්ගන්ධයක් ම ගෙන දෙයි. දැන් මට ඒ ගැන ඇත්තේ කිසිවකුට කිව නොහැකි තරම් පිළිකුලකි. සත්තකින් ම මා දුල්ලෑව ගැන සිතූ දේවල් තරුණ පිරිමි ශරීරයක් දන්නේ නම්?

එක්කෝ මා විශ්වාස නොකරනු ඇත.

නැත්නම් මා පිළිකුල් කරනු ඇත.

බොහෝ විට, 'මට ඉඩ දියං - මං උඹෙ පනසන්නම්' යනුවෙන් කියනු ඇත.

විශ්ව මා වෙනස් කළ තරම්, යැයි මට සිතෙන්නේ දැන් ය. කිසිවකුට මගේ මුහුණ බලන්නට ඉඩ නොදී විශ්වගේ දෑසට ම මගේ මුහුණ උරා ගන්නට ඉඩ දිය යුතු ය. හැම තැන ම ඇති හැම දෙයක් ම මා ඔහු වෙනුවෙන් ප්‍රතික්ෂේප කළ යුතු ය. මගේ හැම දෙයක් ම ඔහුට හිමි විය යුතු ය.

මම මගේ නොව ඔහුගේ ය.

ඔහු ඔහුගේ නොව මගේ ය.

අපි අපේ වන්නේ කවදා ද?

මට අම්මා තාත්තාගේ ආදරේ බැමි කඩා දමා විශ්වගේ ආදරය සොයා අබිනික්මන් කරන්නට සිතේ.

මම විශ්වට ලිපියක් ලියා කාර්යාලයට තැපැල් කරන්නට සිතුවෙමි.



කාමරයේ දොර වසා දමා මම විනාඩි කිහිපයක් කල්පනා කළෙමි. මොහොතක කාලයක් අතීරණයේ ගැලී සිටියෙමි. පසුව කෙටි ලිපියක් ලිව්මි. මගේ ප්‍රේමය කෙ තරම් වුව ත් විශ්ව සැබවින් ම මට ආදරේ ද යන ගැටලුව ඒ වන විට ත් මසිතට යකුළු පහර දෙමින් තිබිණ. මුලින් ලියූ ආදරණීය කෙටි ලිපිය ඉරා දමා මම නැවත ලිපියක් ලිව්මි.

ආදරණීය විශ්ව,

ඔයාගේ හිස තුවාල වුණා. මගේ හිත තුවාල වෙලා. ඔයාගේ හිසේ තුවාලේ ඉක්මනින් සුව වෙයි. දළදා පිහිටෙන් එසේ ම වේවා! ඒත් මගේ හිතේ තුවාලේ හොඳ කරන්නේ කවු ද? විශ්ව මං දැන් ඔයාට ආදරේ කරනවා. සත්තකින් ම මං ඔයාට ආදරේ කරනවා. ඒක කොටු ගහලා, ඉරි ගහලා, වෙන් කරන්න බැරි තරම් විශාල ආදරයක්. මට ම මං ගැන පුදුමයි. මට ඔයාගේ සුදු මුහුණ ඉඹින්න හිතෙනවා. දැන් මට ම ලැජ්ජයි. මට මං පව් කියලා හිතෙනවා. විශ්ව මං අහිංසක කෙල්ලක්. සමහර විට අපිට සදාකාලිකව ම එක්වෙන්න බැරි වෙයි. ඇත්තට ම අපිට එකතු වෙන්න බැරි වෙයි. එහෙම නම් සදාකාලිකව ම වෙන්වෙමු. ඒත් ඊට ඉස්සර මට ඔයාව මුණ ගැහෙන්න ඕනැ. එකම එක වතාවක්. අම්මලා දැන් මාව අවිශ්වාස කරන්නේ නෑ. ලබන බදාදා උදේ 8.00 ට නුවර වැව රවුමේ 'අවන්හල' ළඟ හතරවෙනි නුග ගහ ළඟට එන්න.

මං ආදරණීය,

නේත්‍රා.

For E-Pusthakalaya

# 6

සිතේ තෙරපෙන බොහෝ හැඟීම් පාලනය කර ගන්නට මම උත්සාහ ගත්තෙමි. එම දින කිහිපය ම මා ගත කළේ අම්මාට උදව් කරමින්, අම්මා අසළ ගැවසෙමිනි. අඟහරුවාද සවස සිට ම මම පහන්තිර කිහිපයක් ද, තෙල් මල් ද සූදානම් කොට හන්දියට ගොස් හඳුන්කූරු පැකට්ටුවක් ද ගෙන ආවෙමි.

'මොකද උඹ ඒ පාර තොවිලයක් නටන්න හදනවාද?'

අම්මා තරමක් විමතියෙන් ඇසුවා ය.

'මං හෙට උදේ දළදා හාමුදුරුවන්ට පූජාවක් කරනවා.'

'ඒක හොඳයි. මය හිටිය වගේ තව දවස් දෙකතුනක් සන්සුන් වෙලා ඉන්න බලපං. එතකොට තාත්තා වුණත් ආයෙත් හිත හදා ගනීවි.'

නුවර යාමට අම්මාගේ අවසරය ලැබීම සිතට සහනයක් වී ය. එ විට අම්මා තාත්තාගේ හිත හදන්නට උත්සාහ කරනු ඇත. මම බොහෝ සන්සුන් වූ මෙන් සිතුවිලි ද, විශ්ව පිළිබඳව ලියලමින් පවතින පෙම් සිතුවිලි ද සමඟ නින්දට ගියෙමි.

හිමිදිරියේ ම මම නුවර ගොස් දළදා වැන්දෙමි. දහස් වතාවක් මේ මාලිගය මා දැක ඇතත් තනිව ම බුදුන් වැන්ද එද මට ජීවිතය සහනයක් මැ වී. උදේ අටට ආසන්න වෙන තෙක් මම දළදා පුද බිමේ සක්මන් කළෙමි. උදේ අට ආසන්න වෙත් ම හිමි හිමින් වැව රවුමට පිවිස වම් පැත්තේ අවන්හල දෙසට ගමන් කළෙමි.

තාත්තාදුනන කෙනෙකුට විවාහ යෝජනාවක් කරන්නට යන විටක මෙන් මාගේ සිත චංචල වී තිබිණ. මගේ ළැම උස් පහත්



වනු මට ම දරා ගන්නට බැරි තරම් තිගැස්මකින් යුතු වි ය. පුංචි හොරකමක් කළ සෙරක මෙන් මම ඇවිද ගියෙමි. ඒත් ඒ ආදරණීය හොරකමට මම ආසා කළෙමි. සන්සුන් සමාධියක් දෙස බලා සිටිනවා මෙන් විශ්ව දෙස බලා සිටින්නට මට ඕනෑ වී තිබේ. ඔහුට ඉඩ නොදුන්න ත් ඔහුගේ ළය මත මුහුණ හොවා සිටින්නට ද මම ආසා කරමි. පුද පඬුරක් මෙන් ඔහු සුරකින්නට මට සිතේ. එහෙත් ඔහු මා සුරකී ද? ලෝකයා අපට ඉඩ දෙයි ද? විශ්ව මා එන පෙරමග බලා සිටියේ ය. හරියට ම අවන්හල ඉදිරිපිට හතරවැනි ගහ ළඟ. ඔහු වැව් තලයට බොරලු කැට විසි කරමින් සිටියේ ය. ඈත දී ම විශ්ව මා දැක සිනා සුණේ ය.

'අද ලස්සන වෙලා.'

'නුවර කොහොමත් ලස්සනයි.'

මම ඔලොක්කුවට කීවෙමි.

'නුවර නෙමෙයි – නේත්‍රා. ඔයා ලස්සනයි.'

ඔහු මාගේ ඇඟිලි තුඩු අල්ලා ගත්තේ ය. මම ඔහුට ඉඩ දුනිමි. හිමිදිරියේ ම මගේ සිරුරේ සිහින් උණුසුමක් නැගිණ. ඔහු තම සුරතේ ඇඟිලි අතර මගේ ඇඟිලි යවා ශක්තිමත්ව අල්ලා ගත්තේ ය.

'හරිම පින්වන්ත අතක්....'

'කොහොමත් අපි ඉන්නේ පුණ්‍යවන්ත භූමියකනේ?'

'මං කියන්නෙ මේ පොළොව, අහස ගැන නෙමෙයි.'

'එහෙනම් ...?'

මම බොළඳ වීමි. කෙ තරම් ලෝකය කටුක වුණත් පිරිමි සිතක් ළඟ තොදොල් වීමට ගෑණුකම ආසා කරන හැටි...!

'ඔයා හරි හොඳයි නේත්‍රා...'

විශ්ව නිතර ම කියන කතාව කීවේ ය.

'මම හොඳ නෑ. හොඳයි නම් මෙහෙම තනි පංගලමේ ඇවිදින්න එන්නෙ නෑනේ.'

For E-Pusthakalaya

# 6

සිතේ නෙරපෙන බොහෝ හැඟීම් පාලනය කර ගන්නට මම උත්සාහ ගත්තෙමි. එම දින කිහිපය ම මා ගත කළේ අම්මාට උදව් කරමින්, අම්මා අසළ ගැවසෙමිනි. අහහරුවාද සවස සිට ම මම පහත්තිර කිහිපයක් ද, තෙල් මල් ද සූදානම් කොට හන්දියට ගොස් හඳුන්කූරු පැකට්ටුවක් ද ගෙන ආවෙමි.

'මොකද උඹ ඒ පාර තොවිලයක් නටන්න හදනවාද?'

අම්මා තරමක් විමතියෙන් ඇසුවා ය.

'මං හෙට උදේ දළද හාමුදුරුවන්ට පූජාවක් කරනවා.'

'ඒක හොඳයි. ඔය හිටිය වගේ තව දවස් දෙකතුනක් සන්සුන් වෙලා ඉන්න බලපං. එතකොට තාත්තා වුණත් ආයෙත් හිත හදා ගනීවි.'

නුවර යාමට අම්මාගේ අවසරය ලැබීම සිතට සහනයක් වී ය. එ විට අම්මා තාත්තාගේ හිත හදන්නට උත්සාහ කරනු ඇත. මම බොහෝ සන්සුන් වූ මෙන් සිතුවිලි ද, විශ්ව පිළිබඳව ලියලමින් පවතින පෙම් සිතුවිලි ද සමඟ නින්දට ගියෙමි.

හිමිදිරියේ ම මම නුවර ගොස් දළදා වැන්දෙමි. දහස් වතාවක් මේ මාලිගය මා දැක ඇතත් තනිව ම බුදුන් වැන්ද එද මට ජීවිතය සහනයක් මැ වී. උදේ අටට ආසන්න වෙන තෙක් මම දළදා පූද බිමේ සක්මන් කළෙමි. උදේ අට ආසන්න වෙත් ම හිමි හිමින් වැව රවුමට පිවිස වම් පැත්තේ අවන්හල දෙසට ගමන් කළෙමි.

නන්නාඳුනන කෙනෙකුට විවාහ යෝජනාවක් කරන්නට යන විටක මෙන් මාගේ සිත චංචල වී තිබිණ. මගේ ළැම උස් පහත්



වනු මට ම දරා ගන්නට බැරි තරම් තිගැස්මකින් යුතු වි ය. පුංචි හොරකමක් කළ සෙරක මෙන් මම ඇවිද ගියෙමි. ඒත් ඒ ආදරණීය හොරකමට මම ආසා කළෙමි. සන්සුන් සමාධියක් දෙස බලා සිටිනවා මෙන් විශ්ව දෙස බලා සිටින්නට මට ඕනෑ වී තිබේ. ඔහුට ඉඩ නොදුන්න ත් ඔහුගේ ළය මත මුහුණ හොවා සිටින්නට ද මම ආසා කරමි. පූද පඬුරක් මෙන් ඔහු සුරකින්නට මට සිතේ. එහෙත් ඔහු මා සුරකී ද? ලෝකයා අපට ඉඩ දෙයි ද? විශ්ව මා එන පෙරමග බලා සිටියේ ය. හරියට ම අවන්හල ඉදිරිපිට හතරවැනි ගහ ළඟ. ඔහු වැව් තලයට බොරලු කැට විසි කරමින් සිටියේ ය. ඈත දී ම විශ්ව මා දැක සිනා සුණේ ය.

'අද ලස්සන වෙලා.'

'නුවර කොහොමත් ලස්සනයි.'

මම ඔලොක්කුවට කීවෙමි.

'නුවර නෙමෙයි – නේත්‍රා. ඔයා ලස්සනයි.'

ඔහු මාගේ ඇඟිලි තුඩු අල්ලා ගත්තේ ය. මම ඔහුට ඉඩ දුනිමි. හිමිදිරියේ ම මගේ සිරුරේ සිහින් උණුසුමක් නැගිණ. ඔහු තම සුරතේ ඇඟිලි අතර මගේ ඇඟිලි යවා ශක්තිමත්ව අල්ලා ගත්තේ ය.

'හරිම පින්වන්ත අතක්....'

'කොහොමත් අපි ඉන්නේ පුණ්‍යවන්ත භූමියකනේ?'

'මං කියන්නෙ මේ පොළොව, අහස ගැන නෙමෙයි.'

'එහෙනම් ...?'

මම බොළඳ වීමි. කෙ තරම් ලෝකය කටුක වුණත් පිරිමි සිතක් ළඟ තොදොල් වීමට ගෑණුකම ආසා කරන හැටි...!

'ඔයා හරි හොඳයි නේත්‍රා...'

විශ්ව නිතර ම කියන කතාව කීවේ ය.

'මම හොඳ නෑ. හොඳයි නම් මෙහෙම තනි පංගලමේ ඇවිදින්න එන්නෙ නෑනේ.'

මම ඔහුගේ දෑසට එබී කීවෙමි. වැව් ඉවුරේ වැටී තිබුණු රෙබරෝසියා මලක් ගෙන විශ්ව මගේ වරලසෙහි ගැසුවේ ය.

'මළුවේ මල් ගහන්න එපා. දේවාලයක් වගේ වෙයි'

මම බොරු තරහකින් ඔහු දෙස බැලුවෙමි.

'පිස්සු ...'

ඔහු උරහිසින් මට තෙරපුණේ ය. මා තරමක් ඈතට විසි වෙන විට ඔහු මගේ අතින් අල්ලා ළඟට තුරුලු කර ගත්තේ ය.

'දැන් අපි මොකද කරන්නේ නේත්‍රා?'

මම නිහඬ වීමි. කුමක් කරන්න ද? එසේ සිතන විට පපුව 'හොස්' ගා පත්තු වෙයි. සිරුර සීතල වෙයි. උණුසුම මැකී යයි. ජීවිතය ම එපා වෙයි.

'කියන්න, මොකද අපි කරන්නෙ?'

'මං දන්නෙ නෑ - විශ්ව'

බොහෝ දුරක් අපි කතා නොකර ඇවිද ගියෙමු. විශ්ව කාරය නවතා තිබුණේ අවන්හල ළඟ ය. එ තැන් සිට වැවේ කෙළවර තෙක් ම අපි ඇවිද ආවෙමු.

'තව ටික දුරක් ඇවිදිමු ද?'

'බෑ'

'දැන් ඉතිං අපි ඔය, නෑ - බෑ කියනෙක නවත්වමු නේත්‍රා. මොකක් හරි තීරණයක් ගනිමු.'

'මං බෑ කිව්වෙ ඇවිදින්න. අඳුනන අය දකීවි.'

'එහෙනම් මෙතන වාඩිවෙලා ඉඳිමු.'

අපි වැව් කණ්ඩියේ වාඩි වූණෙමු. මම හොඳට පොළොවට බර දී එරමිණියා ගොතා ගත්තාක් මෙන් වාඩි වූණෙමි. විශ්ව මගේ දකුණත පැත්තෙහි, දෙපා වැවට තැඹුරු වන්නට වාඩි වි ය. මම ගවුම හොඳින් දිග හැර දෙදණ වැසෙන්නට පහළට ඇද්දෙමි. බොහෝ දේ කියා ගන්නට - බොහෝ ආදර හැඟීම් ප්‍රකාශ කරන්නට - සිතේ තෙරපී තිබුණත් මම ගොළුවන රැක්කෙමි. සත්තකින් ම මට



කියා ගන්නට බොහෝ දේ තිබිණ. විඳ ගන්නට ද බොහෝ දේ තිබිණ. ඔහු හා කතා කරන්නට, ඔහුට ආදරය කරන්නට, ඔහු අසළ ගැවසෙන්නට මම ආසා කළෙමි. මම එරමිණියා ගොතා සිටි හෙයින් ඔහුට මට ළං වන්නට තරමක් අසීරු වි ය. ඔහු මගේ දකුණු දණහිස ඔහුගේ උකුළ ආසන්නයේ තබා දණහිසට අතක් බර කළේ ය. මම ඈත බලා ගත්තෙමි.

අප වටේට බොහෝ මැයි මල් වැටී තිබිණ. සමහර මල් පිපෙන්නටත් පෙර බිම වැටුණු ඒවා ය. සමහර මල් පෙති මත තවමත් උදේ පිනි බිඳු රැඳී තිබිණ. පරවූ මල් පෙති කළු පැහැ ගැන්වී ඇත. අප වාඩි වී සිටියේ මල් පලසක් මත මෙනි. මම අප අවට තිබූ බොරලු කැට එකිනෙක ගෙන වැව් තලයට විසි කළෙමි. මෙය බොහෝ පෙම්වතියන් කරනු මම දැක ඇත්තෙමි. සත්තකින් ම ඒ සිතේ ඇති අවිනිශ්චිත බවේ සිතිවිලි මුදා හැරීම සඳහා බව දැන් මට සිතේ. ඒත් විශ්ව කළේ අපූරු දෙයකි. ඔහු අප වට පිටාවේ වැටී තිබුණු පර නොවූ මැයි මල් එකින් එක ඇහින්දේ ය. මලින් මල මගේ ඔඩොක්කුවට දැම්මේ ය. මොහොතකින් මගේ ඔඩොක්කුව මැයි මලින් පිරී ගියේ ය.

'ලස්සනයි නේද?'

විශ්ව මගේ නිකටෙන් ඇල්ලුවේ ය.

'ඒත් ඔයාට පේන්නෙ නැද්ද. දැන් අපි ඉන්න තැන කැත වෙලා. හොඳ මල් අයින් කළාම පරවෙච්ච, කුණුවෙච්ච මල් විතරක් ඉතුරු වෙලා.'

'කමක් නෑ. දැන් ඔයා ළඟ වැඩියෙන් සුවඳයිනේ.'

'ඇයි හොඳ මල් විතරක් ඇහින්දේ?'

'අනික් ඒවා ජරා වෙලා.'

'මේ මල් ටිකත් පරවුණාම ඔයා අයින් කරයි.'

'නෑ - මේ මැයි මල මම කවදාකවත් මගේ ළඟින් ඈත් කරන්නේ නෑ....'

For E-Pusthakalaya

මම සැණෙකින් නැගී සිටියෙමි. ගවුමේ ඔඩොක්කුව උකුළු කොට මල් සියල්ල ම වැව් ජලයට දැම්මෙමි. රටා මවමින් මලින් මල වැව් ජලයේ පාවී ගියේ ය.

'දැන් හරි..'

මම ළය සැහැල්ලු කොට ගතිමි.

'අපරාදෙ නේත්‍රා... මං හරි ආසාවෙන් එකතු කළේ.... '

'කවදහරි වෙන්නෙත් ඔය ටික තමයි විශ්ව. අපි යමු ...'

මම ඔහුගේ අතින් අල්ලා නැගිට්ටුවෙමි. කුඩා එකෙකු මෙන් ඔහු කීකරු වී ය.

'අපි අපේ ඉරණමට මුහුණ දෙමු. ඔය ඇති. අපිට කවදාහරි උරුම වෙන්නෙ එච්චරයි. මං ඔයාට ඇතිත් ඉන්නම්. මං ඔයාට ආදරෙයි. ඒත් මට කවදාකවත් ළඟට එන්න බෑ. දැන් අපි යමු.'

විශ්ව නිහඬව ම මා අනුගමනය කළේ ය. ඔහු මහත් නොසන්සුන්කමකින් පෙළෙමින් සිටියේ ය. මම ඔහුට ළං වී ඔහුගේ අත අල්ලා ගතිමි. ඇඟිලි තුඩු පිරි මැදිමි. හිතාමතා ම ඔහුගේ සිරුරේ ගැවී ගැවී ගමන් කළෙමි. ඔහුගේ සිත රිදී ඇතුවා වත් ද?

'විශ්ව...'

'ඇයි...?'

'තව ටිකකින් අපි වෙන්වෙන්න ඕන. ඇයි කතා කරන්නෙ නැත්තෙ...?'

'මට හිතෙනවා ඔයාව ඉඹගෙන ඉඹගෙන යන්න.'

'මේ ... මහ පාරේ... පිස්සුද?'

'ඔව් නේත්‍රා ... මේක මහා පිස්සුවක් තමයි....'

මම තවත් දුරක් ඔහු හා කතා නොකර ම ගමන් කළෙමි. අපි හදවතින් දොඩමලු වී සිටියෙමු. එහෙත් මුනිවත රැකීමු. ඔහු නොසිතූ වේලාවක මම ඔහුගේ සුරත ගෙන මගේ දෙතොල් මත තබා සිප ගතිමි. ඔහුගේ පිටි අත්ල දෙතොල් මත තෙරපා සිහින්ව

ආත්මයට උරා ගතිමි. ඉන් පසුව ඔහුගේ අත අත හැර තරමක් ඈතට වීමි. ඔහු මගේ මුහුණ ත්, ඔහුගේ අත ත් අතර මාරුවෙන් මාරුවට දෑස හුවමාරු කළේ ය.

'ඔයා හරි හොඳයි නේත්‍රා.'

'නෑ ... මං හොඳ නෑ. මං හරි නරක කෙල්ලෙක්...'

'මං ආසයි.... ඒ නරකකමට.'

අපි 'අවන්හල' ළඟට ම පැමිණ සිටියෙමු. විශ්ව කාරය ළඟට යන විට ම කිසිවෙක් මගේ අතින් මිරිකා අල්ලා ගත්තේ ය. මම හැරී බැලුවෙමි. විශ්වගේ පියා ඉලංගකෝන් දුල්ලෑව ය ඒ.

'මං දැනගත්තා පුතා. උඹ උදේම මූණට පවුඩර් දාගෙන කොට යන්නෙ කොහෙද කියලා.'

දුල්ලෑව මගේ අතින් අල්ලා විශ්ව දෙසට හැරී ඔච්චමට කීවේ ය. කුමකින් කුමක් සිදු වන්නට යන්නේ දැයි මම බියට පත් වීමි.

විශ්වගේ පියා දුල්ලෑව කොහේ සිට මතු වූවා දැයි අපි නොදුටුවෙමු. ඔහු මගේ අතින් අල්ලා මා ඔහු වෙත ඇද ගත්තේ ය. විශ්වගේ දෑස් මවිතයෙන් ද කෝපයෙන් ද දිලිසුණේ ය.

'අප්පච්චිට මං හොඳින් කියන්නෙ. ඔය කෙල්ල මගේ. ඒකිගෙ ජීවිතය මගේ. මං අද නේත්‍රා බඳිනවා.'

'ඔය වයසට ඔහොම තමයි. වැව් රවුමෙ ඇවිදිද්දි උඹට හිතුණද අන්නාසි විකුණන්න?'

දුල්ලෑවගේ දෙනෙතින් ගිනි පුපුරු විසි වෙමින් තිබිණ.

'මං අන්නාසි විකුණලා හරි නේත්‍රා එක්ක ජීවත් වෙන්නං.'

'උඹ පුතා හරියට සිංහල සිනමාවේ වීරයා වගේ. උඹ මොනවද ලෝකේ ගැන දන්නේ?'

විශ්ව දෑත මිට මොළවා බලා සිටියේ ය. මම දුල්ලෑවගේ ග්‍රහණයෙන් මිදෙන්නට නොහැකිව බලා සිටියෙමි.

'අප්පච්චි මගේ යකා අවුස්සන්න එපා.'

'මං හොඳට ඇවිස්සිච්ච යක්කු දැකල තියෙනවා. පුතා උඹ තව ටිකක් දුර හිතපං. උඹ උදුර ගන්න හදන්නේ උඹේ අප්පච්චිගේ ජීවිතේ. මං පතුගිය කාලේ ජීවත් වුණේ මේ කෙල්ල නිසා. උඹ මගේ මුළු බුදලේම ගනිං. උඹට ඕන එකක් ඒවට කරපං. ගෑණු දහයක් අරං ගිහිං ගෙදර තියාගනින්. මේ කෙල්ල මට දීපං'

'අප්පච්චි මාව අජාසත්තයෙක් කරන්න එපා.'

විශ්ව දත්මිටි කමින් කීවේ ය. දුල්ලෑව සැණෙකින් මගේ තිකටෙන් ඔසවා ඔහුගේ දෑස මගේ දෑසට එබුවේ ය. රළු අතින් මගේ කම්මුල මිරිකුවේ ය.

'නේත්‍රා... යමු ගෙදර. මං ගිහිං දාන්නම්.'

'අප්පච්චි මං ආයෙත් කියන්න නෑ තිරිසනෙක් වගේ හැසිරෙන්න එපා.'

තරමක් දුරට මගේ අත ලිහිල් වූ බව දැනුණු සැණින් මම දුල්ලෑවගෙන් මිදී විශ්ව ළඟට පැන ගතිමි.

'මම ආදරේ කරන්නෙ විශ්වට. මිස්ට දුල්ලෑව කරුණාකරල යන්න. අපි අපේ අම්ම තාත්තාටත් කියලයි තියෙන්නෙ.'

'නේත්‍රා ඉස්සර මට තුරුල්වෙලත් ඔහොම කිව්ව නේද?'

'නෑ'

මම කෝන්තියෙන් කීවෙමි.

'ඕ.ටී. කරනව කියල මාත් එක්ක හුරතල් වෙච්ච හැටි මතකද?'

'නෑ... නෑ.... නෑ....'

මම කො තෙක් ශබ්ද නහා හයියෙන් නෑ - නෑ - කීව ද එම ප්‍රතික්ෂේපය විශ්වට තහවුරු කිරීමට මා ළඟ සාක්ෂි තිබුණේ නැත. තිබුණු තරමක් සාධක තිබුණේ දුල්ලෑව අත ය. ඔහු සියල්ල පාවිච්චි කළේ ය.

'ඕන වේස ගෑණියෙක් කසාද බඳින්න ලෑස්ති වුණොත් තමන්ගේ මිනිහට කියන්නෙ පතිනියක් කියලා. ඕන කෙල්ලෙක් කොල්ලෙක් එක්ක යාළු වුණාම කියන්නෙ මගේ මූණවත් කවුරුවත් ඉඹල නෑ



- කියලා. ගෑණු හරි දක්ෂයි තමන්ගේ කුපාඩි හැසිරීම් හංගගෙන ඉන්න.'

මට ඉකි ගසා හඬනවා හැර - පිටුපා සිටින දළදා හාමුදුරුවන්ට කියනවා හැර - කරන්නට දෙයක් තිබුණේ නැත. දුල්ලෑව එයින් වඩ වඩාත් ප්‍රයෝජන ගන්නට වී ය.

'මිනිස්සු දහය පහළොවක් මාරු කරපු ගෑණියෙක් වුණත් ආයෙ කසාද බැන්දොත් මඟුල් පෝරුවෙදි බිම බලා ගන්නවා. ඇහිලි පටල ගන්නවා. ලැජ්ජාවෙ ඇඹරෙනවා. උඹට කොහෙද පුතා ඕව තේරෙන්නෙ. මං බලාගෙන හිටිය උඹල ජෝඩුව වැවරවුමෙ ගිය හැටි. දකින කිසි කෙනෙකුට කියන්න පුළුවන්ද මේකි මං වගේ වයස ගිය මිනිහෙක් එක්ක දහදොළොස් වතාවක් බුදිය ගත්ත එකියක් කියලා.....'

මට අසා සිටින්නට ත් නොහැකි ය. දරා ගන්නට ත් නොහැකි ය. කෑ ගසා කියන්නට ත් නොහැකි ය. කෙසේ වත් විශ්වගේ මුහුණ දෙස බලන්නට නම් නොහැකි ය. මම මගේ යටි තොල ත් උඩු තොල ත් එකටෙක ගෙන දත් ඇඳි අතර තබා විකා ගෙන සිටියෙමි. ගොඩ ගොඩ ගා නැඟෙන හැඬුම් - සුසුම් - පපුව තුළ තෙරපා ගතිමි. දෑස ගිනි ගෙන එළියට පනින්නට තතනයි. මගේ ගෙලේ නහරවැල් පුපුරා යන්නට මෙන් තෙරපෙයි.

'පුතා ...... උඹ කසාදයක් බැඳපං. ආදරේ කරපං. හැබැයි වේස ගෑණියෙකුට නෙමෙයි. මේකි අනාථ කළෙත් මම. මේකි පරඬැලක් කළෙත් මම. මේකි ඉස්සරහටත් මං ළඟම හිටපු දෙං. මං උඹට නොකියපු ටික ඔය කිව්වෙ....'

මම මගේ ම හිස බදා ගත්තෙමි. එහෙත් ඒ සැණින් විශ්ව මගේ කොණ්ඩෙන් අල්ලා හිස කරකවා ඔහු දෙසට ගත්තේ ය. හිස ගැළවී ඔහුගේ අතට එන්නට තරම් ගෙලේ වේදනාවක් ඇවිළිණි. ඔහු සියලු වෙර යොදා මගේ මුහුණට පහර දෙන්නට වි ය.

'පට්ට බැල්ලී... මං උඹට කොච්චර ආදරේ කළා ද? පට්ට බැල්ලී...'

මට ඔහු වළකා ලීමට නොහැකි වි ය.

For E-Pusthakalaya

මගේ මුහුණින් ගිනි පුපුරු විසි වන්නට වි ය.... ක්ලාන්ත වන්නට ආසන්න බවකින් හිස බමන්නට වූ විට මම නිසොල්මන් වීමි.

විශ්ව මගේ කෙස් වැටිය අල්ලා වැරෙන් සොළවනවා මට මතක තිබේ.

‘උඹ පළයං. ඔය වනචර මහළුකා එක්කම පළයං.’

විශ්ව මාගේ බෙල්ලෙන් අල්ලා දුල්ලෑව දෙසට තල්ලු කළේ ය. දුල්ලෑව මා ළඟට ගෙන හිමින් හිමින් වාහනයක අසුන මත ඉන්දුවේ ය. විශ්වගේ කුරිරු බව හා ප්‍රකෝපය මා වෙතට දමා ගැසුවා ක් මට මතක ය.

‘මං ජාතක කරපු මහළුකයි – මං ආදරේ කරපු උඹයි දෙන්නම මගේ ජීවිතේ කෑවා. ඔය යන ගමන් මගේ පපු කැවුත්ත අරං පළයල්ලා.’

වේලාව කො තරම් ගෙවී ගොස් ඇත් දැයි මම නොදනිමි. ගෙවී ගිය කාල පරාසය තුළ මට සිදු වූයේ කුමක් දැයි මට නිශ්චිතව කීමට නොහැකි ය. මම සිහිය ලද විගසින් වහා වහා මගේ ඇඳුම් සකසා ගතිමි. දණහිසට තරමක් උඩින් තිබූ ගවුම පහළට ඇද්දෙමි. උඩ බොත්තම් දෙකක් විවර වී තිබුණෙන් මම බිය වීමි. මා නිලංකාර දැස වට පිටාවට යොමු කළේ මා ඉන්නා ඉසව්ව නිශ්චය කර ගැනීමට යි. තරමක පාලු, එම පරිසරය වඩා හුරුපුරුදු ලෙස දැනුණෙන් මම, හිස ඔසවා කාරයෙන් පිටත බැලීමි. එය හන්තාන නිවාස සංකීර්ණයේ වතුර ටැංකියට යාබද අතුරු පාරක් බව මම සිහි ගැන්වීමි.

මගේ ශරීරය බෙහෙවින් තෙත් වී තිබිණ. දහදිය සමඟ එකට පෙඟී ඇඳුම් ශරීරයට ඇලී තිබිණ. තඩි ශරීරයේ සකලාංගය ම මදෙසට යොමු කොට විශ්වගේ පියා පියදුරු අසුනේ සිටියේ ය. ඔහු විසින් මට අනතුරක් කොට ඇත් දැයි මම බිය වීමි. මම සැණෙකින් කාරයේ දොර් අරින්නට තැත් කළෙමි. එහෙත් විවර කළ නොහැකි පරිදි දොර අගුළු දමා තිබිණ.

‘මට යන්න දීපං.’

‘දැන් ඉතිං හෙමින් ප්‍රශ්නෙ විසඳගත්තොත් හොඳයි. දැක්කනේ. පුතාට වැඩිය තාත්තා තවම දක්ෂයි. හොඳින් හරි තරකින් හරි මං නේත්‍රාව මගේ ළඟ තියා ගන්නවා.’



‘ටිකක් සන්සුන්ව දැන් ප්‍රශ්නෙට මුහුණ දෙන්න නේත්‍රා... ජේනවානේ මූණෙ තිබෙන ඇඟිලි පාරවල්?’

මම මගේ මුහුණ අත ගා බැලීමි. සම පුපුරු ගසන්නට තරම් වේදනාවක් දැනිණ. විශ්ව පහර දුන්නේ ඇයි දැයි සිතා ගැනීමට ත් නොහැකිව මම නැවතත් කල්පනා කළෙමි. දැන් විශ්ව කොහි ද? හන්තාන මුදුනට දුල්ලෑව මා රැගෙන පැමිණියේ ඇයි?

‘මට යන්න දීපං’

‘දැන් ඉතාප් නේත්‍රා අපායට යන්නත් පුළුවන්. දිව්‍ය ලෝකෙට යන්නත් පුළුවන්. කැමති ඉසව්වක් තෝර ගන්න.’

මා වාඩි වී සිටි කාරයේ ඉදිරිපස අසුන පසු පසට නවා තිබිණ. එය සකස් කර ගැනීමට මම වෙහෙසීමි.

‘ඉන්න. සමහර දේ තනියම කරගන්න බෑ කියල ඔය වයසෙ ගෑණු ළමයි තාම දන්නෙ නෑ.’ යනුවෙන් කී දුල්ලෑව මදෙසට නැමී, අසුන සකසා දුන්නේ ය. ඔහු අනවශ්‍ය තරමට ඒ විට මගේ ශරීරයේ ස්පර්ශ වි ය. මම ඔහුට රැව්වෙමි.

‘කෝ විශ්ව ?’

‘මොකක්ද මේ වෙලාවෙ තියෙන වුවමනාව?’

මම හඬන්නට වීමි. කාරයේ දොර ඇර ගන්නට තැත් කළෙමි. පපුවේ තිබුණෙ පිට කර ගත නොහැකි පීඩනයකි.

‘දොර ඇරියේ නැත්නම් මම කෑ ගහනවා.’

‘ඔයා කෑ ගැහුවට එළියට ඇහෙන්නේ නෑ. ඇහුණත් වටපිටාව හිස්...’

‘ඇයි මාව මරන්න හදන්නෙ’

‘මට ඔයාව මරන්න ඕන නෑ.’

‘ඇයි මං මෙහෙම උඹලගෙන් පීඩා විඳින්නෙ. ඇයි මං ගුටි කන්නෙ. ඇයි තාත්තල පුතාල මාව මරාගෙන කන්න හදන්නේ.’

‘තාත්තලට පුතාලට දෙගොල්ලන්ට එක පිඟානෙ කන්න බෑ නේත්‍රා. එක මේසෙ පිඟන්වලට බෙදගෙන කන්න පුළුවන්. නේත්‍රා

ඉස්සරවෙලා ආදරය කළේ මට. විශ්ව ආවම වෙනස් වුණා. එතකොට සිතුව දුක් වජ්ජ ගැන ... මට අමතක වුණා.'

දුල්ලෑව කතා කළේ සියලු පීඩාවන් මවෙතට යොමු කරමිනි.

'පිරිසක් වතවර බල්ලා.'

'මං කරුණු තුනම මං තව ඉටු කළේ නෑ. ඕන නම් දැන් මෙතන වුණත් පුළුවන්.'

දුල්ලෑව මැරවරයෙකු මෙන් මදෙස බැලුවේ ය. මට කිසිදු ඉවක්, බේරී යාමක් තිබුණේ නැත.

'මං අද්දර ගෙදර තමුසෙට මගේ මූණ ඉඹින්න වත් දීලා නෑ. මං හරිම පිරිසිදු කෙල්ලක්. ඒත් විශ්ව ඉස්සරහා මං තරක ගෑණියෙක් කළා තමුසෙට කෙණෙහෙන්වා කරපු දේට.'

'තරුණ කොල්ලෝ ගැණු ගැන දන්නෙ නෑ. දැන් ඌ ඉන්නේ ඔයා ගැන බෝරයෙක්. දැන් ඔයාට මාව ඕන. නැත්නම් ඌ පන්න පළිගනිවි.'

'ඇත්තටම, ඇයි මට මෙහෙම කරන්නෙ?'

මම ඔහුට ආයාචනා කළෙමි. ඔහුගේ දෑසට එබී කතා කළෙමි. ඔහු මගේ තිකයෙන් අල්ලා පෙරළා මගෙන් ම ප්‍රශ්න කළේ ය.

'ඇත්තටම, ඇයි මට මෙහෙම කරන්නෙ, තේත්‍රා?'

'මිස්ට දුල්ලෑවට තේරෙන්නේ නැද්ද මගේ වයසෙ හැටියට මේ දේ සිදුව වෙන්න බෑ කියලා. මං තවම පොඩියි. අනික මං ඇත්තමට විශ්වට ආදරේ කරනවා. ඒකට බාධා කරන්න එපා. මම ඔහෙට වැඳල සමාව ඉල්ලන්නම්.'

'එතකොට කෝ අර කලින් කතාකරපු පංති බේදේ, අර තේත්‍රා කිව්ව සමාජ පරතරය, දුප්පත් පොහොසත්කම. වලව්වෙයි මුඩුක්කුවෙයි වෙනස. ... කෝ ඒවා..'

'ආදරේට ඒවා බලපාන්නේ නෑ. මිස්ට දුල්ලෑවට අපේ හිත් තේරෙන්නේ නෑ.'

'ආදරේට වයස බලපාන්නෙත් නෑ. තේත්‍රාවත් මගේ හිත තේරෙන්නේ නෑ.'

මම බොහෝ වේලාවක් නිහඬව සිටියෙමි. මට ම කතා කරන්නට ඉඩ දුන්නා මිස, ඔහු කතා කළේ නැත. වන මෘගයෙකුට අසු වූ ගොදුරක මෙන් මම අසරණ වීමි.

'මෙහෙම කරන එක පව්. මට මගේ පාඩුවේ ඉන්න දෙන්න... මට මගේ ජීවිතේ දෙන්නෙ නැත්තෙ ඇයි? ඇයි? ඔක්කොම බලය යොදලා මාවම ඉල්ලුවන්නේ. මිස්ට දුල්ලෑවට දුවෙක් හිටිය නම් ඔය තරං නපුරු වෙන්නෙ නෑ.'

'තේත්‍රා මගේ වයසෙ හුඟක් පිරිමි මෙහෙම තමයි. මං මේ හොයාගෙන යන දේ සමහරුන්ට ඉබේම හම්බ වෙනවා, සමහරු දුවසනවා. හැඟීම් මරල වගේ ඉන්නවා. මං උත්සාහ කරනවා. මං හැම දෙයක්ම ලබාගෙන තියෙන්නෙ උත්සාහ කරලා. මේක මගේ හැටි. මං මේක මගේ පුතාටවත් - මගේ ගෑණිටවත් කියන්න ලැජ්ජ නෑ. උන් දෙන්නම දැනගන්න ඕන මං මොන ජාතියේ පිරිමියෙක්ද කියලා.'

'මේකට මාවම බිලිගන්න හදන්නේ. මං අපේ තාත්තාට විශ්ව ගැන කිව්වා. තාත්තා ත් කැමතියි. දැන් මේක මට විසඳගන්න බෑ. මං දුල්ලෑව ගැනත් තාත්තාට කියලම බේරගන්නම්.'

'ඔව්. මං ඕන දේකට ලෑස්ති මිනිහෙක්. දක්ෂයෙක්.'

'ඇයි මං මෙච්චර අසරණ කරන්නෙ. ඔය ඉල්ලන්නෙ මගේ හිත නෙමෙයි. ලේ, මස්, ඇට, නහර ඔක්කොම.'

'මට මගේ ඇස්, ඉස්, මස්! ලේ පේරම දන් දෙන්න පුළුවන්. ඔයා මට මෙහෙම කරන එක පව්.'

'ඇයි තේත්‍රා..... ඔයා මට මගේ ජීවිතේ නොදෙන්නෙ. ඇයි ඔය ඔක්කොම සිද්දි මගෙන් පළිගන්න යොදු ගන්නෙ? ඇයි මට ඔයා ලබාගන්න අයිතියක් නැත්තෙ? ඇයි මට මගේම පුතා හතුරු වෙන්නෙ? මං ඉල්ලන්නේ ඔයාගේ හිත. මං ඒ වෙනුවෙන් මගේ ලේ මස් ඇට නහර ඔක්කොම දෙන්නම්.'

නර්කයේ දී මට ඉඩක් තිබුණේ නැත. අවන්හල ළඟ දී විශ්ව ඔහුගේ පීඩාව මට පහර දීමෙන් මුදා හරින්නට ඇත. ඒත් දැන් ඔහු කොහි ද? මෙ තනට මා රැගෙන ඒමට තරම් පරිසරයක් දුල්ලෑව සකසා ගත්තේ කොහොම ද?

මම දුල්ලෑවගේ මෝටර් රියේ අසුන මත තිබුණු වතුර බෝතලය අතට ගතිමි. කිසිදු පිළිසරණක් නොමැති විට මට කළ හැකි අන් දෙයක් තිබුණේ නැත.

'මං මුලින්ම ඇහුව නේද? අපායට යන්න කැමතිද? දිව්‍ය ලෝකෙට යන්න කැමති ද කියලා.'

දුල්ලෑව අපහාසයට මෙන් සිනා සෙමින් එසේ ඇසුවේ ය.

'මට යන්න ඕන අපායට.'

මම බෝතලය ගෙන එයින් කාරයේ ඩෑෂ් බෝඩයට ගැසුවෙමි. බෝතලය කුඩු වී කාරය පුරා ම වීදුරු කටු විසිරිණි. බෝතලයේ කට හරියේ විශාල කැබැල්ලක් මගේ අතේ ඉතිරි වි ය. දුල්ලෑව කාරය පණ ගන්වා ගත්තේ ය.

'මම මේකෙන් ඇනගෙන මැරෙනවා. මම කිව්වොත් කිව්වා. දෙයියම්පල්ල ඇනගෙන මැරෙනවා. මම කිව්වොත් කිව්වා. දෙයියම්පල්ල ඇනගෙන මැරෙනවා. මාව ගිහිං දාපන් හිටපු තැනට...'

'අවන්හල ළඟටද? කටුගස්තොට ගෙදරටද?

'විශ්ව ඉන්න තැනකට.'

මිස්ට දුල්ලෑව හෙමින් හෙමින් කාරය හරවා ගත්තේ ය. මම මගේ පපුව දෙසට බෝතල් කැබැල්ල එල්ල කොට ගෙන ම සිටියෙමි. දුල්ලෑවට කිට්ටු විය නොහැකි පරිදි දොර පැත්තට බර වීමි.. ඔහු හිමින් කතා කළේ ය. එ විට හන්තාන පල්ලම බැස කාරය නුවර බස් නැවතුමට කිට්ටු කොට තිබිණි.

'ඔය බෝතල් කෑල්ල පහළට දාන්න නේත්‍රා. පාරේ මිනිස්සුන්ට පේනවා...'

'නෑ. පෙනුණාට කමක් නෑ. මිස්ට දුල්ලෑවම නේද දවසක් කිව්වෙ මේකේ වීදුරු කළු කරල තියෙන නිසා පිටට මොකුත් පේන්නේ නෑ කියලා...'



මම මගේ ගැහැණු මොළය පාවිච්චි කරමින් සිටියෙමි.

'මාව දාපන් අවන්හල ළඟට.'

මම ඔහුට අණ කළෙමි.

'නේත්‍රා ඔයා ජීවිතෙත් එක්ක සෙල්ලම් කරන්න එපා...'

'මේ සෙල්ලම මට පුරුදු කළේ ඔයගොල්ලොනේ.'

මම සැජුව ම කීවෙමි. දුල්ලෑව වැව රවුමට කාරය හැරවූයේ ය.

'ඇයි නේත්‍රා දිව්‍ය ලෝකේ පෙනි පෙනී අපායට යන්න හදන්නෙ?'

'මං හිටියෙත් අපායේ. යන්නෙත් අපායට. ඉස්සරහ වම් පැත්තෙ නවත්වන්න.'

මම යළිත් ඔහුට අණ කළෙමි. ඔහු හරියට ම අවන්හල ළඟ කාරය නතර කළේ ය. මම වමතින් කාරයේ දොර විවර කළෙමි. කඩිනමින් එයින් බැස ගතිමි. බෝතල් කැබැල්ල කාරය තුළට දමා දඩාස් ගා දොර වැසුවෙමි.

'නේත්‍රා...'

ඔහු එසේ කියනවා මට මතක ය. මොහොතකින් පැමිණියාට වඩා වේගයෙන් කාරය ඉගිළිණි. මම හුදෙකලාව ටික වේලාවක් සිටියෙමි.

ඉතින් කළ යුත්ත කුමක් දැයි මම නොදැන සිටියෙමි. මම බොහෝ පිරිපතින් පීඩා විඳි අසරණියක් වීමි. ගෙදර යාමට ද මට සිත් නොදේ. විශ්ව කොහේ ගියා ද? ඔහු මැයි මල් ඔඩොක්කුවක් පුරවා මගේ දෙනෙතට එබුණේ කෙ තරම් සංතෘෂ්ටියකින් ද? මගේ හදවතේ තිබුණේ බරකි. බියකි. වකිතයකි. මම හෙමි හෙමින් අප වාඩි වී සිටි මැයි ගස මුලට ගමන් කළෙමි.

විශ්ව වැව දෙසට මුහුණ ලා එ තැන ම වාඩි වී සිටියේ ය. මම තුෂ්ණිම්භූත වීමි. මම පය ඉක්මන් කොට ඔහු අසළට ගියෙමි. ඔහුගේ උරහිසට අත තබා සෙමින් කතා කළෙමි.

'විශ්ව...'

For E-Pusthakalaya

ඔහු කිසිවක් ඇසුවේ නැත. හිස හරවා බැලුවේ ද නැත.

'විශ්ව...'

ඔහුට තිබුණේ හැඬුම්බර පෙනුමකි. ඔහුගේ දෑසේ පුංචි කඳුළක් දිලිසෙමින් තිබිණ.

ශාන්ත වැව් තලය උනුලා සිටියේ කුමන හැඟීමක් දැයි මා දන්නේ නැත. මම බෙහෙවින් කැළඹීමට පත්ව සිටියෙමි. දුල්ලෑවගේ සහ විශ්වගේ හැසිරීම් බොහෝ විට මට නොතේරුම් සහගත ඒවා වී ය. ඔවුන් කතා කළ දේ, ඔවුන් කන බොන දේ, ඇසුරු කළ පුද්ගලයන් පිළිබඳව සිතන විට, මට දැනුණේ ඔවුන් මට සමීප නැති අහස පොළොව මෙන් ඈත වෙසෙන පිරිසක් බව ය. එහෙත් මා සම්බන්ධව ඔවුන්ගේ ගති පැවතුම් මට ම සිතා ගත නොහැකි පරිදි වෙනස් වූ ඒවා ය. සැප පහසු කාරය නවතා තබා විශ්ව වැව් කණ්ඩියේ වාඩි වී සිටී. එ නිසා ම මම බිය වූයේ නැතුව ද නොවේ. කුඩා දරුවකු රවටන බිල්ලෙකු දෙස බලන අයුරින් මම සැකමුසු බැල්මක් හෙළීමි. විශ්ව තවමත් ශාන්ත වැව් තලය දෙස බලා සිටී. ඉන්ද්‍රජාලිකයින් පිරිසක් මා වට කොට ඇතැ යි මට සිතිණි. එහෙත් මගේ හදගැබේ මෝදු වූ විශ්ව පිළිබඳ ළෙන්ගතු සිත ඔහුට නවාතැන් සදන්නට ම සූදානම් වේ. මම මගේ අකීකරු සිතට ඉඩ දුනිමි.

'විශ්ව...'

ඔහු මායාකාරී ලෝකයක සිටියාක් මෙන් දෑස් මා දෙසට හෙළුවේ ය. එහි කෝපය හා වේදනාව සටහන්ව තිබිණි.

'විශ්ව...'

මම වෙව්ලන දෙතොල්වලින් මිමිණුවෙමි. මට තිබුණේ කලකිරීම, දුක හා සන්තාපය මුසු හැඟීමකි. විශ්ව බොඳ වූ දෑස් බිමට බර කළේ නැත. ඔහුගේ දෑසේ දීප්තියක් තිබුණේ ද නැත. මම මායාව හා සත්‍යය අතර හුදෙකලා වීමි. එහෙත් මගේ හදවතේ ගැඹුරු ම තැන් නැවත නැවතත් ඔහු ම ඉල්ලා සිටින්නට වි ය.

'විශ්ව... විශ්ව... විශ්ව...'



මම ඔහුගේ දෙවුරෙන් අල්ලා සෙලවීමි. පරඬැල් පතක් මෙන් ඔහු කය සැහැල්ලු කොට සිටියේ ය.

'අනේ රත්තරං මම මගේ ජීවිතය දෙන්නං. මං ඔයාට හරි ආදරෙයි.'

මට එසේ කියවිණ.

මම ඔහුගේ දෑත ගෙන මගේ මුහුණට තද කොට ගතිමි. කාට කියන්න ද? ඔහු කතා කළේ නැත.

ඔහු හෙමින් මගේ දෙකම්මුල් පිරි මැද්දේ ය. මාපටැඟිලි තුඩින් මගේ දෑස් පියන්පත් වසා කඳුළු ගුලියක් මිරිකා ඉවත් කළේ ය. මම ඔහුගේ දෑතේ උණුසුම් ඇඟිලි තුඩු මගේ නැහැයට උරා ගන්නට වෙහෙස ගතිමි. මගේ උරහිසින් අල්ලා ඔහු වැරෙන් දෙවුර මිරිකා සිටියේ ය.

'මම පාහරයෙක්. මගේ අප්පච්චිත් පාහරයෙක්. මට උරුමවෙලා තියෙන්නෙ පාහර ජීවිතයක්. ඔයා ගෙදර යන්න. මං ඔයාගේ රත්තරං සුදු මූණට ගැහුවා. ඒ මගේ ජඩකම. අප්පච්චි ඔයාව කාරෙකේ දාගෙන අරන් ගියා. ඔයා ආපහු ආවා. දැන් ඔයා යන්න.'

සැපුණු වූ ත් දැඩි වූ ත් ඔහුගේ ස්වරය වඩා රළු ය. තීක්ෂණ ය. මෘදු නැත. ඔහුගේ දෑසේ දීප්තිය වෙනුවට මායාව පොර බදමින් තිබිණ. ඔහු හෙමින් මගේ උරහිසින් ඔහුගේ දෑතේ ග්‍රහණය බුරුල් කළේ ය.

'දැන් යන්න.'

විශ්ව වෙනතක බලා ගෙන කීවේ ය. මට ඉවතට යා නොහැකි ය. මම පවිත්‍ර කෙල්ලක් වෙමි. සැබවින් ම ඔහුට ආදරය කරමි. ඒ හෙයින් මම මුරණ්ඩු ලෙස ඔහු සමීපයට වීමි.

'මාව මිනීමරුවෙක් නොකර පළයන් යකෝ.'

හුදුමයකි. මගේ සිත රිදුණේ නැත.

මසිතේ ප්‍රේමය තවත් දලු ලන්නට වි ය. විශ්ව ඔහුගේ දෑතින් මගේ ගෙල මිරිකා දමති යි මම බිය වීමි. එ විට ම ප්‍රේමය මගේ හදවතේ දලු ලා වැඩෙන්නට වි ය. මම ඔහුගේ කමිසයේ කොලරයේ

පිට ඉණ දක්වා ම සිහින්ව ඇඟිලි තුඩු එහෙ මෙහෙ කළෙමි. සිහින් ම සිහින් ලලිත හඬකින් ඔහුගේ හදට කෙඳිරි ගෑවෙමි.

'බැහැ. මම යන්නෙ නෑ.'

'නේන්නා ... උඹ මෙතනින් පලයං. මට උඹව ලැබෙන්නෙ නැත්නම් මම වෙන කාටවත් උඹව ලබා ගන්න ඉඩ දෙන්නෙත් නෑ. දෙයියම්පල්ල මං උඹව මරල දාල හිරේ යනවා.'

'කමක් නෑ. මං ජීවිතේට ආසා නෑ.'

මම දිග හැරී තිබුණු ඔහුගේ කමිසයේ අත උඩට නමන්නට වීමි. කමිස සාක්කුවේ පැත්තට ඇල වී තිබුණු ඔහුගේ පෑන ගෙන නිස්චිතව එය සකස් කළෙමි. කමිසයේ උඩ බොත්තම පියවා, ඔහුගේ තිකටොන් එල්ලුවෙමි. එක එල්ලේ ඔහුගේ මුහුණ දෙස බලා කතා කළෙමි.

'බැහැ... ඔයාට කවදාකවත් මිනීමරුවෙක් වෙන්න බැහැ.'

මගේ ජීවිතයේ පවිත්‍ර යමක් තිබේ නම් මම එය දෑසට එකතු කළෙමි. මගේ හදවතේ තිබෙන ප්‍රේමාතුර හැඟීම දෑසේ දිය කළෙමි. එකී දෑසින් විශ්වගේ දෑසට එබුණෙමි. ඇසිපිය නොහෙළා සිටියෙමි. ඔහු ත් මම ත් දෑස්වල ගැඹුරු ම තැනින් තරමක් වේලා කතා කළෙමු.

'ඔයාට කවම කවදාකවත් මාව මරාදාන්න බෑ.'

මම ආදරයෙන් කීවෙමි. ඔහු එ විට වැරෙන් මා බදා ගත්තේ ය. මගේ මුහුණ, ගෙල, දෙතොල පුරාවට හාදු වැස්සක් වැටිණි. මම ප්‍රේමයෙන් නොත බරිත වීමි. එහෙත් මොහොතකින් මම යළිත් සිහි එළවා ගතිමි.

'මේක මහපාර .... අතාරින්න.'

මම ඔහුගෙන් මිදුණෙමි. ඔහුට ඉඩ නොදෙන්නට පියවරක් පසු පස්සට ගත්තෙමි.

'දැන් ඉතිං අර කිව්ව වගේ මගේ බෙල්ල මිරිකල මාව මරාදාන්න...'



මම අභියෝග කළෙමි.

'බැහැ....

විශ්වගේ කටහඬ වෙව්ළුවේ ය.

'පුළුවන්. ඔයාට පුළුවන් මාව මරාදාන්න.'

'බැහැ.... බැහැ.... බැහැ.... මට බැහැ.'

ඔහු කියා ගෙන ගියේ ය.

'ඔයා මගේ කෙස් ටික ගලවල ගන්න හැදුව. පොකට්කාරයෙකුට වගේ මගේ මූණට තඩි බෑවා. මිනීමරුවෙකුට වගේ මිට මොළවල මගේ නළලට ගැහුවා. සමහර විට එහෙම වෙලාවක මං මැරෙන්න වුණත් පුළුවන්. විශ්ව ආදරේ කියන්නෙ ඒකට. මගේ තාත්තා මත්පැන් බොනවා. ටවුමෙ ඉන්න නගරංකාරයෝ ආශ්‍රය කරනවා. ඒත් මගේ අම්මට අතක් උස්සන්නේ නෑ...'

විශ්ව කල්පනාවට වැටුණේ ය. මම තෙරපෙ තෙරපා සිටි මෙතෙක් නොකී දේ කීවෙමි.

'මගේ තාත්තා අම්මට ජීවිතේට අත තියල නෑ. ඒ තමයි තාත්තා ආදරේ කරන හැටි. මං ඒ ආදරේට හරි ආසයි. ඔයාට ඉස් ඉස්සෙල්ලම මම ආදරේ කිව්වෙත් අද.... අදම ඔයා මට ගැහුව. ඒකත් ආදරේ වෙන්න ඇති. මං ඒකටත් ආදරේ. එහෙම වෙලාවක මං මැරෙන්න පුළුවන් විශ්ව.... ඒ කියන්නෙ ඔයාට මාව ආදරේ හින්ද මරාදාන්න පුළුවන්.'

මා එ ලෙස කියත් ම මගේ දෑසට අලුත් කඳුළු උනා ආවේ ය. ඒ කුමක් අරබයා දැයි මම නොදනිමි. බොහෝ විට අම්මාගේ ත්, තාත්තාගේ ත් ආදරය නිසා උපන් දුක් කඳුළු වීමට පුළුවන. මම මහා සුසුමක් හෙළුවෙමි.

ඒ මගේ ජීවිතයේ පාළු බවේ, දුකේ හා වේදනාවේ සුසුම යි.

මම මගේ ජීවිතයේ බොහෝ අසරණ අවස්ථාවන්ට මුහුණ දී ඇත්තෙමි. දුක්ඛ දෝමනස්ස පිරිපත මගේ ජීවිතයට ආගන්තුක ඒවා නොවේ. කනිකම - පාලුව - හුදෙකලාව හුහුරු හුහුරුදු හැනීම් දනවනවා ද නොවේ. ප්‍රේමය - ආදරය - නිසා උපදින කම්පනය

හා අලුත් අලුත් විදවීම් සියල්ල ම මට අමුතු රිදුමක් දනවන්නේ ඇයි? එය මට විඳින්නට – විඳ ගන්නට අසීරු ඇයි? දරන්නට – දරා ගන්නට මෙ තරම් අසීරු මහ අමුතු බලවේගයක්ව ආදරණීය රිදුම් – අමරණීය රිදුම් වද දෙන්නේ ඇයි?

මට මහා ඉක්මනකින් පළා යන්නට ඕනෑ වී තිබේ. විශ්ව වෙතින් ඈතට ඈතට ගොස් තනිව ම මහා පාලුව – බෝ දුක විඳව විඳවා ඉන්නට මට ඕනෑ වී තිබේ. යටි හිත මරා දැමූ කලෙක මෙන් මම සරල මතුපිටකින් බරක් නොදැනෙන්නට කෙටියෙන් සමු ගැනීමට හිත හදා ගත්තේ ඒ හෙයිනි.

'මම යනවා...'

'එපා.'

සැණෙකින් විශ්ව මගේ අතින් අල්ලා ගත්තේ ය.

'මට යන්න ඕන.'

'කොහේද?'

'ඇයි අහන්නෙ?'

'මට අයිති නැද්ද එහෙම අහන්න?'

'ඔයාට මාවවත් අයිති නැති එකේ මං යන්නෙ කොහේටද කියලා අහන්න අයිතියක් කොහෙත්ද?'

මම සිතාමතා ම හෝ නොසිතා ම තීරණයක් ගත්තෙමි. විශ්ව දෙසට පියවරක් ඉදිරියට තබා ඇඟිලි තුඩින් ඉස්සී ඔහුගේ නළල සිප ගතිමි.

'මං යනවා විශ්ව.'

ඒ සැණින් මම දළදා මාළිගය පැත්තට දිව ගියෙමි. ඔහු පියවර කිහිපයක් මා පසු පස එළවන හඬ මට ඇසිණ.

'හේනා.... හේනා.... හේනා....'

ඔහුගේ හඬ නුවර නගරයේ දහසක් ඝෝෂාකාරී ශබ්ද අතර මළින වෙද්දී මම හරස් වීදියකින් පැමිණ සෙනඟ අතර තනි වීමි.



# 7

හෝරා කටුව පැයක් යන්නටත් මත්තෙන් මම ආපසු අපේ ගෙදරට ගොඩ වූවෙමි. මා නිවසට ගොඩ වන විට එහි තිබුණේ දැඩි නිහඬතාවකි. දෙතුන් දෙනෙකු ඉදිරි පස කාමරයේ සිට එළියට ආවේ කළබලකාරී ආවේගාත්මක හඬවල් පිට කරමිනි. මා ගෙට ගොඩවත් ම ඔවුහු  මට ඉඩ දී දොර දෙපැත්තට වූ හ. පාලු වේදනාත්මක සිර ගෙදරකට පිවිසෙන්නාක් මෙන් මම තවත් අඩි කීපයක් තබත් ම, කවුදෝ කෙඳිරි ගානවා මට ඇසිණ. කෝපය සහ වේදනාව මගේ හදවතේ ගැඹුරු ම සීමාවේ ගුලි ගැසී තිබිණ. මා කාමරයට යන විට තාත්තා ඇඳේ දිගා කොට තිබිණ. ඔහුගේ නළල ත් උරහිස ත්, කකුලත් මුහුණේ තැන් කිහිපයකු ත් බැන්ඩේජ් පටිවලින් වෙළා තිබිණ.

'තාත්තේ...'

මම ඔහුගේ යහන පාමුල දණ ගැසුවෙමි. තාත්තා වමත හිමින් ගෙන මගේ හිස මත තැබුවේ ය. ඔහුගේ රළු ඇඟිලි තුඩු වෙව්ළනවා මට දැනිණ. මම නළලේ සිට දෙපා දක්වා ඔහුව නිරීක්ෂණය කොට පපුවට අත තබා ගෙන ම සිටියෙමි.

'ඇයි අම්මා ... මොකද්ද වෙලා තියෙන්නේ?'

'මාලුකඩේ කට්ටිය තාත්තාට ගහලා.'

'මොනව කළාටද?'

'කවුද දන්නේ?'

අම්මා කතා කළේ මා සමඟ කලකිරීමෙන් මෙනි.

'ඉතිං පොලීසියට කිව්වෙ නැද්ද?'

For E-Pusthakalaya

'පොලිසියට කියල් අනික් අතපයත් කඩාගන්න ද?'

'ඒක හරි කතාවක්නේ? නිකං එහෙම ගහන්ඩ පුළුවන්ද මිනිස්සුන්ට .... මං යන්නම්කො පොලිසි...'

මම නැගී සිටියෙමි. අම්මා එ සැණින් මට තරවටු කළා ය.

'උඹ නටන නාඩගම් කෙළවර වෙන්නෙ මේ ගෙදරට මිනීපෙට්ටි තුනක් ගෙනාවම තමයි. පැත්තකට වෙලා හිටපං. නැත්නම් උඹේ කකුල් දෙක කඩලා පැත්තකට කරනවා මම. මෙහෙම දුක් විඳිනවට වැඩිය හොඳයි උඹව අබිබගාත කරලා කන්ඩ බොන්ඩ දෙන එක.'

'අම්මට මොකද මේ වෙලා තියෙන්නෙ. මං අහවල් එකක් කළාවද?'

'කොරපු හරිය ජේනව නේද?'

අම්මා තාත්තා දෙසට ඇඟිල්ල දිගු කරමින් කීවා ය. කාමරයේ සිටි දෙදෙනා එ විට ම වාගේ ඉවත් වූ හ. මගේ සිරුරේ පණ නැති වෙගෙන එන්නාක් මෙන් දැනිණ. මම තාත්තාගේ පපුවේ හිස ඔබා ගත්තෙමි. තාත්තා ඇඟිලි තුඩින් නැවතත් මගේ හිස පිරි මැද්දේ ය.

සිතට දුකක් දැනුණ ත්, සතුටක් දැනුණ ත් එය දිගින් දිගට ම විඳ විඳ සිටීමේ පුරුද්දක් මට තිබුණේ නැත. සතුටක ආස්වාදයක් ළඟ ළඟ ම දැනි දැනීත් මම ඉන් ඈත් වූ අවස්ථා එමට ය. දුක වේදනාව මා අසළ ගැවසෙන්නට තතනන විට මම විගසින් ඉන් පිටතට පැනීමි.

තාත්තාගේ කෙඳිරිලි හඬ තවමත් මට ඇසේ.

මම තාත්තා වෙතින් ඈත්ව දොරකඩට පැමිණියෙමි. දෙදණ මත නිකට තබා මහේ බලා ගෙන සිටියෙමි. ඒ කුමක් අරභයා දැයි මම නොදනිමි. අපේ ගේ අවට පරිසරයේ වපසරිය මගේ දෑස දැමේ ඇළී ගැලී කැත්පත් වූවේ නැත. සිමෙන්ති පඩියේ මගේ කය සිඹිය දී මම මම ම නොදන්නා ළඟක් ද දුරක් ද නැති ඉසව්වක මසිත රඳවා තැබීමි.

අම්මා කීප විටක් මා අසළට පැමිණ කතා නොකර ම නැවතත් ගෙට රිංගුවා ය.



දුර දක්නා නුවණක් මට තිබුණා දැයි මා දන්නේ නැත. දුරින් දුරට ඈතට සිතන්නට මට ඕනෑකමක් තිබුණේ නම් නැත. මා ජීවිතයේ මෙ තෙක් කළ කී දේ කිසිවක් බුද්ධියෙන් කිරා මැන බලා කළ දෙවල් නම් නොවේ. ඉවෙන් මෙන් ගත්තා වූ තීරණ යි. බොඳ වූ උමතු, විකල් සිතුවිලි මා වෙළා ගන්නවා දැයි මම නොදනිමි.

තාත්තා වඩා වේදනාවෙන් කෙඳිරි ගාන්නට වි ය. ඇත්තෙන් ම තාත්තාට පහර දුන්නේ කවු ද?

තාත්තා වේදනාව නිසා කෙඳිරි ගාන කෙනෙක් නොවේ. ඔහුගේ සිත දැඩි ය. සැජු ය. අවංක ය. බොහෝ විට නිර්භීත ය. ශරීරයේ වේදනාවට තාත්තා කෙඳිරි ගානවා වන්නට බැරි ය. මම පඩිය උඩින් නැගී සිටියෙමි. පාරට පැමිණ, බසයකට ද නැගී පොලිසියට එමට මට කෙ තරම් කෙටි කාලයක් ගත වි දැයි මම නොදන්නෙමි.

පැමිණිලි සටහන් කොට ගන්නා කොස්තාපල්වරයා යටැසින් බලා 'ඇයි' යනුවෙන් නොසැලකිලිමත් ලෙස ප්‍රශ්න කළේ ය. මම අඩි කීපයක් ඔහුට සමීප වීමි.

'ඇයි?'

ඔහුගේ ස්වරය දැඩි ය. සිරුර රළු ය. බැල්ම මනමාළ ය. මම පැමිණිල්ල ගළපාගත නොහැකිව මොහොතක් ඔහු දෙස නොබලා අහක බලා ගෙන සිටියෙමි.

'ඇයි? කටේ පිට්ටුද?'

'නෑ.'

මට ඉබේට ම කියැවිණි.

'එහෙනම් ඉතිං කතා කරනව.'

'රාලහාමි හරි සැරයිනෝ?'

මම පදික වේදිකාවෙන් ගැහැණුන්ට උරුම වූ ව්‍යාජය ඔහුට පෑවෙමි.

'මොන රෙද්දකටද මෙතෙන්ට ආවේ?'

'රාලහාමි මම තේත්‍රා.'

'ඔයේ කව්රු වුණත් මට කමක් නෑ. මොකක්ද පැමිණිල්ල.'

‘අපේ තාත්තට මාර්කට් එක ගාවදී හොඳටම ගහලා. තාත්තා තමයි මාර්කට් එකේ ඉස්සරහ අන්නාසි විකුණන සිල්වා. එයා අවුරුදු දහය පහළොවක් එතන ඉන්නවා. අද කවුද කට්ටියක් වටකරලා හොඳටම ගහලා. තාත්තාගෙන් ඇහුවොත් ගහපු උන්ගේ නම්ගම් කියයි. එයා බෙහෙත් දාගෙන ගෙදර ගිහිල්ලා. දැන් කෙඳිරි ගගා ඉන්නවා. මගේ තාත්තා වැරදි වැඩකරන කෙනෙක් නෙවෙයි. මේ වැඩේ කරපු උන්ට හෙණ ගහනවා. මම කියන්නෙ.....’

කොස්තාපල්වරයා කිසිවක් ලියා නොගෙන ම නැගිට අසල ඇති වීදුරු කාමරයට රිංගුවේ ය. සැණෙකින් ඇතුළතින් බළල් පැටවකු මෙන් එළියට පැමිණ කුරුමානමකට පොල් කැල්ලක් දමන්නාක් මෙන් කතා කළේ ය.

‘ඕ.අයි.සී. මහත්තයා ඔහේට කතා කරනවා.’

ඔහුගේ දෑස මගේ හිසේ සිට දෙපතුළ දක්වා ගමන් කළේ ය. මම කොන්ද කෙලින් තබා ගෙන වීදුරු ගුහාවට රිංගුවෙමි. උසස් නිලධාරියා ළඟ විශ්වගේ පියා දුල්ලෑව වාඩි වී සිටියේ ය. ඔහු මා දෙස බැලුවේ වත් නැත. නිලධාරියා කතා කළේ කපටිකමින් ද, උපහාසයෙන් ද, තර්ජනයෙන් දැයි මට පැහැදිලි නැත.

‘ආ... මෙයාද මේ බෝතල් කඩාගෙන මිනී මරන්ඩ හදන පුලාන් දේවි. තෝ දන්නවද බෝතල් කටුවෙන් අනින්ඩ හදපු මේ මහත්තයා කවුද කියලා?’

මගේ ඇඟ සීතල වී ගියේ ය. කළ යුත්ත මගේ ගෙල මිරිකා ගැනීම ද, දුල්ලෑවගේ ගෙල මිරිකා දැමීම දැයි මම නොදන්නෙමි.

‘යකෝ උඹල වගේ ගෑනු පොලිසියට ඕන තරම් සෙල්ලම් දාල තියෙනවා. උඹ මතක තියාගනින් කකුල් දෙකෙන් එල්ලල ගහන්නේ. අම්ම දීපු කිරි මතක් වෙන්ඩ. මහත්තයා .... මෙහෙම එවුන්ට පස්සට පයින් ගහල පැත්තක තියන්ඩ ඕන...’

දුල්ලෑව මූණ දුන්නේ නැත.

‘සමහර වෙලාවට වැරදිකාරයා හොයාගෙන පොලිසිය ළඟට යනවා. සමහර වැරදිකාරයෝ වැරැද්ද කරලා පොලිසියට ම එනවා. උඹ දැන් ආපු එක හොඳයි.’

නිලධාරියා රිසීවරයේ අංකයක් කරකවා දෙතුන් විටක් ‘හලෝ හලෝ ....’ කීවේ ය. මම සිතට වීරිය ගත්තෙමි.

‘උඹේ තාත්තා නේද මාර්කට් එකේ සිල්වා?’

‘ඔව්.’

‘ඉස්සරහ ලෑල්ලෙ පත්තරකාරයා ළඟ අන්නාසි විකුණනවා?’

‘ඔව්’

‘උඹ බෝතලයක් කඩලා මේ මහත්තයාට අනින්න හැදුව?’

‘ඔව්’

‘දැන් තාත්තා ගෙදර’.

‘ඔව්’

‘තාත්තට මිනිස්සු ගහලා.’

‘ඔව්’

‘තාත්තා පොලිසි නැවිත් උඹ පොලිසි ආවා.’

‘ඔව්... ඔව්.... ඔව්....’

‘දුවට ඉස්සරහට දාල මංකොල්ල කන්න හැදුවට මහපාරේ මිනිස්සු නිකං ඉන්නෙ නෑ. දුව ගෙදර ගියා. තාත්තට මිනිස්සු ගැහුවා.... මුංව දැන් ම මට්ටු නොකළොත් මහත්තයා... ඊට පස්සෙ දිගටම හොරකම් කරනවා. මිනී මරනවා. මංකොල්ල කනවා...’

එසේ කියා ගෙන ම ඕ.අයි.සී. කාමරයෙන් එළියට ගියේ ය. දුල්ලෑව අසරණ ලෙස බිම බලා ගත්තේ ය. ඔහු පොලිසියට කියා ඇත්තේ මා ත් තාත්තා ත් එකතු වී කුමන්ත්‍රණය කොට ඔහුව මංකොල්ල කෑමට උත්සාහ කළ බව යි. මම මගේ වෛරය ගුලි කොට ඔහුට දමා ගැසුවෙමි.

‘මට මගේ පාඩුවෙ ඉන්න නොදෙන වනචර බල්ලා. කුපාඩියා. මගේ ඇඟට එක අතක්වත් තිබ්බොත් මං උඹව ඉතුරු කරන්නෙ නෑ. අසරණකමෙන් ප්‍රයෝජන ගන්න තිරිසනා. මගේ තාත්තාට කරපු අපරාදෙට උඹව පණ පිටිං කූණු වෙනවා. වලව්වෙ හාමු. තූ විතරක් සාහ්රයා...’

For E-Pusthakalaya

'මේ ඔක්කොම සිද්ධ වුණේ ආදරේ හින්ද? ඔයාට තේරෙන්නෙ නැ තේත්‍රා.'

'ඔයිට හොඳයි ඔය රෙදි ගලවලා පාරේ හෙළුවෙන් ගියා නම්.'

නිලධාරියා 'එක්ස්කියුස් මී' කියා ගෙන ම නැවතත් ඇතුළු වි ය.

'අපි මොකද කරන්නේ මිස්ට දුල්ලෑව'

ඔහු ඇසුවේ ය.

'ඒක තමයි...'

දුල්ලෑව වෙනත් ස්වරයක් ආරූඪ කර ගත්තේ ය. මම නිලධාරියා දෙසට කඩා පැන්නෙමි.

'කරන්න තියෙන්නෙ මේකගේ බෙල්ලේ ගල් ගෙඩියක් එල්ලලා වැවේ ගිල්ලවන එකයි.'

'මේක පොලිසිය. කට ප්‍රවේශමෙන්...'

නිලධාරියා මට රවා ගෙන ම සිටියේ ය.

'මං දන්නවා.'

මම එකවෙත කීවෙමි. බිය මගෙන් ඈත් වෙමින් තිබිණ.

එක් කොස්තාපල්වරයෙක් මගේ දෑත පසු පසට කොට අල්ලා ගත්තේ ය. මගේ මූහුණ පරඬැල් වන්නට දෙකම්මුල්වලට තඩි රළු අතකින් නොනවත්වා ම පහර දෙන්නට වි ය. මම මගේ මුළු වීරිය ම ගෙන කාරා කෙළ පිඩක් දුල්ලෑවගේ මුහුණ දෙසට එල්ල කළෙමි. දුල්ලෑව නැඹී සිටියේ ය.

'තේත්‍රා...'

ඔහු තර්ජනාත්මක ලෙස කතා කළේ ය.

'ඔව්. මම තේත්‍රා තමයි. උඹ මාව දූෂණය කරන්න හැදුවා. මාව විනාශ කරන්න හැදුවා. මගේ තාත්තාට ගුටි ගැස්සුවා. පොලිසියෙන් දාල මට ගැස්සුවා. ඇයි දෙයියනේ මුංට මෙහෙම පිරිමි ආත්මයක් දුන්නේ...?'



මම පොලිසිය දෙවනත් වන්නට විලාප දී කෑ ගසා හඬන්නට වීමි.

වේදනාව හා වෛරය මම අත්විඳ ඇත්තෙමි. කුඩා කාලයේ දී අනේක වූ අසාධාරණකම් අත්විඳීමි. බොහෝ විට කෝපය හා දැවෙන වෛරය පිට කර ගත නොහැකිව මම ඒවා මගේ ආත්මයේ ම ගිලෙන්නට හැරියෙමි. පදික වේදිකාවේ අසරණුන් කුසගින්නේ විලාප දෙනු අසා මගේ දෑසට නැඟුණු කඳුළු දෑස දැළේ ම වියළෙන්නට හැරියෙමි. මගේ වයසේ ම දැරිවියන් ලිංගික අතවරවලට ලක් වී හඬනු මම පුළිඟු දැසින් බලා සිට ඇත්තෙමි. අප වෙනුවෙන් තාත්තා මහමෙරක් බර උසුළා නගරයේ මුට්ට කරගසා ගෙන ගාට ගාට යන විට මම සුසුම් හෙළීමි. වැව් කණ්ඩියේ දී අනුන්ගේ ඉඳුල් බත් කුසගින්නේ බුදින විට පොලිස් සපත්තුවලින් තරු විසි වෙන්නට පස්සට පයින් ගසද්දී ත් ඉවසා සිටීයෙමි.

එහෙත් ....

දෑත ම අල්ලා ගෙන පොලිසියේ දී ඔවුන් මගේ කම්මුලට පහර දෙන විට මම කෙසේ ඉවසන්න ද? අසරණ තාත්තාගේ ජීවිතය නැති කරන්නට තිරිසනෙකුට මෙන් ඔහුට පහර දී ඔත්පල කරද්දී තවත් කෙසේ ඉවසන්න ද? බලය සහ මුදල් තටු විහිද ගත් මකරෙකු මෙන් මා බිලි ගන්නට හදද්දී තවත් අසරණ වී අනුකම්පාව යදින්නට මසිත ඉඩ නොදේ.

'මාව මරා දමාපියව්. නැත්නම් මම පාරට බැහැල කෑ ගහනවා. මගේ පිරිමාංශ කන්න හැදුව කියලා.'

මම වැරෙන් දෑතට වීරිය ගෙන පොලිස් නිලධාරීන් දෙදෙනාගෙන් මිදුණෙමි. ඇහිලි විහිදුවා ගෙන දුල්ලෑවගේ ජොල් ශරීරය මතට යක්ෂාවේශයෙන් කඩා පැන්නෙමි. ඔහු ඉවතට පැන්නේ ය. මගේ මුහුණ ත් දෑතත් පුටුවේ ගැටිණි.

'තේත්‍රා.... ඔයා කළබල වෙලා. ඔහොම වාඩිවෙන්න. කරුණාකරල මෙයාට වතුර වීදුරුවක් ගෙනත් දෙන්න...'

දුල්ලෑව සන්සුන් ස්වරයක් ආරූඪ කර ගත්තේ ය. ඔහු නළලේ නැඟුණු දහදිය බිංදු කිහිපය මාපටැඟිල්ලෙන් උළා බිමට දැමී ය. මම පුටුවේ වාඩි වීමි.

For E-Pusthakalaye

'මිස්ට දුල්ලෑව එහෙනම් කතාකර ගන්නකෝ....'

යැයි කියමින් පොලිස් නිලධාරියා වීදුරු ගුහාවෙන් ඉවත් වි ය. පහළ නිල ලද්දෝ ද ඒ සමග ම ඉවත්ව ගිය හ.

'නේත්‍රා..... මං ආදරේ කළේ ඔය රළු වචනවලට නෙමෙයි. බලන්න ඔය මූණ දිහා .... නිකං මිනී මරන්ඩ යන්ඩ හදනව වගේ....'

'පිස්සා....'

මම දත්මිටි කෑවෙමි. මගේ සිරුර හිගැස්සෙමින් තිබිණ. ආශ්වාස ප්‍රශ්වාස වේගය මට පාලනය කර ගත නොහැකි වි ය. මගේ පෙණහැල්ල සැහැල්ලු වීමට ඔවුහු ඉඩ නොදුන් හ. දුල්ලෑව නැවතත් සෙමින් කටහඬ අවදි කළේ ය.

'අපි තාත්තව සනීප කරමු. රස්සාවක් දෙමු. මං නුවරින් ගෙයක් අරන් දෙන්නම්. මාසෙ වියදමට සල්ලි දෙන්නම්. ඔයා දන්නෙ බොහෝම ටිකයි නේත්‍රා.... සල්ලිවලට හුඟක් දේවල් ගන්න පුළුවන්...'

'තොපි වාගේ නපුංසකයෝ සල්ලි උඩ තියලා පුච්චන්න ඕන....'

මම ඔහුගේ ඇස් ගුලිවලට වෛරය දමා ගැසුවෙමි.

'ඔහොම හිතලා නම් ඔයාට කවදාවත් ජීවිතේ වෙනසක් දකින්න වෙන්නේ නෑ...'

'මං උඹලගේ සල්ලි ඉස්සරහ වෙනස් වෙන්නේ නෑ...'

'සල්ලි ඉස්සරහා නෙමෙයි නේත්‍රා.... ආදරය ඉස්සරහා.'

'ඕවි... ඔව්... උඹල උඹලගේ විස දළ දික්කරන්නෙ ඔහොම කියලා තමයි. මගේ තාත්තට ගුටි ගහපු එවුන් මේ පොලිසියට ගෙනල්ල උන්ගේ ඇට කටු කැඩුවෙ නැත්නම්.... මං කවද හරි උඹේ ඇටකටු කඩනවා...'

මම පුපු ඇන්ද ඇඟිලිවලින් මිරිකා ගෙන ඇඬුවෙමි.

'ඔයා නිකං ත්‍රස්තවාදී කෙල්ලක් වගේනේ.'

'ත්‍රස්තවාදී කෙල්ලෝ හැදුවෙත් තොපි වගේ පාදඩයෝ තමයි.'

'හොඳයි... එක පොරොන්දුවක් .... මං දැන්මම උන්ව මේ පොලිසියට ගෙනෙල්ලා උන්ගේ ඇටකටු කඩවන්නම්. හැබැයි ඔයා මං කියන දේට එකඟ වෙන්න ඕන.'

නිවි නිවී තිබුණු ගිනි පුළිඟු ඇවි ගිනි ලන්නට වි ය. දැවි දැවි තිබුණු පුළිඟු ඇස්වලට දුල්ලෑව විස දුම් පිම්බේ ය.

'යක්ෂයා.... මෙතනින් පළයං යක්ෂයා...'

මම දෙතුන් විටක් කෑ ගසන විට පොලිස් නිලධාරියා නැවතත් එබී බැලී ය. වීදුරු දොර ඇරිණ. මම නැඟී සිටියෙමි. පොලිස් නිලධාරියා කතා කළේ ය.

'එක්ස්කියුස් මී... මිස්ට දුල්ලෑව .... පුතා විශ්ව ඇවිල්ලා....'

මගේ මුහුණට ගිනි පොකුරු වැසි වැටිණ. මගේ දෑස ඉදිරියේ ම දුල්ලෑව අහසින් පොළොවට වැටිණ. දුල්ලෑවගේ සැළෙන මස්ගොබවලට දහදිය දමමින් තිබිණ.

මම හැකි ඉක්මනින් විශ්වගේ උණුසුම සොය ඉගිළුණෙමි.

මම මගේ මුහුණ ඔහුගේ උරහිසට තුරුලු කළෙමි. 'ඩග් .... ඩග්...' යන හඬින් විශ්වගේ පපුව ගැහෙන්නට වි ය. ඔහුගේ මුහුණේ තිබුණේ ගිනි ගන්නට ආසන්න ගිනි කන්දක ශාන්ත බවකි. මට ඉකිබිඳිණ.

ඔහු කතා කළේ නැත. විශ්වගේ දෑස යොමු වී තිබුණේ මා දෙසට නම් නොවේ. තම පියා දෙසට ඔහුගේ දෑසින් ගිනි විදිමින් තිබිණ. මගේ හිසේ කෙස් රොද අතර විශ්වගේ ඇඟිලි සැරි සරනු මට දැනිණ. විශ්ව කතා කරද්දී මම හිස එසවීමි.

'අප්පච්චි.... මං මුලින්ම ආදරෙන් කියන්නම්.... මං මගේ අප්පච්චිට, අප්පච්චි කෙනෙකුට වගේ සලකන්නම්. මගේ හිතේ තියන ඒ ආදරේ වෛරයක් කරගන්න එපා. කරුණාකරල පොලිසියෙන් එළියට යන්න. නැත්නම් මෙතන ඔක්කෝටම ඉස්සර වෙලා අප්පච්චිගේ කලිසම ගලවන්නේ මම....'

විශ්ව සන්සුන්ව එහෙත් දැඩි හඬින් කීවේ ය. ඔහුගේ වචනවල තිබුණේ ස්ථාවර බවකි. එය ම මට සැනසුමකි.

පොලිස් නිලධාරියා කලබල වි ය.

'කරුණාකරල ඔය ප්‍රශ්නෙ පොලිසියෙන් එළියට අරගෙන යන්න. මං හිතුවෙ නෑ මේක තාත්තගෙයි පුතාගෙයි ප්‍රශ්නයක් කියලා..'

'පොඩ්ඩක් ඉන්න. ඔක මීට ටිකක් කලින් කල්පනා කළා නම් නේද හොඳ? දැන් පෙරහැර ගිහිල්ලා. කස ගහලා තියෙන්නෙ රාළහාමිලාමයි. මේ නිසා දැන් මේක මෙතනදීම විසඳගමු.'

'පුතා උඹට මොනවද ඕන. උඹට ඕන දෙයක් දෙන්නම් මට මේ කෙල්ල එක්ක සැනසීමේ ඉන්න ඉඩ දීපං'

'අප්පච්චි පිස්සෙක් වගේ හැසිරෙන්න එපා. මේකිගේ අසරණකම අප්පච්චිට වැටහෙන්නෙ නෑ. මේ ඇස්වල තියෙන හැඟීම ඔය වයසක හිතට තේරෙන්නේ නෑ. මට මොකවත් එපා. මට නේත්‍රා ඕන.'

'උඹ මගේ ජීවිතේ ඉල්ලපං.'

'මට දැන් ඒට වඩා නේත්‍රා වටිනවා.'

'උඹට මොකද්ද මේකි දුන්න ඉනාව?'

'අප්පච්චිට දුන්න එකම තමයි.'

'උඹ මේකිට පිස්සු වැටිලා.'

'අප්පච්චිට වගේම.'

'මෝඩයා...'

'මෝඩ අප්පච්චි.'

'මං තොපි දෙන්නම මරනවා.'

'ඇහුණ නේද? දැන් කරුණාකරල ඔය පැමිණිලි ලියා ගන්ඩ මතු ආරක්ෂාවට, අපිට මරණ තර්ජන තියෙනවා කියලා පොලිසිය සාක්ෂි. මම අද නේත්‍රා බඳිනවා. අපි දෙන්නගේ වයස හරි. අපි අපිට ඕන දිහාවකට යනවා. අපි දෙන්නා මරනවා කියලා අප්පච්චි කියනවා. මතු ආරක්ෂාවට පැමිණිල්ල ලියා ගන්ඩ.'

දුල්ලැව වෙව්ලමින් සිටියේ ය. පොලිස් නිලධාරියා කතා කළේ ය.

'විශ්ව.... ඔයගොල්ලන්ගේ පරම්පරාව, තම්බුකාරකම මම දන්නවා. හදිසි තීරණ ගන්ඩ එපා.'

'මං ගත්තෙ මට ඕන තීරණේ.'

'අපිට නීත්‍යානුකූලව ක්‍රියා කරන්ඩ වෙයි.'

'තමුසෙගේ නීතිය මම දන්නව ඕයි. මේ කෙල්ලගේ තාත්තට ගස්සලා, අතපය කඩලා, මගේ තාත්තාට මේ කෙල්ල බලෙන් ගෙනියන්ඩ දෙන්ඩ? තමුසෙට පුළුවන් මහලක් කරනවා.'

විශ්ව බෙරිහන් දුන්නේ ය. මට විශ්ව පිළිබඳ සිහින් ආඩම්බරයක් දැනිණ.

'මේක පොලීසිය. මිස්ටර් විශ්ව. ඔය ගොල්ලන්ගෙ සල්ලියි බලයයි තියාගන්ඩ මෙතනින් එළියේ. මගේ යකා අවුස්සල ගත්තොත් තුන් දෙනාම දානව කූඩුවට.'

'බොරු පැමිණිල්ලක් කළාට මගේ අප්පච්චිව දාන්ඩ කූඩුවට. නේත්‍රාගේ තාත්තට ගහපු එවුන්වත් දාන්ඩ ඒ කූඩුවටම. නීතිය ක්‍රියාත්මක නොකළට තමුසෙත් යනව ඒ කූඩුවට. නිලධාරියෙක් වෙන්න ඉස්සර, මනුස්සයෙක් වෙනවා ඕයි.'

මම බිය වීමි. විශ්ව නිසා ම බියවීමි.

'සොයිසා ... මේ දෙන්නගේ පැමිණිල්ල ලියාගෙන පිටත් කරන්න. මිස්ටර් දුල්ලැවත් කරුණාකරල යන්ඩ.'

නිලධාරියා නැඟී සිටියේ ය. විශ්ව සොයිසා නමින් අමතනු ලැබූ කොස්තාපල්වරයා ළඟට ගියේ ය.

'අපි දෙන්න අද බඳිනවා. අනාගතයේදී මට හරි මගේ බිරිඳ නේත්‍රාට හරි කරදරයක් වුණොත් තාත්තා වග කියන්න ඕන.... ඒ ටික ලියල තියන්ඩ.... යමු නේත්‍රා...'

මම කරකියා ගත හැකි කිසිවක් නොමැතිව සිටියෙමි. දුල්ලැව හඬමින් අප ඉදිරියට පැමිණියේ ය.

For E-Pusthakalaya

'මං මගේ ජීවිතේ නැති කරගන්නවා පුතා. උඹ ඒකට වග කියන්න ඕන.'

දුල්ලැව වෙව්ලමින් කීයේ ය.

'යමු නේත්‍රා.'

විශ්ව මගේ අත සුරැකිව අල්ලා ගත්තේ ය. මම ඔහු පසු පස ගමන් කළෙමි.



# 8

මේ ගමන ආරම්භ කළේ කවදා දැයි මම නොදනිමි. මේ ගමන අවසන් කරන්නේ කො තනින් දැයි මම නොදනිමි. දැනුදු මා ගමන් කරන්නේ කොහාට දැයි මම මගෙන් නොඇසුවෙමි. එහෙත්: මම විශ්වගේ සුරතේ එල්ලී සිටියෙමි. අපි දළදා වීදිය පැත්තට ගමන් කරමින් සිටියෙමු. විශ්ව දැඩිව මගේ අත අල්ලා ගෙන සිටියේ ය.

'විශ්ව: ඇයි මගේ අත ඔච්චර හයියෙන් අල්ල ගෙන ඉන්නෙ. මගේ අත හිරිවැටිලා.... මං ඔයාව දාල යයි කියල බයයි නේද?'

'ඔව්. මං බයයි. ඔයා අහිමි වෙයි කියලා. කවුරුහරි උදුරගෙන දුවයි කියලා. දැන් ඉතිං මේ අත ආයෙත් අතාරින්නේ නෑ...'

විශ්ව, දැඩිව අල්ලා ගෙන සිටි මගේ අත ඔහුගේ මුවට තබා සිප ගනිමින් එසේ කීවේ ය. පිටි අත්ල රිදුම් දෙන්නට තරම් සිප ගත්තේ ය.

මම ඔහුට ඉඩ දීමට සූදනමින් සිටියෙමි.

විශ්ව කුමන තීරණයක සිටියා දැයි මා දන්නේ නැත. මම ව්‍යාකුල අතීරණය තුළ ම සිටීමට ආසා කළෙමි. කළ යුත්තේ කුමක් දැයි සිතීමට, සිතට බරක් වූ හෙයින් සිතට නිදැල්ලේ ඉන්නට ඉඩ දෙන්නට මම පෙළඹී සිටියෙමි.

මසිතට බාධකයක් තිබුණේ නැත. මම ඔහුට අවනතව බොහෝ දුරක් ඔහු පසු පස ගමන් කළෙමි.

සිත නිදැල්ලේ හැසිරීමට බිය වූ සෙයකි. මගේ අම්මා හා තාත්තා පිළිබඳව දුක්ඛ දෝමනස්ස සිතුවිලි ද, විශ්වගේ මව සහ පියා පිළිබඳව රුදුරු බියකරු සිතුවිලි ද විශ්ව පිළිබඳව ආදරණීය

For E-Pusthakalaya

සිතුවිලි ද මගේ සිත් පතුලෙහි වැදී නිනාද වී ය. හිස කකියවා දෙනෙතට කෙත උරා එන්නට වී ය.

මං දෑස් පියන්පත් තද කළෙමි. මගේ දෑස තෙත් වී තිබුණි. හඬන්නට මෙ තරම් කඳුළු කොයින් ද? මම දෑසට උනා ආ තෙත් කඳුළු වියැළෙන්නට හැරියෙමි.

එ විට ම වාගේ මගේ පපුවේ වේදනා ගුලියක් සිර වී ය. සිත තිගැස්සිණ.

'විශ්ව, මට ගෙදර යන්න ඕන.'

'නේත්‍රා...'

ඔහු කුමක් දෝ කියන්නට තතනා ගිල ගත්තේ ය.

'මට ගෙදර යන්න ඕන විශ්ව .....'

'අපි දෙන්නම ගෙදර යමු නේත්‍රා. අපි දෙන්නම ඔයාගේ ගෙදර යමු. මම කියල කතා නොකර ඉමු. මං ඔයත් එක්කම ඉන්නවා. තීරණ ගන්නකොට අපි දෙන්නම එකට තීරණ ගනිමු.

'මං දන්නෙ නෑ විශ්ව ඔයා මොකද්ද කරන්න හදන්නෙ කියලා...'

'ඔයා නොහිතන දේවල්.... අපේ තාත්තා වෛර කරන දෙවල් ... අපේ අම්මා හතුරු වෙන දේවල්.... මගේ පැත්තෙන් අකීකරු දේවල්.... ඒ දෙවල් ඔක්කොම එකතු කළාම හරිම ආදරේ හිතෙන දේවල්...'

'විශ්ව...'

'ඔව් නේත්‍රා. මට සිද්ධ වෙනව මම ඔයාට ආදරෙයි කියල ඔප්පු කරන්න...'

මම යන මග ම නැවතුණෙමි. මට ඔහුට කියන්නට බොහෝ දේ තිබිණ. එහෙත් මම මොනවා කියන්න ද?

'මං හරි අවාසනාවන්තයි'

අන්තිමේ මම කීවෙමි.

'නෑ...'

'ඔයා කියන්නෙ වාසනාවන්තයි කියලද?'



'නෑ.... අපි හරි තීරණාත්මකයි'

අපි තවත් ටිකක් දුර ගමන් කළෙමු. අතුරු පාරක විවාහ රෙජිස්ට්‍රාර් කාර්යාලයක් අසළ විශ්ව නතර වි ය.

තවත් දැඩි කොට ඔහු මගේ අත අල්ලා ගත්තේ ය.

'තීරණාත්මකයි නේද?'

''ඔව් විශ්ව.... ඒත්...'

මා – මාදැලකට අසු වූ මාළුවෙකු වූවා දැයි මා දන්නේ නැත. මම ගොත ගැසුවෙමි. විශ්ව තීරණය කොට තිබිණ. මම ඇහුම්කන් දුනිමි. එකඟ වූවෙමි.

'මගේ සෙල්ලක්කාරයි කියල හිතපු ජීවිතේ ඔයාට ම වෙනසක් දැනෙයි නේත්‍රා.'

'මම එහෙම හිතුවා..... ඉස්සර...'

'දැන් අපි දෙන්න කසාද බඳිනවා. ඊට පස්සෙ ඔයාලගේ ගෙදර යනවා. තාත්තාට අම්මාට කියනවා. අවසර දුන්නත් නොදුන්නත් එතකොට ඔයා මගේ බිරිඳ .... ජීවිතේ ගොඩක් දේවල් එතකොට වෙනස් වෙයි...'

මට ජීවිතය ලැබෙනවා ද මගේ ජීවිතය කිසිවෙකු ගන්නවා ද කියා මම තර්ක නොකළෙමි. එක්කෝ මම ජීවිතය පූජා කළ යුතු ය. නැත්නම් මා මගේ ජීවිතය ඉල්ලා ගත යුතු ය. මේ වන විට දුල්ලෑව යක්ෂාවේශ වී ක්‍රියා කරන බව මම දනිමි. පොලිසිය –මුදල් – බලය – දුල්ලෑව – මේ සියල්ල මට එරෙහිව – ජීවිතය දියං – උඹේ ජීවිතය හප කරන්නට අපට දියං – ලේ – මස් – ඇට – නහර දියං – යනුවෙන් මා පසු පස ම සියල් අවි අමෝරා පෙළ ගැසෙන බව මම දනිමි. විශ්ව මේ සියල්ලේ ගැළවුම්කරුවා ද? මා මේ සූදානම් වන්නේ මා බිලි ගන්නා විට විශ්ව සමඟ ම හවුලේ බිලි වන්නට නොවේ ද?

ජනප්‍රිය දෙමළ හෝ හින්දි චිත්‍රපටයක නිළියක මුහුණ දෙන සිදුවීම් මාලාවකට මම සැබවින් ම මුහුණ දෙමින් සිටිමි. ඒත් දුෂ්ටයා කවු ද? පෙම්වතා කවු ද? යන්න මට මුලින් මුලින් නිශ්චය කර

ගත නොහැකිව සිටියෙමි. දැන් හරියට ම දෙපැත්ත වෙන් වී ඇති හෙයින් මා විශ්වගේ පැත්තට ම බර වී ය. තාත්තාට පිහිට වීමට – තාත්තාට පහර දුන්න වුන්ට පෙරළා පහර දෙන්නට – පොලිසියට බය නොවී ඉන්නට – දුල්ලැව මට්ටු කරන්නට – මට ඕනෑ වී තිබේ. මේ සියල්ල සඳහා විශ්ව මට සහය වනවා නොවේ ද? සියල්ලන් ම මට්ටු කිරීමට මම විශ්වගේ බිරිඳ විය යුතු ය.

මේ, මා ලැබූ දුක් පීඩාවල අවසානය ද? නැත්නම්, දෙගුණ තෙගුණ වී දුක් කම්කටොලු නැවත පැමිණීම දැයි මම කල්පනා කළෙමි. ඒත්, මා මුහුණ දිය යුතු ය. විශ්ව මට ආදරය කරන විට – මා පෙරළා ඔහුට ආදරය නොකරන්නට හේතුවක් දැන් මට නොපෙනේ. ඔහු මට ජීවිතය දෙන්නට තතනන විට මා ඔහුට ජීවිතය නොදෙන්නේ ඇයි? ආදරය විවාහයකින් කෙළවර වේ නම් එය කවදා – කො තන දී සිදු වුව ද එහි ඇති අරුමය කිම?

මම උත්කර්ෂයට පත් වීමි. පරමානන්දයක ආහ්ලාදය ගිනි කන්දක් පාමුල ඇතැ යි මට සිතේ. දැන් විශ්වගේ දැතේ එල්ලී එකී ආනන්දය සොයන්නට ගිනි කන්ද තරණය කළ යුතු ය. ඔහු මට ගිනි සිසිලක් මැ නොවේ ද?

ජීවිතයේ බොහෝ දේ සිදු වූයේ සිතා මතා කළ කී දේ නිසා ම නොවේ. මා වැනි අසරණියක ජීවිතය සිතාමතා සැලසුම් කරන්නේ කෙසේ ද? අප හැම දා ම කළේ අනුන්ගේ සැලසුමක රේඛා, ජාල බවට පත් වීම නොවේ ද? ඔවුහු අපට නැවතීමේ ලකුණ තබන විට අනුන්ගේ ජීවිත පරිච්ඡේදයක අපි නැවතීමේ ලකුණ වීමු. මට පීඩා කළ – අපට පීඩා කළ සියල්ලවුන්ගේ ජීවිත පරිච්ඡේදය ලියන්නට – සකසන්නට මට දැන් සිතේ. දැන් මා විසින් ඔවුන්ගේ ජීවිතයේ නැවතීමේ ලකුණ තැබිය යුතු ය. මා විශ්වගේ බිරිඳ වීම එහි ආරම්භක – නිතිමය ඇරඹුම, නොවේ ද?

තවත් – තව තවත් මා මනසින් තර්ක කළත් සියලු සිතුවිලි අවසන මම විශ්වගේ බිරිඳ බවට පත් වී සිතුවිලි ගංගාව මුහුදට වැටේ. ඉන් පසු තෙරක් තොරක් නැතිව පාවේ.

මම විශ්වගේ බිරිඳ වීමට – ඔහු හා විවාහ වීමට තීරණය කළෙමි.



බෝඩිමේ ගැහැණු ද වටපිට මිනිසුන් ද මා දෙස වෙසඟනක ලෙස සිතූ සිතුම් එ විට අභවර වනු ඇත. තාත්තා – අම්මා තුළ තිබුණ – බිය – සැකය – කුහුල දුරු වනු ඇත. දුල්ලැව මා පසු පස එළවීම නිරර්ථක වනු ඇත. කාර්යාලයේ කෙල්ලන් මා මායාකාරී වාසනාවන්තියකැ යි සිතනු ඇත. විශ්වගේ මව හිස අත් බදා හුල්ලනු ඇත.

දැන් මම විශ්වගේ බිරිඳ විය යුතු ම ය.

අවසන් වශයෙන් මම, මට තිබූ කෙටි ම – ළඟ ම අවදනම විශ්වට කීවෙමි.

'අපෙන් පළිගනීවි...'

'කවුද?'

'ඔයාගේ තාත්තා.'

'කමක් නෑ අපෙන්නේ. අපි දෙන්නෙක් ඉන්නවානේ.'

'ඔයාට ගොඩාක් දේවල් අහිමි වෙයි?'

'මට දුල්ලැව පරම්පරාවේ බූදලය වටින්නෙ නෑ නේත්‍රා.'

'පස්සෙ කාලෙක ඔයා මගෙන් පළිගනීවි...'

'එතකොට ඔයාට අයිතියක් තියෙනවා එරෙහි වෙන්න. ඔයා මගේ බිරිඳ නින්ද...'

'මං දන්නේ නෑ විශ්ව. ඕන දෙයක් වෙච්චදෙන්. මං ඔයාට ආදරෙයි. එච්චරයි.'

'ජීවිතේ හෙටට කල් දාන්න බෑ නේත්‍රා.'

විනාඩි කිහිපයක දී සියල්ල සූදානම් කෙරිණි. සාක්ෂිකරුවෝ පැමිණිය හ. විවාහ පොරොන්දු ප්‍රකාශ කෙරිණි. අපි දෙදෙනා ම පෝරම කීපයකට අත්සන් තැබීමු. සාක්ෂිකරුවනට මුදල් ලැබිණි. නීතිමය කටයුතු කඩිනමින් අහවර වි ය. අපි දෙදෙනා ම විවාහ රෙජිස්ට්‍රාර්වරයාට ආයුබෝවන් කියා පොළොවට පය තැබීමු.

ජීවිතය කෙ තරම් ඉක්මන් ද? පැයක් යන්නට පෙර මම විශ්වගේ බිරිඳ වීමි.

For E-Pusthakalaya

මම මගේ ආදරණීය ස්වාමියා දෙස බැලීමි.

මට ඉර හඳ තරු ලැබුණා වත් ද?

විශ්ව මගේ අත ලිහිල් කළේ ය. තරමක් දුරින් සිට මා නිරීක්ෂණය කළේ ය. ඔහු අහසින් පොළොවට වැටුණා වත් ද?

'මම ඔයාට ආදරෙයි නේත්‍රා. මේ සේරම කරන්නේ ඒ හින්ද.'

ඔහු ඈත සිට ම කී ය.

'මම ඔයා ළඟ හැමදාම ඉන්නවා.'

මම ඔහු සමීපයට ගියෙමි.

විශ්වාස කරන්න. සත්ත යි. අපි අපිට ම නොතේරෙන කාලසීමාවක් පුරා එකිනෙකා වැළඳ ගෙන සිටියෙමු.

නීල නිලන නිල් අහස අපට වියනක් වි ය. මහපාර විල්ලුද පලසක් වි ය. චණ්ඩ සූර්ය තාපය සීතල සඳ එළිය වි ය. මහපාරේ ඩීසල් දුම සුවඳ දෙන්නට වි ය.

අපි නිදැල්ලේ ගමන් කළෙමු.

'විශ්ව'

මම කීවෙමි.

'නේත්‍රා'

ඔහු කී ය.

කී වාරයක් අප එසේ කියන්නට ඇත් ද? ජනාකීර්ණ මහනුවර නගරයේ වීදි, පටු මාවත් දිග අපි බොහෝ වේලාවක් නිදැල්ලේ ගමන් කළෙමු. ආයෙත් අවන්හලක අපි නැවතුණෙමු. කාරය ළඟ විශ්ව නතර වි ය.

'දැන්...'

'ඔයාලගෙ ගෙදරට. ඊට පස්සෙ ප්‍රශ්න එන විදිහට...'

'විශ්ව අපි...'

'ඔව්... දැන් විශ්වයම අපේ. යමු...'



අපි නුවර ලැබීමු. කටුගස්තොට ගෙදර බලා පියැඹුවෙමු. අම්මා දොරකඩට වී සිටියා ය.

අපි ඇගේ දෙපා ළඟ වැතිරී වැඳ වැටුණෙමු. අම්මාගේ දෙපා අල්ලා ගෙන මම හඬන්නට වීමි. විශ්ව මට පෙර හිස එසවූයේ ය. මා හඬද්දී ඔහු කතා කළේ ය.

'අම්මේ අපි දෙන්නා කසාද බැන්දා.... නේත්‍රා අම්මලාට විරුද්ධ වුණා නෙමෙයි. අපිට වෙන කරන්න දෙයක් තිබුණේ නෑ...'

විශ්ව මා වෙනුවෙන් පෙනී සිටියේ ය. මම දෝතින් ම අම්මාගේ දෙපා බදා ගෙන සිටියෙමි. අම්මා සැණෙකින් මගේ උරහිසින් අල්ලා මගේ මුහුණ නොබලා ම ඇගේ උරහිසට මා වාරු කොට ගත්තා ය. අම්මාගේ පපුව සීතල උණුසුමකින් දැවි දැවී තිගැස්සෙනු මට දැනිණ.

'අම්මේ.... මට සමාවෙන්න'

අපි දෙදෙනා.... අම්මා ත් මම ත් එකිනෙකා තුරුලු කොට ගෙන ම තාත්තා අසළට ගියෙමු. විශ්ව අපේ පසු පස වැටිණි.

'විශ්ව මහත්තයා .... කෙලීව කසාද බැඳලා...'

අම්මා එසේ කියා තාත්තා අසළට ම වීත් නැවතුණා ය. විශ්ව ත් මම ත් තාත්තාගේ ඇඳ පාමුල වැඳ වැටුණෙමු.

මම හෙමින් හෙමින් තාත්තාගේ මුහුණ දෙසට නෙත් යැවීමි. ලොකු ම ලොකු කඳුළු ගුලි දෙකක් බොහෝ වේලාවක් තාත්තාගේ නෙත් කෙවෙනිවල නළියා දෙකම්මුල් දිගේ කඩිනමින් දිය වී ගියේ ය.

තාත්තාගේ ශරීර වේදනාව මුහුණේ තිබුණේ නැත. මට කළ හැකිව - කළ යුතුව තිබුණු හොඳ ම එක ම විසඳුම එය ලෙස ඔවුහු සිතන්නට ඇත. තාත්තාට පහර දුන් හේතුව ඒ වන විටත් තාත්තා දැන ගෙන සිටියේ ය. අම්මා ද දැන ගෙන සිටියා ය. මගේ තීරණය පිළිබඳ ඔවුන් දෙදෙනා ම ප්‍රකෝපය පළ කළේ නැත. විශ්ව සන්සුන් ලෙස කතා කළේ ය.

'වෙන කරන්න දෙයක් ඉතිරිවෙලා නෑ තාත්තේ. අපිට සමාව දෙන්න. මං මගේ ජීවිතේ වගේ නේත්‍රා බලාගන්නවා.'

විශ්ව තාත්තා දෙස බලා ගෙන කතා කළේ ය.

අම්මා ත් තාත්තා ත් කතා කළේ නැත. ඔවුන්ගේ හැඟීම් කුමන ඉසව්වක තෙරපී තිබුණා දැයි මා දන්නේ නැත. ඔවුන් අපට බැණ වැදුණා නම් මෙයට වඩා හොඳ ය.

'අපි ඉක්මනට පිටත් වෙන්න ඕන. අම්මටයි තාත්තාටයි කරදරයක් වෙන්න ඉඩ තියන්නේ නෑ. මං ඒක පොරොන්දු වෙනවා.'

විශ්ව නැවතත් අවධාරණය කළේ ය.

'අපි යමු.'

විශ්ව තීරණාත්මක ලෙස කීවේ ය. මට අවනත වීම හැර කඳුළු බෙද ගැනීමට ඉඩක් නොතිබිණි. අපි දෙදෙනා ම නැවතත් අම්මාට ත් තාත්තාට ත් වැඳ නමස්කාර කළෙමු.

මම අඩියක් ඉදිරියට තැබීමි. විශ්ව මගේ අතින් නැවතත් දැඩිව අල්ලා ගත්තේ ය.

මම තවත් අඩියක් විශ්ව සමඟ ඉදිරියට තැබීමි. තාත්තා හඩ පිට වන්නට නොවන්නට තරම් සිහින් ලෙස 'පුතේ' යැයි කීවා මට මතක ය.

අම්මා අප පසු පසින් ඇදී ආවා ය. කාරයට ගොඩ වන්නට පෙර මම අම්මාගේ මුහුණ සිප ගතිමි. 'අම්මේ .... අම්මේ...' යැයි ඉකි හඬක් පමණක් මගේ තොල් අතරින් නික්මිණ.

මගේ මුහුණේ අම්මාගේ කඳුළු තැවරී තිබෙනු මට දැනිණ.

අපි ගමන් ආරම්භ කළෙමු. කො තනට ද? මොකට ද? කුමකට ද?

මම මොහොතක් දෑස පියා ගතිමි.

# 9

කොළඹ බලා පිටත් වීමට අප සූදනම් වුව ත් සූදනම් වන්නට දෙයක් අපට තිබුණේ නැත. අප මේ සූදනම් වන්නේ කොළඹ බලා පිටත් වන්නට ද, ජීවිතයේ අලුත් මාවතකට පිවිසෙන්නට ද යන ගැටලුව, මුව අයා නොකීව ත් අප දෙදෙනා තුළ ම ආත්ම පීඩනයක් ගෙන දුන් සිතිවිල්ලක් වී ය. එක ම ඉරියව්වක අපි දෙදෙනා බොහෝ වේලාවක් නොසෙල්වී සිටියෙමු. එහෙත් මොහොතකින් - සැණෙකින් - ඇසිල්ලකින් අපේ දෙනෙත් එකිනෙක හා ගැටිණි. ආදරය හා කුතුහලය මිස දෙනෙතින් දෙනෙතට විශේෂ යමක් හුවමාරු වූයේ නැත.

හිටි හැටියේ ම විශ්ව මගේ දෙකම්මුල් සිප ගෙන සිප ගෙන ගියේ ය. ප්‍රේමයේ නොසංසිඳෙන ආශාවනට කාලයක් - ඉඩක් - අවකාශයක් අවැසි නොවන හැටි෴

'ඒයි, ඔහොම පොඩි කළොත් මාව මැරෙයි.'

මම තොදොල් ලෙස හුරතල් වීමි. එහෙත් විශ්වගේ ආධිපත්‍යයේ රළු ග්‍රහණයට මම ආශා කළෙමි. එය ආදරණීය රිදුමකි. ගැහැණු සිතට ආරක්ෂාවකි.

'ඔය මූණ, තොල්, ඇගේ පාට, තියෙන පුංචි කෙලි පැටියෙක් මට ඉක්මනට ඕන.'

විශ්ව මා සිප ගනිමින් කීවේ ය. මසිතට නුහුරු ආගන්තුක ලැජ්ජාවක් දැනේ.

'මාව ඉක්මනට අම්ම කෙනෙක් කළොත්. මං පව්නෙ.'

මම ඔහුට ඉඩ දෙමින් කීවෙමි.

මට ඉස්සිතාට අත්පච්චි කෙනෙක් වෙන්න ඕන. පොඩි ... පැටියෙක් ඔහොත් ඕන ... ගෝන ඕන. පුංචි ... පොඩිත්තක් බැඳලා, චීත්ත චීත්ත ගවුම් පොඩියක් අන්දලා ... ඇඟිල්ලේ එල්ලගෙන ලෝකෙ පුරා යන්න ඕන. මගේ අත්පච්චි ... පෙන්වන්න ඕන ආදරණීය අත්පච්චියෙක් වෙන්නෙ මෙහෙමයි කියලා.

ඔහු යහන මත මා පෙරළා ගත්තේ ය. මගේ දෙකම්මුල් රතු වී ය. තව දුරටත් සුන්දරත්වය ඉතිරිව තිබේ.

"මං ආසා ඔයා වගේ පුංචි රෝසපාට කොලු පැටියෙකුට."

මම කිවෙමි.

"සිස්සු... තුරුලේ තම්බ වෙන්න ඕන දුවෙක්."

විශ්ව උජාරුවෙන් කීවේ ය. අප එක් රැයකින් ජීවිතය වෙනස් කරන්න සිතා නැති.

"අපිට ඊට ඉස්සෙල්ල තව ගොඩක් දුර යන්න වෙයි විශ්ව."

"මට නම් හිතෙන්නේ මහමිරිදම් ඉවරයි කියල"

"ඒත් සමහරවිට කන්දක් නැග්ගම ප්‍රපාතයක් හමුවෙන්න පුළුවන්..."

"අපි කොහොම හරි හොඳවෙමු."

ඔහු එසේ කියත් ම ඔහුගේ උණුසුම් සුසුම් මහා විශාල හැඟීමකින් මගේ ගෙලත් දෙකත් පෙතින් අතරට සේන්දු වි ය. මම ඔහු ප්‍රතික්ෂේප නොකළෙමි.

මසිතේ කවුක හැඟීම් නොතිබුණා නොවේ. එහෙත් මලෙස මෙලෙස දැකින විට රළු කවු නොපෙනේ.

ආදර උණුසුම් ළඟ සංතාප පුළි පුළං තිබුණේ නැත. මද පවනක් අළ මාරුතයක් කොයින් ද?

ඒත් මේ සීත් සිතල උණුසුම් අසනි වැස්සක පෙර ගමන් ගන්නා නිශ්චිතාවය වීමට නොහැකි ද?

මගේ ඉරණම කොයි අතට පෙරළේ දැයි මම නොදැන සිටියෙමි



විශ්මිත බව පමණක් ඉතිරි වි ය.

"මට බය හිතෙනවා විශ්ව"

සියල්ල අමතක කොට විශ්වගේ අවධානය වෙනතකට යොමු කිරීමට මම විසෝර්ව මත තිබු ඔහුගේ මරලෝසුව ගෙන වේලාව බැලිමි.

"උදේ එකොළහත් වෙලා."

"ඉර බැහැලා ගියාම නුතට හතරට විතර යමු."

මා ළඟ තර්කයක් ඉතිරි වූයේ නැත. මම තව දුරටත් එකඟ වීමි. අපි ඒ කුඩා කාමරයේ තවත් හෝරා කීපයක් ගත කළෙමු.

"අපි යමු."

සවස් යාමයේ විශ්ව කිවේ ය. මම බෙහෙවින් නෙහෙට්ටුවී සිටියෙමි. නියමිත බිල්පත් ගෙවා හෝටල් සේවකයින්ට ද අපි ආචාර කළෙමු. මම බිල්පත ගෙන සැලකිල්ලෙන් එය නවා මගේ කුඩා පොකැට්ටුවේ රුවා ගතිමි.

"ඇයි ඒ..."

විශ්ව කාරයට නගිත් ම ප්‍රශ්න කළේ ය.

"මට තියාගන්න හැමදටම මතක් වෙන්න."

"මතක් වෙන්න මම ඉන්නේ."

ඔහු හොරැහින් මදෙස බලමින් කීවේ ය. විශ්ව ආදරය නිරීක්ෂණය කරන ලස්සන! මම එයට ආසා කළෙමි.

අපි "පැල්පත" අවන්හලේ ගෙවත්තෙන් පිටව අතුරු පාර දිගේ ප්‍රධාන මාවතට පිවිසීමු.

"අපි සුපර්මාර්කට් එකටත් යමු."

විශ්ව යෝජනා කළේ ය.

"කොළඹ යන්න රෑ වෙයි."

මම කිවෙමි.

"ඉතිං රාත්‍රිය සුන්දරයි නේන්නා. ගෙවුණු රැයත් එළඹෙන රැයත් සුන්දර වෙච්."

ඔහු 'බරාස් ගා සිරිංග නද කොට 'කාගිල්ස් ෆුඩ් සිටි' ය අභියස කාරය නතර කළේ ය.

'ඔය කවි භාෂාව තව කෙල්ලෝ කීයකට දැම්මද දන්නෙ නැ?'

මම ඔහුගේ අතේ එල්ලෙමින් කීවෙමි.

'සත්තයි නේත්‍රා. මං කෙල්ලන්ට භාෂාව නම් දල තියෙනවා. ඒත් කවි භාෂාව දැම්මේ ඔයාට විතරයි.'

විශ්ව අතරමග නතර වෙමින් කීවේ ය.

'යමු යමු මහපාර.'

මම ඔහු තල්ලු කරමින් කීවෙමි.

අපි එකිනෙකාට දැවටෙමින් ෆුඩ් සිටියට රිංගුවෙමු. කවුන්ටරය ළඟින් ම ඔහු කූඩයක් ගත්තේ ය. සැණෙකින් ම මම එය ඉල්ලා ගතිමි. ඔහු රාක්කයක් රාක්කයක් පාසා ගොස් කූඩය පුරවන්නට වි ය.

'ඔයා කිව්ව නේද සල්ලි නැ කියල.'

'ගොඩක් සල්ලි ළඟ නැ තමයි. ඒත් ඔයාට ආදරේ දෙන්න තරම් පොහොසත්කමක් තියෙනවා.'

විශ්ව ඇපල් ගෙඩි දෙකක් ප්ලාස්ටික් කූඩයට දමමින් කීවේ ය. සුවඳ විලවුන් බෝතලයක්, කැටයම් කළ අවානක්, පුංචි රත්තරං පාට පැනක්, හුරතල් පැටියෙකුගේ කැටයමක්, සුවඳ සබන් වර්ග කිහිපයක් සමඟ විසිතුරු බඩු කිහිපයක් ද ගෙන ඔහු කූඩය පිරවූවේ ය.

මම ඉවසා සිටියෙමි.

'අපරාදෙ මෙච්චර ගොඩක්.'

බැරි ම තැන මම කීවෙමි.

'අපේ ගෙදර සල්ලිවලට පුදුම හිතෙන අපරාධ කරනවා නේත්‍රා.'

ඔහු මට කන් දුන්නේ නැත. කාගිල්ස් සාප්පුවේ දොර ළඟ මා කුඩා කාලයේ ඇවිද ගිය සැටි සිහිවී මගේ පපුව පත්තු වෙන්නට වී ය. මා පිළිබඳව සිතට නැඟුණේ දුකක් ද ඉරණම පිළිබඳව අලුත් පිටුවක අසම්පූර්ණ ප්‍රහේලිකාවක් දැයි මම ප්‍රශ්න නොකළෙමි.



බඩු භාණ්ඩ කාරයේ පසු පස අසුනට දැමූ ඔහු මගේ අතින් අල්ලා ගෙන නැවතත් පාර පැන්නේ ය. මට විමසන්නට ඉඩක් නොතබා ඔහු ජෝමවන්ද්‍ර සාප්පුවට පිවිසුණේ ය. මා ඔහු වළකන්නේ කෙසේ ද? මට විශ්වගේ ආදරය මිස යස ඉසුරු කුමට ද? මා දැන සිටියේ ආදරය යනු කෙනෙකුට දෙන දෙයක් මිස ගන්නා දෙයක් ලෙස නොවේ.

පුංචි නිල්පාට ගල් ඇල්ලූ මුද්දක් ඔහු මගේ ඇඟිල්ලේ දමා හැඩ බැලූවේ ය.

'ඇයි ලස්සනයි කියන්නෙ නැත්තෙ.'

'ලස්සනයි...'

මා නිහඬ වූයේ කියන්නට දෙයක් නැති නිසා ම නොවේ.

'ඔය මගේ මඟුල් මුද්ද. තවත් තියෙනවා කොළඹ ගියාම.'

'හැම දෙයක්ම මෙහෙම සුන්දරව විසඳෙයි ද විශ්ව. ඔයාගේ තාත්තලා අම්මලා මාව ඉතුරු කරයිද?'

'අපි ගෙදරට මූණ නොදී ඉමු.'

'කොච්චර කල් කියල හැංගිමුත්තන් කරන්නද?'

'හොර අහුවෙන කල්ම.'

'විහිළුවට ගන්න එපා විශ්ව.'

මම හැඟීමෙන් කීවෙමි. විශ්ව උත්තර දුන්නේ ද හැඟීමෙනි.

'මං ඔයා විහිළුවට ගත්තෙ නැ නේත්‍රා. ඔයා ඒක පිළිගන්නවාද?'

'ඔව්'

සත්තකින්ම 'ඔව්' යනුවෙන් කීමට තරම් මසිතේ හැඟීම් උද්දීපනය වී තිබිණ.

අපි පේරාදෙණිය පසු කරමින් සිටියෙමු.

'ඔච්චර හයියෙන් යන්න එපා මට බයයි.'

මම කඩුගන්නාවේ දී කීවෙමි. ඔහු ඉතා වේගයෙන් රිය පදවමින් සිටියේ ය.

For E-Pustakalaya

'බය වෙන්න එපා මං මළත් මැරෙන්නෙ ඔයාව බේරලා.'

අපි කඩුගන්නාව පල්ලම බසිමින් සිටියෙමු.

'බලන්නකෝ මාවනැල්ල මිටියාවතේ ලස්සන.'

විශ්ව ඈත පහත් බිම් දෙසට ඇඟිල්ල දිගු කරමින් කීවේ ය. විවිධ වර්ණනා කරන්නට වි ය. උරුහත් බාන්නට වි ය. හිටි ගමන් වමකින් මගේ නැහැය කොනිත්තන්නට වි ය. කම්මුලට තට්ටු කරන ශබ්දය ද වැඩි කළේ ය.

ඉදිරියෙන් පැමිණි බවුසරයකට ඉස්සර කොට වැන් රථයක් පැමිණියා මට මතක ය. විශ්ව සැණින් රථය යකඩ වැට සමීපයට ගත්තේ ය. යකඩ වැට කඩා ගෙන රිය ප්‍රපාතයට ඇදී ගියේ ය. අපි දෙදෙනා ම කෑ ගැසුවෙමු. විශ්ව මා බදා ගන්නට උත්සාහ කළ ත් එය වැළකිණ. දොර ඇරී මා පාවී යනවා පමණක් මට අවසිහියෙන් මෙන් මතක තිබේ. ඊටත් බොහෝ පහළට රථය පෙරළෙන හඬත් මට ඇසුණි. සියල්ල තිලංකාර වී අඳුරකින් මගේ දෑස වැසී ගියේ ය.

කඩුගන්නාව ප්‍රපාතයට ජීවිතය පෙරළී ගොසින් ය.

ස්නේහයේ කළාලය ගිනි ගැනිණ.

මම දෑස් හැර අවට බැලීමට බෝ සේ වෙහෙස ගත්තෙමි. තිලංකාර අඳුරේ ඡායා මාත්‍ර සමූහයක් බොඳ වි ය. උණසන්නිපාත බරකින් දෑස් පියන්පත් බර වි ය. බර වන ඇහිබැම මිස තිමිර දෑසට නිශ්චිත යමක් අසු වන්නේ ම නැත. බොඳ වෙන විවිධාකාර රූපකායවල් මිස මිනිස් වෙසක් නැත. හඬ නගා කෑ ගසන්නට සිතේ. ඒත් පපුවේ හිර වෙන වේදනා ගුලි මාංශ පේශී අතර හිර වේ. වේගයෙන් සුසුම් හෙළන්නට සිතේ. දෙතොල් විවර වන්නේ නැත.

ජීවිතය නැවතුණාවත් ද?

මගේ වියළී ගිය දෙතොල කිසිවෙකු විසින් වතුර පෙඟූ සිහිල් පුළුන් කැබැල්ලකින් තෙත් කරනු දැනේ. ඔඩිකලෝන් මිශ්‍ර බෙහෙත් ගඳක් ආශ්වාස වේ. දිය බිඳක් යාන්තමට මුව තුළට පිවිසේ. මම එය ගිල ගැනීමට වෙහෙසෙමි.

මා මේ ගෙවන්නේ ජීවිතය සහ මරණය අතර ගන්ධබ්බ හෝරාව වත් ද?



මම මගේ දෑත දෙපා තිබේ දැයි බැලීමි. දැනෙන්නේ නැත. මම දෑත දෙපා සෙළවීමට වෙහෙස ගතිමි. හිසේ සිට පාදාන්තය දක්වා සකල ශරීරය ම හිරි වැටුණු බවක් දැනේ. මට විශ්ව නගන මහා විලාපයක් සිහිනෙන් මෙන් ඇසේ. රථය පෙරළී ගියා මට මතක ය. ඔහු මා අල්ලා ගන්නට තැත් කළා මතක ය. ඉන් පසුව ගංවතුරකට හසු වූවෙකු නගන හඬක් මෙන් දෝංකාරයක් ඇසිණ.

මම මනසින් කෑ ගසමි. හිසේ සිට පාදාන්තය දක්වා හිරි වැටුණු සෙයක් දැනේ. මම නැවත නැවතත් මනසින් කෑ ගසා විලාප දෙමි.

'විශ්ව.... විශ්ව.... විශ්ව....'

'විශ්ව.... විශ්ව.... විශ්ව....'

හඬක් පිට නොවේ. මගේ හෘද ස්පන්දනය වැඩි වන බව දැනේ. කඳුළු ගුලි දෑසට එකතු වේ.

මම නිසොල්මනේ සිටියෙමි.

ගෙවුණු දින ගණන හෝ පහන් කළ රාත්‍රී ගණන කොතෙක් දැයි මා දන්නේ නැත. යාන්තම් දෑස විවර කර ගැනීමට හැකි වුව ත් කතා කිරීමට තරම් හැකියාවක් මට තිබුණේ නැත. රෝහල් වාට්ටුවක සිහින් හඬවල් කෙඳිරිලි පමණක් වටින් පිටින් ඇසේ.

'නේත්‍රා!... නේත්‍රා!!... නේත්‍රා!!!...'

මම යන්තම් දෑස විවර කොට අවට බැලීමට වෙහෙස ගතිමි. අම්මා ත් තාත්තා ත් මා අසල වූ හ.

'අම්මේ.... කෝ වි....විශ්ව...?'

ඉන් එහාට මට කතා කිරීමට නොහැකි වි ය. කඳුළු ගුලියක් වැටී දෑස් වැසී ගියේ ය. මා ක්ලාන්ත වූවා යැයි මා දැන ගත්තේ නැවත සිහිය පැමිණි විට යි.

තාත්තා මගේ මුහුණ අතගානවා ත් අම්මා ඉකිබිඳිනවා ත් මට මතකය.

'හිමින් කතා කරන්න. වැඩිය මහන්සි කරන්න එපා.'

එය හෙදියකගේ ළෙන්ගතු හඬක් බව මම තේරුම් ගතිමි.

දින කිහිපයකින් මට යහපත් ලෙස අවට නිරීක්ෂණය කිරීමේ වාසනාව ලැබුණි. එහෙත් කතා කිරීමට අපහසු වී ය. මම උත්සාහ කළෙමි. විටෙක ඇඳ විට්ටමට කොට්ටය තබා හෙදිය මා ඇඳට හේත්තු කොට තැබුවා ය.

මගේ පාදය වෙළුම්පටිවලින් වෙළා ඇත. සුදු වෙළුම්පටි මතුපිට තවමත් රතුපාට ලේ පැල්ලම් ය. ඒ දින තරමක් මා සුව අතට පත් වූ බව මම තේරුම් ගතිමි.

දින කීයක් මා මෙසේ සිටියා ද? සති කීයක් සිටියා දැයි මා දන්නේ නැත. මේ වන විට මා දන්නේ කඩුගන්නාව පල්ලමේ දෙවන වංගුව පහළින් අප ගමන් කළ කාරය පෙරළී ගිය බව පමණි. පාර අයිනේ පළතුරු කඩවල මිනිසුන් අපව පේරාදෙණි රෝහල දක්වා ගෙනවිත් ඇත. මට මෙ තෙක් ඇසුණු කතා බහෙන් මා තේරුම් ගත්තේ ඒ පමණකි. මාගේ පාදයේ වෙළුම්පටි සහිත තුවාලය තරමක් බරපතල වුව ද සෙසු තුවාල කැළල් මා සිහිය ලබන විටත් හොඳ අතට හැරෙමින් තිබිණ.

පිරිමි වාට්ටුවේ හදිසි ප්‍රතිකාර ඒකකයේ විශ්ව සිටින බව මම මේ වන විට අවබෝධ කොට ගෙන සිටියෙමි. විශ්ව කො තරම් බරපතල ලෙස තුවාල ලබා ඇත් ද යන්න මා දැන නොසිටිය ත්, ඔහු මට වඩා අසාධ්‍ය තත්ත්වයේ සිටින බව මම මේ වන විට දනිමි. දැන එහෙ මෙහෙ කොට හිස හැරවීමට මට පුළුවන්කමක් තිබුණත් නැගිට යාමට මට ඉඩ ලැබුණේ නැත. සේලයින් කටු හා ඉංජෙක්ෂන් කටුවලින් විදින ලද තැන්වල පුංචි කැළල් මම අතගා බැලුවෙමි. දෑස හැර ගත්තත් අවට තවමත් ගොම්මන් කළුවරක විදුලි කෙටුවා මෙන් නිලංකාර වෙයි. දෑස වසා සිටීම තරමක සහනයකි.

මම කොට්ටය ඇඳ විට්ටමට තබා කොන්ද තරමක් ඉහළට ඇද්දෙමි. හිස කොට්ටයට වාරු කොට අපහසුවෙන් කෙළ බිඳක් ගිල ගතිමි. දෙකොල වියළී උගුරේ සිට බෙහෙත් ගඳ නාසය දක්වා එයි. මම දෑස යන්තම් විවර කොට මගේ සුදුමැලි දෑත දෙස බැලීමි. විශ්වගේ මව ත් පියා ත් මගේ ඇඳ අසළට වී සිටී.

රෝහලේ දී ම මා මරා දමනු යි මම බිය වීමි. සිහි එළවා කටයුතු කළ යුතු නොවේ දැයි මම කල්පනා කළෙමි. යන්තම් මතකයේ රැඳී ඇති පසු ගිය දින කීපය මම අමාරුවෙන් මතකය තුළට පෙළ ගසා ගන්නට

තැත් කළෙමි. මගේ අම්මා ත් තාත්තා ත් දින කීපයක් ම මේ ඇඳ වටේ සිට මා සමඟ කතා කිරීමට වෙහෙස ගත් බව ඡායා මාත්‍රයක්ව මට දැනේ. මට සිතේ. මගේ ඇඳ වටා ඔවුන් හිතමිතුරන් ද සමඟ පසු ගිය දිනවල පණ අදින රෝගියෙකු දෙස බලා සිටිනවාක් මෙන් සිටියා මට දැන් සිහි ගැන්වීමට පුළුවන. මගේ මතකය නිවැරදි නම් අම්මාගේ දෑසේ හැම විට ම බොඳ වූ කඳුළු ගුලියක් තිබුණා මට හොඳට මතක ය.

ප්‍රේමය ත්: විවාහය ත්: මරණයත් එක ම දිනක දී සිදු වන්නට තරම් අපේ දෛවය පාපකර වන්නට ඇතැ යි මට සිතේ. මාසයකටත් අඩු කාලයක දී ජීවිතය කෙ තරම් දෛවෝපාගත ලෙස වෙනස් වී ද? අප දෙදෙනාගේ ජීවිතය මරණයෙන් කෙළවර නොවූයේ කුමන ප්‍රාතිහාර්යකට ද?

විශ්ව කෙ තරම් අපූරු ලෙස ආදරය කරන්නට දන්නා පෙම්වතෙක් ද?

විශ්ව කෙ තරම් සුන්දර ලෙස කෙල්ලකගේ හිතක් තේරුම් ගන්නා තරුණයෙක් ද?

විශ්ව කෙ තරම් ආහ්ලාදජනක ස්වාමියෙක් ද?

සත්තකින් ම විශ්ව කියන්නේ ආදරණීය රිදුමක් පමණක් ද?

ඇස කකියමින් මට මහ හයියෙන් හැඬුම් එයි. ගැහැණිය ත් - කඳුළ ත් අතර මෙ තරම් උරුමයක් අත් දැයි මට නොසිතේ. ඒත් අපේ හිත්වල රිදෙන තැන්වලට දැනෙන විට අපේ ඇස් ඕනෑ ම විටක තෙත් වෙයි. මට 'නේත්‍රා' යනුවෙන් නමක් දුන්නේ - නෙත කඳුළක උරුමය උපතේ දී ම මගේ අම්මා දුටු නිසා වත් ද?

එදා දහවල් විශ්වගේ පියා දුල්ලෑව ත්, ඔහුගේ බිරිඳ ත් වාට්ටුවට පැමිණ සිටිය හ. ඈත සිට ඔවුන් මා වෙතට එත් ම මම දෑස පියා ගතිමි. දුල්ලෑව පැමිණ මගේ ළඟ සිට ගත් බව මට දැනිණ. කාගේ දෝ අතක් මගේ නළල මත රැඳිණ. මම දෑස ඇර බැලීමි. විශ්වගේ මව ය. ඇගේ පිටි අත්ලට මගේ කඳුළු බිඳු වැටිණ. මම ගොත ගසමින් කතා කළෙමි.

'විශ්ව මාව බැන්දා.... අපිට කරදර කරන්න එපා.... මට විශ්ව බලන්න ඕන.... කෝ මගේ විශ්ව....?'

For E-Pusthakalaya

මම ඉකිළෙමින් ඇසුවෙමි.

දුල්ලැව් වෛද්‍ය සටහන් පිටපත පරීක්ෂා කළේ ය. මම මහත් බියකට පත් වී සිටියෙමි. විශ්වට කුමක් සිදු වී දැයි මා දන්නේ නැත. එහෙත් අනතුරින් ඔහු මට වඩා බරපතල ලෙස තුවාල ලබන්නට ඇතැයි මට සිතේ. ඔහුට සිදු වූ දේ කිසිවෙකු මට නොකියන්නේ ඇයි? ඔහුට කුමක් සිදු වූව ද? විශ්ව ගත් තීරණය නිසා මේ දෙමහල්ලෝ මට අනතුරක් කරත් ද? මගේ විශ්ව කොයි ද? මම ඉකිළෙමින් ම කතා කළෙමි.

'මට මගේ විශ්ව බලන්න දෙන්න. ඇයි මට කියන්නේ නැත්තේ?'

එ විට විශ්වගේ මව කතා කළා ය.

'නේත්‍රා, ඉස්සෙල්ල සනීප වෙන්න.'

'බෑ... බෑ... මට විශ්ව නැතිව ඉන්න බෑ.'

මම මව අල්ලා ගෙන සිටි අත මෙහාට ඇද්දෙමි. අතේ විද තිබූ සේලයින් කටුව ගැලවිණ. මව කලබල වූවා ය. හෙදිය කඩිනමින් දිව ආවා ය. මම වෛරයෙන් ද දුකින් ද වේදනාවෙන් ද වට පිට ඇහැලුවෙමි.

හෙදිය නැවතත් සේලයින් කටුව වමතට විද්දා ය. වෛද්‍යවරයා පැමිණ දුල්ලැව් සමඟ කතා කළේ ය.

'ඩොක්ටර් ... මේ ළමයගේ තත්වෙ දැන් සතුටුදායකයි නේද?'

'දින කීපයක් යද්දී හොඳ අතට හැරෙයි.'

වෛද්‍යවරයා මා පරීක්ෂා කරමින් කිවේ ය.

'අද ඉන්ටෙන්සිව් කෙයා එකෙන් පුතාව ගත්තා නේද?'

වෛද්‍යවරයා ඇසුවේ ය.

'ඔව් ඩොක්ටර්.'

'එයත් එක්ක කතා කරන්නට එපා. වෙලාවක මේ ළමයව ගෙනිහින් පෙන්නන්න.'

'හොඳයි ඩොක්ටර්.'

'එක්ස් රේ එකේ හැටියට නම් මොළේට තරමක් තුවාල වෙලා තියෙන්නේ. නමුත් හරියටම දැන්ම කියන්න බෑ. අපි බලමු ඉස්සරහට.'



වෛද්‍යවරයා නිවි සැනසිල්ලේ කියා ගෙන ගියේ ය.

'මේ ළමයා ඉක්මනටම පුතාට පෙන්වන්න. අපිට එයාගේ හැසිරීම අනුව ප්‍රතිකාර තීරණය කරන්න වෙයි.'

වෛද්‍යවරයා සමු ගැනීමට පෙර කීවේ ය.

මගේ දෑස දැලෙන් ඇද හැළුණු කඳුළු දෙකොපුල දිගේ ගලා ගියේ ය.

'මාව ගෙනියන්න. මට විශ්ව පෙන්නන්න.'

මම කියා ගෙන කියා ගෙන ගියෙමි. මව ටික වේලාවකින් නිහඬව මදෙස බලා සිට කතා කළා ය.

'නේත්‍රා ... අඩන්න එපා දුවේ. දැන් ඉතිං මොනව උණත් උඹ මගේ ලේලි. මං උඹව බලාගන්නවා.'

මව මගේ හිස අතගෑවා ය. එහෙත් මට සැනසීම ලැබුණේ නැත. මම මහත් වූ අසහනකාරී සිතුවිලි දැලක පැටළී සිටියෙමි.

සවස් වරුවේ මා රෝද පුටුවක තබා විශ්වගේ වාට්ටුවට ගෙන යන ලදි. විශ්වගේ මව ත් පියා ත් මා පසු පසින් ගමන් කළ හ. හෙදියන් දෙදෙනෙක් ද අප සමඟ වූ හ. වෛද්‍යවරු විශ්වගේ ඇඳ අසළ සිටියේ ය.

මම ඔහුගේ ඇඳ අසළට ගිය සැණින් දෑත දිගු කොට ඔහුට කතා කළෙමි.

'විශ්ව.... විශ්ව..... විශ්ව.....'

ඔහු කතා කළේ නැත. හිස හරවා බැලුවේත් නැත. දෑස මදෙසට යොමු කළෙත් නැත. ඔහු නිසොල්මන් ය.

මම ඔහුගේ අත අල්ලා ගතිමි. නන්නාඳුනන කෙනෙකු ලෙස ඔහු සිටියේ ය.

මම නැවතත් ක්ලාන්ත වීමට ආසන්න වී සිටියෙමි. බොඳ මීදුම් පටලයකින් මෙන් දෑස වැසී ගියේ ය. විශ්වගේ හිසේ සිට නිකට දක්වා සිදුපාට බැන්ඩේජ්වලින් ඔතා තිබිණ. ඔහු නිසොල්මනේ ය. මට ඔහුගේ

[illegible] කතා කරන්නට බැහැ වී ය. මා විශ්ව අසලින් හිඳ සිටිමට [illegible]

'එපා... එපා... මාව මෙතැනින් ගෙනියන්න එපා... දෙයියන්ගේ නාමෙට මට ඉන්න දෙන්න. මට මගේ විශ්ව දාල මෙතැනින් යන්න බෑ. අපි කාටවත් වැරැද්දක් කළේ නෑ. ඇයි අපිට මෙහෙම වුණේ..?'

මට තව කතා කරන්නට නොහැකි වුණත් මම මගේ වේදනාව මුමුණා කීවෙමි. වේවුලන දෙතොල්පට අමාරුවෙන් සොලවමින් කතා කළෙමි. හිස හරවන විට මගේ බෙල්ල දෙසින් ඇඟ කිළිපොළන වේදනාවක් දැනේ. එය සිරුර පුරා විදුලියක් මෙන් ගමන් කරයි. මම වචන පළපා කතා කරන්නට, මගේ වේදනාව ඉල්ලා ගන්නට උත්සාහ කළෙමි. එහෙත් සකල ශරීරය ම ඇලුම් කරන්නට වී ය. තුළේ සිට සිහින් පිළිතුරු වාතුවක් මුව තුළින් අසහනයෙන් පිටවන බව මට දැනේ. මම අසහනයෙන් කෙඳිරියෙන් ඇස අරිලා ගතිමි.

'අනේ මිසී...'

මම ආයාචනා කළෙමි. මගේ විලාපයේ කඳුළු මිදුණු සැහැල්ලුවෙන් ඉවත් කළේ ය. මගේ හිස දස දහස් වාරයක් නැවත නැවතත් බිමට හෙන්නට වී ය. ලෝකයා මගෙන් අහිමි කරන්නට යන්නේ මොනවා දැයි මම නොදැන සිටියෙමි. බොහෝ දෙනා මාරුවෙන් මාරුවට මා දෙසත් විශ්ව දෙසත් දුක් ප්‍රශ්නමාරු කළෝ ය.

'සමහර වෙලාවට මොළේ පුංචි තුවාලයක් වෙලා ලේ ගැලීමක් වුණොත් අතීතය සම්පූර්ණයෙන් ම වාගේ අමතක වෙනවා. සමහර විට ටික කාලයක දේවල් විතරක් අමතක වෙනවා. ඒත් සමහර විශ්වගේ තත්ත්වය කියන්න බෑ. ඔය කිසි දෙයක් නොවී හිටියා වගේ ඉන්නෙ. ඒකා දැන් තරමක් විතර සිහියෙන් ඉන්නෙ... හැබැයි මේ ඇණු අම්මා මොනවා ආවා කියලා වෙනසක් එයාට දැනුණේ නෑ...'

හෙදියක් උල්ලෑව දෙසට හැරෙමින් කීවේ ය. මම රෝද පුටුවේ ඇන්දට හිස බර කළෙමි. නැවත නැවතත් ලොකු කඳුළු බිඳු බෙරමින් මගේ ගෙල දෙපස තෙත් කළේ ය. මම හඬ දමමින් කතා කරන්නට වෑයම් කළෙමි.

'මිස ලෙඩාව වාට්ටුවට ගෙනියන්න. වැඩිය කතා කරන්න ඉඩ දෙන්න එපා...'



හෙදියට අණ ලැබිණ. මට පිළිපදින්නට නියෝගයක් තිබුණා දැයි මම නොවිමසුවෙමි.

'ඇයි විශ්ව කතා කරන්නෙ නැත්තෙ...? ඇයි එයාට කතා කරන්න බැරි..?'

මම ප්‍රසුම් ලැබෙමි. රෝහලේ වෛද්‍ය ක්‍රියාකාරිත්වය තුළ ප්‍රශ්නවලටත් ඉඩක් ලැබුණේ නැත. මම ඉකිලෑවෙමි. මා ළඟ තිබුණු සියලු ම හැඟීම් ප්‍රකාශ කිරීමට මම අපොහොසත්ව සිටියෙමි. මා සිටියේ ජෝරාදේශීය රෝහල තුළ බව ඉවෙන් මෙන් දැන ගත්තෙමි.

ගනඛව ඉසව්වක සිට එන සීත සුළං ජනේල කවුළු අතරින් නිරන්තරව වාට්ටුව පුරාවට ඇදී තුනී වී යයි. දොර ජනෙල්වල කොළ පැහැති සිර රෙදි එහාමෙහා වන ඇසිල්ලේ මම වාට්ටුවෙන් ඒ පිට ලිමාවට දෑස යවමි. අතපය කඩා දැමූ සිරකාරියක මෙන් මම විටෙක මහත් ම අමාරුවකින් බෙහෙත් ගඳ ආඝ්‍රාණය කළෙමි.

මම උදේ සවස සිහින් දළදා වැන්දෙමි. උදේ ම දෑස විවර වන විට ම මගේ විශ්ව ඉක්මනින් සුවපත් කර දෙන්නැ යි මම දළදා පිහිට පැතුවෙමි. රාත්‍රී නින්දට පිවිසෙද්දී ත් දළදා සමිඳු පිහිටෙන් විශ්ව ඉක්මනින් සුවපත් කර දෙන්නැ යි මම ප්‍රාර්ථනා කළෙමි.

මම මගේ පුපුරු ගසන, කිරි ගසන වේදනාව දරා ගැනීමට ටික දවසකින් පුරුදු වූයෙමි. එහෙත් විශ්ව සිහිපත් වන විට ශරීරයේ වේදනාව ඇස්, ඉස්, මස් විනිවිද හදවතට දැනේ. මම නිශ්චිත අරමුණකින් තොරව යහන මත වැතිරී සිටියෙමි. මගේ ජීවිතය පිළිවිසින්නට, විමසන්නට තීන්දු කරන්නට කෙනෙක් සිටියා දැයි මා දන්නේ නැත.

එත ම එක වතාවක් හැර විශ්ව බැලීමට මා ඔහු ඉන්නා වාට්ටුවට ගෙන ගියේ නැත. මම දිනක් වාට්ටුව භාර හෙදියට ආයාචනා කළෙමි.

'මිසී මාව විශ්ව බලන්නට ගෙනියන්නේ කවද්ද...?'

'ඒක තීරණය කරන්නේ ඩොක්ටර්ස්ලානේ. නේන්‍රාට දැන් ටික ටික සනීප වෙනවානේ. ඔහොම බෙහෙත් ගන්නකෝ...'

ඇය දැන් දැන් මා වෙත කාරුණික වෙනවා පමණක් නොව ආදරයෙන් කතා කිරීමට ද පෙළඹී සිටී. ඇගේ කරුණාව මගේ හැඟීම්

For E-Pusthakalaya

ජීවිත සිහිය පසුගිය හොට ගත් මම දිනින් දිනට ම ඇගෙන් විවිධ දේ විමසීමින්නට වීමි.

'මිසී මොකක්ද දැන් විශ්වගේ තියෙන අමාරුව...?'

'මම දන්නේ නැහැ නේත්‍රා...'

'ඇයි මාව එහෙට ගෙනියලා පෙන්වන්නේ නැත්තේ...?'

'මම හිතන්නේ විශ්වගේ තාත්තලා, අම්මලා එහෙම කියන්න ඇති...'

'අපි කසාද බැඳලනේ.... මං එයාගේ බිරිඳනේ...'

'ඔය දේවල් මං දන්නෙ නැහැ නේත්‍රා...'

ඇය මා මග හැර ගියා යනුවෙනත් අඳුරු වලාකුළු අපව වසා පැතිරෙන්නේ දැයි මම නොදැන සිටියෙමි.

අම්මා දිනපතා ම විශ්ව මා බලන්නට වාට්ටුවට පැමිණියා ය. එහෙත් ඇය කතා කළේ බොහොම පරිස්සමිනි.

'අම්මලා මට මොනවද වසන් කරන්නේ...?'

'උඹට මොකුත්ම අපි හංගන්නේ නෑ දුවේ.... ඉස්සෙල්ල හොඳට සනීප වෙන්ට බලපං...'

අම්මා නිතර ම කීවේ 'ඉස්සෙල්ල සනීප වෙන්ට බලපං...' කියා ය. ඇය මගේ හිස පිරි මදිමින් බොහෝ වේලාවක් වාට්ටුවේ රැඳී සිටින්නී ය. බොහෝ දිනවල අම්මා මගෙන් සමු ගනිද්දී මගේ තලල් තලය සිප ගනී. මගේ දෑසට කඳුළු නොඑන්නට ඈ කඳුළු සඟවා ගන්නට වෙහෙස ගනී. එහෙත් හිටිහැටියේ ම අම්මාගේ කඳුළු මගේ මුහුණට වැටේ.

'අම්මා අඬනවා...'

'නෑ...'

ඈ කඳුළු පිසිමින් කියයි. මම අම්මා තව තවත් රිදවීමට අකමැති වීමි. අම්මා ත් එසේ ම මගේ සිත රිදෙනු ඇතැයි සිතා කටයුතු කරන බව මම අවබෝධ කොට ගත්තෙමි. මේ නිසා අපි බොහෝ වේලාවට එකිනෙකා දෙස බලා නිහඬව සිටියෙමු.



දින පහළොවක් පමණ ගත වෙද්දී මම බොහෝ සේ සුවය ලබමින් සිටියෙමි. සමහර තුවාල වෙළුම් අද උදයේ ම හෙදිය ඉවත් කළා ය. එහෙත් හරියට ඇවිද ගැනීමට නොහැකි වීමෙන් මම යහනේ ම රැඳුණුව සිටියෙමි. සඳුදා උදේ ම මම විශ්වට කුඩා ලියුම් කැබැල්ලක් ලියුවෙමි.

ආදරණීය විශ්ව...

දළදා හාමුදුරුවන්ගේ පිහිටෙන් ඉක්මනට සනීප වෙන්න. ඔයා දොළහේ වාට්ටුවේ ඉන්න බව මං දන්නවා. එක දවසක් මාව ඔයාව බලන්න ගෙනාවා. දැන් මට එන්න දෙන්නෙ නැ. අපිට මොකක්ද වුණේ...? මොකක්ද අපි දෙන්න කරපු පව...? මෙහෙම විඳවන්න නම් කුරා කුහුඹුවෙකුට වත් සිද්ධ වෙන්න එපා. අනේ රත්තරං ඔයා ඉක්මනට සනීප වෙන්න කියලා ප්‍රාර්ථනා කරනවා හැර මට කරන්න වෙනත් දෙයක් ඉතිරි වෙලා නැ. ඔයාට ඉක්මනින්ම සුවය ලැබේවා...!

මං ආදරණීය නේත්‍රා.

මම උදේ ම ලිපිය හෙදිය අතට දුන්නෙමි.

'අනේ මිසී මේ ලියුම විශ්වට ගෙනිහින් දෙන්න පුළුවන්ද...? පිං සිද්ද වෙනවා...'

හෙදිය ටික වේලාවක් මදෙස බලා සිටියා ය. ඉන් පසුව එය අතට ගෙන කල්පනා කරන බව මම තේරුම් ගත්තෙමි.

'මිසී .... දෙනවා නේද...?'

'මම ගිහිං දෙන්නම්. ඒත් නේත්‍රා.... විශ්වට තවම හරියට සිහි බුද්ධියක් නැ...'

ඇය ආපසු හැරී කීවා ය. බොහෝ දිනකට පසු ලැබෙමින් තිබුණු සහනය කිසිවෙකු උදුරා ගත්තාක් මෙන් දැනිණ. මම ඒ දින උදේ ආහාරය නොගෙන සිටියෙමි. දහවල් වන විට තෙහෙට්ටුව මෙන් ම වේදනාව ද නිසා මම ඇස් තද කොට පියා ගෙන අඳුරේ ශූන්‍ය ලෝකයක් සොයමින් සිටියෙමි.

මගේ කම්මුල් සුමුදු ලෙස කිසිවෙක් අල්ලා ගත්තේ ය. මම නිවි සැනසිල්ලේ සිටියෙමි. රළු ඇඟිලි තුඩු මගේ කම්මුල දිගේ ගමන් කරන්නට වි ය. මම දෑස් හැර බැලිමි. විශ්වගේ පියා මා අසළ සිටී.

For E-Pusthakalaya

'නේත්‍රා...'

'මාව අල්ලන්න එපා...'

මම පිළිකුල් ලෙස ඔහුව ප්‍රතික්ෂේප කරමින් කීවෙමි.

'කලබල වෙන්න එපා. අහගෙන ඉන්න. මගේ ජීවිතේ හුඟක් වෙනස් වෙලා. මං නේත්‍රාට තවමත් ආදරෙයි...'

දුල්ලෑව කියා ගෙන කියා ගෙන ගියේ ය.

'ඇයි දෙයියනේ මට තවත් වද දෙන්නේ...?'

මම දැරිය නොහැකි මානසික පීඩාවකින් කතා කළෙමි.

දුල්ලෑව මගේ තළල් තලයෙන් ඔහුගේ අත අහකට ගත්තේ නැත. අලුත් බියකින් මම සැළෙන්නට වීමි.

සිහින්ව ඇද හැළෙමින් තිබුණු වැස්ස තුරල් වන විට මම මට ම ගුලි වී සිටියෙමි. මට මා තුළ ම ගිලෙන්නට උවමනා වී තිබුණත්, හරියට ම නොතේරෙන කිසි යම් බලවේගයක් මා වෙළා ගන්නා බව, මා රිදවන බව ද අද්‍යශ්‍යමාන ලෙස මට වැටහෙමින් තිබිණ. මම බොහෝ සේ කම්පා වී සිටියෙමි.

'නේත්‍රාගේ අනාගතය කොහොමටත් මට බාර ගන්න වෙන බව මං දැනගෙන හිටියා...'

දුල්ලෑව කොඳුරමින් කීවේ ය.

'මාව කවුරුවත් බාරගන්න ඕන නෑ. විශ්ව මාව බාර ගත්තා... දැන් අපි දෙන්නම දෙවියන් වහන්සේ බාර ගනීවි...'

මම කීවෙමි.

'ඉතින් විශ්ව කියන්නෙ මගේ පුතානේ...'

දුල්ලෑව එසේ කීවේ ඔච්චමට ද, හැඟීමෙන් යුතුව ද යන්න මට පසක් නොවුණි. ජීවිතය තීරණය කරන සැබෑ දිශා දර්ශකය තිබුණේ කා අතේ ද යන්න මම මේ වන විටත් තේරුම් නොගෙන සිටියෙමි. දුල්ලෑව කිසි යම් අනාගත සැලසුමක් හිතේ තබාගෙන සිටින්නේ ද යන්න මා වටහා නොගත්තත් ඔහු බෙහෙවින් ම අපගේ ජීවිතවලට බල පාන බව පමණක් මම දැන සිටියෙමි.

'නේත්‍රා.... දෛවය විසින් ඔය දෙන්නම මට බාර දීල. මං කැමතියි ඒ දෙවියන් වහන්සේගේ ඉල්ලීම ඉටු කරන්න..'

'මට මීට පස්සේ කාටවත් එකඟ වෙන්න බෑ. මම එකඟ වුණා. ඒ විශ්වට. විශ්වගේ ආත්මයට. එයාට කරදරයක් වුණොත්.... මං මගේ ජීවිතේ තනියම තීරණය කරනවා. අවසාන වශයෙන් අපිට දෙන්න පුළුවන් දඬුවම මරණය. මං ඒකත් පිළිගන්නවා... විශ්වට කරදරයක් වුණොත්... මං එක මොහොතකින් මගේ ජීවිතය නැතිකර ගන්නවා. ඒක මම දෙවියන් වහන්සේට බාර දෙන්නේ නෑ...'

මම එසේ කීවෙමි. එහෙත් මගේ දෑස්වලට කඳුළු උනා ආවේ නැත. කඳුළු තිබුණේ ඇස්වල නොවේ. සිත් පතුලේ ය. මම ඒවා පිටතට එන්නට ඉඩ නොදුන්නෙමි. කඳුළු උල්පත සිඳී යන්නේ නම් කෙ තරම් භාග්‍යයක් ද...?

'නේත්‍රා... ඔයාට ඉස්සර වෙලා විශ්වගේ ටිකට් කපන එකක් නෑ. ඒ නිසා ටික දවසකින් ඔයාට තීරණය කරන්න වෙයි ටිකට් කැපුවම මොකද කරන්නෙ කියල. වඩාම හොඳ තීරණය ඔයා ගන්න. ඒත් අපි කතා කරගත්තේ නම් ඔයාව කොළඹ එක්ක යන්න. දැන් ඔයා විශ්වගේ බිරිඳ. මගේ ලේලි. ඔයාට අයිති අපේ ගෙදර. ඔයා අයිති අපිට...'

මා නිහඬව සිටියේ කියන්නට දෙයක් නැති නිසා ම නොවේ. හැකි තරම් දුල්ලෑව ඉදිරියේ දී නිහඬ පිළිවෙතක් අනුගමනය කිරීම වඩා සුදුසු යයි මම සිතා සිටියෙමි.

සති තුනකට වඩා රෝහලේ ගත කළ නේවාසික කාලය අහවර වෙමින් තිබිණ. මානසික තිගැස්ම හැර මට වෙන යම් ආබාධයක් තිබුණේ නැත. කොන්දේ තිබූ අමාරුව ත් කකුලේ තිබුණු තුවාල ත් සුව වෙමින් තිබිණ. රෝහල් ඇඳෙන් බැස ඇවිදීමට මට ලැබුණු අවසරය මම රිසි සේ අත් වින්දෙමි. මුල් දිනවල දී රෝහල් වාට්ටුව පුරා හෙමි හෙමින් ඇවිද ගිය මම ටික දිනකින් එළිමහනේ ද ඇවිදීමට ගියෙමි. මාගේ මේ ගමන් බිමන් රෝහල් කාර්ය මණ්ඩලයට ද අමුත්තක් නොවිණි. විශ්ව ඉන්නේ දෙළහේ වාට්ටුවේ බව මම දැන සිටියෙමි. මා තුළ තිබුණු එක ම කුතුහලය ඔහු දැක ගැනීමට යි. මම හෙමි හෙමින් දෙළහේ වාට්ටුව පැත්තට ගමන් කළෙමි.

පිරිමි වාට්ටුවක් වීම නිසා මා කෙරේ කිසිවෙක් අවධානයෙන් සිටිනැ යි මම මුල දී බිය වීමි. එහෙත් මාගේ ඒකායන අරමුණ වී තිබුණේ විශ්ව දැක ගැනීම ත්, ඔහු සමඟ කතා කිරීම ත් ය. වාට්ටුවේ කොරිඩෝරය දිගේ නිවී සැලසිල්ලේ තරමක් දුරට ගමන් කළ මම අවස්ථාව ලැබුණු සැණින් වාට්ටුවට රිංගා ගතිමි. ගොදුරකට ඉව අල්ලන්නාක් මෙන් ඇස එහෙ මෙහෙ දිව යැවූ මම විශ්ව ඉන්නා ඉසව්ව සොයා ගතිමි. අඩියට දෙකට ඔහු ඉන්නා ඇඳ අසළට ගියෙමි.

කාටත් හොරෙන් විශ්ව සිප ගැනීමට මට ඕනෑ වි ය. 'ඔයාට බුදු සරණයි රත්තරං...' යනුවෙන් කොඳුරා කීමට මට ඕනෑ විය.

ඔහුගේ ශරීරයේ තුවාලවලට දමා තිබූ බොහෝ වෙළුම් පටි ඉවත් කොට තිබුණි. හිසේ පමණක් වෙළුම් පටි එසේ ම තිබිණ. විශ්ව දෑස් හැර එහෙ මෙහෙ බලමින් සිටියේ ය. එහෙත් ඔහු සන්සුන් ය. මම ඔහුට කතා කළෙමි.

'විශ්ව.... විශ්ව...'

ඔහු මා ගණනකට ගත්තේ නැත. එහෙත් ඔහු හොඳ සිහියෙන් සිටින බව මට පෙනුණි. ඔහු අවම වශයෙන් මා නිරීක්ෂණය කළේ වත් නැත. සිනාවක් කතාවක් තබා කිසිදු වෙනසක් ඔහුගේ මුහුණේ ඇඳී තිබුණේ නැත. මහත් ශාන්ත බවක් ඔහුගේ දෑසේ ලියැවී තිබුණි. එය බෙහෙවින් තැන්පත් ය. මම විශ්ව වෙතට තවත් නැඹුරු වීමි.

'විශ්ව.... විශ්ව...'

මට කඳුළු එන්නට ආසන්න ය. මම ඔහුගේ අත ගෙන පිරිමදින්නට වීමි.

'විශ්ව...'

නිදිගැන්වුවෙකු අවදි කරන්නාක් මෙන් මම කතා කළෙමි. එහෙත් විශ්ව කුමක් දෝ නොපෙනෙන ඉසව්වක සිත ත්, දෑස ත් රඳවා ගෙන සිටියේ ය. ඔහු සිටියේ සිහි මූර්ජා වූවෙකු පරිද්දෙනි.

'විශ්ව .... කතා කරන්නකො....'

මම ඔහුගේ මුහුණට එබී කීවෙමි.

ඔහු හැළ හොල්මනක් නැතිව සිටියේ ය.



'අනේ විශ්ව.... කතා කරන්න. ඇයි ඔයාට මොකක්ද වෙලා තියෙන්නෙ...? මං නේත්‍රා.... ඇයි මාත් එක්ක කතා කරන්නේ නැත්තේ....?'

මම බැගෑපත්ව කීවෙමි.

මොහොතකින් ඔහුගේ ඇස් රතු වි ය. මුහුණේ පැහැපත් බව වෙනස් වි ය. ඇස් යට පුංචි මාංශ පේශී වෙව්ළන්නට වි ය. දෙතුන් විටක් ඔහුගේ පපුව නිගැස්සිණි. ඔහු දෑස පියා ගත්තේ ය. ඇස් පිල්ලම එසවූ සැණින් කඳුළක් බොඳ වී ඔහුගේ කම්මුල් දිගේ ගලා හැළිණි.

'විශ්ව....'

හිම කන්දක් දිය වූවාක් මෙන් මම ඔහුගේ පපුවට මුහුණ හොවා හඬන්නට වීමි.

'කවුද ඔය ළමයට මෙහෙට එන්න කීවේ...?'

හෙදියක් විත් මගේ උරහිසින් එසවූවා ය.

'කරුණාකරල මෙතනින් යන්න.'

ඇය මගේ අතින් අල්ලා ගෙන නියමිත වාට්ටුවට මා ගෙන ආවා ය. මම නිසොල්මනේ ඇයට ඉඩ දුනිමි. ඉඩ දීම හැර විරුද්ධ වීමට මට ඉඩක් තිබුණේ නැත. මා කැඳවා ගෙන පැමිණි හෙදිය සෙසු සේවිකාවන්ට දොස් පැවරුවා ය.

'එහා වාට්ටුවේ ලෙඩාගේ තත්වෙ සීරියස්. ඔයගොල්ල ටිකක් කල්පනාවෙන් ඉන්න. මෙහෙම පේෂන්ට්ස්ලට එහෙ මෙහෙ යන්න දෙන්න එපා. ප්‍රශ්නයක් වුණොත් කවුද වග කියන්නෙ...?'

ඇය තවත් දෝෂාරෝපණ රැසක් ඇද බැවා ය. මම යහනට වී උඩුබැලි අතට දිගා වීමි. පුදුම හිතෙන තරමේ ශූන්‍ය හැඟීමක් මා පෙළන්නට වි ය.

එදා සවස අම්මා පැමිණියා ය. මට බොහෝ දේවල් අම්මා සමඟ කතා කරන්නට ඕනෑ වී තිබිණ. මම ඇය එන පෙර මග බලා සිටියෙමි. අම්මා මට ගෙනා බත්මුල ලිහා එය මට කවන්නට සූදානම් වූවා ය.

'මං තනියෙන් කන්නම්...'

මට හොඳට ම සුව බව පෙන්වීමට මම උත්සාහ කළෙමි. අම්මා

For E-Pusthakalaya

වතුර බෝතලය පුංචි කබඩ් එක උඩ තියා යහනේ පැත්තකින් වාඩි වූවා ය.

බත්මුල ලිහා කන්නට සැරසෙත් ම මට විශ්ව මතක් වි ය.. මගේ පපුව හෝස් ගා දැවෙන්නට වි ය.

'මට කන්ඩ බැ...'

මම බත්මුල අකුළමින් කීවෙමි.

'බලපං මේ දවස් දෙකතුනට උඹ ඇදිල ගිහිල්ලා. ඔහොම නොකා හිටියම ලෙඩ හොඳ වෙන්නෙ කොහොමද...? විකාර නොකර කාපන් දුවේ. හෙට උදේ ටිකට් කපනව කිව්වනෙ...?'

මම තරමක් තිගැස්සුණෙමි. මගේ ටිකට් කපනවා කියන්නේ මේ රෝහල් භූමියේ විශ්ව තනි කර මා පිටත් වන බව නොවේ ද...?

'ටිකට් කැපුවට මං යන්නෙ නැ...'

'උඹ නොගිහින් කොහොමද? ඉස්පිරිතාලෙ හැමදාම තියාගන්න එකක්යැ...'

'මට බැ අම්මා. විශ්ව දාල මං කොහොමද යන්නේ...?'

'ඒක මං දන්නෙ නැ. ඊයේ දුල්ලැව මහත්තයල ඇවිල්ල තාත්තා එක්ක කතා කරගත්තා. උඹ දැන් ඒ විදිහට වැඩ කරපන්...'

'මට බැ...'

'දැන් ඉතින් බැ කියල බැනෙ දුවේ. ඕවා අපි කියල උඹ කරගත් දේවල් නෙමෙයිනේ. දැන් ඉතින් ඉස්සරහටත් ඒ විදිහට වැඩ කරන්න බලාපන්. දොස්තර මහත්තයාත් කියල තියෙනව උඹ විශ්ව මහත්තයා ළඟම තියන්න කියලා...'

'ඉතින් විශ්ව ඉන්නේ ඉස්පිරිතාලෙනෙ...?'

'හොඳ වුණාම ගෙදර එක්ක එයිනෙ...'

'එතකල්...'

'උඹට එහෙ යන්න වෙයි. එහෙම තමයි කතා කරගත්තෙ...'

'මට බැ...'



නැවත නැවතත් මා අභාග්‍යයට ම ඇදී යන්නේ දැයි මම නොදැන සිටියෙමි. එහෙත් මා මේ තීරණාත්මක මොහොතේ අකීකරු වීමෙන් ඵලක් වෙයි ද...? මා හිමි කාට ද? මා මට වත් හිමි නැති හැටි.

'උඹලා කසාද බැඳලා. ඉතින් අපිට පුළුවන්ද උඹ ගෙදර ගෙනියන්න. ඒ මිනිස්සුන්ගෙ කතාවට පිටුපාලා.... ඊට පස්සේ උඹට මොකද වෙන්නෙ...?'

මගේ පපුවේ තිගැස්ම වැඩි වෙමින් පැවතුණි. විශ්ව සුව වන තෙක් රෝහලින් පැන යාමට මට සිත් නොවූවා නොවේ. ඒත් කොහේ යැයි කියා යන්න ද...? විශ්වගේ රෝගී තත්ත්වය එන්න එන්න ම වඩාත් අභිරහසක් වෙමින් පැවතුණි. අම්මා කීවේ ඔහු කිසිවෙකුත් සමඟ කතා නොකරන බව යි.

ඔහුගේ තුවාලවල ඒ තරම් අපහසුවක් දැන් නොමැති බව මම එකිනෙකාගේ කතාබහෙන් තේරුම් ගත්තෙමි.

'දොස්තරල ගිහිල්ල මොන මොනවද අහල තියෙනව. විශ්ව මහත්තය ඒ මොකකටවත් උත්තර දෙන්නෙ නැතිලු.....'

අම්මා කීවා ය.

'මමත් ගියා විශ්ව බලන්න...'

'කවද්ද...?'

'අද...'

'ඉතිං...'

'කතා කලේ නැ...'

'මොළේ තුවාල වෙලාද මොකක්ද කියන්නෙ.... තාම කාවවත් අඳුරගන්න එහෙම බැරිලු...'

ටික වේලාවකින් දුල්ලැව ත් ඔහුගේ බිරිඳ ත් වාට්ටුවට පැමිණිය හ. මම අම්මාගේ උරහිසට බර දී සිටියෙමි. අම්මා මගේ කෙහෙරැලි අත ගාන්නට වූවා ය. මම උණුසුම සොයන කුඩා දරුවෙකු මෙන් තව තවත් අම්මා සමීපයට වීමි.

'තේත්‍රා... ඔයාට හෙට උදේ අපිත් එක්ක යන්න පුළුවන්. හෙට උදේ ටිකට් කපනවා කිව්වා..'

දුල්ලැව කීවේ ය. මම මුනිවත රැකීමි.

'මෙතන අලුත් ඇඳුම් වගයක් ඇති. හෙට උදේම ලෑස්ති වෙන්න. දැන් ඉතින් අපේ ළමයෙක් කියල හිතලයි මේව කරන්නෙ. අපි කියන විදිහට ඉස්සරහට වැඩ කරන්න. පුතාව හොඳ කරගන්න ඔය ළමය උදව් කරන්න ඕන...'

'මට කොහේවත් යන්න බෑ...'

මම සැපුව ම කීවෙමි. දෙමහල්ලෝ මුහුණට මුහුණ බැලුවෝ ය.

'තේත්‍රා ඔයා දිගටම අකීකරු වුණොත් ... ඔය දරුවෝ දෙන්නම අපට නැති වෙන්න පුළුවන්... බලන්න ජීවිත කීයක් ඔය ළමයි නිසා දුක් විඳිනවද කියලා...'

විශ්වගේ මව කීවා ය.

'ජීවිත ඔක්කොම හින්ද විඳවන්නෙ මම...'

මම හැඬුම්බරව කීවෙමි.

'ඔයාට දැන් හොඳට සනීප නිසා විශ්ව සනීප කරගන්න උදව් කරන්න ඕන නේද...?'

'ඔව්.... ඒක මං දන්නවා...'

'ඉතිං එහෙනම් හෙට උදේ අපිත් එක්ක යන්න ලෑස්ති වෙන්න...'

මට තවත් කතා කිරීමට ඉතිරිව තිබුණත් තර්ක කිරීමේ එලක් තිබුණේ නැත.

මම තවත් ඉරණම් ගමනකට සූදානම් වීමි.



# 10

අපමාණ වූ ත් අනන්ත වූ ත් හැඟීම් දළ රළ පෙළක් මෙන් රළුව නැගෙයි. රුදුරුව බිඳෙයි. බියකරුව වැළපෙයි. ජීවිත කාලය ම හැඬූ සිතක් මෙන් හදවතේ මස් පිඬු එකිනෙක තෙරපෙයි. රිදෙයි. වැළපෙයි. නන්නාඳුනන නුවරක තනි වූ අසරණියක මෙන් හුදෙකලා වූ මම විටෙක හඬමි. කාටත් හොරා තැවෙමි. වැළපෙමි. මළ පුඩුවකට හසු වූ මුවැත්තියක මෙන් මම මහා මන්දිරයක සුව පහසු කාමරයක සිර වීමි.

'මේක දැන් අනුන්ගේ ගෙයක් නෙමෙයි. තේත්‍රා දැන් අපේ සේවිකාවකුත් නෙමෙයි. තමන්ගේ ගෙදර කියල හිතාගන්න. මේ දේවල් ඔක්කෝම කවදා හරි විශ්වට අයිති වෙන්න තිබුණ ඒවා. එයා තීරණයක් ගත්තා. දැන් අපිට විරුද්ධ වෙන්න බෑ. දැන් ඉතිං ඉස්සරහට ඔක්කෝම දේවල් අපේ පුතා වෙනුවෙන් කැප කරන්න ඕන. රොඩී කුප්පායමකින් කසාද බැන්දත් අපිට අපේ පුතා වෙන් කරන්න බෑ.... මොන දේ කරල හරි පුතා සනීප කරගන්න ඕන...'

විශ්වගේ මව කාමරයට විත් කීවා ය. ඇගේ අනවශ්‍ය ළෙන්ගතුකමට මම බිය වී සිටියෙමි. මට යස ඉසුරු හෝ සිදාදියේ මහා මන්දිර දිනන්නට ඕනෑකමක් තිබුණේ නැත. මම කලෙක ඒවා පිළිකුල් කළෙමි. එහෙත් දෛවය විසින් ඒ සියල්ල මගේ දෙපා මුල අතුරද්දී නියත අවිශ්වාසය හැර කුමක් ඉතිරි වන්න ද?

'විශ්වගේ බැංකු පොත් මුකුත් තේත්‍රාට දුන්නාද?'

'නෑ.'

මව නොසිතූ මොහොතක නැඟූ පැනයට මම සැණෙකින් පිළිතුරු දුනිමි.

'ඔප්පු මුකුත් දුන්නෙත් නෑ නේද?'

For E-Pusthakalaya

'නෑ.'

'නුවරදී නිතිඥ මහත්තුරු කවුරුවත් හමුවෙන්න ගියාද?'

'ඒත් නෑ.'

'මාතලේ පාරේ අපේ ඉඩම් වගයක් තියෙනවා. ඒවා බලන්න යන්න වෙලාවක් තිබුණෙත් නෑ නේද?'

'ඔව්'

'දුවට ... විශේෂ මුකුත් තෑගි එහෙම දෙන්නත් වෙලාවක් තිබුණෙ නැනේ?'

'නෑ... මේ මුද්ද අරන් දුන්නා. හේමචන්ද්‍ර එකෙන්.'

මම වමතේ තිබුණු මුදුව පෙන්වා කීවෙමි.

'ඕක ඉතින් සුළු තෑග්ගක්නේ.'

'වෙන මොකුත් දුන්නෙ නෑ.'

'මං නිකමට ඇහුවේ. දැන් ඉතිං පිට කෙනෙක් නෙමෙයිනේ. ඔක්කොම දේවල් පිළිවෙළක් කරගන්න ඕන.'

මම බොහෝ අසංවේදී ප්‍රශ්න රැසකට පිළිතුරු දුනිමි. වික්ති කුඩුවකට හැඟුණු වූදිතයෙකු මෙන් මම පිළිතුරු දුනිමි. එහෙත් ඒවා හිමිකාර පාර්ශ්වයට කෙ තරම් සත්‍ය දැයි මම නොදනිමි. මට වසන් කරන්නට දෙයක් තිබුණේ නැත.

'ඔයගොල්ලන්ට තිබුණෙ කසාද බැන්දදාම කොළඹ එන්න....'

'අපි දෙන්නම බයවෙලා හිටියේ.'

'මොකටද බය වෙන්නේ?'

විශ්වගේ මව කතා කරන්නේ පියවි සිහියෙන් දැයි අසන්නට මට සිතිණ. මම එය මැඩ පවත්වා ගතිමි. බෝඩිමට ඇය පැමිණි දින මැරයන් සමඟ කළ නිග්‍රහ සහ සාහසික ප්‍රකාශ ඇයට අමතක වී ද? නැත්නම් සත්‍ය ලෙස ම ඇය දැන් වෙනස් තත්ත්වයකට පත් වී ද? එසේ නොවේ නම් මා සූදානම් කරන්නේ අලුත් බිලි පූජාවකට ද?

'දෙයියන්ගේ පිහිටෙන් එදා කොළඹ ආව නම් ඔහොම කරදරයක් වෙන්නෙ නෑ.'



මම නිහඬව සිටියෙමි. මව නැවතත් ප්‍රශ්න කළේ නිහඬ බවේ සැඟවී තිබුණු රහසක් හොරා ගන්නට මෙනි.

'අපි නුවර හෝටලයක හිටියේ.'

'හෝටලයක හිටියට එකට හිටියේ නෑ නේද?'

මම තරමක් වෙලා නිහඬව සිට 'හිටියා...' යනුවෙන් කීවෙමි. මවගේ මුහුණුවර වෙනස් වී යනවා දැකීමට නොහැකිව මම බිම බලා ගතිමි.

'තාත්තා වුණත් ඔයිට වැඩිය හොඳ විදිහකට ඔය දේවල් එකලාසයක් කරල දෙයි ඔහොම නොවුණ නම්?'

මව කනස්සල්ලෙන් කිවා ය. මම මුනිවත රැකිමි.

'ඇයි නේත්‍රා තාත්තා ගැන කිව්වම කතා නොකර ඉන්නෙ?'

'නෑ... මොකුත් නෑ.'

'ඇයි තාත්තා මුකුත් බලපෑමක් කළාද?'

'නෑ.'

'බඳින දවසෙ නුවරදී හම්බ වුණා නේද?'

'ඔව්.'

'කාරෙකට දාගෙන හන්තානට ගියා?'

'ඔව්'

'ඊට පස්සෙ...?'

'මොකුත් නෑ.'

'මොකුත් නැත්තං මිනිස්සුන්ට බෝතල්වලින් ගහන්ඩ යනවද?'

'ඒ මගේ හැටි'

'මිනී මරන්ඩ හදන එක ඔයාගේ හැටිද?'

ඇගේ දෑස දෙස බැලීමට නොහැකිව මම අහස ත් පොළොව ත් අතර හිර වීමි.

For E-Pusthakalaya

'නේත්‍රාට හැබැයි මෙහෙ ඉන්ඩ වෙන්නෙ ඉස්සර හිටියට වැඩිය වෙනස් විදිහකට. එහෙම ඉන්ඩ පුළුවන්ද?'

'පුළුවන්.'

'මං කියන දේ අහල හිටියොත් පිළිවෙළක් කරල දෙන්නම්. අර තාත්තා-පුතාල නටන හැංගිමුත්තම කරන්නෙ නැතුව.'

මගේ ආත්මය බිත්ති අතර සිර වී ය. මාව පිළිවෙළක් කර දෙන්නේ කාට ද? මා කළ හැංගිමුත්තම කුමක් ද? මට කරන්නට කියන්නේ කුමක් ද? මේ මවට තම පුතාගේ රෝගී තත්ත්වයට වඩා වෙනත් දේ බැරෑරුම් වී ද?

මම නීතිය ඉදිරියේ විශ්වගේ බිරිඳ වීමි. ආත්මය ඉදිරියේ විශ්වගේ බිරිඳ වීමි. ඔහුගේ පය පාමුල මගේ පවිත්‍රභාවය ඔප්පු කළෙමි. ඉතිකින් ම තවත් නම් ජීවිත අරමුණක් කොයින් ද? මම ආත්මයෙන් ආත්මයට ඔහු වෙනුවෙන් ආත්ම පූජා කරමි.

'අම්මල හිතනවට වැඩිය මං විශ්වට ආදරෙයි. මම මේ වෙලාවෙ හිතන්න ඕන එයා ගැන.'

'මම හිතන්නෙත් එයා ගැන තමයි. නේත්‍රා හිතන්නෙ එක දවසක් ඇසුරු කළ කෙනෙක් ගැන. මං හිතන්නෙ මං වදපු පුතා ගැන. මට කොයිතරම් කැක්කුමක් තියෙනවද කියල නේත්‍රාට හිතාගන්න පුළුවන්ද?'

'පුළුවන්.'

'කොහොමටත් නේත්‍රාට ටික දවසක් මෙහෙ 'ඉඳිද්දී තේරේවි ඔයගොල්ලො හිතනවට වැඩිය ජීවිතේ වෙනස් කියලා. ගෑණු ළමයි ඔය වයසට ඔහොම තමයි. බැලුම් බෝලේ වගේ පිම්බෙනවා. ඒ ගොල්ලො දන්නෙ නෑ ඒක අව්වට අල්ලන්න හොඳ නෑ කියලා...'

'මං මේ ලෝකෙ මිනිස්සු ගැන දන්නව අම්මෙ. මිනිස්සු වගේම තිරිසන්නු ඉන්නව කියලත් මං දන්නවා.'

'ඔව් ඉතිං මං ඔය වයසට නොපැන්න කඩු දැනටමත් නේත්‍රා පැතලෙන ඉන්නෙ නේද?'

ඇය කටේ දිව නොගැවී කීවා ය.

'මං නරක කෙල්ලෙක් නෙවෙයි'



'දැනට නරක නෑ. ඉස්සරහටත් මං කියන දේ අහල හොඳින් හිටියොත් කරපු වැරදිවලටත් වන්දි ගෙවන්න පුළුවන්.'

මව සිනාවක් පා කාමරයෙන් පිටත් වූවා ය. මම අසරණ භාවය පිළිබඳව අලුත් පාඩමක් ඉගෙන ගනිමින් සිටියෙමි. ගෙවෙන ගෙවෙන රැයක් පාසා මම නව නවත් අසරණ වෙමින් සිටියෙමි. විශ්වගේ පියා දුල්දැව දින දෙක තුනක් ම මා සමඟ වචනයකුදු කතා නොකර සැඟවුණු චරිතයක් රඟ පාමින් සිටියේ ය.

නුගේගොඩ නාවල පාරේ 'අරලිය උද්‍යානයේ පිහිටි විශ්වලාගේ නිවස අක්කර භාගයකටත් වඩා වැඩි වපසරියකින් යුතු වූවකි. මට ලැබුණු කාමරය මතු මහල් තලයේ පිහිටි නිසා ම උදේ ම මම කාමරයෙන් සඳලුතලයට පිවිස වටපිට නිරීක්ෂණය කරමි. එහෙත් පහත මාලයට බසින සැණෙකින් සේවකයෝ පමණක් නොව විශ්වගේ මව ද මා පසුපස හඹා යන බව මම තේරුම් ගනිමි. සෙර ක, උමතු ගැහැණිය ක, ගේ ඇතුළෙහි සැරි සරන කලෙක මෙන් ඔවුහු මා පසු පස ඉව අල්ලති. මුහුණට කිසිවක් නොකීවත් ඔවුහු වඩා සුපරීක්ෂාකාරිව මගේ හැසිරීම නිරීක්ෂණය කරන බව තේරුම් ගත් මම, මා පිළිබඳව වඩාත් බිය වීමි.

ජීවිතය හා මරණය අතර සැරි සරන භූතාත්මයක මෙන් මගේ සිත ඔද්දල් වී තිබිණ. බලාපොරොත්තුව හා ජීවිතය අතර පරතරය වඩා දුරස් වෙමින් තිබිණ. සියල්ල වේරම්භ වාතයෙන් මෙන් කැරකී කැරකී බමන්නට වන විට විශ්ව පිළිබඳව ආදර බිංදුවක් දෙනෙතේ පොපියන්නට වෙයි. ඒවා බෙහෙවින් ම සීතල කඳුළු ය. ආදරයේ පණතල රැකෙනු යි සිතෙන හැම මොහොතක ම විශ්ව පිළිබඳව බරැති සුසුමක් මුවින් නිහඬව ම පිට වෙයි. එය බෙහෙවින් ම අදැති ය. සීතල කඳුළු ත්, ආදර සුසුම් ත් අතර මම විශ්වගේ උණුසුම් හාදුවක බලාපොරොත්තු හද ගැබට වඩින තෙක් පාරම් පූරමින් සිටියෙමි.

සති තුනකටත් වැඩි කාලයක් මම මෙකී ගන්ධබ්බ ආත්මයේ සැරිසැරිමි.

මගේ රෝගාතුර තත්ත්වය බෙහෙවින් ම සුව වී තිබිණ. කිසිදු කායික නෙහෙට්ටුවක් තිබුණේ නැත. සිතේ පැවැති නොසන්සුන් ලීලාව ඇස්, ඉස්, මස්, ඇට මිදුළු සිඳ බිඳ වේදනා දුන්න ද මම දුකට ම හුරු වීමි. විශ්ව ගැන කාගෙ කාගේත් කණින් කොණින් ඇසූ දේ හැර සත්‍යය

මා දැන සිටියේ නැත. ඇතැම් දිනවල බෙහෙවින් කලබලකාරී කසුකුසු පහත මාලයෙන් ඇසේ. බැණ වැදීම්, තර්ජනය කිරීම් පමණක් නොව ආදර වදන් ද දෙසවනට ඇදේ. මම විශ්වගේ මවගේ සහ පියාගේ චර්යාවන් පිළිබඳව තුහුරු අත්දැකීමක් විඳිමින් සිටියෙමි. සත්තකින් ම එය බෙහෙවින් ම ගුප්ත ය. වියළි ය. ඇසෙන, දැනෙන විට මහත් අපහසුවක් සිතට දැනේ.

කෑමබීම ද, ඇඳුම් පැළඳුම් ද මට අවැසි තරම් ලැබිණ. සේවක සේවිකාවක් වත් මා සමඟ අල්ලාප සල්ලාපයේ යෙදුණේ නැත. ඔවුහු බෙහෙවින් කෘත්‍රිම ය. එහෙත් ඒ හැම කෙනකුගේ ම ඇස්වලින්, මොකක් දෝ රහසක් රකින බව ඔවුහු ම නොකියා කියති.

‘ඇයි ඔයගොල්ල මගෙත් එක්ක කතා නොකරන්නෙ? තරහද?’

මම දිනක් සේවිකාවකගෙන් පිළිවිසීමි.

‘නෑ.’

‘එහෙනම්.’

‘ඒ අපේ හැටි.’

‘මං වගේ නමයි.’

‘නෑ නෝනා. අපි ඉති‍ං පඩියටනේ වැඩ කරන්නෙ.’

‘පඩි නොගත්තට ඔය ගොල්ලන්ට වැඩිය දුකින් මං ඉන්නෙ.’

‘අපි දන්නෙ නෑ නෝනා.’

‘මොනවද නොදන්නෙ?’

‘අපිට ඕව කතා කරන්න එපා කියල තියෙන්නෙ.’

‘මොනවද?’

‘මොකවත්...’

‘ඔයගොල්ලට බැරිද මට උදව් කරන්න?’

‘අපි හරි අසරණයි නෝනා...’

‘මමත් අසරණයි කියල හිතෙන්නෙ නැද්ද?’

‘හිතෙනව.’

‘ඉතිං’

‘ඕවට අපි මොනව කරන්නද නෝන.’



‘ලීලා.’

ගම්භීර හඬක් සමඟ කාමරයේ දොර හැරිණ. විශ්වගේ මව පුළිඟු දැසින් ලීලා නමැති සේවිකාව දෙස බලා බැණ වැදුණා ය.

‘තොට මොකක්ද මෙතන තියෙන කතාව. පළයං පහළට. කකුල් දෙකෙන් අල්ලල ගහනව මං උඹව පොළොවේ. උඹට මොක්ද මෙතන තියෙන කසු කුසුව.?’

කොණ්ඩ වහල්ලෙන් අල්ලා ලීලා එළියට ඇද දැමූණි. මම ඉදිරිපත් වීමි.

‘ඒ කෙල්ල වැරැද්දක් කළේ නෑ.’

‘නෝනා... ඒ ළමයි වරදට පොළඹවන්න එපා.’

‘මං එහෙම කළේ නෑ...’

‘ඔහොම කළොත් කරන්න හිතෙයි. හෙට විශ්ව ගෙදර ගේනවා. අපි කියන විදිහට වැඩ කළොත් පුතාව සනීප කරන්න පුළුවන් වෙයි. කියන දේ අහල ඔය හිටිය වගේම ඉන්න ඕන. තේරුණාද?’

‘ඔව්.’

බොහෝ දේ නොතේරුණත් මම ‘ඔව්’ කීවෙමි. විශ්වගේ දෙපා මුල වහලියක් වුව ද මට කම් නැත. හිසේ සිට පාදාන්තය දක්වා පීඩාව දැනෙද්දී මම හෙටට සූදානම් වීමි. තැන් තැන්වල වැටී තිබුණ ආදරයේ සුනු විසුණු බඳුන් කැබලි ඔහු දෝතට ගනු ඇත. මම ඔහුට අවනත වෙමි. මුරණ්ඩු නොවෙමි. කීකරු වෙමි. මම මසිත තැන්පත් කොට ගෙන යහනට ගියෙමි. සීත සුළං පොදක් සමඟ සහනදායී සුවඳක් මගේ නැහැයට දැනිණ. මම ළය සැහැල්ලු වන තෙක් එය ආඝ්‍රාණය කළෙමි. මව කීවේ බොරුවක් වීමට නොහැකි ය. විශ්ව ආදරය ත් රැගෙන හෙට පැමිණෙනු ඇත.

අසරණ භාවය පිළිබඳව වේදනාකාරී අත්දැකීමක් මම ලබමින් සිටියෙමි. දෑසැහිලි දිගු කොට ජීවිතය දැඩිව අල්ලා ගැනීමට මට ඕනෑ වී ය.

එහෙත් රුදුරු හස්තයකින් දසැඟිලි ලිහිල් වී ඒ අතරින් ජීවිතය බිම වැටිණ. ඉතා ම කෙටි කාල සීමාවක් තුළ විශ්ව පිළිබඳව

අනන්තාපරිමාණ භක්තිමත් ප්‍රේමයක් මා තුළ හට ගති. මේ තරම් කෙටි කාලයක් තුළ මගේ හදවත ප්‍රේමයෙන් පිරී ගිය හැටි!

‘නේත්‍රා, තනියම මොකද්ද කල්පනාව.’

දුල්ලෑව කාමරයේ අඩවන් දොර අතරින් කාමරයට පිවිසියේ ය. දොරටුවෙන් ඇතුළු වෙත් ම ඔහු ශරීරයේ බර එයට වාරු කොට දොර වසා ඊට හේත්තු වී ය. මා තුළ ඇති වූ තිගැස්ම ඔහුට දැනෙන්නට ඇත.

‘බය වුණාද?’

‘මං එකෙකුටවත් බය නෑ.’

මම සන්සුන් ලෙස ජනේලය අසලට යමින් කීවෙමි.

‘පහුගිය දේවල් ඔක්කෝම එකතු කරලා ගත්තම කවුද දිනුවෙ?’

ඔහුගේ වචන පිහි තුඩු මෙන් වී ය.

‘දිනන්න මට තරගයක් තිබ්බෙ නෑ.’

‘එහෙම නෙමෙයි, මං කොච්චර උත්සාහ කළාද නේත්‍රා මගේ ළඟට ගන්න. දැන් බලන්න මගේ ගෙදරම මගේම කාමරයක කිරිල්ලියක් වගේ ඉන්නවා. දැන් ටික කාලයක් හති අරින්න. කාලේ කොච්චර ගෙවුණත් කමක් නෑ. ඉන්නේ මගේ ළඟනේ.’

‘මං කාගෙවත් වහලියක් නෙමෙයි. කාගෙවත් අතකොලුවක් නෙමෙයි. මං ඉන්නෙ මගේ විශ්වගේ ගෙදර.’

‘ඉතිං මං නෑ කියල කිව්වෙ නෑනේ. හැම වෙලාවෙම මතක තියාගන්න, විශ්ව මගේ පුතා. මගේ දේවල් සේරම පුතාට අයිතියි.’

‘ඒ වුණාට පුතාගේ දේවල් තාත්තට අයිති නෑනේ...’

මම එසේ කියා ජනේලයෙන් පිටත බලත් ම දුල්ලෑව කොක් හඬලා සිනා වූයේ ය. ඉන් පසුව කටහඬ වෙනස් කොට බැරෑරුම් ස්වරයක් ආරූඪ කොට ගත්තේ ය.

‘නේත්‍රා දැන් කොහොමද අනාගතේ සැලසුම් කරන්නෙ...?’

‘මේ අමනුස්සයෝ එක්ක මට ඉස්සරහට ඉන්න වෙන හැටි ගැන තමා සැලසුම් කරන්නෙ.’



‘සැප විඳල පුරුදු නැති කෙනාට එහෙම හිතෙනවා. හරියටම සැප විඳින්න පුරුදු වුණාම මේ ජීවිතේට ගෑණු ආසා කරනවා.’

‘ඔහේලා හිතන්නේ යානවාහන කෑමබීම ගෙවල් දොරවල්වලට ගෑණු වහ වැටෙනවා කියලා. තමුසෙලා ජීවිතේ කියල දන්නෙ ඒක. සල්ලි වෙනුවෙන් ඕනම බලු වැඩක් කරනවා. මං ජීවිතෙ කියන්නේ ගෑණු පිරිමි එකට බුදිය ගන්නවට නෙමෙයි.’

‘ඔය දේවල් ඔක්කොම ජීවිතේ කොටස් කියලා කාලෙකින් ගෑණු තේරුම් ගන්නවා. එදාට ඔය දේවල් ඔක්කෝම පිරිමින්ගෙන් ඉල්ලනවා.’

‘රත්තරන් පය පාමුල තියද්දී ඒකට පයින් ගහන්ඩ මං දන්නවා.’

මට කාමරයෙන් පළා යන්නට ඔහුගෙන් මිදෙන්නට ඕනෑ වී ය. එහෙත් දුල්ලෑව තමන්ගේ ශරීරය දොරට බර කොට හේත්තු වී සිටියේ ය.

‘කොහොම වුණත් මා එක්ක ඔය වගේ දේවල් කතා කරන්ඩ මිස්ටර් දුල්ලෑවට අයිතියක් නෑ.’

‘මට මේ ගෙදර ශුද්ධ වූ අයිතියක් තියෙනවා.’

‘මං වහලියක් නෙමෙයි.’

‘මගේ වහල යට ඉද්දී මට යටත්...’

‘මං කාටවත් යටත් නෑ...’

‘අවුරුදු තිස් ගාණක් දිග කාපු මගේ ගෑණිත් මේ වහල යටදී මගේ යටතේ ඉන්නෙ.’

‘මං තමුසෙගේ ගෑණි නෙමෙයි.’

මම දත්මිටි කමින් කීවෙමි.

‘නේත්‍රා, ජීවිතේ ආයෙත් අවුල් කරගන්න එපා.’

‘තිරිසනා...’

මම දුල්ලෑවගේ දෑස දෙස එක එල්ලේ බලා කීවෙමි.

දුල්ලෑව දොරේ අගුල තද කළේ ය.

‘මිස්ටර් දුල්ලෑව.... ඉස්සර වගේ නෙමෙයි. මං දැන් හරි වෙනස්.... ඔතනින් අඩියක් ඉස්සරහට තියන්ඩ එපා.’

For E-Pusthakalaya

'නේත්‍රා... ඔයා ඔය කියන වෙනසට මං හරි කැමතියි.'

'මතනින් අඩියක් ඉස්සරහට තිබ්බොත් මං කෑ ගහනවා.'

'කාට ඇහෙන්නද?'

මා සිතූ තරම් ඉක්මනින් දූල්ලැව ක්‍රියාත්මක වූයේ නැත. මම මේසය අසල තිබූ මල් පෝච්චිය අතට ගතිමි.

'මං විහිළුවක් කළේ නේත්‍රා. මං එහෙම තිරිසන් විදිහට ඔයාට කරදර කරන්නේ නෑ. ඉස්සරත් එහෙම කළේ නෑ. මතකනේ. ඒ මගේ හැටි. මං ඉල්ලීමක් කළා. ඔයා ප්‍රතික්ෂේප කළා. එච්චරයි. මට ඇත්තටම බලාගන්න ඕන වුනේ ඔයා හොඳ ළමයෙක්ද කියලා. අපට ගැළපෙනවද කියලා. ඔයා දැන් මගේ පුතාගේ බිරිඳ. මං ඒක තේරුම් අරන් ඉන්නේ. පුතාගේ බිරිඳ කියන්නෙ මගේ දුව කියන එක. හිත රිදුණා නම් සමාවෙන්න. මේ සිද්ධිය කාටවත් නොකිව්වොත් අපි දෙන්නටම හොඳයි..'

දහඩියෙන් තෙමී ගිය මගේ සිරුර සිසිල් වි ය. මම සුසුමක් හෙළීමි. පීඩාවෙන් නැඟුණු රුදුරු හැඟීම් වෙනුවට සහනයක කඳුළු නැඟෙමින් තිබිණ.

'මං බය වුණා...'

'තරක වැඩකට මං ඔයාව පොළඹයි කියලා.'

'ඔව්'

'මං ඔයා හිතන තරම් තරක නෑ...'

එසේ කියමින් දූල්ලැව දොර ළඟින් මෑත්ව මා දෙසට පියවර කිපයක් තැබුවේ ය.

'ඒත් ළඟට එන්න එපා.'

දූල්ලැව දොර ත් මා ත් අතර සිට ගත්තේ ය.

'අද පුතා එනවා. අම්ම උදේම ගියේ එයා එක්ක එන්න. මං නොගියේ බිස්නස් වැඩ ගොඩ ගැහිලා තින්දා...? පසුගිය ටිකේ ඔක්කොම අවුල් වෙලා. පුතාගේ තත්වෙ තේරෙයි නේත්‍රාට එයා ආවාම... අපි දෙන්නම මීට පස්සෙ පුතා ගැන හිතුවොත් තමයි හොඳ...'



දූල්ලැව තව අඩියක් ඉදිරියට තැබුවේ ය.

'ළඟට එන්න එපා.'

ඔහු නැවතත් හිටි තැන ම හිට ගත්තේ ය.

'ඇයි නේත්‍රාට සතුටක් දැනෙන්නේ නැද්ද විශ්ව එනවා කිව්වාම. දෙයියන්ගේ පිහිටෙන් පුතාට සනීප වුණා. පුංචි ප්‍රශ්නයක් තියෙනවා. ඒක හරියයි. පුදුමයි නේත්‍රා විශ්ව ගැන කතා නොකරන එක... ඇයි සතුටක් නැද්ද විශ්ව එනවාට...'

'සතුටුයි.... ඒත් තමුසෙ ළඟට එන්න එපා.'

'ඩොග්.... ඩොග්.... ඩොග්...'

කිසිවෙක් දොරට තට්ටු කළේය. මම තුෂ්ණිම්භූත වීමි.

'නේත්‍රා නෝනා... තේ ගෙනාවා...'

එළියේ සිට සේවිකාව කතා කළා ය.

'ඔතනින් පළයන් යන්න... නේත්‍රා නෝනා පස්සෙ තේ බොයි...'

දූල්ලැව කෑ ගැවේ ය.

'යන්න එපා ඔහොම දොර ළඟ ඉන්න...'

මම අවස්ථාවෙන් ප්‍රයෝජන ගෙන කීවෙමි. දූල්ලැව බෙහෙවින් අසරණ වි ය. මම ඔහුට තව තවත් පීඩා කළෙමි.

'අනේ ලීලා .... යන්න එපා.... මං කරදරේ වැටිලයි ඉන්නේ... දොර ළඟට වෙලාම ඉන්න. නෝනා ආවාම විස්තරේ කියන්න...'

මම ගැණු කපටිකම පාවිච්චි කළෙමි. දූල්ලැවගේ මුහුණේ සිහින් දහදිය බිඳු නැඟිණි.

ඔහු දොර හැර කාමරයෙන් පිටව ගියේ ය. මම ලීලා දෙස බලා සිටියෙමි.

සේවිකාවට අගක් මුලක් වැටහී තිබුණේ නැත. මම තව තවත් ගුප්ත බවට ඇදී යමින් සේවිකාව අපහසුතාවට පත් කළෙමි. ඇයව අපහසුතාවට පත් කොට මේ ගෙදර ජීවිතය ගැන රහස් ඇගෙන් දැන ගැනීමට මම උත්සාහ කළෙමි.

'ලීලා දැක්කද වෙච්ච දේ?'

මම ඇය තුළ කුතුහලය වර්ධනය කළෙමි.

'මට හිතාගන්න බෑ නෝනා...'

'මොනවද?'

'මේ සිද්ධවෙන දේවල්'

'දුල්ලෑව මහත්තයා හොඳයි නේද?'

මම තවත් ඇය අපහසුතාවට පත් කරමින් ඇසුවෙමි.

'මං දන්නෙ නෑ නෝනා...'

'ලීලා මොකද්ද මං ගැන හිතන්නෙ.'

'ඇත්තටම නෝනා කවුද?'

'මං මේ පරම්පරාව විනාශ කරන්ඩ ආපු පිල්ලියක්...'

මම ගුප්ත හඬින් කීවෙමි. ලීලාගේ ඇස් උඩ ගියේ ය. සත්තකින් ම අසරණ සේවිකාව බිය වූවා ය. මම ඇය සමඟ ලෙන්ගතුකමට සිනා සුණෙමි. මගේ සිනාවට ම ඇය තවත් බිය ගත්තා ය. මම මගේ දෙකම්මුල්වලට තට්ටු කළෙමි. ඇය මා නිරීක්ෂණය කළා ය. ගෙලේ සිට ළමැද හරහා මම කුස දෙසට දෑතින් ම පිරි මැදිමි. ලීලා අඩි දෙක තුනක් පස්සට ගියා ය.

මම නැවතත් ඇය සමඟ සිනා සීමි. අඩියට දෙකට දොර ළඟට ගිය ඇය 'දඩාස්' ගා දොර වසා කාමරයෙන් නික්මුණා ය.

මම ජනේලයෙන් එහා ලෝකය දෙස නෙත් යොමා සිටියෙමි. වෑන් රථයකු ත් කාර් රථ දෙකකු ත් ගෙවත්තට ඇතුළු වූයේ ඒ විට යි. කඩි රැළක් මෙන් වෑන් රියෙන් බැස ගත් පිරිස මැද්දෙන් පැමිණි කාර් රථය වට කොට ගත්තෝ ය. කැඩෙන බිඳෙන භාණ්ඩයක් එළියට ගන්නවාක් මෙන් සුරක්ෂිතව ඔවුහු විශ්ව රථයෙන් එළියට ගත්තෝ ය.

මම ජනෙල් කවුළුවේ හිස ගසා ගෙන මහත් වීරියෙන් ඒ දෙස බලා සිටියෙමි.



# 11

ඉවසමින්... ඉවසමින්... ඉවසමින්... ඉන්නා විට එහි කෙළවර කුමක් දැයි මම නොදනිමි. වෛරය ගුලි ගැසෙන්නට පුළුවන. ඒ විට වෛරය පුපුරා යයි. නැත්නම් සහනය සොයා සිත නිද්‍රාගත වෙන්නට ත් පුළුවන. විටෙක නිද්‍රාගත වන සිතට පීඩාව හා වෛරය පහර දෙන විට උමතු විකල් මනසක් ඇති වීමට ද බැරි නැත.

විටෙක ඇසේ මතු වී නළියන කඳුළකි. තවත් වරෙක ළය සැහැල්ලු වන සුසුමකි. මේ සියල්ලගේ ම එකතුව හිසට වධ දෙන මහමෙරක් තරම් බරකි. පීඩාවකි. ඉවසුම් නොදෙන රිදුමකි.

මම දෙතුන් විටක් මගේ ම හිස ජනෙල් කවුළුවේ ඇන ගතිමි. රිදෙන්නේ නැත. තවත් වැරෙන් මම මගේ ම හිසින් ජනෙල් කුරුවලට පහර දුනිමි. දෙවියනි, මා කුරිරු ලෙස සහනය සොයන හැටි!

මම දැස පියා ගතිමි. දැස් පියන් පත් තද කොට ගතිමි. අත්ල රතු පැහැ ගැන්වෙන්නට ජනෙල් කුරු මිරිකා ගතිමි. ගොළුවෙකු මෙන් බාහිර ලෝකයෙන් මිදෙන්නට උත්සාහ කළෙමි.

ජීවිතයේ මා මුහුණ දුන් ඉතා ම බැරෑරුම් අවස්ථාවක් පසු කළෙමි. මම ප්‍රබන්ධ කතාවක චරිතයක් මෙන් අමුතු ලෝකයක තනි වීමි. විශ්ව සමඟ සහපිරිවර ගෙදරට ඇතුළු වූ හ. ඔවුහු මහපොළොවේ සිටියදී මම සඳලුතලාවේ සිටියෙමි. සඳලුතලාවේ කඳුළු තිබුණි. ඒවා පොළොවට වැටුණේ නැත. ඒ දවස පොළොවේ කඳුළු තිබිණ. ඒවා සඳලුතලාවට පෙනුණේ නැත.. කොහේ තිබුණත් 'කඳුළු' දුකක් බව මම තේරුම් ගතිමි. කඳුළු දුකකි. දුක කඳුළකි.

මම බොඳ වූ ශූන්‍ය ඇස්කුහර විවර කර මහපොළොවට නෙත් හෙළීමි. කිසිවෙකුත් නැත.

For E-Pusthakalaya

ඔවුහු මන්දිරයක දොරගුලු වසා ගෙන ය. රථවාහන කිපයක් පමණක් මිදුලේ තැන තැන අජීවීව නිසොල්මනේ තිබිණ.

මම කාමරයේ දොර විවර කරලීමට තැත් කළෙමි. එය පිටතින් අගුලු ලා තිබිණ. මගේ ජීවිතයට ද අගුලු වැටෙමින් තිබෙනවා වත් ද? ඔවුහු සැරසෙන්නේ විශ්වත් අගුලු ලා වසා දැමීමට ද? ශක්තිමත් කොන්ක්‍රීට් බිත්ති විනිවිද මගේ සිත විශ්ව ඉන්නා ඉසව්ව සොයා පාවී යයි. ජීවිතය තීරණය කරන්නේ දෛවය ද? දෛවය තීරණය කරන්නේ මිනිසුන් ද? මම වික්ෂිප්ත වීමි.

මම තව තවත් ඉවසමින් සිටියෙමි. වනාන්තරයෙන් අල්ලා ගත් අසරණ මුවැත්තියක මෙන් මා සිර වී ඇත. මම මගේ කාමර සීමාවේ සක්මන් කළෙමි. මගේ ජීවිත සීමාවේ සක්මන් කළෙමි. මගේ සිත බිමට වැටේ යැයි බියෙන් මෙන් හෙමින් ගමන් කළෙමි. සොරක සේ බියෙන් විටෙක කාමරයේ එහෙ මෙහෙ බැලීමි. අමුතු ගැහැණියක මෙන් කැඩපතකින් මුහුණ බැලීමි. මේ බිත්ති පුපුරා හැළෙන්නට වියරු ලෙස පිනා සෙන්නට මට සිතේ. කැඩපතින් මුහුණ පෙනෙන විට එහි ප්‍රතිබිම්බයට පහර දෙන්නට සිතේ. දැතින් කණ්නාඩියට පහර දී දැතේ ලේ තවරා ගන්නට සිතේ.

වේගයෙන් ... වේගයෙන් ... පපුව තිගැස්සී හිර වන්නට මෙන් පීඩාවක් මාංශපේශී අතර තෙරපේ. මට මගේ ජීවිතයේ වටිනාකම සැහැල්ලු වන බව පිතේ. දැනේ. ජීවිතයට වටිනාකමක් නොමැති විට අරමුණක් ඉතිරි වන්නේ නැත.

මම ඇඳේ වාඩි වීමි. ගමන් කරන්නට තරම් ඉඩක් මේ කාමරයේ නොමැති බව ටික වේලාවකින් මට පසක් වෙමින් තිබිණ. මම හැවතුණෙමි. ජීවිතය ද නවතා ගන්නට මට සිතේ. මගේ හිස බමන්නට වන් විට මහ බරක් දැනී, එය දෑදණ අතර රුවා ගතිමි.

මම මහා අසරණියක් වීමි.

මට මහා දුකක් දැනේ.

මට මා ගැන ම පුදුම තරමේ අනුකම්පාවක් දැනේ.

දින දෙක තුනක් ගෙවී යන විට මා 'අමුතු' වන බව මට දැනිණ. කෙ තරම් සිත සන්සුන් කර ගැනීමට තැත් කළ ද, 'අමුතු' විදිහේ



සංජානන මට දැනෙමින් තිබිණ. බාහිරින් පෙනෙන සිරියාවට වඩා මේ මන්දිරය ගුප්ත ගුහාවක් මෙන් දැනෙන්නට වි ය. මසිත තිගැස්සෙන්නට වූයේ මෙහි තිබූ ගුප්ත බවට නොවේ. එකී ගුප්ත රටාව සහ ගුප්ත මිනිසුන්ගේ හැසිරීම් විසින් මා තුළ ද අමුතු හැඟීම් ඇති කළ හෙයිනි.

සියල්ලෝ ම එකතු වී කිසි යම් නිහිමය රටාවකට මා හැඩ ගස්වමින් සිටිය හ. මම දැන් දැන් කිසිවකට විරුද්ධ නොවී සිටින්නෙමි. විරෝධය හා අකීකරුකම යනු මාගේ විනාශය ළඟා කර ගැනීම බව මට පසක් වෙමින් තිබිණ.

නිවසේ සේවක සේවිකාවෝ ද එකී රටාවට අනුගත වී ඇති සැටියකි. සියල්ල අධ්‍යයනය කිරීමේ ඕනෑකමක් මා තුළ ද ලියලමින් තිබිණ. එකී සිතිවිල්ල සිතට නැඟීම ම යම් සහනයක් වි ය. මා තුළ නැගෙන විකල් සිතුවිලි පරයා නැඟුණු 'අමුතු' අරමුණට මම ඉඩ දුනිමි. එය බලාපොරොත්තු ඇති කරන්නකි.

දිනකට කිපවරක් ම සේවක සේවිකාවෝ මගේ කාමරයට පැමිණෙති. උදේ ම කිරි තේ එකක් ලැබෙයි. පැය භාගයකින් පමණ උදේ ආහාර ලැබෙයි. දවාලට හරියට ම එකට පෙර ආහාරය සූදානම් කර ගෙනත් දෙයි. තුනට තේ ලැබෙයි. රාත්‍රී ආහාරය ද කාමරයට ම ලැබෙයි. ගුප්ත වෙස් මුහුණු සහවා ඔවුහු මා සමඟ සිනා සෙති. මම එකී වෙස් මුහුණුවලට විරිත්තමි. විටෙක රවන්නෙමි. ඔරවන්නෙමි. ගොරවන්නෙමි.

'නෝනා, තේ ගෙනාවා.'

'නෝනා, කෑම ලෑස්තියි.'

'නෝනා ඇඳුම් තියෙනවනම් දෙන්න ... හෝදන්න.'

'නෝනා මහන්සි වගේ නම් නිදගන්න.'

මන්ද බුද්ධික ළපැටියෙකු හසුරුවනවා මෙන් ඔවුහු මා හසුරු වන්නට වූ හ. මම එයට ඉඩ දුනිමි. බොහෝ විට සේවක සේවිකාවන්ගේ සේවිකාවක වීමි.

දිනකට එක් වරක් විශ්වගේ මව පැමිණ මා පහත මාලයට රැ ගෙන යයි. එය ආදරය තැවරූ රූදුරු අණ කිරීමකි.

'එන්න දුව, දැන් විශ්ව බලන්න වෙලාව...'

For Pothkalaya

අමුතු සතෙකු බැලීමට මෙන් ඇය මා රැගෙන යයි. මම ද ඔහේ ඇය සමඟ පහත මාලයට පාත් වෙමි.

'ගිහිල්ල ඉක්මනින් උඩට එන්න. අනවශ්‍ය කතා – කතා කරන්න එපා.'

'හොඳයි.'

මම කාමරයෙන් නික්ම තරප්පු පෙළ වෙත ගමන් කරමි

විශ්වට වෙන ම කාමරයක් සකසා ඇත. ඔහු ළඟ ම සේවකයෙකු නවතා තිබේ. ඔහු විශ්වගේ සියලු ආවතේව ඉටු කරයි. ක්ලාන්ත වී සිහිය ලැබූ විගස මෙන් විශ්ව වටපිට බලමින් සිටී. කො තරම් කතා කළ ද ඔහු වචනයකුදු කතා කරන්නේ නැත. සියල්ලෙන් ම සහනය ලැබූවෙකු මෙන් ඔහු සන්සුන් ය. ශාන්ත ය. නිසංසල ය.

මම ඔහු දෙස බොහෝ වේලා බලා සිටියෙමි. මුල දී මුල දී ඔහුව ස්පර්ශ කළෙමි. නළල සිප ගතිමි. ඇඟිලි තුඩින් කම්මුල් පිරිමැද්දිමි. අතින් අත අල්ලා උණුසුම් කළෙමි.

'ඇයි රත්තරන්... ඔයාට මොකද...?

මම පිළිවිසිමි. නැත. ඔහු මා දකින්නේ නැත. ඔහු මා හඳුනන්නේ නැත. ඔහු කතා කරන්නේ නැත. ඔහු මදෙස බලන්නේත් නැත. ඔහුට මා එපා වත් ද?

'කමක් නෑ.... මම මැරෙන තුරාවට ඔයා වෙනුවෙන් මේ ගෙදර හිරකාරියක් වගේ ඉන්නවා. මගේ රත්තරං විශ්ව.... මං මැරෙන තුරාවට ඔයා ඉන්න තැන ඉන්නවා...'

මම ඔහුගේ පපුවට හිස ඔබා ගෙන කීවෙමි.

එහෙත්.... ඔහුට දැනෙන්නේ නැත. සෙල් රුවක් මෙන් ඔහු නිහඬ ය. නිසල ය.

මා කාමරයට ගොස් එන තෙක් විශ්වගේ මව එකී කාමරය තුළට ම වී සිටී. මම බොහෝ වේලා ඔහු දෙස බලා සිට නැවත උඩු මහලට එන්නෙමි. නැවතත් ඊ ළඟ දිනයේ නිශ්චිත කාල හෝරාවට ඔහුගේ කාමරයට යන්නෙමි. සිහින් බැල්මකුදු ඔහු මා දෙසට හෙළන්නේ නැත. විශ්ව බැහැ දැකීමේ දින චර්යාව ද වියළි සම්බන්ධතාවක් පමණක් බවට පත් වෙමින් තිබිණ.



විශ්ව මා සමඟ කතා නොකළ ද වෙනත් අය සමඟ කතා කරනවා ද නැද්ද යන්න දැන ගැනීම මට මහත් ප්‍රහේලිකාවක් වී තිබිණ. එහෙත් මේ ගුප්ත බංගලාවේ කිසිවෙකු සෘජු ලෙස පිළිතුරක් දෙන්නේ නැත.

'මං දන්නේ නෑ නෝනා...'

'අපි ඒවා දන්නේ නෑ...'

ඒ, බොහෝ විට ඔවුන්ගෙන් ලැබෙන පිළිතුරු යි.

මම බලු කුඩුවක 'බැල්ලක' මෙන් ඇති දැඩි වීමි. ඔවුහු විශ්ව 'කුඩා දරුවෙකු' මෙන් ඇති දැඩි කළෝ ය. සිරිදාස නමැති සේවකයා විශ්වගේ ආවතේවකරුවා ය. දත් මැද මුහුණ සෝදවා විශ්වගේ දළ රැවුළ කපා හිසට යටින් විශාල පුළුන් කොට්ටයක් තබා තිබේ. වටේට ඊටත් වඩා විශාල පුළුන් කොට්ට දෙකකි. පපුව දක්වා ලෝම සහිත බ්ලැන්කෙට්ටුවකින් සිරුර වසා තිබේ. අමුතු සතෙකු මෙන් ඔහුව බැහැ දකිනවා හැර මට කළ හැකි තවත් යමක් ඇත් දැයි මම කල්පනා කරන්නට වීමි.

දින දෙක තුනකට වරක් වෛද්‍යවරයෙක් නිවසට පැමිණෙයි. කීප දෙනෙකු පැමිණ විශ්ව නිවසින් පිටතට ගෙන යනවා ද මම කිහිප දිනක් ම දුටුවෙමි. රෝහලට ගෙන යනවා වෙන්ට ඇතැ යි මම අනුමාන කළෙමි.

'විශ්ව මහත්තයා බලන්න එන්නෙ කොහේ දොස්තරලද?'

දිනක් මම ලීලාගෙන් ප්‍රශ්න කළෙමි.

'මං දන්නෙ නෑ නෝනා...'

ඇගේ පිළිතුර වී ය.

'විශ්ව මහත්තයා හිටපු ගමන් දොස්තරල ගාවට ගෙනියනවා නේද?'

'මං දන්නෙ නෑ නෝනා...'

මට ඉවසුම් නොදෙන කේන්තියක් ඇති වී ය. ජීඩාව ඉහ වහා යන්නට වී ය. මම ඇගේ කෙස් වහල්ලෙන් අල්ලා ගතිමි. ඇයට තර්ජනය කළෙමි.

'උඹ මොනවාද දන්නේ?'

ඇය දෑස උඩ ඉන්දවා මදෙස බැලුවා ය. එකී බැල්ම අසරණ ය.

'දුල්ලෑව මහත්තයා දවසක් මගේ කාමරයට ඇවිල්ල දොර වහගත්ත විත්තිය උඹ දන්නවද?'

'මං ඕවා කාටවත් කියන්නේ නෑ නෝනා...'

'මං විශ්ව මහත්තයාගේ කසාද ගෑණි කියලා තොපි දන්නවද?'

'අපිට ඕවා වැඩක් නෑ නෝනා. අනේ නෝනා මාව අතාරින්න. මට මේ රස්සාව කරන්න ඉඩ දෙන්න.'

මම ඇයව ලිහිල් කළෙමි. මගේ ඇස්වල කෝන්තිය වෙනුවට දුක් කඳුළක් උනමින් තිබිණ. මම කඳුළු බේරෙමින් ඇගෙන් ප්‍රශ්න කළෙමි.

'උඹල දන්නවාද මං උඹලට ආදරෙයි කියලා. ඇයි උඹල මට ආදරේ නැත්තෙ...?

'මට ඕව තේරෙන්නෙ නෑ..'

'ඇයි ලීලා මේවා තේරුම් ගන්න හදන්නෙ නැත්තෙ...?'

'අපි වැඩ කරන්නෙ පඩියට නෝනා...'

'ඇයි බැරි මට උදව් කරන්න...?'

'නෝනට මොනවද ඕන...?'

'මට ඕන මේ ගෙදර ඉන්න එවුවෝ ටික මරල විශ්ව මහත්තයා අරන් පැනල යන්න...'

මම ඇයව දැඩි කොට අල්ලා ගෙන කීවෙමි.

'නෝනගේ ඔළුව හොඳටම නරක් වෙලා...'

'උඹ හිතන්නේ මට පිස්සු කියලද...?'

'නෑ.... නෝනාගේ ඔළුව අවුල් වෙලා...'

'උඹල දන්නවාද මගේ ඔළුව අවුල් කරේ කවුද කියල...?'

'නෝනා මට යන්න දෙන්න...'



ඇය මගේ දෙපා මුල වැටෙන්නට සැරසිණ. පීඩාව ඉදිරියේ අසරණ වීමට ඔවුහු හුරු වී ඇත.

'අසරණ විදිහට හැසිරෙන්න එපා ලීලා...'

'අපි හරි දුප්පත් මිනිස්සු නෝනා...'

'ලීලා සල්ලිකාරයන්ට බයයිද...?'

'ඇයි නෝනා මං අසරණ කරන්නෙ...?'

'උඹලා ඔක්කෝම ඇයි මාව අසරණ කරන්නෙ...?'

'අපි ඔක්කෝම නෝනාට ආදරේ...'

ඇය මගෙන් මිදිණ. මිදුණු සැණින් ඇගේ මුහුණේ සහනය ඉපදිණි.

'මං යනවා නෝනා...'

ඇය කඩිනමින් නික්මුණා ය. මම නැවතත් තනි වීමි.

කාමරයේ තනි වන හැම මොහොතක ම මම දොර ජනෙල් සමඟ කතා කරමි. බිත්ති හතර සමඟ කතා කරමි. කැඩපතින් පෙනෙන 'මා සමඟ ම කතා කරමි. 'දුර්වල නොවී හිටපං... අසරණ නොවී හිටපං...' යනුවෙන් මම මට ම කියා ගතිමි. එහෙත් මම දුර්වල වී සිටිමි. අසරණ වී සිටිමි. හෙට දවසේ මට ත් විශ්වට ත් කුමක් සිදුවේ දැයි නොදැන සිටිමි.

මා ගෙවා දමන්නා වූ මෙම කාල වකවානුව අරාජික ස්වභාවයක පරාජයක් මා තුළට ගෙන එතැ යි මම බිය වීමි. මේ නිසා ම මා තුළ නැඟෙන ශූන්‍යත්වය අතර පරාසයේ අලුත් ජීවයක් මතු වෙතැ යි මම බලාපොරොත්තු සහගත වීමි.

මම අම්මාට ත්, තාත්තාට ත් ලිපියක් ලිවීමි. පරාජය හා මාගේ අසරණ බව වෙනුවට මම ඔවුන්ට සුන්දර බලාපොරොත්තු හෙළි කළෙමි. දුක්බදායී රිදවීම්වලින් කීරි ගැසෙන මාගේ සිත දෙමාපියන්ට හෙළි කිරීමේ පාපයට හවුල් නොවී මා වෙත සහනය ම ලැබෙමින් පවතින බව ලිවීමි.

අම්මාටයි – තාත්තාටයි,

අම්මා තාත්තාගේ සැපදුක් කොහොමද? මම දැන් සතුටින් ඉන්නවා. ඒක් විශ්වට තවම හරියට සුවයක් නැහැ. ඒත් ඉක්මනින් සුවවේවි. මට මෙහෙ කිසි අඩුපාඩුවක් නැ. සැප සම්පත් පිරිලා. ඒත් අම්මා තාත්තා තවම දුක් විඳිනවා කියල හිතුවම කනගාටුවක් දැනෙනවා. මට මෙහෙ කරන්න කිසි දෙයක් නැ. කම්මැලිකම විතරයි තියෙන්නෙ. විශ්වට හොඳ වුණාම අපි දෙන්නාම අම්මා – තාත්තා බලන්න එන්නම්. මම කොහොම හරි මගේ ජීවිතය ජය ගන්නම්. විශ්ව මට පිහිට වෙයි. මම සතුටින් ඉන්නවා. හැකි ඉක්මනින් අම්මා තාත්තා බැලීමට එනවා.

අම්මාටයි, තාත්තාටයි දළදා හාමුදුරුවන්ගේ පිහිටයි !

මං,

දූව නෝත්‍රා.

මම දෙතුන් විටක් ලිපිය කියවීමි. අම්මා තාත්තාට මගේ දුක ලිවීමට මම මැලි වීමි. මා විසින් තීන්දු කර ගත් මගේ ඉරණම් ගමන මා විසින් ම කරණය කළ යුතු ය. දුප්පත් අම්මා තාත්තාට එයට අත්වැල් පවුරක් වීමට තරම් ශක්තියක් මේ වන විට ඉතිරි වී නොමැති බව මම වටහා ගෙන සිටියෙමි. දුක වෙනුවට සතුට තැවරූ දොම්නස වෙනුවට සොම්නස තැවරූ ලිපිය දෙස බලා මම පළමුව සිනා සීමි. තනිව ම සිනාසීමි. දෙවනුව හැඬීමි. තනිව ම හැඬීමි. තෙවනුව වියරු ලෙස වටපිට බැලීමි. මගේ වියරු බැල්මට කිසිවෙකු හසු නොවී ය. තවත් යමක් හිතෙන්නට ත් කරන්නට ත් පෙර ලීලා කාමරයට ආවා ය.

'නෝනා .... මෙන්න තේ ගෙනාවා.... මොකද මේ? නෝනාට හොඳටම දාඩිය දාල?'

'උඹලගේ වලව්වෙ රස්නෙට.'

මම පිළිතුරු දුනිමි. ලීලා වෙන දාට වඩා එදා කාමරයේ රැඳී සිටියා ය. මම අම්මා තාත්තට ලියූ ලිපිය ලීලා අත තැබීමි.

ඔය ලියුම කියවන්න.'

'අනුන්ගේ ලියුම් කියවන එක හොඳ නැ නෝනා.'

'මමයි කියන්නෙ කියවපං.'

මම සැරවැර කළෙමි. ඇය කියවන්නට පටන් ගත්තා ය. මම මගේ 'අමුතු' හැසිරීමෙන් ඇයට දමා ගැසීමි.

'මට ඇහෙන්න කියවපං.'

ඇය ලිපිය ශබ්ද නඟා කියවූවා ය. කියවා මා දෙස බලා සිටියා ය.

'දැන් ඕක තැපැල් කරන්න ඕන අදම.'

'හොඳයි නෝනා මං ඒක කරන්නම්.'

ලීලාගේ චර්යාව තරමක වෙනස් වෙමින් පවතින බව මට වැටහිණ. ඇය මගේ රුදුරු හැසිරීම් ඇතැම් විටෙක ආදරයෙන් ඉවසුවා ය. මම පුදුම වීමි. බොහෝ විට ආරූඪ කර ගත් කුරිරු වචනවලින් මම ඇයට දමා ගැසීම ඇය ඉවසුවා ය. මම ඇයට අණ කළෙමි. ඇය කීකරු වූවා ය. කෙස් වහල්ලෙන් අල්ලා තර්ජනය කළෙමි. ඇය දණින් වැටුණා ය. මම ලීලාගෙන් මේ පිළිබඳව ආදරයෙන් විමසීමි.

'ලීලා කොහොමද මෙච්චර කුරිරුකම් ඉවසන්න පුරුදු වුණේ.'

'මං නෝනට ආදරෙයි නෝනා. මං ලියුම දාන්නම්. ඒත් නෝනා මේ ලියුමෙ ලියල තියෙන්න බොරු නෝනා සතුටින් නෙමෙයි ඉන්න. ඇයි නෝනා බොරු ලිව්වෙ.'

'ලීලා දැකල තියෙනවද මේ ගෙදර මිනිස්සුන්ගේ ඇත්තක් තියෙනව දැකල තියෙනවද ඇත්තටම ආදරය කරනවා.?'

'නෝනා හිතන ඔක්කොම දේවල් ඇත්ත නෙමෙයි.'

'මොනවද'

'විශ්ව මහත්තයා නෝනාට ඇත්තටම ආදරේ. ඒ දවස්වල ගෙදර ආවාම හැමදාම ගෙදර රණ්ඩු වුණා. නෝත්‍රා, නෝනාව බඳින්න ඕන කියල. මේ බුදලේ කිසි දෙයක් දෙන්නෙ නැ කියල තර්ජනය කරද්දීත් කිව්වා 'මට මොකවත් එපා කියලා...' විශ්ව මහත්තයත් පව් නෝනා.'

'ලීලා කියන්නේ විශ්ව මහත්තයා බොරුකාරයෙක් නෙමෙයි කියලද?'

'නේත්‍රා විශ්වාස කරල මං මේ කියන්නෙ. විශ්ව මහත්තයා ලිව්ව දිනපොතක් තියෙනවා. මං ඒක ගෙනත් දෙන්නම්. නෝනා ඒක කියවන්න. එතකොට නෝනට තේරෙයි.'

ලීලා කාමරයෙන් පිට වීමට පෙර කීවා ය. අලුත් තිගැස්මක් මා තුළ ඇති වි ය.

එදා දවල් ලීලා මට දිනපොත ගෙනත් දුන්නා ය.මට නති නොතනියට ජීවිතයක් ලැබුණාක් මෙන් වි ය. මම කඩිනමින් එහි පිටු පෙරළීමි.

*මැයි 10 ද –*

*තාත්තා හෝ අම්මා මිල මුදල්වලින් ජීවිතය තීරණය කිරීම වැරදි බව තේරුම් නොගන්නේ ඇයි? ජීවිතයට මුදල් අවශ්‍ය බව ඇත්ත ය. ඒත් ජීවිතය යනු මුදල් ම නොවේ. මට බොහෝ ධන සම්පත් වලට වැඩිය නේත්‍රාගේ වටිනාකම වැඩි ය. ඇයට ජීවිතය දෙන්නට මට ඉඩ නොදෙන හැටි.*

*මම තවත් පිටුවක් පෙරළීමි.*

*මැය 17 ද –*

*මං නේත්‍රාගේ අහංකාරකමට ප්‍රිය කරමි. මුදල් ඉදිරියේ දණින් නැමෙන කෙල්ලන්ට වඩා නේත්‍රාගේ අහංකාර ජීවිතය කොච්චර සුන්දර ද?*

*මම තවත් පිටුවක් පෙරළුවෙමි.*

*මැයි 25 ද –*

*අද නේත්‍රා එකඟ වෙලා ගල්කිස්සේ හෝටලයට ගියා. ඒත් ඇය මට ආදරය කරන්න ඉඩ දුන්නේ නෑ. මං ඉක්මන් වුණා වැඩියි. නේත්‍රා හොඳට හැදිච්ච කෙල්ලක්. ඇය නරක කෙල්ලක් නෙමෙයි. නේත්‍රා දරුණු විදිහට මාව ප්‍රතික්ෂේප කළා. දැන් මටම ලැජ්ජයි. ඒත් මට නේත්‍රා ගැන ආඩම්බරයි. ඒත් මං ඇය ලබා ගන්නවාමයි.*

මම දිනපොත වසා තැබීමි. රහසේ සඟවා තැබුණු ආදරය පිළිබඳ නොසිඳි උල්පත් දෝරේ ගැවාක් මෙන් මගේ හදවත පිරී යන්නට වි ය. ජීවිතයේ කුදු මහත් බලාපොරොත්තු නව ද ලා වැඩෙන්නට වි ය. මම දිනපොත ගෙන දෙතොලතර තබා සිප ගතිමි.



මම දිනපතා විශ්ව බලන්නට යන චර්යාව මහත් ආසාවෙන් ඉටු කළෙමි. ඔහුගේ නිහඬ නිසොල්මන් පැවැත්ම දස දහසක් ආදර හැඟුම් නැඟෙව්වේ ය. මුල දී, මුල දී විශ්වගේ රෝගාතුර ජීවිතය හා නැළහොල්මනක් නැති පැවැත්ම මට බෙහෙවින් යාන්ත්‍රික වි ය. කෘත්‍රිම වි ය. ඒත් දැන් දැන් මට විශ්ව දැකීම ම සුවයකි. මම ඔහු තුළින් අලුත් ජීවිතයක් දකිමි.

එද විශ්ව බැලීමට ගිය විට මම කිසිවෙකු පිළිබඳ නොසිතා ම ඔහුට බොහෝ දේ කීවෙමි. අම්මා ද අසා සිටියා ය. එහෙත් සොරොව් විවර කළ විට වැව පිටාර ගැලුවේ ය.

'විශ්ව.... විශ්ව.... මං ඉන්නවා. කවදාක හරි ඔයා හොඳටම සනීප වෙනකල් ඉන්නවා. අනේ රත්තරං එකම එක වචනයක් කියන්න... ඉක්මනින් සනීප වෙන්නම් කියන්න. මට අඬන්න එපා කියන්න. කතා කරන්න බැරිනම් එකම එක වතාවක් මගේ අත අල්ලගෙන ඉන්න.'

මම බොහෝ දේ කීවෙමි. හැම දක ම මෙන් ඔහු නිහඬ ය. වැඩි වේලාවක් ඔහු අසළ රැඳී කතා කරන විට ඔහුගේ සුදුමැලි මුහුණ රතු වෙයි. දෙතොල් සැළී සැළී යයි. කන්පෙති රතු වී යයි. එයට ලේ උනයි. ඔහු මහත් වෙහෙසකින් ඇස් පිල්ලම් ගැසුවේ ය. ඔහුගේ දෑස ගිනියම් වී පසුව තෙත් වෙයි. මම ඔහුගේ ඇසින් නැඟෙන කඳුළකට බිය වීමි. ඒ හෙයින් දෝ ඔහුගේ දෑසින් කඳුළක් පනින්නට පෙර ම කාමරයෙන් නික්ම එමි.

'හැමදම නේත්‍රා ඇවිල්ල පුතාගේ ඇස්වලින් කඳුළු ගන්නවා. හිතෙන්නෙ නැද්ද පව් වැඩක් කරන්නේ කියල?'

විශ්වගේ මව කීවා ය. එය ඉල්ලීමක් වත්, තර්ජනයක් වත් නොවේ. එහෙත් ඉල්ලීමක් තරම් කාරුණික ද නැත. තර්ජනයක් තරම් රුදුරු ද නැත. ඒ අතර තිබූ ප්‍රහේලිකාවකි.

ගැහැණියක සම්බන්ධව සොබාදහම අතිශය රහසිගත ලෙස තීරණය කළ සිදුවීමකින් මම ආවේශ වී සිටියෙමි. පළමු මාසය ගෙවී ගිය විට මම එය එ තරම් ගණන් නොගත්තෙමි. එහෙත් මේ ගෙවී යන්නේ දෙවන මාසය යි. විටෙක හැදුණු කැරකිල්ල මම ගණන් නොගත්තෙමි. හිස රුදව හැදුණ ත්, ඔක්කාරය හැදුණ ත් මම එය ගණන් නොගෙන

සිටියෙමි. ඒත් තව දුරටත් සොබාදහමට එරෙහිව ගණින් නොගෙන ඉන්නේ කෙසේ ද?

For Pusthakalaya

මම දෝත කම්මුලට තබා බැලීමි. මගේ ගෙල මම ම පිරි මැදීමි. මම මට ම නොරිදෙන්නට සිහින් ලෙස මගේ ම කුස අත ගා බැලීමි. කාටත් හොරා සළුව ලිහිල් කොට බැලීමි. දෙතොලතර මඳ සිනහවක් සමඟ ම දහදිය බිඳු ද නැගෙයි. කුසේ බාහිර සම තරමක් දිග හැරී ඇත. මම නිරීක්ෂණය කළෙමි. කළ නොහැකි වුවත් කුසට කණ තබා ගන්නට සිතේ.

මම වේල් දෙකක් නොකා නොබී සිටියෙමි. ඒ කිසිවෙකුට රිදෙන්නට නොවේ. එහෙත් සිතේ තෙරපෙන දේ වමාරන්නට මට අවැසි වී තිබේ. මම මගේ කුඩා පොකට්ටුව දිගහැර 'පැල්පත' අවන්හලේ අපේ මධුසමයේ බරපැන ගෙවූ බිල්පත පරීක්ෂා කළෙමි. එය ගුලකොට මුව ළඟට ගෙන සුවඳ බැලීමි. විශ්වගේ සුවඳ ඇත් දැයි බැලීමි. කුඩා මුදුව සමඟ ම රත්දමින් කුස පිරි මැදීමි. 'විශ්වගේ තිළිනය' මම සුරකිමි. මම දෝතින් කුස පිරිමැද සැණෙකින් දෝත නැහැයට තබා තද කළෙමි.

විශ්වගේ මව කාමරයට පැමිණියේ රාත්‍රී අඳුර ත් සමඟ ය. මම පහන් නොදල්වා ම කාමරයට වී සිටියෙමි.

'මොකද මේ දරුව කළුවරේ.'

මව විදුලි පහන් දල්වමින් කීවා ය.

'කළුවර නෑ.'

මම කීවෙමි.

'මොකද කෑම නොකා ඉන්නෙ?'

.....................

'මම කිව්වනේ ටික දවසකින් පිළිවෙළක් කරල දෙන්නම් කියල?'

.....................

'ඔය ළමයට මෙහෙ මොනවද අඩු? කන්න තියෙනවා. බොන්න තියෙනවා. නාන්න ... අඳින්න - පළඳින්න .... සල්ලි? ටික දවසක් ඔහොම හිටියම ඔය හිතේ අමාරු හොඳ වේවි. ඔය ළමයින්ගේ ගෙදරටත් උදව්වක් පදව්වක් කරගෙන ඊට පස්සෙ හොඳින් ඉන්න. මං



හොඳ තැනකින් මොකක් හරි පිළිවෙළකට කටයුත්තක් කරල දෙන්නම් ... එතකල්වත් ඉවසන්න බැරිද?

නොහැකි ය.

මගේ ඉවසීමේ සීමාව සීමාන්තිකයට පැමිණ ඇත.

තව දුරටත් මම ඇගේ දෙපා මුල් වැඳ වැටුණෙමි.

'අම්මේ... අනේ අම්මේ... විශ්ව මාව බැන්දා.... එද අපි එහෙ එකට හිටියා. මං එයා විශ්වාස කරනවා. මාව විනාශ කරන්න එපා. මාව නැති කරල දාන්න කුමන්ත්‍රණ කරන්න එපා. මට වහදීල මාව මරල දාන්න එපා... මට විශ්ව හැර මොකුත් එපා... මං විශ්ව හින්ද අම්ම කෙනෙක් වෙන්න යනවා...'

'මොකක් කිව්වා...?'

මට ඇයගේ දෙපා මුලින් නැගිට උරහිසට මුහුණ හොවා ආදරයෙන් හා දුකින් නැවතත් තෙපළීමි. විශ්ව බලාපොරොත්තු වූ උතුම් ම දේ ඔහුගේ මවට කීවෙමි.

'මං විශ්ව හින්ද අම්ම කෙනෙක් වෙන්න යනවා.'

ඇය මගේ ශරීරය ඇයට වාරු කොට යහනේ වාඩි ගත්තා ය. මගේ හිස ගෙන ඇගේ උරහිසට බර කොට ගත්තා ය. උණු ම උණු කඳුළු දෙපේළියක් ඇගේ උරහිස දිගේ ගලා ගියේ ය.

කිසිවෙකුට කියා ගන්නට තබා දරා ගන්නට ත් නොහැකි කායික හා මානසික පීඩාවන් රැසක් මැද දින කීපයක් ගෙවී ගියේ ය. සිහිනයකින් හදිසියේ අවදි වූවෙකු මෙන් මම විටෙක තෝන්තුවාවෙන් මෙන් සිටියෙමි.

තිවයේ සඳලුතලයට පිවිසි බොහෝ විට මම අවට නිරීක්ෂණය කළෙමි. සඳලුතල අතුළ මහා මාළිග හැර නෙත් මායිමට 'අපේ එකෙක් ගේ' යැයි සිතෙන නිවහනක් දිස් නොවේ. විසල් මාළිගවල උස් තාප්ප ජීවිත කොටු පවුරු මෙන් ඔවුහු වට ලා සිටිති. සුඛෝපභෝගී රථවාහන මේ නිවෙස්වලින් විටෙක හෙමිහිට එළියට ඇදෙයි. නැවත පැමිණෙන විට ඉබේට මෙන් විසල් ගේට්ටු පියන් ඔවුනට විවර වෙයි. මේ විසල් දොර පියන් පත් 'අපි වෙනුවෙන්' විවර වන්නේ කවද ද?

මට මේ හාම්පුතුන් පිළිබඳ තිබුණු වෛරය පහ වී ගොස් බොහෝ කල් ය. දැන් එන්න එන්න ම සිතේ නැගෙන්නේ ඔවුන්ගේ අදෘශ්‍යමාන වත් පිළිවෙත් පිළිබඳ ව්‍යාකූල සිතිවිලි ම ය.

මම සඳැල්ලෙන් එ පිට බලා සිටිද්දී ම වාගේ 'මේ ලොවින් මගේ ලොවට පැන යන්නේ කවද ද?' වැනි හැඟීමක් සිත් කුහරයේ ඉපැදිණි. 'පැනපන්.... පැනපන්.... බිමට පැනපන්...' යැයි දෙතුන් වතාවක් යටි සිත උඩු සිතට වධ දුන්නේ ය. 'කල්පනා නොකර.... තීරණය කරපන්.... පැනපන්...' යයි නැඟුණු ආවේගකාරී පීඩාව නිසා මගේ දෙපා වෙව්ළන්නට වි ය. මම මගේ කුසට අත තබා බැලීමි.

දෙවියන්ගේ නාමයෙන් මා ජීවත් විය යුතු නොවේ ද?

යන හැඟීම දෙතුන් විටක් නැගෙන් ම පුංචි සිඟිත්තෙකු පිළිබඳ අනන්ත මව්වත් හැඟීම් මසිතේ රුදුරු හැඟීම් මැදු කරන්නට වි ය. සප්තකින් ම විශ්ව මේ සියල්ල දනී නම්? ඔහු මා සිප ගනු ඇත. වැළඳ ගනු ඇත. මා මවක් වන බව ඔහු සිහිනෙන් වත් දනී ද? ඔහුගේ හෘද සාක්ෂිය ම හැර මේ දරුවා ඔහුගේ බව ලෝකයට හෙළි කරන්නට මට වෙනත් ඉඩක් තිබේ ද?

වෙන දාට වඩා දැන් අහස නිල් පාට ය. පොළොව වෙන දාට වඩා වියළි ය. අහස පොළොව අතර පරතරය අඩු ය. මම අහස ත් පොළොව ත් අතර සිර වෙතැ යි බියෙන් මෙන් සඳැල්ලේ වාඩි වීමි. දෙපා බිමට වැටෙන්නට මෙන් පහළට එලා පද්දමින් සිටියෙමි. දුල්ලැව පිටුපස සිට වින් ඔහුගේ දෑතින් මගේ දෑස වසා ගත්තේ ය.

සැණෙකින් මම බිමට වැටෙතැ යි බිය වීමි. පසුව 'ඩිග් ඩිග්' ගා ගැහෙන්නට වි ය. දෙදෙනා ම සඳැල්ලෙන් බිමට වැටෙතැ යි සිතූ මම තිගැස්මෙන් වීමි. දුල්ලැව හෙමිහිට මගේ උරහිසින් අල්ලා මා නැගිට්ටෙව්වේ ය.

'පුදුම සැහැල්ලුවකින්නේ නේත්‍රා ඉන්නේ? ඇත්තටම නේත්‍රා කොහොමද පුරුදු වුණේ ඔය තරම් සැහැල්ලුවෙන් ඉන්න. මෙච්චර වයසට ගිහිල්ලා අපිටත් හිත පාලනය කරගන්න බැරි කොට?'

'මම භාවනා කරලා - ඉවසනවා.'



'අම්ම කෙනෙක් වෙන්න ඉන්න කෙනෙකුට ඒක හොඳ දෙයක්. භාවනාව... ඉවසීම.... හිත පාලනය කරගැනීම.... තවත් දේ තියෙනවා.'

ඔහු උරහිසින් අල්ලා මා ළඟට ගෙන නිකටින් එසෙව්වේ ය.

'ඔව් ... තවත් දේ තියෙනවා. දරුවගේ තාත්තා ළඟට දරුවා ගෙනියන එක.... ඉවසල ඉවසල බැරිනම් වෛරය එකතු කරන එක. එකක්වත් හරියන්නේ නැතිනම් මරාගෙන මැරෙන එක...'

'ඔහොම හිතන එක බොහොම දරුණු වැඩි. ඒක හොඳ නෑ...'

'මොකක්ද හොඳ...?'

'අත්දැකීම් තියන වැඩිහිටියෝ කියන දේ අහන්න ඕන. අපි හැම දෙයක්ම කියන්නේ ඉදිරිය හොඳට හිතල බලල...'

'තමන්ට වාසි වෙන විදිහට...'

'නෑ.... නෑ.... තමුන්ට වාසි වෙන විදිහට...'

ඔහු මදෙසට ඇඟිල්ල දිගු කර කීවේ ය.

'උඹල ඔක්කෝටම මගේ ජීවිතය සෙල්ලමක්. එක එකාට ඕන තම තමන්ගේ ජඩගති මගේ පිටින් තියල පහකර ගන්න. බැරිනම් මං බිල්ලට දෙන්න.'

'අපි මේ තරම් සලකලත් ඇයි නේත්‍රා එහෙම හිතන්නේ?'

ඔහු නැවතත් මගේ නිකටින් එසෙව්වේ ය.

'මගේ ඇඟට අත තියන එක දැන්වත් නවත්වනවද?'

'ආදරේටනේ නේත්‍රා.'

ඔහු එසේ කියා උරහිස වටේට අත දමා ගෙන මා ආපසු හරවා ගත්තේ ය. තියුණු පුළිඟු දෑසින් එ දෙස බලා සිටියේ විශ්වගේ අම්මා ය. මම හිරි වැටී ගියෙමි. දුල්ලැව අත හෙමිහිට මගෙන් මුදා ගත්තේ ය.

දුල්ලැව සඳැල්ලෙන් එ පිට බලා සිටිද්දී - මව දොරකඩ හරස් කර සිටියා ය. මම අතරමැදි වීමි.

'නේත්‍රා.... පුතා මදිවට තාත්තත් වාහෙට ගන්නද හදන්නෙ...?'

For E Pusthakalaya

'මම නෙවෙයි....'

'එහෙනම් මමද?'

'මං වරදක් කළේ නෑ.... මම කම්මැලිකමටයි මේ පැත්තට ආවේ.'

'උඹට කම්මැලියි කියල.... මගේ මිනිහ ළඟට ගත්තම හරියනවද? ඉස්සර තැන් තැන්වල රවුම් ගැහුව.... ඔෆිස් එකේ රෑ ජාමේ මහුල් නැටුවා. බෝඩිං ගානේ රිංගුවා. මගේ කොල්ල පොලිසි ගානෙ ගියා. අන්තිමට කොල්ල රවට්ටල උගෙත් එක්ක බුදිය ගත්තා. දැන් බඩගෙඩියක් හදාගෙන. කවුද මේව ඉවසන්නේ? උඹ කිව්වට විශ්වගේ කියල කවුද දන්නේ මහ එකාගෙද කියල. නන්නාත්තාරේ යන කවුරු හරි චනවරයෙක්ගෙද කියල? මං කොහොමද උඹට කන්න බොන්න දීල මෙහෙ තියාගන්නෙ?'

'මං වැරැද්දක් කළේ නෑ.'

මම තියුණු ලෙස කීවෙමි. දැස් පියන් වසා ගෙන දැඩි කොට විලාපයක ස්වරයෙන් කීවෙමි.

'පව්ට බැල්ලි...'

විශ්වගේ මව මට පහර දුන්නා ය. පළමු පාර වැදුණේ කම්මුලට යි. හැරෙන්නටත් පෙර දෙවන වරට ද අනෙක් කම්මුලට පහර දුන්නා ය. මම කැරකී ගොස් ඇගේ දෙපා මුල ම වැටුණෙමි. ඇය පයින් ගැසුවා ය. පා පහර කුසට වදී යැයි බියෙන් මම දෑතින් ම කුස ආවරණය කොට ගතිමි.

ඊත් ඈ තෙවන වරට ද පහර දුන්නා ය. මගේ කෙස් වැටියෙන් අල්ලා මගේ හිස බිත්තියේ ඇන්නා ය. දුල්ලෑව ඉදිරිපත් වූයේ මම පරඬැලක් මෙන් අසරණ වී බිම වැටුණාටත් පසුව ය.

'නවත්වනව ඔය වැඩේ...'

ඔහු කීවේ ය.

'මං නෙමෙයි.... තමුසෙ නවත්වනව ඔය පාහර වැඩේ.... දැන්මත්.'

මව ඔහුට ද කඩා පැන්නා ය. මම ඉකි බින්දෙමි. ඇය මගේ අතින් අල්ලා මා නැඟිට්ටෙව්වා ය.



'දැන් හොඳට අහගනින්. උඹ ඔය ළමය නැති කරන්න ඕන. මං දොස්තර ගාවට ගෙනියන්නම්. උඹ මගේ පුතා සදාකාලික රෝගියෙක් කළා. උඹ ඔය දරුව නැති කරපං. උඹට බැරි නම් මං ඒක බලෙන් කරනවා. ඊට පස්සෙ උඹ කසාද බඳින්න ඕන. මං ලොරියේ ඩ්‍රයිවර් එක්ක කතා කළා. බැඳල නුවර පළයං. එහෙ ජීවත් වෙයං. මාතලේ පාරේ ඉඩමෙන් උඹලට අක්කර භාගයක් දෙනවා. හොඳට මතක තියාගනින්.... එහෙම නොවුණොත් වැඩේ වරදින බව හොඳට මතක් කරගනිං උඹට තේරුණා නේද....?'

'මට බෑ...'

මම හඬමින් කීවෙමි. එහෙත් මව ඉක්මනින් එ තැනින් ඉවත් වූවා ය. දුල්ලෑව මා සමීපයට ආවේ ය. ඔහු කිසිවක් එ තරම් ගණන් නොගත් සෙයකි. දෙවියනේ .... ගැහැණියකගේ සිත පිරිමින් තේරුම් ගන්නේ කවදා ද? කෙළි බඩුවක් තරම් සැහැල්ලු ලෙස ඔවුන් මා තළා පෙළා දමන හැටි!

දුල්ලෑවගේ මෘදු වෙස් මුහුණ පිටු පස බියකරු චරිතයක් ඇතැයි මම මේ වන විටත් තේරුම් ගෙන සිටියෙමි.

'නේත්‍රා බයවෙන්න එපා.'

ඔහු සැනසිලි වචන තෙපළී ය. මම ප්‍රතිචාර නොදැක්වීමි.

'ඔය විදිහට කරන එක හොඳයි. මගෙත් තීරණය ඒකම තමයි. ඔහොම ඉඳලා කොහොමද? අක්කර බාගෙට අමතරව මං තව සල්ලි ටිකකුත් දෙන්නම්. ඩ්‍රයිවර් කොලුව හොඳයි. උන් අපි කියන දේ අහනවා. නේත්‍රාට කරදරයක් වෙන්න ඉඩ තියන්නෙ නෑ. මං උණත් සුමානයකට සැරයක් එන්නම් සැපදුක් බලන්න...'

මම නැඟී සිටියෙමි. දුල්ලෑව දෙසට චියරු බැල්මක් හෙළීමි. මම තිවසේ කිසිවක අයිතියක් නැත්තියක මෙන් සිටි මම ආධිපත්‍යය සිතට ගුලිකොට ගතිමි. මගේ මුළු වැර ම යොද සිතට ශක්තිය එකතු කළෙමි. ධෛර්යය හීන වන්නට නොදී රැස් කළෙමි. ඉන්පසුව තීරණය කළෙමි.

'පොඩ්ඩක් ඔතනින් අයින් වෙන්න'

මගේ දැඩි වචනවලට කීකරු නොවී සිටීමට දුල්ලෑවට නොහැකි වී ය. දොර අවුරා සිටි ඔහු මට ඉඩ දී පැත්තට වී ය.

For E-Pusthakalaya

## 12

මම තරප්පුව හෙමි හෙමින් බැස විශ්වගේ කාමරය දෙසට පිය එසවීමි. අඟුමුලුවල සිටි සේවිකාවෝ මා දෙසට එබිකම් කළෝ ය. මම කිසිවෙකුත් ගණන් නොගත්තෙමි. මීට පෙර පූර්ව අවසරයක් ලැබෙන තෙක් මම විශ්වගේ කාමරයට ඇතුළු නොවීමි. එහෙත් මා විඳින සියලු දුක් වේදනා ඔහුට මිස කාට කියන්න ද? අනෙක මාගේ විවාහක ස්වාමියාගේ කාමරයට ඇතුළු වීමට අවසර ලැබෙන තෙක් සිටීම මා කළ වරදක් නොවේ ද? ඔහුට ආවතේව කළ යුත්තේ මා විසිනි. මම විශ්වගේ කාමරයට ඇතුළු වීමි. විශ්වගේ මව ඔහු අසළට වී සිටී. විශ්ව මවට ඇහුම්කන් දෙමින් ඇඳේ විට්ටමට හිස තබා තරමක් සෑප්පු ලෙස සිටී. මම එක එල්ලේ ම ඔහු දෙස බලා සිට මවට කතා කළෙමි.

'අම්මේ මට විශ්වත් එක්ක කතා කරන්න ඕන...'

'ඔය ළමය විශ්වත් එක්ක මොනව කතා කරන්නද?'

'කසාද ගෑණිට මිනිහත් එක්ක කතා කරන්න තිබෙන ඒවා නැන්දම්මට කියන සිරිතක් නැනේ?'

මම මගේ ආධිපත්‍යය ගෙන ඇයට දමා ගැසීමි.

'උඹට කවද ඉඳලද මේ ගෙදර ඔච්චර හයියක් ලැබුණෙ...?'

'විශ්ව මා කසාද බැන්දදා ඉඳල...'

'බොරු කසාද සහතිකයක් තියාගෙන. උඹ මේ කොල්ල රවට්ටන්ඩ එපා. දවසකට සැරයක්වත් මෙතෙන්ට ඇවිල්ල බලන්න දුන්න පව් කියල. අපේ මනුස්සකමට. රොඩී කුප්පායම්වල හැදිච්ච එවුන් වලව්වලට ගත්තම ඕක වෙනව. කුඩැල්ලෝ මෙට්ටෙ තියන්න බැහෙ.



නැතිනම් මේ අසනීපකාරයන්ට වද දෙයි ද මෙතෙන්ට ඇවිල්ලා.... නේත්‍රා... දෙයියන්ගෙ නාමෙට උඹ යන දීපංකරේක පළයං...'

මව විශ්වගේ හිස අත ගාමින් කිවා ය. මම ඇඳේ අනෙක් පැත්තෙන් විශ්ව අසළට ගියෙමි.

'විශ්ව ඔයාට මං කියන දේ තේරෙනවා. ඔයා කතා නොකළාට කමක් නෑ අහගෙන ඉන්න. ඔයාට ඇහෙනව. ඔයාට මං කියන දේ ඇහෙනවා. ඔයාට මතකයි නේද ඔයා මාව කසාද බැන්ද? අපි 'පැල්පත' අවන්හලේ හිටිය. ඔයා කිව්ව දරුවෙකුට ආසයි කියල. ඔයා මට 'කාගිල්ස්' එකෙන් ඇපල් අරන් දුන්න. මේ බලන්න. මේ බලන්න. ඔයා මට දුන්න මඟුල් මුද්ද. විශ්ව.... මං ඔයාගෙ නේත්‍රා....'

මවට කරකියා ගන්නට දෙයක් තිබුණේ නැත. ඇය කළබල බවක් නොපෙන්වා ම වටපිට බැලුවා ය. කරන්නේ කුමක් දැයි තීරණය කිරීමට ත් පෙර මම කතා කළෙමි.

'විශ්ව ඔයාට ඇහෙනව නේද? දැන් මාස දෙකකුත් ඉවරයි. ඔයාගේ පුංචි දරුවෙක් ඉන්නවා මගේ කුසේ. මට ඉඩ දෙන්න ඒ දරුව හදන්න. ඔයාගෙ අම්මා.... ඔයාගෙ දරුව මරන්න හදනවා.... විශ්ව ඔයාට ඇහෙනවද? ඔයාගේ අම්ම. ඔයාගෙ දරුව මරන්න හදනවා... ඔයා ඉඩදෙනවද ඔයාගේ දරුව මරන්න?'

මම ඔහුගේ උරහිසින් අල්ලා සෙළවූවෙමි. දෙතුන විටක් ම සෙළවූවෙමි.

'මං ඔයාගේ දිනපොත කියෙව්වා. ඔයා මට හුඟාක් ආදරය කරලා. ඒත් සැකෙන් ඉඳලා තියෙන්නෙ මාව නොලැබෙයි කියල. ඔයාට ඇහෙනවා නේද විශ්ව .... මං අම්ම කෙනෙක් වෙන්න හදනවා ... විශ්ව ඔයා තාත්තා කෙනෙක් වෙන්න හදනවා .... ඒත් ඔයාගේ අම්මා දරුවා මරන්න හදනවා...'

විශ්ව වරක් මා දෙස බැලුවේ ය. බලා ගෙන ම සිටියේ ය. තත්පර කිහිපයක් ම බලා සිටියේ ය. ඉන් පසුව සිහි කල්පනාව නැති ඉරියව්වෙන් ම වහ වහා මව දෙසට හැරුණේ ය. හැරී මව වැළඳ ගත්තේ ය. විශ්ව තමාගේ මව වැළඳ ගෙන හඬන්නට වී ය. මහා හයියෙන් හඬන්නට

වි ය. පිරිමියෙකු මහා හයියෙන් හඬනු බලා සිටිය නොහැකි ය. ඔහු තව තවත් මවට තුරුලු වෙමින් හැඬුවේ ය. මට මගේ කඳුළු ඉවසීමට පුළුවන. එහෙත් විශ්වගේ කඳුළු කෙසේ ඉවසන්න ද?

'නේත්‍රා .... දැන් පළයං කාමරෙන් එළියට.'

මව අණ දුන්නා ය. මම කාමරයෙන් පිටතට තීරණාත්මක පියවර කිපයක් තැබිමි.

එදා ඉර බැස ගියේ හෙමිහිට ය. රාත්‍රිය ඉක්මනින් අඳුර ගෙනාවේ ය. එළිය නැති වී අඳුර ඇති වන තෙක් කාලය ඉවසුම් නොදෙන්නකි. මාගේ සිතේ තිබුණේ ද ඉවසුම් නොදෙන නොසන්සුන් ගතියකි.

දැන් ඉතින් පරිස්සම් වෙයං. උඹම තමයි ගිනි ඇවිළුවේ. ගින්දර මැද්දෙ පිච්චෙන්නෙ නැතුව හිටපං. හිතට ධෛර්ය ගනිං.'

මගේ යටි සිතේ නැඟුණු ධෛර්යය මට තවත් ආරක්ෂකයෙකු වි ය. මම කාමරයේ අගුලු ලා තද කළෙමි.

එදා ඉර බැස ගිය මොහොතකින් සඳ නැඟිණි. තරු නිවිණි. මම නෙත් පහන් දල්වා සඳට එබුණෙමි. කාන්තිමත් අහසේ ගැඹුර දෙස බලා සිටියෙමි. අහසින් පතිත වන සඳරැස් කැදැලි මිදුලේ තැඹිලි ගස මතට පතිත වෙයි. මම බොහෝ වේලාවක් ඒ දෙස බලා සිට සිත තැන්පත් කළෙමි. සිත සන්සුන් කර ගතිමි.

එදා රාත්‍රී මම කිසිවක් ආහාරයට නොගත්තෙමි. කීප විටක් ම, කීප දෙනෙකු ම කාමරයේ දොරට තඩි බැව ද මම නිහඬව ම සිටියෙමි. මගේ චර්යාව වහා ම වෙනස් කළ යුතු බව මම තේරුම් ගතිමි. එහෙත් පළා නොයාමට ත් ඔවුන් ඉදිරියේ එකහ නොවීමට ත් මම දැඩි ලෙස ඉටා සිටියෙමි.

උදේ ම මම අවදි වී කුස්සියට ගොස් තනිව ම තේ එකක් සාදා ගතිමි. විශ්වට ත් තේ එකක් සකස් කළෙමි.

'නෝනා කාමරයට යන්න අපි තේ හදල ගෙනත් දෙන්නම්.'

ලීලා කීවා ය.



'මට කව්රුවත් විශ්වාස නෑ, ලීලා. වහ ටිකක් දීල මාව මරල දාන්නත් පුළුවන්. ඒ නිසා මං ටිකක් ප්‍රවේසම් වෙන්න ඕන. මේව ඔයගොල්ලන් මතක තියාගන්න. මේ ගෙදරදීම මට මොකුත් උණොත් ඒකට මේ ගෙදර අය වග කියන්න ඕන.'

එ විට ම මව කුස්සියට පැමිණියා ය.

'නේත්‍රා නටන නාඩගමක් නටාගන්නව කාමරේට ගිහිල්ලා. මේ වැඩකරන ළමයින්ගේ හිත් අවුල් කරන්නේ නැතුව. පුදුම කරදරයක්නෙ ඔය ළමය කරන්නෙ.... මොකද්ද ඔහොම කරන්න ඔය ළමයට තියෙන අයිතිය?'

'මගේ බඩේ ඉන්න ළමයාගේ අයිතිය... විශ්වගේ කසාද ගැණි වීමේ අයිතිය....'

මම එසේ කියා තේ දෙක ම රැගෙන කුස්සියෙන් ඉවත් වීමි. විශ්වගේ කාමරයට ගියෙමි. ඔහු හොඳටෝ ම නිදි ය. මම අපේ තේ දෙක ම ටීපෝව මත තබා ඔහුට කතා කළෙමි.

'විශ්ව.... මෙන්න ඔයාගේ තේ එක ගෙනාවා.... බොන්න.'

මම ඔහු නැඟිටුවා මගේ වමතට ඔහුගේ හිස බර කොට ගතිමි. මට පුදුම තරම් සැනසුමක් දැනේ. ඔහු විරුද්ධත්වයක් පෙන්නුවේ නැත.

'කට සෝදන්න.'

මම සිහිල් වතුර වීදුරුව විශ්වට දුන්නෙමි. ඔහු මට එකඟව කට සේදුවේ ය.

'බොන්න තේ එක...'

මම ඉක්මන් කළෙමි. මව කාමරයට එන්නට පෙර ඔහුට තේ එක දීමට මට ඕනෑ වි ය. විශ්ව කුඩා බිළිදෙකු මෙන් පුංචි පුංචි උගුර උගුර තේ එක බීවේ ය. පසුව කෝප්පය මගේ අත තැබුවේ ය. මම ඔහුගේ නළලත සිප ගතිමි.

සත්තකින් ම මට දැනෙන්නේ අප්‍රමාණ සැහැල්ලුවකි. මම ලෝකයක් ජය ගත්තාක් මෙන් සැනසුණෙමි. විශ්ව පුදුමයෙන් මෙන් මදෙස බලා සිටියේ ය.

'ඇයි විශ්ව පුදුමයෙන් වගේ?'

මම බොහෝ ආදරණීය බැල්මෙන් දෑසට එබුණෙමි. ඔහු බලා සිටියේ ය. මම කතා කළෙමි. ඔහු අසා සිටින්නට වි ය.

'ඊයේ හවස ඉක්මනින් ඉර බැහැල ගියා. මං හිතුව කළුවරයි කියල. ඒත් ඔයා දන්නවාද වෙනදට වැඩිය කලින් හඳ මෝදු වුණා. මං අපේ පැටියට කිව්වා ඉක්මනින් එන්න පූතේ අපේ ලෝකෙට කියල. නැත්නම් අම්මට තනිකම විඳගන්න බෑ කියල.... මොකද තාත්තා වෙන කාමරයකනෙ ඉන්නෙ...'

මම විශ්ව දෙසට හැරෙමින් හිස සොළවමින් තොදොල් ලෙස කීවෙමි. මගේ හිස පැද්දෙන විට නොදැනුවත්ව ම විශ්වගේ හිස ද දෙපැත්තට පැද්දෙන්නට වි ය. මම මහා බොළඳ දැරිවියක මෙන් ඔහු සමඟ තොදොල් වීමි.

ඒත්.... එදා ත් විශ්වගේ මව මට හරස් වූවා ය.

'මේ කාමරයේ ඉන්න බෑ. පූතා ලෙඩෙක් විත්තිය තේරෙන්නේ නැද්ද? අනික මේ කාමරයේ සේවකයෙන් ඉන්නවා නේද? ඒ පාර පිරිමි දෙන්නෙක් ඉන්න කාමරේ බුදිය ගන්නද හදන්නෙ? ඇත්තටම ඔය ළමයට විකාරද?'

'මට මේ ගෙදර හාම්පුතාලට වැටිය මේ අහිංසකයා විශ්වාසයි...'

මම සිරිදාස නමැති සේවකයා දෙස බලා ගෙන ම උත්තර දුනිමි. මේ ගෙදර සේවක සේවිකාවෝ මට ඇළුම් කරන බව මම දැන සිටියෙමි. එහෙත් තව දුරටත් කාමරයේ නොඉඳ මම ඉවත් වීමි. ප්‍රශ්නවලට පිළිතුරු මිස ප්‍රශ්නවලට ගැටුම් ඇති කර ගැනීම ආරවුලක මුල බව මම මේ වන විට ප්‍රත්‍යක්ෂ කොට ගෙන සිටියෙමි.

මම ගේ පිටුපසට ගොස් ඉදල ගෙන මිදුලට ගියෙමි. ලීලා මා ළඟට වික් මට පින්සෙණ්ඩු වූවා ය.

'අනේ නෝනා.... ඔය වැඩ කරන්න ගියොත් මට විඳුමක් වෙන්නෙ නෑ...'

එහෙත් මම මිදුල අතු ගාන්නට වීමි. ලීලා බලා සිටියා ය. මම හෙමිහිට ඇයට කතා කළෙමි. ඇය අසා සිටියා ය.



'මට මේව කරන්න නොදෙන්නේ ආදරයට නෙමෙයි. මම ඕවට හවුල් වුණාම මාත් මේ ගෙදර කෙනෙක් වගේ වෙනවා. ඒකට බයේ. මීට පස්සෙ මං කුස්සියට එනව උයන්න. ලීලා දැන් යන්න. උයන්න ලෑස්ති කරන්න. අද විශ්ව මහත්තයට බත් දෙන්නෙත් මම....'

මම නොයෙක් රටා මැවෙන්නට මිදුල අතු ගෑවෙමි. ජීවිතය ම රටාවක් නොවේ ද? ඉස්සර මා කටුගස්තොට පුංචි ගෙදර මිදුල අතු ගාන සැටි මට සිහි වේ. එ විට කොහේ දෝ සිට පැමිණෙන අපේ පූස් පැටියා ඉදලේ එල්ලෙයි. ටික වේලාවක් යන තෙක් මට මිදුල අතු ගාන්නට ලැබෙන්නේ නැත. පූස් පැටියා සමඟ අනිවාර්යයෙන් සෙල්ලම් කරන්නට මට සිදු වේ. ඊටත් කුඩා කාලයේ දී මම අප පදිංචිව සිටි කුඩා පේමන්ට් එක අතු ගෑ සැටි මට සිහි වේ. දෛවයක හැටි... දැන් මන්දිරයක ගෙමිදුල අතු ගාන මට මා ගැන ම සිනහවක් පහළ වේ.

බොහෝ දුක් දැනෙන විට සිතට දුක හුරු වේ. මා එය උරුම කොට ගත යුතු නැතැ යි මම සිතීමි. බෝ සතුටින් දවසරින සඳ එය ද අනියත යැයි සිතීමි. මට මගේ ජීවිතය තීරණය කිරීමට දෙන ඉඩකඩ ඇහිරී ගිය විට මම පීඩාව ශක්තියක් කොට ගතිමි. මම දැඩි වීමි. අයෝමය ගැහැණියක ලෙස හැසිරීමි. මට එරෙහි වන බව දැනෙන කාට වුව ද මම 'පීඩාව' මිට මොළවා එයින් දමා ගැසීමි.

එහෙත්, මසිත ඉල්ලා කැගැසුවේ වෛරක්කාර ජීවිතයක් නම් නොවේ. ආදරය පිළිබඳ කුඩුමහත් බලාපොරොත්තු හැම මොහොතක ම පපුවට වේදනාකාරී ලෙස බල පෑම් කළේ ය. මම විශ්ව වෙතින් නිරාමිස සුවයක් සොයන්නට පෙළඹීමි. ඔහු අසළ දැවටෙමින් උවටැන් කරමින් සුසුම් පොද විඳ ගන්නට මා පෙරුම් පිරූ තරම්.

ඔහුගේ මුවට උඩින් සිහින් ලෙස පාත් වී ආදරය මේ යැයි කියමින් ඔහු සිප සැනසෙන්නට මා සිතූ සිතුම් වියැකී ගිය තරම්...

මම මේ අතීරණ අතර පාවෙමින් සිටියෙමි.. මා අතින් අත මාරු වන තත්ත්වයකට පත් කිරීමට දුල්ලැව දෙමහල්ලෝ සැලසුම් කරති.

සැඩ ගංවතුර කෙ තරම් රළු වුව ත් මම උඩුගං බලා පිහිනීමට වෙර දරමි. දිරිය සොයමි.

මම විශ්වගේ කාමරයට අහම්බෙන් මෙන් පිවිසීමි. මගේ ගමන් වේගය මම දොරකඩ දී පාලනය කොට ගතිමි. වැටුණු වැටුණු කඳුළු

එක් නොකොට ගිල ගතිමි. සන්සුන් ඉරියව්වෙන් ඔහුගේ යහන අද්දර වාඩි වීමි. තරමක් සුදුමැලි වී ගිය ඔහුගේ මුහුණ ඇඟිලි තුඩින් පිරි මැදීමි.

'විශ්ව...'

ඔහුගේ දෙසවනට සිහින් ලෙස කොඳුරා කතා කළෙමි. ඔහුගේ සුරත ගෙන මගේ කුසට තබා තද කොට ගතිමි. අප ජීවත් විය යුතු නොවේ ද? මේ කුස ඔත් දරුවා පිළිබඳ සත්‍යය දන්නේ විශ්ව ත් මා ත් පමණක් නොවේ ද? මම විශ්වගේ අත තව තවත් මගේ කුසට තද කළෙමි.

'දැනෙනවාද?'

විශ්ව දෑස හැර සිවිලිම දෙස බැලුවේ ය. ඔහුගේ දෑසේ මඳ රතක් තිබිණ. මම විශ්වගේ අත්ල ගෙන ආදරයෙන් උණුසුමින් එය පිරි මැදීමි. එහෙත් අත්ල රත් පැහැ ගැන්වුයේ නැත.

'ඔයාට පුංචිම පුංචි මතකයක්වත් නැද්ද විශ්ව.... මේ අපි දෙන්නාගේ දරුවා...?'

මම විශ්වට යමක් තහවුරු කිරීමට වෙහෙස ගතිමි.

මට පසුවේ තිගැස්ම ඔහුට දැනුණා දැයි මා දන්නේ නැත. මම සන්සුන් ලෙස විශ්වගේ යහනේ ම සැතපුණෙමි. බලහත්කාරයෙන් ඔහුගේ අත ගෙන මගේ ගෙල වටා ඔතා ගතිමි. මගේ මුහුණ ඔහුගේ ගෙල ත් පපුව ත් අතර සඟවා ගතිමි. මගේ ස්පර්ශය ඔහුට දැනෙන්නට ඔහු සමීපයේ උණුසුම් වීමි. ඉඟියකින් වදනකින් සිහින් ගතින් ඔහුට ආදරය කරන බව කීවෙමි.

අප දෙදෙනා ම එක්වර ම තිගැස්සුණේ මවගේ පැමිණීමෙනි. ඇය දොරකඩ අඩුරා පෙනී සිටියා ය.

'මොන වනචරකමක්ද තේත්‍රා උඹට තියෙන්නෙ? මේ අසනීපකාරයටවත් ඉන්න නොදෙන්නේ. උඹට හැදිච්චකමක් කියල එකක් ඇත්තෙම නැද්ද?'

'කසාද බැන්ද ගෑණු මිනිස්සු ඉන්න කාමරවලට එබෙන එකනෙ වනචරකම.'

'යකෝ මං විශ්වගේ අම්ම'



'අම්ම හරි නැන්දම්ම හරි හැදිච්චකමක් තියෙනව නම් ගෑණු පිරිමි බුදියගන්නව බලන්න එන්නෙ නැතේ?'

මම දිගට ම ප්‍රහාරය එල්ල කළෙමි. ඒ සමඟ ම නැඟිට කෙළින් ව යහනේ වාඩි වීමි.

'තේත්‍රා උඹ ඔය උරුම කරගන්ඩ දඟලන්නේ උඹේ කරුමෙ වෙන්නත් පුළුවන්.'

'මගේ බඩේ ඉන්නෙ මේ අම්මගේ පුතාගේ දරුවා තේද කියල හිතන්නවත් මනුස්සකමක් නැද්ද?

මම තරමක් ලිහිල් ලෙස විමසීමි.

'කවුද දන්නේ පුතාගෙද නැත්තං තාත්තගෙද කියල?'

ඇය දිවේ කටේ නොගෑවී කීවා ය.

මම තිගැස්සී ගියෙමි. විකල් වීමි. මගේ හිස බමන්නට වි ය. මම විශ්වගේ උරහිසින් අල්ලා ප්‍රශ්න කළෙමි.

'කියපං, කියපං.... උඹේ අම්ම ඉස්සරහ කියපං... මේ දරුව උඹේ කියල.... මට තනියම මේ ඔක්කොම විඳින්න බෑ.... උත්තර දීපං මං වනචරකමේ ගිහිං හදාගත්ත දරුවෙක් නෙමෙයි කියලා...'

මම නැවත නැවත දහ පහළොස් වතාවක් ඔහුගේ දෙවුරෙන් අල්ලා සෙළවීමි. පරඬැලක් මෙන් ඔහුගේ හිස එහෙ මෙහ සෙළවිණ. මොහොතකින් විශ්වගේ කටින් නහයෙන් ගොඩ ගොඩ ගා ලේ ගලන්නට වි ය. දෑස් අඩවන් කොට ඔහු යහන මත ඇද වැටුණේ ය.

විශ්වගේ මව ප්‍රකෝප වූවා ය. මොහොතක් සිට ඇසිල්ලේ ම සිටි මම ඇඳ විට්ටමේ තිබූ තුවාය ගෙන විශ්වගේ ලේ ගලන නාසයට තබා තද කළෙමි.

'තෝ ඒ පාර මේ කොල්ලගේ හුස්ම හිරකරල මරන්නද හදන්නේ.?'

ගෝරනාඩුවක් සමඟ ම මව මා පසෙකට තල්ලු කළා ය. මට තිහඬව හැඬීමට නොහැකි ය. සේවක සේවිකාවෝ කාමරයට එබී එබී කොකම් පාන්නට වූ හ. මම ඉන්ද්‍රඛීලයක් වීමට සිතුවෙමි. එහෙත් මගේ දෙපා වාරු නැති වි ය. මා ගත වෙව්ලන්නට වි ය. මගේ සකල අධ්‍යාත්මය ම පීඩාවකට හසුව ඉරී තළන්නට වි ය.

'කවුරුහරි ගිහිල්ලා කාරෙකට එන්න කියන්න.'

මම තතනමින් සේවකයන්ට ආයාචනාත්මක අණ කිරීමක් කළෙමි. කඩි ගුල විසුරුණා හ. මම යහනත සමීපයට වීමි. විශ්ව මගේ සුරතින් අල්ලා ගත්තේ ය.

මම ඔහුගේ නාසයෙන් හා කටින් උතුරන්නා වූ ලේ බිඳ මගේ ඔඩොක්කුවට වැටෙන්නට ඉඩ දුනිමි. 'අනේ මේ මාගේ මුහුණ සිප ගත් මුව ම නොවේ දැයි' මගේ යටි සිත කළ සිහි ගැන්වීම ම මගේ නෙතට කඳුළක් ගෙනාවේ ය.

මව දිව ගොස් අයිස් කැටයක් ගෙනාවා ය. ඇය උත්සාහ කළේ එය ඔහුගේ මුහුණේ තවරා ඉන් ලේ ගැලීම නවතා ලීමට යි. විශ්වට ආදරය ත් මට අනාදරය ත් එක එල්ලේ ම ප්‍රකාශ කළ ඕ කඩිනම් වූවා ය.

'අපේ පවුල විනාශ කරන්ඩ ආපු පිල්ලියක්. මෙහෙට පොඩ්ඩක් හැරෙන්න පුතේ.'

යැයි කියා ගෙන ම ඇය විශ්වට සාත්තු කරන්නට වූවා ය.

වාහනයක් ඇවිත් මිදුලේ නැවතිණ.

විශ්ව ඔසවා ගෙන ගොස් කාරයට දැමීමට සේවක සේවිකාවෝ යුහුසුළු වූ හ.

'වැරහැල්ල වගේ එන්නේ නැතුව උඹ ගෙදර හිටපං.'

මා ද විශ්ව සමඟ යන්නට සූදානම් වන බව දුටු මව මට නියෝග කළා ය.

ඈ වාහනයේ පිටු පස අසුනට නැඟී දොර වසා ගත්තා ය. මම කාරයේ අනික් පැත්තෙන් ගොස් දොර හැර ගෙන බලෙන් ම කාරයට ගොඩ වුණෙමි.

'බැහැපං බිමට'

මව රකුසු හඬින් කෑ ගැසුවා ය. මම විශ්වගේ හිස සෙමින් ඔසවා මගේ උකුළ මත තබා ගතිමි.

'ඩ්‍රයිවර්..... ඉක්මනට යමු..... ඩොක්ටර් තිලක් ජයසෝම ළඟට.'



ඔවුන් මට වසත් කළ දේ මා දන්නා බව හෙළිදරව් වීම ම මවගේ මුව ගොළු කිරීමට සමත් වී ය. විශ්වට බෙහෙත් කරන්නේ වෛද්‍ය තිලක් ජයසෝම බව මම ලීලාගෙන් හෙළි කොට ගෙන සිටියෙමි. රාජගිරිය උද්‍යානයෙන් දකුණු පැත්තට හරවා කාරය නාවල දෙසට පැදවිණ.

'ඉක්මන් කරන්න...'

විශ්වගේ සිරුර සීතල වී යන බව හැඟුණෙත් මම බිය වීමි. නිකට ත් දෙතොල ත් අතර තිබුණු ලේ බිඳු ඇඟිලි තුඩින් පිරි මැද ඉවත් කළෙමි. විශ්වගේ අහිංසක අකලංක දෑස මදෙසට යොමු වී තිබිණ. කාරය නාරාහේන්පිට පැත්තට හැරී විණ. මම මගේ පපු කුහරයේ ගැඹුරුතම සීමාවෙන් නැඟෙන ආදරය විශ්වගේ දෙනෙත මත තැවරීමි.

'රත්තරං බය වෙන්න එපා.. මම ඔයත් එක්ක ඉන්නවා.'

'මේ වරද වුණේ මගේ අතින්. මට සමාවෙන්න. මං ඔයත් එක්ක ඉන්නවා රත්තරං'

'පිස්සු දොඩවන්නේ නැතිව බැහැපං.'

මව නැවතත් කෑගැසුවා ය.

වාහනය රෝහල ළඟ නැවතී ඇති බව මට වැටහුණේ පසුව යි. විශ්ව ම දෙස බලා ගත් වන ම ඇසිපිය නොහෙළා බලා සිටී. ඔහුගෙ සීතල වී යන සිරුර අත හරින්නට මට සිත් නොදේ.

'ඉක්මන් කරන්න. විශ්වගේ ඇඟ සීතල වෙලා වගේ.'

මම කීවෙමි. එසේ කියා ඔහුගේ නළලතට මුහුණ ඔබා සිටියෙමි.

විශ්වගේ මව විගසින් කාරයෙන් බැස මා එළියට ඇද දැමුවා ය. මම රෝහලේ කොරිඩෝරය දිගේ දිව ගොස් 'විමසීම්' ස්ථානයේ නතර වීමි.

'ඩොක්ටර් තිලක් ජයසෝම මුණ ගැහෙන්න. එයාගේ ලෙඩෙක් ගෙනාව. හොඳටම අමාරුයි. මිස්ට දුල්ලෑවගේ පුතා...'

මම කියා ගෙන ගියෙමි. පිළිගැනීමේ නිලධාරිනිය රිසිවරය ගෙන අංක කිහිපයක් කරකවා යමක් කතා කොට මෙසේ කීවා ය.

'16 කාමරයට ගෙනියන්න.'

For E-Pusthakalaya

මා ආපසු හැරෙන්නට පෙර විශ්වගේ මව 'විමසීම්' අංශයට පැමිණියා ය. මම හෙද සේවිකාව ද සමඟ රෝද පුටුව පිටු පස වැටුණෙමි. කඩිනමින් අපි විශ්ව ත් රැගෙන 16 කාමරයට ඇතුළු වීමු. වෛද්‍යවරයා විශ්වගේ ශරීරයට වෙද නළාව තබා විමසා පරීක්‍ෂා කොට ඔහුව වාට්ටුවට යැවීමට සූදානම් වි ය. මා ඔහුගේ අවධානයට යොමු වූයේ ඉන් පසුව ය.

'මෙයා විශ්වගේ කවුද? මිස්ට දුල්ලෑව කෝ අද?'

'ඩොක්ටර් මම විශ්ව බැඳල ඉන්නේ.'

'හා හොඳයි. ඔහොම ඉන්න.'

දහදිය පෙරා ගෙන මව 16 කාමරයට පැමිණියේ මේ මොහොතේ ය.

'ඩොක්ටර් මගේ පුතා...'

'ආ.... මිසිස් දුල්ලෑව.... පුතා වෝඩ් එකේ ඇඩ්මිට් කරන්න වෙයි.'

වෛද්‍යවරයා තමන්ගේ රාජකාරිවල නියුතු වෙමින් ක්‍රියාශීලී වි ය. මම බිත්තියට වාරු වී සිටියෙමි. වෙනත් කාර්යයක් මා වෙත පැවරී තිබුණේ නැත.

'දැන් පළයං ගෙදර. උඹ දොස්තර නෙමෙයිනේ.'

විශ්වගේ මව කීවා ය.

'මං විශ්ව බලලාම යන්නම්.'

'විශ්ව බලාගන්න අපි ඉන්නවා...'

'මටත් අයිතියක් තියෙනවා...'

'අපෙ නම්බුව කන්නෙ නැතුව පළයං, නේත්‍රා...'

'අම්මා යන්න. මම එන්නම්.'

මේ අතරතුර නැවතත් වෛද්‍යවරයා පැමිණියේ ය.

'මට මේ ළමයත් එක්ක ටිකක් කතා කරන්න අවශ්‍යයි. මිසිස් දුල්ලෑව ටිකක් එළියෙන් ඉන්න.'



මව කාමරයෙන් පිටිවහල් කෙරිණි. මා තුළ ඇති වූ සහනය වචනයෙන් විස්තර කළ නොහැකි ය.

'ලෙඩා හොඳ කරන්න නම් මට බොහෝම පෞද්ගලික දේ කියන්න වෙයි. මොකක්ද නම කිව්වෙ?'

'නේත්‍රා..'

'මට කීප විටක්ම නේත්‍රා එක්ක මේ ගැන කතා කරන්න ඕන උණා. ඒත් වැඩිහිටියොත් කැමති නෑ.... ඇයි ඒ?'

මම නිහඬව සිටියෙමි. වෛද්‍යවරයා විමසිලිමත් ලෙස මගේ පිළිතුර බලාපොරොත්තු වි ය.

'ඒ ඇයි කියල මං දන්නෙ නෑ ඩොක්ටර්.'

'විශ්වට දැන් තියන අසනීපය මොකද්ද කියල දන්නවාද?'

'නෑ ඩොක්ටර්.'

'විශ්ව ගැන බලාපොරොත්තු අතෑරලා නේත්‍රාට ජීවිතේ ගැන හිතන්න පුළුවන්ද?'

ඒ වචනවලින් මම එකවර තිගැස්සී ගියෙමි.

'මං එයාට ආදරෙයි.'

මා අගාධයකට වැටෙන්නට යන්නාක් මෙන් බියක් දැනෙන්නට වි ය. මම මොහොතක් මගේ ඇස් වෛද්‍යවරයා වෙත කේන්ද්‍ර ගත කොට ගතිමි. අවට බමන්නට වි ය. හාත්පස නිලංකාර වි ය. රුදුරු සිතුවිලි සිතට නැගිණ.

'මං ප්‍රශ්න කරන්නේ ඔයාව පීඩාවට පත් කරන්න නෙමෙයි.'

වෛද්‍යවරයා කී ය.

'මං හැමදේම කරන්නේත්, කළේත් රෝගියා ගැන හිතලා. මට විශ්වගේ කායික අපහසුතාවලට බෙහෙත් කරන්න පුළුවන්. ඒත් හිත හදාගන්න මහන්සි වෙන්න වෙයි. නේත්‍රාට තේරෙනවාද?'

'ඔව් ඩොක්ටර්.....'

මම සිහි ලද්දෙමි. විශ්ව සුවපත් කර ගැනිමට උදව් වීමට ලැබේ නම් මනුෂ්‍යගේ කයට වෙදකමක්, හිතට හෙදකමක් කරන්නට හැකි නම්..... යන බලාපොරොත්තුව මා සිතට දිරිය ගෙනෙන්නක් වි ය.

'නේත්‍රාට උත්තර දෙන්න මොකුත් අපහසුතාවක් එහෙම තියෙනවාද?'

'නෑ නෑ.... කිසි අපහසුතාවයක් නෑ.'

'නේත්‍රාට පුළුවන්ද විශ්ව මුලින්ම දැක්ක දවස මතක් කරන්න.'

'මම රස්සාවට ආව දවස්වල විශ්ව හිටියේ ලන්ඩන්වල. මම කොම්පැනියේ මාස තුනක් විතර රස්සාව කළා. විශ්ව ලංකාවට ඇවිල්ලා දවස් දෙකකින් උදේ වරුවක කොම්පැනියට ආව....'

'ඉතිං?'

'විශේෂත්වයක් නෑ....'

'විශේෂත්වයක් නැත්නම් ඔය තරම්ම මතක?'

'කාගෙත් අවධානය එයා දිහාට යොමුවෙලා තිබුණා. ආකර්ෂණය කරගන්න පුළුවන් පෙනුමක් එයාට තිබුණ හින්දා.'

'ආදරේ හිතෙන තරම්ම....?'

'මං දන්නේ නෑ.'

'නේත්‍රා කොහොමද කියන්නේ විශ්ව කාගෙත් සිත් ඇදගත්ත කියලා....?'

'මගෙත් එක්ක හිටිය ඔෆිස් එකේ කෙල්ලෝ කතා වුණා.... විශ්ව හරිම හොඳයි..... කඩවසම්.... ලස්සන කෙනෙක් කියලා.'

'නේත්‍රාත් විශ්ව දකින්න බලාපොරොත්තුවෙන් හිටියද?'

'කාටවත් නොකිව්වට මාත් එයා දිහා බලලා තියෙනවා.'

'ඉස්සෙල්ලා දැක්ක වෙලාවෙ මොකද හිතුණෙ?'

'මං එයා දිහා බලද්දි එයා මගේ දිහා බලාගෙනම හිටියා. ගැඹුරු විදිහට. එතකොටයි මං දැනගත්ත මටත් ඉස්සර එයා හුඟාක් වෙලා මගේ දිහා බලා ඉඳලා කියලා.'

'එතකොට නේත්‍රාට ආදරේ හිතුණද?'



'නෑ.'

'බය වුණාද?'

'නෑ...'

'තිගැස්සුණාද?'

'නෑ.... ඩොක්ටර්. එයා මට ආදරේ කරයි කියල බයවුණා. විශ්ව මගේ දිහා බලාගෙන ඉන්නවා එයාගේ තාත්තා මිස්ටර් දුල්ලෑව දකිවි කියලා බයවුණා. විශ්ව මගේ දිහා බලා හිටියේ ගිලින්න වගේ.'

'මිස්ටර් දුල්ලෑව ඔයාව රස්සාවෙන් අයින් කරයි කියලද බයවුණේ?'

'නෑ... විශ්වගේ තාත්තා හැසිරුණේ තරුණයෙක් වගේ. මං ඔෆිස් එන්න පරක්කු වුණොත් කාව හරි බෝඩිමට එවනවා. මාව ටිකක් රෑ වෙනකල් ඔෆිස් එකේ තියා ගන්නවා. නිවාඩු දවසට වුණත් මං කරන කියන දේ එයාට හරියටම කියන්න ඕන. ටික දවසකින් මාව එයාගේ කාමරයට අර ගත්තා. පෞද්ගලික ලේකම් කියලා හැමෝටම කිව්වා.'

මම මගේ ජීවිතයට විශ්වගේ පියා පිවිසුණ ආකාරය හෙළි කළෙමි.

'මොන වගේ බලපෑම්ද මිස්ටර් දුල්ලෑව කළේ?'

'බලපෑමක් කළේ නෑ. මට ඔෆිස් එකේ යාළුවෝ ආශ්‍රය කරන්න දුන්නෙ නෑ. පහළ තට්ටුවට බහින්නවත් අවසර නෑ. අනවශ්‍ය විදිහට මගේ පඩි වැඩි කළා. මාව ආරක්ෂා කරන්න හැදුවා.'

'නේත්‍රාට මිස්ටර් දුල්ලෑව ආදරේ කළා?'

'මං හිතන්නේ එහෙම කියලා.'

'නේත්‍රා ඉඩ දුන්නද?'

'එහෙම නොවී බැරිවුණා.'

'හැමදේටම ඉඩ දුන්නා? බොහෝම දුරදිග ගිය සම්බන්ධයක්.'

'මටූ නරක විදිහේ යෝජනා කළේ නෑ. ගොඩක් වෙලාවට කළේ මගේ දිහා බලා ඉන්න එක. සමහර දවස්වලට මාව ස්පර්ශ කළා. මගේ ඔළුව අත ගෑවා. සමහර දවස්වලට මගේ මූණ ඉඹලත් තියෙනවා.'

For E Pustakalaya

'ඇයි නේත්‍රා ඉඩ දුන්නෙ?'

'මට විශේෂ කරදරයක් නොතිබුණ නිසා. රස්සාව නිසා.'

'විශ්ව ආවම තත්වෙ වෙනස් වුණාද?'

'එයා ටිකක් වෙනස් කෙනෙක්. එයා සමහර විට බලෙන්ම වගේ මගේ නහය මිරිකලා, රවලා යනවා. පඩි පෙළ නගිද්දී හම්බ වුණොත් අත් දෙකින්ම මගේ ගමන නවත්වනවා. දවසක් මගේ උරහිස් දෙකෙන් අල්ලගෙන මිරිකගෙන හිටිය. 'ආඩම්බර කෙල්ල..... මං කවදාහරි උඹව කසාද බඳිනවා කියලා කිව්වා...'

'ඊට පස්සේ නේත්‍රා විශ්වට ආදරේ කළා...?'

'මට එයා ගැන කිසිම විශ්වාසයක් තිබුණේ නෑ.'

'නේත්‍රා ආදරේ කළේ එයාගෙ කඩවසම් සිරුරටද? සල්ලිවලටද..... බුද්ධියට ද?....'

'නෑ...'

'එහෙනම්?'

'ඇස්වලට. ඒ ඇස් වෙලාවකට නපුරුයි. වෙලාවකට අහිංසකයි. ඒ ඇස් කතා කරන ඇස්. මට දුක හිතුණ මං දිහා බලන විදිහට අනිත් අය දිහාත් බලයි කියලා.'

'දැන් ඒ ඇස් වෙනස් වෙලාද?'

'ඔව් ඩොක්ටර්...'

'කොහොමද?'

'දැන් විශ්වගේ ඇස්වල ඉස්සර තිබුණ දීප්තිය නෑ. මලානිකයි. සුදුමැලි වෙලා. කලකිරිලා... දැන් ඒ කතා කරන ඇස්.... ගොළු වෙලා.'

මා මේ සියල්ල හෙළි කරනු යි වෛද්‍යවරයා ද නොසිතන්නට ඇත. ඔහු වඩ වඩාත් උනන්දු වූ සෙයකි. ගිලෙන විට තුත්තිරි ගසකින් හෝ පිහිට සෙවිය යුතු සීමාවකට මා සිර වී සිටි හෙයින්... විශ්ව සුවපත් කිරීමට වෙර දරන ජීවකයාට මා සියල්ල හෙළි කිරීමේ වරදක් ඇතැයි මම නොසිතිමි.



'හොඳයි.... මෙච්චර ප්‍රශ්න තිබිලත් නේත්‍රා හුඟක් දුර ගියානේ. විශ්ව කසාදත් බැන්දා. දැන් ඒ ගෙදර පදිංචිකාරිය් වෙලා.... විශ්ව සනීප කර ගන්නකල් නේත්‍රාට ඒ වෙනුවෙන් කැප වෙන්න පුළුවන්ද?'

'පුළුවන් ඩොක්ටර්.... මගේ කුසේ ඉන්න දරුව වෙනුවෙන්..... විශ්වගේ ජීවිතය වෙනුවෙන් මට ඕන දේකට මුහුණ දෙන්න පුළුවන්...'

වෛද්‍යවරයා මගේ හිසේ සිට පාදාන්තය දක්වා නිරීක්ෂණය කළේ ය.

'ඒත් විශ්ව හොඳ කරගන්න එක ලේසි නෑ.'

වෛද්‍යවරයා බැරෑරුම් මුහුණක් ආරෝපණය කොට ගත්තේ ය.

පසුව මා නොදන්නා බොහෝ දේ ඔහු හෙළි කළේ ය.

'මං කියන දේ බුද්ධිමත්ව තේරුම් ගන්න. ඇක්සිඩන්ට් එකක් වුණාම විශේෂයෙන් ඔය වගේ හදිසි අනතුරකදී මොළේට තුවාල වුණාම විවිධ දේ සිද්ධ වෙනවා. මොළේ තියන සමහර සියුම් පටක විනාශ වුණාම සමහරුන්ට අතීතය සම්පූර්ණයෙන්ම අමතක වෙනවා. සමහර අයට ටික කලක දේවල් අමතක වෙනවා. හරියට මකන කෑල්ලකින් මකල ඉවත් කළා වගේ. කැසට් පටියක් මකල දැම්ම වගේ. විශ්වට ඇක්සිඩන්ට් එකට ඉස්සර සතියට විතර දේ අමතක වෙලා තියෙන්නේ. ඒ මතකය ආපහු ගන්න එක ඉතාම අමාරු දෙයක්.'

...... ඒකෙන් අදහස් කරන්නෑ සතියකට පෙර දේවල් ඔක්කොම එයාට සම්පූර්ණයෙන් මතකයි කියල. තැන් තැන්වල හිස් ඇති. සමහර වෙලාවට දිගටම පුංචි එකෙක් වාගේ හැසිරෙයි.'

මම නැවතත් අහසින් පොළොවට පතිත වීමි.

'ඒ කියන්නෙ එයාට මාව බැන්ද කියලවත් මතක නෑ.'

'බැන්ද කියල විතරක් නෙමෙයි. ඇක්සිඩන්ට් එකට ඉස්සර සතියක් විතර කාලෙක වෙච්ච කිසි දෙයක් එයා දන්නෙ නෑ. ඔය දෙන්නා බැන්ද කියල, එකට හිටිය කියලා, කුසේ ඉන්න දරුවා එයාගේ කියලා.... මේ කිසි දෙයක් ගැන විශ්වට මතකයක් නැහැ.'

'ඩොක්ටර්....'

මට හැඬුම් එන්නට ආසන්න ය.

'මේවා ඔක්කොම දරාගන්න වෙනවා. ඒ විතරක් නෙවෙයි. හරිම පරිස්සමින් ඒවාට උත්තර හොයන්න වෙනවා. මට හිතෙන්නෙ මෙහෙම, විශ්ව දැන් හිතන්නෙ.... නේත්‍රා ගෙදර ඉන්නෙ තාත්තාගේ අහියම් බිරිඳ විදිහට කියලා. දරුවා ගැන කිව්වාම එයා හිතන්නෙ දරුවාගේ තාත්තා එයාගේ තාත්තා කියලා. ඔය තත්වය වෙනස් කරන්න අමාරුයි. හැබැයි නේත්‍රා පරිස්සමින් ජීවත් වුණොත් විශ්වගේ හිත ටිකටික වෙනස් කරන්න පුළුවන්.'

'එයා කතා කරන්නෙ නෑ...'

'ඒ තිගැස්මට. ටික දවසකින් හරියයි. ඒත් සදාකාලිකවම නිහඬ රෝගි කෙනෙක් වගේ ඉඳීවි. හරියටම එයාගේ හිතට වෙදකමක් නොකළොත්...'

'මම උත්සාහ කරන්නම්.'

'පරිස්සම්ං .... මොකද එයාට සමීප වෙද්දී එයා ඔයාට වෛර කරන්නත් පුළුවන්. දරුවා කුසේ ඉන්න බව දැනෙද්දී එයා තාත්තාව අවිශ්වාස කළොත් මහා විනාශයක් කරන්නත් පුළුවන්. නැත්නම් ඔය මානසික පීඩාව පුපුරලා වෙනත් මානසික ආබාධයක් හැදෙන්නත් පුළුවන්. ඔය සේරම බොහෝම පරිස්සමින් තෝරගෙන බේරගෙන වැඩ කරන්න වෙයි. නේත්‍රාට පුළුවන්ද ඔය ඔක්කෝටම මුණ දෙන්න.'

'පුළුවන් ඩොක්ටර්.... මට පුළුවන්...'

මම නැඟී සිට වෛද්‍යවරයා වෙතින් සමු ගැනීමට සූදානම් වීමි. හෙඳියක් පැමිණ වෛද්‍යවරයා ඇමතුවා ය.

'ඩොක්ටර්..... මිස්ට දුල්ලැව ඇවිල්ල ඩොක්ටර් මුණ ගැහෙන්න.'

වෛද්‍යවරයා ද අතිරණයෙන් යුතුව මදෙස බැලී ය. 'ඕනම දේකට සූදානම්' වැනි හැඟීමක් මම ආරෝපණය කොට ගතිමි.



# 13

යුක්තිය පසිඳලා අභය දානය දෙන ලෙස ඉල්ලන චූදිතයෙකු මෙන් මම වෛද්‍යවරයා දෙස බැලීමි. ඔහුගෙන් පිට වන හැම වචනයක් ම ජීවිතයට බෙහෙවින් තීරණාත්මකව බල පානු ඇතැ යි මම විශ්වාස කළෙමි. දුල්ලැව පවුලේ උදවියට බල පෑම් කිරීමට තරම් පෞරුෂයක් හා බලයක් ඔහුට ඇතැ යි මට සිතේ. වෛද්‍යවරයාගේ තේජාන්විත ස්වරූපය දෙස මම කරුණාවෙන් හා ඇල්මෙන් යුතුව දෑස් යොමා සිටියෙමි.

ඔහු බැරෑරුම් ආධිපත්‍යයක් ගෙන දුල්ලැවට කතා කළේ ය.

'මිස්ට දුල්ලැවට මේ සිද්ධියෙන් කාටවත් බිලි දෙන්න ඕනද?'

'නෑ....'

ඔයිට වැඩිය සිහි බුද්ධියෙන් ඉවසීමෙන් කටයුතු කරන්න වෙයි. මොකද දැන් ලෙඩේ තියෙන්නෙ විශ්වගේ හිතේ. හරියට කටු අත්තක් උඩට දාපු රෙද්දක් ඉරෙන්න නැතුව ගලවනවා වගේ වැඩක් තමා විශ්ව බේර ගන්න එක.'

'මං හැමදේම කරන්නෙ ඒකට තමයි ඩොක්ටර්...'

දුල්ලැව එසේ කියා මදෙස හොරැහින් බැලී ය. මම බිම බලා ගතිමි. 'හැමදේම කරන්නෙ මොකට දැයි' පෙරළා ප්‍රශ්න කිරීමට සිත් වුව ත් මම නිහඬ වීමි. කාගෙ කාගෙත් වසන් කරන චරිතය ත්, බලයෙන් ධනයෙන් වසා සිටින නිරුවත ත් හෙළි කළ යුතු යැයි සිතුවත් මේ එයට කාලය නොවේ යැයි මම සිතීමි.

'මේ සිද්ධියේදී නේත්‍රාට තමයි හොඳටම පුළුවන් විශ්වගේ හිත හදන්න. ඒකට ගෙදරදී හොඳට ඉඩකඩ හදලා දෙන්න වෙනවා...'

For Pusthakalaya

'අපි නේත්‍රාට ඒකට ඉඩදීල තියෙන්න? ඒත් එයා අපි දීල තියෙන ඉඩෙන් ප්‍රයෝජන ගන්නෙ නෑ.'

දුල්ලෑව එසේ කීවේ කුමන ඉඩකින් ප්‍රයෝජන ගන්නට දැයි අසන්නාක් මෙන් විශ්වගේ මව ඔහු දෙස රවා බැලුවා ය. දුල්ලෑව සටැසින් මදෙස බැලුවේ ය.

'කොහොම වුණත් මං ඔය අම්මටයි තාත්තටයි කීප දවසක්ම කිව්වා ගෙදරදි විශ්වට හැසිරෙන්න දෙන්න ඕන විදිහ. ඒත් අද වෙනකල් ඒක වෙලා නෑ. මං අද විශ්වගේ බිරිඳටත් ඔන්න කිව්වා. ඔය තුන්දෙනාට මේ ගැන විශේෂ වුවමනාවක් නැත්නම් ජීවිත දෙක තුනක් නැතිවෙන්න පුළුවන්. ප්‍රවේශමෙන් වැඩ කරන්න.'

'ඩොක්ටර් නේත්‍රා කියන දෙයක් අහන්නේ නැති එකයි වැඩේ. දැන් අද උදේ වුණත් පුතාට තුවාල කළේ නේත්‍රා. පුතාට සලකන්නේ වෛරක්කාරයෙකුට වගේ. නහයෙන් කටින් පුතා ලේ දැම්මා. මේ ළමයා නපුරුයි. පුතාගෙන් අයින් කරල තිබ්බොත් තමයි හොඳ'

මවගේ කතාව මම ඉවසීමි. වෛද්‍යවරයා පිළිතුරු දුන්නේ ය.

'කසාද බැන්ද ස්වාමියාගෙන් බිරිඳව වෙන් කරන්න කියල දොස්තර කෙනෙකුට කියන්න බෑ. එහෙම නම්.... මේ වෙදකම මට කරන්නත් බෑ. මං කියන්නේ නේත්‍රා පුළුවන් තරම් විශ්ව ළඟම තියන්න කියලා. මොකද දරුවෙකුත් ලැබෙන්න ඉන්න අම්ම කෙනෙක් නිසා. එහෙම මේ අය වෙන් කරන්න ඔය අයට ඕන නම් දොස්තර ගාවට නෙමෙයි නඩුකාරයා ළඟට තමයි ගෙනියන්න වෙන්නෙ.'

'අපි කොහොමත් උසාවි තීරණයක් ගන්න තමා හිතාගෙන ඉන්නේ.'

විශ්වගේ මව කීවා ය. වෛද්‍යවරයා මොහොතක් කල්පනාවට වැටුණේ ය.

'හොඳයි.... එතකොට දරුවා?'

විශ්වගේ පියා කඩිනම් පිළිතුරක් දුන්නේ ය.

'මගේ දරුවා.... මං ගන්නවා ඩොක්ටර්...'

මගේ වචන දෙතොලතර වෙව්ලමින් ගැහෙන්නට වි ය.



'මේ මගෙයි විශ්වගෙයි දරුවා...'

මම හඬන්නට වීමි.

'ඒක තමයි මම කිව්වෙ. මගේ දරුවාගේ දරුවා. එයා මට බලාගන්න පුළුවන්.'

දුල්ලෑව වරද්දා ගත් කට හදා ගත්තේ ය.

වෛද්‍යවරයා බෙහෙවින් අපහසුතාවට පත්ව ඇතැ යි මම සිතීමි. ඔහුට මේ ව්‍යාකූල ප්‍රශ්නය ලිහා ගත නොහැකි වූවාක් මෙන් තරමක් විස්මිත්තව සිටියේ ය.

'හොඳයි තව සතියකින් විශ්ව ගෙනත් ආයෙත් මට පෙන්නන්න. එයාව කතා කෙරෙව්වොත් හොඳයි. කතා නොකර ඉන්නෙ කල්පනාව නැති නිසා නෙමෙයි. දැන් ලෙඩාව ගෙදර ගෙනියන්න පුළුවන්. අවශ්‍ය ප්‍රතිකාර සේරම කරලයි තියෙන්නෙ.'

මම වෛද්‍යවරයාගේ කාමරයෙන් මුලින් ම නික්මුණෙමි. දුල්ලෑව දෙමහල්ලන්ට පෙර විශ්ව ඉන්නා කාමරයට යාමට මට ඕනැ වි ය. මම රෝහලේ කොරිඩෝව දිගේ ඉදිරියට ගියෙමි. දකුණට හැරුණු තැන විශ්වගේ රෝහල් නවාතැන් කාමරය වි ය. මම අනවසරයෙන් කාමරයට ඇතුළු වීමි. සහනයක් සුවයක් ලද්දාක් මෙන් ඔහු සිටි ඉරියව්වෙන් ම සිටී. හෙදිය ඒ අසළට වී සිටියා ය. මා පිවිසෙත් ම හෙදිය විශ්ව අසළින් ඉවත් වූවා ය. මම ඔහුට සමීප වීමි.

'ඩොක්ටර් කිව්වා ඔයාව ගෙදර ගෙනියන්න කියලා. දැන් හොඳටම සනීපයි කිව්වා. පොඩ්ඩක් ඉන්න.'

යැයි කියා මම ඔහුගේ හිසට යටින් තවත් කොට්ටයක් තබා හිස ඔසවන්නට සැලසීමි. මගේ අත් බැගයෙන් පනාව ගෙන විශ්වගේ හිස පීරුවෙමි. හිසට දහදිය දමා තිබුණු හෙයින් තෙල් දමා පීරුවාක් මෙන් කෙස් රොද කීකරුව හිස මත රැඳිණ. මම විශ්ව ඇඳේ වාඩි කරවූවෙමි. ළපැටියෙකු මෙන් ඔහු කීකරු වි ය. මම සැණෙකින් ඔහුගේ නළල සිප ගත්තමි.

'ඩොක්ටර් තිලක් ජයසෝම හොඳයි. එයා කිව්වා ඔයාට ඉක්මනට සනීප වෙයි කියලා. ඩොක්ටර් කියන්නේ මටම ඔයාව බලාගන්න කියල.'

හෙදිය අප සමීපයට පැමිණ විශ්ව වත්තම් කර රෝද පුටුවට නංවා ගැනීමට උදව් වූවා ය. වාහනය ළඟට එන තුරු ම මම රෝද පුටුව තල්ලු කර ගෙන පැමිණියෙමි. කිසිදු වෙනසක් නැතිව පැමිණි දුල්ලැව ද වාහනය හැර අපට අසුන් ගන්නට ඉඩ දුන්නේ ය. අප කිසිවෙකු ගෙදරට එන තුරු ම කිසිවක් කතාබහ කළේ නැත.

මම විශ්වගේ කාමරයට ඔහුට රැගෙන ගියෙමි. දුල්ලැව මා පසු පස වි ය.

'නේත්‍රා ඔහොම මහන්සි වෙන්න ඔයාට හොඳ නෑ. ඔතනින් අයින් වෙන්න.'

යැයි කියමින් මගේ උරහිසින් අල්ලා මා පසෙකට ගත් ඔහු,

'ළමයෙක් බඩේ ඉන්න කොට අම්ම කෙනෙක් පරිස්සම් වෙන්න ඕන'

යයි රහසින් කීවේ ය.

නැවතත් මා අපහසුතාවකට පත් වෙතැ යි බිය වී මම විශ්ව දෙසට හැරුණෙමි.

විශ්ව ඔහුගේ ඇඳ අසළ වූ ටීපෝව මත තිබූ බීම බෝතලයක් ඔසවා මට දමා ගසන්නට සූදානම් වන බව මා දුටුවේ ඒ විට ය. මා කළ යුත්තේ කුමක් දැයි සිහියට නගා ගත නොහැකිව මම ගල් ගැසී බලා සිටියෙමි.

විශ්වගේ ආවේගකාරී තද පහර දීමකින් මගේ හිස කුඩු වී සුන්නද්දූලි වෙතැ යි සිතුවෙමි. බමමින් තිබුණු හිසේ සිට සර්වාංගය පුරාවට නැඟුණු දහදිය නිසා හිස හිරි වැටෙන්නට වි ය. මම මොහොතකින්, තවත් මොහොතකින් දෑස විවර කළෙමි. දණින් වැටී සිටිමින් ම, දෑත බිම ඔබා ගෙලෙන් ඉහළ සිරස්ව ඉහළට එසවීමි. මායා දැලකට හසුව මෙන් බොඳ වී.... බොඳ වී යමින් තිබුණේ විශ්වගේ රූපය යි. වෛරයෙන්, ගිනියමින්, ද්වේශයෙන් පුපුරමින් විශ්ව විකල් රූහුරු වෙසක් ගෙන සිටී.

විශ්ව.... ආදරණීය විශ්ව... ජීවිතයේ ගැඹුරු ම අරුතින් මා ප්‍රේම කළ දයාබර විශ්ව, මම ඔහුගේ දෙපා අල්ලා ගෙන දෙවියන් බුදුන්



ඉදිරියේ මෙන් ජීවිතය ඉල්ලා සිටියෙමි.නැතහොත් මරණය අයැද සිටියෙමි.

'කමක් නෑ. මාව මරා දාන්න. කවදාවත් ඔයාව තනි කරන්නේ නෑ කියලා මාව තුරුලු කරගත්තු ඔය අත් දෙකින්ම මාව මරා දාන්න. කමක් නෑ විශ්ව. මං මරණයට බය නෑ. මං කාලයක් මං හින්ද ජීවත් වුණා. පස්සේ කාලෙක ඔයා හින්ද ජීවත් වුණා. ඊටත් පස්සේ ඔයාගෙයි මගෙයි දෙන්නගෙම ජීවිත වෙනුවෙන් උපදින්න ඉන්න මේ දරුවා හින්ද ජීවත් වුණා. මං හිතුව ඔය අත් දෙකම මට ආරක්ෂාවක් වෙයි කියලා. ඇයි රත්තරන් අපි ඔක්කොම විනාශයට යනව කියන එක තේරුම් ගන්නේ නැත්තේ?'

නැගී නොසිටිමින් ම මම ප්‍රශ්න කළෙමි. විශ්වගේ කය පුරා නැඟුණු දහදිය සට සට ගා වැටෙන්නට වි ය. ඔහුගේ දෑස රතු වී තිබිණ. කමිසය පොඩි වී දහදියෙන් තෙමී තිබිණ. කමිසයේ නැවූ අත් දිග හැරී බොත්තම් ගැලවී තිබිණ. ඔහු වෙවුලමින් සිටියේ ය. මම ද ඔහු ළඟ ම ගැහෙමින් සිටියෙමි.

විශ්ව සන්සුන් වූ බව දැන ගත්තාක් මෙන් කාමරයේ සිටියවුන් මෙන් ම කොකම් පාන්නෝ ද ඉවත් වූ හ. මම් දණට අත තබා නැඟී සිටියෙමි. විශ්වගේ ඇස් දෙක දිහා එක එල්ලේ ම බලා සිට ඔහුට සමීප වීමි. දෑත ඔසවා ඔහුගේ උරහිස මත තැබීමි. මෘදු ලෙස ඇඟිලි තුඩු අතුරා ස්පර්ශ කළෙමි. ඊ ළඟට සෙමින් විශ්වට කතා කළෙමි.

'මට වද දෙන්න. කරන කරදරයක් මට කරන්න. ඔයා වද විඳින්න එපා. මට මගේ දුක් උහුළන්න පුළුවන්. මට ඔයා වේදනා විඳිනවා උහුලන්න බෑ.'

මම විශ්වගේ ගෙල දෙසට දෑත ම යවා ඇඟිලිවලින් ඔහුගේ කම්මුල ස්පර්ශ කොට ඔහුගේ නෙතේ උතුරන්නට ආසන්නව තිබූ කඳුළක් ආදරයෙන් පිස දැමුවෙමි.

'ඔයාට අඬන්න දෙන්න බෑ විශ්ව. මමයි අපේ දරු පැටියයි ඔයාව බලා ගන්නවා.'

මම විශ්වගේ අවුල් වූ කෙස් රොද ඇඟිලි අතර දවටමින් පිරි මැද්දෙමි. ඔහුගේ ළයෙන් වේගයෙන් පිට වූ සුසුම් රිද්මයකට හැරිණි.

විවර කරන්නට තැත් කළ දෑස ඔහු නැවතත් සෙමෙන් පියවා ගත්තේ ය.

'අපිට අපේ පාඩුවේ ඉන්න නොදෙනවානම් අපි යමු විශ්ව නුවර. ඔයාටත් මටත් අපේ කටුගස්තොට ගෙදර ඉස්සරහා ඉස්තෝප්පුව උණත් ඇති. මට පුළුවන් ඔයාව බලාගන්න. පැටියව ලැබුණාම වුණත් අපේ අම්මා හොඳින් ඒ වැඩ ටික කරලා දෙයි.'

ටීපෝව මත තිබුණු පත්තර පිටුවක් ගෙන මම විශ්වගේ පපුතුරේ ස්පර්ශ වන්නට පවන් ගැසීමි. දහදිය බිඳු වියළී ගිය විට ඔහුගේ කමිසයේ බොත්තම් එකිනෙක පියවා සකස් කළෙමි.

'මේ දරුවා කාටවත් ඕන විදිහට හදාගන්න බැහැ විශ්ව. අපේ දරුවා හදාගන්න ඕනේ අපිට ඕන විදිහට. මට නම් හිතෙන්නේ ඔයාට උණත් වෙදකමක් හෙදකමක් කරන්න නුවර ගෙදර හොඳයි කියලා.'

දිග හැරී තිබුණු ඔහුගේ කමිස අත, පිළිවෙළකට නවමින් මම කීවෙමි. දණක් දක්වා පොරෝනය විශ්වගේ සිරුරට එළා මම ඔහුගේ මුවට උඩින් පාත් වී නළල ත් සිප ගතිමි. මගේ මුවින් නික්මෙන උණුසුම් සුසුම් ඔහුගේ කම්මුලට වැදෙන්නට සැලසීමි.

'ඔයාට කේන්ති යනවා හරියට පොඩි ළමයෙක් වගේ. මීට පස්සේ එහෙම බොරුවටවත් ඔහොම දරුණු වැඩ කරන්න යන්න එපා. චූටි පැටියෙක් බඩේ ඉන්න කොට බය කරන්න හොඳ නැතිලු.'

විශ්ව දෑස හැර එ විට මදෙස බැලුවේ නින්දෙන් අවදි වූ රුදුරු සතෙකු මෙනි. ඔහුගේ දෑස තව තවත් ගිනියම්ව තිබිණ. ඔහු සන්සුන් කිරීමට ගත් සියලු උත්සාහයන් අසාර්ථක වී වත් ද? එහෙත් මගේ යටිහිත ඔහුගේ රුදුරුකම මැඩ ගෙන නැඟී සිටියේ ය. 'උඹ සන්සුන් වෙයං. ඉවසපන්.... දරුවා ගැන හිතපං.... උත්සාහ කරපන්.' යැයි යටිසිත මට හඬ ගා කියන්නට වි ය. මම නැවතත් ඔහුට කතා කළෙමි.

'විශ්ව ඔයාට ඒ දවස්වල ලස්සන කවි හිතක් තිබුණා. ඔයා ඒ දවස්වල කතා කළා පින්නේ මල් පිපෙන හැටි. ඔළිඳ ඇළට පැනලා දිය නාන හැටි. නුවර මෙහෙට වඩා ලස්සනයි. හඳ එළිය වැටුණාම ගොම්මැටි ගාපු අපේ පිල් කණ්ඩිය හරි ලස්සනයි. සඳ රැස් ඇවිල්ලා. මං ඒ දවස්වල හැමදාම වගේ හඳ්දින්නත් තරු පොකුරු ගණිනවා. තරු ගොඩාක් තිබුණාම රෑට අහස හරිම ලස්සනයි. ගෙට පිටිපස්සේ පුංචි



දෙවට අයිනෙන් කෝපි මල් සුවඳ එනවා. මං කාමත් ඒ සුවඳට ආසයි.ඔයා කොච්චර නම් ඒවාට ආස කළාද?'

මට හැඩුම් එන්නට වි ය. එහෙත් හඬන්නට නොහැකි ය. නොහඬා සිටින්නට ද නොහැකි ය. මම ඉකියකින් සංතාපය පිට කළෙමි.

අප සිටි කාමරයට ඒ පිටින් කිසිවෙකු සෙමින් කතා කරනු ඇසී මම ඒ දෙසට ඉව කළෙමි. කාමරයේ සිදු වන සියල්ල කිසිවකු විසින් අසා සිටිනවා යැයි මම අනුමාන කළෙමි.

'කවුද ඔතන දොර ළඟ ඉන්නේ?'

'මම නෝනා.'

ලීලා පිළිතුරු දුන්නා ය.

'දොර ගාවට වෙලා ඉව අල්ලන්නේ? කියපං මොකද?'

මම ආධිපත්‍යය ආරූඪ කොට ගෙන කතා කළෙමි.

'නුවර ඉඳලා නෝනා බැන්ද කෙනා ඇවිල්ල ඉන්නවා.'

'මොකා කිව්වා?'

'නෝනගේ කසාද මහත්තයා.'

ඊ ළඟ උගුලට හිතන්නට ත් පෙර මා ළඟා වී ඇතැ යි මම සිතා ගතිමි. එහෙත් ඔහේ නිකම් ම පාවෙනවාට වඩා යාත්‍රා කිරීම ගුණදායක ය. මෙ තරම් ඉක්මනින් ම මා ගොදුරු කරවීමට මළපුඩු සකසතැ යි මම නොසිතිමි. එහෙත් පළා යා නොහැකි ය. විශ්ව ඉදිරිපිට දී ම සියල්ල විසඳා ගත යුතු ය. ලීලා ද මේ සඳහා යොදා ගැනීමට තරම් විශ්වගේ මව සූක්ෂ්ම වී ඇති සැටි.

'කාමරයට එන්න කියන්න.'

මිනිත්තු කීපයකින් ඔහු කාමරයට පැමිණියේ ය. ඒ අහිංසක, අසරණ හා අතරමං වූ ලොරි රියදුරා ය. මීට පෙර විශ්වගේ මව, මා පාවා දීමට යෝජනා කළේ ද මොහුට ය. බුවුන් පේපර් කඩදාසිවලින් ඔතන ලද පාර්සලයක් ඔහු ටීපෝව මත තැබුවේ ය. මගේ මුහුණ වත් නොබැලූ ඔහු විශ්වගේ පය පාමුලට ගොස් ඇද වැටුණේ ය.

'මට සමාවෙන්න මහත්තයා. කරදර නිසයි එන්න බැරිවුණේ. ඒත්

මං නේත්‍රාට කිව්වා පාත්තු සප්පායම් කරන්න උදව් වෙන්න කියලා. හාමු මහත්තයා තමයි කිව්වේ දැන් ඉතින් බඩටත් මාස කීපයක් වෙච්ච හින්දා ගෙදර ගෙනියන්න කියලා.... දෙන්න දෙගොඩ වෙනකල් අපේ මහගෙදර යන්න හිතාන ඉන්නේ?'

කට පාඩම් කිරීමෙන් ද එසේ නැති නම් කපටිකමෙන් දැයි තෝරා ගත නොහැකි තරමට ඔහු දක්ෂ ලෙස අසරණකම සහ කපටිකම රඟ පාමින් සිට පසුව නැවතත් විශ්වට වැඳ වැටුණේ ය.

'අපි එහෙනම් යනවා මහත්තයෝ. බුදු සරණින් ඉක්මනට සනීප වෙන්ට ඕනෑ... අපි යමු නේද නේත්‍රා...'

ඔහු මගේ අතින් අල්ලා ගත්තේ ය.

වෛරය, ක්‍රෝධය හා පිළිකුල සමඟ ම දැඩි චිත්ත ආවේගය ද මගේ සිහිබුද්ධිය විකල් කිරීමට සැරසෙද්දී, මම පොළොවට හොඳින් පය තබා ශරීරයට වෙර ගතිමි.

දකුණතට සියලු ශක්තින් කැටි කළෙමි. ඔහුගේ කම්මුල හරහා මගේ සියලු ශක්තිය පහරකින් දිග හැරියෙමි.

'කවදා ඉඳලද යකෝ මං තොගේ ගෑණි වුණේ?'

නොසිතූ පහර වැදීමෙන් ඔහු අන්දමන්ද වි ය. ඔහු කැරකී වැටෙන්නට ගොස් යාන්තමින් සිරුර කෙළින් කර සිදු වූ නොසිතූ පෙරළිය සිතන්නට ඇත. වැටුණු විට ඔහුට නොනැඟිටින්නට පහර දිය යුතු යැයි මම සැණෙකින් තීරණය කළෙමි. මම විශ්වගේ ටීපෝව මත තිබුණු බටර් පිහිය අතට ගත්තෙමි. වෛරයෙන් කෑ ගැසීමි.

'මං තොගේ බඩකැවුතු ගන්නවා එළියට. වලව්වල එවුන්ගේ සල්ලිවලට පාහරකම් කරන බල්ලා. මගෙන් මැරුම් නොකා පළි මෙතනින් එළියට. නැත්නම් තොපි ඔක්කොම මරාගෙන මැරෙනවා.'

මම ඔහුට පිහිය උලුක් කළෙමි. දියෙන් ගොඩ දැමූ නොමැරුණු මාළුවෙකු මෙන් ඔහු ගැහෙන්ට වි ය. ඒ ළඟ මොහොතේ විශ්වගේ මව කාමරයට පිවිසියා ය.

'ඔය හන්තාන්තාරේ ගිහිල්ල ආවත් මේ මිනිහගේ ගෑණි හින්ද උගේ මනුස්සකමට උඹව බාර ගන්න ආවේ. කුප්පායම්වලයි ප්‍රේමන්ට



එකෙයි එක එකා එක්ක බුදිය ගත්තු උඹව මේ ගෙදෙව්ට වැද්ද ගත්ත එකයි අපේ වැරැද්ද?'

ඇය කම්මුලට අත තබා ගත්තා ය.

සීමාව ඉක්ම වන විට වෛරයක් වෙයි. පීඩාව ඉවසීම නිවටකමක් වෙයි. මම විශ්වගේ මවගේ කෙස් රොදෙන් අල්ලා ගතිමි.

'මගේ බඩේ ඉන්නේ උඹගේ පුතාට ජාතක වෙච්ච දරුවෙක්. නූපන්න දරුවෙක්ව අවජාතක කරන්න හදන තොපේ කටවල්වලට හෙණ ගහනවා.'

මම ඇය දෙතුන් විටක් සොළවා අත හැරියෙමි.

ඇඳෙන් නැඟී සිටි විශ්ව ඉකි ගසමින් හඬන්නට වි ය. ගොත ගසමින් හඬන්නට වි ය. ඔහු තතනමින් 'අම්මා අම්මා' යැයි කිවේ ය. මහා වේදනාබර හඬකින් විශ්ව ඉකි බින්දේ ය.

විශ්ව මහා වේදනාවෙකින් හඬන්නට වි ය. එය දුක්බර ඉකියක් අඳෝනාවක් වි ය. 'ඔයා අඬන්න එපා. ඔය කඳුළු මට දෙන්න. ඔය කඳුළු ඔයාට බර වැඩියි.' යැයි කියන්නට මට සිතුණි. එහෙත් විශ්ව 'අම්මා.... අම්මා....' යැයි හඬ නඟමින් හඬන විට මගේ සිත කිරි ගැසී ගියේ ය.

ඇස් මායිමේ ඉසව්වක දූල්ලැව සිටියේ නැත. විශ්ව මගේ හිසට පහර දෙන්නට සූදානම් වූ විගස ම දූල්ලැව කාමරයෙන් නික්ම ගියේ ය. ඔහු මේ සියල්ල දැන හෝ නොදැන මඟ හැර ගියේ ය. මෙකී සියලු සිද්ධි දාමයෙන් ඔහුට ගැළවී යන්නට අවැසි වූවා වත් ද?

විශ්වගේ දුක්බරිත හඬ අවසරයක් කර ගත් මව විශ්වට වඩ වඩාත් සමීප වූවා ය. ඇය විශ්වගේ ඉකි බිඳීම පෙරළා මවෙතට එල්ල කිරීමට තියුණු ආයුධයක් බවට පත් කර ගැනීමට ඉඩ තිබිණ. මම ද ගතින් ඔහුට ළං වීමි. විශ්වගේ සමීපයට ගියෙමි. එහෙත් ඔහුගේ සිත මගෙන් මිදී බොහෝ දුර ගොස් තිබිණ.

'අම්මා.... මගේ අම්මා...'

යැයි විශ්ව නොදොල් බසින් තෙපලේ ය. බොළඳ සියුමැලි ස්වරයෙන් විශ්ව කතා කළේ ය. මව කෙරේ ඇල්මෙන් හා කරුණාවෙන්

For E-Pusthakalaya

ඔහුගේ දෑස දයාර්ද්‍ර වී තිබිණ.

'ඔව් පුතේ.... දඩාවතේ ගිහින් අම්මලා වෙන්ඩ හදන බැල්ලියන්ට වැඩිය උඹේ අම්ම උඹට ආදරෙයි. මගේ රත්තරං පුතේ.... මං උඹට කරදරයක් වෙන්ඩ ඉඩ තියන්නේ නෑ...'

මව විශ්වගේ හිස පිරි මැද මුහුණ ත්, ගෙල ත් සිප ගත්තා ය. මහා මෘදු ස්වරයකින් ඔහුට දයාව පෑවා ය.

මේ මහා මන්දිරයේ සිමෙන්ති බිත්ති මා දෙසට තෙරපෙනවා මෙන් දැනිණ. ප්‍රචණ්ඩ පීඩනයකට ඔරොත්තු නොදෙන්නාක් මෙන් මගේ හිත හැකිළිණි. ක්ලාන්ත වීමට ආසන්න කලෙක මෙන් සිහින් දහදිය බිඳු ගත පුරා නැගිණ. නිවසේ තැන් තැන්වල තබා තිබුණු මේස, පුටු, වීපෝ, පින්තූර, සැරසිලි ආදිය නේක වියරු වෙස් ගෙන සැලෙන්නට වී ය. මම මට ම වාරු නැති වීමි. මට මගේ ම ශරීරය පුරා තුවාල කර ගන්නට සිතේ.

'මම මටත් වඩා ඔයාට ආදරෙයි විශ්ව. ඔයා ඔයාටත් වඩා මට ආදරේ කළා විශ්ව. අපි අපිටත් වැඩිය මේ නූපන්න දරුවට ආදරේ කරමු. ඔයා ඉන්නෙ මායාවක නෙමෙයි...'

'අපි දැන් ආයෙත් ජීවිතේ පටන් ගනිමු. මේ හැමදේම වුණේ මං හරියට ඔයාව විශ්වාස කළ නිසා. වැරදිච්ච තැන් අපි මුල ඉඳලම හදාගමු විශ්ව. ඔයාට දැන් කතා කරන්න පුළුවන්. හීනෙන් බයවෙලා වගේ ඉන්න එපා. ඇත්ත තේරුණොත් ඔයාටම පුදුම හිතෙයි. නපුරු වෙන්න එපා. ඔයාගේ අම්ම හොඳම හොඳ අම්ම කෙනෙක්. ඔයා දිහා බලන්නෙ දේව මාතාවක් වගේ. ඔයා නින්ද උපදින්න ඉන්න දරුව දිහා බලන්නේ කාලි යක්ෂණියක් වගේ. මේ දේවල් තේරුම් ගන්න විශ්ව...'

කියා ගෙන කියා ගෙන ගොස් නවත්වන්නට තැනක් නොමැති වන තෙක් ම මම කියෙව්වෙමි. 'අම්මා... මගේ අම්මා...' යැයි කියමින් විශ්ව නව නවත් මවගේ උණුසුම සොය සොයා තුරුලු වී ය. විෂ කැවූ රී පහරක් වැදෙනවාට බියෙන් සැඟවෙන මුව පොව්වෙකු මෙන් මගේ නෙත් මායිමෙන් ඔහු ඉවත් වෙයි. කෙ තරම් දයා නෙතක් ඔහු දෙස බැලූව ද විශ්ව සැඟවීමට තැත් කළේ ය. විශ්වගේ මෙම හැසිරීමට අම්මාගෙන් ද වෙසෙස් අනුබලයක් ලැබිණ. මේ සියල්ල මව ඉවෙන් මෙන් අවබෝධ කොට ගෙන සිටිණ.



ඇය ඉතා සියුම් ලෙස විශ්ව දිනා ගත්තා ය. ඒ හැම මොහොතක ම මගෙන් පළි ගත්තා ය.

'උඹ දැන්වත් කාමරයෙන් එළියට පලයං තේන්ත්‍රා... උඹව දැක්කම විශ්ව බයවෙනවා. මනුස්සයෙකුට බය වුණාම තොවිල් නටලවත් හොඳ කරන්න බැරිලු. බලපං උඹේ මූණේ තියන වනචර පාට. පලයං.... පලයං.... කාමරයෙන් එළියට පලයං...'

කුණු ගොඩක්, විෂ බීජයක්, වෛරසයක් මෙන් ඈ මා පිළිකුල් කළා ය. පළවා හැරියා ය. ප්‍රතික්ෂේප කළා ය. තිරිසන් ලෙස හෙළා දැක්කා ය. මම අසරණ වීමි. තනි වීමි.

අවස්ථාව අනුව 'දුවේ' යැයි කතා කිරීමට ත්, අවස්ථාව අනුව කුණු බැල්ලියක් මෙන් මා පළවා හැරීමට ත් ඇය පසු බට නොවූවා ය. ඇගේ දෙබිඩි චරිතය මා තේරුම් ගනිමින් සිටියෙමි. විශ්ව කෙරේ මගේ සිතේ ඇති ආදරයේ තරමට මව කෙරේ වෛරයක් හා පළි ගැනීමේ චේතනාවක් මතු වෙමින් තිබිණ.

මව මට වෛර කළේ විශ්වගේ බිරිඳ වීම නිසා නොවන බව මම දැන සිටියෙමි. දුල්ලැව මා සමඟ අනියම් සම්බන්ධයක් පවත්වතැ යි ඇය සැක කළා ය. විශ්වට මට වඩා කුලයෙන්, බලයෙන් පිරිපුන් යුවතියක් කසාද බන්දා දීමට ඇයගේ සිතේ තිබෙන්නට ඇත. මේ සියල්ල විනාශ වී ගියේ මා නිසා නොවේ ද? දුප්පත්කම හා අසරණකම නිසා මා තුළ උපන් වෛරය හා ක්‍රෝධය පුපුරු ගසමින්, බුබුළු දමමින්, සිත් පතුලේ සිට නැඟෙන්නට වී ය. මම සියලු පීඩාවන් කැටි කොට මව දෙස බලා සිටියෙමි.

'යන තුත්තුකුඩියකට පලයං මගේ දෑහැට නොපනී. තෝ මෙතනින් තොලොංජි වෙච්ච දවසට තමයි මගේ පුතාට සනීප වෙන්නෙ.'

තරයේ මෙන් ම දැඩිව ඇය මා එළවා දැම්මා ය. මා කාමරයෙන් පිය එසවූවා ම නොවේ. මම කාමරයෙන් මෙ පිටට වීසි වීමි.

For E-Pusthakalaya

# 14

මගේ මුළු සර්වාංගය ම දැවෙන්නට ත්, තැවෙන්නට ත්, පිච්චෙන්නට ත් වි ය. මම තව තවත් විනාශයට ඇදෙමින් සිටියෙමි. ජීවිතයට උරුමකමක් හෝ අවසරයක් නොමැති තරම් වි ය. පීඩාව හැර කිසිවක් ඉතිරි නොවී ය.

මම වමතින් කුස පිරි මැද්දෙමි. බිත්තියට වාරු වී මොහොතක් සිටියෙමි. බිත්තියට මුහුණ ඔබා සිටියෙමි. හිස බිත්තියට තබා තද කළෙමි. කොහේ සිට හෝ මගේ අයැදුම අසන්නට කෙනෙක් එතැ යි සිතීමෙන් ඔහේ විකාරයෙන් මෙන් කතා කළෙමි.

'අනේ මගේ අම්මේ. දෙවියනේ මෙච්චර පව්කාර එකියක් මොකටද ලෝකෙට හැදුවෙ? දුක් විඳල... දුක් විඳල... මැරිල යන්නට අපි උපදින්නේ? මෙහෙම දුක් විඳල මැරෙන්න මට බැ. අනේ මගේ අම්මෙ.... මං මැරිල යන්න ඉස්සර මගේ ළඟට එන්න මගේ අම්මේ. අනේ.... දෙවියන්ටවත් මගේ දුක පේන්නේ නැද්ද දෙවියනේ...'

මම බිත්තිය දිගේ රූටා වැටෙමින් ම ඉදිරියට ගියෙමි. මා මේ මන්දිරය කිලිටි කරන පව්කාර වෙසඟනක් ද?

එහෙත් මේ මහා තාප්පවලින් වට කළ ලෝකය මට වඩා කෙතරම් කිලිටි ද?

මම විශ්වගේ පියාගේ නිදන කාමරය දෙසට ඇදුණෙමි. සෙරක මෙන් – විකල් ගැහැණියක මෙන් කාමරයට එබී බැලුවෙමි. ඔහු මත්පැන් වීදුරුවක් දෙතොලතර තබමින් සිටී. අඩක් හිස් කළ බෝතලය ඇඳ අසළ ඔහුට තනි රකී. මත් වූ ලොව් ගෙඩි මෙන් රතු වූ දෑස විහිදුවා ඔහු මදෙස බැලුවේ ය.



මම තීරණයක් ගත්තෙමි.

මම දෙවරක් නොසිතා ම ඔහුගේ කාමරයට රිංගුවෙමි. දුල්ලෑව දෙසට රාගික මායා බැල්මක් හෙළීමි. ශබ්ද නොනැගෙන්නට දොර වැසුවෙමි. දුල්ලෑව තුෂ්ණිම්භූතව මදෙස බලා සිටියේ ය. මම ඔහු සමීපයට ගියෙමි. ඔහු අසළ ඇඳේ දැවටෙමින් යහනේ වාඩි වීමි. දුල්ලෑවගේ හිසේ සිට නළල හා මුහුණ හරහා ගෙල දක්වා මගේ දෑත යවා ඔහු පිරි මැදීමි. බෝතලය අතට ගෙන වීදුරුව පුරවා එය ඔහු අතට දුනිමි. දුල්ලෑව නිසලව බලා සිටියේ ය.

'බොන්න.'

මම තෙපළීමි. ඔහුට එකඟ නොවී බැරි වි ය. සැණෙකින් ඔහු මත්පැන් වීදුරුව කටට හළා ගත්තේ ය.

'නේත්‍රා ඇයි මේ?'

ඔහු සැලෙමින් හා උණුසුමින් ප්‍රශ්න කළේ ය. මම තව වීදුරුවක් පුරවා ඔහුගේ අතේ තැබුවෙමි.

'ආදරේට...'

මම රාගික වියරුවකින් කීවෙමි. දෙවරක් නොසිතා ඔහු දෙවන වීදුරුව ද හිස් කළේ ය.

'මොනවද මගෙන් ඕන.'

හිමි හිමින් මම ඔහුගේ කමිසයේ බොත්තම් විවර කර කමිසය අහවර කළෙමි. ගුලියක් කොට යහන පල්ලට දැමීමි. ඔහුගේ ගෙල ත් පපුව ත් පිරිමැදීමි.

'කැමති දේවල් ඔක්කොම ගන්න.'

මම ඔහු පෙළඹීමි. සැලෙන දෑතින් ඔහු මගේ මුහුණ අල්ලා ගත්තේ ය.

දුල්ලෑවගේ ගොරෝසු ඇඟිලි මගේ දෙකම්මුල් දිගේ ගෙල දෙසට රූටා වැටෙන්නට වි ය. ඔහුගේ මුවින් නිකුත් වූ මත්පැන් ගඳ මගේ නාස් පුඩු ආසන්නයේ ම දැනෙන්නට වි ය. හීගඩු පිපෙන හිරිකිතයකින් මම ඔහුට ඉඩ දී සිටියෙමි. විශ්වගේ පිරිපුන් ආදරය හද ගැබේ ගැඹුරු ම පතුලේ රැඳෙමින් නළියන්නට වි ය. ඇස් පිල්ලම පහතට හෙළා තද

කොට ගත් මඟ හිටි කිරිගේ යටි තොල සපා ගත්තමේ. ඇස් කුහරයේ කොහේ දෝ ඈතක සිට උතුරු උතුරා උණුදිය කඳුළු ඇද හැළෙන්නට වි ය.

'තේත්‍රා අඬන්න එපා..'

දුල්ලෑව මහින්, රාගයෙන් හා කුතුහලයෙන් තෙපලේ ය. 'කෙනෙක් – කෙනෙකුට හඬන්නට එපා' යැයි කියන්නේ ආදරයට වුව ද දුල්ලෑවගේ හඬෙහි ආදරයක් තිබුණේ නැත. සෙනෙහසක් තිබුණේ ද නැත.

'කාමරයෙන් එළියට සද්ද ඇහෙයි.'

දුල්ලෑව දහදිය මුසු රළු අතින් මගේ මුව වසමින් කීවේ ය.

කාමරයේ තිබුණේ අඳුරු ම අඳුරු ගුප්ත බවකි. මට කිසි කලෙක තේරුම් ගැනීමට අපහසු වූ මේ සුවිසල් මන්දිරයේ සියලු අද්භූතයන් දුල්ලෑවගේ කාමරයට කැටි වී, අරක් ගත්තාක් මෙනි. ළා අඳුර දුල්ලෑවගේ රාගය වැඩි කරන්නට ඇත. ළා අඳුර මගේ බිය ද, කුතුහලය ද, අසරණකම ද වැඩි කළේ ය. එහෙත් මගේ කුරිරු වූ පළි ගැනීමේ චේතනාව සියල්ල අභිභවා නැඟෙමින් යටිසිත ශක්තියෙන් තීව්‍ර කළේ ය.

විශ්වගේ ආදරය ත්, කුස මත් සිහින්තා පිළිබඳ අප්‍රමාණ ස්නේහය ත් පමණක් ම නැඟෙමින්, සැලෙමින් සිතෙහි මතු වන්නට වි ය. සියල්ල සැනසීමෙන් විසඳා ගත හැකිව තිබුණත් මට පමණක් සතුරු පෙරමුණක රුදුරු සෙබළියක් මෙන් ක්‍රියා කළා ය. ආදරණීය අම්මා කෙනෙකු ලෙස ඇගේ ජීවිතයට සමීප වන්නට මා කළ සියලු උත්සාහයන්හි දී ඇය කුරිරු පිළිවෙතක ම සිටියා ය. ඈ උත්සාහ කළේ මා ලේලිය කර ගන්නට නම් නොවේ. පරඬැල් පතක් මෙන් ඉවත ලීමට ය. ඉවත ලා ගිනි ලෑමට ය. එහි උණු අළු ගෙන ධනය බලය හිමි ලේලියකගේ නළලත තිලක තැබීමට ය.

මගේ සිතුවිලි අසහනකාරී ලෙස මුරණ්ඩු වණ්ඩ මාරුතයක් වෙමින් තිබිණ. ගත හිරි වැටී මා නිසල වෙද්දී, දුල්ලෑව පපුතුරේ වැහැරී හිය මස්ගොබවලින් මා සිර කර ගත්තේ ය. ඔහු බලාපොරොත්තු වන ආලිංගනයට මා ඉඩ දෙනවා ද?



'තේත්‍රා බයවෙන්න එපා.'

'මං බය නෑ.'

'මොකාටවත් බයවෙන්න එපා.'

'මං මොකාටවත් බය නෑ.'

'මොන යකාටවත් දැන් ඔයාව මගෙන් දිනාගන්න බෑ.'

සැණෙකින් මගේ සිහින සිතුවිලි සුළි සුළඟක් වි ය. පවිත්‍ර තිකැමැල් මගේ හද ගැබ බුර බුරා නැඟෙන ගින්නකට අසු වි ය. දුල්ලෑවගේ ගත දරදඬු වි ය. මගේ ආත්මය ම ලිය වැලක් මෙන් මෘදු සියුමැලි බවකින් සුකුමාර වි ය.

දුල්ලෑව මගේ හිස ඔහු දෙසට හරවා ගත්තේ ය.

මම හරියට ම ඉලක්ක කොට දුල්ලෑවගේ ගෙල දෑතින් ම අල්ලා ගතිමි.

'බෙල්ල තදකරන්න එපා තේත්‍රා මං මැරෙයි.'

'මැරිද්දෙන්.'

'ආදරේ කරද්දී එහෙම කියන්න එපා'

දුල්ලෑව මගේ කෙස් රොද සිරුවට බෙරා දෙකන් පෙති සිප ගත්තේ ය. දඬු අඬුවකට හසු වූවාක් මෙන් මම සිර වී සිටියෙමි.

'මේක මගේ ගෙදර – මගේ සල්ලි – මගේ යාන වාහන – මේ සේරම මගේ. තේත්‍රා ඔයා මගේ වෙන්න. එතකොට මේ ඔක්කොම අපේ. මට මගේ ගෙදරදීම ඔයාව අයිති වෙන්නයි යන්නෙ. මං හරිම පින්කාරයෙක්. මොකාටවත් දැන් ඔයාව මගෙන් ගන්න බෑ තේත්‍රා.'

'මගේ කුසේ දරුවෙක් ඉන්නවා.'

'කමක් නෑ.'

'කවුද ඒ නුපන්න දරුවගේ තාත්තා.'

'මම... මම.... මමයි තාත්තා.'

ඔහු වියරුවෙන් හා උද්දාමයෙන් කීවේ ය.

'ඔව්. මටත් ඕන ඒකනමයි. විශ්වගේ අම්මා මට මුළු ලෝකෙම

පාවා දුන්නා. මට දැන් හොයාගන්න ඕන තාත්ත කෙනෙක් තමයි. මට බෑ අවජාතක දරුවෙක් හදන්න.'

'නේත්‍රා මගේ බිරිඳ. මං දරුවගේ තාත්තා.'

'ඕක මගේ ඉස්සරහ නෙමෙයි. විශ්වගේ අම්ම ඉස්සරහ කියන්න ඕන.'

මගේ යටි හිතේ කුරිරු පළිගැනීමේ චේතනාව මේ ලද අවස්ථාවේ මම දිග හැරියෙමි. එකී බලාපොරොත්තුව ඉටු වන තෙක් ම මම ඔහුගෙන් නොමිදෙමින් සිටියෙමි. මට ඕනෑ ම වේලාවක දුල්ලෑවගෙන් මිදී පළා යාමේ හැකියාව තිබිණ. ඔහු ඒ තරම් ම දුර්වලයෙකු බව මම දැන සිටියෙමි.

'නේත්‍රා..'

ඔහුගේ වැළඳ ගැනීමේ කෙළවරක් නැත.

'ඔව් මං නේත්‍රා තමයි.'

'නේත්‍රා...'

ඔහු යළිත් කොඳුරයි.

මම ඔහු සොළවා සොළවා මදෙසට ම ඇද ගත්තමි. ඒ විට දුල්ලෑව ආදරයෙන් තෙත් වී සිටියේ ය. ඔහු බිය වී සිටියේ ය. අතක් වත් ඔසවා ගත නොහැකි පරිදි ඔහු මත්වී සිටියේ ය.

මොහොතක් වත් ගත වූයේ නැත. විශ්වගේ මව කාමරයට වැදුණා ය. මම විකල් වෙස් ගෙන සිටියෙමි. වරලස ඉහිරිලා ය. සුදුමැලි වෙලා ය. ගෙල ත් කම්මුල ත් රතු වී තිබෙන්නට ඇත. ඇඳුම් රැලි රැලි වී පොඩි වී තිබිණ. දුල්ලෑවගේ කමිසය ඇඳ පල්ලේ ය.

මම දුල්ලෑවගේ උරහිසින් අල්ලා ගත්තෙමි. ඔහුට මගෙන් මිදෙන්නට ඉඩ නොදී සිටියෙමි.

මවගේ මුහුණේ තිබුණේ කුමන හැඟීමක් දැයි තේරුම් ගැනීමේ අවැසිකමක් මට තිබුණේ නැත. තව තවත් ඇය අසරණ කිරීමට, රිදවීමට, නරුම වීමට පමණක් ම මට ඕනෑ වි ය.

'කියපං.... කියපං.... මගේ කුසේ ඉන්න දරුව කාගෙද' කියල කියපං...'



මම දුල්ලෑවට වධ දුන්නෙමි. අසරණකමකින් සිටි ඔහු අවදි කළෙමි. අකීකරු ඉලක්කය පරාජය වූ විට මම කීකරු වෙසක් මවා ගතිමි.

'කියන්න. ඔයා ඉස්සෙල්ල කිව්ව වගේ ලෝකෙට ඇහෙන්න කියන්න. නැත්නම් මේ දරුව අවජාතක දරුවෙක් වෙනවා.'

'නේත්‍රා.... නේත්‍රා..... ඔයාගේ බඩේ ඉන්නෙ අවජාතක දරුවෙක් නෙමෙයි. ඒ දරුව මගේ. මගේ දරුව. මගෙයි නේත්‍රාගෙයි දරුවා.'

මම කුරිරු පළිගැනීම ඉටු කොට ගතිමි. අසහනකාරී සිතට සහනයක් නොලැබුණෙන්, දුල්ලෑවගේ මත් මායාව මගේ අරමුණු ඉටු කළේ ය. දැන් ඉතිං නාඩගම නැටිය යුතු ය. 'දැන් මොකද කියන්නේ' යැයි අසන්නාක් මෙන් මම දුල්ලෑවගේ බිරිඳ – විශ්වගේ මව දෙස බැලීමි.

ඇගේ නළියන දෙනෙතේ ගුලි ගැසුණු කඳුළු දෙපේළියක් ගලා හැළෙමින් තිබිණ. මම ඇගේ බොඳ වෙමින් යන දෑස දෙස බලා ගත් වන ම සිටියෙමි. 'දඩාස්' ගා දොර වසා ඇය කාමරයෙන් ඉවත් වූවා ය.

මා යහනින් නැගිට්ටා ම නොව නැගිට්ටිණි. වටපිට බැලීමි. දුල්ලෑව කටින් පෙණ දමමින් වමනය කරමින් සිටියේ ය. බෝතලයේ ඉතිරි අරක්කු සියල්ල මම ඔහුගේ හිසේ සිට පහළට වත් කළෙමි. 'මං උඹල ඔක්කොම මට ඕන විදිහට නටවනවා' යැයි මම මට ම කියා ගතිමි.

මව ඇගේ දෑසේ නැඟුණු කඳුළු මගෙන් සැඟවීමට උත්සාහ නොකළා ය. මට මගේ කඳුළු සිහි වි ය. ගැහැණුන්ගේ ඇස්වලින් හිටිගමන් එළියට කඳුළක් කඩා පතින්නේ කුමකට දැයි මම ප්‍රත්‍යක්ෂයෙන් දැන සිටියෙමි. ඈ හඬවන්නට මගේ සිත, ගත ක්‍රමෝපායන් සෙව්වත් කඳුළ දුටු විට එහි බියකරු බේදයක් ඇතැ යි මම බිය වී තිගැස්සී සිටියෙමි.

මං දුල්ලෑවගේ කාමරයෙන් නික්මෙන්නට තීරණය කළෙමි. එහෙත් තවත් යමක් ඉතිරි වී ඇතුවාක් මෙන් මම නැවතත් දුල්ලෑව සමීපයට ගියෙමි. ඔහු ශබ්ද නඟා මුව තුළින් ගොජ දමමින් .... ගොර අදිමින් ..... මස් පර්වතයක් මෙන් උඩුබැලිව හොත් තැන ම ඔත්පළව මෙන් උන්නේ ය. මම ඔහුට ඇසෙන නොඇසෙන ගුප්ත හඬකින් කතා කළෙමි.

උඹල ඔක්කෝම මගේ ජීවිතය සෙල්ලමක් කර ගත්තොත්: මං උඹල ඔක්කොම මගේ ජීවිතයේ සෙල්ලමක් කර ගන්නවා. මං කැමැත්තෙන් හිටිය උඹලට අම්ම තාත්තලාට වගේ සලකන්න. ඒත් උඹලට ඕන කළේ මාව දූවෙක් කරගන්න නෙමෙයි. මට තවත් රිද්දුවොත් මං උඹලව ටික ටික රිද්දල මගේ ලෝකේ දිනා ගන්නවා.'

මා කියූ දේ කොතෙන්ට, කුමකට ගැළපේ දැයි මට නිච්චියක් තිබුණේ නැත. නැවතීමක්, විරාමයක් නැති අප්‍රභංස පරිච්ඡේදයක, නොවැටහෙන ප්‍රහේලිකාවක් බවට මම ඉබේට ම තල්ලු වෙමින් සිටියෙමි.

දූල්ලෑවගේ කාමරයෙන් නික්මීමට පෙර මම ඔහුගේ කමිස සාක්කුවට අත ලෑවෙමි. එහි තිබූ සිල්ලර කාසි හැර සියලු ම මුදල් කොළ මම සොරා ගතිමි. ඒ තැන කෙතරම් මුදල් තිබේ දැයි ගණන් කර බලන්නට මම උත්සාහ නොකළෙමි. කොයි මොහොතේ හෝ මට මුදල් ඕනෑ වේතැ යි යන හැඟීම පමණක් ම සොරකමට මා පෙළඹී ය.

පිස්සියකෘ: විරහිනියකෘ පෙරක මෙන් මම විස්සෝපයෙන් විශ්වගේ කාමරයට පාවී ගියෙමි. යගදාවෙන් පහර කෑ බැළලියක මෙන් මම අනන්ත පීඩාකාරී චිත්ත වේගයක සිර වී සිටියෙමි. විශ්ව සමහ කතාබහ කර මේ පීඩාව නිදහස් කරලීමට ඇත්නම් කෙතරම් සහනයක් ද? එහෙත් ගිරිහිසක සිට ඇද හැළෙන සීතල ජල කඳක් හමුවේ පර්වතයක් මෙන් ඔහු මට හරස් වී සිටියේ ය.

මම සියුම් හඬින්, සමු ගැනීමට ආසන්න වූ හැඬුම් ස්වරයෙන් ඔහු ඇමතීමි.

'විශ්ව....'

ගුගුර ගුගුරා හැතුණ හෙණ හඬ දරන මහා වෘක්ෂයක් මෙන් ඔහු නිහඬව සිටියේ ය. දරන්නට බැරි නිශ්ශබ්දතාව මහා බරකි.

'මම යනවා විශ්ව. සමහර විට කවදාවත් නොඑන්න. කවුරුවත් මට ආදරේ නෑ. කවුරුවත් මං දිහා බලන්නේ නෑ. ඔක්කෝටම මාව එපාවෙච්ච එකියක්. මේක මගේ ඉරණම වෙන්න ඇති. ඔයා මාව හොයාගෙන ආවා. මං හිතුවෙ ඔයාට බොහෝම දයාබර හිතක් තියනව කියලා. තාමත් එහෙමයි. මමත් ඔයත් එක්ක ගොඩක් දුර ආව. කවදාක හරි ඔයාට තේරෙයි. ගෙවාගන්න බැරි දුරක් මම ආව විත්තිය. අතරමගදී ඔයා මට දරුවෙක් දුන්න. ඔයා දන්නවා .... හොඳටම දන්නවා....



ඔයාගේ හිත දන්නවා .... කොච්චර ආදරෙන් ඔයා මගේත් එක්ක එකට හිටියද කියලා.... පුදුම හිතෙන තරම් ආදරයක් ඔයාගේ තිබුණේ. මම ඒ විශ්වට තවමත් ආදරෙයි. ඒ තමයි සදාකාලික විශ්වය. මම යනව විශ්ව.... ඔයාගේ මේ මූසල මහා මන්දිරයෙන් මම යනවා. මට ආදරේ කරපු, මම ආදරේ කරපු විශ්ව කවමදාක හරි මට හමුවෙයි. මගේ කුසේ ඔයාගේ දරුවෙක් ඉන්නවා. මං පුංචි කාලේ ඉඳල දුක හදාවඩා ගත්තා. දැන් මට මගේ දුකින් දරුවා හදා වඩා ගන්න පුළුවන්.'

මම දෙදණ ඔබා ඔහුට වැන්දෙමි. ඔහු යහනේ උඩුබැලිව සිටියේ ය. ඔහුගේ දෙපා මම කිටි කිටියේ වැළඳ ගෙන මගේ හිස ඔහුගේ දෙපා මත ඔබා ගෙන සිටියෙමි. ප්‍රාණය නිරුද්ධ සිරුරක දෙපා මෙන් ඒවා නොසෙළවී, ගල් ගැසී තිබිණ.

'මං යනවා විශ්ව....'

මම හිස ඔසවා කීවෙමි. ඔහු දෑස වසා සිටී. කතා නොකර සිටී ඇසිපිය නොහෙළා සිටී. ගල්හිත වී සිටී. මම නැඟී සිටියෙමි. පියවර කිහිපයක් ඔහු දෙස බලා ගත් වන ම දොර දෙසට පිය එසවීමි. ඔහු යාන්තම් ඇස හැර බැලුවේ ය. මම දොර අභියසට වී ඔහුගේ දෑසට එබී මෙසේ කීවෙමි.

'මම යන්නම යනවා විශ්ව...'

අවකාශයේ කිසිවක් ඉතිරි නොවන පරිදි සියල්ල උරා ගත්තාක් මෙන් ඔහු දෑස වසා ගත්තේ ය. මම කාමරයෙන් නික්මුණෙමි.

දූල්ලෑවගේ කාමරයට ගියෙමි. කඩිනමින් දොරෙන් එබුණෙමි.

'මම යනවා.

ඔහුට එය ඇසුණ ද, නැසුණා දැයි මා දන්නේ නැත. මම කාමරයෙන් කාමරයට එබුණෙමි. මට නවාතැන් දුන් කාමරයේ හිස් අවකාශයට කතා කළෙමි.

'මම යනවා. මට මෙහෙ ඉන්න ඉඩ නෑ යන්නම්...'

හිමි හමින් තරප්පුව බැස මම කුස්සි කාමරය දෙසට ගියෙමි. වන මෘග ගෝරනාඩුවකට හසු වූ මුවැත්තෝ, මුවැත්තියෝ කාමරයේ ගාල් වී සිටිය හ. ලීලා.... සිරිදාස.... ඇතුළු අහිංසකයන්.... ඒ කිසිදු දෑසක

සතුටක් තිබුණේ නැත. හැම ඇසක් ම වියළි ය. හැම ඇසක් ම බිමට බර වී ය. හැම ඇසක් ම විසඳුම් රහිත ය. මම බිමට බර නෙත් එසවෙන තෙක් සිටියෙමි. අසරණ ඇස්වලට කතා කළෙමි.

'මම යන්න යනවා. ඕගොල්ලෝ විශ්ව මහත්තයා හොඳින් බලාගන්න. මට වෙන කරන්න දෙයක් නෑ. මං යන්නම් හොඳේ...'

වියළි ඇස් තෙත් වී ය. එහෙත් ඇස් මිස වචන කතා කළේ නැත. ඇතැම් විට ගිල ගත් වචන මා පිටු පා යන විට කඳුළු වී බිම හැළෙන්නට ඇත. මම දොර ළඟ දී නැවත හැරුණෙමි.

'මං යනවා....'

අවසන මම විශ්වගේ මව ඉන්නා කාමරයට ගියෙමි. එහි දොර වසා තිබිණ. මම නිසොල්මනේ දොරට කන් දී සිටියෙමි. හාවක් හුවක් නැත.

'ටක්.... ටක්.... ටක්...'

දොරට තට්ටු කළෙමි. දොර විවර වුවේ නැත.. දොරටුව ළඟ සිට මම කාමරයේ ඇතුළට කතා කළෙමි.

'මං යනවා අම්මෙ. යන්නෙ කොහෙද කියල මන්දන්නේ නෑ. ඒත් මං යනවා. මං වැරදි කරල නැති හින්ද සමාව ඉල්ලන්නේ නෑ. මට මේ ගෙදර අඬ අඬා ඉන්නත් බෑ. හිනාවෙන්නත් බෑ. මේ ගෙදර මං ස්වාමි දුවත් නෙමෙයි. මෙහෙකාරියත් නෙමෙයි. මං විශ්වගේ බිරිඳ. ඒත් අම්මලාට පේන්නෙ මං වනචර හැතිරියක් වගේ. ඉතිං මං මොකටද මේ ගෙදර ඉන්නෙ... අම්මල මොකද මාව මේ ගෙදරට එක්කගෙන ආවේ....? මං යනවා අම්මෙ....?'

මම නික්මුණෙමි.

මහපාර, මම පාර පනින්නට හදන හදිස්සිකාර ළදැරියක මෙන් එ පිට, මෙ පිට බැලීමි. ආපසු හැරී බලන්න සිත් නොදුන්නත් ..... විශ්ව කොහේ සිට හෝ මදෙස බලා සිටිතැ යි සිතා මම ගෙල හරවා බැලීමි. නැත කිසිවෙකුත් නැත.

මම නික්මුණෙමි.

ටික දුරක් හෙමින් ගමන් කළෙමි. බොහෝ දුර යන්නට ඇතැ යි සිතෙන විට පය ඉක්මන් වේ. වේගය වැඩි වේ. එහෙත් පයින් ගමන්



කිරීමේ සීමාවක් තිබේ. සීමාව කො තෙක් දැයි මා නොසිතුව ත්, සිතට පෙර ගත අඩපණ වී ය. පීඩාවෙන් නෙත් වන ගත දහදියෙන් නැහැවේ. මම මහමග නැවතී මොහොතක් බලා සිටියෙමි.

මේ කටුක නගරය වුව ද බෙහෙවින් නිදහස් යැයි මට සිතේ. තැන තැන වුව ද මැළැවෙමින් තිබූ ගහකොළ තමන්ගේ පාඩුවේ ඉන්නට තැත් දරයි.

රාජගිරිය.... නාවල..... විවෘත විශ්ව විද්‍යාලය.... නුගේගොඩ.... මම නුගේගොඩ හංදිය තෙක් පැමිණ සිටියෙමි. අතරමං වූ එකියක දෙස බලනවාක් මෙන් දහසක් ජනයා උකුසු ඇස් යොමා සිටිය හ.

මම ත්‍රීවීලරයක් නතර කළෙමි.

'පිටකොටුව....'

බෝ ගහ ළඟින් හයිලෙවල් පාරට පිවිසි රථය වේගයෙන් ඉගිළෙයි. මම හිස මඳක් ඇලයකට යොමු කොට සිටියෙමි. ක්ලාන්ත ගතියක් දැනුණත් මම සිතින් ද, ගතින් ද එය මැඩ ගැනීමට වෙහෙස ගතිමි. දෑස අඩවන් කොට නිසොල්මන් වීමි. එහෙත් එහෙටත් මෙහෙටත් පැද්දෙමින් ගැස්සෙන ත්‍රීවීලරය දැඩි ශාරීරික අපහසුවක් ගෙන දේ.

'හිමින් යන්න. ගැස්සෙනවා...'

මම අසරණ වී සිටිය ද අණ කිරීමේ හඬකින් කීවෙමි. රියදුරා පැති කන්නාඩියෙන් බකුසු බැල්මක් හෙළා ගුරුළු ගමනින් පියාඹන්නට වි ය.

'හිමින් යන්න ගැස්සෙනවා. ගැස්සෙන්න හොඳ නෑ මං අසනීපයෙන් ඉන්නෙ.'

එ විට රියදුරා වේගය අඩු කළේ ය. තවත් ටික දුරක් ඉදිරියට යන්නට හැර රියදුරා කතා කළේ ය.

'නෝනා අසනීපයෙන් නම් තනියම යන්නෙ?'

'එහෙමට අසනීපයක් නෙමෙයි. ගැස්සෙන්න හොඳ නෑ.'

'ඒ කිව්වෙ නෝනා?'

'තමුසෙට ඔක්කොම කියන්න ඕනද?'

මම තර්ජනය දැම්මෙමි.

For E-Pusthakalaya

'තෝනා නිකං ළමයි හම්බුවෙන්න ඉන්න අම්ම කෙනෙක් වගේනෙ?'

රියදුරා සෝපහාසයෙන් කීවේ ය. ඉන් පසුව වැල්ලවත්ත රෙදිමෝල හරියේ දී රථය අතුරු පාරකට දමා වේගයෙන් ධාවනය කළේ ය.

ජීවිතය වරදින්නට පටන් ගත් විට එයට නැවතීමේ ලකුණු යෙදෙන්නේ නැත. ප්‍රශ්නාර්ථ පිරි වැරදි පරිච්ඡේදයක් ම ජීවිතය කනපිට පෙරළන්නට පටන් ගනියි. ඒ වන විටත් ත්‍රිවීලරය අතුරු පාර දිගේ තරමක් දුර ගමන් කොට තිබුණි. සැණෙකින් ක්‍රියාත්මක නොවුණොත් ජීවිතය අතරමග අනතුරකට වැටෙනු යි මම තැති ගතිමි. මහ පාරේ ජීවිතයෙන් ලද පන්හරය මම ශරීරයට ආරෝපණය කොට ආවේග වීමි.

'නවත්තපං වාහනේ'

මම පාදඩ වචන භාවිත කළෙමි. අණ කළ සැණින් වාහනය නතර වි ය.

'පිටකොටුව තියෙන්නේ මේ මුඩුක්කු අස්සෙද? කොහෙටද මාව ගෙනියන්න හදන්නේ?'

'පොඩි උදව්වක් කරන්න හැදුවෙ? අමාරුවෙ වැටිල නම් ගොඩඑන්න. දරුව ලැබෙන කල් ඔය ඉස්සරහ ලොජ් එකේ නතර වෙලා ඉන්න පුළුවන්. කන්න, බොන්න, සල්ලි ලැබෙයි. නැතිනම් නිකං තියෙන ශරීරෙනේ? ඔය කාලේ කීයක් හරි හම්බකර ගත්තොත් තමයි.'

රියදුරා තීරණාත්මක ලෙස මදෙස බලා දැස විරිත්තුවේ ය.

'උඹ හිතුවෙ මම මහපාරේ වල්කමේ යන ගෑණියෙක් කියලද?'

මම ත්‍රිවීලරයෙන් බැස ගතිමි. රුපියල් හැටක් ඔහුට ගෙව්වෙමි.

අතුරු පාරේ බොහෝ දෙනා මා මුහුණ දුන් අකරතැබ්බය තේරුම් නොගන්නට ඇත. නමින් නොහඳුනතත් මම ඔවුන් මනැසින් හඳුනා ගතිමි. ඔවුහු නුවර ගුඩ්ෂෙඩ් එක අයිනේ ප්‍රේමක්කා, චූටිටෙ, මොහොමඩ්, විල්බට් අයියා වැනි චරිතයන් ම ය. මම මොහොතක් අස්වැසිල්ලක් ලබා පයින් ම මහපාර දෙසට ගමන් කළෙමි.

ජීවිතය බස් නැවතුමේ හෝරාවක් පමණ කාලකන්නි වි ය.



මුලින් ම මා තීරණය කළේ නුවර ගෙදර යන්නට ය. නතිව අකීකරු ගමනක් අබිනික්මන් කොට බඩගෙඩිය ත් සමඟ නුවර ගෙදරට ගොඩ වීමේ නොහැකියාව නැවත නැවතත් සිතට වධ දෙන්නට වි ය. තාත්තාගේ මුහුණ බලා ගෙන ගෙදර හුදෙකලා වීමට ත්: අම්මාගේ ජීවිතය තවත් පීඩාවට පත් කිරීමට ත් මම නොරිසි වීමි.

විශ්වට වෙදකම් කරන දොස්තර තිලක් ජයසෝම මුණ ගැසී මේ සියල්ල ඔහුට කියා පෑමට සිතුව ත්, නනිපංගලමේ ඔහු මුණ ගැසී නොවලහා සියල්ල හෙළි කිරීම මදිකමකැ යි සිතිමි. කිසිවෙකුට ත් නොව විශ්වගේ ජීවිතයට එය කැළලක් වෙතැ යි සිතා මම දෙවරක් නොසිතා ම එම ගමනට තහංචි දමා ගතිමි.

වඩාත් හුරුපුරුදු දුල්ලෑව කොම්පැනියට ගොස් බඩගෙඩිය ත් දරාගෙන එහි එහා මෙහා සක්මන් කිරීමට ද වරක් සිත් වි ය. නොහික්මුණු මගේ සිත එය කළ යුතුම යැයි බල කළේ ය. මා පමණක් නොව මුළු ලෝකය ම මා ගැබිනියක් බව දත යුතු යැයි මම සිතිමි. වෙන ම බෝඩිමක නැවතී හෙට සිට කාර්යාලයට ගොස් එහි කටයුතුවලට සහාය වී අවුල් ඇති කළ යුතු යැයි ද සිතා සිටියෙමි. එහෙත් මා කරන ආත්මාර්ථකාමී සියල්ලක් ම විශ්ව දෙසට පෙරළා බූමරංගයක් වෙතැ යි මම බිය ගතිමි.

කළ නොහැකි ම දේ වූයේ නැවත දුල්ලෑව මන්දිරයට පය ගැසීම යි. මහපාරේ තනි වීම ඊට වඩා යෙහෙකැ යි සිතිමි. දෙමාපියන් සමඟ ළඳැරියකව සිටියදී මහපාරේ ජීවිතය සිහිවටනයක් වූව ද එහි කටුකත්වයෙන් මම තුෂ්ණිම්භූත වීමි. ඇරත් විශ්වගේ සහජාත දරුවා පදික වේදිකාවෙක උපද්දන්නේ ඇයි? කුස ඔත් දරුවා මා විඳි දුක් නොවිඳිය යුතු ය. මගේ උරුමය නොව ඔහුගේ උරුමය රැක නොදීම මා මාතෘත්වයට කරන මදිකමකැ යි සිතිමි. එ හෙයින් මහපාරේ ජීවත් විය යුතු ය යන්න ද මා විසින් ම ඉවත හෙළන ලදී.

අවසන ඉතිරි වූයේ කළ නොහැකි ම දේ කළ යුතු බවට ගත් තීරණය යි. මම බසයකට අත දමා නවතා නුගේගොඩ බලා නැවත පිටත් වීමි.

මේ ගමන කෙළවර වන්නේ මා පිස්සියක වී අංගොඩ මානසික රෝහලෙත් වීමට ත් පුළුවන. මිනීමරු ළියක වී වැලිකඩ හිර ගෙදරින්

විමට ත් පුළුවන. එසේත් නැති නම් ඔවුන් මා මරා දමා මගේ සිතල මළකඳ රෝහල් මෝචරියක තිබෙන්නට ද පුළුවන. කෙසේ වෙතත් මම නුගේගොඩින් බැස ගතිමි.

මගේ මානසික තුලනය ගිලිහී යමින් තිබිණ. පරාජය හා අපේක්ෂා භංගත්වය දරන්නට බැරි තරම් සිත චංචල කළේ ය. ආදරය ද, විකල් බව ද සමඟ දරු සෙනෙහස ද වඩ වඩාත් හද ගැබින් මෝදු වන්නට වි ය. නන්නාඳුනන විසල් නගරයේ විශ්ව..... විශ්ව..... විශ්ව.... යැයි කෑ ගසමින් එහෙ මෙහෙ දිව යන්නට මට සිතේ. විලාප දී කෑ ගසා 'මට මගේ විශ්ව දෙන්න' යැයි ඝෝෂා කරන්නට මට සිතේ.

මට මගේ සිතේ භයංකර සිතුවිලි දාමය පළ කරන්නට අවකාශ නැතියෙන් වාරු සිඳුණු, රුවල් බිඳුණු ඔරුවක් බවට මම පත් වීමි. මම මහත්ම වූ මානසික හිඩසකින් පෙළෙන්නට වීමි.

විශ්වගේ පියා සමඟ කිටි කිටියේ තද වී යහනත ගුලි වී සිට මා විශ්වගේ මවට කළේ කිසි ද සමාව ගත නොහැකි නොදැමුණු ක්‍රියාවක් නොවේ ද? මගේ අම්මාට එය සිදු වී නම් මා කුමක් කරාවි ද? මේ සියල්ල විශ්ව හමුවේ කවද හෝ සාධාරණීකරණය කරන්නේ කෙසේ ද?

දැන් ඉතින් විශ්ව සොයා යා යුතු ය. ඔහුගේ පය පාමුල සියල්ල නැවත නැවතත් දිවුරා පාපය සෝද හළ යුතු ය. විශ්වගේ පළල් උරතලයේ හිස සතපා සැනහි මිය යා යුතු ය. සාක්ෂි නැති මරණයකට වඩා හෘද සාක්ෂියක් සහිත මරණය වඩා ගෞරවනීය නොවේ ද?

මම රාජගිරි උද්‍යානයට යෑමට නුගේගොඩින් බස් රථයකට ගොඩ වීමි. නාවල පසු කොට මදක් තැන් ගොස් බසයෙන් බැස අඩක් විවර වූ ගේට්ටුවෙන් නැවතත් මගේ ශූන්‍ය වූ ආත්මය ගුප්ත මහා මන්දිරය දෙසට පා කළෙමි.

නිහඬ බව අබ මිටක් බිමට වැටුණත් හඬ නැඟෙන තරම් සියුම් ය. ගුප්ත බව හොල්මනක දත්මිටි කනවා තරම් හිරිකිත ය. පාලුව මූසල සොහොන් පිටියක පාලුවට දෙවැනි නොවී ය. මුළු නිවස ම පරඬැලකි. සීතල අමු සොහොනකි.

මම කාමරයෙන් කාමරයට සක්මන් කළෙමි. කිසිදු අමුත්තක් නැත. විශ්ව දවාල ද රැය ද නොදන්වා මෙන් හිටි ඉරියව්වේ ම සිටී.



පැය ගණනක් මේ නිවස කිසිදු වෙනසක් නොවී තිබෙන හැටි... මම විශ්ව සමීපයට යෑමට බිය වීමි. ඈතින් සිට කතා කළෙමි.

'මං ආව විශ්ව. මං ආයෙත් ආව. මට ඔයා නැතුව ඉන්න බෑ විශ්ව.'

ආවා ද, ගියා ද, ආවා ද කියා ඔහු දන්නේ නැත. රැය ද දවාල ද කියා ඔහු දන්නේ නැත. ප්‍රේමය ද වෛරය ද කියා ඔහු හඳුනන්නේ නැත. බිරිඳ ද පෙම්වතියද සැතිරියක ද කියා ඔහුට වැටහීමක් නැත.

මම දුල්ලැවගේ කාමරයට ගියෙමි. ඔහු දෑස අඩවන් කොට ගොරෝද්ද අදිමින් සිටී. ඔහු නිසල ය. නිහඬ ය.

මම රී ළඟට මවගේ කාමරයට ගියෙමි. තවමත් දොර වැසූ ගමන් ය. මම දෙතුන් වරක් දොරට තට්ටු කළෙමි.

'අම්මෙ.... අම්මෙ..... අම්මෙ....'

දොරට තට්ටු කොට බැරි ම තැන මම දොරට තඩි බෑවෙමි. සද්ද බද්දයක් නැත. මම දොරට වැරෙන් පහර දෙමින් කතා කළෙමි.

'අම්මෙ..... මට සමාව ගන්න ඕන අම්මගෙන් විතරයි. අම්ම මට වැරදී කළා තමයි. ඒත් මං කළේ හදන්න බැරි වැරැද්දක්. සත්තයි මං බොරුවක් කළේ. මේ දරුව මගේ. මගේ කුසේ ඉන්න දරුව මගේ. මගේ .... මගෙයි විශ්වගෙයි. එහෙම නැතුව දුල්ලැව මහත්තයගෙ නෙවෙයි. මං කවදවත් අම්මට හතුරු වෙන්නේ නෑ. මං බොරුවක් කළේ. මේ ඔක්කොම හදන්න පුළුවන් අම්මට. අම්ම තීරණයක් ගන්න. මට වෙනසක් කරන්න එපා මගේ අම්මෙ...'

මම දොර ළඟ වැඳ වැටුණෙමි. ඇය දොර හැරියේ නැත. මගේ හඬට කුස්සියේ සිටි සේවක සේවිකාවෝ ද නැවතත් රොත්ත පිටින් මා සිටි තැන වට කළෝ ය.

'ඇයි නෝනා ආයෙත් ඇවිල්ලා?'

'මට අම්මගෙන් සමාව ගන්න ඕන.'

'ඉතිං නෝනා දොර අරින්න.'

'දොර අරින්නේ නෑ. වහගෙන ඉන්නෙ?'

For E-Pusthakalaya

සේවකයෝ ද දොරට තට්ටු කළ හ. දොර හැරුණේ නැත.

ලීලා පුටුවක් ගෙන දොර ළඟින් තබා ඉහළ ගරාදිය අස්සෙන් කාමරය බැලුවා ය. ඇස් උඩ දමා හ්හ්... මී ගා ඉහළ ගත් හුස්ම පිට නොකර ම ඇය පුටුව ත් සමඟ ම බිමට ඇද වැටුණා ය.

'මොකද ලීලා?'

සේවකයෝ ඇය වට කළ හ.

'ලොකු හෝනා බාල්කෙ එල්ලිලා මැරිලා.'



# 15

ඉලංගකෝන් දුල්ලෑව මාතාව දිවි නසා ගැනීමෙන් දින තුනකට පසුව බොරැල්ල කනත්තේ දී සියලු ගෞරව බුහුමනින් යුතුව භූමදානය කෙරිණි.

ළදැරියක අතින් වැරදීමකින් බිඳුණු සම්බුද්ධ ප්‍රතිමාවක හැඩරුව නැවත සකසන්නට මෙන් මම නැවත නැවතත් මරණය සිදු වූ දින සිට දින කීපය ගැට ගසන්නට වීමි. 'මව මරා දමා සිල් රකිනා උවැසියක' මෙන් මම වික්ෂිප්තව සිටියෙමි.

'ලොකු හෝනා බාල්කේ එල්ලිලා මැරිලා' යැයි ලීලා කී සැණින් පා පහර දෙක තුනකින් කාමරයේ දොර දෙපලු වී ගියේ ය. දුල්ලෑව වෙරි හිඳී දෙපයින් සිට ගත්තේ ය. දුරකථනය කීප විටක් ක්‍රියාත්මක විණි. සෝෂා නැඟුණි. දුල්ලෑව පැය කීපයක් යන තුරු නොහඬා සිටියේ ය. ඔහුගෙන් පිට වූයේ අණ කිරීම් හා තීරණ පමණි.

'පුතා ගැන දුක උහුලන්න බැරුව කරගත්ත දෙයක්. මේකට මේ ගෙදර කවුරුවත් වග කියන්න ඕන නෑ.'

පළමු තීරණය එය වි ය. සියල්ලෝම එකඟ වූ හ.

පොලිසිය පැමිණියේ ය. පශ්චාත් මරණ පරීක්ෂණය කෙරිණි. සාක්ෂි සටහන් කෙරිණි. ප්‍රශ්න කිරීම් කෙටිව කෙළවර වි ය. විශාල රථවාහන ප්‍රමාණයක් මන්දිරය ආක්‍රමණය කළේ ය. සුදු වතින්, සුදු සැරසිල්ලෙන් සියල්ල වැසී ගියේ ය.

'සිය දිවි හානි කර ගැනීමක්.'

දුල්ලෑව මන්දිරය පැය කිහිපයක දී ගරු ගම්භිර මළ ගෙදරක් බවට පෙරළිණ.

මම විශ්ව සොයා ගියෙමි. ඔහුගේ හිස දෝතට ගත්තෙමි.

For E-Buddhalaya

'විශ්ව...'

කඳුළු නොහෙළා කතා කළෙමි. බියට ද දුකට ද නොදත් කඳුළු නැති ගැනීමෙන් සැඟවිණ.

'අම්මා අපිව දාල ගිහිල්ලා.... විශ්ව.... ඔයාගේ අම්ම....'

මොහොතක නිහැඬියාවකින් පසු විශ්ව නැඟී සිටියේ ය. ගිඩි ගිඩි ගා මා සොළවා සොළවා විනාඩි කිහිපයක් ගැහි ගැහී සිටි ඔහු යහන මතට ඇද වැටුණේ ය. ඔහුගේ කාමරයට පිටස්තරව සිදු වූ දේ කිසිවක් ඔහුගේ කල්පනාවට හසු වී තිබුණේ දැයි මම නොදනිමි.

අඳුර පමණක් හාත්පසින් එබෙමින් තිබිණ. මම ඔහුගේ මුහුණ සේදුවෙමි. සුදු කමිසයක් ඇන්දුවෙමි. කලිසම අන්දා කමිසය එයට යට කළෙමි. හිස පීරුවෙමි. සිහිනි පිළිදෙකු මෙන් විශ්ව සියල්ලට ඉඩ දුන්නේ ය.

'යමු. යමු විශ්ව.... මං ඔයා ළඟ ඉන්නවා.'

මම විශ්ව ද සමඟ මැද සාලයට පැමිණියෙමි.

රාත්‍රිය එළඹෙමින් තිබිණ. සුදුවන ඔතා විශාල ගුරුපාට පෙට්ටියක මවගේ සිරුර බහා තිබිණ. පිත්තල පහන්, ඇත් දළ, මල් වඩම්, වට කිර... සියල්ල සූදානම් වී තිබුණාක් මෙනි. ඉදහිට පැමිණෙන ගරු ගම්භීර අමුත්තන්ගේ ආචාර කිරීම්වලින් නිහඬතාව තීව්‍ර කොට තිබිණ. මම විශ්ව කැඳවා ප්‍රාණය නිරුද්ධ සිරුර අභියසට ගියෙමි.

මොහොතකට සියල්ලෝ ම ගල් ගැසී සිටියෝ ය. මැද සාලයේ සිටි සැම දෙනාගේ දෑස් අප දෙසට එල්ල වී ය. විශ්ව වඩාත් තීරණාත්මක පියවරක් ගනිතැ යි ඔවුන් මෙන් ම මම ද අනුමාන කළෙමි. විශ්ව බොහෝ වෑයමින් දෑත එකතු කොට අම්මාට වැන්දේ ය. හිටි පියවරේ ම එම වන්දනීය ඉරියව්ව බොහෝ වේලාවක් ශාන්ත තවුස් වෙසින් පැවතිණ. ඔහු මිමිණුවේ භය හතර නොතේරෙන කුඩා දරුවෙකුගේ මුවින් නික්මෙන අකුරු පෙළ පමණි.

'අම්මා...'

සියුම් ම සියුම් විශ්වගේ හඬ නිහඬ වටපිටාවේ හතර බිත්ති දෙදර වන්නට සමත් වි ය. මම මහා හයියෙන් හැඬුවෙමි. විශ්ව වෙවුළමින් දෑත දෙපසට ගත්තේ ය. දේහය අද්දර පහන් තිරෙන් නික්මෙන මුසල



එළියට විශ්වගේ දෑසින් ගලා ගිය කඳුළු දෙපේළිය දිලිහිණි. සිත් පිත් නැත්තෙකු මෙන් ඔහු ආපසු හැරුණේ ය. මම පසු ගමන් ගත්තෙමි.

කිසිවෙකුට මුහුණ නොදී සිටීමට මම තීරණය කළෙමි. මරණයේ භූමදාන කටයුතුවලට උදව් වීමට තබා කිසිදු අමුත්තෙකු සමඟ ඇසට ඇස මුණ ගැසීමට ද මම නොකැමැති වීමි.

මම විශ්වගේ සියලු කටයුතු කරමින් ඔහුගේ කාමරයට ම වැදී සිටියෙමි. දිනකට දෙවරක් බැගින් විශ්ව කැඳවා ගෙන විත් දේහය අබියසට වී සිටියෙමි. ඒත් බොහෝ විට සෙනඟ අඩු වේලාවක් බලා එ තැනට යාමට තරම් මම කල්පනාකාරී වීමි.

දුල්ලැව වුව ද මුහුණට මුහුණ මුණ නොගැසීමට මම කල්පනා කළෙමි. ඇතැම් විටෙක පමණක් ඔහු දෙකම්මුලේ දෑත රුවා ගෙන දේහය අබියසට වී සිටියේ ය. ඔහුගේ දෑසේ ඇති හැඬීම මැන ගැනීමේ වුවමනාවක් තිබුණ ද මම ඔහු හැකි තරම් මග හරිමින් සිටියෙමි.

මරණය සිදු වූ දා රාත්‍රී පුරාවට මට නින්ද ගියේ නැත. කෑමක් බීමක් තිබුණේ ද නැත. විශ්වට ද නින්ද ගියේ නැත. ඔහු දෑස අයා ගත් වන ම සිටියේ ය. කතා කිරීමට බොහෝ දේ තිබුණත් මම අත්‍යවශ්‍ය විටක දී හැර ඔහුට කතා නොකළෙමි. මුළු රැයක් පුරා ඔහු එකදු වචනයක් වත් දෙඩුවේ නැත. පාන්දර තුන හතර පමණ වන විට විශ්ව යන්තම් ඇහැ පියා ගත්තේ ය. මම කඩිනමින් කුස්සියට ගොස් විශ්වට තේ සාදා දීමට අවශ්‍ය දෑ කාමරයට ගෙනැවිත් තැබීමි. කීප විටක් ම විශ්ව සිහිනෙන් තිගැස්සිණි.

'විශ්ව .... මම ඔයා ළඟ ඉන්නවා.... නිදාගන්න.'

ඒ හැම විට ම ඔහුට සමීප වී මම එසේ තෙපළීමි.

පරපුරක නෑදෑයෝ ද, මිත්‍රයෝද නානාප්‍රකාර අය ද මළ ගෙදරට ආ හ. ඒ හැමෙකෙක් ම මවගේ දේහය පමණක් නොව කාමරයට එබී අප දෙදෙනා ද නිරීක්ෂණය කිරීමට අමතක නොකළ හ. කිසිවක් කතා නොකර අමුතු සත්තු දෙස බලන්නාක් මෙන් ඔවුහු කාමරය පුරා ම, අප දෙදෙනාවත් නිරීක්ෂණය කරති. ඒ දෑස් හැමෙකක් ම ගුප්ත සෙයකි. වසංගත රෝගීන් දෙස බලන, උමතු වූවන් දෙස බලන ආකාරයේ ඒ දෑස්වලට මම මුහුණ නොදී සිටියෙමි.

බොහෝ අය අප සමඟ කතා කළේ නැත.

භූමදානය දිනට පෙර දින රාත්‍රී මැදියමේ පමණ මම අම්මාගේ දේහය අභියසට ගොස් වැඳ වැටී බොහෝ වේලා සිටියෙමි.

'මේ මිරණයට වග කියන්න ඕන මම. මට සමාවෙන්න මගේ අම්මේ.... අම්මා හිත රිදවා ගන්න ඇති. අම්මා සැක හිතන්න ඇති. මම වල් ගෑණියෙක් කියලා ඇත්තටම හිතන්න ඇති. මම විශ්ව රවටා ගත්තා කියල හිතන්න ඇති. මං මුළු පරම්පරාවටම පිළිලයක් කියලා හිතන්න ඇති. අනේ.... මට සමාව දෙන්න. මේ පාපයට මං කවද වන්දි ගෙවන්නද? මං මහම මහ මෝඩ එකියක්.... මං පළිගන්න කළදේ අම්මා ඇත්තට හිතන්න ඇති. තමන්ගේ ගෙදර තමන්ගේ මිනිහත් එක්ක බුදිය ගන්න දැක්කාම ඒ බිරිඳට ඉවසන්න බැරි බව මට තේරෙනවා.... මට ජාති ජාතික් සමාව දෙන්න මගේ අම්මේ....'

මම දස දහස් වතාවක් සිහින් පින්සෙන්ඩු වෙමින් දෙදණ ඔබා දේහය අභියසට වී සිටියෙමි.

පසුව දුල්ලෑවගේ කාමරයට ගියෙමි. ඔහු නිදි නැතිව රතු වූ දෙනෙතින් යුතුව කාමරයේ සක්මන් කරමින් සිටී. මම ඔහු අභියසට ගියෙමි. ඔහුගේ පා අල්ලා බිම වැටී ඔහුට වැන්දෙමි.

'මට සමාවෙන්න. මට දැනටමත් දීල තියෙන සමාව හොඳටම ඇති. ඒත්.... මට සමාවෙන්න.'

මම ඔහුගේ දෙපා අල්ලා වැන්දෙමි. දැහැමි සහරුවනකගේ මෙත් අතක් මෙන් දුල්ලෑවගේ ගොරෝසු අත මගේ හිස මත රැඳිණි.

'පුතා ඉන්න තැනට යන්න. පුතාව බලාගන්න.'

මහා ඉවසුම් සහගත හැඩුම්බර ශාන්ත හඬකින් ඔහු කිවේ ය. මම නැවතත් ඔහුට වැඳ විශ්වගේ කාමරයට ගියෙමි.

පසුව දා භූමදානයට පසු නිවෙස තුන් බියට ගොදුරු වූ විසාලාව මෙන් වී ය.

මුළු මන්දිරයට ම අලුත් මූසලකමක් පිරී තිබිණ. කිසිවෙක් මුහුණට මුහුණ දී කතා නොකරති. සැඟවුණු යමක් එළි වෙතැ යි සොරකමකට හසු වෙතැ යි බියෙන් මෙන් සියල්ලෝ ම මුනිවත රකිති.

ඊ ළඟ මොහොතේ සිදු වන්නේ කුමක් දැයි නොදන්නා ගුප්ත



නාට්‍යයක් නරඹන්නාක් මෙන් අපි අප තුළ ම සිර වී සිටියෙමු.

සියල්ල සිදු වෙද්දී මටත් හොරා ඉදිරියට තෙරා එන මගේ කුස මා මවක් වීමේ පෙරනිමිති ලොවට හෙළි කරමින් තිබිණි.

හැම දා ම.... හැම රෑ ම.... මෙහෙම ගෙවෙන ජීවිතය මම ම වෙනස් කිරීමට සිතුවෙමි. කලකිරීම් ජීවිතය වෙළා ගන්නා විට සොම්නස සතුට කොහේ හෝ ඇතැ යි මම සැක කළෙමි. මම එකී සතුටු කොදෙව්ව සොය සොයා සිතුවිලි පා කරමින් විවෙක හුදෙකලාවම කල් ගෙවීමි. අවසන මම මට ම කරුණාවන්ත වීමි. මම මට ම ළෙන්ගතු වීමි. දයාර්ද්‍ර වීමි.

රැය එළඹෙත් ම මම මැද සාලයෙන් මිදුලට පිවිසීමි.

අවකාශය දුළවමින් සඳ මඬල පායා තිබුණේ ය. බොහෝ රෑ බෝ වී තිබුණත් මම මිදුලෙන් පිච්ච මල් වට්ටියක් නෙළා ගතිමි. සමන් පිච්ච සුවඳ, මුදු සුළඟේ නැවරී තුනුසපුව වෙළා ගනී. මම පිච්ච මල් වට්ටිය ගෙන පැන් ඉසීමි. මෙත් සිත එහි තවරා ලීමි. මල් වට්ටිය දෝතින් ම අල්ලා මම මොහොතක් මිදුලේ සක්මන් කරමින් සඳරැස් විඳ ගතිමි. බොහෝ පවිත්‍ර සිතුවිලි හද ගැබේ නලියමින් තිබේ.

මම විශ්වගේ කාමරයට ගියෙමි. බුදු කුටියකට පිය ඔසවන විටක තරම් බැතිබර සිතක් ඒ වේලේ මා තුළ ලියලමින් තිබිණ. ඔහු පරණ දිනපොතක් ගෙන උඩ බැලිව එය බලමින් සිටී. විශ්ව එය කියවනවා ද? නරඹනවා ද? සිහිවිලිවල පා වෙනවා ද? යන කිසිදු නිශ්චිත යමක් මට තේරුම් ගත නොහැකි ය. දැන් දැන් ඔහු කාලය ගෙවන්නේ එසේ ය. ඔහු කාලය ගෙවා දමනවා නොව ගෙවී යන කාලයට ඉඩ දෙනවා මෙනි.

'මං මල් පූජා කරන්න හදන්නේ විශ්ව, අපි දෙන්නම බුදු කාමරේට යමුද? අම්මාටත් පිං දීලා අපේ දරුපැටියත් නිරෝගීව ලැබෙන්න කියල බුදුන් වඳිමු. දැන් ඉතිං අත් දෙකින්ම වැඳල සාදු කියන්න.'

මම පිච්චමල් වට්ටිය ම දෝතින් ඔහු වෙත දිගු කරමින් කීවෙමි. විශ්ව එහෙම ම හිඳිමින් මල් වට්ටිය දෙස කුලුණු පිරුණු නෙතින් බැල්මක් හෙළා ගෙන සිටියේ ය.

For E-Pusthakalaya

'වදින්න විශ්ව...'

මම හඬ උස් කොට ආදරයෙන් කීවෙමි. විශ්ව දැන් කියන දේ කරන කුඩා දරුවෙකු මෙන් හැසිරෙනවා මිස ප්‍රකෘතිමත් ලෙස ජීවිතය දකින්නේ වත් ගෙවා දමන්නේ වත් නැත. විටෙක ඔහු මුරණ්ඩු දඟකාර ළපැටියෙකු මෙනි. විටෙක මානසික රෝගියෙකු මෙනි. බොහෝ විට ශාන්ත සිල්වත් පැවිදි කෙනෙකු මෙනි. සියලු ආමිසයන් ඔහු විටෙක ප්‍රතික්ෂේප කරයි. එහෙත් කිසි විටෙක ඔහු නිරෝගීමත් ප්‍රකෘතිමත් පිරිමියෙකු වූවේ නම් නැත. එහෙත් බොහෝ විට ඔහු අහිංසක වී ය.

'වදින්න විශ්ව....'

ඔහුට ආදරයෙන් කතා කළ ද, විශ්ව තිගැස්සී පිබිදියේ ය. ඔහු දෝතින් මල් බඳුන ස්පර්ශ කොට වැන්දේ ය.

මම ඔහුගේ හිස සිඹ බුදු කාමරයට ගියෙමි. බුදුන් වැඳ බොහෝ වේලා මෙත් වැඩුවෙමි. දරුවා ලැබීමට සියලු දෙව් රැකවරණ පැතීමි. විශ්වට සුවසෙත් පැතිමි. ශාන්තිය යැදිමි. සහනය ළඟා කරන්නැ යි ආයාචනා කළෙමි.

මා කාමරයට එන විට විශ්ව තද නින්දට වැටී සිටියේ ය. බොහෝ වේලාවක් බුදු කාමරයේ ගත කිරීම ගැන මම පසුතැවීමි. ඔහුගේ හිස තිවැරදිව ම කොට්ටයට තබා විසිරී තිබුණු දෙපා ළං කළෙමි. ලිහී තිබුණු සරම තද කොට අන්දවා පොරෝනයකින් දෙපා පමණක් ආවරණය කළෙමි. විදුලි පංකාව කෙළින් ම ඔහුගේ මුහුණට වැදෙන නිසා පැත්තට ඇල කළෙමි. ඔහුගේ පපුව මත ම වැටී තිබුණු හිස් බැල්මකින් ඔහු දෙස බලා සිටිමි.

ජීවිතය කෙ තරම් හිස් ද? මේ මහා මන්දිරයේ කිසිදු පණ නළක් නැතුවාක් මෙනි. මැදියම් රැය ද ආසන්න ය. විදුලි පංකාව වා ගැබ කළඹන හඬ මිස පරිසරයේ රැහැයි හඬක් වත් කාමරටය ඇසෙන්නේ නැත. හිස් ම හිස් ජීවිතය දෙස මම හැරි බලමින් සිටියෙමි. විශ්වගේ දින පොත ගෙන නිකමට ඔහේ පිටු පෙරළීමි. විශ්ව ලංකාවට පැමිණි දිනවල ලියූ දින සටහන් එහි වී ය. ජූනි 18 දාතම සහිත සටහනේ 'නේත්‍රා' යනුවෙන් ලොකුවට සටහන් කොට තිබිණ. ඊට පහළින් රතු තීන්තෙන් ද කළු තීන්තෙන් ද ලියූ සටහන් පෙළ මම කියවන්නට වීමි.



'නේත්‍රා'

*I love you*

*You my heart*

*You my soul*

*I want you*

*I love you*

*I love you very much*

ඊටත් පහළින් මුතු අකුරින් ඔහු පද ගළපා තිබිණ.

'රකිමි ඔබ මම
නිරා දුක් විඳ'

සත්තකින් ම ඔහු මේ නිරා දුක විඳින්නේ ප්‍රේමය නිසා ම නොවේ ද? මම විශ්වගේ පපුවට මුහුණ හොවා බොහෝ වේලාවක් සිත් පිත් නොමැත්තියක සේ සිටියෙමි. ඔහුගේ හද ගැබ දැවුණු මා වෙනුවෙන් කැළඹේ දැයි මා දන්නේ නැත. මාත් ඔහුත් කෙ තරම් අසරණ ද? මම හිමින් ඔහුගේ පපුවට හිස තබා කොඳුරන්නට වීමි.

'විශ්ව.... විශ්ව...'

ඔහු තරහින් මෙන් අනෙක් ඇළයට හැරී නිදන්නට වි ය. මම සිටි ඉරියව්වේ ම සිටියෙමි. නපුරු සතෙකු මෙන් ඔහු මට රවන්නට වි ය. මම පුටුවේ වාඩි වීමි. ඔහුගේ ම දින සටහන් යටින් දිනය දමා මෙසේ ලිවීමි.

ආදරයත් සමඟ

නේත්‍රා.

මගේ නෙතින් සැණින් කඳුළු කඩා වැටෙන්නට සැරසිණ. මම ඉවසීමි. ඉතිරි හිස් පිටු පුරා මම මැදියම් රැය ඉක්ම වන තෙක් ඔහේ කුරුටු ගෑවෙමි.

මම..
හරිම හරි පව්කාර
ඇස් දෙකක උරුමකාරී

For E-Pusthakalaya

අසරණී !

විශ්ව, මේ පව්කාර මන්දිරය කෙ තරම් පෙම්පාට කළ හැකි ද? මේ අපේ යහනක් පින්පාට පුද බිමක් කරන්න පුළුවන්.. ටික දවසකින් අපිට පූජා පඬුරු වගේ සිහිත්තෙක් ලැබෙයි. ඒත් ඔබ දෙපා තබන බිමේ මම වැලිකැටියක් තරම් වත් ඔබට නොවටිනා හැටි... ආදරේ බිංදුවක් වත් නොදෙන හැටි...

විශ්ව, මය පපුතුරේ හිස හොවා දැවටෙන්නට වරම් නැති හැටි.. හිම තරම් හීතල ම හිතල වැහිදාක වත් මහ රැක ඔබ තුරුලට මා නොගන්නා හැටි... පුදුමයි...

හැම දාම...

මෙහෙම....

ඔයාගෙම සෙවණ පතන... සරණය ම යදින.... සෙනෙහස ම ඉල්ලන.... ඒත් හව්හරණ නොලබන..... මම පව්කාර අසරණියක් වග ඔබට නොවැටහෙන හැටි

විශ්ව..

සඳ මැරී ළය පැළී ගියාදෙන්

ඉඩ දෙන්න.

මලානික යහනතේ

පරඬැලක් වන්න මට?

ඒත් ඇති

සත්තමයි ඒ ආදරේ හින්දමයි.

මම පාන්දරට අත වනන සූර්ය මහෝදය එළඹෙන්නට පෙර විශ්වගේ යහනතේ පැත්තක ගුලි වීමි.



# 16

ඉර පායා බොහෝ වේලාවකට පසුව අලුත් දවස උදා වී ය.

'නෝනා උදේට ඉඳිආප්ප හදන්නද?'

'නෝනා මාර්කට් යන්න සල්ලි නෑ?'

'නෝනා කොම්පැනියෙන් කෝල් එකක් ඇවිත්'

'නෝනා මෙන්න ලියුම් ඇවිල්ලා....'

'නෝනා විශ්ව මහත්තයගේ කෑම එක?'

සියල්ල මගෙන් ම විමසීමට සියල්ලෝ ම පෙළඹී සිටිය හ. මම දුල්ලැව මන්දිරයේ සියලු කාර්ය සියතට ගත්තාක් මෙන් කෙනෙකුට පෙනෙන්නට පුළුවන. එහෙත් සිදු වූවේ වෙනකකි.

අම්මාගේ හත් දවසේ දානයට පසුව නැවතත් ගෙදර පෙර තත්ත්වයට පත් වෙමින් තිබිණ. මරණය පිළිබඳ කවුරු කවුරු නිතර සතරකන් මන්ත්‍රණ කළා දැයි මම නොදනිමි. එහෙත් සියල්ලෝ ම මා සමඟ ඒ පිළිබඳව මුනිවත ම රැක්කා හ.

මම ත් විශ්ව ත් විශ්වගේ පියා ත් ලීලා ඇතුළු සේවක සේවිකාවන් කීප දෙනා ත් හැර කිසිවෙකු නිවහනේ රැඳුණේ නැත. මේ නිසා ම සියලු කාර්ය මගෙන් විමසීමටත් මගෙන් කර ගැනීමටත් සියල්ලෝ ම ඉබේ ම පුරුදු වූ හ. දුල්ලැව නිවසේ වියදමට දිනපතා ම රුපියල් දහසක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් මා අතට දී පිටව යයි.

'මේවාගෙන් ගෙදර වියදම් බලා ගන්න.'

ඒ වැනි වචනයක් හැර ඔහු කිසි විටෙක වෙන යම් විෂයක් මා සමඟ කතා කළේ නැත. මවගේ මරණය ත් සමඟ ම දුල්ලැවගේ ඇති වූ මෙම වෙනසට මම මුල දී බිය වීමි. එහෙත් කිසිදු විටෙක දුල්ලැව සීමාව ඉක්මවා කටයුතු කළේ නැත.

මම දුල්ලෑවට ත් විශ්වට ත් උදේ ම තේ දෙකක් සාදා ගෙන ගොස් දීමට පුරුදු වීමි. ඔහු බොහෝ ශාන්තිවාදී හැඟීමෙන් එය පිළිගනී. විශ්ව නොදරුවෙකු මෙන් දෑත ම දිගු කොට තේ එක දාගනී.

මම විශ්වගේ කාමරයේ නිදා ගන්නවාටත් දුල්ලෑව විරුද්ධත්වය පෑවේ නැත. බැල්මකින් වත් වෙනසක් පෙන්නුවේ නැත. මෙම අලුත් චර්යාව මට බෙහෙවින් සහනදායී වී ය.

නිහඬ, නිසංසල මේ පැවැත්ම විටෙක මට ම බිය ගෙනෙන්නක් වී ය.

මම සියල්ල ජීවිතයේ ආහ්ලාදයක් කර ගැනීමට වෑයම් කළෙමි. අසුන්දර සියල්ල ම සුන්දර තිමිරයකින් පෙරා දෙනෙතට උරා ගතිමි. කුඩා දරුවකුගේ නොපනත්කම් ඉවසන්නා වූ අම්මා කෙනෙකු මෙන් විශ්වගේ නොහොඳ නෝක්කාඩු ඉවසීමි.

'විශ්ව.... නැගිටින්න. නැගිටින්න ඉර පායලා හුඟක් වෙලා. ඔහොම හිටියොත් කම්මැලි කොල්ලෙක් වෙයි. නෝ... ඉතිං ඔයා තාම නිදිනේ.... දැන් ඉතිං නැගිටින්න රත්තරං...'

මම වෙහෙසකර සිත පාලනය කොට විශ්ව පුබුදුවාලමි. ඔහු සෙමින් සෙමින් දෙනෙත් විකසිත කොට අවට බලයි. ඒ ඉර මල පිදී ඇත් දැයි කියා ය. යන්තම් වත් කළුවර කාමරයට එබෙයි නම් ඔහු කළබල වෙයි. මාව ප්‍රතික්ෂේප කරයි. ඇතැම් විට මුරණ්ඩු ලෙස පයින් දමා ගසයි. එහෙත් ඉර පිදී ඇත් නම් දෑස පිබිදෙයි. ඔහු පිබිදෙන සැණින් තිතිපතා ම පුරුද්දට වාගේ වටපිටාව නිරීක්ෂණය කරයි. නන්නාඳුනන නවාතැනක හොරෙන් නිදිදී ගැන්වුවෙකු අඩ නින්දේ පිබිදෙව්වාක් මෙන් සියල්ල මුලින් ම නිශ්චය කර ගනියි.

'ඔයාට.... හොඳටෝම නින්ද ගියා. පොඩි එකෙක් වගේ රෑ තිස්සෙ ගෙරෙව්වා. ඔයා දන්නෙත් නැනේ... මම කොට්ටෙ හදල ඔළුව පිළිවෙළට තිබ්බමයි ඔයා ගෙරවිල්ල නවත්තලා නිදාගත්තේ. මමත් ඇඳේ පැත්තකින් නිදා ගත්ත තමයි.... ඊත් ඔයාගේ ඇගේ ඩිංගක් හරි ගෑවුණොත් ඔයා පයින් ගහනවා. එහෙම කරන්න එපා විශ්ව, මම පව්නේ... ඇරත් අපේ පැටියා.... නිකමට හරි බඩේ වැදුණොත්.... පැටියා හිතයි තාත්තා නපුරා කියලා. ඔයා නපුරු නැනේ.... අහිංසකයි. මමත් අහිංසකයි. අපි තුන්දෙනාම අහිංසකයි.'



ගිනි ගත් යකඩයක් සිසිල් කරනවාක් මෙන් මම උදේ ම හැඳා ම මොනවා හෝ ඔහුට කීමට පෙලඹී සිටියෙමි. එහෙත් ඔහු ඒවා මා කියූ ආකාරයෙන් ම වටහා ගත්තා දැයි මා දන්නේ නැත. විශ්ව නාඳුනන පරිසරයක් තේරුම් ගැනීමට මෙන් බෝල ඇස්ගෙඩි එහෙට මෙහෙට කරකවයි. බය වෙලා වාගේ වටපිට බලයි. මම ඒ විට බොහෝ විට ඔහුගේ නිකටෙන් අල්ලා ඔහුගේ දෙනෙත් දෙස බලා සිටීමට වෙහෙසෙමි. එහෙත් ඔහුගේ නෙත්වල ඇත්තේ ඉලන්දාරි කඩිසරකම නොවේ. ඔහුගේ නෙත්වල දැන් දැන් ඇත්තේ මෝඩ ගැමියෙකුගේ රෝගාතුර ඇස්වල පෙනුමකි. ඒ ඇස් මගේ හදවත ඇමතීමට කොහෙත් ම ප්‍රමාණවත් නැත. ඒ ඇස් කිසි විටෙකත් කතා කරන ඇස් නොවී ය. ඒ ඇස් හැම විටෙක ම වාගේ ස්නායු විනාශ වූවෙකු යමක් නාහිගත කර ගන්නට වෑයම් කරන විටෙක මෙන් නලියමින් ලෝකය තේරුම් ගැනීමට වෙහෙස වෙමින් තිබිණි.

එහෙත් ඒ ඇස්වලට මම ආදරය කළෙමි. ඒ ඇස් දෙස බලා ගෙන බොහෝ වේලාවක් එසේ සිටීමට මම ආශා කළෙමි. එහෙත් ඉරමල බැස යන්නට පෙර කෙ තරම් කටයුතු නිමා කළ යුතුව තිබේද?

'දැන් ඇති. විශ්ව. කට සෝදල තේ එක බොන්න. ඊට පස්සෙ බාත්රූම් යන්න. බලන්න.... හොඳටෝම රැවුලත් වැවිලා. රැවුල කපලා අද අර ළා නිල්පාට කමිසය අඳිමු. ඒකට මං හරි ආසයිනේ. ඊට පස්සෙ මං අද ඩොක්ටර් මුණගැහෙන්නත් ඕන. ගිය මාසෙ ක්ලිනික් ගියෙත් නෑ. පැටියට කරදරයක් වුණොත්? ඉතිං ඉක්මන් කරන්න....'

මම ඔහුට එසේ කියමි. ඒ සැණින් ඔහු කළබල වෙයි. එහෙත් සිටි ඉරියව්වේ ම සිටී. ඇතැම් විට දෙකන් පෙති රතු වෙයි. දෑස වඩාත් සූක්ෂ්ම ලෙස ක්‍රියාත්මක වෙයි. ඒ දෙස බලා සිටින විට බොහෝ දුක් සිතෙන තරමට ඔහු අසරණ වෙයි. ඔහුට සියල්ල ම කිරීමට, කර ගැනීමට අවැසි මෙන් හැසිරෙයි. එහෙත් විශ්වට කිසිවක් තනිව ම කර ගැනීමට නොහැකි ය.

මම ඔහුගේ තේ එක අතට දුනිමි. වැසිකිළි කැසිකිළි කටයුතු ඉටු කරවූවෙමි. දත් මැද්දෙමි. මුහුණ පුරා සබන් ගා හෙමින් හෙමින් රැවුල කපා දැමීමි. මුහුණේ ක්‍රීම් ආලේප කළෙමි. හිස පීරුවෙමි.

'දැන් ඉතිං ටිකක් ඔහොම ඉන්න. මම ගෙදරට ලියුමක් ලියන්නත් ඕන. ඩොක්ටර් ගාවට යන්න ලෑස්ති වෙන්නත් ඕන. ඔයත් එනව නම් ෂෝක්. ඒත්, ඔයාට බෑනේ.... කමක් නෑ....

මම ඔහු සමඟ කතා කරමින් ම මගේ කටයුතු ඉටු කර ගතිමි.

'නේත්‍රා.... දහයට නේද ඩොක්ටර්ගෙ අපොයින්ට්මන්ට් එක...?'

දුල්ලෑව කාමරයට පිටතින් සිට හිමින් කතා කොට විමසයි.

'ඔව් තාත්තේ.... මං ලෑස්ති වෙනවා...'

මම කාමරයේ සිට ම ඔහුට පිළිතුරු දෙමි. ටික දිනක සිට මම විශ්වගේ පියාට 'තාත්තා' යනුවෙන් ආමන්ත්‍රණය කරමි. ඉන් අරමුණු කීපයක් ම සඵල කර ගැනීමට මට හැකියාව ලැබෙයි. බාහිර සමාජයේ දී ඔහුට 'තාත්තා' යැයි කී විට අප දෙස වපරැසින් බලන අය නිහඬ වීම එකකි. දුල්ලෑවට 'තාත්තා' ලෙස ඇමතීමෙන් .... ඔහුට මා වෙතට සමීප වීමට තිබූ අවසන් ඉඩකඩ ත් අසුරා දැම්මා යැයි සිතීම ම මට මහත් සහනයක් මැ වී.

'නේත්‍රා.... බඩගින්නෙ හිස්බඩ යන්නේ නැතුව මොකුත් කාලම ලෑස්ති වෙන්න....'

දුල්ලෑව දෙවනුව ද කාමරය සමීපයේ සිට කීවේ ය.

මම 'හොඳයි තාත්තේ' යනුවෙන් කීවෙමි.

මොහොතකින් මම ලකලෑස්ති වී මැද සාලයට පිවිසීමි.

'තාත්තේ.... විශ්වත් එක්කරගෙනම යමුද...?'

මම විමසීමි.

'නේත්‍රාට කරදරයක් නැත්නම් එහෙම කරමු.'

'මම තනියම ගියාම එතන ඉන්න මිනිස්සු උණත් බලයි මොකද මේ ගෑණි මේ තනියම බඩකුත් හදාගෙන කියලා...'

'එහෙම ප්‍රශ්නයක් නම් නෑ... මං ඉන්නෙ.... අනෙක ඉතිං හැමෝගෙම කටවල් වහන්නවත්, කරන කියන දේ නවත්වන්නවත් අපිට බෑ. නේත්‍රාට තේරුණාද...?'



'ඔව් තාත්තේ....'

මම තනිව ම ගොස් කාරයට නැඟ ගතිමි. දුල්ලෑව හෙමි හෙමින් කාරය ගේට්ටුවෙන් පාරට ගත්තේ ය. ටික දුරක් යන තෙක් ඔහු වචනයකුදු කතා නොකළේ ය. පසුව සෙමින් කටහඬ අවදි කළේ ය.

'වෙලාව තියෙනවානේ... හිමීට යමු. ඇරත් මාස අටේදී ගැස්සෙන්න හොඳ නෑ, නේත්‍රා ගම්වල උදවිය ගමනක් බිමනක්වත් බඩදරු අම්ම කෙනෙක් එක්ක නොයන කාල තියෙනවා. මුලින්ම මාස තුනක් යනකල් හොඳ නෑ. පස්සෙ මාස අටේදි හොඳ නෑ...'

කිසිදු උත්තරයක් නොදී ගමන් කිරිම නොහොබිනාකමක් සේ හැඟුණු හෙයින් මම 'වෙන්න ඇති' යනුවෙන් කීවෙමි.

'ඔය කාලෙදි පළතුරු පුළුවන් තරම් කන්න ඕනි. එතකොට බබා ගොඩාක් සුදු වෙනවා. ඊට පස්සෙ පලා වර්ග කන්න ඕනෑ. එතකොටයි ළමයගේ මොළේ වැඩෙන්නෙ. ගම්වල නම් ඉතිං ළමයා හම්බ වුණාම කොස් පොලොස් තමයි වැඩිපුරම දෙන්නෙ. මොකද, ඒවට හරියට කිරි එරෙනව කියල තමයි කියන්න.'

මම එ විට කිසිවක් ම කතා නොකළෙමි. පසු ගිය සති කීපය තිස්සේ ම දුල්ලෑව මිදි, අඹ, පේර, කෙසෙල්, ගස්ලබු ආදී විවිධ පළතුරු වර්ග අවශ්‍ය ප්‍රමාණයටත් වැඩිය ගෙදරට ගෙන ආවේ මේ නිසා වීමට පුළුවන. ඔහු කෙරේ කිසි යම් ලෙන්ගතුකමක් ඉපදුණ ත් මම එය නොපෙන්වා සිටියෙමි. දුල්ලෑව ත් නොසිටියා නම් මා තවත් අසරණ නොවන්නේ දැයි සිතන විට ඔහු කෙරේ අනුකම්පාවක් හා ගෞරවයක් ද මසිතේ උපදී. එ නිසා මම කතා කළෙමි.

'මම හිතාන ඉන්නෙ බබා හම්බ වුණාම ගෙදර යන්න.'

'එතකොට විශ්ව...?'

'එයාවත් එක්ක යනවා.'

'මුළු ගෙදරම පාලු වෙයි.'

ඔහු දුකින් කීවේ ය. එය නම් ව්‍යාජයක් නොව සැබෑ ම කතාගාටුවක් බව ඔහුගේ ඉරියව් ඔහුට ත් හොරා හෙළි කළේ ය.

'මම නිකම් එහෙම හිතුව විතරයි.'

‘ගියාට කමක් නෑ. ඒත් ගෙදර කටයුතු කොහොමද නේත්‍රා ගියෑම? මටත් නුවර එන්න පුළුවන්කමක් නෑනේ. අනික නේත්‍රා මෙහෙ හිටියා කියලා අපි කිසිම අඩුවක් කරන්නෙ නෑ. වෙනසක් කරන්නෙ නෑ. ඕනම නම් අම්මව ටික දවසටක මෙහෙට ගෙන්න ගමු.’

‘කල්පනා කරල බලන්න ඕන.’

‘හැම දෙයක්ම හැම පැත්තක්ම කල්පනා කරන්න.’

ඔහු රෝහල ළඟ ම රථය නතර කළේ ය.

‘පරිස්සමින් බහින්න. අයිනට වෙලා ඉන්න. මම කාර් එක පාක් එකට දාල ඉක්මනින් එනවා.’

අපි දෙදෙනා ම කොරිඩෝව දිගේ රෝහල් කාමරය වෙතට පිය එසවීමු.

‘ලබන සුමානේ ඇඩ්මිට් වෙන්න. ටිකක් ප්‍රෙෂර් වගේ තියෙනවා. එහෙම දිගටම තිබුණොත් සමහර විට සීසර් කරන්න වෙයි.’

වෛද්‍යවරයා අවසන් වරට උපදෙස් දෙමින් කීවේ ය. මා වෛද්‍යවරයාගෙන් උපදෙස් ලබා එන තෙක් දුල්ලෑව ඉදිරි පුටු පෙළේ වාඩි වී සිටියේ ය. සෙසු රෝගීන් හා ඔවුන්ගේ හිතෛෂීන් අප දෙස විමසුම් බැලුම් හෙළුවා දැයි මා දන්නේ නැත. කිසිවක වගක් මට තිබුණේ නැත. දුල්ලෑව හා මා අතර වයස් පරතරය නිසා ඔවුනට දෙවිදියක සිතුවිලි ඇති වීමට ඉඩ තිබිණ.

‘මේ මිනිහා බැඳලා ඉන්නෙ තරුණ කෙල්ලෙක්’ යැයි සිතන්නට ත් පුළුවන. ‘මේ දැරිවිගේ තාත්තා වෙන්න ඇති’ යැයි සිතන්නට ත් පුළුවන. එහෙත් ඒ දෙක ම සත්‍ය නොවී තිබිය දී මම උපක්‍රමශීලී වීමි.

‘යමු තාත්තේ.’

මම දෙතුන් දෙනෙකුට ඇසෙන සේ කීවෙමි. කාරයට නැඟී නිවහනට පැමිණෙන තෙක් කාලය ගත කිරීම අසහනකාරී පීඩාවක් ම වී ය. දුල්ලෑව මගෙන් හරස් ප්‍රශ්න අසතියි මම තිගැස්සී සිටියෙමි. එහෙත් ඔහු බොහෝ විට මෙන් ම එ දින ද නිවහනට පැමිණෙන තෙක් ව්‍යාකූල ප්‍රශ්න ඇසුවේ නැත. එ නිසා ම මම ඔහුට තොරතුරු කීවෙමි.



‘ටිකක් ප්‍රෙෂර් වගේ කිවා.’

‘ඒකට එච්චර බය වෙන්න දෙයක් නෑ.’

‘මං බය නෑ.’

මම සිහින්ව පිළිතුරු දුනිමි. නැවතත් තොරතුරු කීවෙමි.

‘සමහර විට සීසර් කරන්න වෙයි කිව්වා.’

‘ඒකටත් එච්චර බය වෙන්න හොඳ නෑ. වෙන රටවල ගැහැණු අය දොස්තරට කියලම සීසර් කර ගන්නවා. එකක් ඒක පවුල් ජීවිතේට හොඳයි. ළමයා තැළිල පොඩි වෙන්නෙත් නෑ. නිරෝගී වෙනවා. බුද්ධිමත් වෙනව කියලත් කියනවා. අම්මට අමාරුවකුත් නෑනේ. ඒක කරන්න හොඳ නැත්තේ බර වැඩ කරන ගැහැණු අයට. ඒ නිසා හැම දේම ගත්තම නේත්‍රාගේ පැත්තෙන් වාසියි.’

මම තවත් වේලාවක් නිහඬව සිටියෙමි. දුල්ලෑවගේ හිතේ මොකක් දෝ නොඉවසිලිමත් හැඟීමක් මතුවී ඇතුවාක් මෙන් මුහුණේ සිහින් සිනහවක් ඉපිලෙමින් තිබෙයි. දුල්ලෑවට ‘තාත්තා’ යනුවෙන් අමතන විට ඔහු ප්‍රකෝප වෙතැ යි මම මුල දී සිතුවෙමි. එහෙත් ඔහු හැම ඉරියව්වකින් ම තමන් තාරුණ්‍යයට නෑකම් කියන බව ඉඟි කිරීමට වෙහෙසුණේය. කාරය එළවන විටත්, වටපිට බලන විටත් ‘මම තවම තරුණයි’ වැනි හැඟීමක් ඔහු ගෙන හැර පෑමට වෙහෙසුණේ ය. මා කලින් තීරණය කර නොතිබුණත් නිවහනට ආසන්නයේ දී මම අපූරු ප්‍රශ්නයක් නැඟුවෙමි. අලුත් අරමුණක් නොතිබුණත් දුල්ලෑව අධ්‍යයනය කිරීමට බලාපොරොත්තුව නම් මා ළඟ තිබුණි.

‘මම හිතාගෙන ඉන්නෙ දරුව ලැබුණාම විශ්වත් එක්ක වෙනම ගේක පදිංචි වෙන්න.’

‘හදිස්සියේම නේත්‍රා එහෙම තීරණයක් ගත්තෙ අපෙන් වරදක් වෙලා නෙමෙයිනේ.’

‘නෑ ඉතිං දරුවත් ලැබුණම අපේම තැනක් තිබුණොත් හොඳයිනේ.’

‘දැන් ඉන්න තැනත් අපේම තමයි.’

‘මං කිව්වෙ අපි තුන් දෙනාට.’

‘කවුද නේත්‍රා කියන තුන්දෙනා?’

For E-Pusthakalaya

'මමයි, විශ්වයි දරුවයි...

'එතකොට මම?'

දුල්ලෑව ඉවසීමෙන් ප්‍රශ්න කළේ ය. වෙන දා නම් දුල්ලෑව එක්කෝ බලය පෙන්නා සෙස්සන් මැඩ ගනියි. නැත්නම් මුදල් පෙන්නා සෙසු අය දමනය කරයි. එසේත් නැත්නම් කුරිරු ප්‍රශ්න අසමින් පරපීඩක උමතුවක් මෙන් හැසිරෙයි. දැන් දැන් ඔහුගේ නිවුණු ගති පැවතුම් මාගේ සිතුවිලි ද පාලනය කිරීමට තරම් සන්සුන් ය.

'ඔයා ඔය කිය අපිට 'මම' අයිති නැද්ද? මම අයිති කාටද? මේ ඔක්කෝටම වැරදිකාරයා මමද? නෝනා.... මීට පස්ස 'අපි' ගැන කතා කරද්දි මාවත් එතැනට ගන්න. බල කරනව නෙමෙයි. මම දැන් එච්චර නරක මිනිහෙක් නෙවෙයි.'

හෝන්දු මාන්දු වී ගිය කළු වලාවක් ඇවිත් ඔහුගේ මුහුණ වසා ගත්තාක් මෙනි.

'මම නපුරු චේතනාවකින් නෙමෙයි කිව්වෙ?' මට ඕනකම තියෙන්නෙ විශ්ව ඉක්මනින් හොඳ කර ගන්න. දෙවිහාමුදුරුවන්ගේ පිහිටෙන් එහෙම වෙන එකට තාත්තා මොකටද අකමැති වෙන්න? මම විශ්වත් එක්ක වෙනම ගේකට යන්නෙ විශ්වට හොඳ වුණහම. අපි දෙන්නට කොහොම වුණත් ලෝකේ දකින්න ඉන්න පැටියට අනාගතයක් තියෙන්න ඕන. මගේ චේතනාවත් - අරමුණත් දෙකම එකයි.'

මගේ අවසන් ප්‍රකාශයට පිළිතුරු නොදීම දුල්ලෑව කාරය පෙවත්තට ගත්තේ ය. කාරය ඇතුළු වෙත් ම කුඩා දරුවෙකු මෙන් විශ්ව කාරය ළඟට දුව ගෙන ආවේ ය. කාරය තුළ සිටියේ අප බව ඔහු නොදත්තේ ය. සිනා සපිරි මුහුණින් ඔහු පැමිණ නැවත ආපසු දුව ගෙන ගොස් ගෙමිදුලේ තිබුණු කුඩා ටෙනිස් බෝලයක් රැගෙන නැවත වඩාත් වේගයෙන් දුව ගෙන ආවේ ය. විශ්ව මිදුලේ සෙල්ලම් කරමින් සිටි බව මම වටහා ගතිමි. තමන් සමග සෙල්ලම් කිරීමට යහළු යෙහෙළියන් පැමිණි විටෙක මෙන් ඔහු ටෙනිස් බෝලය උඩ දමමින් කාරය ළඟට පැමිණ සිටියේ ය. දුල්ලෑව පළමුව කාරයෙන් බැස්සේ ය. තමන්ට හුසුහුසු මිතුරෙකු පැමිණියාක් මෙන් විශ්ව කාරයේ අනෙක් දොර දෙසට පැමිණියේ 'ඔයාට වඩා මෙයා හොඳයි' වැනි ඉරියව්වකිනි. නෙරා ගිය



කුස නිසා තරමක් අසීරුවෙන් මම පිටකොන්දට බර දී කාරයෙන් බැස ගතිමි. විශ්ව කාරයෙන් එ පිටට දිව ගොස් මදෙස බලා සිටියේ ය. මම ඔහුගේ සමීපයට ගියෙමි. ඒ අතර දුල්ලෑව ගෙට ගියේ ය.

'කෝ මෙහෙට දෙන්න ඔය බෝලේ මං ඔයා ළඟට එවන්නං.'

මම විශ්ව අතේ තිබුණු ටෙනිස් බෝලය ඉල්ලා ගතිමි. ඔහුගේ මුහුණ විකසිත වි ය. දෙතුන් විටක් ම මිදුල මැද්දේ අපි දෙදෙනා එහෙට මෙහෙට දිව්වෙමු. අප්‍රමාණව නොවුණත් ඔහු මට එකඟව තරමක් සහනයෙන් හැසිරුණේ ය.

'මං ඔයාට චොක්ලට් එකකුත් ගෙනාවා.'

මම හෑන්ඩ් බෑගය හැර චොක්ලට් එක එළියට ගතිමි. ෆාමසියෙන් බෙහෙත් ගන්නා විට මම තරමක චොකලට් එකක් ද ගෙන බෑගයට ඔබා ගතිමි.. මම එහි කවරය ලිහා චොක්ලට් කැබැල්ලක් කටේ ඔබා ගෙන ඉතිරිය විශ්වට දුනිමි. ඔහු ළදරුවෙකු මෙන් එය රැගෙන මවෙතින් තරමක් එහාට පළා ගියේ ය. මම ඔහු ලුහුබැඳීමි.

'කොහෙටද දුවන්නෙ? මට වැඩිය එහෙට මෙහෙට දුවන්න හොඳ නෑ.'

ඔහුගේ අතින් අල්ලා ගතිමි. ඔහු නැවතුණේ ය.

'යමු. යමු. කාමරේට.... ගොඩක් දේවල් තියනව කියන්න.'

මම විශ්වගේ අතින් අල්ලා ගෙන කාමරයට ගියෙමි. විශ්ව පුටුවේ වාඩි කරවූවෙමි. ඇඳුම් යන්තම් ලිහිල් කොට මම ද ඇඳේ වාඩි වීමි.

'ඉතිං .... ඔයා දන්නවාද ලබන සුමානේ මොකද වෙන්නෙ කියලා...?'

'මම දන්නෙත් නෑ. නොදන්නෙත් නෑ. මට වැඩකුත් නෑ' වැනි හැඟීමකින් විශ්ව ඔහේ බලා ගෙන සිටියේ ය.

'ඔයා තාත්තා කෙනෙක් වෙනවා. මම අම්ම කෙනෙක් වෙනවා. අපි දෙන්න තුන්දෙනෙක් වෙනවා. මට ටිකක් ප්‍රෙෂර් වගේලු. ඒක එච්චර හොඳ නෑ. ඒක හින්දා ඩොක්ටර් කිව්වා ඔපරේට් කරන්න වෙයි කියලා..'

මම ඔහුට ළංවී ඔහුගේ දෑතින් ම අල්ලා ගතිමි.

For E-Pusthakalaya

'අපි එහා පැත්තෙ ලොකු කාමරේට යමු. මේ කාමරේ අපි තුන්දෙනාට ඉඩ මදිනෙ. එතන හොඳයි. පැටියට හොඳට වටපිට එළිය වුණත් එනවා. කමක් නෑ නේද විශ්ව?'

මම තවත් කතා කළෙමි. මට තවත් කතා කිරීමට වුවමනාව ද තිබුණි. ඔහු අසා සිටින නිසා කතා කිරීමට ආශාව ද ඇති වේ. එහෙත් ඒ සියල්ල නිෂ්ඵල ද?

අනේ ඔහු තාත්තා කෙනෙක්..... සැබෑ ම තාත්තා කෙනෙක් වෙනවා නම්? අනේ ඔහු ඇත්තට ම මගේ ස්වාමියා ලෙස හැසිරෙනවා නම්? සත්තකින් ම ඔහු සෙනෙහස දෝතට ගෙන සතුට බෙදා දෙනවා නම්?

එහෙම සිත සිතා සිටින විට මට බෝ දුක් සිතේ. එහෙත් මම බෝ දුක් සිතට නොගෙන සිටිමි. බෝ දුක් සිතට ගෙන නිරන්තර තැවෙන්නේ දැවෙන්නේ කුමකට ද?

අම්මාට කොළඹ එන්නැ යි විදුලි පුවතක් යවා මම හෙට දිනට සූදානම් වීමි. හෙට මේ ප්‍රශ්න සමනය වීමට පුළුවන. අලුත් ප්‍රශ්න ඇති වීමට ත් පුළුවන. දරු ප්‍රසූතියේ දී මා මිය යාමට ත් පුළුවන. ජීවිතය එහෙම යි. මම එයට සූදානම් වීමි. මරණයට වුව ද සතුටින් සූදානම් විය හැකි නම් එය ද සහනයකි.



# 17

දෙපා දෙසින් ඇරඹෙන වේදනාව කුස දක්වා විත් නහර කිළිපොළා ගෙන නිද්‍රාගත දෑස අරවයි. මම යාන්තමට දෑස විවර කොට වටපිට නිරීක්ෂණය කිරීමට වෙහෙසෙත් ම රාත්තල් කිලෝ ගණනින් දෑස් පියන්පත් බර වී නෙත් කුහරයට ම නද වෙයි. සිහින් වූ කටහඬවල් රැසක් යහන වටේට ම කිචි බිචි ගෑවත් ඒ කිසිවක නිශ්චිත තේරුමක් මට වැටහුණේ නැත.

මම යාන්තමට අත එසවීමට උත්සාහ කළෙමි.

'එපා අත හොල්ලන්න එපා. සේලයින් කටුව ඇදුණොත් තුවාල වෙලා සේලයින් එක ගැලවෙයි.'

ඒ නුහුරු කටහඬට මම අවනත වීමි. මම අත පහතට හෙළා ගතිමි. සියුම් ම සියුම් බිලිඳු කිරිකැටි ආත්මය මාගේ වෙව්ළන ඇඟිලිවල ස්පර්ශ වි ය.

'පුතා ළඟට ගන්න නේන්‍රා.'

ඒ දුල්ලැවගේ කටහඬ ය. මම එය හඳුනා ගතිමි. හෙදිය සමීප වී බිලිඳා වඩාත් මා තුරුලට කළා ය. දකුණු පයෝධරය සෝදා බිලිඳාගේ මුවට ළං කළා ය.

'අමාරුවෙන් හරි මුලින්ම එන මව්කිරි ටික පොඩ් එකාට දෙන්න ඕන'

හෙදිය උදව් කරමින් කීවා ය.

විකල් සිහින මියැදිණ. ගිනිගත් සයනය සිසිල් වි ය. බමමින් තිබුණු යහනත ඒක්තැන් වි ය. ඒක්තැන් වූ යහනතේ මපුතු මට තුරුල

වි ය. බෝ සෙනෙහසින් පිරිතිරි මගේ හදවත වේගයෙන් ස්පන්දනය වෙයි. විශ්ව... ඔබට පෙනෙනවා ද ඔබට දැනෙනවා ද මගේ ළමැදේ කිරිසුවඳ ඉහිරෙන හැටි... දෙවියනි, අප කොතරම් නම් පෙරුම් පිරුවා ද...?

'අපේ කැදැල්ලේ කිරිසුවඳ ඉහිරෙන්නෙ කවදාද නේත්‍රා...'

විශ්ව එසේ ඇසූ වාර අනන්ත ය. මා එසේ සිතූ වාර අනන්ත ය.

'මට ඕන ඉක්මනින් තාත්ත කෙනෙක් වෙන්න. එතකොට වයසට යන්න ඉස්සෙල්ල ජීවිතේ සම්පූර්ණ වෙනවා.'

විශ්ව මාගේ කුස සිඹිමින් එසේ ස්නේහය අවදි කළ වාර අනන්ත ය. පීතෘත්වයට ඔහු එ තරම් ආශා කළේ ඇයි? දෛවය ඔහුට ම ස්රදම් කළ හැටි...

'මං ආසයි නේත්‍රා වගේ ඇස් දෙකක් තිබෙන දරුවෙකුට. මොකද ඔය කතා කරන ඇස් එච්චරටම ලස්සනයි.'

ඔහු මාගේ දෑසට එබී ගෙන ම සිටි හැටි....

මගේ දෑසින් ගලා ගිය කඳුළක් බිලිඳාගේ කම්මුලට වැටිණ. මම මහත් අපහසුවකින් කඳුළු කැට පිසිමින් මගේ රත්තරං පුතාට කතා කළෙමි.

'පුතේ. උපන්න ගමන්ම අම්මගේ කඳුළු මූණට වැටුණට තරහ වෙන්න එපා. මට මගේ පුතාගේ තාත්තා මතක් වුණා. අම්මට හුඟාක් දේවල් තියෙනවා දැන් පුතාට කියන්න. දැන් ඉතිං ඩිංගිත්තක්වත් පුතාගේ අම්මට පාලු නෑ. මං මගේ පුතාට හැම දෙයක්ම කියනවා. හැමදේම තේරුම් කරල දෙනවා. මගේ රත්තරං පැටියා.'

මම සිරිසුවඳ මුසු ඒ මුහුණ සිප ගතිමි.

'නේත්‍රා. වැඩිය එහෙට මෙහෙට දඟලන්න එපා. ඔයා සීසර් කරලයි පුතාව ගත්තේ. ඩොක්ටර් කීවා දවස් දෙකකින් ගෙදර යන්න පුළුවන් කියලා. ඔයාගේ අම්මත් හෙට කොළඹ එයි. එතකල් ලීලා ඔයා ළඟ ඉඳීවි.'

දුල්ලැව යන්නට සූදානම් වෙමින් කීවේ ය. මම යන්නමට ඔහුගේ මුහුණ දෙස බැලීමි. ආඩම්බර පිරිමියෙකුගේ උද්දාමයේ ආවේශයක් ඔහු



ආරූඪ කොට සිටියේ ය. ඔහුගේ දෑස අපේක්ෂා හා ජයග්‍රහණවලින් පරිපාකයට පත් වී මෙන් නළියමින් දිලිසෙමින් තිබිණ. මා දරුවෙකු ලැබූ විට ඔහුට මෙ තරම් උද්දාමයක්, ජයග්‍රහණයක්, සතුටක් කොයින් ද? කඳුළු උනන්ට පෙර මම දෑස පියා ගතිමි.

දුල්ලැව හෙමිහිට හිස පාත් කොට බිලිඳාගේ හිස සිම්බේය. දෙවනුව ඔහුගේ දෙතොල මාගේ නළල මත තබා සුසුම් මුහුණට වදින සේ කතා කළේ ය.

'මං යනව මගේ පුතේ...'

'මං යනව නේත්‍රා...'

ඔහු දෙවනුව කීවේ ය.

මම මොහොතක් නොදොඩා සිට ලීලාට කතා කළෙමි.

'විශ්ව මහත්තයට කොහොමද ලීලා?'

'හොඳින් ඉන්නව නෝනා.'

'මං ගැන ඇහුවෙ නැද්ද?'

'විශේෂයෙන් එහෙම මොකුත් ඇහුවෙ නෑ. උදේ ඉඳලම මිදුලට පැනල තනියම සෙල්ලම් කරනවා. තනියම කතා කරනවා.'

'මගේ පුතා කවුරු වගේද ලීලා?'

'පොඩිම කාලේ කියන්න බෑනේ නෝනා. හැබැයි සුදුම සුදුයි.'

'එහෙනම් විශ්ව වගේ.'

'ඔව් නෝනා. විශ්ව මහත්තයලා දුල්ලැව හාමුලා කවුරුත් ඉතිං සුද්දෝ වගේ සුදුයිනේ.'

ඒ තනින් එහාට මම කතා නොකළෙමි.

**'ඉසිවර විශ්වනාත් දුල්ලැව'**

ලෙස මපුතුට නම් තැබීමි. අපගේ සියලු පිරිපත දෝෂ නිවාරණය කරන ඉසිවරයෙකු වීමට මපුතුට හැකි වේවා යි මම පැතීමි.

මම පුතා වඩා ගෙන කාරයෙන් බැසීමට හැකියාවක් තිබුණේ නනැත. මගේ අම්මා පුතා වඩා ගත්තා ය. දුල්ලැව විත් හෙමින් කාරයේ

දොර විවර කර උරහිසින් අල්ලා මා කාමරයෙන් බිමට ගත්තේ ය. මම උතුම් වස්තුවක් රැගෙන පැමිණියකු මෙන් වටපිට බැලීමි. අපහසුවෙන් අඩිය තබා මිදුලේ එහෙ මෙහෙ බැලීමි. විශ්ව පිච්ච ගස යට සැඟවී සිටියේ ය. අම්මා ගෙට යද්දී මම දුල්ලැවගෙන් මිදී විශ්ව සමීපයට ගියෙමි. විශ්වගේ අතින් අල්ලා පිච්ච පඳුරෙන් මෙ පිටට ඔහු කැන්දා ගතිමි. පසුව මහත් අපහසුවකින් ඔහුගේ දෙපා පාමුල වැඳ වැටුණෙමි.

'විශ්ව ඔයා නාත්ත කෙනෙක්. අද ඉඳලවත් එහෙම හිතන්න. දෙවියනේ මං ඔයාගේ බිරිඳ කියල පිළිගන්න. මේ දරුවා ඔයාගේ කියල පිළිගන්න. නීතියෙන් විතරක් නෙමෙයි විශ්ව ආත්මයෙන්ම අපිට එකතු වෙන්න.'

ඔහු මා නැඟා සිටවූයේ නැත. මේ කියූ දෙය ඔහුට වැටහුණා දැයි මා දන්නේ ද නැත. මම විශ්ව සමඟ ම කාමරයට ගියෙමි. උඩු මහලේ විශාල කාමරයක් අප වෙනුවෙන් ලකලෑස්ති වී තිබිණ. විශාල යහනට නිල් තිරපට එළා තිබිණ. නිල් පාට මදුරු දැල, නිල් පාට උණු වතුර බෝතල, නිල් පාට බේසම්, බාල්දි, නිල්පාට තුවා, මුළුතුට බොහෝ යසිසුරු ලැබී තිබිණ. පා පිස්නය පවා නිල් පාට කෙඳි සහිත වි ය. කාමරයේ දොර ජනෙල් තිර පවා නිල් ම නිල් පාට අලුත් ම ඒවා වි ය.

'මන්න නේත්‍රා අපි ඔක්කොම ලෑස්ති කළා.'

දුල්ලැව ස්වකීය හැකියාව පෙන්වා උද්දාමය මගේ මවට ද දැනෙන සේ මුදා හැරියේ ය.

අම්මා පුතාව යහනේ තබා ඔහුගේ මුහුණ දෙස ම බලා සිටියා ය. මම යහනේ කෙළවරක වාඩි වීමි.

'තවත් මොකුත් අඩුපාඩුවක් තියනවා නම් කියන්න. ඔයා දරුවත් එක්කම ඉන්න. අනිත් වැඩ සේරම ලීලා බලාගනීවි.'

'මොනව තිබුණත් මොකටද?'

මට ඉබේට ම කියවිණි. එය අසන්නට අකමැත්තෙන් මෙන් දුල්ලැව කාමරයෙන් නික්ම ගියේ ය.

'දැන් ඉතිං ඔය අනංමනං මනස්ගාත නොහිතා දරුවා ගැන බලාපං.'



අම්මා බොහෝ වේලා ඉවසා සිට කියා ගැනීමට අවැසි දේ කෙටි කොට කීවා ය.

'කෝ ලීලා.... විශ්ව මහත්තයා.'

'එළියේ දොර ළඟට වෙලා ඉන්නවා.'

මගේ පසුව හෝස් ගා පත්තු වි ය. මම අපහසුවෙන් වුව ද නැඟිට දොර ළඟට ගොස් එබී බැලුයෙමි. විශ්ව කාමරයට එන්න ද නොඑන්න ද වැනි හැඟීමකින් බිත්තිය අසළට වී ඇඟිල්ලෙන් බිත්තියේ ඉරි අඳිමින් සිටියේ ය.

'අපි යමු පුතා බලන්න.'

මම විශ්වගේ අතින් අල්ලා ඔහු කාමරයට කැඳවා ගෙන ආවෙමි. කුලැටි දරුවකු මෙන් විශ්ව ඇදී ඇදී කාමරයට ආවේ ය. මම විශ්ව ඇඳේ වාඩි කරවීමි. දෙපා ඔසවා ඇඳට ගෙන ළං කොට පිළිවෙළට තැබීමි. නිල් පාට උරය සහිත කොට්ටයක් ගෙන ඔහුගේ දණිස මත තබා අපේ පුතාව විශ්වගේ උකුළට දුනිමි.

විශ්ව සෙල්ලම් බඩුවක් ලැබුණු තොදරුවෙකු මෙන් මහා හයියෙන් සිනා සුණේ ය. බිලිඳා ඒ සමඟ ම හඬන්නට වි ය. මම තවත් වේලාවක් විශ්ව ළඟ පුතාට ඉන්නට ඉඩ හැර විශ්වට කතා කළෙමි.

'විශ්ව.... ඔයාගේ පුතා. ඔයා කතා කරන්න. ඔයාගේ පුතාට කතා කරන්න. ඔය අඬන්නේ තාත්තා ආදරේ නෑ කියල හිතලා. 'පුතේ' කියල කතා කරන්න. එතකොට නැළවෙයි.'

මම බලාපොරොත්තු සහගතව කීවෙමි. එහෙත් විශ්ව දිගට ම කොක්හඬලා සිනා සුණේ ය. පුතා බිය වීමෙන් දිගට ම හැඬුවේ ය. මට ද හැඬුම් එන්නට ආසන්න වි ය. බලා ගෙන ඉන්නට බැරි ම තැන අම්මා මට අණ කළා ය.

'විකාර නොකර දරුව පැත්තකට ගනිං. උඹ හදන්නේ පොඩි එකාත් පිස්සු වට්ටන්නද?'

අම්මා එසේ කියත් ම මට ඉහිළුම් නොදෙන වේදනාවක් දැනිණ. මම විශ්වගේ මුහුණ බදා ගෙන ඉකි ගැසීමි.

දවසක්, දෙකක්, සතියක්, මාසයක් ගෙවී ගිය ත් මගේ ජීවිතයට මා පැතූ වත්කමක් එකතු වුණේ නැත. ඉසිවර පුතා සමඟ ගෙවී යන

For E-Pusthakalaya

කාල අන්තරයක ලැබෙන සැනසුමක් හැර ආලෝකයක් ගලා ආවේ නැත. තාත්තා තනි කොට සිටීමට නොහැකි බව කියා අම්මා ද ගමට ගියා ය.

'මෙච්චර දේවලුත් කරලා තියෙද්දි උඹ දුල්ලැව මහත්තයට අරියාදු නොකර හිටපං...

අම්මා සමු ගැනීමට පෙර කීවා ය.

'මට තේරෙන්නේ නෑ, අම්මත් මොනවා කියනවද කියලා.'

'මොනවද කියන්න කියලා උඹට ටිකක් ඇහැ කණ ඇරලා බලපං. අපි කොච්චර දුක් වින්ද මිනිස්සුද? උඹට දැන් මොනවයින්ද අඩු? මටයි උඹලගේ තාත්තටයි කල්ප කාලයක් දුක් විඳලවත් පුළුවන්ද උඹට මෙහෙම සැප සම්පත් දෙන්ඩ. අතට පයට වැඩකාරයෝ දෙන්ඩ. මදුරුවෙක්, මැස්සෙක්වත් වහන්න නොදී උඹයි, මේ පැටියවයි ආරක්ෂා කරන්ඩ, ඔය ඔක්කෝම සිද්ධ වුණෙත්, උඹ පොඩිකාලේ දුක් වින්දෙත් ඔය ටිකට තමයි. ගිය ආත්මෙකවත් උඹ හොඳට පිං කරන්න ඇති. උඹේ වාසනාව.'

'ඔය ඉතිං අම්මට පෙනෙන දේයි. අම්මට හිතෙන දේයිනේ. ඇස් දෙකට පේන හැමදේම ඇත්ත නෙමෙයි අම්මේ. මේ හතර බිත්තිවලින් එහා ඉඳලා මෙහෙන්ට ඔළුව දාල බලනකොට නම් ඔහොම හිතෙන්ඩ පුළුවන්. කාටවත් බෑනේ මගේ පපුව ඇතුළට රිංගලා බලන්ඩ. මට දුක අම්මටත් එහෙම බැරි වෙච්ච එකට. අම්මටත් තේරෙන්නේ නෑ. මගේ හිතේ තියෙන ගින්දරේ තරම. මේ සප්ත මහා සාගරේම ගිනිතියන්ඩ පුළුවන්, මගේ හිතේ ගින්දර අවුළුවා ගත්තොත්....'

'උඹ ඉතිං කතා කරන්නෙයි, වැඩ කරන්නෙයි හරියට අර දේසපාලනේ කරන ගෑණු වගේනේ. උඹ දන්නේ නෑ, උඹ කොච්චර වාසනාවන්තද කියලා?'

'අම්මා කියන්නේ විශ්වයි, මමයි ඇක්සිඩන්ට් වෙච්ච එක මගේ වාසනාව කියලද? අපි දෙන්නා කසාද බැඳල එකම එක දවසයි සන්තෝෂෙන් හිටියේ. එදා ඉඳලා එයා ලෙඩෙක්. අඩුම ගානේ මට ඉපදුණ පුතා මගෙයි එයාගෙයි කියලවත් විශ්ව දන්නෙ නෑ. එයාට හොඳ වෙයිද නැද්ද කියලා දන්නේ උඩ ඉන්න දෙවියෝ විතරයි. හොඳ වුණත් එයාට මේ සේරම අවබෝධ වෙයිද කියලා කවුද දන්නෙ?



විශ්වගේ අම්මා බෙල්ලේ වැළඳාගෙන මේ ගෙදර අස්සෙම මැරුණා. විශ්වගේ තාත්තා දැන් නම් හොඳින් මට සලකනවා තමයි. ඒත් කවුද දන්නේ මොන එහෙකට එහෙම කරනවද කියලා?'

'මොන එහෙකටවත් නෙමෙයි කියලා උඹට තේරෙන්නේ නැද්ද?'

'දැන් නම් එහෙම සැකයක් නෑ. ඒත් කවුද දන්නේ අනුන්ගේ හිත්. කුපාඩිකමකට ආවොත් නම් මම ඕකව මරනවා.'

දුල්ලැව කෙරේ අතීතයේ තිබූ පිළිකුල සැණෙකින් මගේ හිත් පතුලේ සිට ඉල්පිණ. එහෙත් එසේ සිතීම ම මහත් පව්කාරකමකැ යි මට නැවතත් සිතිණ.

'ඒ මනුස්සයගෙන් ලබාගන්න ඕන දේ හිත හොඳින් ලබාගන්ඩ උඹ දන්නෙ නෑ නේන්නා.'

'අම්මා කියන්නේ ඒ මිනිහා මගේ වාහේ කරගන්ඩද?'

'එහෙම කියනවා නෙමෙයි.'

'එහෙනම්?'

'අනේ මන්ද, උඹම හිතපං උඹේ ජීවිතේ ගැන. උඹ ඉතිං මීට ඉස්සරත් අපි කියන දේ කරපු ගෑණියෙක් නෙමෙයිනේ.'

'අම්මා වහෙන් ඔරෝ කියන්නේ මං කැමති නම් ඒ මිනිහගේ ගෑණි උණාට අම්මගේ විරුද්ධකමක් නෑ කියලද?'

'මං කිව්වේ උඹේ කැමැත්තක් කරපං කියලා.'

'මං කැමති නම් ඒ මිනිහගේ ගෑණි වෙන්න අම්මලට කමක් නෑ.?'

'උඹ කැමති නම් ඉතිං අපි මොකද කරන්නේ?'

'මේ රත්තරං පැටියෙකුත් ළඟ තියාගෙන කාලකන්නි කතා කියන්න එපා අම්මේ. අම්මා හිත හොඳින් ගෙදර යන්න. ඔය කතාව වෙන ගෑණියෙක් මගේ මූණට කිව්වා නම් මං දන්නවා කරන දේ. ඒත් අම්මා ඔය කියවන්නේ අම්මට තේරෙන තරම තමයි.. ඔව්ව ඉතිං අම්මලගේම මෝඩකමට කියන ගොං කතා. එහෙම නැතුව දුවෙකුට අම්මලා කියන කතා නෙමෙයි. 'බුදු සරණයි' කියලා අම්ම එහෙම නම්

යන්න. තාත්තා ඉස්සරහා එහෙම ඔය බූරු කතා කියන්න යන්න එපා. මාව පිළිකුල් කරයි. අම්ම හිතන විදියට මං මගේ ජීවිතේ ඉඳුල් කරගත්තේ නෑ. මෙහෙම ඉන්ඩ බැරි වුණොත් දරුවත් එක්ක වහ ටිකක් කාල මැරෙනවා.'

'මං උඹට නරක ගෑණියෙක් වෙයං කියල උපදෙස් දුන්න නෙමෙයි නේත්‍රා.... කවුද දන්නෙ උඹ පහුගිය මාස දහයට කොහොම හැසිරුණාද කියලා.'

'ඒ කියන්නේ අම්මට අම්මගේ දුව විශ්වාස නෑ?'

'නේත්‍රා.... මං උඹව අවිශ්වාස කරනවා නෙමෙයි.'

'එහෙනම්?'

'මමත් දැන් මාසයක් මේ වහල යට හිටියනේ. උඹට වැඩිය මේ ගෙදර වැඩ කරන මිනිස්සු මගෙත් එක්ක හිතවත් උණා... දුල්ලෑව නෝනා බෙල්ලේ වැළදාගෙන මැරුණේ උඹ දුල්ලෑව හාමුත් එක්ක කාමරේ එකට ඉන්නවා අහුවෙලයි කියලයි හැමෝම කියන්නේ. මමත් ඉතිං ඒකම හිතාගත්තා. නැතුව ඉතිං ඒ මනුස්සයට මැරෙන්ඩ හේතුවක් උඹවත් මට කියලා තියෙනවද?'

අම්මාගේ ඒ කතාවෙන් මම මොහොතකට ගල් ගැසී ගියෙමි.

'ඒ පාර මගේම අම්මා මාව මිනීමැරුමකටත් සම්බන්ද කරන්න හදනවා...'

'උඹට මං..කියන දේ තේරෙන්නේ නෑ නේත්‍රා..'

'එහෙනම් තේරෙන බාසාවෙන් කියන්ඩ.'

'උඹට නොතේරුණාට මේ ගෙදර හැමෝටම තේරෙනවා දැන් දුල්ලෑව මහත්තයා වෙනදට වැඩිය සන්තෝසෙන් ඉන්නේ කියලා. බලපං උඹට සතපහක දෙයක් අඩුවක් කරනවද? වැඩ ඇරිලා ආපු ගමන්ම මූණ හෝදගෙන එන්නේ මේ කාමරේට. ඇවිල්ලා පැයක් හමාරක් ඉන්නවා. ඉඳලා 'මගේ පුතේ.... මගේ පුතේ...' කියල මේ දරුවා හුරතල් කරනවා. බලපං ඇහැ ඇරලා මේ කාමරේ කී දාහක සෙල්ලම් බඩු තියෙනවද කියලා. ඔය ඔතන වීපෝව යට ලාච්චුවට කී දාහක් සල්ලි දාලා ගිහිං තියෙනවද කියලා. ගිහිං බලපන්කො කුස්සියට ගියත්



කියන්නේ නේත්‍රා නෝනාට කිසි දෙයක් අඩුපාඩු කරන්න එපා කියලා. ඉතිං තවත් මොනවද? උඹ එහෙම නෙමෙයි උණත් මිනිස්සු හිතන්නේ එහෙම තමයි...'

'මිනිස්සුන්ගේ කටවල් වහන්න අපිට බෑනේ.'

'ඉතිං උඹට පුළුවන්ද මිනිස්සු හිතන දේ වෙනස් කරන්ඩ?'

'ඕන එකක් හිතා ගත්තාවේ. මං දන්නවනේ මං කවුද කියලා... අම්මත් අම්මට ඕන මනස්ගාතයක් හිතාගන්න. වැඩට ගිහිං ආවම ඒ මනුස්සයා මේ කාමරයට එනව. මට පුළුවන්ද එපා කියන්න. දරුවා වඩාගෙන හුරතල් කරනවා. අම්මා කියන්නේ මට ඒක තහනම් කරන්ඩද? කාමරයට ආවම මගෙන් එක එක ප්‍රශ්න අහනවා දරුවා ගැන. මට පුළුවන්ද උත්තර නොදී ඉන්න? මේ සේරම දරුවට කළේ ඒ මනුස්සයා නෙමෙයිද? එහෙව් එකේ මට පුළුවන්ද මගාරින්ඩ. ඒ හැම දෙයක්ම ඇත්ත. ඒත් මං ඒ මිනිහාගේ ගෑණි නෙමෙයි. එහෙම වෙලත් නෑ. එහෙම වෙන්නෙත් නෑ.'

'උඹ ඉතිං ඕකට මගෙත් එක්ක නොරොක් වෙන්ඩ එපා.... මං කිව්වේ උඹ අහපු නිසා. මං යනවා.'

'හොඳයි අම්මේ... බුදු සරණයි..'

මම අම්මාගේ දෙපා අල්ලා වැන්දෙමි. පුතා සමඟ ම කොරිඩෝරය දිගේ තරමක් දුර ඇවිද ආවෙමි. පුතාට නොතේරුණත්, නොවැටහුණත් 'ආච්චිට ටටා කියන්න පුතේ' යැයි කීවෙමි. අම්මා බොහෝ දුරට යන තෙක් මම ජනේලයෙන් බලා ගෙන සිටියෙමි. මගේ සිත බොහෝ දුර ගමන් කොට තිබිණ. තවත් ඈතට සිතට ඇදී යාමට ඉඩ නොදී මම සිත නවතා ගතිමි. පසුව කාමරයට විත් පුතාට, මගේ පුතාට කතා කළෙමි.

'මගේ රත්තරං පුතේ...'

මම අලුත් ආදරයකින් පුතාව සිප ගතිමි.

'ඔය වටේටම තියෙන සෙල්ලම් බඩු එකක්වත් උඹට එපා මගේ පුතේ. ඒවායේ දවටලා තියෙන්නෙ වස විස, අපි ඔය ඔක්කෝම වීසි කරමු. මගේ පුතා ලොකු වුණාම අම්මම හම්බ කරලා ගෙනැල්ලා දෙන්නම්. මගේ පුතා ඔය සෙල්ලම් බඩුවලට ආසා කළොත් මගේ

පුතාගේ තාත්තා පුතාට අහිමි වෙයි. එතකොට පුතාගේ අම්මා තනිවෙයි. අපි ඔය ඔක්කෝම වීසි කරමු පුතේ....

මගේ තීරණය සම්බන්ධව මම පුතාගෙන් සමාව ගතිමි. පසුව කාමය පුරා අහුරා තිබුණු නානාප්‍රකාර සෙල්ලම් බඩු එකින් එක ගෙන ජනේලයෙන් පහළ මිදුලට වීසි කළෙමි. එහෙත් ඒ හැම සෙල්ලම් බඩුවක් මගේ නෙතට උනමින් තිබිණ. මම එය ම වීසි කරද්දී අලුත් කඳුළක් මගේ නෙතට උනමින් තිබිණ. මම එය ම වීසි කරද්දී අලුත් කඳුළක් ඉවසීමි. එහෙත් එකදු සෙල්ලම් බඩුවක් හෝ ඉතිරි නොකර සියල්ල ම මම පහළ මැද මිදුලට වීසි කළෙමි.

ගෙයි සාලයේ සිට විශ්ව ඒවා එකින් එක එකතු කිරීමට මිදුලට පැන්නේ ය. ඒවාට පයින් ගසමින් ද උඩ දමමින් ද ඒවා තුරුලු කර ගනිමින් ද විශ්ව මිදුල පුරා ම දිව යන්නට වි ය. කිසිදු දවසක සෙල්ලම් බඩු අතපත නොගෑ ළපැටියෙකු මෙන් විශ්ව මහත් තණ්හාවකින් ඒවා වැළඳ ගත්තේ ය. සමහරක් මල් පඳුරු අස්සේ සැඟවුවේ ය. සමහරක් කැලි කැලිවලට කඩා දැම්මේ ය. වැලි දූලි ගා ගනිමින් ඔහු මිදුල පුරා එහෙ මෙහෙ දුව පැන්නේ ය.

දුල්ලෑවගේ රථය ගෙවත්තට ඇතුළු වූවේ එ විට යි. ඔහු මිදුල මැද රථය නතර කළේ ද වේගයෙන් තිරිංග තද කරමිනි. මම ජනෙල් කවුළුවෙන් පහත මාලය දෙස බලා ගෙන සිටියෙමි. කාරයෙන් බැස ගත් විගස දුල්ලෑව සැණෙකින් සෙල්ලම් බඩු කීපයක් දුහුවිලි පිසදා අතට ගත්තේ ය. කිසිවක් ගණන් නොගත් විශ්ව තවත් සෙල්ලම් බඩු කීපයක් තමාගේ තුරුලේ ම තබා ගත්තේ ය.

‘බුරුවා...’

දුල්ලෑව රතුසු මුහුණින් බලා විශ්වට රැව්වේ ය. ගෙරෙව්වේ ය. පසුව අතට ගත හැකි පමණ සෙල්ලම් බඩු ද ගෙන ගෙට ඇතුළු වූයේ ය. විශ්ව ද තමන්ගේ තුරුලේ තිබුණු සෙසු සෙල්ලම් බඩු ත් රැගෙන දුල්ලෑව පසු පස වැටී ගෙට ආවේ ය.

මම පුතාව තුරුලු කොට ගෙන ජනේලයෙන් එ පිට බලා ගෙන ම සිටියෙමි.

‘කුමක් සිද්ධ වුවත් එයට මුහුණ දිය යුතු ය.’ එකී හැඟීම තදින් සිතේ ධාරණය කොට ගෙන මම මොහොතක් ඉවසීමි.



දෑස ගිනි දවා ගත් දුල්ලෑවගේ බැල්ම මා වෙලා ගත්තේ ය. හිටි පිම්මේ ම සිටියා විනා සෙලවෙන්නට වත් නොහැකි තරමට එකී බැල්ම ප්‍රතාපවත් ය. දිවි මකුළු දැලකට හසු වූ කෘමියෙකු මෙන් මම හැකිළී ගියෙමි. මගේ හෘදය වස්තුව පවා සංකෝචනය වන බවක් දැනිණ. මින් පෙර නොදුටු තේජසක් මම දුල්ලෑව වෙතින් දුටිමි.

‘කවුද නේත්‍රා මේ සෙල්ලම් බඩු විසි කළේ...?’

‘මම....’

‘ඇයි...?’

‘ඕව මගේ දරුවට ඕන නෑ...’

‘ඔය පුංචි පැටියට නේත්‍රා ආදරේද....?’

‘ඔව්...’

‘ඔය පැටිය කාගෙද කියල නේත්‍රා දන්නවාද...?’

‘මගේ බඩේ හැදිච්ච පැටිය මගේ...’

‘මගේ නෙමෙයි. අපේ දුල්ලෑව පරම්පරාවෙ...’

‘මොන පරම්පරාවෙ උණත් උගේ අම්ම මම...’

‘නේත්‍රා.... ආයෙත් පිස්සු වැඩ කරන්න එපා. නේත්‍රා ඉන්නෙ අපේ ගෙදර. කන්න අඳින්න ඕන එපා කරන දේ ඔක්කෝම මේ වහලෙ යට තියනවා. ඒ ඔක්කොම හොඳයි. සෙල්ලම් බඩු විතරක් නරකයි. මේව විසි කළාට වැඩිය හොඳයි පුච්චල අළු ගාගත්තා නම් නළලේ. මොන අයිතිය උදුර ගත්තත් මං නිශ්ශබ්ද වෙලා ඉන්නම්. මේ ගෙදර ඕන දෙයක් නේත්‍රා අයිති කර ගන්න. පොඩි එකාට හැදෙන්න, හැසිරෙන්න, විනෝද වෙන්න තියෙන අයිතිය උදුර ගන්නෙ නැතුව. පව් සිද්ධ වෙයි...’

මට දෙන්නට උත්තරයක් ඉතිරි වූයේ නැත. මුව පොව්වෙකු මෙන් විශ්ව නොතේරුම් සංවාදය අසා සිටියේ ය. දුල්ලෑව ප්‍රතාපවත් යක්ෂාවේශයෙන් ම ක්ෂණිකව විශ්ව දෙසට හැරුණේ ය.

‘විශ්ව..... පරවැඩ කරන්න එපා යකෝ. උඹ අපේ මුළු ජීවිතේම අවුල් කළා. උඹම පිස්සෙක් වුණා. උඹට කවදාකවත් හොඳ වෙන්නෙ නැත්නම්.... උඹම උඹට පිස්සු හදාගත්තා නම් උඹටත් මැරෙන කල් මේ

ගෙදර ඉන්න පුළුවන්. ඒත් මං කියන විදිහට. මේ දරුවට හිරිහැර නොකර තිරිසනෙක් නොවී. උඹට තේරුණාද...?

විශ්ව ඔව් කීවේ ද නැත. නැහැ කීවේ ද නැත. විස්තර කළ නොහැකි තරමට ඔහු මැළවී ගියේ ය. බියෙන් වෙවුළන අභය නොලැබූ අසරණයකු මෙන් සැඟවීමට තැනක් සෙව්වේ ය. තමා ඉදිරියේ ඉන්නේ තමාගේ බිරිඳ, දරුවා සහ පියා යන පිරිමි හැඟීම් ඔහුට නොතිබුණේ ය. මරණයට මොහොතකට පෙර තම මව වෙත දිව යන සිහින්නෙකු මෙන් විශ්ව සැණෙකින් මවෙතට දිව ආවේ ය. මාගේ දෙදණ ත්, දෙකලවා ත් අතර හිස සඟවා ඔහු බෙරිහන් දී හඬන්නට වි ය. විදුලි සැර වැදුණ හා පැටියෙකු මෙන් ඔහුගේ හිස බමන අයුරු මට දැනිණ. කම්පනය වන හඬ මට දැනිණ.

'ඔයා බයවෙන්න එපා විශ්ව. කවුරු කොච්චර පුප්පල කෑ ගැහුවත් මං ඉන්නෙ ඔයත් එක්ක. මං ජීවත් වෙන්නෙ ඔයත් එක්ක. මං ඔයාට කරදරයක් වෙන්න දෙන්නේ නෑ. ඔයා මගේ ළඟින් ඉන්න කෝ.... ඉතිං පොඩි එකෙක් නොවී නැඟිටින්න.'

'නේත්‍රා ලැස්ති වෙච්ච කිසි දෙයක් ඒ විදිහටම සිද්ධ වුණේ නෑ නේද...?'

'වෙන අය ලැස්ති වෙච්ච දේවලුත් නවම සිද්ධ වුණේ නැහේ....'

'මං නේත්‍රාට මීට හුඟක් කාලෙකට ඉස්සර කිව්වා මං නේත්‍රා වෙනුවෙන් ඕනෑම කැපවීමක් කරල පෙන්වනවා කියලා. මං දැනටත් එහෙම දේවල් කරල තියෙනවා...'

'ඒවා මට කරපුව නෙවෙයි. තමන්ටම කරගත්ත ඒවා...'

'පරට්ටි..... මං මගේ ගෑණි මරා ගත්තොත් මට ඕන හින්දද...?'

'තාත්තේ.... ඇයි මට ආයෙත් නිස්කාන්සුවේ ඉන්න නොදෙන්නෙ...? මට මගේ පාඩුවේ ඉන්න නොදුන්නොත් මං මගේ දරුවත් අරං හිස හැරුණ අතේ යනවා...'

'තේත්‍රාට ගන්න පුළුවන් අන්තිම තීරණේ ඒක බව මං දන්නවා. අන්න එදාට මං මේ ගෙදර ගිනි තියලා මේකේ ඉතිරිවෙන එවුන්වත් මරලා.... මමත් මැරෙනවා.... දරුව අරන් ගියොත් ඒ ටික ස්ථිරවම වෙනවා..'



මගේ ප්‍රතිඋත්තරය බලාපොරොත්තු නොවී ම දුල්ලැව කාමරයෙන් එළියට ගියේ ය. මම විශ්ව නැඟිටුවා ගෙන පුතාගේ කොට් එක සමීපයට ගියෙමි.

'හැමදාමත් හැමදාකමත් මට මේව අහ අහ ඉන්න බෑ විශ්ව. හිටි ගමන් මේ ගෙදර ගිනි ගන්නවා. හිත ඇතුළේ බුර බුරා නැඟෙන ගිනි දැල් හැමදාම මං කඳුළු වතුරින් නිවනවා. කඳුළු උනන්නේ හිමීට. ඒත් ගින්දරට වැඩිය ඒ කඳුළු බරයි. දැන් මගේ ඇහෙන් වැටෙන්නෙ බොළඳ කෙල්ලෙකුගේ නොමේරූ කඳුළු නෙමෙයි. අම්මා කෙනක්ගේ කඳුළු. අම්මලාගේ කඳුළු බර වැඩියි. ඒ කඳුළු ගින්දරට වැඩිය බරයි. ගින්දරය වැඩිය සැරයි. මගේ ඇහෙන් බෝවෙන හැම කඳුළකම අග ඔයා ඉන්නවා. ඒ කඳුළු වැටෙන්නෙ ඔයා වෙනුවෙන් විවර වෙච්ච ඇස්වලින්. හරියට මං වැන්දඹු වෙච්ච ගැහැණියක් වගේ. නොසන්ඩාලයන් අතින් අනාථ වෙච්ච ගෑණියෙක් වගේ. මං එදත් දැනගෙන උන්න ජීවිතේ කියන්නෙ පාට පාට හීනෙකට නෙමෙයි කියලා. මං ඔයාට මගේ ජීවිතේම දෙන්නම් විශ්ව. දෙවියන්ගේ නාමෙන් මට මගේ ජීවිතේ දෙන්න...'

කවර දාකට ත් වඩා විශ්ව මා කියන දෙය අසා සිටියේ ය. මම වැව් සොරොව් විවර කළෙමි.

'ඔයා තට්ට තනියම මේ කාමරේට වෙලා ගුලිවෙනවා. ඔයා හිතන්නෙ ඔයාට කාත් කවුරුවත් නෑ කියලා. බෙහෙත් දුන්නම පොඩි එකෙක් වගේ ඒවා බොනවා. ඔයා දන්නවාද බෙහෙත් බීල හොඳ කරන්න තරම් ලෙඩක් ඔයාට නෑ කියලා. මං උණුහුමට පැටියට තුරුලු වෙලා නිදාගන්න ඒක ඇත්ත. ඒත් මගේ හිත හඳ එළිය වගේ නිතලයි. කොච්චර ගිනිලැව්ත් මගේ හිත ඔයා වෙනුවෙන් ගිනිගන්නේ නෑ. ඔයා මටයි මේ අපේ පැටියාටයි ගින්දර දෙන්න එපා. නිවන්න බැරි වෙයි. ඔයාටම දුක් කරදරයක් දැනුණම උණුහුම ආරක්ෂාව ඕන නේද? බලන්න ඔයා දැනුත් තාත්ත බැන්නම මගෙ ළඟට දුවගෙන ආවා. උණුහුමට ආරක්ෂාවට. ජීවිතේ එහෙම තමයි විශ්ව, මමත් පොඩි එකා ඇහැරියාම රෑට තනිවෙනවා. අනාරක්ෂිතයි කියල දැනෙනවා. මාත් ඔයාට තුරුලු වෙන්නෙ උණුහුමට. ආරක්ෂාවට, ඔයා දන්නවාද? ඒ හැම වතාවකම ඔයා මාව ප්‍රතික්ෂේප කරනවා. පිළිකුල් කරනවා. එහෙම කරන්න එපා විශ්ව. මං පව්. ඔයාට ඩිංගින්නක්වත් එහෙම හිතෙන්නේ

For E-Pusthakalaya

නැද්ද?'

මා ඒසේ කියද්දී විශ්ව ඇත බලා ගත්තේය. මම ඔහුගේ මුහුණ මගේ මුහුණ දෙසට හරවා ගතිමි. දෑසට දෑස ඔබා කතා කළෙමි.

'මැළවිලා ගියාට ඔය ඇස් තවමත් දීප්තිය දෙනවා. ඔය ඇස් අස්සෙ හැංගිලා මගේ පරණ විශ්ව තවමත් ඉන්නවා. අහක බලන්නේ නැතුව ඔහොමම ඉන්න...'

මම එසේ කියා ඔහුගේ නළල සිප ගතිමි. කඳුළු වැටෙන්නට පෙර ඔහුගේ දෙකම්මුල් සිප ගතිමි. මාව පිළිකුල් කරන්නට පෙර ඔහුගේ දෙතොලට දෙතොල තැබීමි. සීතල ..... ඔහු සීතල වී ගිය තරම්....

'ඇයි විශ්ව...?'

'උඹ යකා...'

විශ්ව පිළිකුල් ලෙස කීවේ ය. එහෙත් මට දැනුණු පිළිකුලක් නැත. මම ඔහුගේ කට හඬට ආශා කළෙමි. විශ්ව කතා කරන්නේ ම නැති තරම් ය. ප්‍රතික්ෂේප කිරීමට හෝ ඔහු මට කතා කළ හෙයින් මම තුටු පහටු වීමි.

'මට සතුටුයි විශ්ව...'

මම ඔහුගේ ගෙලේ එල්ලුණෙමි. ඔහුට මිදෙන්නට ඉඩ නොදී ගෙලේ එල්ලී ගෙන ම සිටියෙමි.

දොර හැර දුල්ලෑව කාමරයට පිවිසුණේ ය. මම සිටි ඉරියව්වේ ම සිටියෙමි. ඉඳිමින් ම ඔහු දෙස 'කුමකටද...?' වැනි හැඟීමකින් බැලීමි. 'ඇයි ඉරිසියාද?' වැනි හැඟීමක් ද එහි නොතිබුණා නොවේ.

'කොච්චර කළත් නේත්‍රාට විශ්වව පොළඹවා ගන්න බෑ...'

'මට එහෙම එකක් ඕන නෑ...'

'නේත්‍රා කවදාවත් ඔහොම කරල හරියන්නේ නෑ...'

'මං කරන්නෙ මට ඕන දේ...'

'ඒත් විශ්වට ඕන නෑ... නේත්‍රාට ඕන කරන දේ කරන්න.'

'මට විශ්ව ගැන වල් හිතක් නෑ...'

'කවුරු ගැනද වල් හිතක් තියෙන්නේ...?'



'එක පරයෙක් ගැනවත් මට එහෙම හිතෙන්නේ නෑ...'

'නේත්‍රාට හොඳට රඟපාන්න පුළුවන්නේ...?'

'කවුරු කවුරුත් වගේ මමත් දැන් රඟපානවා...'

'හිටපු ගමන් 'තාත්තා' වෙනවා. 'මිස්ටර් දුල්ලෑව' වෙනවා 'පරයා' වෙනවා. තමන්ගේ වැඩේ කරගන්න කල් ඉතිං රඟපානවා. නේත්‍රා ඔය තවම බහින්නේ පල්ලම... අමාරු හරිය ඉස්සරහට...'

'ඕන මහගිරිදඹක් නගින්න මට පුළුවන්...'

'ඒත් අමාරු හරිය ප්‍රපාතයක් වෙන්නත් පුළුවන්...'

'මං ඕන එහෙකට ලෑස්ති ගෑණියෙක්...'

'මං වගේම...?'

'මට කවුරුවත් වගේ වෙන්න ඕන නෑ...'

'ඒත් ඔය දරුව...?'

'දරුවත් මං වගේ තමයි...'

'පැත්තට හැරිල බැලුවොත් නේත්‍රාට තේරෙයි දුල්ලෑව පරම්පරාවෙ කපාපු පලුව...'

'මං මේකා ජාතක කළේ දුල්ලෑව පරම්පරාවට තමයි...'

'ඔය විශ්වගේ බෙල්ලේ එල්ලෙන්නෙත් එහෙම එහෙකට වෙන්ඩැති...'

'මට ඒකත් බැරි නෑ...'

'එහෙම වුණොත්.... ඊළඟ දරුවත් මමම හදන්නම්කෝ...'

දුල්ලෑව නැවත් යන්නට ගියේ ය. ඔහු ආගන්තුක ගරු රඟපෑමක් කරන්නෙකු මෙන් ගුප්ත ලෙස හැසිරෙන්නට වි ය. මම විශ්වගේ මුහුණ සෝදා ඇඳුම් මාරු කළෙමි. ඔහුගේ නග්න කයෙහි ස්වරූපය මා දකින විට වත් විශ්ව හැකිළුණේ නැත. මම ඔහුගේ මුළු සිරුරේ ම දහදිය යන්නට හොඳින් සෝදා පවිත්‍ර කළෙමි. අලුත් ඇඳුමක් ගෙන ඔහුගේ ඇඟ ලෑවෙමි.

'දැන් බබා වගේ...'

For E-Pusthakalaya

දෑත දෙපා අතර රුවා ඔහු සිනා සුණේ ය.

'දැන් ඉතිං මම ඇඟ සෝදා ගෙන එනකල් හොඳ තාත්තා වගේ අපේ පුතා බලාගන්න ඕන. තේරුණාද...?

මම විශ්ව දෙසට විකසිත බැලුම් හෙළා කීවෙමි. ඔහු නොහික්මුණු සෙයක් ගත්තේ ය. එහෙත් මම කිසි විටෙක විශ්ව ළඟ පැටියා තබා මොහොතකට වත් ඉන් බැහැර නොවීමි. විශ්වගේ චර්යාවේ අවිශ්වාසවන්ත බව මගේ සිතට වදයක් මෙන් ම ප්‍රහේලිකාවක් ද වීම එයට හේතුව යි. මම නැවතත් විශ්ව දෙසට විකසිත බැලුම් හෙළා සිනා සීමි. ඔහුට සමීප වී දෙකම්මුලෙන් අල්ලා ගතිමි. ඇඟිලි තුඩුවලින් ඔහුගේ දෙකම්මුල් මිරිකුවෙමි.

'උඹ යකා...'

ඔහු නැවතත් නොසන්සුන් වි ය.

'කවුද විශ්ව යකා...?'

මම ඔහු ළඟින් වාඩි වී ඇසීමි.

'මම යකා නම් ඔයා යකා මහත්තයා...'

මම ව්‍යාජ ලෙස සිනා සීමි.

ඒ සිනා සුණා ම නොව හඩන්නට බැරිකමට ය.



# 18

'විශ්ව වසන්තය ඇවිල්ලා...'

මම ඔහුගේ ඇහේ ගැවී නොගැවී සිටියෙමි. විශ්ව මගේ ගෙල ත් උරහිස ත් දිගේ සුරත දිගේලි කළේ ය. මගේ සියොළඟ හිරිගඩු පිපිණ. විශ්ව මගේ නිතඹ කෙනිත්තුවේ ය.

'ආදර වැස්සක් වහින්න හොඳටම ළඟයි...'

මම නෙතගින් අඩවන් වූ.බැල්මක් පාමින් කීවෙමි.

සුදුපාට සමන්පිච්ච රැට කහපාට ය. සමනල්ලු ඉගිළ විත් පිච්ච පඳුරේ නවාතැන් ගතිති. මල් බිස්සේ සිය නේක වර්ණ පෙති සඟවා ගැනීමට ඔවුහු වෙහෙසෙති. මම නිරාවරණ ගෙල ත් මුහුණ ත් විශ්ව දෙසට ඔසවා සිට ගතිමි. ප්‍රේමයෙන් ආර්ද්‍රව මගේ ගෙල ත් දෙකම්මුල ත් සැණෙකින් තෙත් කිරීමට තරම් විශ්වගේ දෙතොල් කඩිසර වි ය. මම ඔහුට ඉඩ හළෙමි.

වඩ වඩාත් ශක්තිමත් විශ්වගේ ඇඟිලි තුඩු මදෙසට තෙරපී ඔහුගේ බාහු අතර මා සිර වි ය.

'ලස්සන ඇස්...'

සඳ කාන්තියට මගේ මුහුණ හරවා විශ්ව තමාට ම කියා ගත්තේ ය. නළියන, පොපියන, දිලි දිලි හිනැහෙන නේත්‍ර මංගල්‍යය මම ඔහුට පිළිගැන්වීමි. එහි අංශුවකුදු අවකාශයට යා නොදී ඔහු එය විඳ ගනියි. උරා ගනියි.

'කතා කරන ඇස්...'

ආශාවනට නළියන.... පියන් පත් නොසළා හිනැහෙන.... විශ්වගේ තාරුණ්‍යයේ දැස දෙස බලා මම ද මට ම කියා ගතිමි.

'හැමදාමත් සඳ එළිය කහ පාටද...?'

විශ්ව ප්‍රශ්න කරන්නේ මගෙන් විය යුතු ය.

'හැමදාමත් සඳ එළිය මා ළඟද?'

මා ප්‍රශ්න කළේ ද මගෙන් ම විය යුතු ය.

'හීනෙකින්වත් මං දුකක් දෙන්නේ නෑ...'

'කවමදාකවත් මං ඈත්ව යන්නේ නෑ...'

නොතිත් ආශාවකින් අපි එකිනෙකා වැළඳ ගෙන බොහෝ වේලා ගත කළෙමු.

අපි සැහැල්ලු වීමු.

අපි සැනසීම ලැබීමු.

මම සැණෙකින් නින්දෙන් දැස හැර වටපිට බැලීමි. සමීපතම යහනේ, විශ්ව ගොරෝද්දේ අදිමින් නිදා සිටී. මට ඉබේට ම වේලාව බැලිණ. මැදියම් රැය ද ඉක්ම ගොස් ය. මම කඩිනමින් ඇඳෙන් බැස විශ්වගේ යහනට ගියෙමි. ප්‍රේමය ආරූඪ කර ගත් ආවේශයකින් විශ්වගේ මුහුණ දෑතින් ම අල්ලා සිප ගෙන සිප ගෙන ගියෙමි.

බැළලියකට හසු වූ මී පැටියෙකු මෙන් තිගැස්සුණු විශ්ව පළමුව කෙඳිරි ගෑවේ ය. දෙවනුව දැස හැර වඩා වේගයෙන් හුස්ම ඉහළ පහළ ගත්තේ ය. තෙවනුව පිළිකුලෙන් හා බියෙන් මා ප්‍රතික්ෂේප කළේ ය.

'එපා.... එපා. මං මැරෙයි..... මාව මරන්ඩ එපා...'

එක එල්ලේ මදෙස බලා ගෙන ම විශ්ව යහනින් නැගිට්ටේ ය. නිදිමතේ ම වෙවුලමින් දොර මුල්ලට ගියේ ය. දෑත, දෙපා ගුලි කොට උන්ඩි කොට ගෙන වාඩි වී ය. හැකිළුණු සිහින් ද ගතින් ද යුතුව මදෙස බැලුවේ අභය ඉල්ලන්නාක් මෙනි.

ඔහුගේ බැල්ම ඉදිරියේ මා අපහසුතාවට පත් වන තරම්....'

ස්වාමි දූවක් ඉදිරියේ සොරකමක් කොට පැකිළෙන වහල් කොලු ගැටයෙකු තරම් ම විශ්ව අසරණ වී සිටියේ ය. එකී අසරණකම, අසරණ



පෙනුම ආදරය කළ ගැහැණු හිතට වාවා දරා ගන්ට බැරි තරම් පීඩිත ය.

ඔහු ඉදිරියේ මම මංමුලා වී සිටියෙමි.

'යක්ෂණී පළයන්.... මාව මරන්ඩ එපා.... පළයන්.... පළයන්...'

විශ්ව බිත්තිය දෙසට තෙරපෙමින් කීවේ ය.

'බොරුවට කෑ ගහන්න එපා විශ්ව. පුතා ඇහැරෙයි. අනික පහළට ඇහුණොත් හිතයි මේ මහ රෑ අපි දෙන්නා පිස්සු නටනවා කියලා. මමයි වැරැද්ද කළේ.... යන්න.... ඔයා ඇඳට ගිහින් නිදා ගන්න....'

මම ඉහළට ගත් හුස්ම නොහෙළා ම පහත් ස්වරයෙන් කතා කළෙමි. මා හුස්ම හෙළන්නට ත් පෙර විශ්ව යහනට වැදිණ. හොරැ හින් මදෙස බලා පොරෝනය ගෙන එ තුළට ගුලි වී නිදන්නට වි ය.

'සමාවෙන්න විශ්ව.... මට සමාව දෙන්න...'

යා යුතු අතක් නොදැන තටු සිඳී අතරමං වූ කිරිල්ලියක මෙන් මම තෙපළීමි.

විශ්ව පොරෝනය ගෙන පාදාන්තය ද වසා ගත්තේ ය. පිටතට පෙනුණේ ඔහුගේ සැළෙන උරපතු පමණි. උණ සන්නිපාත රෝගියකු මෙන් ඔහු කම්පනයට වෙවුළන බව පමණක් මම නිරීක්ෂණය කළෙමි.

මගේ ම දරුවා ගැන ත්, විශ්ව ගැන ත් මගේ හිතේ නොනිම් වේදනාවක් තිබුණු බව සැබවි. එහෙත් සියල්ල මට ම, මා වෙතට ම තෙරපෙන විට මා වෙනුවෙන් ආත්ම අනුකම්පාවට උපදින වේදනාව දරන්නට කෙනෙක් සිටියේ නැත. සියලු වේදනා පරයා මා වෙනුවෙන් උපන්, මා තුළින් ම උපන් අනුකම්පාවකින් මාගේ සියොළඟ ම දැවී ගියේ ය.

උමතු හැඟීමෙන් නොවූවත් මම විශ්ව දෙසට වඳින්නට මෙන් දෑත එකතු කළෙමි.

'මමයි රත්තරං වැරැද්ද කළේ. මං හීනයක් දැක්කා. ඔයත් එක්ක එළියේ සමන් පිච්ච මල් ගාලේ ඇවිදිනවා දැක්කා. මං ඔක්කෝම හැඟීම් පාලනය කරගෙනයි ජීවත් වුණේ. ඒත් හීනෙන් ඇවිත් ඔයාගේ ආදර හිත මට වධ දුන්න. මටම ආදරේ දරාගන්න බැරිවයි කළබල වුණේ. මට සමාවෙන්න...'

මම විශ්ව ස්පර්ශ නොකොට කීවෙමි. මගෙන් මුදා හැරෙන බොහෝ වචන ඔහුට දරන්නට නොහැකි බව මම තේරුම් ගතිමි. මා කතා කරන අතරමග ඔහු බොහෝ විට දෙපා තව තව පපුව දෙසට ගත්තේ ය. දෙදණ පපුව තෙක් ඉහළට නවා දෑත ඒ අතර සඟවා ගත්තේ ය.

මම හිස්ම හිස් හැඟීමකින් යහනට ගියෙමි.

වසරකටත් අධික කාලයක් මම පුතා වෙනුවෙන් ම වෙහෙසීමි. ඉසිවර පුතා දැකීම ම, ඔහු වෙනුවෙන් වේදනා විඳීම ම, අනන්තයක් නැති අනන්ත රේඛාවක් වි ය.

නුවර සිට අපේ තාත්තා පැමිණ රාජගිරියේ නිවසේ අප සමඟ දින දෙකක් රැඳීම ඒ තැන් සිට මගේ ජීවිතය තීරණය කිරීමේ ලා වැදගත් ම සිද්ධිය වි ය.

'මං පුතේ උඹව විකුණන්න හදනව වගේ වැඩක් කියල උඹ මේ ගැන වැරදි විදිහට හිතන්න එපා...'

තාත්තා මුල පිරුවේ ය.

'නෑ තාත්තේ මං එහෙම හිතන්නේ නෑ...'

'උඹ ඉස්සෙල්ල දුල්ලැව මහත්තයාට විස්තරේ කියපං..... මම හිතන්නේ බෑ කියන එකක් නෑ...'

මම තාත්තාට මගෙන් ඉටු විය යුත්තේ කුමක් දැයි විමසීමි.

'මොකක් උණත් කමක් නෑ. තාත්තා කියන දෙයක් කෙලින් කියන්න.'

'මං මෙහෙම කියන එකෙන් උඹට කරදරයක් වෙයි කියල හිතනවනම් උඹ ඒ දේ නොකර හිටිය කියල මගේ තරහක් නෑ. මම අන්තිමට තමයි තීරණය කළේ මේක උඹට කියන්න ඕන කියල.'

'මොකක්ද තාත්තෙ?'

'දැන් මාර්කට් එක ඉස්සරහ අන්නාසි විකුණල ජීවත් වෙන්න බෑ. උඹට කිව්වම මොකද දැන් අම්මයි මමයි උණත් ජීවත් වෙන්නෙ අමාරුවෙන්. සමහර දවස්වලට රුපියල් පනහකවත් ආදායමක් නෑ. අපි දෙන්න නොකා නොබී ඉන්න දවසුත් නැතුවම නෙමෙයි.'



'මං ළඟ සල්ලි ටිකක් තියෙනවා. මං ඒක තාත්තට දෙන්නම්.'

මම මගේ ජීවිතය පිළිබඳව නිරන්තරව කල්පනා කළා මිස අම්මා තාත්තා පිළිබඳව සිතා නොබැලීම ගැන මා තුළ පසුතැවිල්ලක් ඇති වි ය. එය ගෙවා දැමිය නොහැකි පාපයක් තරමට මගේ සිතට වධයක් වි ය. අම්මා කෙනෙකු වූ මම මගේ අම්මා ගැන මීට වඩා සිතිය යුතු නොවේ ද? අම්මාගේ ත් තාත්තාගේ ත් ඒකායන බලාපොරොත්තුව වූවේ මගේ ජීවිතය සාරවත් කිරීම ය. එහෙත් එකී බලාපොරොත්තු මා සුළඟේ පාවෙන්නට හැරියා මිස බරක් කොට නොගත්තේ මා මට ම ආත්මාර්ථකාමී වූ නිසාවෙනි.

'මම කොහොම හරි ගෙදර වියදම එවන්නම්. තාත්තා මාර්කට් එක ළඟ වෙළඳාමට නොගිහිං ඉන්න.'

'කොහොමත් මං පහුගිය ටිකේ මාර්කට් එකේ හිටියේ කැමැත්තකින් නෙමෙයි. 'සිල්වා මොකද දුල්ලැව බොස් සලකන්නේ නැද්ද?' කියල අහනවා. පපුවට පිහියෙන් අනිනවා වගේ හිත්ට් පාස් කරනවා. 'සිල්වා.... උඹ තමයි දවසකටවත් මිනිහ. ඇටකටු කඩාගෙන, පොළොවෙ පස් කාගෙන ගුටි කාලා.... කොහොම හරි දුව හේත්තු කළා නේද?' කියල අහනවා. ජේමන්ට් එකේ හිටියත් මං කවදාකවත් මිනිස්සුන්ට ඔය තරම් පාච්චල් වුණේ නෑ. දැන් නම් ඉතිං අපි බොහෝම අසරණ වෙලා. කඩේකින් ණයට කුනපහ ටිකවත් ගන්න බැරි තරමට උන් මාව සමච්චලේට අරං...'

තාත්තා කියා ගෙන කියා ගෙන ගිය ත් නොකියූ කොටස් බොහෝ දීර්ඝ යැයි ද දුක් සහිත යැයි ද මම තීරණය කළෙමි. තාත්තාගේ මුහුණ බෙරි වෙලා ය. ඔහුගේ දෑසින් කඳුළු වැටෙතැ යි මම බිය වීමි. ඊට පෙර මම කතා කළෙමි.

'මට සමාවෙන්න තාත්තෙ. මං මීට පස්සේ අම්ම තාත්ත ගැන හොයල බලනවා. මේව මගේ වැරදි. මමත් හිතපු දේවල් නෙමෙයි උණේ. විශ්වත් එක්ක මේ ගමන පිටත්වුණු දා ඉඳල මගේ හිතේ තිබුණේ ගින්දර. මට ඒක හින්ද අම්ම තාත්ත දුක් විඳිනව කියල හාන්කවිසියක්වත් දැනුණෙ නෑ. මේක මගෙ වැරැද්ද. තාත්ත කනගාටු වෙන්න එපා. මං ගෙදරට කීය කීය හරි පුළුපුළුවන් විදිහට එවන්නම්.'

මගේ වචන කො තරම් හැඟිම්බර වුණ ත් තාත්තාගේ කනස්සලු ස්වභාවය දුරු කිරීමට ඒවා සමත් වූයේ නැත. බැරි ම තැන මම නැවතත් තාත්තාගෙන් ප්‍රශ්න කළෙමි.

'ඇයි තාත්තේ?'

'නෑ.... මේක උඹට කියල වැඩක් නෑ...'

'මොකක්ද?'

'අපි ඉන්න කටුගස්තොට ගේ කෑල්ල අයිතිකාර මිනිස්සු විකුණන්න හදනවා. කුලියටවත්, බද්දටවත් දෙන්න බැරිලු. ලක්ෂ තුනහමාරකට විකුණනවලු. ලක්ෂ තුනහමාරක් තියා රුපියල් තුන් හාරසීයක්වත් අපිට හොයා ගන්න බෑ. අපිම ගේ ගන්නවා නම් ලක්ෂ තුනකට දෙන්නම්ලු. මං ආවේ මේක දුල්ලෑව මහත්තයාටවත් කියන්න. උඹට මේක හිතට බරක් නම් නොකිය හිටපං...... මං නම් පිරිමියා. අම්මත් එක්ක ආයෙත් පේමන්ට් එකක් ගානේ ලගින්න මං කැමති නෑ. ගේ ගන්න ලැබුණොත් එතනම පෙට්ටි කඩයක් හරි දාගෙන ජීවත් වෙන්න පුළුවන්. ඒත් ඉතිං මේක කොහොමද දුල්ලෑව මහත්තයට කියන්නෙ?'

'මං කියන්නම් තාත්තෙ.'

මම දෙවරක් නොසිතා ම කීවෙමි. තාත්තට කිසිවෙකු ඉදිරියේ පින්සෙණ්ඩු වීමට ඉඩ නොදී මා මේ නිවසේ වහළියක වුව ද කම් නැතැයි මම සිතීමි. මට මේ සිද්ධිය නිසා දුල්ලෑව ඉදිරියේ තව තවත් අසරණ වීමට සිදු වන බව මම දැන සිටියෙමි. එහෙත් අම්මා තාත්තා අසරණ වනවාට වඩා එය මට දරා ගැනීමට පුළුවන් යැයි සිතා මම සිතට දිරිය ගත්තෙමි.

'මම ඉක්මනින් නුවර යන්නත් ඕන. අම්ම විතරයි ගෙදර. මං මෙච්චර දවසක්වත් මේ ගෙදර හිටියෙ උඹට මේ ටික කියාගන්න බැරුව.'

'මට ප්‍රශ්නයක් වෙන්නෙ නෑ තාත්තෙ. මං ඉල්ලලා දෙන්නම්.'

සවස දුල්ලෑව නිවසට පැමිණි විගස ඉහළ මාලයට වීත් කාමරයට එබුණේ ය.

'නේත්‍රා... කෝ තාත්ත. නුවර ගියාද?'



'නෑ පහළ ඇති...'

'මං අද නේත්‍රාගේ තාත්තත් එක්ක බියර් එකක් බොන්න ඕන.... පුතාට කිරි දුන්නද...?'

'ඔව්...'

'කීයටද නැව්වෙ...?'

'දහයට විතර...'

'දැන් කොහොමද හෙම්බිරිස්සා ගතිය...?'

'තිකං නහය බරවෙලා වගේ තිබුණා. දැන් හොඳයි.'

'නේත්‍රා වතුර නාපු ගමන් පුතාට කිරි දෙන්න එපා. කොණ්ඩෙ වේළෙන කල් ඉඳලා කිරි දෙන්න. අම්මගෙ කොණ්ඩෙ තෙත පිටින් කිරි දුන්නම තමයි දරුවට හෙම්බිරිස්සාව වගේ එන්නෙ.'

දුල්ලෑව කොට් එකට එබී පුතාගේ නළලට අත තබා නහය මිරිකා බැලුවේ ය.

'මං අද ගියා මිස්ට ආටිගල මුණ ගැහෙන්න.'

'ඒ මොකටද?'

'පුතාව ඉස්කෝලෙකට දාන්න දැන්මම ලියකියවිලි හදන්න ඕන. මිස්ට ආටිගල ඉන්නෙ රෝයල් එක ඉස්සරහ. මිනිහ කැමති වුණා. ඔන්න ඒ වැඩෙත් හරි. එතකොට මගේ පුතා රාජකීය පැටියෙක් වෙනවා.'

එසේ කියා දුල්ලෑව දරුවා වඩා ගත්තේ ය. තත්.... තත්... තාත්තා.... යැයි කියමින් ඉසිවර ද දුල්ලෑව ළඟ හුරතල් වී ය. දුල්ලෑව යහනේ වාඩි වී දෙපා දිග හැර දෙපා මත ඉසිවර සිටවා ගත්තේ ය. 'හා... හරි...' යැයි කියා පුතාගේ දෙඅතින් අල්ලා සීසෝ පද්දන්නට වී ය.

'සී.... සෝ අප් ඇන්ඩ් ඩවුන්
බේබීස් ගොයින් ටු ලන්ඩන් ටවුන්...
සී සෝ අප් ඇන්ඩ් ඩවුන්
බේබීස් ගොයින් ටු ලන්ඩන් ටවුන්...'

For E-Pusthakalaya

ඉසිවර යටි ඇන්දේ කිරිදත් පෙන්වමින් දුල්ලැව සමඟ හරි හරියට විනෝද වි ය.

'පුතා යමු තාත්ත එක්ක පහළට...'

දුල්ලැව පුතා දෝතින් ම ගෙන සිප ගත්තේ ය. ඉසිවර දෝතින් ම ඔහුගේ ගෙල බදා ගත්තේ ය.

'දැන් අම්මිට ටටා කියන්න...'

'මම්.... තටා...'

පොඩි එකා සුරත වැනුවේ ය. මම ඔවුන් පසු පස වැටුණෙමි.

'මට මිස්ට දුල්ලැවට පණිවිඩයක් තියෙනවා කියන්න...'

'කාට?'

'මිස්ට දුල්ලැවට...'

'මොකක්ද නේත්‍රා මේකෙ තේරුම? නේත්‍රා මට හිටපු ගමන් තාත්ත කියනවා... ඒක අහගෙන ඉඳල පොඩි එකා තාත්ත කියනවා. ජඩයා, පරයා කියනවා. දැන් මිස්ට දුල්ලැව කියනවා. ටික දවසක් යද්දී පොඩි එකත් මිස්ට දුල්ලැව කියයි.'

මම ටික වේලාවක් නිහඬව මුනිවත රැකීමි.

'මොකක්ද ඔයාට කියන්න ඕන?'

'මට සල්ලි ටිකක් ඕන.'

'කීයක්ද?'

'ලක්ෂ තුනහමාරක්.'

'ලක්ෂ පනහක් හරි මං ළඟ තියෙනවා. නේත්‍රා හිතන්නෙ මං දෙයිද නොදෙයිද?'

'දෙයි කියල හිතලතමයි ඉල්ලුවෙ...'

'අන්නහරි. මං අනිවාර්යයෙන්ම දෙනවා. අදම චෙක් එකක් දෙනවා. මං සල්ලි දෙන හින්දයි අහන්නෙ මොකටද?'

'තාත්තට දෙන්න.'



'දැන් බිස්නස් සරු නෑ. මිනිස්සු පේමන්ට් එකේ අන්නාසි කන්නෙ නෑ. කටුගස්තොට ගෙදරින් යන්න වෙලා. ඒ ගේ විකුණනව. ඒක සින්නක්කර ගන්නයි සල්ලි ඕන. හරි නේද?

'ඔව් මට සල්ලි ඕන.'

'මං කටුගස්තොට ගේ ගන්නම්. අරන් ගේ ඉස්සරහ කඩයකුත් දාල දෙන්නම්. මං ඒක ඔයාගේ තාත්තත් එක්ක කතාකර ගන්නම්.'

බූමරංගයක් හිසේ වැදුණාක් මෙන් මම තිගැස්සුණෙමි. දුල්ලැව ඉන්ද්‍රජාලිකයෙකු මෙන් ක්‍රියා කරතැ යි මම සිතීමි.

'මං සල්ලි ඉල්ලුවේ අසරණකමට නෙමෙයි.'

මම ඉවසිය නොහැකි තැන කීවෙමි.

'එහෙනම් ආදරේට...?'

'මොන සමයමකටවත් නෙමෙයි. වෙන කරගන්න දෙයක් නැති හින්ද'

'ඒ ඕන දෙයක් කරන්න මම ඉන්නවා.'

දුල්ලැව සැණෙකින් මගේ නළල සිප ගත්තේ ය.

මම ඒකරාශී වූ සියලු ම පීඩාවන් හිරිගඩු පිපුණු ශරීරයේ ඔ හිර කොට ගතිමි.

'මං පහළට ගිහිං තාත්ත එක්ක කතා කරන්නම්. නේත්‍රා එන්න අවශ්‍ය නෑ.'

දුල්ලැව තැන්පත් ආඩම්බර ගමනින් තරප්පුව බැස පහත මාළයට ගියේ ය. මා පිටු පසින් විශ්ව සිටිනු මා දුටුවේ එ විට යි. ඔහුගේ දෑසේ උතුරන්නට ආසන්න කඳුළක් නළියමින් තිබිණ.

'අනේ විශ්ව ඇයි මට මෙහෙම වෙන්න ඉඩ දෙන්නෙ?'

'උඹ යකා...'

For E-Pusthakalaya

විශ්ව හඬන්නට ආසන්න ස්වරයෙන් කීවේ ය. මම ඔහුගේ විරෝධය නොතකා ම මහත් වෙර ගෙන ඔහුව සිප ගතිමි.

‘‘අපිට අපේ කියල ජීවිතයක් ඇත්තෙම නැද්ද විශ්ව. ඇයි මෙහෙම වෙන්ඩ ඉඩදීල ඔයා බලාගෙන ඉන්නෙ?’

‘මං ඌව මරනවා.’

‘කාවද විශ්ව මරන්නේ?’

‘මාව.’

‘නෑ විශ්ව... ඔයාට තේරෙන්නෙ නෑ රත්තරං. මාව මරල දාන්න. ඔයා නෙමෙයි මමයි පව්කාරී.’

මම විශ්වගේ දෙකම්මුලේ සිට පහතට දෑත දිගේලි කරමින් කීවෙමි.

‘යමු.’

‘කොහෙද විශ්ව. මං එනවා. කොහෙද?’

‘මැරෙන්ඩ.’

විශ්ව මගේ අතින් අල්ලා කාමරයට පිවිසුණේ ය. මම කාමරයේ අගුළු දැමීමි.

‘කමක් නෑ. අපි අපේ ජීවිතේ තීරණය කරමු. ඔය අත් දෙකින්ම බෙල්ල හිර කරල මාව මරන්ඩ.’

මම විශ්වගේ දෑත ගෙන මගේ ගෙලෙහි රඳවා ගතිමි.

විශ්ව උඩුතොලින් යටිතොල සපා ගෙන මූරණ්ඩු තිරිසන් බැල්මක් හෙළුවේ ය. ඔහුගේ ජ්වලිත දෙනෙත නොසන්ඩාල වේශයක් ගෙන තිබිණි.

‘ඔයාට මාව ඔච්චරටම පිළිකුල්ද?’

‘ඔව්’

දෙවරක් නොසිතා ම ඔහු පිළිතුරු දුන්නේ ය. එය නිරෝගී චෛතසිකයක් ඇති පිරිමියෙකුගේ තීරණාත්මක නිගමනයක ප්‍රකාශනයකි. හිස් තැනක් ඇති සතුටක සේයාවක් මගේ හිත් පතුලේ තළියන්නට වි ය.



‘මං තරහ හිතන්නෙවත් ඔයා ගැන පිළිකුල් කරන්නෙවත් නෑ. ඔයා මාව පිළිකුල් කරත්, මට මොනව කරත් මගේ හිත කියන්නෙ දීනුවෙ මම කියලා. මේ සේරම මට ලැබුණෙ ඔයා නිසා. මම මේ සේරම කැපකළේ ඔයා නිසා. ඔයාට දෙවියන්ගෙ පිහිටයි විශ්ව...’

ඔහු මා ප්‍රතික්ෂේප කරන උපහාසාත්මක බැල්මක් හෙළුවේ ය. අබ මල් රේණුවක් තරම් වත් ඔහු මා ගණන් ගත්තේ නැත. තේක නැටුම් පා රහ පා කුමරෙකුගේ වසඟයට ලොල් වූ නළඟනක් දෙස බලන හිරිකිත බැල්ම මම අපහසුවෙන් දරා සිටියෙමි.

‘ඩිංගිත්තක්වත් මං ගැන ආදරයක් හිතෙන්නේ නැද්ද?’

‘නෑ.’

මම සොඳුරු වදනින් – ප්‍රේමය අයදින දෑසින් ඔහු වෙත බැලූම් හෙළද්දී ඔහු ඉන්ද්‍රඛීලයක් මෙන් නොසැළී උත්තර දුන්නේ ය.

මෙ තෙක් මා දරා සිටි – උහුළා සිටි සියල්ලෙහි එකතුව සදාකාලික අඳුරු ශෝකාන්තයක එළඹුමෙකැ යි මට සිතිණි. ප්‍රේමයෙන් ආඪ්‍ය වූ විටෙක මෙන් මගේ සිත ත් කය ත් පරඬැල් පතක් මෙන් වාරු සොයන්නට වි ය.

මම විශ්වගේ ළය මතට මගේ හිස කඩා හෙළීමි.

‘ඔයාට මාව එපා ද?’

‘එපා.’

‘අපි දෙන්නගේ පුතා?’

‘දරුවා උඹේ උණාට මගේ නෙමෙයි.’

‘පව්කතා කියන්න එපා.’

‘උඹ පව්කාර වැඩ කරන්න එපා.’

‘ඔයා මගේ බෙල්ලෙන් අල්ල ගත්තෙ කේන්තියෙන්?’

‘නෑ මට කේන්තියක් නෑ. මං ඉන්නෙ වෛරයෙන්.’

‘ඔයාට පුළුවන්ද ඒ වෛරයෙන් මාව මරාදාන්න.’

‘මං උඹේ මරණය දකින්න ආසයි...’

‘ඔයා මගේ හිත බලන්න හදන්නේ. ඔයාට එහෙම වෛර කරන්න ඊර්ෂ්‍යා කරන්න නපුරු හිතක් නෑ. මට ඔයාගේ පපුවේ උණුසුම දැනෙනවා. ඔය පපුව ඇතුළේ තියෙන ආදරණීය හිත මං දන්නවා. ඔයා කිව්වෙ ..... සුළං හමාවී – නපුරු තද සීත සුළං හමාවී ... අපි බලා ඉමු. කවදාහරි වසන්තය එනව කියලා.’

‘උඹ මායාකාරියක්.’

‘කාටද විශ්ව මං මායාකාරී දේවල් කළේ?’

‘මගේ තාත්තට.’

‘තාත්තා ඔයාටයි මටයි නේද මායම් පෙන්නුවෙ. එතකොට ඔයා – මං අපි පව් නැද්ද?’

‘නෑ – මගේ තාත්තා පව්.’

‘ඔයා ඔය කියන්නෙ ඇත්තටද බොරුවටද මං දන්නේ නෑ. මං මෙච්චරවත් ඔයත් එකක් වාද කරන්නෙ ඔයා දිගට දිගට කතා කරන එකේ සංතෝෂයට. ඒත් ඔයා ඔහොම කතා කරද්දී මං හරිම අසරණයි විශ්ව.’

‘උඹ මගේ අසරණ අම්මා මැරුවා.’

‘පව් සිද්ධවෙන කතා කියන්න එපා විශ්ව.’

‘මට පව් නෑ. මං උඹව මරලා අපායෙ යනවා.’

‘ඔයා ඔය කතා කරන්නෙ හොඳ සිහි බුද්ධියෙන්. ඔයත් තාත්තා වගේම මටයි මායම් පෙන්නන්නෙ. ඔයාට තර්ක කරන්න සිහිය තියෙනවා, ඔයාට දැන් හුඟක් දුරට සනීපයි. ඔයාගේ හිත ඔය තත්වෙට ගේන්න මං වින්ද දුක – මං ඉවසපු ඉවසිල්ල උඩ ඉන්න දෙයියෝ විතරයි දන්නෙ විශ්ව. විහිළුවටත් මාව ඔය තත්වෙට දාන්න එපා. මාව පිළිකුල් කිව්වා. ඩිංගිත්තක්වත් මට ආදරේ නෑ කිව්වා. දරුව ඔයාගේ නෙමෙයි කිව්වා. ඉන්නෙ වෛරයෙන් කිව්වා. මාව මරන්ඩ ඕන කිව්වා. ඔයාගේ තාත්තා රවට්ට ගත්ත කිව්වා. දැන් කියනව ඔයාගේ අම්මා මරා ගත්තලු. ඔය ටික ඔක්කොම කියන්න පුළුවන්ද හොඳ සිහිබුද්ධියක් නැතිව? මම මගේ පණටත් වැඩිය ඔයාට ආදරේ කළා. කසාද බැඳපු ගෑණියෙක් පිරිමියෙක් එක්ක ඉන්න සිරිතට අපි එක දවසයි එකට



හිටියේ. මං නාමත් පිරිසිදුයි විශ්ව. දෙයියන්ගේ නාමෙන් ඔයා සනීප වෙලා. දැන් මාව පිස්සියෙක් කරන්න එපා. ඔය ටික ඔක්කොම හිතේ තෙරපගෙන ඔයා මේ වහල යට මාව තියාගෙන ඉන්නවට වැඩිය මට ආදරෙන් සිප ගත්ත ඔය අත්දෙකින් මාව මරාදාන්ඩ. මට ඔක්කොම ඉවසන්න පුළුවන්. ඒත් පිරිමි දෙන්නෙක්ගේ අතින් හිරිමතප් බිඳුණ කියල අහගන්නවට වැඩිය මට මරණය සම්පතක්.’

මම විශ්වගේ දෑත ගෙන තව තවත් ගෙලට හිර කර ගනිමින් කීවෙමි. ගෙල මිරිකනවා තබා ඉපල්ලක් බිඳීමට තරම් වත් ශක්තියක් ඔහුගේ ඇඟිලිවල තිබුණේ නැත. ඔහුගේ නොහැකියාව තේරුම් ගත් මම ලතාවක් සේ ඔහු අසළ අඩපණ වුණෙමි. කැටි ගැසුණු සියලු ම දෑඩ් හැඟීම් දෑසේ නාගිගත කොට ඔහු මදෙසට මුදා හරින්නට වි ය. විශ්වගේ දිගටි නාසය දිගේ රූරා වැටුණු දහදිය බිඳක් මගේ උරපත්ත උරා ගති. ඇස් යට නළියන ඔහුගේ මාංශ පේශී චලනයට නැහිය නොහැකි වූ කම්පිත බවේ එකතුවකි.

‘කමක් නෑ. ඔය හිතේ තියෙන කේන්තිය නිවෙනකල් ඕන දෙයක් කියන්න. මට මේ අසරණකම හුරුයි. ඔයාට කාවද ඕන? ඔයා කාටද විශ්ව ආදරේ?’

‘මට මගේ නේත්‍රා දීපං. මට මගේ පණ යන්න ඉස්සර මගේ නේත්‍රා දීපං. නැත්නම් මං උඹව මරනවා.’

‘මාව මැරුවොත් කොයින්ද නේත්‍රා කෙනෙක්? දෙයියනේ හැමදේම හිතනව වගේ සැනසිල්ලේ හිතන්න. ඔයා මොනවද මේ කියන්නෙ. මං ඔයාගේ නේත්‍රා තමයි.’

විස්සෝපය ත් – උමතුව ත් අතර මැද මම පරාජිත වීමි. මම ඔහුගේ මුහුණ දෝතට එකතු කොට ගතිමි. ඔහු සියලු ශක්තිය යොදා මා පසෙකට තල්ලු කළේ ය. රකුසෙකු මෙන් මවෙතට පැන ගත් ඔහු මට පහර දෙන්නට වි ය. කරකියා ගත හැකි කිසිත් නොවී මා බිමට ඇද වැටුණි. මම හිස බිමට හොවා ගතිමි. දෑස නිලංකාර වී ගියෙන් දෑස පියා ගතිමි. කෙස් රොදින් අල්ලා ඔහු මගේ හිස දෙවරක් ම බිත්තියේ ඇන්නේ ය. දෙකොලින් ගලන උණු ලේ වළකා ගන්නට මට ක්‍රමයක් නොවී ය. මම දෝතින් හිස බදා ගෙන බිම වැතිරුණෙමි. ඔහු මට මැරෙන තෙක් පහර දෙති යි මම සිතිමි. ඔහු මට පහර දෙන විට

නවතන කෙනෙක් ද නැත. ඔහු නවත්වන පාටක් ද නැත. මම වේදනාවෙන් කෙඳිරි ගෑවෙමි. මෙ තෙක් කළ කී දෑ සියල්ලේ අවසානය මෙය යැයි මට සිතිණ. ඔහු දෙවරක් මගේ කුසට පයින් ඇන්නේ ය.

‘අපේ පුතා හම්බවෙන්න මං ඔපරේෂන් කරලයි ඉන්නෙ විශ්ව.’.

ලේ සමග සෙම්සොටු කඳුළු පෙරෙන මුහුණින් මා ඔහු දෙස බලා කීවෙමි. ඔහු මා එසේ කී සැණින් මගේ කුස පාගා ගෙන ම සිටියේ ය. වෛරයෙන් ගිනියම් විකල් මුහුණ මදෙසට හරවත් ම කාමරයේ දොර හැරිණ. ඉසිවර පුතා මුලින් ම කාමරයට එබුණේ ය. සැණෙකින් දොර සමීපයට පැන්න විශ්ව ඉසිවරගේ ගෙලෙන් අල්ලා ගෙන මා සමීපයට ගෙනාවේ ය. පසුව නැවතත් කකුලෙන් මගේ කුස පාගා ගත්තේ ය.

‘කියාපිය මේ කවුද?’

ඉසිවර සෘජුව උත්තර දුන්නේ ය.

‘මගේ අම්මා.’

ඔහුට හැඬුම් එන්නට ආසන්න ය. එහෙත් ඔහු හැඬුවේ නැත. ඉසිවරගේ පුංචි ඇස්වලින් කඳුළු පනින්ට ආසන්න ය.

‘කියාපිය මේ ගෑණි මරන්වද එපාද?’

‘මගේ අම්ම මට ඕන.’

ඉසිවර හඬන්නට වි ය.

‘උඹට උඹේ අම්ම ඕන. මට මගේ අම්ම නෑ. මේ ගෑණි අම්ම මැරුවා. මං මේ ගෑණි මරනවා. එතකොට උඹටයි මටයි දෙන්නටම අම්මල නෑ.’

ඉසිවර මහ හයියෙන් විලාප දී හඬන්නට වි ය. විලාපයේ වේගය වැඩි වත් ම විශ්ව කෙමෙන් පය ඉවතට ගත්තේ ය. ඉසිවරගේ දෙපා මුල දණ ගසා ගත්තේ ය.

‘මට බැරිවුණා මගේ අම්ම හින්දා අඩන්න. මට අඩන්න තිබුණ. අඩපං මං කැමතියි උඹ අඩනව දකින්න. මගේ අම්ම හින්දා මගේ ඇස්වලින් නොගිය කඳුළු... උඹේ ඇස්වලින් එළියට පැනපුදෙන්.’

විශ්ව ඉසිවරගේ උරහිසින් අල්ලා සොලවමින් කීවේ ය.



ලීලා ත් දුල්ලෑව ත් කාමරයට පිවිසියේ එ විට යි. ඔවුන් සමඟ මගේ තාත්තා සිටියේ නැත.

‘අනේ මගේ පුතා අහකට ගන්න. අනේ ලීලා මගේ පුතා අරගෙන යන්න. මගේ පුතාට අනතුරක් කරයි. මගේ පුතා ගන්ඩ.’

මම හති දමමින් කීවෙමි. දුල්ලෑව පැමිණ මා ඔසවා ගෙන යහනේ වැතිරැවේ ය. ලීලා විශ්ව සමීපයට ගියා ය.

‘විශ්ව මහත්තයා පුංචි බේබි දෙන්ට.’

ලීලා අණ කරන ස්වභාවයෙන් කීවා ය. එකී කීමට විශ්ව ඉසිවර අත හැරියේ ය. මරණයෙන් මිදුණු හා පැටියෙකු මෙන් ඉසිවර මා තුරුලට පැමිණියේ ය. මම ඔහු බදා ගත්තෙමි.

‘අනේ මගේ පුතේ...’

මම ඔහුගේ හිස අතගා වඩ වඩාත් තුරුලට ගත්තෙමි. පිටතට ඇහෙන තරම් වූ පුතාගේ පපුවේ තිගැස්ම මගේ වේදනාව දෙගුණ තෙගුණ කළේ ය.

‘අපි දෙන්නම වහ ටිකක් කාල මැරෙමු පුතේ.’

‘මගේ වහලේ යට කවුරුවත් මැරෙන්ඩ ඕන නෑ.’

දුල්ලෑව මගේ හිස පිරි මදිමින් කීවේ ය.

‘තොපි ඔක්කොම ඉන්ඩ. මගේ අම්ම මරා ගත්තෙ?’

විශ්ව දුල්ලෑව දෙසට හැරී කීවේ ය.

‘මූට ඇති අසනීපයක් නෑ. දවල් මිගෙල් රෑ දනියෙල් වගේ. තිරිසන් පරයා. මෙහෙමත් ගහනවද යකෝ ගෑණියෙකුට?’

විශ්ව පිළිතුරු දෙන්නට ත් පෙර ලීලා කතා කළා ය.

‘යමු අපි පහළට...’

කටට ගත් වචන පිට නොකර ම විශ්ව කීකරුව ලීලාගේ අතේ එල්ලුණේ ය.

‘යමු.’

ලීලා විශ්ව වාරු කර ගත්තේ ය.

මට අලුත් විකාර ලෝකයක් පෙනෙන්නට වි ය. මරණයේ ඡේයාව දැනෙන්නට වි ය.

For E-Pusthakalaya

'කෝ .... මගේ තාත්තා.?'

'මං බොරුවක් කියල කාමරේට දාල දොර වහලයි ආවි.'

දුල්ලැව කළබලයෙන් කීවේ ය.

මහා අසරණකමකින් ඉසිවර මගේ ගෙල බදා ගත්තේ ය. 'මගේ රත්තරං පුතා' යන හැඟීම පමණක් මසිතේ කැටි ගැසිණ.

'මට අමාරුයි. පුතා ගන්න'

මම දුර්වල ලෙස කීවෙමි. දුල්ලැවගේ මුහුණේ ශාන්තවත් බවක් ඇඳී තිබිණි. මේ නොසන්සුන් මොහොතේ ඔහුගේ ශාන්තවත් බවට ඉසිවර ප්‍රිය කරන්නට ඇත. සැණින් ඔහු දුල්ලැවගේ උකුළට පැන බෙල්ලේ එල්ලී දැතින් වෙළා ගත්තේ ය.

'පුතා එක්ක යන්න පහළට.... මට තනියම ඉන්න ඕන.'

නපුරු හුදෙකලාව මට අවශ්‍යව තිබිණ. පීඩාව, තනිකම සමඟ බෙදා ගන්නට මට ඕනෑ වී තිබිණ. කිසිවෙකුට නොදැනෙන්ට මට තනිව ම හඬන්ට ඕනෑ වී තිබිණ.

'වතුර එකක් දෙන්නද බොන්න?'

'එපා...'

'නළල ටිකක් ගෙඩි ගැහිලා. තව ඕඩිකලෝන් ටිකක් දාන්න ද?'

'එපා...'

හරියට ම හිස් මුදුනේ ඉඳිකටු ඇනෙනවා වැනි වේදනාකාරී රිදුම ගෙල දිගේ යටි පතුලට ම ගිලා බසින සෙයකි. යටි බඩේ වේදනාව පිට කොන්දේ කොඳු ඇට පෙළ දක්වා ම විහිදේ. මම දෑස අයා මුහුණේ මාංශපේශී හකුළුවා නිසොල්මන් වී සියලු ම වේදනා පපු කුහරයට ම එකතු වන්නට හැරියෙමි. වමනය දැමීමට ත්, වැසිකිළි යෑමට ත් දැඩි ඕනෑකමක් තිබුණ ත් දෑස තිලංකාර වී – රෝමෝද්ග්‍රහණය වී දහදිය පිට වී ගත සීතල වී යන තෙක් ම මම සිත් පිත් නැති දරදඬු පදාර්ථයක් සේ සිටියෙමි.



'අනේ....'

මට ඉබේට ම කියැවිණි. මදෙස බලා නොසිටිය ත් මගේ සුසුම් හඬට ඉසිවර පුතා ඉකි ලෑවේ ය. මගේ වේදනාව දෙගුණ තෙගුණ කරමින් කාමරය පුරා ඉසිවරගේ ඉකිබිඳුම දෝංකාර දෙන්නට වි ය.

'මට තනියම ඉන්න දීලා පුතා අරගෙන යන්න.'

මම නොසන්සුන් හඬකින් කීවෙමි.

'මීට පස්සේ මං නේත්‍රාට ඔහොම අඬන්න දෙන්නේ නෑ... අපි යමු පුතේ පහළට.'

දුල්ලැව තමාට ම කියා ගනිමින් කාමරයෙන් නික්මිණ.

මම හිස් මුදුනට අත යවා කෙස් අතරින් හිසේ ගෙඩි ගැසුණු තුවාල සොයන්නට වීමි.. නාසයෙන් තවමත් සිහින් ලේ බිංදු දෙතොලට වැහේ. නාසය ඇතුළතින් ඉවසිය නොහැකි දැවිල්ලක් දැනේ.

මම බොහෝ ඉවසා ඇත්තමි. එහෙත් කුමක් අරභයා මා තවත් ඉවසන්න ද?

එක්කෝ, ඉවසන්නේ අනාගත බලාපොරොත්තුවක් වෙනුවෙනි. එ විට ඉවසීම අත්‍යවශ්‍ය වෙයි. එසේ නොවුණ හොත් සැනසීම අහිමි වීමට පුළුවන.

'එක්කෝ, ඉවසන්නේ පීඩකයා වඩාත් බලවත් වූ හෙයිනි. ඒ පෙරළා පහර දීමට නොහැකි නිසා ය.

පළමුව විශ්ව ත්, දෙවනුව දරුව ත් වෙනුවෙන් මම ඉවසීමි. දැන් මට ඉවසීමට සුවිශේෂ හේතුවක් නැත. ගැරහිලි, පීඩා, නින්දා, අපහාස, පහරදීම් ඉදිරියේ කුමකට ඉවසන්න ද?

For E-Pusthakalaya

# 19

ජීවිතයේ පළමු වතාවට මගේ හිතේ විශ්ව පිළිබඳව කෝන්තියක් හට ගත්තේ ය. ඔහු බොහෝ ව්‍යාකූල සිතිවිලි ඇත්තෙක් වුව ද දැන් තරමක සුව ලැබූ අයෙකි. මෙ තරම් දරදඬු ලෙස ඔහු පීඩාකාරී පිළිවෙතක් අනුගමනය කරන්නේ නම් ඔහුගෙන් මා තවත් කුමකට ආදරය ඉල්ලා සිටින්න ද? ඔහුගෙන් මට ලැබිය හැකි ප්‍රේමයේ දයාර්ද්‍ර බවක් තිබේ ද? මා බලාපොරොත්තු වන ප්‍රේමයේ සුරක්ෂාව ඔහුගෙන් උරුම වේ ද?

එ දා ම හවස තාත්තා නුවර යන්නට සූදානම්ව මගේ කාමරයට පිවිසියේ ය. දුල්ලෑව පුතා වඩා ගෙන ඔහු පසු පසට වී සිටියේ ය.

'තාත්තා යන්න හදන්නේ නේද්‍රා. මම මුදල් ප්‍රශ්නෙට පිළියමක් යෙදුවා.... වෙන ගැටලුවක් නැතේ...?'

දුල්ලෑව යහපත් පිළිතුරක් බලාපොරොත්තුව තාත්තාගේ පසු පසට වී එක එල්ලේ මගේ මුහුණ බලා විමසුවේ ය.

'මං යන්නම් දුවේ...'

තාත්තා අහක බලා ගෙන මෙන් කීවේ ය.

මම යහනින් නැගිට තාත්තාගේ දෙපා අල්ලා වැන්දෙමි.

'බුදු සරණයි.'

තාත්තා මගේ හිස අත ගාමින් කීවේ ය. හිසේ ගෙඩි ගැසුණු තැන් තාත්තාගේ ඇඟිලි තුඩුවලට හසු වෙතැ යි බියෙන් මම කඩිනමින් හිස හරවා නැඟී සිටියෙමි. තාත්තාට නොපෙනෙන්නට නාසයෙන් ගැලූ ලේ පිස දැමූ රෙදි කැබැල්ල කොට්ටය යටට එබුවෙමි.



'ඔපරේෂන් කරපු එක ටිකක් අමාරුයි වගේ. හවස ඩොක්ටර් ගාවට ගෙනියනවා...'

දුල්ලෑව තාත්තාට යමක් වසන් කරන හඬින් කීවේ ය.

ඉසිවරගේ ද මුහුණ සිඹ තාත්තා නික්මිණ. මම සුසුමක් හෙළීමි.

'තාත්තා මොනවා හිතුවද මන්දා?'

මම මට ම කියා ගතිමි.

'මං විස්තරේ කිව්වා.'

'මොන විස්තරේද?'

'අර මාර පුත්‍රයා තිරිසනෙක් වාගේ ගැහුව කියන්න බැහේ. මං කිව්ව දවාලටවත් නේද්‍රාට ඉන්න දෙන්නේ නැ. උගේ තියෙන නැහැදිව්වකමට කියලා.'

'මට මේ ඔක්කොම දැන් අප්‍රසන්නයි.'

පුතා මගේ උකුළට ගනිමින් මම කීවෙමි.

රාත්‍රිය එළඹෙන තෙක් ම මම පහත මාලයට නොගියෙමි. මෙ තරම් පීඩාවක් මැද්දේ වුව ත් විශ්ව මා සමඟ එක කාමරයේ නිදා ගැනීම මගේ සිතට සහනයක් වි ය. රාත්‍රී ආහාරයෙන් පසුව ත් විශ්ව කාමරයට නොපැමිණියෙන් මම අපහසුවට පත් වීමි. අනාරක්ෂාව ද මසිතට වඩ දුනි. මම පුතා ත් කැටිව පහත මාලයට ගියෙමි. විශ්ව කුස්සියේ පුටුවක වාඩි වී සිටියේ ය. ලීලා බිත්තියට හේත්තු වී විශ්ව දෙස බලා ගෙන සිටී.

'විශ්ව එන්නෙ නැද්ද උඩට...?'

'විශ්ව මහත්තයා පහළ කාමරයේ නිදා ගන්නදෙන් නෝනා.'

විශ්වට පෙර ලීලා උත්තර දුන්නී ය.

'උඹට මොකක්ද විශ්ව මහත්තයා පහළ බුදි කරගන්න තියෙන ඕනකම?'

මම පෙරළා ප්‍රශ්න කළෙමි.

'නෝනට සස්සෙ නේරෙයි.'

'නේරෙන හින්ද තමයි මං කියන්නේ.'

'මං කිව්වෙ නෝනගේ හොඳට.'

ලීලා අහක බලා ගෙන කීවා ය.

For E-Pusthakalaya

'උඹල ඔක්කොම මගෙත් එක්ක සෙල්ලම් කරනවද? මොනව උණත් මටනේ. විශ්ව එන්න උඩට. මටයි පුතාටයි පුළුවන්ද උඩ තනියම ඉන්න..'

මම විශ්ව සමීපයට ගොස් කීවෙමි. ඔහු ඇඟිලි තුඩුවලින් පුටුව අල්ලා මිරිකා ගෙන ම සිටියා විනා උත්තර දුන්නේ නැත.

'පුතා.... තාත්තට උඩට එන්න කියන්න.'

මම ඉසිවරට කීවෙමි.

'තාත්තා ඉස්සලා කාබලේ නේ.'

ඉසිවර සැණෙකින් කීවේ ය. මගේ ඉහමොළ රත් වී ය. ඉසිවර තාත්තා කියන්නේ දුල්ලැවට ය. එය වැළැක්විය නොහැකි වී ය. මම පසු ගිය කලෙක දුල්ලැවට 'තාත්තා' යනුවෙන් ආමන්ත්‍රණය කරන්නට පුරුදු වීමි. ඒ ඔහු සමීප කර ගැනීමට නොව ගෞරවාන්විතව ඈත් කර තැබීමට යි. ඉසිවර ද ඔහුට තාත්තා කීවේ ය. එයට දුල්ලැවගෙන් මහත් ම අනුබලයක් ලැබිණ. මට එ තනින් එහාට සිතන්නට වත් ඉඩ නොදී විශ්ව කුස්සියෙන් නික්මිණ. මම ලීලාගේ ඇහට කඩා පැන්නෙමි.

'මොකක්ද ලීලා මේ වෙලා තියෙන්නෙ?'

'මට මොකුත් වෙලා නෑ නෝනා.'

ඈ බිම බලා ගෙන ම කීවා ය.

'කියපං විශ්ව මහත්තයා මොනවද කියන්නෙ?'

'මට ඕව මොකුත් තේරෙන්නේ නෑ නෝනා.'

'උඹට තේරෙන දේ කියපං.'

'විශ්ව මහත්තයා පව්.'

'ඉතිං.?'

'එච්චරයි.'

'එතකොට මේ දරුව පව් නැද්ද? මේ වහලේ යට අපායක වගේ ඉන්න මං පව් නැද්ද?'

'නෝනට තේරෙන්නේ නෑ නෝනා. විශ්ව මහත්තයට අම්මා නෑ. එයා කියනවා තාත්තාත් නැලු. දරුවෙකුත් නැලු. නේත්‍රාත් නැලු. මට මහත්තයා ළඟට වෙලා ඉන්නලු.'



'උඹ කැමති උණාද?'

'මට අනුකම්පාවයි නෝනා.'

'උඹ පව්කාර වැඩ කරන්න එපා...'

'නෑ නෝනා. නෝනට අම්ම, තාත්ත ඉන්නවා. දරුවෙකුත් ඉන්නවා. ඉන්න තැනක් තියෙනවා. ඕන තරම් සල්ලි තියෙනවා. යානවාහන තියෙනවා. විශ්ව මහත්තය කියන්නෙ ඒවා මොනවත් එයාට නැලු.'

'උඹූ මොකටද ඕව කතා කළේ මහත්තයා එක්ක?'

'මං කතා කළේ නෑ නෝනා. කියද්දි අහගෙන හිටියා. නෝනා උඩට වෙලා බබාගේ වැඩ කරද්දි හැමදාම විශ්ව මහත්තය පහළට එනවා. ඇවිල්ල දුක කියනවා. අපි අහගෙන ඉන්නවා.'

'කවුද අපි?'

'මමයි ලොරිය එළවන අයියයි.'

'කවුද ලොරිය එළවන මිනිහ ගෙන්න ගත්තේ?'

'එයා රෑට මෙහෙ ඉන්නවා. උදේම යනවා.'

'උඹල ඔක්කොම ආයෙත් මොකක්ද නාඩගමකට ලෑස්ති වෙන්නේ.'

මම පුතාගේ අතින් අල්ලා ගෙන හෙමින් පියවර තබා තරප්පුව නඟින්නට වීමි.

'අම්ම අපි තාත්ත ළඟට යමු.'

ඉසිවර මගේ අතින් අදිමින් කීවේ ය.

'පුතාට අම්ම ඉන්නවනේ.'

මා කාමරයට පිවිසෙන විට දුල්ලැව කාමරයට වී සිටියේ ය. ඔහු පුටුවේ වාඩි වී දුම් උරමින් සිටියේ ය.

'දරුව ඉස්සරහ සිගරට් බොන්න එපා. විසයි.'

මම නෝක්කාඩු ලෙස කීවෙමි. ඔහු සිගරට්ටුව විසි කළේ ය.

'දැන් යන්න. අපිට නිදාගන්න ඕන.'

'පුතා කියන්නෙ තාත්ත යන්නද? ඉන්නද?'

'තාත්ත ඉන්න.'

ඉසිවර දුල්ලැව අතට පනිමින් කීවේ ය. මම නොසන්සුන් ලෙස ඒ මේ අත බලන්නට වීමි. දුල්ලැව පුතා හුරතල් කරමින් සැහැල්ලු ලෙස කාමරයේ ආධිපත්‍යය සියතට ගනිමින් සිටියේ ය.

'මේ පොඩි එකා ඉස්සරහා පිස්සු විකාර නොකර කාමරයෙන් ගියොත් හෝද හොඳ...?'

මම, මා තුළ තිබූ නොසන්සුන්කම සඟවා ගනිමින් කීවෙමි. දුල්ලැව කෙරේ මසිතේ ද යම් ඇල්මක් හට නොගත්තා ම නොවේ. කාලයක් එක වහලේ යට ඉඳීමෙන් මට දුල්ලැව අමුත්තෙකු ලෙස නොපෙනේ. ඇරත් මා මේ කාල අන්තරය තුළ ඔහු හා කතාබස් කොට ඇති තරම්ය මම විශ්ව සමඟ වත් මෙ තරම් වාද කොට නැත්තෙමි. අදහස් හුවමාරු කොට නැත්තෙමි. සිහින් ළං වුව ත් විශ්ව සමඟ මා ගතින් ළංව හුන්නේ දින ගණනකි. අදටත් වැඩිපුර කතා කරන්නේ දුල්ලැව ය. මම ඇහුම්කන් දීමට පුදානම් වීමි.

'මම එච්චර මෝඩයෙක් නෙමෙයි නේත්‍රා... මං හොඳට ඉවසන්න පුළුවන් මිනිහෙක්.'

'මුළු ජීවිත කාලෙම ඉවසන්න තමයි වෙන්නෙ.'

මම ඔහු දෙස නොබලා ම කීවෙමි.

'පුළුවන්. ගෑණියෙකුගේ හිත කවදාහරි තීරණයක් ගන්නවා. වැඩිපුරම වෙන්නේ... ආදරය තියෙන පැත්තට ළංවෙන එක නෙමෙයි. තමන් හිතන දේ සත්‍යය කියල හිතල, තීරණ ගන්න එක. එකෙන්ට ළං වෙන එක.'

'එහෙම ගෑණුත් ඇති.'

'ඇති නෙමෙයි.... ඉන්නවා. මොකක්ද නේත්‍රාගේ තියෙන වෙනස.'

'මිනිස්සු සීයක් එක්ක ආදරේ කරල ආඩම්බර වෙනවාට වැඩිය එක්කෙනෙකුට ආදරේ කරල ආඩම්බර වෙන්න මට පුළුවන්.'

'හිතේ සතුටක් නැතුව..... බැඳුම් අහඅහා.... අඩුම ගානේ තමන්ට ආත්ම ගෞරවයක් නැතිව ඉන්න එකේ.... මොකද්ද තියන ආඩම්බරේ?'



අප අතර දළදඬු සංවාදයක් තිබුණේ නැත. වාද කළ ත් නොහොඳ නොක්කාඩුවක් තිබුණේ නැත. වචනයෙන් මා ඔහු ප්‍රතික්ෂේප කළ ත් මගේ හැසිරීම්වල පිළිකෙව් ඉරියව් තිබුණේ නැත. සත්තකින් ම පසු ගිය මුළු කාලය පුරා ම මගේ ජීවිතය ආරක්ෂා කළේ දුල්ලැව නොවේ දැයි මම සිතන්නට වීමි.

'මම ඇත්තටම මිස්ට දුල්ලැවට ණයගැතියි. මං ඒක අමතක කරන්නෙ නෑ.'

'ඕව එච්චර හිතන්න එපා. මං හිත හොඳින් හැම දෙයක්ම කළේ.'

අප කතා කරන අතර ඉසිවරට දුල්ලැවගේ උකුළෙහි ම නින්ද ගියේ ය. ඔහු දුල්ලැවගේ උරපත්තට හිස හොවා ගෙන ම උණුසුමට හිඳී.

'පුතා ඇඳෙන් තියන්න.'

'ඉන්න විදිහට.... තියන්න ලෝබයි.'

දුල්ලැව පුතා මගේ අතට දෙමින් කීවේ ය.

'පව් අහිංසකයා.'

මම කීවෙමි.

'මං වගේ.'

දුල්ලැව ගණනකට නොගෙන කීවේ ය.

'ඇත්තටම ඔහොම හරි කතා කරන්න කෙනෙක් ඉන්න එක මට සහනයක්.'

මම කතාව දිග් ගැස්සීමි.

'මං නේත්‍රාට බෝම ඉස්සර ඉඳලම ආදරේ කළා. ඒක කාට හැංගුවත් නේත්‍රාට හංගන්න බැහැ. මං බොහෝම උත්සාහ කළා නේත්‍රා දිනාගන්න. බැරි වෙච්ච හැම තැනකදීම මං පසුබැස්සෙ නෑ. ඒත් විශ්ව ඉස්සර වුණා. මං නේත්‍රාට තවමත් ආදරෙයි.... මං මගේ නෝනාට ආදරේ නොකළා නෙමෙයි. ඒත් එයා නොහිතපු වෙලාවක මහ අසාමාන්‍ය තීරණයක් ගත්තේ.... ඒ මරණය වෙලාවෙ මං බොහෝම හිතල මතල වැඩ කළේ. මැරිච්ච කෙනාට පණ දෙන්න බැහැ. එහෙම කියල ජීවත්වෙන අය අමාරුවෙ දාන්නත් බැහැ. මං බොහෝම නිහඬව හිටියේ ඒකයි. ඒ මරණය මගේවත්, නේත්‍රාගේවත්, වෙන කාගේවත් වරදක් නෙමෙයි. එයාම කරගත්ත දෙයක්.'

'ඔය ප්‍රශ්නෙ එහෙම කතා කරන එක හොඳයි. මගේ හිතට ටිකක් හරි සැනසීමයි. ඒත් ඔය ඔක්කොම දේවල් දිහා ආපහු බලන්න කියල මං කියන්නේ. මගේ අම්ම, තාත්තා, විශ්ව.... දරුවා.... අවාසනාවන්ත විදිහට අපෙන් සමුගත්ත අම්මා.... මිස්ට දුල්ලැවට තේරෙනවානේ මට කවදාකවත් මිස්ට දුල්ලැවට එකඟ වෙන්න බැරි විත්තිය.'

'ඔව්. මට තේරෙනවා...'

'හැම දෙයක්ම කාලයට බාරදීල මං බලාගෙන ඉන්නෙ.'

'දැනටත් කාලය හුඟක් ගෙවිල තේත්‍රා. කමක් නෑ කවදාහරි තේත්‍රාට තේරෙයි තමන් ආදරය කරන කෙනා පිටිපස්සෙ තබාගෙන ඕනවට වැඩිය තමන්ට ආදරය කරන කෙනාට ළංවෙන එක හොඳයි කියලා. එදා වෙනකල් මං ඉන්නවා. එදා වෙනකල්ම මං තේත්‍රාට ආදරය කරනවා. දොර හොඳට වහල නිදාගන්න.... මං යනවා පහළට...'

ඔහු සුසුමක් හෙළා යන්නට සැරසී, මොහොතක් මා දෙස බලා සිටියේ ය. ගත මොකක් දෝ නොහඳුනන නොසන්සුන්තාවකට ලූදානම් වෙද්දී මම බිම බලා ගත්තෙමි.

සති - මාස කීපයක් ම දුල්ලැව සහ මා අතර ඒ වැනි සංවාද පැවතිණි. මම හැම විට ම සැහැල්ලුවෙන් සිතන්නට පුරුදු වීමි. නැත්නම් හැම දා ම දුකින් සිටිය යුතු ය. එකී මාස කීපයට විශ්ව මාගෙන් නොසිතූ දුරකට ඈත් වී සිටියේ ය. ඇතැම් විටෙක මට කරකියා ගත හැකි දෙයක් නොවී ය.

බාහිර ලෝකයේ සැහැල්ලු සුන්දර දේ පමණක් මම මගේ සිරුරට අවශෝෂණය කොට ගතිමි. ඉසිවර වෙනුවෙන් පමණක් මම ඒකාත්මික වීමි. එහෙත් කාලය විසින් ඔහු මටත් වඩා දුල්ලැව කෙරේ ලෙන්ගතු කරවනු ලැබිණි. මම එකී සම්බන්ධය නුසුදුසු එකකැ යි සිතා පුතාව ඈත් කිරීමට උත්සාහ නොකළෙමි. දුල්ලැව නොමැති විටෙක ඔහු මාගේ ඇඳුමේ එල්ලී සිටිනවා විනා, මගෙන් බැහැර යන්නේ නැත. විශ්ව දකින විට ත් ඔහු මුහුණ සඟවා ගනී.

මම පුතාට කිසි විටෙක බල නොකළෙමි. 'පුතාගේ තාත්තා තමයි ඔය' කියමින් මම කිසි විටෙක ඉසිවර, විශ්ව දෙසට දිගේලි නොකළෙමි. බොහෝ විට මම උඩුමහලට වී සිටියෙමි. පහත මාලයෙන් උඩට විශ්ව කිසි විටෙක පැමිණියේ නැත.



ඇතැම් විටෙක විශ්ව පහත මාලයේ සිනා සෙනු මට ඇසේ. ඔහු මහා හයියෙන් කතා කරනු ඇසේ. සේවක සේවිකාවෝ ද ඔහු සමඟ හරි හරියට සිනා සෙති. එය අසා සිටින්නට බැරි තරම් මගේ හිතට බරක් වි ය. දරන්නට ම බැරි තැන මම ඉසිවර සමඟ කාමරයට වී දොර වසා ගන්නෙමි. නැත්නම් පුතාව ද ඇද ගෙන පහත මාලයට යමි. මා දකින සැණින් විශ්වගේ මුහුණ වෙනස් වේ. අඳුරු වේ. මම පුතාත් සමඟ ඔහුට සමීප වෙමි.

'මට හරි පුදුමයි විශ්ව...'

මම ඔහුගේ මුහුණට එබී කියමි.

'මං දැක්ක බලු කුක්කෙක් ඇති කරන බැල්ලියක් උඩ තට්ටුවේ ඉන්නවා. අපෙ තාත්තා තමයි බැල්ලිට සලකන්නේ. මොකද අපේ තාත්තාත් බල්ලනේ.'

විශ්ව කටට දිවට නොදැනී කියයි.

'පව් කතා...'

මම ලැජ්ජාවට බිම බලා ගනිමින් කියමි.

'අම්ම මරගත්ත එක පව් නෑ. නාකි මනමාළයා පව්.'

ඔහු ලීලා දෙසට හැරෙමින් කියයි.

'ඔයා මොකක්ද මට කියන්නෙ...?'

'හුහ්.... හොඳ කලක් යයි.... කියන්න තියෙන්නෙ එච්චරයි...'

'ඔයා මට වැඩිය මගේ බඩේ උපන්න, ඔයාගේ පුතාට කරන්නෙ මහ අසාධාරණයක්...'

'පාරේ ලැගපු ගෑණුන්ට කොයින්ද සාධාරණ බඩක්...?'

'මේක මහ හෙණ ගහන කතාවක්...'

'දැන් විදුලි කොටනවනේ.... ළඟදීම හෙණ ගහයි...'

'ඔයාට කවදා හරි තේරෙයි...'

'එතකොට අනිත් ළමයත් හම්බවෙයි.'

'මොනවද ඔයා මේ කියන්නෙ...?'

'තොපි වගේ ගෑණුන්ට මොනව නොකියන්නද...?'

'ඔයාට .... දැන් හොඳටම සනීපයි විශ්ව...'

'අපේ තාත්තාගේ අසනීපෙ තාම හොඳ නැතෙ..'

'මං මේ ගෙදරින් ගිය දවසට ඔක්කෝටම සනීප වෙයි.'

'තෝ මේ ගෙදරින් ගිය දවසට මුළු ගෙදරම නිවන් යයි.'

ලීලා ත් වටේට සිටි සේවක සේවිකාවෝත් මට සමච්චලයට මෙන් සිනා සුණෝ ය. පුතාගේ පපුවේ 'ඩග්.... ඩග්...' සද්දය මගේ පපුවට ත් දැනේ. ඔහු මහත් වීර්යයෙන් මගේ ගෙල බදා ගෙන සිටී. පොළොව දෙදරවා යන්නට තරම් ලැජ්ජාවක් මට දැනිණ.

මම පහත මාලයට යෑම සම්පූර්ණයෙන් ම නවතා දැම්මි. එහෙත් හැම විට ම පහත මාලයේ සිදුවීම් දෙස කණ යොමා සිටියෙමි.

ලීලා ඇතැම් විට 'එපා මහත්තයා.... එපා මහත්තයා....' කියමින් පහත මාලයෙන් එහෙ මෙහෙ දුවන හඬ ඇසේ. ඒ විට සෙස්සෝ හඬ නහා සිනා සෙති. හූ කියති. පහත මාලය ඔවුන්ගේ රජදහන මෙනි. මූණු බලා කතා නොකරන සේවක සේවිකාවෝ දැන් හිතේ හැටියට නටති. ටික වේලාවකින් ඔවුහු මිදුලට පනිති. විශ්ව ලීලාගේ අතින් අල්ලා ගෙන හිමි හිමින් මිදුලේ ඇවිදියි. ලීලා ද නොකැමැත්තෙන් ගමන් කරන බවක් නොපෙනේ. මම යක්ෂාවේෂ වී උඩුමහලේ සිට මිදුලට කෑ ගසමි.

'ඔය විකාර නවත්තලා පළයං ලීලා ගෙට..'

'විශ්ව මහත්තයා යන්ඩ දෙන්නෙ නෑ නෝනා...'

ඇය මිදුලේ සිට කෑ ගසයි. ඉන් පසුව නැවතත් විශ්ව ලීලාට වධ දෙයි.

මා කුමක් කරන්න ද...? පිස්සන් කොටුවකට දැමූ පිස්සියක මෙන් මම නොසන්සුන් වෙමි.

# 20

නිසල රාත්‍රියෙහි බියකරු සීතලකින් මම නැති ගෙන සිටියෙමි. කැරකෙන, දිලිසෙන, නළියන හුන එලි මෙන් විවිධ මනස් රූප මට වධ දෙන්නට වි ය. මම අසහනකාරී ලෙස යහනේ ඒ මේ අත පෙරළෙන්නට වීමි. සිත නිද්‍රාවට පත්ව තිබුණ ත් ගත එයට ඉඩ දුන්නේ නැත. ශුද්ධ වූ ත් පවිත්‍ර වූ ත් ක්‍රමෝපායක් මගේ ජීවිතයට අවශ්‍යව තිබිණ. නැති නම් අශුද්ධ වූ ත් අපවිත්‍ර වූ ත් අනාගතයකට සිත එකඟ කර ගැනීමට මට මග කියන්නෙක් අවශ්‍යව තිබිණ. මතුපිට සිහින් කො තරම් සත්‍යතා තර්ක මා ඉදිරිපත් කළ ත් මට බොහෝ විට මගේ හැඟීම් පාලනය කර ගැනීමට සීතල යුද්ධයක් කිරීමට සිදු වි ය. දහවල පුරා මිනිස් වෙස් ගෙන මිනිස් දුවක ලෙස මාතෘෂික ගැහැණියක ලෙස සදාචාර ලෝකයක් වෙනුවෙන් පෙනී සිටීම මම මගේ සිතට ම කර ගන්නා වංචාවක් නොවේ දැයි මට සිතේ. බුද්ධිය කෙ තරම් සත්‍ය දේවතාවෙකු වුවත් හැඟීම් බිහිසුණු යක්ෂ වෙසින් මගේ ලේ මස් ඇට තහර දවාලයි. මගේ හිත හැඟීම්වල උණුසුම ඉල්ලා මා සමඟ අති බිහිසුණු සටනක් කරමින් සිටී. ශිෂ්ට සම්පන්න ගැහැණුකම සමඟ මා කරනා අරගලය සාධාරණීකරණය කිරීමට මගේ උපවිඥානගත හැඟීම් මට ම ඉඩ නොදෙන සෙයකි. තෙරපෙන පීඩා කරන නොසන්සුන් හැඟීම් වඩ වඩාත් ආත්මගත කර ගන්නවාට වඩා සියල්ල නිරෝගී පිරිමියෙකු ඉදිරියේ මුදා හරින්නට මට සිතේ. යටත් විය නොහැකි ආශාවන්ගෙන් මම උන්මාදකර වී සිටියෙමි. රුදුරු වගවලසෙකුට යටත් වන මුව පොව්වෙකු මෙන් යටහත් පහත්ව සාමකාමී යහනක සෞම්‍ය රාත්‍රියක් ගෙවීමට මට ඕනෑ වී තිබේ.

වඩාත් තීරණාත්මක ජීවිත ඉසව්වකට මම අවතීර්ණ වී සිටියෙමි. රුදුරු කුණාටුවකට සැඩ සුළඟකට හසුව ඉරී යන කුඩා රුවල් ඔරුවක් මෙන් මම හැඟීම් වධ දෙන තියුණු චණ්ඩ මාරුතයක අතරමංව සිටිමි.

මගේ ශරීර ඉන්ද්‍රියයන් මට ම කීකරු නොවිණි. අකීකරු ශරීර ඉන්ද්‍රියයෝ අශිෂ්ට ආදර හැඟීම් ඉල්ලා කෑ ගසති. ඒවා බෙහෙවින් සංවේගකාරී සංවාදශීලී ය. ගොදුරු සොයන වෙනුවට ගොදුරක් වීමට මට ඕනෑ වී තිබේ. මම රාත්‍රී හුදෙකලාවේ නිසසල යහන පොඩි කරමින් සිටියෙමි. මගේ දෑස පිරිමියෙකු දුටුවා නම් ඔහුගේ හැඟීම් දවා අළු කරන තරම් අඩවන් රාගයක් එහි තැන්පත්ව නළියමින් තිබෙන බව ඔහු දකිනු ඇත. සම්පූර්ණ රාත්‍රියක දුල්ලෑව වෙහෙසට පත් කිරීමට මගේ සිත බල කරමින් සිටියේ ය.

දුල්ලෑව සහ විශ්ව මගේ මනැස් ලෝකයේ ද්වන්ධ සටනක නියැළුණ හ. එයින් මහ බියකරු වෙසක් ගෙන තිබුණේ විශ්වගේ රූපකාය යි. ද්වේශයෙන් මුසපත්ව රුදුරු වෙසින් නළියන ඔහුගේ වත්මන් පැවැත්ම සිතට පිවිසෙත් ම හැඟීම් සිඳී බිඳී ඉවුරු කැඩී මගේ පසුවේ 'ඩග් ... ඩග්...' හඬ වැඩි කරයි. ඔහු යක්ෂයෙකු මෙන් මගේ හැඟීම් උදුරා දමනු යි මම සිතිමි. ඒ සැණින් දුල්ලෑව සෞම්‍ය නෙතින් ද, සිහින් කෙඳිරියකින් ද, රළු ගොරෝසු කයකින් ද මා ඉදිරියේ පෙනී සිටී.

පිළිකුල් සහගත ගුප්ත සදාචාරයට වඩා අගතිගාමී කායික සංතෘප්තිය උතුම් බව මගේ හැඟිම්වල බලය මට පෙන්වා දෙමින් සිටී. මගේ තියුණු හැඟිම්වල අසංතෘප්තිකර ආවේගය දුල්ලෑව දනී නම් මේ වන විට ත් මට තනි යහනක සැතපීමට ඉඩ නොදෙනු ඇත. සත්තකින් ම ඔහු එය දනී නම්?

විශ්ව පිළිබඳ ආදරය ත් දුල්ලෑව පිළිබඳ ආශාව ත් රාත්‍රියේ බිහිසුණු සීතල යුද්ධයේ බලසේනාව වි ය. ජය පරාජයෙන් තොරව රාත්‍රිය ගෙවී ගියේ ය. ජයග්‍රහණයෙන් ද පරාජයෙන් ද තොර රාත්‍රිය ශූන්‍ය හිම්දිරියකට පහත් වි ය.

කාමරය ඉදිරියෙන් ඇසුණු පිරිමි අඩි ශබ්දයට මම දොර ළඟට ගියෙමි. නිදන ඇඳුම් පිටින් ම මම සිහින් පියවර තබා ගොස් දොර හැරියෙමි.

'ගුඩ් මෝනින් නේත්‍රා...'

'ගුඩ් මෝනින්.'

දුල්ලෑවගේ උණුසුම් පිළිගැනීම මම ප්‍රතිචාර දැක්වීමි.



'කොහොමද නින්ද ගියාද? ඇහැරලා සිටියද?'

'මොකද ඒ දෙවිදිහක්.? නිදිමත නැති නින්ද ඇහැරලා හිටියා. නිදිමත ආවම නිදා ගත්තා.'

'ඒක ටිකක් කපටි උත්තරයක්.'

දුල්ලෑව කාමරයට පිවිසෙමින් කීවේ ය.

'කපටි උත්තරයක් නෙවෙයි. ගැඹුරු උත්තරයක්'

මම සංවාදශීලි වෙමින් කීවෙමි.

'මට එළිවෙනකල්ම වගේ නින්ද ගියේ නෑ නේත්‍රා. මහ විකාර දවස් ටිකක් ගෙවිල යනවා වගේ. ජීවිතේ වෙනසක් නොවුණොත් මං පිස්සෙක් වෙයි.'

කාමරයේ පුටුවට බර වෙමින් දුල්ලෑව කීවේ ය. පසුව ඔහු විදුලි කොටන දෑසින් මගේ හිසේ සිට දෙපතුල දක්වා නිරීක්ෂණය කළේ ය. මම නිදි ඇඳුමට උඩින් හවුස්කෝට් එක දමා ගතිමි.

'නේත්‍රා...'

ඔහු දෑස ඉහළට ඔසවා ප්‍රශ්න කළේ ය. එහි තිබුණේ කි නම් හදිසි හැඟීමක් දැයි දැන ගැනීමට ත්, එකඟ වීමට ත් සැණෙකින් මං පෙළඹුණෙමි.

'ඇයි...?'

'මම මහ පච්කාරයෙක්. ජඩයෙක්. පරයෙක්. මට මගේ ජීවිතේ එපාවෙලා. මං මේ කියන කතාව විහිළුවකට ගන්න එපා. මට දැන් මාවම එපා වෙලා.'

ඔහු සැනසීමට ත් ඔහුව ස්පර්ශ කිරීමට ත් මට ඕනෑ වී තිබිණ. මම කිසිත් ප්‍රකාශ නොකොට වචනයට ඉඩ දුනිමි.

'මං මොකද්ද කරන්න ඕන. කියන්න. කමක් නෑ. දැන් මට වෙන කරන්න දෙයක් නෑ.'

මම බිම බලා ගෙන කීවෙමි. යහනේ ඇඳ ඇතිරිල්ල පොඩි වී තිබුණු තැන් ඇඟිලි තුඩින් පිරිමැදීමි. ඇඳ ඉහත්තාවේ තිබුණු අනෙක් කොට්ටය ගෙන ඉසිවරගේ දෙපා අසළට දැමීමි.

For E-Pusthakalaya

‘ඔයා ඉස්සර වෙන්න එපා. ඔයාට කරන්න දෙයක් ඉතිරි වෙලා නෑ නේත්‍රා...’

‘මං ඇත්තටම කිව්වෙ. මං දැන් එකහයි. අවනතයි. ප්‍රශ්නයක් නෑ මට තේරෙන්නේ නෑ. මට මේව කටින් කියන්න ලැජ්ජයි.’

‘මට තියෙන්නෙ ඒ මොකවත් නෙමෙයි. දුකයි. ඔයා ගැන. දෙයියම්පල්ල දැන් මට ඔයා ගැන දුකයි.’

එහෙත් අප දෙදෙනා ඉසව් දෙකක, මාතෘකා දෙකක, අන්ත දෙකක, තර්ක කරනවා යැයි සිනී මගේ මුළා වූ සිතිවිලි පිළිබඳව මට ලැජ්ජා සිතිණ. විශ්ව සමීපයට මා ළං වීමට කළ හැම සියලු උත්සාහයක් ම ව්‍යර්ථ වෙද්දී මා තුළ ගොඩ නැඟුණේ ඔහු පිළිබඳව දැඩි ඊර්ෂ්‍යාවකි. මට පෙනෙන්නට මට දැනෙන්නට ඔහු ලීලා සමඟ ඇහැළුම් පාන විට මගේ සිතේ තිබුණු ඉරිසියාව දෙගුණ තෙගුණ වී ය. මගේ හැඟීම් වඩා තියුණු වූයේ ත් දුල්ලෑව වෙනට මා මෙ තරම් සමීපව ඇහැළුම් පාන්නේ ත් ඒ නිසා නොවේ ද?

‘මට සමාවෙන්න. මම නරක ගෑණියෙක්. මං ගැන එහෙම හිතන්න.’

‘මට එහෙම හිතන්න ඉඩක් නෑ’ නේත්‍රා...’

මට මං ගැනම ලැජ්ජයි...’

මම ඉසිවරගේ හිස අත ගාමින් කීවෙමි. කිසිවක් නොදත් නොතේරුම් පැටියා අනෙක් ඇලයට හැරී මගේ උණුසුම සොයන්නට වි ය.

‘අපි ඔක්කෝටම පිස්සු.’

මම සුසුමක් හෙළමින් කීවෙමි. එයින් ළය සැහැල්ලු වී ගියත් හිසේ බර ගතිය පහ නොවී ය.

‘අපි ඔක්කොම එක්තරා විදිහක පිස්සෝ තමයි. ඒත් අර බැල්ලිගේ පුතාට හොඳටම පිස්සු.’

දුල්ලෑව දැඩි හඬකින් කෝපතියෙන් කීවේ ය. අලුත් මුසල හැඟීමක් සමඟ සිත කිරි ගැසෙන කටු අත්තක් මගේ ළයේ දැවටුණාක් මෙන් මම වංචල වීමි.

‘අපි, අපේ වැරැදිවලට විශ්ව සම්බන්ධ නොකර ඉමු. මම මිස්ට දුල්ලෑව එක්ක දැන් දැන් සමීපයෙන් කතා කරන එක ඇත්ත. ඒත් මම තවමත් විශ්වගේ බිරිඳ. මට ඒ හැඟීම අයින් කරගන්න බෑ. කොහොම කිව්වත් එයා අහිංසකයි. පව්.’

කවුද පව්. කවුද අහිංසකයා?

දුල්ලෑව පෙරළා ක්ෂණික පිළිතුරක් බලාපොරොත්තුව මදෙසට තීක්ෂ්ණ බැල්මක් හෙළුවේ ය.

‘මට තවමත් විශ්ව දිහා වෙනත් විදිහකට බලන්න, හිතන්න පුළුවන්කමක් නෑ.’

මම දුල්ලෑව ඉහළට ගත් හුස්ම පහතට හෙළන්නට ත් පෙර කීවෙමි.

‘ඒත් ඒ බැල්ලිගේ පුතා වෙනත් විදිහකට හිතලා, ඔයයි පව්. ඔයයි අහිංසක. මට දුක ඔයා ගැනයි. ඌට පිස්සු නෑ. ඌට තිබිල තියෙන්නෙ වෙන පිස්සුවක්.’

‘මොනව ගැනද ඔය කියන්නෙ.’

‘ලීලාට ළමයෙක් හම්බවෙන්න ඉන්නවා.’

දුල්ලෑව වෙව්ලමින් කීවේ ය. එක්වර ම මගේ ඇට මිදුළු මිදුණු බවක් දැනිණ. මම දුල්ලෑවගේ දෙපා මුල වැද වැටීමි. ඔහුගේ දෙපා අල්ලා ගෙන හිස එහි ඔබා ගතිමි.

ජීවිතය කියවා ලියා ඉවර කළ නොහැකි පරිච්ඡේදයක් නම් විශ්ව එහි නැවතීමේ ලකුණ තැබීමට සූදානම් වූවා වත් ද? ලීලා ගැබ් ගෙන ඇත්තේ විශ්ව නිසා නම් මා තවත් බලාපොරොත්තු වන සහනශීලී පරමානන්දය කුමක් ද? මගේ හදවත ඔහු වෙනුවෙන් ම විවෘතව මෙ තෙක් කළ අරගලයේ අවසන් ප්‍රතිඵලය මෙය නම් මා ජීවත් විය යුත්තේ කා වෙනුවෙන් ද? මම මගේ හදවතේ සෞම්‍ය ආදර හැඟීම් ඔහුට තිළින කරන විට ඔහු මගේ හෘදය මාංශය ම කා විනාශ කළ හැටි.

‘දැන් කෝ ලීලා?’

මම තැති ගත් සිතින් කෙඳිරි ගාමින් විමසුවෙමි.

For E-Pusthakalaya



තමා අසළ දණින් වැටී සිටි මගේ උරහිසින් අල්ලා මා නඟා සිටුවන ගමන් දුල්ලෑව කීවේ ය. දැනුවත්ව හෝ නොදැනුවත් ම මම හිස දුල්ලෑවගේ උරහිසට වාරු කළෙමි. රළු පිරිමි උරපත්තක ආරක්ෂාව මට ඕනෑ වී තිබිණි. අනාරක්ෂිත බවකින් පෙළෙන හැම විට ම වාගේ පිරිමියෙකුගේ රැකවරණය හා උණුසුම මට තදින් දැනෙන්නට වී ය.

'මාව තනි කරන්න එපා.'

මම දුල්ලෑවගෙන් ඉල්ලා සිටියෙමි.

'මාවත් අසරණ කරන විදියට හැසිරෙන්න එපා. මම නේත්‍රා බලාගන්නම්. මගේ ඇස්දෙක වගේ. ඔය දරුවා මගේ කියලා හිතාගන්න. මේ අපි සංසාරේ ප්‍රාර්ථනා කරගෙන ආපු ඒවා නේත්‍රා..'

ඉසිවර යහනින් නැගිට අප දෙසට පියවර තබන්නට වි ය.

'ගුඩ් මෝනිං ඉසිවර පුතා...'

දුල්ලෑව මගෙන් මිදී ඉසිවරට දෑත පාමින් කීවේ ය.

'ගුඩ් මෝනින් තාත්තා.'

ඉසිවර ගොත ගසමින් කියා ඔහු මගහැර මදෙසට පිය එසවී ය. මම ඉසිවර උකුළට ගතිමි. පුතාගේ මුහුණ ත්, ගෙල ත්, හිස ත් සිප ගතිමි. ඉසිවර මගේ ගෙල ත්, උරහිස ත් අතර තම හිස හොවා සැනසෙන්නට වි ය.

'මායි, දරුවයි අසරණ වෙලා අනාථ වෙයි කියල මං දැන් බයයි.'

මම යහනේ හිඳ ගනිමින් කීවෙමි.

'නේත්‍රා සාමාන්‍යයෙන් අසරණකමට බය නැති කෙනෙක්නේ?'

'තනියම ඉන්න කාලෙ නං මං යකෙකුටවත් බය නෑ. මට පුදුම ධෛර්යයක් තිබුණ. මං දැන් අසරණයි කියල හිතෙනවා. තාත්තා මිස්ට දුල්ලෑවට ණය වුණා. අම්මා මං ගැන වරදවා හිතාගත්තා. මට දරුවෙක් ඉන්නවා. විශ්ව මගෙන් ටික ටික ඈත් වුණා. මං දැන් කෙල්ලෙක් නෙමෙයි දරුවෙක් ඉන්න අම්මා කෙනෙක්. තනියම නන්නත්තාර වෙච්ච කෙල්ලෙකුට තියෙන ආත්ම ශක්තිය අම්මා කෙනෙකුට නෑ. හැමදේම



එකතු වුණාම අසරණ වෙනවා. මෙච්චර කල් මගේ හැඟීම් එක්ක මං සෙල්ලම් කළා. මං මිස්ට දුල්ලෑව විහිළුවකට ගත්තා.'

'මං උගුලකට අහුවුණා කියල හිතෙන්නේ නෑ. මාවයි, දරුවයි ආදරෙන් බලාගන්න. මං මැරෙන කල් මිස්ටර් දුල්ලෑව ළඟ ඉන්නං.'

මම දුල්ලෑව දෙසට ම දෑස් අයා ගෙන කීවෙමි.

'අපිට මේ ගෙදර ඉන්න බෑ නේත්‍රා. වෙන ගෙයක් අරගෙන යමු. මේ ගෙදර නීත්‍යානුකූලව උණත් අයිති මට නෙමෙයි. විශ්වට. එයාගේ අම්මා කලින්ම මේ ගේ එයාට ලියල තිබුණෙ. එයා කැමති දෙයක් මේ වහලෙ යට කරගත්තදෙන්. දැන් විශ්ව ලීලාත් එක්ක ඉන්නවානේ. ඒක එයාගේ ලැබීම. දැන් අපි පිටත් වෙන්න ඕන.'

'මට හිතෙන්නේ නෑ විශ්වට හොඳටම සනීපයි කියලා.'

'නේත්‍රා හිතන තරම් අසනීපයක් එයාට නෑ. හෙට අනිද්දා තවත් දරුවෙක්ගේ තාත්තා වෙනවා.'

'එයා අසරණ වෙන්න ඇති. මට ඩොක්ටර් තිලක් ජයසෝම කිව්වෙ එයාට වෙදකමට වැඩිය හෙදකම කරන්න කියලා. හොඳින් බලාගන්න කියලා. ආදරේ කරන්න කියලා. පුතාගේ වැඩ හින්ද මගෙන් ඒවා ටික ටික මගැරුණා. උඩ කාමරේට වෙලා හිටිය විශ්ව පහළට යන්න පුරුදු වුණේ එහෙම. මගෙන් නොලැබුණු දේ එයාට ලීලාගෙන් ලැබෙන්න ඇති. එක විදිහකට මමත් වැරදිකාරී.'

'ඒ වැරදිවලට උත්තරේ තවත් ගෑණියෙකුගේ බඩට ළමයෙක් දෙන එක නෙමෙයිනේ.'

'ඒක නිසා තමයි මට හිතෙන්නේ එයාට තමා අසනීප හොඳ නෑ කියලා.'

'නේත්‍රාට එහෙම සැකයක් තියනවා නම් ලීලාගෙන්ම අහන්න.'

වඩාත් සුදුසු දේ මෙය ලීලාගෙන් ම විමසා දැන ගැනීම බව මට ද පසක් වෙමින් තිබිණ. අපි තිදෙනා ම පහත මාලයට ගමන් කළෙමු. දුල්ලෑව ඉසිවර වඩා ගත්තේ ය. සාලයේ හාන්සි පුටුවේ විශ්ව වාඩි වී සිටියේ ය. මට එක එල්ලේ ඔහුගේ දෑස බැලීමට අවශ්‍යව තිබිණ. එහෙත් ඔහු තමන්ගේ දකුණු කකුල ලීලාගේ උකුළේ තබා ගෙන සිටියේ ය. ලීලා බිම වාඩි වී විශ්වගේ නියපොතු කපමින් සිටී. දුටු සැණින් ලීලා තමන්

කළ කාර්ය නවතා බිම බලා ගත්තා ය.

For Free Posthakalaya

‘ලීලා පළයන් කුස්සියට.’

දුල්ලැව සැරෙන් කීවේ ය. තත්පර ගණනකට ත් පමා නොවී ඇය නැඟී සිටියා ය. ලීලාගේ නිතඹ දෙස ත් උකුළ දෙස ත් බලා සිටි මම ඈ ගැබ් ගෙන ඇද්දැ යි නිරීක්ෂණය කළෙමි. ඈ ලලිත ලෙස නිතඹ පද්දමින් ගමන් කරන විට පිරිමියෙකුට ආශා හිතෙන ලතාවක් ඇතැ යි සිති මම ඊර්ෂ්‍යා කළෙමි.

‘ලීලා ප්‍රවේශමෙන්, නාකියා කුපාඩියා.’

විශ්ව හිටි ඉරියව්වේ ම සිට ඇහට පතට නොදැනී කීවේ ය. දුල්ලැව දත්මිටි කමින් විශ්ව දෙසට හැරුණේ ය.

‘මොකක් ද යකෝ කිව්වේ.?’

‘කුපාඩියා කිව්වේ.’

විශ්ව ගණනකට නොගෙන කීවේ ය.

‘කවුද කුපාඩියා...?’

‘නාකියා කුපාඩියා...’

විශ්ව එය ම දෙතුන් විටක් කිය කියා කාමරයට ගොස් දොර වසා ගත්තේ ය.

අපි ලීලා පසු පස වැටුණෙමු.

ලීලා කුස්සියේ බංකුවට බර දී හිස දෙදණ අතර රුවා සිටියා ය.

‘ලීලා ඇත්ත කියපං... නේත්‍රා නෝනට වෙච්ච දේ කියපං.’

දුල්ලැව කතා කළේ පිළිතුරු නොදී සිටීමට නොහැකි තරම් සැර ස්වරයෙනි. පළමු වටයේ ඇය නිහඬව සිටියා ය.

‘දැන් මාස කීයද?’

මම ඇය වෙතට සමීප වී ප්‍රශ්න කළෙමි.

‘තුනක් විතර ඇති.’

‘කවුද ළමයගේ තාත්තා?’



‘මගෙන් ඕව ගැන අහන්න එපා නෝනා.’

‘උඹෙන් නැත්තං කාගෙන්ද මේව අහන්නෙ. විශ්ව මහත්තයාගේද?’

‘නෝනා කැමති දෙයක් හිතාගන්න.’

‘වෙන කාගෙවත්ද?’

‘නෝනා කැමති දෙයක් හිතාගන්න.’

‘උඹ මහ වල් ගෑනියෙක්’

‘මාත් නේත්‍රා නෝනා වගේ.’

‘උඹ කොහොමද මං වගේ වෙන්නෙ?’

‘මට මේක පුරුදු කළේ නෝනා.’

‘උඹට වල්කං කරන්න පුරුදු කළේ මමද?’

‘නෑ නෝනා. අතීත් අයට හිතාගන්න බැරිවෙන විදිහට හැසිරෙන්න පුරුදු කළේ නෝනා. අසරණ නොවී ඉන්න. බය නොවී ඉන්න. යටත් නොවී ඉන්න. වහල් නොවී ඉන්න. තමන්ට ඕන දේ දිනා ගන්න. මේ හැමදෙයක්ම ඉස්සර මතුරනවා වාගේ නෝනා කියල දුන්න. අසරණකමින් ගොඩ වරෙන් කිව්වා. අසරණ නොවී හිටපං කිව්වා. මේ ඔක්කෝම මට පුරුදු කළේ නෝනා. ඒ හින්ද මං වල්කං කළා නම් නෝනත් වල්කම් කරපු කෙනෙක්. නෝනා ඉසිවර බේබි බඩේ තියාගෙන ඉන්නකොට හැසිරුණේ ගුප්ත විදිහට. මමත් එහෙමයි. මට මගේ පාඩුවෙ ඉන්න දෙන්න. අපි බොහෝම අසරණ වෙලා හිටපු මිනිස්සු. මෙච්චර දවස් මෙහෙම කතා නොකළේ කතා කරන්න දේ නැතිව නෙමෙයි. අපේ කටවල් වලච්චේ හාමුලා වහලා තිබුණා. දැන් මේ ගෙදර එහෙම නෑ. ඒ ඔක්කොම වෙනස් කළේ නෝනා. මටම දොස් කියන්න එපා.’

‘මට කියපං දරුවගේ තාත්තා කවුද කියලා.’

‘දැන්ම කියන්න බෑ.’

‘මේ ගෙදර කෙනෙක්ගෙද? පිට කෙනෙක්ගෙද?’

‘මං බඳින්න ඉන්න කෙනාගේ...... ඒක රහසක්’

‘අපි උඹව මේ ගෙදරින් පිටත් කරනවා. පොලීසියට කියලා.’

‘මං පොලිසියට බය නෑ නෝනා. විශ්ව මහත්තයා මාව බේරා ගනීවි. මං පොලිසියට යේරම ඇත්ත කියනවා. එතකොට මට වැඩිය කරදරේ වැටෙන්නෙ නෝනා.’

‘උඹ මේ ගෙදරට ආව වසංගතයක්.’

‘නෝනා මේ ගෙදරට ආපු දවස්වලත් හැමෝම කිව්වෙ එහෙම.’

‘මෙකිව මරන්න තියෙන්නෙ.’

‘ඊට ඉස්සෙල්ල මං මේ ගෙදර එවුන්ව මරනවා.’

‘උඹ මහ හැපින්නක්. උඹ විශ්ව මහත්තයා රවට්ට ගත්තා. උඹ මහම තිරිසන් හැතිරියක්. උඹට මේකට ශාප වෙනවා.’

‘නෝනා විශ්ව මහත්තයාගේ තාත්තා රවට්ට ගත්තා. ලොකු නෝනා එල්ලිලා මැරුණා. ඒවටත් ශාප වෙනවා.’

‘උඹ මොකද්ද කරන්න හිතාගෙන ඉන්නෙ?’

‘නෝනා හිතාගෙන ඉන්න දේ තමයි.’

හිතට දරා ගන්නට අමාරු පිළිකුලක් දැනී මගේ සියොළඟ ම හීත හිරිගඩු පිපිණ. මේ මහා මන්දිරයේ ගුප්තකම යටින් සංවර හිරිකිතයක් ද ඇතැ යි මම සිතිමි. ලීලා ඉදිරියේ මා පරාජය වූවා නේදැ යි සිතී මම කරබා ගෙන මුහුණ බිමට බර කළෙමි. තිලංකාර දෑසින් වටපිට සිසිලක් ඇත් දැයි සෙව්මි.

‘නෝනාට තිත්ත කළුවරේ වහ බිව්ව වගේ දැනෙනවා නේද?’

ලීලා උපහාසෙයන් ප්‍රශ්න කොට මා අසරණ කරන්නට තැත් කළා ය.

‘උඹ හිතන්නේ මාව අසරණ කරල බය කරන්නද?’

මම හිස කෙළින් කොට ප්‍රති උත්තර දුනිමි.

‘නෑ. මට නෝනා ගැන දුකයි’.

‘උඹට මං ගැන දුකයි නම් ඔහොම ඒවා කරගනීයැ?’

‘බඩ උස්සන් ඉන්නේ මමනේ නෝනා. ඒත් වැඩිය බර දැනෙන්නේ නෝනාට.’



‘උඹට නම් පිස්සු ලීලා.’

‘මෙ ගෙදර වැඩි දෙනෙකුට එහෙම තමයි නෝනා.’

ලීලා සමඟ එකටෙක කීමෙන් ඇගේ මුරණ්ඩු ගතිය වැඩි වි ය. කුමක් නිසා දෝ ඇයට මහත් නිර්භීතකමක් එඩිතරකමක් ලැබී තිබිණ. ඇය ඇවිස්සීමෙන් බඹරයකට ගල් ගැසූ කලෙක මෙන් සියල්ල සී සී කඩ විසිරීමට පුළුවන. මම ඇය සමඟ වඩාත් ළෙන්ගතු වන්නට ඉටා ගතිමි. මම ලීලා අසළ වූ මිටි බංකුවේ වාඩි වීමි. කතාවට නැවත මුල පිරිය යුතු ය. එහෙත් ලීලා සමඟ නැවත කතාව ආරම්භ කරන්නේ කොතනින් දැයි මට සිතා ගැනීමට ත් අපහසු ය. කිසිවක් සිදු නොවූ අයුරින් දුල්ලැව අප දෙස බලා සිටියා විනා සිදුවීමට වචනයකින් හෝ සම්බන්ධ වූවේ නැත.

කුස්සියේ ලිප නිවී බොහෝ වේලා ය. උදේට තේ සෑදූ භාජන තැන් තැන්වල ය. රාත්‍රී ආහාර පිසූ භාජන තවමත් ඉදුල් පිටින් ය. කුස්සිය මුල්ලේ දින කීපයක කුණු රොඩු පිරී ඇත. කාලෙකින් විවෘත නොකළ කුස්සියේ ජනෙල් පෙළ මෙහා ග්‍රිල් එක ත් වීදුරු ත් අතර මකුළු දැල් දෙක තුනක් ම පරණ වී යමින් තිබේ.

‘මුළු ගෙදරම අපිළිවෙළ වෙලා. මේවා ඔක්කොම සුද්ද කරලා දාන්න වෙයි.’

‘නෝනා කරදර වෙන්න එපා. මම ඒවා කරන්නම්. මේක නෝනාට කිව්වට පස්ස මගේ හිතට සැනසීමයි. මට පුළුවන් මේ ගේ පිළිවෙළක් කරලා ගන්න.’

ලීලා කීවේ තාවකාලික ප්‍රශ්නයට පිළිතුරක් ම නොව අනාගත සැලසුමක හෙළිදරව්වකැ යි මම සැක කළෙමි. මා දුල්ලැව සමඟ ගෙදරින් නික්මෙතැ යි ඇය හිතනවා වීමට පුළුවන. එ විට ගෙදර ආධිපත්‍යය ගැනීමට ඇ සිතනවා වීමට ත් පුළුවන. මම තුෂ්ණීම්භූත වීමි. ක්ෂණයකින් මම ඇය දෙස හැරී බැලිමි. පැත්තට හැරී බිමට නෙත යොමා සිටි ලීලා වෙතින් වෙන කවර දාකට ත් වඩා මහ අමුතු ම සිරියාවක් මම දිටිමි.

‘උඹ හරිම දක්ෂයි ලීලා.’

මම ඇය අපහසුවට පත් කරන අටියෙන් කීවෙමි.

'මම නෙමෙයි මගේ මහත්තයා දක්ෂයි.'

ඈ කට කොණකට සිනහවක් එලා ගනිමින් කීවා ය. එ වර ද මම පරාජය වීමි. හැම විටෙක ම ඈ මට ඇනුම්පද එල්ල කරනවා වත් ද? සියල්ල හමුවේ වඩාත් අසරණ වීමේ ඉඩකඩ මා වෙතට ම තල්ලු වෙමින් තිබිණ.

'නෑ මං කිව්වෙ ලීලා ලස්සන වෙලා. හොඳට තර්ක කරන්න ඉගෙන ගෙන තමන්ගේ අයිතීන් දිනා ගන්න අරගල කරනවා. දැන් ඉතිං අම්ම කෙනෙක් වෙන්න හදනවා. ලීලා දක්ෂයි.'

'කාලයක් අපි වහල් කඳවුරක අනාථයෝ වගේ හිටියා. තේනුා නෝනා අපිට ආයුධ එකතු කරල දුන්න. මගේ මහත්තයා මාව සටනට පෙළඹුවා. එච්චරයි.'

'මට උඹ ගැන ආඩම්බරත් හිතෙනවා ලීලා.'

'මට නෝනා ගැනත් කාලයක් එහෙම හිතුණා.'

'උඹ දක්ෂයි.'

'නෑ නෝනා. නෝනා ලැබුණු දේත් එපා කියන ජාතියේ කෙනෙක්. මම ලැබුණොත් ගන්න ජාතියේ කෙනෙක්.'

'ලීලාගේ අම්ම තාත්තා ඉන්නවද?'

'පොඩි කාලෙ හිටියා. මට නොතේරුම් කාලෙම මැරුණා. ඒ අයත් ඔය දුල්ලෑව හාමුලා ගාව තමයි දාසකම් කළේ.'

'දැන් ලීලාට ජීවිතේ සම්පූර්ණයි කියල දැනෙනවාද?'

'තව කොහෙද නෝනා?'

මා පොටක් පාදා ගැනීමට කො තෙක් වෙහෙසුණ ද ලීලා කල්පනාකාරීව උත්තර දෙන්නට වූවා ය. ඇය බොහෝ සූක්ෂ්ම එකියක ලෙස මම කල්පනා කළෙමි. මෙ තරම් වේලා කතා කළ ත් මට ඉඩ දී බලා සිටියා විනා දුල්ලෑව කතා නොකිරීම මගේ කලකිරීම වැඩි කළේ ය. ඔහු ද මේ සිද්ධියට ඇදා ගත යුතු බවට මම තීරණය කළෙමි.

'උඹට දුල්ලෑව මහත්තයා ඉස්සරහ ඔහොම කතා කරන්න බය නැද්ද?'



'මොකද බය වෙන්නද නෝනා. අපේ අම්ම අප්පල නම් ඔය අප්පොලට හරියට බයයි. අපිත් ඊට පස්සේ ඔය හාමුලට බයේ හිටියා. දැන් නම් ඩිංගිත්තක් වත් බය නෑ. ආදරේ විතරක්...'

'උඹ කාටද ආදරේ...?'

'දුල්ලෑව මහත්තයටත් ආදරෙයි. විශ්ව මහත්තයටත් ආදරෙයි.'

'උඹ නරක ගෑණියෙක් වෙලා ලීලා.'

'නරක විදියට හැසිරෙන මහත්තුරු ඉන්නා තැන්වලදී එහෙම වෙනව නෝනා...'

'මට උඹල ඔක්කොම සැකයි.'

මම දුල්ලෑව දෙස බලමින් කීවෙමි. දුල්ලෑව මගේ ප්‍රකෝපය අවබෝධ කොට ගත්තාක් මෙන් කතා කළේ ය.

'ලීලා උඹ ඕනෑ නැති විදියට කතා කරලා නෝනගේ හිත බිඳින්න එපා. කියාපං උඹට මොනවද ඕන කියලා?'

'හාමු මහත්තයා දෙන දෙයක් ගන්නම්.'

'පරට්ටි....'

දුල්ලෑව කඩා පැන්නේ ය. ඒ සැණින් විශ්ව කුස්සියට රිංගුවේ ය. ඔහු දුල්ලෑව වැළකුවේ නාට්‍ය ජවනිකාවක විහිළුකාරයා දුෂ්ටයා වළකනවා මෙනි.

'හා... හා.... කලබල වෙන්න එපා. කළ කළ දේ පල පල දේ... කළ කළ දේ පල පල දේ...'

විශ්ව රවුමක් කැරකී ලීලා අසළින් වාඩි වී ය.

'ලීලා දැං බය නොවී හිටපං. පරට්ටිට නාකියා ගහන හැටි දැන් බලමු.'

විශ්ව සටනට සූදානම් වූ අසරණයෙකු මෙන් බිම වාඩි වී ය. ඉන් පසුව බිමට හිස බර කොට ඇඟිල්ලෙන් බිම පිරි මදින්නට වී ය. පිරි මදිමින් තාලයට හිමිහිට මුමුණන්නට වී ය.

'නාකියා.... කුපාඩියා..... නාකියා..... කුපාඩියා....'

මහා අසික්කිත අසංවර ලෝකයක මම තනි වීමි. ඉසිවර මුවගට සිනහවක් නගා ගෙන සියල්ල නිරීක්ෂණය කරමින් සිටී. මම ඉසිවර ඉණේ රුවා ගෙන නැඟී සිටියෙමි.

‘යමු පුතේ අපි යන්න. මේක මහ අසික්කිත කුප්පායමක්. ඔක්කෝම ඉන්නේ මහ වනචර පෙරේතයෝ.’

මම පියවර දෙක තුනකින් ඉක්මන් අඩි තබා ඉහත මාලයට පිවිසියෙමි.

ඉර ඇහැරි කටු පුප්පාගෙන සිටී. මේ මහ මන්දිරයෙන් එහා මහ පාරේ යනෙන රථ පෙළෙහි වහලවල් පමණක් තාප්පයට එ පිටින් පෙනේ. කිසිවක් සිදු නොවූ අයුරින් සේවකයෙකු මිදුල අමදිමින් සිටී. රාත්‍රිය පුරා සිත නගන කොට අවදි වූ සියලු ම සෞම්‍ය ශෘංගාරාත්මක හැඟීම් පිළිකුලෙන් සහ ජුගුප්සාවෙන් යටපත් වෙමින් තිබේ. ජීවිතයේ රසමුසු තැන් සියල්ලෙහි අසූචි මිශ්‍ර සැරව තැවරුණාක් මෙන් මම මහත් අප්පිරියාවකින් සිත ත් ගත ත් හකුළා ගතිමි.

කටුකත්වය ද, අසහනය ද තැවිත ත් මගේ ත් පුතාගේ ත් ජීවිතයට එබෙතැ යි මම තැනි ගෙන සිටිමි. මගේ සිතුවිලි සාගරයට රැළි සුළං නඟමින් සිටිනා විට ඉසිවර මා පියවි ලෝකයට කැඳෙව්වේ ය.

‘කාටද අම්මි නාකියා කියන්නේ...?’

‘වයසක අයටනේ පුතා.’

‘ඉතිං අපේ තාත්තා වයසද?’

‘නෑ පුතා, පුතාගේ තාත්තා තරුණයි... ලස්සනයි.’

මම අහක බලා ගෙන ඉසිවරගේ හිස අත ගාමින් කීවෙමි.

‘එහෙනම් කුණාඩියා කියන්නෙ?’

‘ඒක නරක වචනයක් පුතා. එහෙම කියන්නේ නරක අයට.’

‘ඉතින් අපේ තාත්තා නරක කෙනෙක්ද?’

‘නෑ පුතා.... පුතාගේ තාත්තා හොඳම හොඳ රත්තරං තාත්තෙක්...’

‘තාත්තා පව් අම්මි.’

‘ඔව් පුතේ පුතාගේ තාත්තා පව් තමයි.’



‘අර විශ්ව කියන මිනිහා ඇයි තාත්තට බනින්නේ?’

මට උත්තර දිය නොහැකි සීමාවේ දී මම ඉසිවරට සැර කළෙමි.

‘පුතා ... ඕන නැති දෙවල් කතා කරන්න එපා. ගිහිං සෙල්ලම් කරන්න.’

මම ඉසිවර මගෙන් ඈත් කරමින් කීවෙමි. සියල්ල තේරුම් ගත්තාක් මෙන් නොතේරුම් දරුවා මගෙන් ඉවත් වී සෙල්ලම් බඩු රාක්කය වෙත ගමන් කළේ ය. මගේ හිත නැවතත් හෝස් ගා පත්තු වි ය. මම ඔහු සැනසීමට තැත් කළෙමි.

‘පුතා අම්මත් එක්ක තරහද?’

‘නෑ...’

කෙටි කතා රැසකින් යුත් දිග කතාවක් ලෙස ජීවිතය ලියැවෙමින් තිබේ. හැකි ඉක්මනින් මෙහි අවසානයක් තීන්දු කළ යුතු ය. මම ජනෙල් කවුළුවෙන් එ පිට බලා සිටියේ ජීවිතයේ ඉරණම කො තැනක හෝ සැඟවී ඇත් දැයි සොයනවාක් මෙනි. කඳුළු නොගලන තරමට ම දැන් දෑස වියළි ය. ශූන්‍ය ය. දෑසේ නෙතමනය සමඟ ම ජීවිතයේ දයාබර වූ සිතිවිලි ද වියළී යමින් තිබේ. ‘ඕනෑ ම දෙයක් වෙන්නට දැන් ඉතිං දුල්ලෑව සමඟ ජීවත් විය යුතු ය’. යන සිතිවිල්ල ද නිරන්තරව මට වධ දෙයි. එහෙත් ලීලාගේ දරුවා දුල්ලෑවගේ වත් ද යන අලුත් සැකයක් ද මා තුළ ඉපැදෙමින් තිබේ.

For E-Pusthakalaya

# 21

උදේ ම පිනි වැටෙමින් තිබිණ. දයාර්ද්‍ර බවින් හා තෙතමනයෙන් යුතු සුළඟක් කාමරයට විත් මාගේ ඇස අවදි කරවයි. මා නිදා සිටියේ දකින කිසිවෙකුගේ සිත් පිනවන ඉරියව්වකින් නොවේ. ජීවමය ගුණය හීන වූ, එහෙත් නිදියන.... ඔහේ නැගිටින..... ඔහේ ඇලවී සිටින අසහනකාරී එකියක මෙනි. මගේ ගෙල ආසන්නයේ ළඟ ළඟ ම ඉසිවර හුස්ම ඉහළ පහළ ගන්නා උණුසුම මට දැනේ. 'උඹ තනි එකියක් නෙවෙයි.... මමත් ඉන්නවා' වැනි හැඟීමක් ඒ නිසා නිරන්තරව උපදිමින් මගේ සිතට බොහෝ දුර යාමට ඉඩ නොදී මා නවතාලයි. ඔහුගේ ලා රත් පැහැ සුරත මගේ ගෙල ත් ළමැද ත් අතර නිරාවරණ තැනක් සොයමින් ඇවිද ලැගුම් ගනී. ඔහු කුඩා කල සිට ම නිදන්නට වන් විට අත පත එහෙ මෙහෙ පැවිසරවා එසේ පණ ඇති බව දැනෙන ඉසව්වක රඳවා නිදා ගැනීම පිරිතකි. ඔහුට ඒ විට 'තනිකම' නොදැනෙනවා වීමට පුළුවන.

හිම පිනි තවමත් වැටෙමින් තිබේ.

මම මගේ පුතාව තව තවත් මදෙසට සමීප කොට මව්වත් උණුසුමකින් ඔහු තුරුලු කොට ගනිමි.

මට පින්නේ සීතල නොදැනේ.

ළඟ ළඟ ම ඉහිරෙන පුතුගේ කිරි සුවඳ දැනේ. අලුත් හුස්මකින් පපුව පුරවා මම ඉසිවර දෙසට දෑස විකසිත කළෙමි.

'පුතා උදෙම වැටෙන පිනි බිඳුවක් වගේ' මම සිතිමි. මම මෘදු ම මෘදු සිසින් ඉසිවරගේ මුහුණ පිස ගනිමි. නින්ද ත් නොනින්ද ත් අතර සිටි ඉසිවර මගේ තන්පෙති ත් කම්මුල ත් අතර මුහුණ සඟවා ගත්තේ ය. සමනලයෙක් වැළඳුවා වගේ මට දැනිණ.



දහවල් වන විට පිනි සිසිල දැවෙන්නට පුළුවන. නොසිතූ විරූ පරිදි ලීලා ද මේ සියල්ලට මැදිහත් වී ඇත. මම තීරණාත්මක කාලය ගෙවා දමමින් සිටියෙමි. 'මං මගේ පුතාට තාත්තා කෙනෙක් හොයල දෙනවා' මම මට ම කියා ගනිමි. ඒ විට මසිතට සැහැල්ලුවක් දැනේ.

මතුපිටින් දැනන සියලු සදාචාරයන්ට පටහැනිව 'මටත් මිනිහෙක් ඉන්න ඕන' වැනි අශීලාචාර වූ එහෙත් ශීලාචාර හැඟීමක් මා තුළ නොතිබුණා නොවේ. එහෙත් ලීලාගේ කුස ඔත් දරුවා බැරි වෙලා වත් විශ්වගේ නොවේ නම් මට තව දුරටත් ඔහු වෙනුවෙන් ඉවසීමට පුළුවන. 'ඔහු තවමත් මා වෙනුවෙන් ජීවත් වෙනවා' යන ගතට නැතත් සිතට දැනෙන හැඟීම මට ජීවත් වීමට ප්‍රමාණවත් ය. විටෙක මට ම අකීකරු සිත ඔහු වෙනුවෙන් තව දුරටත් කීකරු කර ගැනීමට මම මැලි නොවෙමි.

ඒ නමුදු මට රිදවීමට මගේ ගත සිත දවාලීමට විශ්ව එක දිනක් හෝ ලීලා සමඟ උණුසුම් වී ඇත් නම් මොහොතක් හෝ සමා නොවී ඔහුගෙන් පළිගැනීමට මම නොපැකිළෙමි. ඒ තරම් ම පළිගැනීමේ චේතනාවක් මසිතේ උපදී.

විශ්ව පවිත්‍ර යැයි සිතෙන විට මගේ මනසේ ඇඳෙන්නේ සංවේදී ආදරණීය විශ්වගේ රූපය යි. එය බෙහෙවින් ආදරණීය වෙයි. 'මගේ පුතාගේ තාත්තා' යැයි සිතන විට ආදරය ගෞරවනීය වෙයි. මට රවන, ගොරවන, වෙනස්කම් කරන පහරදෙන විශ්ව ලීලා සමඟ යහන්ගත වූවා නේදැ යි සිතෙන විට ජුගුප්සාවක්, ඊර්ෂ්‍යාවක්, වෛරයක් මෙන් ම ක්‍රෝධයක් ද දැනී ඔහුට පාඩමක් ඉගැන්වීමට තරම් මගේ සිත තරුම් වෙයි.

එහෙත් ලීලාගේ කුස ඔත් දරුවා දුල්ලැවගේ වත් ද යන සැකය මගේ හිත මේ මහා මන්දිරයේ සීමාවෙන් පිටතට සීත සුළං හමන දිශාවෙන් ඒ පිටට මා කැඳවා ගෙන යයි.

'ලීලාට සමීප වූයේ දුල්ලැව නොව විශ්ව' යැයි සිතීමට ද මම සමහර විටක වඩාත් ප්‍රිය වීමි. මේ වන විට විශ්වට වඩා දුල්ලැව බෙහෙවින් මට සමීප වීම මගේ චිත්ත සන්තානය යම් තරමකට වෙනස් කිරීමට බල පාන්නට ඇත.

අහිමි වෙමින් පවතින විශ්වගේ දුරස් වීමට වඩා සමීප වෙමින් පවතින දුල්ලැව ඇත් වීම සමහර විට මට වැඩි රිදවීමක් ගෙනෙන්නට

වි ය. 'විශ්ව තමයි ඔය වැඩේ කරන්නට ඇත්තේ' යැයි සිතීමට මම පූර්ව කොන්දේසි සොයමින් සිටියෙමි. ඉසිවරගේ දෛනික චර්යාව ද තරුණියක ලෙස නොව ගැහැණියක ලෙස ජීවිතයට මුහුණ දීමේ [illegible]නැකම ද වඩ වඩා ත් විශ්ව සැක කිරීමට හේතු ප්‍රත්‍ය සොයා දෙන්නට ද වි ය. මගේ සැකය තහවුරු වූ සැණින් මම දුල්ලැවගේ බිරිඳ වීමට සූදානමින් සිටියෙමි.

මම හිමිදිරි සංක්‍රාන්තියේ ම පහත මාලයට බැසීමි. කො තනක හෝ සැහවී ඇති සැකයක් සාක්ෂියක් කොට ගැනීමට මට ඕනෑ වි ය. කුස්සියේ පහන් දල්වා ඇත. මම පියවර සත් නොනැහෙන සේ කුස්සියට රිංගුවෙමි. එහෙත් මා කුස්සියට පියවර කීපයක් තැබීමට ඉතිරිව තිබියදී කුස්සියෙන් එළිමහනට බසින දොර වැසී තද වී අගුලු වැටිණ. මම උගුර පාදමින් කුස්සියට පිවිසියෙමි. උගුර පාදා කුස්සියට පිවිසීම මගේ මෝඩකම වි ය. මට ම ලැජ්ජා සිතිණ. කිසිවෙකු කුස්සියේ වැරදි ලෙස හැසිරෙමින් සිටින්නේ නම් 'සංවර වන්න. මම එනවා.' වැනි සංඥාවක් දීම මගේ උගුර පෑදීමේ ක්‍රියාවේ අරමුණ වි ය. 'ඉතින් හොර අල්ලන්නේ කෙසේද?' මගේ ගොන්කම සමඟ මම කුස්සියට රිංගුවෙමි.

විශ්ව ලීලාගේ හිස ගෙන පපුතුරෙහි හොවා ගෙන සිටී. මට මරා ගෙන මැරෙන තරම් දරුණු සිතක් පහළ වි ය.

එහෙත්,

කවුරු මරන්න ද? කවුරු වෙනුවෙන් කවුරුත් මරා ගෙන මැරෙන්න ද? මගේ මුළා වූ සිතිවිලි පසෙක දා මම ගැහෙන තිගැස්සෙන රිදෙන සිතින් ඔවුන් දෙස බලා සිටියෙමි.

'විශ්ව, ඔයා හදන්නෙ මාව රිදවන්න මාව මැනගන්න නේද? මං එච්චර මෝඩ නෑ.'

විශ්වගෙන් මා එසේ විමසන විට හොරහින් මදෙස බැලුවේ ලීලා ය. පිළිතුරු නොමැතියෙන් මම නැවතත් ප්‍රශ්න කරන්නට වීමි.

'ඔයා ලීලාට ආදරේ කරනව කියල මට පෙන්නන්න හදනවා.'

මම ගොත ගැසිමි.

'දරුවෙකුත් හදලාම පෙන්වනවා.'

'ඔයා එච්චර තරකත් නෑ. මං එච්චර මෝඩත් නෑ.'



'ලීලාට එච්චර වයසකුත් නෑ. ආදරේ අඩුවකුත් නෑ...'

මට ඔච්චමට මෙන් ඔහු එසේ කියන්නට වි ය. මම කිසිවක් කියා ගත නොහැකිව වටපිට බැලීමි. කුස්සියේ බිත්තියේ ලොකු අකුරින් කිසිවෙකු යමක් ලියා තිබිණ. මම එය කියවීමි.

'දෙවියනි,

විශ්වට ඇස් දෙකක්ද (නේත්‍රාද) නේත්‍රාට ලෝකයක්ද (විශ්වද) ලබාදුන මැනව.

මම ලීලාගෙන් ප්‍රශ්න කෙළෙමි.

'කවුද ලීලා අර බිත්තියේ ඒවා මේවා ලිව්වෙ?'

'මන්ද නෝනා.'

'උඹලා හිතන්නේ, උඹලට වගේ මටත් පිස්සු කියලද?'

එ විට විශ්ව 'ඔව් නෝනා' යැයි කීවේ ය.

'විශ්ව ඔයා බොරුවට රහපාන්න හදන්න එපා. ඔයාට හොඳටම සනීපයි. හොඳ සිහිබුද්ධියෙන් ඔයා ඉන්නේ. ඔයාට දැන් හොඳට හිතල බලල හොයලා බැලුවොත් තේරෙයි පහුගිය අවුරුදු දෙක තුනේ මොනවද වුණේ. මං කොහොමද ඔයා වෙනුවෙන් හිටියේ කියලා.'

මගේ කතාවට ඉඩ නොතබා ම ඔහු ලීලාගේ මුහුණ සිප ගෙන ගියේ ය.

'එපා මහත්තයා.'

ලීලා පසෙකට පැන්නා ය. විශ්ව ද ලීලාගේ කියමනට එකඟ වි ය. මම අවසන් වරට මට කිව යුතු දේ විශ්වට කීමට තීරණය් කළෙමි.

'ඔය ඇත්ත නම් මට තවත් ඔය දේවල් ඉවසන්න බෑ විශ්ව. ඔයාට අශීලාචාර විදිහට හැසිරෙන්න අයිතියක් තියෙනව නම් මටත් මගේ ජීවිතේ ගැන තීරණයක් ගන්න අයිතියක් තියෙනවා. ඔයා හින්ද මං හුඟක් දේවල් කැප කළා. ඔයත් මං හින්ද ඉස්සර එහෙම කළා. මට ඔයා හින්ද දරුවෙක් ඉන්නවා. මට මගේ දරුව ගැන හිතන්න වෙනවා. දෙයියන්ගේ නාමෙට මට බෑ ඒ නොදරුව සාරට දාන්න. ඒ හින්ද මමත් තීරණයක් ගන්නවා. මටත් නමට හරි මිනිහෙක් ඕන. මගේ දරුවටත්

වි ය. 'විශ්ව තමයි ඔය වැඩේ කරන්නට ඇත්තේ' යැයි සිතීමට මම පූර්ව කොන්දේසි සොයමින් සිටියෙමි. ඉසිවරගේ දෛනික චර්යාව ද තරුණියක ලෙස නොව ගැහැණියක ලෙස ජීවිතයට මුහුණ දීමේ ඕනෑකම ද වඩ වඩා ත් විශ්ව සැක කිරීමට හේතු ප්‍රත්‍යය සොයා දෙන්නට ද වි ය. මගේ සැකය තහවුරු වූ සැණින් මම පූල්ලෑවගේ බිරිඳ වීමට සූදානමින් සිටියෙමි.

මම හිමිදිරි සංක්‍රාන්තියේ ම පහත මාලයට බැසීමි. කො තනක හෝ සැහවී ඇති සැකයක් සාක්ෂියක් කොට ගැනීමට මට ඕනෑ වි ය. කුස්සියේ පහන් දල්වා ඇත. මම පියවර සත් නොනැගෙන සේ කුස්සියට රිංගුවෙමි. එහෙත් මා කුස්සියට පියවර කීපයක් තැබීමට ඉතිරිව තිබියදී කුස්සියෙන් එළිමහනට බසින දොර වැසී තද වී අගුලු වැටිණ. මම උගුර පාදමින් කුස්සියට පිවිසියෙමි. උගුර පාදා කුස්සියට පිවිසීම මගේ මෝඩකම වි ය. මට ම ලැජ්ජා සිතිණ. කිසිවෙකු කුස්සියේ වැරදි ලෙස හැසිරෙමින් සිටින්නේ නම් 'සංවර වන්න. මම එනවා.' වැනි සංඥාවක් දීම මගේ උගුර පෑදීමේ ක්‍රියාවේ අරමුණ වි ය. 'ඉතින් හොර අල්ලන්නේ කෙසේද?' මගේ ගොන්කම සමඟ මම කුස්සියට රිංගුවෙමි.

විශ්ව ලීලාගේ හිස ගෙන පපුතුරෙහි හොවා ගෙන සිටී. මට මරා ගෙන මැරෙන තරම් දරුණු සිතක් පහළ වි ය.

එහෙත්,

කවුරු මරන්න ද? කවුරු වෙනුවෙන් කවුරුත් මරා ගෙන මැරෙන්න ද? මගේ මුළා වූ සිහිවිලි පසෙක දා මම ගැහෙන හිගැස්සෙන රිදෙන සිතින් ඔවුන් දෙස බලා සිටියෙමි.

'විශ්ව, ඔයා හදන්නෙ මාව රිදවන්න මාව මැනගන්න නේද? මං එච්චර මෝඩ නෑ.'

විශ්වගෙන් මා එසේ විමසන විට හොරහින් මදෙස බැලුවේ ලීලා ය. පිළිතුරු නොමැතියෙන් මම නැවතත් ප්‍රශ්න කරන්නට වීමි.

'ඔයා ලීලාට ආදරේ කරනව කියල මට පෙන්නන්න හදනවා.'

මම ගොත ගැසීමි.

'දරුවෙකුත් හදලාම පෙන්වනවා.'

'ඔයා එච්චර නරකත් නෑ. මං එච්චර මෝඩත් නෑ.'



'ලීලාට එච්චර වයසකුත් නෑ. ආදරේ අඩුවකුත් නෑ...'

මට ඔච්චමට මෙන් ඔහු එසේ කියන්නට වි ය. මම කිසිවක් කියා ගත නොහැකිව වටපිට බැලීමි. කුස්සියේ බිත්තියේ ලොකු අකුරින් කිසිවෙකු යමක් ලියා තිබිණ. මම එය කියවීමි.

'දෙවියනි,

විශ්වට ඇස් දෙකක්ද (නේත්‍රාද) නේත්‍රාට ලෝකයක්ද (විශ්වද) ලබාදුන මැනව.

මම ලීලාගෙන් ප්‍රශ්න කෙළමි.

'කවුද ලීලා අර බිත්තියේ ඒවා මේවා ලිව්වෙ?'

'මන්ද නෝනා.'

'උඹලා හිතන්නේ, උඹලට වගේ මටත් පිස්සු කියලද?'

එ විට විශ්ව 'ඔව් නෝනා' යැයි කීවේ ය.

'විශ්ව ඔයා බොරුවට රඟපාන්න හදන්න එපා. ඔයාට හොඳටම සනීපයි. හොඳ සිහිබුද්ධියෙන් ඔයා ඉන්නේ. ඔයාට දැන් හොඳට හිතල බලල හොයලා බැලුවොත් තේරෙයි පහුගිය අවුරුදු දෙක තුනේ මොනවද වුණේ. මං කොහොමද ඔයා වෙනුවෙන් හිටියේ කියලා.'

මගේ කතාවට ඉඩ නොතබා ම ඔහු ලීලාගේ මුහුණ සිප ගෙන ගියේ ය.

'එපා මහත්තයා.'

ලීලා පසෙකට පැන්නා ය. විශ්ව ද ලීලාගේ කියමනට එකඟ වි ය. මම අවසන් වරට මට කිව යුතු දේ විශ්වට කීමට තීරණය් කළෙමි.

'ඔය ඇත්ත නම් මට තවත් ඔය දේවල් ඉවසන්න බෑ විශ්ව. ඔයාට අශීලාචාර විදිහට හැසිරෙන්න අයිතියක් තියෙනව නම් මටත් මගේ ජීවිතේ ගැන තීරණයක් ගන්න අයිතියක් තියෙනවා. ඔයා හින්ද මං හුඟක් දේවල් කැප කළා. ඔයත් මං හින්ද ඉස්සර එහෙම කළා. මට ඔයා හින්ද දරුවෙක් ඉන්නවා. මට මගේ දරුව ගැන හිතන්න වෙනවා. දෙයියන්ගේ නාමෙට මට බෑ ඒ නොදරුව භාරට දාන්න. ඒ හින්ද මමත් තීරණයක් ගන්නවා. මටත් නමට හරි මිනිහෙක් ඕන. මගේ දරුවටත්

For E-Pusthakalaya

තාත්තා කෙනෙක් ඕන. මං මේ කරන්න හදන වැඩේ පව්කාර එකක් වෙන්න පුළුවන්. ඒත් මං මගේ දරුව වෙනුවෙන් ඒ පව්කාර වැඩේ කරන්න ලෑස්තියි. මට සමාවෙන්න....

මම විශ්වගේ දෙපා මුල වැඳ වැටී මගේ හිස ඔහුගේ දෙපා මුල රඳවා සිටියෙමි.

'මට සමාවෙන්න.'

නැවතත් එසේ කියා මම වැටෙන්නට ආසන්න කඳුළ සඟවා ගෙන දුල්ලෑවගේ කාමරයට ගියෙමි. ඔහු පිබිදී සිටියේ ය.

'ගුඩ් මෝනින් නේත්‍රා...'

ඔහු එසේ කියා යහනින් නැගිට්ටේය. පිළිවෙළකට සකසා තිබුණු කාමරය පුරා මම දෑස යැවීමි. දුල්ලෑව තවමත් රාත්‍රී පිජාමා ඇඳුම පිටින් ය. කාමරයේ ටීපෝව මත විශ්වගේ මවගේ සේයාරුවකි. ඒ පසෙකින් ඉසිවර සිනහ වී සිටින විශාල ප්‍රමාණයේ සේයා රුවක් වී ය.

'සාමාන්‍යයෙන් ඔයා මගේ කාමරයට උදේම එන්නේ නෑ.'

'ආද අවේ නොයන්න හිතාගෙන.'

මම ඔහුට කීවෙමි. කපා හෙළූ ගසක් මෙන් ඔහුගේ පා මුල වැටී දෙපා ස්පර්ශ කොට වැන්දෙමි. ඔහු මාගේ උරහිසින් අල්ලා මා නඟා සිටවූවේ ය.

දෙවුරින් අල්ලා මා සෑප්‍රු කළ දුල්ලෑව දෝතින් ම මගේ දෙකම්මුල් බදා ගෙන දෑසින් දෑස තියෙව්වේ ය.

'මොකටවත් හිත කළබල කරගන්න එපා. මං ඉන්නව.'

මාපටැඟිලි දෙකින් ඔහු මගේ කම්මුලට වැටුණු අවසන් කඳුළ ත් පිස දැම්මේ ය.

'මං මෙච්චර කලක් මහපොළොව වගේ හැම දෙයක්ම දරාගෙන හිටියේ. ඒත් මහපොළොවටත් හැකිමක් තියෙනවා. නේත්‍රා...'

'මං දන්නවා..'

මීට පුථම ද දුල්ලෑව මා ස්පර්ශ කොට ඇත. එහෙත් කිසි දිනෙක මා ඔහුට උනන්දුවෙන් හිලෑ වූවේ නැත. මට ඒ වැනි ඕනෑකමක් තිබුණේ



නැත. එහෙත් මෑතක සිට මට 'තනිව ජීවත් වීමේ' නොහැකියාව ආත්මය විසින් ම පාඩමක් කොට උගන්වා තිබේ. මගේ සිරුර සලිතව ඔහුට අවනත වූවා ය.

'කෝ පුතා.'

'කාමරේ නිදි'

සිහින් ස්වරයෙන් ඇසූ රහසකට මෙන් මම ද රහසින් උත්තර දුනිමි. ඇලි වැටෙන්නට ආසන්නව තිබූ ඔහුගේ දෙනෙත තාරුණ්‍යයේ පුළිඟු පිට කරමින් තිබිණ. පිරිමිකම වැතිරුණු පළල් උරපතු අතර මහා ඉඩකඩක් තිබිණ. මම හිතාමතා ම එම ඉඩකඩ මත දෙකම්මුල් සතපවා ලිමි.

'මට ඕනෑ පිස්සු වැටෙනකල් ආදරය කරන්න ඉඩක්.'

ආදරය ත් ශෘංගාරය ත් විසින් මුසපත් කරනු ලැබූ දුල්ලෑව කියා ගෙන ගියේ ය. ඔහු ලතාවකට මගේ හිස වමට හරවා පහත් කොට කන්පෙත්ත සිප ගත්තේ ය.

මට සුවදායක අඩනින්දක නිදන්නට ඕනෑ වි ය. ඔහු ගෙල වටා අත යවා නැවතත් මා පිබිදෙව්වේ ය. මම ජනෙල් කවුළුවෙන් එහාට දෑස් ඇවිද්දුවෙමි. ළා අරුණලු ඇත සිට මෙ පිටට එයි.

'මම ඔයාව කසාද බඳිනවා.'

දුල්ලෑව කීවේ ය.

'මට බෑ'

මම අකුණක් වැදුණු එකියක මෙන් බිය වී කීවෙමි. 'මට බෑ' යනුවෙන් මා කී කතාව ත් ඔහුට හුරතලයක් වි ය. කුඩා දරුවෙකුගේ නොකීකරුකමක් සේ ඔහු මගේ ප්‍රතිවිරෝධය ඉවසුවේ ය. ඔහු කිසි විටෙක මා ස්පර්ශ කිරිම අත් හිටෙව්වේ නැත.

නොඉවසිලිමත් විනාඩි කීපයක් මොහොතකින් ගෙවී ගියේ ය.

ගැහැණියකට ජීවිතයේ මුහුණ දිය හැකි දෙවැනි ස්වයංවරය ලැබීමේ අවාසනාවන්ත වූ – වාසනාවන්ත කාල හෝරාව ගෙවී ගියේ ය.

මම සිතින් ද කයින් ද දුල්ලෑවගේ බිරිඳ වීමි.

For E-Pusthakalaya

## 22

අලුත් උදෑසනක් ගෙතුළට ගලා ආවේ ය. කාමරයේ දොර හැරිණි. ප්‍රභාතයට පසුව ඇදෙන අපූර්ව තරුණ හිරු එළිය තවමත් මෝරා වැඩෙමින් තිබෙයි. දුල්ලෑව සතුටින් ද විස්මයෙන්ද යුතුව ආශ්වාස ප්‍රශ්වාස කරයි. කුරුල්ලෝ එකා දෙන්නා මිදුලේ පිනි ජම්බු ගසට රොක් වෙති. මම මිරිකුණු සිත සතුටකැ යි සිතා පොඩිවුණු ඇඳුම් සකසා ගතිමි.

'මං යනවා. පුතා තනියම කාමරේ.'

මම ආපසු හැරී එක් වරක් දුල්ලෑව දෙස බලා කාමරයෙන් එළියට බැස්සෙමි.

ඉසිවර කුඩා සෙල්ලම් කාරයක් ගෙන තනිව ම සෙල්ලම් කරමින් සිටියේ ය. මට එක් වර ම සතුටක් ද දුකක් ද දැනිණ. මම මගේ පුතාව සිප ගෙන සිපගෙන ගියෙමි.

'මං හිතුවා... අම්මා ගියා කියලා?'

'මං මගේ පුතාව දාලා කොහේ යන්නද පුතේ?'

'බැලුවම .... අම්ම නෑ කියල හිතුණා...'

ඔහු කුරුලු වචන හළමින් කීවේ ය.

'පුතා බය වුණාද?'

'නෑ.... මං බය වුණේ නෑ... මං පස්සෙ බය වුණේ...'

ඉසිවර හේතුඵල ගළපා ගත නොහැකිව අගක් මුලක් නැති අතෝරක් දේ කියා ගෙන යයි.

'මොකට ද මගේ පුතා පස්සෙ බය වුණේ...'



'මං බයවුණේ අර යකා වගේ මිනිහා එයි කියලා...'

'කවුද පුතේ යකා වගේ මිනිහා...?'

'අර පහළ ඉන්නේ.... අම්මට දවසක් ගැහුවේ?...

'ආ.... පුතා එයාට බයවෙන්න එපා. දැන් අපි එයාට බය නෑ...'

මට තවත් දේ පුතාට කියන්නට ඕනෑ වි ය. එහෙත් ඒ කිසිවක් මේ නොතේරුම් දරුවාට කියා ඵලක් නැත. එහෙත් කවදාක හෝ ඉසිවරට මේ සියල්ල කිව යුතු ය. එදාට ඉසිවර ජීවිතය පිළිබඳ කුමක් සිතයි ද? ජීවිතය කෙසේ තේරුම් ගනී ද? ඔහුට අම්මා ගැන පිළිකුලක් දැනී ප්‍රතික්ෂේප කරයි ද? මම මොහොතක් ඉසිවර දෙස බලා සිටියෙමි. මට ඔහු විසිවසරක මිනිහෙකු වී මා ඉදිරියේ ප්‍රතාපවත් වන සැටි මැවී පෙනේ.

'මගේ පුතා අම්මට ආදරේද?'

'ඔව්.... මට මගේ අම්ම ඕන...'

ඔහු මගේ ඇඟේ ඇතිල්ලෙමින් බළල් පැටියෙකු සේ දැවටෙයි.

මා කළ නොසණ්ඩාලකම ඉසිවරට දැනෙතැ යි මම බිය වීමි. ඉක්මනින් ඇඳුම් අහවර කොට පිරිසිදු වී අලුත් ඇඳුමක් ඇඟලා අලුත් වීමට  මට ඕනෑ වී තිබේ. මම මගේ ඇඟිලි තුඩින් - පිටි අත්ල සිප ගතිමි. ඉසිවර ළඟ වාඩි වී ගෙල එහෙ මෙහෙ හරවා කැඩපතින් මුහුණ බැලීමි. 'උඹ කොහොම හරි දුල්ලෑව අල්ලා ගත්තා නේද. බැල්ලි' වැනි මුරණ්ඩු සතුටක් මට දැනිණ. මම එකී මුරණ්ඩු සතුටට ප්‍රිය කළෙමි. 'ජීවිතය විඳගනිං.... නැත්තං ගෑණු හැමදාම පරාදයි.' වැනි ආඩම්බරයක් ද මගේ යටි සිතේ සිට උඩට ගලා එයි. මගේ ශරීරය නැවතත් ඉක්මනින් හුස්ම ගැනීම අරඹන්නට වි ය. මම පුතාව වඩා ගෙන රවුමක් දෙකක් කැරකුණෙමි. ඔහු සතුටින් උතුරා යයි. මගේ මුහුණේ විකසිත හැඟීම් ඔහුගේ මුහුණට ආරෝපණය වී ඇත. මම තවත් රවුමක් ඔහු කැරකුවෙමි.

'ඇයි අම්මා...?'

ඔහු නැවත මහා හයියෙන් සිනා සුණේ ය. ජීවිතය රසවත් ය. මිහිරි ය. මම එකී මිහිර විඳ ගනිමින් සිටියෙමි. අලුත් මිහිරියාවක තුන්වැන්නා කාමරයට පිවිසියේ ය.

For E Pusthakalaya

'මොකද පුතා කියන්නේ?'

දුල්ලැව වැඩි අයිතියක් ලැබූ නිදහස් කාමියෙකු ලෙස විමසුවේ ය. වෙන දා මෙන් ඔහු කාමරයට එබුණේ නැත. තොකම් පෑවේ නැත. දොර පියන් විවර කොට කෙලින් ම කාමරයට පිවිසියේ ය.

'පුතා කියනවා තාත්තා හොඳ නෑ ලු...'

මම තරමක් පමා වී නමුදු සිනා සෙමින් පිළිතුරු දුනිමි. දුල්ලැව ද පෙරළා සිනාසුණේ ය.

'අපි යමු නේත්‍රා ඇවිදින්න.'

මට ද ඒ ඕනෑකම තිබිණ. අනෙක දුල්ලැව කළේ ඉල්ලීමක් ම නොව ඔහු තීරණය කළ දෙයක් ප්‍රකාශ කිරීමකි. මේ බිත්ති හතරෙන් මිදී ලෝකය දැක ගැනීමට පවා මා තුළ වූයේ මහත් ඕනෑකමකි. ඉසිවර ඉපදුණාට පසු මේ ගෙදරින් මා පිට වූයේ දින දෙක තුනකි. ඒත ඉසිවරගේ වුවමනාවකට ය. එක්කෝ බෙහෙත් දාන්නට ය. ඇඳුම් ගන්නට ය. එහෙමත් නැත්නම් ඉසිවරට වටපිටාව පෙන්වන්නට ය.

'ඔයා ලෑස්ති වෙන්න. මං පුතාව බලාගන්නම්...'

'පුතා ඉස්සෙල්ල ලෑස්ති කරලා ඉමු...'

මම කීවෙමි. මට සිතට සහනයක් ද කුතුහලයක් ද දැනෙමින් තිබේ. වරෙක මගේ ජීවිතයට යහපතක් වේ නම් ඒ වෙනුවෙන් මා ජීවිතයේ බොහෝ දේ කැප කළ යුතු බව සිතිමි. මේ මොහොත වන විට ත් දුල්ලැව මගේ ජීවිතයෙන් බලාපොරොත්තු වන්නේ මොනවා ද මගේ ජීවිතයට වන්නේ කුමක් ද යන්න මට ප්‍රහේලිකාවක් වුව ත් ඔහු ඉසිවරට ආදරය කරන බව මම සක් සුදක් සේ දැන සිටියෙමි.

මම කඩිසරව පුතාගේ මූණ කට සෝදා ඇඳුමක් ඇන්දුවෙමි. හිස පීරා සපත්තු ලෑවෙමි. ඕඩිකලෝන් බිංදු කිහිපයක් තැන තැන තැවරීමි. ඉන් පසුව දුල්ලැවගේ ඔඩොක්කුවේ ඉන්දුවෙමි.

මම ද ඉක්මනින් සූදානම් වීමි. 'යමු' යැයි නොකියා ම අපි පහත මාළයට පිවිසුණෙමු. විශ්ව දොරකඩට වී සිටියේ ය. ඔහුගේ මුහුණ බැලීමට හෝ ඔහු නිරීක්ෂණය කිරීමට මට මහත් ඕනෑකමක් තිබිණ. එහෙත් මම ඔහු දෙස නොබලා ම කාරයට නැඟ ගතිමි. පුතා පිටුපස අසුනට නැඟ ගත්තේ ය. කාරය පණ ගැන්වූ දුල්ලැව එය ගේට්ටුව දෙසට



පැදවූයේ ය. මම පුතා දෙස බලන නියාවෙන් පසු පස බැලීමි. විශ්ව ගේට්ටුව දෙසට පයින් ගමන් කරමින් සිටී. මම පුතාගේ ඇඳුම් සකස් කොට නැවතත් ඉදිරිපස අසුනේ හරිබරි ගැසුණෙමි.

මගේ පපු කුහරයේ සැඟවුණු ගින්දර, පුපුරු ගසමින් නැවත දැල්වෙන්නට වී ය. විශ්වගේ මුහුණ බොහෝ ශෝකාකුල යැයි මම සිතීමි. මසිතේ යළිත් ශෝකය ඇවිළිණි. 'හෝස්' ගා මගේ පපුව පත්තු වි ය. එ විට ත් කාරය නාවල පාරට වැටී අවසන් ය.

බොහෝ දුරක් මා නිහඬව ගමන් කරද්දී ත් දුල්ලැව කතා නොකළේ මගේ මානසික ස්වභාවය තේරුම් ගත් නිසා දැයි මම නොදනිමි. නුගේගොඩින් කාරය දකුණු පැත්තට හරවා හයිලෙවල් පාර දිගේ කොළඹ දෙසට ඇදෙමින් තිබිණ.

'නේත්‍රා කතා කරන්ඩ පටන් ගන්නවාද? මම පටන් ගන්නද?'

දුල්ලැව ඉදිරිය බලා ගෙන ම විමසුවේ ය.

'දැන් ඉතිං විශේෂයෙන් කතා කරන්ඩ දෙයක් ඉතිරි වෙලා නෑ.'

මම කීවෙමි.

'තියෙනවා. දැන් ඉතිං ඔය හිත පාලනය කරගන්ඩ ඕනෑ. විශ්ව එයාගෙ ජීවිතේ ගෙනියයි. එයාට දැන් සනීපයි. අසනීපකාරයෙක් කියල විශේෂ අනුකම්පාවක් කාගෙන්වත් ඕන නෑ. එයාට ඉඩම් තියෙනවා. සල්ලි තියනවා. ගේදොර තියෙනවා. පිටරට යවලා උගන්වලා තියෙනවා. නේත්‍රා ඉතිං හුඟක් කල් එයා වෙනුවෙන් කැපවෙලා හිටියානේ. දැන් හිත පාලනය කරගන්න වෙනවා. විශ්ව ගැන හිතන එක දැන් ඉතිං නවත්වන්ඩ වෙනවා.'

'මම තීරණයක් අරන් තමයි අද උදේ කාමරයට ආවේ. මේක මගේ නොසණ්ඩාලකමට වෙච්ච දෙයක් නෙමෙයි. මම එදත් බොරු කිව්වේ නෑ. අදත් මම කාටවත් බොරු කරන්නේ නෑ. මට තවම විශ්ව ගැන හිතන එක නවත්ත ගන්න බෑ. ඒක නරක, වනචරකමක් නෙමෙයි. මං ජීවිතේ ආදරය කළ එකම පිරිමියා. මගේ දරුවගේ තාත්තා.'

'එතකොට මම මොකාද?'

For E-Pusthakalaya

දුල්ලෑව තරමක් සැරෙන් ප්‍රශ්න කළේ ය. ඉසිවර පසු අසුනේ සිට මගේ ඔඩොක්කුවට පැන්නේ ය.

'පොඩි එකා බයවෙයි. පව් හිතෙන කතා කියන්න එපා...'

තවත් දුරක් ගමන් කළ ත් අප අතර කතාවක් තිබුණේ නැත. මම නැවතත් සැහැල්ලු ලෙස සිනීමට වෙහෙස ගතිමි. රණ්ඩු වීම, මුරණ්ඩු වීම, නොකීකරුකම මගේ ජීවිතයට ගෙනා ආබාධ බෙහෙවි. මම පුතාට හොඳින් වටපිටාව පෙනෙන සේ උකුළට ගෙන හිඳුවා ගතිමි. කිරුළපන හරියේ දී දුල්ලෑව කාරයෙන් බැස ගොස් පුතාට ලොකු බෝල කිපයක් ගෙනත් දුන්නේ ය.

'ලස්සනයි නේද පුතා?'

මම දුල්ලෑවට ඇසෙන සේ පුතාට කීවෙමි.

'තාත්තා ශෝක්.'

ඉසිවර ද මගේ සිත තේරුම් ගත්තාක් මෙන් උත්තර දුන්නේ ය. අපේ තුන්පත් රැනට පුතාගේ මැදිහත් වීම නැවත සහනය සැනසීම ගෙනෙන්නක් වි ය.

'මමත් පිරිමියෙක් නේන්‍රා...'

තවත් දිගු කතාවකට දුල්ලෑව මුල පුරද්දී මම විරුද්ධ වීමි.

'පුතා ඉන්නවානේ.... අපි පස්සේ කතා කරමු.'

මගේ කතාව ඉත සිනින් පිළිගත්තාක් මෙන් දුල්ලෑව පුතාගේ නිකට උස්සා කම්මුලට සිහින් තට්ටුවක් දැම්මේ ය.

'අපි කොහාටද නේන්‍රා යන්නේ... කිංජෝයි යනවාද? ශාන්ති විහාර් යනවාද? සත්තු වත්තට යනවද? නැත්නම් මුහුදු වෙරළට...?'

ප්‍රශ්න මතු නොකොට ප්‍රශ්න සමනය කිරීමට මම ඉක්මනින් ම පිළිතුරු දුනිමි.

'මුහුදු වෙරළට යමු'.

කාරය ඩික්මන් පාරෙන් වමට හැරිණ. මීට බොහෝ කලකට පෙර රාත්‍රී මේ පාරේ දුල්ලෑවගේ බෙන්ස් රථයේ ගමන් කළ දින වකවානු මගේ සිතේ මැවෙන්නට වි ය.



'මට අද හරි සතුටු දවසක්.'

'මං දන්නවා.'

'නේන්‍රාට සතුටුද?'

'ඔව්.'

මම පිළිතුරු දුනිමි. මට වඩාත් අවශ්‍ය පිළිතුර වූයේ 'සමහර විට' යැයි කීමට වුව ත් මම 'ඔව්' කීවෙමි. පිළිතුරේ අඩක් ඇත්ත ය. අඩක් බොරු ය. මම පිළිතුරෙහි තිබූ ඇත්තට වඩා බොරුවට ප්‍රිය කළෙමි.

ගාලු පාර දෙසට කාරය ඇදෙත් ම අතීත චිත්‍ර රූප රැසක් මගේ මනසේ වේගයෙන් සංස්කරණය වි ය. විශ්ව සමග කාර්යාලයේ ගත කළ දවස්, ඔහුට ආඩම්බර පෙන්වූ හැටි.... විශ්වගේ මව කාර්යාලයට විත් බැණ වැදුනු දවස්.... විශ්වගේ මව බෝඩිමට පැමිණ කළ ගාලගෝට්ටිය.... විශ්ව මා ගල්කිස්සේ හෝටලයකට ගෙන ගිය දවස.... එදා ඔහුගේ ඉවසීම.... නොඉවසීම..... දැරියක් ගෙන මා මුහුදු වෙරළට දිව ගිය හැටි... බම්බලපිටිය පොලිසිය.... අදට වඩා එදා සිත කෙ තරම් මුරණ්ඩු ද? අනම්‍ය ද? මෙ තැන් සිට අතීතය ගැන සිතන විට දුකක් ද සතුටක් ද මිශ්‍ර හැඟීමක් දැනේ. අනාගතයේ දී අද ගැන ත් එසේ සුහුඹුල් සතුටක් ජනිත කළ හැකි වනු ඇත් ද?

යාත්‍රා කරන්නට සිටි මම පාවී පාවී යන ඉසව්වක හැටි... ගොදුර සහ ගොදුරු වීම අතර ඇත්තේ තත්පරයක වෙනසකි. ආදරය සහ අනාදරය අතර පරතරය අහස පොළොව මෙනි. ඇයි විශ්ව සහ මම? අප කෙ තරම් දුරස් වූණි ද?

'බහින්න. බැහැලා කල්පනා කරන්න.'

දුල්ලෑවගේ ස්වරයෙන් මම අවදි වීමි.

පුතා අපට ත් පෙර වෙරළට පැන සෙල්ලම් කරන්නට වි ය.

මම මෑත ම තිබූ ගල් කුළකට බර වුණෙමි. දුල්ලෑව ඇගේ ගෑවී ගෑවී සමීපයේ ම හිඳ ගත්තේ ය.

'සැහැල්ලුයි...'

ඔහු කී ය.

‘ලොකු බරක් නිදහස් කළා වගේ?’

For E-Pusthakalaya

‘ඔව්’

‘මගේ ජීවිතේට තවත් බරක් එකතු වුණා වගේ.’

මම එකටෙක නිවෙමි.

‘හැම දෙයක්ම අසුබ විදියට හිතන්න එපා. අසුබ විදිහට හිතන එක ගැණුකමක් නෙමෙයි. මූසල හැඟීමක්.’

‘ගැණු ගැන පුදුම අද්දැකීම්නේ තියෙන්නෙ?’

‘ඔව්. මං විශ්වගේ අම්මා ගැන හිතල එහෙම කිව්වේ.’

‘මං මහා පව්කාරි.’

‘නෑ එයා පව් හොයහොයා ගියා. සතුට තියන හැම තැනකම එයා සැකය දැක්කා. කසාද බැන්ද අලුත මං කොච්චර අඬන්න ඇද්ද? මගේ පිරිමිකමටත් මටත් ලැජ්ජයි. එයා හරිම ඔතෑනි ගැහැණියක්. එයාගේ ජීවිතේ කම්මැලිකමින් පිරිලා. මම පුදුම තරම් මූසල ජීවිතයක් ගෙනිච්චේ. ඒ එයාගේ හැටි. මං එයාට වරදක් කළා. ඒත් මං දකින දකින හැම ගෑණිත් එක්කම බුදිය ගත්තේ නෑ. මට ඉවසීම තිබුණා. වරදක් කළාට මං එයාට පව් වැඩ කළේ නෑ.’

‘මං මගේ ඉවසීම නැති කර් ගත්තා. මං විශ්වට පව් වැඩක් කළා...’

රළ ගෙඩි බිඳෙන සරින් නැඟෙන හඬ පරයා මම ඔහුට කීවෙමි. මගේ ජීවිතය ගසා ගෙන යන්නට දෝ දළ රළ පෙළ අප අසළටම එයි. පුතා රළට බොහෝ මෙහා ඉසව්වක සිටී. ඔහු අපේ කතාවට ඉඩ දෙන හැටි...

‘අපි කසාද බඳිමු නේත්‍රා...’

‘මට බෑ....’

විදුලි කොටා හෙණ ගසන්නට පෙර මම කීවෙමි.

‘මට ඕන දෙයක් කරන්න. මගේ මුළු ශරීරයම ඔයා ළඟ තියාගන්න. මගේ ආත්මය විතරක් ඉල්ලන්න එපා. මට ඒක කරන්න බෑ. විශ්ව ජීවත් වෙලා ඉන්න කල් මං මගේ ආත්මය එයා ළඟ තියා ගන්නවා.’



‘ඒ වුණාට අපි බඳින්න ඕන.’

‘මං කොහොමද ඔයාව බැඳලා ඒ ගෙදර ඉන්නේ. මං ඔයත් එක්ක එකට හිටිය එක ඇත්ත. ඉස්සරහටත් මං ඔයත් එක්ක ජීවත් වෙන්නම්. ඒත් විශ්ව...’

‘ඌ මානසික රෝගියෙක් කියලා දික්කසාද වෙමු.’

‘මට තිරිසන් වෙන්න බෑ.’

‘ඒ උණාට ඌ තිරිසන් වැඩක් කළේ.’

‘ලෝකෙම තිරිසන් උණත් මට බෑ.’

‘කපටිකම’

‘නෑ ඇත්ත.’

‘නේත්‍රා මට ආදරේ නැද්ද ඩිංගිත්තක්වත්?’

‘ආදරෙයි...’

‘කොච්චර...?’

‘පොඩි එකෙකුට වගේ මට ආදරේ වර්ග කරන්න බෑ.’

‘නේත්‍රා හදන්නේ විශ්වට වගේ මටත් පිස්සු වට්ටන්නද?’

‘නෑ.’

‘එහෙනම් රැට ඔළුව තියලා අයින් කරන කොට්ටය වගේ මාව අයින් කරන්නද?’

‘නෑ..’

‘එහෙනම් මොන මගුලක්ද යකෝ කියන්නෙ?’

දූල්ලැව් අහක බැලුවේ ය. මගේ ගත පුරා දහදිය නැඟිණ. අපහසුවෙන් මම සැළෙන්නට වීමි.

‘මායාකාරකමේත් සීමාවක් තියෙනවා නේත්‍රා.’

‘ඔව්.’

‘අර මේ ලෝකේ දෙයක් නොතේරෙන පොඩි එකා ගැන හිතන්න ඕන නේද?’

'ඔව්.'

For E-Pusthakalaya

'නුවර ඉන්න අම්ම තාත්ත ගැන?'

'ඔව්.'

'ඔයාටත් ජීවිතයක් කියල එකක් ඕන නේද?'

'ඔව්... ඔව්.... ඔව්...'

මම කියා ගෙන කියා ගෙන ගියෙමි. මගේ කටහඬේ සැරට ඔහු නිහඬ වී ය. මම මගේ වාරය ඇරඹීමි.

'මට එනවර හැඟීමක් තිබුණ නම් මෙච්චර කලක් ඉවසගෙන ඉන්න බෑ නේද?'

'ඔව්.'

'ඉවසල ඉවසල බැරිම තැන මං ඔයාට ළං වෙච්ච එක වැරදි නෑ නේද?'

'ඔව්.'

'මං මගේ ජීවිතේ ඉස්සෙල්ලාම ආදරය කරපු මගේ දරුවගේ තාත්තා ගැන හිතන එකත් වැරදි නෑ නේද?'

'මට පුළුවන් දරුවට තාත්තා වෙන්න. ඇයි බැරි ඔයාට අම්ම වෙන්න?'

'මං මගේ විශ්ව අමතක කරන්නෙ කොහොමද?'

'මං මගේ ගෑණි අමතක කළේ කොහොමද?'

ඒ තැන් පටන් අප දෙදෙනාට ම කතා නැති වී ය. ප්‍රතිඋත්තර නැති වී ය. ප්‍රශ්න නැති වී ය. අපි දෙදෙනා ම ඉසිවරගේ හුදෙකලා කෙළි කවට හරඹමින් සිටියෙමු. ඈත ඈත දුරකට හිත පාවී යමින් තිබිණ. ප්‍රශ්න ත් නැති පිළිතුරු ත් නැති ජීවිතය කෙ තරම් ශූන්‍ය ද? එහෙත් ඒ ශූන්‍ය බව සැණෙකින් ප්‍රශ්න සහ පිළිතුරුවලින් පිරී ඉතිරී හිතට වධ දෙන හැටි කෙ තරම් පීඩාකාරී ද?

අප වෙනුවෙන් මුහුද ඝෝෂා කරන්නට, කෑ ගසන්නට වී ය. වෙරළ සියල්ල දරන්නේ විඳින්නේ ප්‍රචණ්ඩත්වය විඳ ගන්නා ගැහැණියක මෙනි.



පුංචි පුංචි පෙණ බුබුළු වෙරළේ සිහින් සරයකින් බිඳී බිඳී යයි. හරියට කෑ ගසා ගෙන එන හැඟීම් සංසිඳෙනවා මෙනි.

මම දුල්ලැවගේ උරහිසට වාරු වුණෙමි. සටනකින් පරාජය වූ සෙබළියක මෙන් ඔහුට යටහත් පහත්ව ඔහුගේ සරණය ම සොයන්නට වීමි.

රෑ අඳුර හති දමමින් අහුමුලුවලට එකතු වෙද්දී අපි නිවසට ඒමට පිටත් වීමු. ඉසිවර බොහෝ තෙහෙට්ටු වී කාරයේ පසු පස අසුනට වී නිදා ගත්තේ ය. ඔහු දහවල් ආහාරය ගත්තේ ද වෙන දාට වඩා අඩුවෙනි. 'රෑටත් නොකා පොඩි එකා බඩගින්නෙම නිදි කරන්න වෙන්නෙ' යන අදහස මම නොකියා සඟවා ගෙන සිටියෙමි. අඳුරු වලා වඩ වඩා ත් රොංචු ගැසෙමින් තිබිණ. වහින්ට ආසන්න ය. මගේ සිතට ද කයට ද අනියත බියක් දැනෙමින් පවති.

'රෑට වහීවි.'

දුල්ලැව කීවේ ය.

'හෙණ ගහන්න වගේ ගොරවන්නේ වහින්ඩ තමයි.'

මම කීවෙමි. අපේ මුහුණු අඳුරු වී තිබෙන්නට ඇත. අප තුළ ම නොහික්මුණු ගුප්ත හැඟීමක් සැඟවී ඇතුවාක් මෙනි. මගේ සම වියළී ගොසිනි. සිතට ද ගොරෝසු හැඟීමක් දැනේ. මම දුල්ලැවට නොපෙනෙන්නට ඔහුගේ මුහුණ දෙස බැලීමි. ඔහුගේ ද දෙතොල සුදුමැලි වී ගොසින් ය. ඇසිපියවල තෙත් ගතිය නොමැති තරම් ය. මට සිටි ඉරියව්වේ ම සිටින්නට නොහැකි සියුම් කරදරයක් ගතට ත් සිතට ත් දැනේ.

'ඇයි?'

දුල්ලැව ඉදිරිය බලා ගෙන ම ප්‍රශ්න කළේ ය.

'නෑ නිකං. රෑට වහීවි.'

මම කීවෙමි. කළුවර ජීවිතයට හුඟක් දේ උගන්වන බව මම දැන සිටියෙමි. කළුවරට නීතියක් නැත. කළුවරට සදාචාරයක් නැත. කළුවරට හික්මීමක් නැත.

'පාරෙ ලයිට් ගිහිල්ලා. ඒකයි කළුවර.'

For E-Pusthakalaya

දුල්ලෑව කීවේ ය.

'ගෙදර ලයිට් ඇති.'

මම කීවෙමි. අප අතර තිබුණේ මහත් වියළි සංවාදයකි. එය රූදුරු නැත. එහෙත් මෘදු ද නැත. මගේ ස්මරණය සුන්දර මතක වස්තූන් සොයා ම පියා සළයි. කළුගල් ගෙඩි දෙකක් බර තැබුවාක් මෙන් මගේ හදවත ගිර වෙයි. සීතල දිය බිඳු කීපයක් එහි ගලා යනවා නම්: කෙ තරම් සහනයක් ද?

'පුතා පව්.'

මම පසු පස අසුනට හැරී කෙපළුවෙමි.

'දැන් කරදර කරන්න එපා. ගිහිල්ලා ඇඳට දාන්න.'

දුල්ලෑව කී වචන නියෝගයක් නොවේ. අණ කිරීමක් ද නොවේ. එ මෙන් ම ඉල්ලා සිටින ආයාචනයක් ද නොවේ. එකී වචනවල තිබුණේ අධිපති බව යි. හිමිකාරකම යි. තමන් සන්තක දේ පිළිබඳ සින්නක්කර පිරිමිකම යි.

'මෙහෙට කලින් වැහැලා තියෙනවා. ඒකයි පාර මඩවෙලා තියෙන්නෙ.'

දුල්ලෑව නැවතත් කාරයේ වේගය බාල කරමින් කීවේ ය.

'හැම තැනම වලවල්නේ. ඒවායේ මඩ පිරිලා.'

මම හිස ඉදිරියට නෙරා ගෙන ම කීවෙමි.

දවසක් කතා කළ පසු අපට කතා කරන්නට දෙයක් ඉතිරි නොවූ සැටි.... මම සුසුමක් හෙළීමි.

දෙවන ස්වයංවරයෙන් පසුව ත් ගැහැණියක් ගොළු වේ නම්: ශූන්‍ය වේ නම්: වියළි වේ නම්: කෙ තරම් අවාසනාවක් ද? අපිරිසිදු සර්පයන් රැනක් විත් මගේ ඇඟේ දැවටෙනවාක් මෙන් මට හිරිකිත බියක් දැනිණ. ඔවුහු මාගේ හෘද මාංශයේ සියුම් ම සියුම් සංවේදී තැන් හපා දැමීමට සැරසෙති. මගේ සියොළඟ ම හිරිකිත හිරිගඩු පිපිණ.

'බුලත් විටක් කන්න ඕන.'

'ඇයි?



'නිකං අප්පිරියාවක් වගේ දැනෙනවා.'

'කාර් එකේ වීදුරු වහලා හින්දා. ඒ.සී. එකට. ගෙදර ගියාම හරියයි.

දුල්ලෑව හිතට නොගෙන පිළිතුරු දුන්නේ ය.

'නිකං කලන්තෙ වගේ.'

'උදේ ඉඳලා මුහුදු හුළං වැදිච්ච නිසා. ගෙදර ගියාම හරියයි.'

දුල්ලෑව නැවතත් උත්තර දුන්නේ ය.

'ඔළුව කකියනවා පුපුරන්න වගේ.'

'ගෙදර ගිහින් පැනඩෝල් එකක් බොමු. එතකොට හරියයි.'

මායාකාර කට්ටඩියෙකු ළඟ නතී වූ ගැමි ආතුරයෙකු මෙන් මම මලාන වී ගියෙමි. මගේ පිරිපත දෝෂ නිවාරණය වූවේ ද නැත. තොවිලය අහවර වූවේ ද නැත. පළා යාමට ත් බැරිය. සමීප වීමට ත් බැරි ය මාගේ පදේට ඔහු දැන් නටන්නේ ද නැත. ඔහුගේ පදයට මට නටන්නට ත් බැරි ය.

මට හැඬෙන්නට එන් ම මම අමාරුවෙන් හැඬුම නවතා ගතිමි. කෑ ගසන්නට සිතුණ ත් නිහඬ වුණෙමි. මගේ ජීවිතය පෙර කවර දාක වත් නොවූ ලෙස අඩපණ වෙමින් තිබිණ. මගේ ගැහැණු කය තුළ තිබූ ශක්තීන් සියල්ල කිසිවෙකු විසින් සොරා ගත්තාක් මෙනි. සියල්ල වියළි ය. තෙත් බවක් නැත.

'විශ්ව'

සියල්ලෙහි අගය එය තුළ ම ක්ෂය වෙමින් පවතින බව ඔබ දනී නම්?

යන්තම් වල ගැහෙන පිරිපුන් කොපුල් තල ඔබේ සිනාව කැන්දා ගෙන එන විට: මා කෙ තරම් සතුටු වූවා ද? විටෙක හඬ නගා සිනා සෙන, තාරුණ්‍යය කෙ තරම් ම මිහිරියාවක් වී ද? [illegible] ඉඳහිට කෝප වන හැටි... සුළු ම සුළු සිද්ධියක දී පවා කඳුළක හෙළන හැටි !

මගේ දෑතින් ම සට සට ගා කඳුළු දෙපේළියක් ගලා ගෙන ගියේ ය. සඟවන්නට බැරි කඳුළු මම නොසඟවා සිටියෙමි.

‘නේත්‍රා ඇයි...?’

For E Pustakalaya

‘මට ගෙදර ගිහිල්ල පුතා එක්ක තනියම නිදාගන්න ඕන..’

‘මමත් පුතා එක්ක ඉන්නම්. ඇයි අඬන්නේ...?’

‘ඇඬුවේ නෑ...

‘එහෙනම් කඳුළු?...’

‘මට මගේ පුතාට හොඳ අම්ම කෙනෙක් වෙන්න ඕන.’

‘ඔයා හොඳ අම්ම කෙනෙක් තමයි.’

‘මං මහ මූසල ගෑණියෙක්...’

‘විකාර කතා නොකර ඉන්න. දවාලේ හොඳට හිටියේ. ඔයා මේ වැහි අඳුරට බයවෙලා...’

‘මට කළුවර වැටෙද්දි බය හිතුණා තමයි.’

‘බයයි නම් පුතා එක්ක තනියම ඉඳලා හරියනවද? විකාර...’

රෑ අඳුර විඩා නිවමින් නටද්දී අපි ගෙදරට ගොඩ වීමු.

නින්දේ සිටි ඉසිවර දෝතට ගෙන මා සාලයට ගොඩ වූ විගස ලීලා මා දෙස වික්ෂිප්ත බැල්මක් හෙළුවා ය.

‘නෝනා...’

‘ඇයි?’

මගේ තියුණු බැල්මෙන් එඩි බිඳී ගිය ලීලා ‘විශ්ව මහත්තයාට ආයෙත් සනීප නෑ’ යැයි කීවා ය. ලීලාට තිබුණේ ශෝකයෙන් හා පීඩාවෙන් තැවුණු ශෝකාකුල මුහුණකි. මම හනිකට සාලයේ හාන්සි පුටුවේ ඉසිවර වාරු කරවා ලීලා දෙස බැලුවෙමි. ‘විශ්ව කෝ’ යන මගේ බැල්ම ඇයට වැටහිණ.

‘කාමරේ නිදි.’

මගේ පැනයට පෙර ලීලා උත්තර දුන්නී ය. මා විශ්වගේ කාමරයට ඇතුළු වෙත් ම දුල්ලැව ගෙට ගොඩ වනු මට ඇසිණ. ඔහු නොසලකා මම විශ්වගේ කාමරයට ගියෙමි. යහනේ සුදු ඇතිරිල්ල පොඩි කරමින් විශ්ව දරදඬු ලී කොටයක් මෙන් වැතිරී සිටී.



නිල් ඉරි සහිත කමිසය ත්, හරස් නිල් ඉරිසහිත සරම ත් ඇඳ සිටි විශ්ව බෙහෙවින් මළානික ය. සුදුමැලි ය. හද කකියා ගෙන පැන නැඟුණු ශෝකය මම වාරුවෙන් මැඩ ගතිමි. විශ්ව දවසට පැය ගණනට දිරාපත් වූ සෙයකි. හිටි ගමන් විශ්ව අසනීප වුවේ ඇයි? මම ලීලා දෙස බැලුවෙමි.

‘මගේ වැරැද්දක් නෙමෙයි නෝනා.’

‘උඹේ වැරැද්දක් නෙමෙයි නම්.... මගෙන් අහගන්ඩ එපා. වල් බැල්ලී.’

‘මට ඕන දෙයක් කියන්ඩ... ඒත් මේ රත්තරං මහත්තයාට පව් කතා නොකියා...’

ලීලා යහනේ පාමුලට වී පොරෝනය ගෙන විශ්වගේ දණහිසින් පහළ නිරාවරණ දෙපා වැසුවා ය.

‘පළයං... මෙතන කොමල නොදා. ගිහිං හොඳ කිරි තේ එකක් හදාගෙන වරෙන්.... මගේ කාමරේ ඇති පැනඩෝල් වගයක්. එයින් පෙති දෙකකුත් ගෙනෙන්...’

මගේ නියෝගය අහවර වන්නට ත් පෙර ලීලා කාමරයෙන් නික්මුණා ය. විශ්වට හෙදකම් කරමින් ජීවක ආශ්‍රමයක තනි වීමට මට ඕනෑ වී තිබේ.

ගෙය පුරා ම මහත් නිසලතාවක් මොහොතකින් පැතිර ගියේ ය. විශ්ව කෙඳිරුම් හඬක් වත් පිට නොකළේ ය. මම ඔහුගේ නළලට අත තැබීමි. ගිනි කබලක් මෙන් හිස ගිනියම් ය. හිසට අත තබමින් ම මම ඔහුගේ කෙස් රොද පසු පසට තල්ලු කෙළෙමි. දහදිය ත්, හිසතෙල ත් මිශ්‍ර කෙස් රොද කීකරුව හිස මත දිගේලි වී ය. සනීපයට මෙන් විශ්ව දෙතොල සෙළවීවේ ය.

‘විශ්ව...’

මම මගේ ඇස්වලින් කඳුළු පනින්නට පෙර ඔහුට කතා කළෙමි. අමාරුවෙන් වචන ගළපා ගැනීමට වෙහෙසුණෙමි. මගේ සිත බෙහෙවින් නැති ගෙන තිබිණ..

‘විශ්ව...’

මම නැවතත් හීන් හඬින් ඔහුගේ කණට කෙඳිරුවෙමි. අප මෙ තරම් අසරණ කරනවාට වඩා දරුවා ත් සමඟ අප දෙදෙනා මිය යන්නේ

නම් වඩාත් යහපතක් නේදැ යි මට සිතිණි. මගේ හිස හිරි වැටෙමින් තිබිණ. විශ්ව සුදුමැලි දෙතොලෙ සොළවමින් යමක් කීමට තැත් දරයි.

'ඇයි දෙයියනේ ඔයා මේ හිටපු ගමන් වැරදි බෙහෙතක්වත් බිව්වද?'

මම ඔහුගේ මුවට මුව ළං කර බෙහෙත් සුවඳ ඇද්දැ යි බලමින් කීවෙමි. ඔහු මහත් වෑයමකින් දෝත ගෙන මගේ හිස අල්ලා ගත්තේ ය. මම ඔහුගේ මුහුණට නැඹුරු වූ ගමන් ම සිටියෙමි. ඔහුගේ රෝගී සුසුම් මගේ මුහුණ මත පතිත වි ය.

'ඔයා මොන වැරැද්දක් කළත් මං ඔයාට ආදරෙයි විශ්ව...'

මම ඔහුගේ මුහුණට වාරු වෙමින් කීවෙමි.

විශ්ව වඩ වඩාත් ඔහුගේ ග්‍රහණය දැඩි කළේ ය.

'නේත්‍රා... මට ඔයාව ඕන. මාව දාලා යන්න එපා.... මාව දාල යන්න එපා නේත්‍රා.... මාව දාල යන්න එපා රත්තරං...'

විශ්ව පපුව ත් හිස ත් ගස්සමින් ඉකි ගසමින් කීවේ ය. අපි දෙදෙනා විනාඩි කිහිපයක් ඒ තීරණාත්මක මොහොත ගත කළෙමු.



# 23

හතළිස් මසකට ආසන්න කාලයක් විශ්ව ත්, මා ත් අතර තිබුණු මානසික සහ කායික පරතරය බොහෝ වේගයෙන් හීන වී යන අයුරු මට දැනුණි. අපි දෙදෙනා ම වේගයෙන් හුස්ම ඉහළ පහළ ගත්තෙමු. අප එකිනෙකා ඉතා ම ළංව ඔහේ සිටිනා විට එක් හිස් ඉඩක මගේ සිත වේගයෙන් නැවතිණි. ඒ පුදුමය සහ ආස්වාදය අතර හිස් ඉඩකඩ යි. මට විශ්ව පිළිබඳ ආදරයක් ද මා පිළිබඳ පිළිකුලක් ද දැනිණ. මම පුදුමය සහවා ආස්වාදය සෙවීමි. මා ගැන ඇති පිළිකුල සහවා ඔහුට මා අවශෝෂණය කර ගැනීමට ඉඩ දුනිමි.

'මං හැමදාමත් හිටියේ ඔයා ළඟ. මං ඔයාව දාල යන්නෙ නෑ විශ්ව...'

මම තෙපළීමි. එහෙත් එය සත්‍යය නොවී ය. උණු බත් යැයි කියා ලුණු බත් කටක් දරුවෙකුට කවන අම්මා කෙනෙක් කෙ තරම් මානසික පීඩනයකට ලක් වෙයි ද? එ තරම් ම මම සිත රිදවා ගත්තෙමි. බෝ කුසගින්නේ සිටින දරුවෙක්, මව කියන දෙය විශ්වාස කරන්නාක් මෙන් විශ්ව මා විශ්වාස කළේ ය. සුදු පිරුවටයක් මෙන් ම ඔහුගේ සිත ද බොහෙවින් පිරිසිදු යැයි මට සිතිණ. විශ්ව මා එළවා දැම්මා නම් මගේ සිත මෙ තරම් කීරි ගැසෙන්නේ නැත.

'මට සමාවෙලා මගේ ළඟම ඉන්න නේත්‍රා...

විශ්ව, නළියන දෑසේ උනන කඳුළු සඟවා ගනිමින් කීවේ ය. ඔහු මට 'සමාවෙන්න' යැයි කී විට මම නැවතත් සැක සංකා උපදවා ගතිමි. ඔහු 'සමාවෙන්න' යැයි කියන්නේ වරදක් කළ නිසා ද? මා ඔහුට 'විශ්ව දාලා යන්නෙ නෑ' යැයි කීවේ වරදක් නොකළ නිසා ද? සත්‍යය සහ අසත්‍යය ත්, ප්‍රේමය සහ වංචාව ත්, පවිත්‍ර බව හා පිළිකුල ත් අතර සීමා පටු වෙමින් තිබිණ.

ලීලා දොරකඩට පැමිණ අපේ ඉරියව් දෙස බලා සිටියා ය. නොඉවසිලිමත් බවක් ද ආරෝපණය කර ගත් සිනහවක් ද ඇයගේ මුහුණේ වැතිරී තිබුණේ ය. මම ලීලා අත තිබුණු පැනඩෝල් පෙති දෙක ගෙන විශ්වට පොවන්නට සැරසුණෙමි. කොට්ටය ත් හිස ත් අතර මගේ අත යවා මම ඔහුට නැඟී සිටීමට උදව් කළෙමි. විශ්ව ඇස් කත් අයා ගෙන ලීලා දෙස බලා සිටී.

‘ලීලා උඹ පළයං ... මං මහත්තයා බලාගන්නම්...’

මම කීවෙමි.

‘ලීලා පළයං... ලීලා පළයං නම් උඹත් පළයං... උඹ කවුද ලීලාට බණින්න...?’

විශ්ව කඩා පැන්නේ ය. මම හිටි අඩියේ ම තුෂ්ණිම්භූත වීමි. සහතික වශයෙන් ම විශ්වට තවමත් හරිහැටි අසනීපය සුව වී නැති බව මම තේරුම් ගතිමි. මම මගේ තීරණය ත්, මගේ සිතිවිලි ත් වෙනස් කළෙමි. මම වඩාත් ළෙන්ගතු හඬකින් ලීලාට කතා කළෙමි.

‘ලීලා.... මෙහෙට එන්න. එහා පැත්තෙන් ඇවිල්ලා මහත්තයා අල්ල ගන්න...’

මම අනවශ්‍ය ලෙස ලීලාගෙන් උදව් ගත්තෙමි. අපි දෙදෙනා ම හවුල්ව විශ්වට හෙදකම් කළෙමු. ටික වේලාවකින් ඔහු යන්තම් දෑස අඩවන් කොට නිදන්නට සූදානම් වූයේ ය. මම ලීලා දෙස බලා ‘යමු’ යැයි හැඟෙන ලෙස ඉඟි කළෙමි.

මම පුතාත් කරපින්නා ගෙන හිතා මතා ම ශබ්ද නැඟෙන පරිදි කරප්පුව හැන ඉහළ මාලයට පිය මැන්නෙමි. පුතා යහනේ මැද්දට වන්නට තබා නොවැටෙන්නට දෙපැත්තට කොට්ට දෙකක් තැබුවෙමි. මා හැරී බලත් ම ලීලා ද ඉහළ මාලයට පැමිණ දොරකඩට වී සිටියා ය. ඉවසිලිවන්ත බවින් තොර ආරෝපණය කර ගත් සිනහව මම නැවතත් නිරීක්ෂණය කළෙමි. මම ඇයව එ තරම් ගණන් නොගෙන පුටුවේ වාඩි වීමි.

මගේ ජීවිතයේ කෙ තරම් මා පීඩා විඳ ඇතත් ඒ සියල්ල ම හමුවේ මා ජීවිතය ජය ගත්තාක් වැනි හැඟීමක් මට දැනෙමින් තිබේ. සියලු කම්කටොලු හමුවේ මා ජය ගෙන සතුට ලබනවා යැයි ද මට සිතිණි



තාත්තා කටුගස්තොට කඩය දමා ගත්තාට පසු අම්මා ද උදේ ම කඩයට එන බැවින් දවස ගෙවෙනවා නොදැනෙන බව අම්මා ලියා එවා තිබුණි. තාත්තා දුල්ලෑවගෙන් ගත් මුදල් කවදා හෝ නැවත දෙන බව ද, තාත්තාට දැන් සතුටින් ජීවත් විය හැකි බව ද ඇය ලියා එව්වා ය. අම්මාගේ ලිපියෙහි අවසන මෙසේ තිබිණ.

‘මේ පැත්තෙ මිනිස්සු නම් තාත්තා කඩේ දැම්මාට එක එක කතා කියල තිබුණා. දුව එක එකාට දීලා සල්ලි ගත්තා කියලා. ඒත් උඹ කසාද බැන්ද මිනිහගේ තාත්තාගෙන්නේ ගත්තේ. නිතර අපි ආවා නොගියාට දැන් ඉතිං කොහොමත් අපි එක මිනිස්සුනේ. එක එකා දැන් කොහොම කිව්වත් මිනිස්සු මූණට නම් අපට සලකනවා. නාඳුනන මිනිස්සුන්ට අපිව හඳුන්වලා දෙනවා. දුල්ලෑව හාමුගේ පුතා.... විශ්ව බැඳල ඉන්නේ මේ සිල්වාගේ දුව.... කියලා. මේ ඔක්කොම උඹ හින්ද ලැබුණු ඒවා කියලා තාත්තාත් කිව්වා. උඹ වැඩිය ගමේ නොඑන එක විතරයි මිනිස්සුන්ට ප්‍රශ්නෙ.’

දෙමාපියන් සතුටින් සිටින්නේ නම් එය ම මාගේ භාග්‍යයක් කොට මම සැලකීමි. කෙ තරම් කම්කටොලු තිබුණත් ගණන් නොගෙන සිටිය යුතු යැයි මම සිතීමි. එහෙත් ගැහැණියකට එම ඉඩකඩ ගැහැණුකමේ සීමාවන් විසින් ම අහුරා දමනු ලබයි. පුංචි පුංචි ප්‍රශ්න කටු වැටක් මෙන් වටේට දැවටෙයි. තුත්තිරි ඇමිණෙනවා මෙන් ප්‍රශ්න එකිනෙක එකතු වේ.

‘නේත්‍රා නෝනා.... මම හෙට උදේ ගමේ යනවා...’

මගේ සිතිවිලි අවදි කරමින් ලීලා කීවා ය. මම කළබල නොවී සිටි ඉරියව්වේ ම සිට කතා කළෙමි.

‘ලීලා මොකද මේ හදිසියේම...?’

‘හදිසියේ නෙමෙයි නෝනා..... දැන් ඉතිං මාස නවය සම්පූර්ණයිනෙ...’

‘කොහෙටද උඹ පදිංචියට යන්නෙ...? දවසක් මට කිව්ව නේද අම්මා තාත්තා දෙන්නම නෑ කියලා...?’

‘ඔව් නෝනා...’

‘එහෙනම් උඹ කොහාටද යන්නෙ...?’

‘නුවර පැත්තට...’

For E-Pusthakalaya

'ඇයි උඹවත් තවම දන්නෙ නැද්ද යන්නෙ කොහාටද කියලා...?'

'නුවරට කියලා දන්නවා... නුවර කොහාටද කියල දන්නෙ නෑ...'

'කවුද උඹට කිව්වෙ නුවර ගමනට ලෑස්ති වෙන්න කියල...?

'ලොකු හාමු...'

මට නැවතත් දහදිය දමන්නට වි ය. ලීලා හෙට උදේ පිටත් වන්නට පෙර මේ සියල්ල හෙළි කර ගත යුතු ය. ලීලාගේ කුසේ ඉන්නා දරුවා දුල්ලෑවගේ යැයි යන්තම් තිබූ සැකය තව දළුලා මගේ සිතේ නැවත වැඩෙන්නට වි ය. අලුත් වෛරයක් ද ඊර්ෂ්‍යාවක් ද මගේ සිතේ ගැස්ම වැඩි කළේ ය. මම කළබල බවක් නොපෙන්වා මගේ පරණ ගවොම් කිපයක් ද අල්මාරියෙන් ගෙන ඇඳ උඩට දැම්මිි. පුතාගේ කුඩා කාලයේ ඇඳුම් රැසක්ද එ තැනට දැම්මිි. ලාච්චුව හැර එහි තිබූ සියලු මුදල් ද අතට ගතිමි. රුපියල් පන් දහසකට අධික මුදලක් එ තැන තිබෙන්නට ඇත. මම එය ගණන් නොකර ම ලීලාට දුනිමි.

'මං උඹත් එක්ක තරහ නෑ ලීලා... මේ සල්ලි තියාගනින්...'

මම ඇයගේ අත මුදල් තබා ඇගේ දෑසට එබී ඇයව නිරීක්ෂණය කළෙමි.

'සල්ලි නම් දැන් ඇතිවෙන්න තියෙනවා නෝනා. විශ්ව මහත්තයත් දුන්නා. දුල්ලෑව හාමුත් සල්ලි දුන්න...'

මා දුන් මුදල් ඇඟිලි අතර මිරිකා ගනිමින් ඇය කීවා ය.

'මේ රෙදි ටිකත් ඔක්කොම අරන් යන්න. මට ඕවා දැන් වැඩක් නෑ. උදේට ලීලා මොකේද යන්නෙ...?'

වෙව්ලන කටහඬ පාලනය කර ගනිමින් මම ප්‍රශ්න කළෙමි.

'මුලින්ම හිතාන හිටියේ ලොරියෙ යන්න. දුල්ලෑව හාමු කිව්වා කාර් එකේම යන්න කියලා...'

තවත් මොහොතක් මම කල්පනා කළෙමි. ලීලා වක්කඩ කැඩූ [illegible]ක් මෙන් උත්තර දෙන නිසා සියල්ල ඇගෙන් විමසීමේ කුහුල ලඟ ළඟ ම දැනුණෙන් මම ඉවසීමෙන් කතා කළෙමි.

'ලීලා ගියාම ගෙදර වැඩයි... විශ්ව මහත්තයාගේ වැඩ [illegible] හිරවෙන්නෙ...'



'ගෙදර වැඩ නම් කරගන්න කෙනෙක් හෙටම නුවරින් එනවා නෝනා. මටත් විශ්ව මහත්තයා ගැන තමයි දුක...'

'ඇත්තටම ලීලා විශ්ව මහත්තයාට ආදරේද...?'

'එහෙම නොකර කොහොමද නෝනා... මං මගේ ජීවිතේට දැක්ක රත්තරං මහත්තයෙක් තමයි විශ්ව මහත්තයා. මං නම් මගේ ජීවිතේටත් වැඩිය විශ්ව මහත්තයට ආදරෙයි...'

ලීලා නැවතත් මා වටේට කරකවනවා වැනි හැඟීමක් මට දැනුණි. බමන්නට වුවත් මම එය මැඩ ගැනීමට වෙහෙසුණෙමි.

'ලීලා මට වැඩිය හුඟක් මේ ගෙදර දේවල් දන්නවා. ඒ සමහර දේවල් ලීලා මට කියල නෑ. දැන් ලීලා හෙට උදේ යනවා. ඒ ගියාම මං තනියම ඒවාට විසඳුම් හොයන්න ඕන. ලීලා මට උඹ දන්න ඔක්කොම කියල පළයං. උඹ මට ඇත්තම කියල පළයං... උඹට පව් නෑ. උඹත් මං වගේම ගෑණියෙක්...'

මගේ දෑසින් ම කඳුළු ඇද වැටිණ. බොහෝ හේතු නිසා වැටුණු කඳුළු අතර ලීලා වෙනුවෙන් උපන් සහේතුක කඳුළක් ද තිබිණ.

'අඬන්න එපා නෝනා.... නෝනාට මීට පස්සෙ අඬන්න වෙන්නෙ නෑ. මම මට පුළුවන් තරමින් නෝනට හොඳින් ඉන්න කටයුතු කරලයි යන්නෙ. හැබැයි නෝනා මීට පස්සෙවත් දුල්ලෑව හාමුත් එක්ක එහෙ මෙහෙ යන එක නවත්වන්න. නෝනට අයිති විශ්ව මහත්තයා මිසක් දුල්ලෑව හාමු නෙමෙයි...'

ලීලා මට උපදෙස් දෙන්නට පටන් ගත්තා ය. මම ඇගේ උපදෙස් පිළිපදින්නට මෙන් ඇහුම්කන් දුනිමි.

'නෝනා වෙනුවෙන් විශ්ව මහත්තයා ඕන දෙයක් කරයි. දැන් හුඟක්ම සනීපයිනේ. හැබැයි නෝනා විශ්ව මහත්තයාගේ ලෙඩේ වැඩි හරියක් හොඳ කළේ මම, දැන් ඉතිං මං කිව්වොත් මහත්තයා ඕන දෙයක් කරනවා . පව්...'

'ලීලා උඹ මට ඇත්තම කියල පළයං. මං උඹට ආශිර්වාද කරනවා. උඹේ බඩේ ඉන්න දරුව විශ්ව මහත්තයාගෙ නේද...? උඹ ඒක විතරක් කියල පළයං...'

For E Pothkalaya

'වැඩි නැති හෙණ ගහන අපරාධ කතාවක් නෝනා. .. මගේ කුසේ ඉන්න දරුවපල්ල ඌ විශ්ව මහත්තයාගේ නෙමෙයි. මේ මහත්තයා පෙරුම් පුරන බෝධිසත්වයෙක්...

'උඹ ඇයි බොරු කියන්නෙ...?'

'මං දිවුරලා බොරු කියන්නෙ නෑ නෝනා. විශ්ව මහත්තයා ළඟදීම සනීප වෙයි. නෝනා එතකොට විශ්ව මහත්තයායි ඉසීවර බේබියි එක්ක සතුටින් ඉන්න. විඳපු දුක් ඔක්කොම ඉවර වෙයි. සමාවෙලා දුල්ලෑව හාමුත් එක්ක ඇයි හොඳයියක් තියෙනවා නම් නවත්තලා දාන්න...'

'ඇයි උඹට දුල්ලෑව හාමු ගැන ඔච්චර කැක්කුම...?'

'දුල්ලෑව හාමු නෝනාට අයිති නෑ...'

මම තවත් කතා කිරීමට ප්‍රශ්න කිරීමට සැරසුණ ත් මට මගේ සිත ම ඉඩ නොදුන්නේ ය. මම ලීලා දෙස වඩාත් තීරණාත්මක බැල්මක් හෙළීමි. ඇය ජීවිතයේ සත්‍යය පිළිබඳ පාපොච්චාරණයක යෙදෙමින් සිටින බව මට ප්‍රත්‍යක්‍ෂ වී ය.

ලීලාගේ දෑස කැඩපතක් කොට ගෙන මම ඇගේ ජීවිතය විනිවිද දකින්නට උත්සාහ කළෙමි. මට ඇගේ ජීවිතයට කිඳා බසින්නට ඉඩ නොදී ඇය මගෙන් දෑස වසන් කොට ගත්තා ය.

'උඹ කපටියි ලීලා...'

මම කීවෙමි. මගේ හඬෙහි දැඩි බව ත් සෘජු බව ත් එකතු වූ ආවේගයක් ද ශෝකයක් ද තිබිණි. ලීලා සන්සුන්ව උත්තර දුන්නා ය.

'නෝනා එහෙම හිතන එක වැරදි නැහැ. මම පහුගිය මාස කීපයේ කපටි විදිහට හැසිරිච්ච එක ඇත්ත. මිනිස්සු මුලු ජීවිතයටම කපටිකම් කරද්දි මම කාටවත් හානියක් නොවෙන්න කපටිකමක් කළ එකේ වැරැද්ද මොකක්ද..? මට එකම සමාවක් තියෙයි නෝනා...'

'ඔව්. ලීලාට සමාවක් තියේවි.... මොන වැරැද්ද කළත් උඹට සමාවක් දෙන්න තරම් මම හිත හදාගෙන ඉන්නේ. කාලය මිනිස්සුන්ට හුඟක් දේ උගන්නනව. උඹ ඔය වසන් කරන්න හදන ඔක්කොම දේවල් උඹ දන්නෙත් නැතුව උඹේ ඇස්වල ලියවිල තියෙනව. මිනිස්සුන්ගෙ ඇස් දෙක කවින් නොකියවෙන හුඟක් දේවල් එළියට දානව.......



උඹත් දන්නව ඇති විශ්ව මහත්තයට ඉස්සර තිබුණ මෛත්‍රියෙන් පිරිච්ච ඇස් දෙකක්. උඹ දන්නවද ලීලා මං පහුගිය කාලේ ලොකු හාමුගේ වනචර ඇස් දෙකට අහුවෙච්ච විත්තිය. ඇත්ත කියපං.... උඹත් ඒ ඇස්වලට අහුවුණා නේද...?

'බුදු හාමුදුරුවන්පල්ල නෑ නෝන....'

'එහෙනම් මිනිස්සු දිහා කරුණාවෙන් බලන මෛත්‍රියෙන් පිරිච්ච විශ්ව මහත්තයගේ හිත උඹ කිලිටි කළා නේද....?'

'පව් කතාවක් නෝනා. හොඳ මිනිස්සු නරක් කරන එකයි, හොඳ මිනිස්සුන්ට කතා හදන එකයි දෙකම පව්.'

'ලීලා..... උඹ මාව ආයෙත් වටේ කරකවන්නද හදන්නේ...? උඹ ගෙදරින් ගියාට කමක් නැහැ. මාව පිස්සියෙක් කරල යන්න එපා...'

'මම එහෙම කරන්නේ නැහැ නෝනා. හොඳ මිනිස්සුන්ගේ හිත් රිදවන එක ගෙවාගන්න බැරි පාපයක්...'

'එහෙනම් උඹේ බඩේ ඉන්න දරුවට තාත්ත කෙනෙක් නැද්ද...?'

'ඉන්නව නෝනා. අහිංසකයෙක්. මං වසං කරගෙන හිටියේ අපි දෙන්නටම අනතුරක් වෙයි කියල. ලොරිය එළවන සෝමදාස තමයි ළමයගේ තාත්තා....'

මංමුලා වී ක්ලාන්තව ඇද වැටෙන විට සීතල අයිස් කුට්ටියක හිස ගැටුණාක් මෙන් මම තිගැස්සුණෙමි. අන්ධකාරයේ කණාමැදිරි එළියක් යැයි ගිනි පුළිඟු ගොඩක් බදා ගත්තාක් මෙන් මම දැවී ගියෙමි. කුරිරු හැඟීම් ගොඩක් මගේ හෘද මාංශය ම කා දමනවාක් මෙන් වි ය. අශීලාචාර මිනිසුන් ගොඩක් මැද නිරුවත් වුණාක් මෙන් මට හිරිකිතයක් දැනෙන්නට වි ය. මා, මගේ ම දරුවා, මගේ ම මව, මගේ ම ස්වාමියා මරා දැමීමට හවුල් වූ අසික්කිත ගැහැණියක මෙනැ යි මට සිතිණ. මම වේගයෙන් පිට වන්නට ආ සුසුමක් ළයට බර දී, පීඩාකාරීව ළයෙහි ම තෙරපා ගතිමි.

'යහපත් මිනිසුන්ගේ හිත රිදෙව්වොත් ඒක ගෙවාගන්න බැරි පාපයක් තමයි ලීලා..'

බොහෝ කලකට පසු ගැහැණියක් ඉදිරියේ මම කඳුළු හෙළුවෙමි.

හුදෙකලාව කඳුළු හෙළනවාට වඩා, පිරිමියෙකු ඉදිරියේ හෙළන කඳුළකට වඩා, ගැහැණියක් ඉදිරියේ හෙළන කඳුළ බර වැඩි ය.

'උඹට දළදා හාමුදුරුවන්ගේ පිහිටයි ලීලා. ගිහිල්ලා හොඳින් හිටපං. තවත් ඕන දෙයක් තියනව නම් මට නොකියා හරි කමක් නැහැ මෙහෙත් අරං පළයං. පව්කාර ගෙදරක හිටපු වාසනාවන්ත ගැහැණියක් උඹ. උඹට වගේ ජීවිතයක් මටත් තිබුණා නම් මාත් හරි වාසනාවන්තයි.'

මට තවත් කතා කිරීමට බොහෝ දේ තිබිණ. පිරිපත දොස් නිවන්නට ලීලා ඉදිරියේ මගේ පව් සෝදා හරින්නට ද මට සිතිණ. එහෙත් මම සියල්ල සඟවා ගත්තෙමි. දුල්ලැව් සමඟ මගේ ජඩ, එහෙත් වේදනාකාරී හැසිරීම ලීලාට කියන්නට ද මට සිතිණ. එහෙත් ජීවිතය ලස්සනට සැලසුම් කළ අහිංසක ගැහැණියකට මගේ පිළුණු ජීවිතය ගැන කියා ඇගේ හිත කිළිටි කරන්නේ ඇයි?

'මට වචනයක් කියන්න තියෙනවා නෝනා. සමාවෙලා ඒකත් කියන්නද...?

'කියන්න. මට දැන් කොහොමත් ඉස්සරහට වෙන්නේ වැඩිපුර ඇහුම්කන් දෙන්න තමයි.'

ලීලා බොහෝ වේලාවක් ඇගේ ළමා විය ත්, කටුක නීරස දුක් මුසු යෞවනයත් හෙළි කළා ය. ඇගේ කතාවේ අතරතුර කඳුළ ද, සිනහව ද තිබිණ.

දෙවන භාගයේ දී ඇය මාත් විශ්ව ත් සම්බන්ධ රහස් ද හෙළි කළා ය.

'ලොකු නෝනට ඕනකම තිබුණ නේත්‍රා නෝනව කොහොම හරි විනාශ කරන්න. මරන්න, වහ දෙන්න. මහ පාරට ගෙනියල වාහනේකට යට කරන්න පවා ඒ දවස්වල කතා කළා. මේ හැම දේකටම හවුල් කරගත්තේ සෝමදාසයි තව දෙතුන් දෙනෙකුයි. විශ්ව මහත්තය අසනීප වුණාම නේත්‍රා නෝනා බැන්ද මහත්තයා කියලා සෝමදාස කාමරේට එවපු දවසෙත්, ලොකු නෝනා කරන්න හදපු දේ මම දැනගෙන හිටියා.

'මම ,ඔය ඔක්කොම අමතක කරල ඉන්නෙ ලීලා...'

'නේත්‍රා නෝනා අකමැති නම් මම නොකියා ඉන්නම්...'

'නැහැ.... මට අහගෙන ඉන්න පුළුවන්...'



'මේ හැම දෙයක් ගැනම සෝමදාස කලකිරීමෙන් හිටියේ. ඒවා ගැන කතා කරන්න ගිහිල්ල තමයි සෝමදාස මගෙත් එක්ක යාළු වුණේ. විශ්ව මහත්තයත් සෝමදාසට හරි හිතවත්. පහුගිය ටිකේම රට මෙහේ ඉඳල උදේට යනව. විශ්ව මහත්තය අපිත් එක්ක කතා කරකර ඉන්නව රෑ දෙගොඩ හරියේ වෙනකම්, විහිළු කරනව. අපිත් එක්ක ඉඳ්දී විශ්ව මහත්තයා පුදුම සැනසීමෙන්. සැහැල්ලුවෙන් හිටියේ. මං හිතන්නෙ විශ්ව මහත්තයාට සනීප වෙන්න ඒකත් බලපාන්න ඇති.'

'විශ්ව මහත්තයා මං ගැන සැක කළාද?'

'සැකයක්ම නෙමෙයි නෝනා. මොකක්ද අමතක වීමක් තමයි තිබුණේ. ඇක්සිඩන්ට් එක නිසා වෙන්න ඇති. මායි සෝමදාසයි ටික ටික නෝනා ගැන කතා කළාම දොඩී එකක් වගේ අහගෙන හිටිය. හැබැයි පහුවදාට ආයෙමත් මතක නැහැ. ආයෙත් කියල දෙන්න ඕන. ඇක්සිඩන්ට් වෙච්ච දා ඉඳල වුණු හැම දෙයක්ම අපි විශ්ව මහත්තයට කිව්ව. ඒවා අහද්දී විශ්ව මහත්තයා සමහර වෙලාවට ඇඬුවා. වෙලාවකට හිනාවුණා. වෙලාවකට හිටියේ මිනිමරුවෙක් වගේ කේන්තියෙන්.'

'ඇයි ලීලා ඔය විස්තර මට ඒ දවස්වල නොකිවේ...?

'විශ්ව මහත්තයගේ හැසිරීම හින්ද. එයාට තිබුණ කාගෙන්දෝ පළිගන්න ඕනකමක්. වෙලාවකට තාත්තා ගැන කියනවා. ඒ කියල තාත්තට ආදරෙයි කියනව. ආදරේ හින්දා ඕකව මරන්න ඕනේ කියනව. මගේ අම්ම බුදුවෙන්න ඕන කියනව. කියල තාත්තට දේවදත්ත කියනව. මගේ නේත්‍රා මට ඕන කියල හිටපු ගමන් ඉකි ගහනව. ඊට පස්සේ අර විංචිමානවිකාව කෝ කියල කුස්සියේ අහුමුලුවල හොයනවා.'

'තවමත් විශ්වට සනීප නැහැ ලීලා.'

'මහත්තයා සැකෙන් ඉන්නේ.'

'මහත්තයා මොනව හරි දන්නවද?'

'දන්නව නෙමේ. මතක නැහැ. දරුව විශ්ව මහත්තයගේ කියල පිළිගන්නේ නැහැ. දරුවෙක් හම්බ වෙන්න බඳින්න එපායැ කියල කියනව. නේත්‍රා බබෙක් හම්බවෙන්න ඉන්නව මම දැකල නැහැ කියනව. මම කවදාවත් නේත්‍රා එක්ක එකට ඉඳල නැහැ කියනව. එහෙම කියද්දී

For E-Pusthakalaya

මමයි සෝමදාසයි දෙන්නම දුකෙන් අහගෙන හිටියා ඇර වෙන කරන්න දෙයක් තිබුණේ නෑ...

'මට ඩිංගක් හරි කිව්ව නම් හරි ලීලා...

'කොහොමද නෝනා කියන්නේ? මමයි සෝමදාසයි පහුගිය අවුරුදු දෙකේ හොරා පොලිස් වගේ ජීවත් වුණේ. සමහර දවස්වල නෝනා පඩිපෙළ බැහැල එන සද්දේ ඇහුණාම සෝමදාස කුස්සියේ දොර ඇරගෙන දුවනව. අපි දෙන්න වැඩිය කතා කරල තියෙන්නේ අපි දෙන්නටත් වැඩිය නෝනයි විශ්ව මහත්තයයි ගැන. දවසක් සෝමදාස අඟුරු කැල්ලකින් කුස්සියේ ලියල තිබ්බා 'විශ්වට නෝනාත්, නෝනාට විශ්වත් ලැබෙන්නේ කවදාද?' කියල. අපි නෝනලා ගැන හතුරු හිතකින් හිටියේ නැහැ.'

විශ්ව මා වෙත දිනා ගැනීමේ අරගලය නැවතත් මුල සිට ම කළ යුතු නොවේ දැයි මම කල්පනා කළෙමි. ඔහු දුව විමට ඉතා ම ආසන්න තත්ත්වයේ සිටින බව ද මේ වන විට මට අවබෝධ වී තිබිණ. පසු ගිය කාලේ මට විශ්ව පිළිබඳව යහපත් දේ තේරුම් ගත හැකි නොවූයේ ජඩ බවට පත් වෙමින් තිබූ මගේ සිත ත්, කය ත් විශ්ව ඉල්ලා නොසිටි නිසා ම ද? දැන් විශ්ව දිනා ගත්ත ද මට ඔහු වෙනුවෙන් ගෙවන්නට පිවිතුරු ජීවිතයක් ඉතිරි වී නැත.

ජීවිතයේ යහපත් අරමුණක් නොමැති විට අතරමග දී මංමුළාව වල් වදියි. විශ්ව ගැන බලාපොරොත්තු දල්වා ගත හැකි අනාගතයක් නොමැති යැයි මගේ ම සිතිවිලි මට ම ඒත්තු ගැන්වී ය. එසේ නොවුණා නම් පිනි බිඳුවක් තරම් ජීවිතය පවිත්‍රව තබා ගැනීමට මට හැකියාව තිබිණ. ප්‍රභාතයේ පිපුණු පිච්ච මලක් සේ විශ්වගේ ආත්ම පූජාසනයේ එය පුදන්නට තිබිණ. මා පර මලක් වුවා පමණක් නොව කැත කුණු මුසු වූ විස වූ මට්ටු බඳුනක් බවට ද පත් වී සිටිමි.

'ලීලා එහෙනං උදේට යන්න ලෑස්ති වෙන්න.'

මා ලීලාට එසේ කිව ත් මට ද ජීවිතයෙන් පළා යන්නට සිදු වී තිබිණ. ලීලා කාමරයෙන් ගිය පසු මම ඉසිවර බොහෝ ළෙන්ගතුකමින් උකුළට ගත්තෙමි. හිස ත් දෙකම්මුලු ත් අත ගෑවෙමි. සිය සිය වතාවක් ඔහු සිප, සිප සැනසීමි. ඔහු සැනසීම ලැබුවේ ද නැත. මට සැනසීම ලැබුණේ ද නැත.



'ඇයි අම්මා...?

'මං හරිම කරදරේක වැටිලා ඉන්නෙ පුතා. පුතාට මේවා තේරෙන්නේ නැහැ. මට මගේ පුතාට මේවා කියන්නත් බැහැ. අපි යමු පුතේ. ගිහිල්ලා තාත්තගේ කකුල් දෙක අල්ලලා සමාව ගමු.'

තාත්තා ළඟට යනවා යැයි කී විට ඉසිවර වඩා කඩිසරව ඉක්මන් වූයේ ය. 'තාත්තා' යැයි කී විට ඔහු සිතන්නේ දුල්ලෑව ළඟට යන බවකි. මම ඉසිවර කැඳවා ගෙන විශ්ව ඉන්නා තැන සොයා පහත මාලයට බැස්සෙමි.

තරප්පුව බැස සාලයට පිවිසෙත් ම දුල්ලෑවගේ ඇසට මා හසු වී ය. ගොදුරක් ගිල දමා සිටි ගුරුළෙකු මෙන් ඔහු වටපිට නොබලා ම සැපපහසු පුටුවේ දපා සිටියේ ය. ගත සලිත නොකළ ඔහු ගිජු දෑස පමණක් එහෙ මෙහෙ කරකැවී ය. මේ ගුප්ත ... තේරුම් ගැනීමට මගේ ජීවිත ඥානය මඳ බව මට වැටහිණ.

'මගේ පුතේ.'

ඔහු 'ඇයි අම්මා' යැයි කියා පූස් පැටියෙකු මෙන් දැවටෙමින්, ඇතිල්ලෙමින් මට වසන් වී ය. මා කරදරයකට පත් වී යැයි ඔහු අවබෝධ කොට ගත්තාක් මෙනි. පොඩි පොඩි පියවර තබමින් ඉසිවර පරිස්සමින් අඩිය තබයි.

'පරෙස්සමින් පුතේ.'

මම කීවෙමි. එහෙත් මා එසේ කීවේ පුතාට ද, මගේ ම හිතට දැයි මම නොයිතිමි. බොහෝ විට මගේ යටි සිතේ තිබුණු කැළඹිලි සහිත බව විසින් මටම මම 'පරිස්සම් වෙයං' යැයි කියා ගත් අවස්ථා වී ය. එහෙත් නාසය තෙක් වතුර ගැලූ විට එ තනින් එහාට කුමක් අරභයා මා පරෙස්සම් වන්න ද? මම පුතාගේ කර වටා අත දමා සැහැල්ලු වීමට ත් ඉසිවරට මගේ ආරක්ෂාව ඇතැ යි හැඟවීමට ත් වෙහෙසීමි.

අතීතයෙන් ඇරඹී – අනාගතයට දිවෙන – මා වෙතට ම පතිත වන – ආදරණීය සෙවණැල්ලක් මෙන් ඉසිවර මා පසු පස වැටිණ. සදාකාලික සුවයක් ඉසිවර වෙතින් මට දැනේ. මම දුල්ලෑවගේ හඬට ඒ දෙස බැලීමි.

For E-Pusthakalaya

'නේත්‍රා...

දූල්ලැව මා ඇමතුවේ ය. එහෙත් එයි ඇමතුමේ තේරුම් ගත හැකි කිසිවක් නොවී ය. ඔහු මෙන් ම හඬ ද ගුප්ත ය. මුසලකමට ත් වඩා මට දැනුණේ අවාසනාවන්තකම නිසා අසරණ වූවෙකුට දැනෙන ව්‍යාකූල මානසික පීඩනයකි. මම ඔහුට පිළිතුරු නොදුන්නෙමි.

'ලීලාගේ ප්‍රශ්නෙ ඉවරයි නේද?'

'ඉවර වෙන්න එතන ප්‍රශ්නයක් තිබුණේ නෑ.'

'නේත්‍රා ඒ ගැන මාවත් සැක කළා...?'

'බඩට ළමයෙක් එන්නෙ පිරිමියෙක් හින්ද කියල මං දන්න හින්ද?'

'මේ ගෙදර ඉන්න එකම පිරිමියා මම නෙමෙයි...?'

'වලාත්තකමේ යන එකම පිරිමියා මං අඳුනනවා.'

'පිරිමින්ට දරුවෝ හම්බු වෙන්නෙ නැති හින්දම හොඳයි.'

දූල්ලැව එසේ කියා වියරු අසික්කිතකමකින් සිනා සුණේ ය.

'මේ ලෝකේ හුඟක් ගෑණු කට අරින්නෙ නැති හින්ද හොඳයි.'

මම ප්‍රතිප්‍රහාර දුනිමි.

'නේත්‍රා කට ඇරල ලෝකෙට මොනව කිව්වත් ඒ දේවල් ලෝකෙට යගන ඉස්සෙල්ල නේත්‍රා ගැන ලෝකේ එවුන් හුඟ දේවල් දැනගෙන හිටියා.'

'ඕකට කියන්නෙ ජඩකම, පාහරකම.'

මම පුතා වඩා ගත්තෙමි.

'ගෑණුන්ගේ තියෙන ජඩකමට, පාහරකමට කියන වචනෙ මොකද නේත්‍රා..?'

දූල්ලැව හුරතල් ලෙස තොදොල් බසින් විමසුවේ ය. මම පුතුගේ හිස මගේ උරහිසට බර කොට ගත්තෙමි. දූල්ලැව මගහැර මට ඉක්මනින් විශ්ව සොයා යන්නට ඕනෑ වි ය.

'ඒත් නේත්‍රාගේ හුඟක් ප්‍රශ්නවලට උත්තර තියෙනව නේද?'



මං නිහඬව ම සිටියෙමි. එහෙත් ඔහුගේ වධ දීම කෙළවර වූයේ නැත.

'නේත්‍රාට බයයිද මං විශ්වට කියයි කියල?'

එ විට ම මම වෙව්ලන්නට වීමි. වෙව්ලමින් කතා කළෙමි.

'බෙල්ල හිරවෙන්න මිරිකල හුස්ම හිරවුණාම අහනව රිදුණද කියල? බඩගින්නෙ තියල අහනව බඩගිනි නේද කියලා. අත් දෙකයි කකුල් දෙකයි බැඳල කට වහල දූෂණය කරල කියනව අපරාදෙ නේද තරුණකම කියලා. කියන්ඩ පුළුවන් ඕන එකෙක් එක්ක කියනවා මං තමුසෙත් එක්ක එකට හිටිය කියලා. හැබැයි ඔය සෙල්ලම් නවම ඉවර නැති විත්තිය මතක තියා ගන්නවා.'

දූල්ලැව නැවතත් සිනා සුණේ ය. හිමි හිමින් අතේ තියපොතු අගින් හපන්නට වි ය. මම පුතා ද සමඟ විශ්වගේ කාමරයට ගියෙමි. මා බලාපොරොත්තුව සිටියාක් මෙන් ඔහු මා දුටු සැණින් පුටුවෙන් නැඟිට්ටේ ය.

'වාඩිවෙන්න නේත්‍රා.'

'ආගන්තුකයෙකුට වගේ කතා කරන්න එපා විශ්ව.'

මම ඔහු අසළින් වාඩි වීමි. පුතා බිමින් තබා ඔහුගේ හිස විශ්ව දෙසට නැඹුරු කොට මම මෙසේ කීවෙමි.

'මගේ රත්තරං පුතේ.... තාත්තාට වඳින්න.'

මගේ කීම විශ්වාස කළාක් මෙන් මගේ අණට නොකීකරු වීම නුසුදුසු යැයි සිතුවාක් මෙන් සැණෙකින් ඉසිවර විශ්වගේ දෙපා මුල වැඳ වැටුණෙ ය.

'ඔයාගේ දරුවා විශ්ව.'

මම හැඬුම්බරව කීවෙමි.

'මං මොකවත් දන්නේ නෑ නේත්‍රා.'

ඔහු ඉසිවරගේ හිස අත ගාමින් කීවේ ය.

'දන්නේ නෑ නෙමෙයි. ඔයා විශ්වාස කරන්නෙ නෑ.'

'මට මොකවත් තේරෙන්නේ නෑ.'

For E-Pusthakalaya

නොදරුවෙක් වෙන්න එපා.... අපි ආයෙමත් අමාරුවේ වැටෙයි.'

මට හුඟක් ආදරේ ඕන තේත්‍රා...

'මං දැනගෙන හිටියේ නෑ විශ්ව.

'මං නවම අසනීපෙන්ද?

'ඔයාට ලෙඩදුක් නෑ.'

'මගේ හිතටත් දුකක් තියනවා' යැයි කියන්නට සිතුණ ද මම නොකියා සිටියෙමි.

අපට දිගු දුරක් යන්නට ඉඩ නොලැබිණි. දුල්ලෑව නැවතත් කාමරයට පිවිසිණි.

'තේත්‍රා උඩට යන්න. පුතා එක්ක අනවශ්‍ය තැන්වලට එන්න එපා...'

එ වර ඔහු අණ කළේ ය. මම අණට කීකරු වීමි. වරක් ජීවිතය වරද්දා ගත් විට එසේ වීමට සිදු වේ. මම දුල්ලෑව සමීපයට ගොස් ඔහුගේ මුහුණට මුහුණ සමීප කොට ඔරවා ප්‍රශ්න කළෙමි.

'උඩට ගියාම විතරක් ඇද්ද?'

මම පුතා නැවතත් කිහිලි ගත්වා ගතිමි. විශ්ව මා පසු පස වැටුණේ ය.

'තේත්‍රා... යන්න එපා. තේත්‍රා.... යන්න එපා...'

ඔහු හැඩුම්බරව කිවේ ය. දුල්ලෑව ඔහුට කඩා පැන්නේ ය.

'ඇයි උඹේ ගෑණිද යන්න එපා කියන්න? එක ගෑණියෙක්ගෙ බඩට දරුවෙක් දුන්න මදිවට. උඹට පුතායි අමාරු නම් මං උඹව පිස්සන් කොටුවට ගිහිං දානවා.'

දුල්ලෑව තර්ජනය කළේ ය. විශ්ව අසරණ විය. ඔහු අසරණ ලෙස මගෙන් ප්‍රශ්න කළේ ය.

'මට මගේ ජීවිතේ ගැන තීරණයක් ගන්න අයිතියක් නැද්ද? මට මං කැමති විදිහට ඉන්න අයිතියක් නැද්ද? මාව ජාතක කළේ මොකටද යකෝ?'

උඹ හැදුණේ මගේ අවාසනාවට.'



දුල්ලෑව ගෙමින් මිමිණුවේ ය.

ඉසිවර හොඳටෝ ම බිය ගෙන සිටිණි. මම මට ත් වඩා දරුවා ගැන දුක සිතීමි. ඔහුට මේ කිසිවක අගක් මුලක් තේරෙන්නේ නැත.. ඉසිවර දැඩිව මගේ ගෙල බදා ගෙන සිටියේ ය. ඔහුගේ පපුවේ වැඩි වන හෘද ස්පන්දනයේ රිද්මය මට දැනේ. මම ඉක්මනින් ම කාමරයට වී දොර වසා ගත්තෙමි. පුදුම තරමේ [illegible]ක් සහ කනස්සල්ලකිනි.

'ඇයි අම්මා.'

ඔහුට තේරෙන හැකි පමණින් මට සහාය වීමට මෙන් මගේ දුක, මගේ ප්‍රශ්න තේරුම් ගැනීමට මෙන් ඉසිවර දෑස් උඩප්පා ප්‍රශ්න කරයි.

'පුතාගේ අම්මා හරිම පව්කාරයි පුතේ...'

මම මගේ කටට ආ වදන් ඔහේ පා කර හැරියෙමි. මම දරුවාගේ ප්‍රශ්න කිරීම් හමුවේ අසීරු නිහඬතාවක් කෙටි කලක් තුළ ගෙවා දැමීමි. කල්පනා කළෙමි. තැවීම, සුසුම් හෙළීම් කිසිවකින් මට සැනසුම ළඟා නොවේ. අවසානයේ දී සිත ඉතා නපුරු අඳුරු සීමාවක හිර වී නතර වේ. ඉතා ම බියකරු ලෙස, සියදිවි නසා ගැනීමට මට සිතේ. එහෙත් එයින් මේ සියලු ගැටලු විසඳේ ද? මට දුල්ලෑව වෙතින් බොහෝ මානුෂික උදව් උපකාර ලැබී තිබේ. එහෙත් ඒ සියල්ල යටින් අමානුෂික ගුප්ත බවක් ද ඔහු කෙරෙන් පළ වේ. ගැහැණියක දඩමීමා කර ගන්නවා හැර ගැහැණියකට සැබෑ ලෙස ආදරය කිරීමට පිරිමින් නොදන්නා හැටි. ගැහැණියක පව්කාර යැයි කියන්නේ ඒ ආදරය පිරිමින්ට නොතේරෙන නිසා ය. ආදරය යැයි කියන්නේ සිත අවබෝධ කොට ගැනීමට නොවේ ද?

මට විශ්ව පිළිබඳ ඇති සියලු ආදරණීය හැඟීම් නැවත උද්දීප්තියට ගෙන ඒමට ඕනෑ කර තිබේ. ඔහු සමඟ සැනසීමට මට ඕනෑ වී තිබේ.

ඔහුගෙන් ආදරය බිඳක් ඉල්ලන්ට එයින් ඔහුගේ සිත [illegible] තෙමා ලන්නට මට ඕනෑ වී තිබේ. උණුසුම් ම උණුසම් හාදුවකින් විශ්වට ජීවිතය දිය හැකි යැයි මට සිතේ.

පූර්ව ආත්මයක කළ මහා පාප කර්මයක් මෙන් මගේ ජීවිතයේ තීරණාත්මක බලවේග සියල්ල දුල්ලෑවට මා කේන්ද්‍රගතව ප්‍රසාරණය වන විට මට මහත් බියක් දැනේ. ඔහුට නතු වූයේ කුමන පාපයකට දැයි මම සිතන්නට වීමි.

For E-Pusthakalaya

# 24

වඩාත් තීරණාත්මක රාත්‍රියක් උදා වෙමින් තිබිණි. කාමරයට කොයි මොහොතක හෝ දුල්ලෑව වදිති යි මම සිතා සිටියෙමි. ඒ විට මා ගත යුතු තීරණය ඇතැම් විට ජීවිතය ම අද ම පුපුරා යන මහා කාලබෝම්බයක් වීමට බැරි නැත. කාමරයට විශ්ව පැමිණීමට ත් බැරි නැත. ඒ [illegible] ම දුල්ලෑව ත් පැමිණිය හොත් මා කුමක් කරන්න ද?

මම අවාසනාවන්ත ලෙස පිරිමින් දෙදෙනෙකුගේ බිරිඳක බවට පත් වී සිටියෙමි. සමහරුනට අසම්මතය ඉතා සුමිහිරි මතක වස්තුවක් වන බව මම දනිමි. මම අසම්මතයේ දී ඉතා ම නිගරු අවාසනාවන්තියක් වීමි.

[illegible] යය හරි ද වැරදි ද මම නොදනිමි. එහෙත් ස්ථිර ලෙස ම මට ඉතිහාසය වෙනුවෙන් වන්දි ගෙවීමට සිදු වනු ඇත. මා සූදානම් විය යුත්තේ කාට වන්දි ගෙවන්නට ද? යාන්තමට කහපාට පඩුපැහැ එළියට මට ඉසිවරගේ මුහුණ පෙනේ.

එළිය බෙහෙවින් මළානික ය. ඉසිවර ද මළානික වූ සෙයකි. මම ඔහුට කවා පොවා ඇඟ සෝදා යහනට දැමීමි. යන්තම් දෑස අඩවන් කොට එක එල්ලේ බිත්තිය දෙස ශූන්‍යව බලා සිටි ඔහුට සැණෙකින් නින්ද ගියේ ය. මම ඔහුට නොදැනෙන්නට ඔහුගේ මුහුණ සිප ගත්තෙමි. විශ්වට දීර්ඝ ලිපියක් ලිවිය යුතු යැයි මම තීරණය කළෙමි.

ආදරණීය මගේම විශ්ව.,

ඔයාගේ බිරිඳ වෙච්ච මට, මේ වහල යටදීම ඔයාට ලිපියක් ලියන්නට වීම මම වාසනාවක් කියලා හිතන්නෙ නෑ. මගේ පැත්තෙන් ගත්තම මේක අවාසනාවක්. ඒත් ඔයාට කතා කරන්නට, මගේ හිතේ



තියෙන දේවල් කියන්නට දැන් දැන් අවස්ථාවක් නොලැබෙන පාටයි. මම මහා අසරණ ගැහැණියක් බව ඇත්ත. ඔයා මට ආදරය කළෙත් මගේ අසරණ ජීවිතය දිහා දැක දැකම නේද? ඔයාගේම දරුවෙක් ඉන්න අම්මා කෙනෙක් වෙච්ච මට ඔයාගේම ගෙදරදී මෙහෙම ඉරණමකට මුහුණ දෙන්න සිද්ධ වීම මම පූර්ව ආත්මයක කළ පාප කර්මයක් වෙන්න ඇති. මට මගේ ජීවිතය ගැන හිතන්න දැන් පුළුවන් කමක් නෑ. මට දැන් හැමදේටම වැඩිය මගේ පුතාගේ – ඔයාගේ පුතාගේ අනාගතය ගැන හිතන්න වෙලා. දැන් දැන් දරුවාත් තේරෙන වයසට එනවා. සමහරවිට ඔයාගෙත් ඔයාගේ තාත්තාගෙත් හැසිරීම මේ දරුවා පිස්සෙක් කරයි. අපිට අපේ දරුවාට මානසික රෝගියෙක් කරන්න පුළුවන්ද? අපිට දරුව පිස්සෙක් කරන්න පුළුවන්ද? හැමදාම මේ සෙල්ලම කරන්න පුළුවන්ද?

මට වෙලාවකට මේ ගෙදර දීම සියදිවි නසාගන්න හිතෙනවා. දරුවත් එක්කම බියකරු විදිහට මැරෙන්න හිතෙනවා. මම තවත් කුමන අරමුණකට ජීවත් වෙන්නද? මිනිහෙකුට අරමුණක් නැතිව ජීවත් වෙන්න පුළුවන්ද මං දන්නේ නෑ. ඒත් විශ්ව ඔයා දන්නවාද ගැහැණියකට අරමුණක් නැතිව ජීවත්වෙන්ඩ අමාරු විත්තිය. විශේෂයෙන්ම දරුවකුත් ඉන්න අම්මා කෙනෙකුට. ඔයාට තේරෙනවාද විශ්ව. මං දැන් ඉස්සර නේත්‍රා නෙමෙයි. ඔයාගේ බිරිඳ. ඔයාගේම දරුවගේ අම්මා. අපේ ජීවිත දිහා නරක විදිහට බලන්න එපා. ඔයා පිරිමියෙක් වෙන්න... පිරිමියෙක් වගේ හිතන්න. තාත්තා කෙනෙක් වෙන්න. තාත්ත කෙනෙක් වගේ හිතන්න. ඔයා අසරණ වෙද්දි, ඔයා දුකින් ඉද්දී, ඔයාට අරමුණක් නැති වෙද්දී අපට තීරණයක් කොයින්ද? අපට සතුටක් කොයින්ද? අපේ දරුවට ජීවිතයක් කොයින්ද?

මං වගේම, අපේ දරුව වගේම, ඔයත් වාසනාවන්ත විත්තිය ඇත්ත. දරුවා මගේ කුසේ ඉන්න කාලේ මගේ හැඟීම් ඔයාට දැනුණේ නෑ. එකම එක දවසක් හැර ඔයා මගෙත් එක්ක පිරිමියෙක් විදිහට හැසිරිලා නෑ. බිරිඳකගේ ඕනෑ එපාකම් ඔයා දන්නේ නෑ. ඔයාට අවබෝධයක් නෑ.

දරුවා ලැබෙන්න ඉද්දී මගේ සිතුවිලිවත් ඔයාට තේරෙන්නේ නෑ. පුතෙක් ලැබුණා කියලා තාත්තා කෙනෙක් ලෝකයේ වැඩියෙන්ම සතුටු වන දවසෙ ඔයා නිකම්ම නිකං හිස් අහස දිහා බලාගෙන හිටියා. පුංචිම

පුංචි කිලිදෙකුගේ කිරි සුවඳට ඉව අල්ලන්න ඔයාට පුළුවන්කමක් තිබුණේ නෑ. දරුවා කිරි සුවඳ ඉහිරවද්දී ඔයාගේ කාමයා මත්පැන් බිව්වා. දරුවා කුරුලු වචන එකදෙක හළද්දී ඔයා දරුවාට රැවුව - ගෙරෙව්වා. දරුවා මගේ උකුළෙ සැනසීමෙන් ඉද්දී ඔයා මට දවසක් තිරිසනෙකුට වගේ පහර දුන්නා. ඒ පුංචි දරුවාගේ හිත මේ හැම දේකින්ම ඔද්දල් වෙලා. කවුද විශ්ව අපේ දරුවාගේ අවාසනාවන්ත ඉරණමට වග කියන්නෙ?

ජීවිතය කොයි තරම් සුන්දර වෙන්න තිබුණද? කොයි තරම් ලස්සන කැදැල්ලක් අපිට උරුම වෙන්න තිබුණද? මම කෙල්ලක් කාලේ ඉඳල අද වෙනකම්ම ප්‍රශ්නත් එක්ක ජීවත් වෙනවා. තනියම ඉන්න හැම මොහොතකම මං කොයිතරම් කඳුළු හලන්න ඇද්ද? ඔයාගෙ අසනීපෙ ගැන හිතල කොයි තරම් නම් හිත රිදවගන්න ඇද්ද? ඔයා දන්නවද? මට ඔයාගෙන් අඩුම ගානේ සහනයක් හිතෙන බැල්මක්වත් ලැබුණෙ නෑ.... විශ්ව.

මේ හැම දෙයක්ම වෙද්දී ඔයාගේ තාත්තා ඉව අල්ල අල්ල හිටිය.

(මට බොහෝ දේ ලියන්නට සිතේ. එහෙත් මම ටික වේලාවක් කල්පනා කොට මගේ අපිරිසිදු පැවැත්ම පිළිබඳ කිසිවක් නොලීමට ප්‍රවේශම් වීමි.)

මම ඔයා ළඟට එනවා. ඔයා අපිව ආරක්ෂා කරන්න. මෙහෙ ඉන්න බැරිනම් පුංචි ගෙයක් අරගෙන හරි අපි කොහෙට හරි යමු. ඔයා තීරණයක් ගන්න. නැත්නම් මම දරුවා ගැන හිතලා තීරණයක් ගන්නවා. මම අනුන් නිසා දුක් වින්ද කාලය අවසාන කරන්න මට සිද්ධ වෙයි විශ්ව.

මං,

ඔයාගේ,

ආදරණීය බිරිඳ,

නේත්‍රා.

මම ලිපිය රැගෙන කාමරයෙන් පිට වීමි. තරප්පුව බැස යන විට දුල්ලැව සාලයේ සිටියේ ය.

'කොහාටද?'



ඔහු ප්‍රශ්න කළේ ය.

'විශ්වගේ කාමරයට.'

'දවාලට මගේ කාමරේ - රෑට විශ්වගේ කාමරේ තමුසෙ තවද්ද ඕක නවත්තන්නෙ?'

'මගේ මිනිහගේ කාමරයට යන්න මම තමුසෙගෙන් අවසර ගන්න ඕන නෑ.'

'නේත්‍රා - උඹේ සෙල්ලම් බලපු කාලේ ඉවරයි. දැන් උඹලට බලන්න වෙන්න මගේ සෙල්ලං.'

එසේ කියමින් ඔහු නැඟී සිටියේ ය. සැණෙකින් මගේ කට තද කොට වැසුවේ ය.මට දැහලීමට කෑ ගැසීමට හැකියාවක් තිබිණ. එහෙත් මම නිහඬව සිටියෙමි. විශ්වට මේ බව දැනුණොත් විනාශය දැන් ම සිදු වනු ඇත.

'පළයං මගේ කාමරයට.'

දුල්ලැව ඔහුගේ කාමරය දෙසට මා තල්ලු කළේ ය. මම ඔහුගේ කාමරයට ගියෙමි...

ඔහු දොර වසා දැම්මේ ය.

බලහත්කාරය පිළිබඳ ගැහැණියක ජීවිතයේ මුහුණ දිය හැකි පිළුණු අත්දැකීමකට මම ද සූදානම් වීමි. දුල්ලැව වත් මේ කාමරය වත් මට අලුත් ආරම්භයක් නොවේ. මට දැන් ඕනෑ වී ඇත්තේ මේ පිළුණු අතීතය වල දැමීමට යි. එහෙත් පිරිමියෙකුට මෙන් ගැහැණියකට ජීවිතයේ අතීත මතක පැල්ලම් පහසුවෙන් පවිත්‍ර කළ නොහැකි ය.

'අන්තිම වතාවටත් මාව මරාගෙන කනවා'

මම වියරු ලෙස කෙඳිරි ගෑවෙමි. ආත්මය නිරාවරණය කළ විවෘත ගැහැණියක මෙන් දුල්ලැවගේ යහනේ වාඩි වීමි. ඔහු දොරට හේත්තු වී සිටියේ ය. ඔහුට අවැසිව ඇත්තේ කුමක් දැයි ඔහු වෙතින් පිළිඹිඹු නොවේ. මම දෙතිස් වධයට ම සූදානම් වීමි. දැස විලිස්සා රකුසු වෙස් ගෙන උමතු ලෙස ඔහුට කතා කළෙමි.

For E Pustakalaya

මගේ පිරි මාංසෙම අරගෙන හරි මාව නිදහස් කරපං. මට මගෙ ජීවිතය දියං. මං සිඳ වෙයි මට මගේ ජීවිතය දියං.

ඔහුට හදිසියක් තිබුණේ නැත ඔහු කතා කළේ ගුප්ත මිනිසෙකුගේ තීරණාත්මක හඬකිනි.

'ඒක මං උකසට නෙමෙයි ගත්තෙ. බද්දට. දැන් මට ඕන සින්නක්කරම උඹව තියාගන්න.'

'මටයි විශ්වටයි මගේ දරුවටයි නිදහසේ ඉන්න දෙන්න. හොඳ නාත්තා කෙනෙක් වගේ අපි දිහා බලලා සතුටු වෙන්න.'

මම ඇඳ වියලට හිස ඔසවා ගතිමි. ඔහු තීරණාත්මක ය.

'බෑ.'

'තිරිසනා'

මම නෑ ගැසිමි.

'මං මය බිරිල්ලට ආස නෑ. ආදරෙන් කතා කරපන්. මං ආස පාදේ ශරීරය පුරාම තියෙන නේත්‍රාට'

'තමුසෙට පිස්සු.'

මම අහක බලා ගෙන කීවෙමි.

'මගේ පිස්සුව හොඳ කරන්න නේත්‍රා.'

ඔහු කොදොල් ලෙස මා අසළට විත් තෙපළී ය.

මගේ අත ස්පර්ශ කරන විට විශ්වට මා ලියූ ලියුම ඔහුට හසු වී ය. වියරු ලෙස එහි මුල් වචන හඬ පිට නොවන්නට කියවූ ඔහු එය තැ තැ කොට ඉරා දැම්මේ ය. පසුව එය ගුලියක් කොට මගේ මුහුණට දමා ගැසුවේ ය. මම දැස පියා ගතිමි.

'උඹට මිනිස්සු දෙන්නෙක් ඕන නෑ. නේත්‍රා.'

'මට විශ්ව හිටියම ඇති.'

'ඔයාට ඇති. බැරි මට ආදරය කරන්න. මට දැන් ශයාව නැතිව බෑ. ඒකට ඉඩ සලසල දුන්නෙ ඔයාමයි. දැන් මාව ප්‍රතික්ෂේප කරන්න එපා. මං වියරු වෙයි. මට දැන් ඕන දෙයක් පරිත්‍යාග කරන්න පුළුවන්



මගෙත් එක්ක අවුරුදු තිහක් ජීවත් වෙච්ච ගෑණි ගැනවත් මං දැන් හිතන්නේ නෑ. නේත්‍රා දන්නව නේද විශ්ව දුර්වල මිනිහෙක්? ඌ පිස්සෙක්

'ඒක සුන්දර පිස්සුවක්.'

'මොකක්ද මගේ තියෙන අඩුව?'

'තමුසෙ මෝඩයෙක්, කෑදරයෙක්, කුපාඩියෙක්, තිරිසනෙක්'

'එච්චරද?'

'නෑ අමනුස්සයෙක්.'

'නේත්‍රා උඹම මට බලකරනවා උඹෙන් පළිගනිං කියලා.'

'මගෙත් හිත කියනවා 'නේත්‍රා... උඹ ඉස්සර වෙයං' කියලා....'

'මගෙන් පළිගන්න?'

'ඔව්'

'මං පළිගන්නෙ උඹෙන් නෙමෙයි. මං අදම විශ්ව ගිහිං දානව පිස්සන් කොටුවට...'

'බබෙක් වගේ වඩාගෙනද?'

'නෑ උගෙ අතපය කඩල'

ඔහු තීරණාත්මක ලෙස කීවේ ය. මම සැණින් නැගී ගතිමි. දුල්ලැව විශ්වට හානියක් කරන්නට බැරි නැත. මේ පව්කරයා ඒ වැනි දෙයකට වුව ත් පෙළෙඹීම පුදුමයක් නොවේ. මම නිහඬව මුනිවත රැකිමි. ඉන් එහාට සිදු වුණු දෙයක් නැත. මම යහනින් නැගී සිටියෙමි. දොර දෙසට ගියෙමි. එය තීරණාත්මක පියවර කීපයකි. දුල්ලැව මා පසු පසින් වැටුණේ ය. ඔහු දොර ආසන්නයේ දී ම මගේ උරහිසට අත තැබුවේ ය. පිළිකුල මා හිරි වැට්ටුවේ ය.

'නේත්‍රා'

'ගන්න අත අහකට.'

මෙම සෙමින් මුමුණා රළු කීවෙමි. ඔහු අත අහකට ගත්තේ නැත.

'ගනින් යකෝ අත පැත්තකට

For E-Pushpakatalaya

මම මහ හඬින් කාමරය දෙදරුම් කන්නට කෑ ගැසීමි. ඔහු අත ... ඒ අත ගැහුණා සැයි මට දැනුණි.. මම කාමරයෙන් පිට වෙ... යතුර ඩැහැ ... කාමරයෙන් නික්මුණු සැණින් එළි... ... දොර අගුළු දැමීමි.

නේත්‍රා..... නේත්‍රා...... නේත්‍රා....

ඔහු කාමරය ඇතුළේ සිට කතා කළේ ය. මම කාමරය එළියේ සිට ඔහුට තර්ජනය කළෙමි.

'මම කියනකල් කාමරය ඇතුළේ ඉන්නවා. දොර කඩන්න හැදුවොත් අත කපනවා. තේරුණාද? දැගලුවොත් පොලිසියට කියනවා බලහත්කාරකම් කරන්න ආවා කියලා. බඩගිනි නම් තව ටිකකින් තේ එකක් එළියෙ ජනේලෙන් දෙන්නම්. විශ්ව අංගොඩ දාන්න ඉස්සර තමුසෙ හිරබත් කාල බලනවා. කම්මැලි වගේ නම් ටිකක් ඇලවෙලා ඉන්නවා.'

මම අන්තිම වචන ටික තරමක උස් හඬින් කීවෙමි.

මම සැණෙකින් විශ්ව ඉන්නා කාමරයට ගියෙමි. විශ්වගේ කාමරය ඉතා ම පිළිවෙළට සකසා තිබිණි. එහෙත් ඔහු කාමරයේ සිටියේ නැත. මම තවත් මොහොතක් කාමරය දෙස බලා සිටියෙමි. ඇඳ ඇතිරිල්ල පවා එකදු රැල්ලක් වත් නොමැති ලෙස සකසා තිබිණ. මම කාමරයෙන් මේ පිට බලා කුස්සියට ගියෙමි. එහි ද ඔහු නැත. සාලය ත් මිදුල ත් පිරික්සා උඩු මහලට ගියෙමි. මම සැණෙකින් දරුවා සිහි වී කාමරයට දිව්වෙමි.

විශ්ව මගේ ඇඳේ වාඩි වී සිටියේ ය. හෙමි හෙමින් සිරුවට ඉසිවරගේ හිස පිරි මදියි. මගේ පපුව උණුසුමකින් හෝස් ගා පත්තු වී ය. විශ්ව ඉතා ම පිළිවෙළට සරම සහ කමිසය ඇඳ හිස පීරා අලුත් පෙම්වතෙකු මෙන් සංයමයෙන් සිටියේ ය. තවත් මොහොතක් ඔහු දෙස බලා සිටීමේ දොළදුකක් උපන්න ත් මම ඔහු දෙසට පියවර තැබීමි. දරුවාගේ හිස අත ගාමින් ම ඔහු දෑස මදෙසට යොමා සංයමයෙන්, ශික්ෂණයෙන්, අවංකභාවයෙන් යුතු බැල්මක් හෙළී ය.

'මේ දරුවා මගේද?'

ඔහු ලජ්ජාශීලි ලෙස විමසුවේ ය. මම යෞවනියකගෙන් කුමරි බඹසර විමසූ කලෙක මෙන් පැකිළී ලැජ්ජාවට පත් වීමි. අසරණ වීමි

ඔව් යනුවෙන් කෙටියෙන් පිළිතුරු දීමට මට පුළුවන්කම තිබිණි. එහෙත් වචන දහසකට වත් මගේ හැඟීම් ගොනු කළ නොහැකි ය. මවකගේ හැඟුම පිට කිරීමට නොහැකි තරමට ම භාෂාව දුප්පත් ය. මම මවකගේ ත් බිරිඳකගේ ත් උණුසුම් ම වචන ආදරයෙන් තෙපළීමි.

'අපි දෙන්නාගේම.'

මම යහනේ අනෙක් කෙළවරේ අලුත් පෙම්වතියක මෙන් වාඩි වීමි

'මට පුතාව වඩාගන්නත් ආසයි. මූණ ඉඹින්නත් ආසයි.'

අවසරයක් ලැබේ ද නොලැබේ ද යන සැකයකින් මෙන් ඔහු බිම බලා ගෙන මගෙන් ප්‍රශ්න කළේ ය. මම කඩිනමින් ඔහුගේ ඉල්ලීම ඉටු කිරීමට වෙහෙසීමි. ඒ විට ත් ඔහු ඉසිවරගේ හිස අත ගාමින් සිටියේ ය. මම පුතාව හෙමිහිට මගේ උකුළට ගත්තෙමි.

'ඇහැරිල අඬයිද දන්නේ නෑ.'

සතුට ඉහිරුම් හැතිව විශ්ව කීවේ ය. මම අනෙක් අතින් කොට්ටය ගෙන එය විශ්වගේ උකුළෙහි තබා පුතාව ඔහුට දුනිමි. දෙවරක් පෙරළී ඇහැමැලි නඩා ඉසිවර විශ්වගේ පපුවට තුරුල් වී ය. ලැජ්ජාව, බය මිශ්‍ර වී සතුට ඉතිරී යන කලෙක මෙන් විශ්වගේ මුහුණ රතු වී ය. ඔහු හෙමි හෙමින් හිස පහත් කොට ඉසිවරගේ නළල් තලය සිප ගත්තේ ය. මගේ නෙත් කඳුළින් පෙත් වනු මට දැනිණ.

'සමහර විට දැන් ඔඩොක්කුවේ චූ දායි'

මම සිනා සෙමින් කීවෙමි.

'තාම එළියට යන්න බැරිද?'

'දවාලට නම් කියල යනවා. රෑට එයා දන්නෙත් නෑ. එයාට චූ යනවා කියල.'

මම සොම්නස මුසු හුරතල් වදනින් කීවෙමි. සතුට කෙ තරම් මිහිරි අත් විඳීමක් දැයි මට දැනිණ. සහජාත දරුවා තාත්තාගේ උකුළෙහි නිදන විට මවකගේ හැඟීම් කෙ තරම් උතුම් පවිත්‍ර සීමාවක උත්කෘෂ්ට වේ ද?

පහත මාලයේ දුල්ලැවගේ කාමරයේ දොරට ගසන හඬ ත්, පුටු මේස පෙරළන හඬ ත් ටිකෙන් ටික තීව්‍ර වෙමින් ළඟ ළඟ ම ඇසෙන්නාසේ මෙන් දරුණු වී ය. මම ගත එක තැන තබා සිත ත් ඇස ත් ඒ දෙස

[illegible] නොතේරෙන්නට දුල්ලැව වෙතට ගොස් නැවත [illegible] කළෙමි. තර්ජනය කොට පැමිණියේ [illegible]

'මම පහළට ගිහිල්ලා බලලා එන්නම්. තාත්තාගේ කාමරේ පැත්තෙන් තමයි සද්දෙ එන්නේ.'

මම යහනින් නැගිටින ගමන් කීවෙමි. විශ්ව සැණෙකින් මදෙස බලා ප්‍රශ්න කළේ ය.

'ඔයා වෙනදත් ඔහොම රෑට කාමරෙන් පිටවෙලා තාත්තගේ කාමරේට යනවාද?'

'නෑ විශ්ව නෑ ඇයි එහෙම ඇහුවෙ...?'

'ඔයා ගියාම පුතා තනියම නිසා. ඇඳෙන් එහෙම වැටුණොත්. එහෙයි...'

ඔහු සංවරව කීවේ ය.

දුල්ලැව මොනවා කරන්නේ දැයි බැලීමට මා ඔහුගේ කාමරයට යාමට සූදානම් වූ විට විශ්ව අසරණ වූ සැටි දැකීමෙන් මා තුළ ඔහු කෙරෙහි උපන්නේ වචනයෙන් කිව නොහැකි තරමේ අනුකම්පාවකි.

මගේ දෑසින් අනෝරයක් නැතිව කඳුළු කඩා හැලෙන විට විශ්ව [illegible] තේරුම් ගත නොහැකිව මෙන් කළබල වූයේ ය. ඔහු කුමක් කරන්න දෝ වැනි හැඟීමකින් අවට සිසාරා දෙනෙත සැරි සරවන්නට වි ය. [illegible] වරදක් වූවාක් මෙන් මදෙසට ආයාචනාත්මක බැල්මක් හෙළී ය.

'මට සමාවෙන්න තේජා.'

ඔහු පළමුව කී ය.

'මං තවම තේරෙන්නේ නෑ මං කොහොමද හැසිරෙන්න ඕන කියලා. ඔයාගේ හිත රිදුණා නේද?'

ඔහු දෙවනුව කී ය.

'ඔයා පුතා එක්ක ඉන්න. මං මගේ කාමරයට යන්නම්. මං වැරැද්දක් තමයි කළේ. මට හිතාගන්න බෑ, මං මොනවද කරන්න ඕන කියලා. ඔයාට කරදරයක් නැති විදියට මං ඉන්නම්. මං තරහ හිතකින් නෙමෙයි කාමරයට ආවෙ. මං දන්නව මේ දරුවා මගේ කියලා. මං



දන්නව ඔයා මගේ තේජා කියල. ඔයා ඉතාම පිරිසිදු විදියට ජීවත් වුණා කියලත් මං දන්නවා. ලීලා මට කිව්ව දේවල් ඔක්කොම ඇත්ත. හෙට උදේම ඔයා මාත් එක්ක කතා කරලා අපි අපේ ප්‍රශ්න විසඳගමු. මං දැන් යන්නම්. ඔයාගේ හිත රිදිලා තියෙන්නේ.'

ඔහු නෙවනුව නැඟී සිටින්නට සූදානම් වි ය.

'එපා විශ්ව. යන්න එපා. අපේ කාමරේ අපි ඉඳිමු. මං බැලුවෙ තාත්තාගේ කාමරේ සද්ද ඇහෙන නිසා. කරදරයක්ද දන්නෙ නෑ.'

'ඔයා ගිහිල්ල බලලා එන්න.'

'නෑ අපි දෙන්නම යමු.'

මම කීවෙමි.

පහත මාලයේ දුල්ලැවගේ කාමරයට ගිය හොත් අත් විඳින්නට සිදු වන ඉරණම පිළිබඳ මගේ සිතට විවිධ විකාර මනස් රූප පෙනෙන්නට වි ය. ඔහු පහර දීමට පුළුවන. ඔහු අශීලාචාර ඇවතුම් පැවතුම් හෙළි කිරීමට පුළුවන. නින්දිත ලෙස බැණ වැදීමට ත් පුළුවන.

දීර්ඝ නොතිවෙන කෝපයක් මගේ ලේ මස් ඇට නහර රිදවමින් කකියමින් මතු වන්නට වි ය. මම සුසුමක් හෙළා විශ්ව සමීපයට වීමි. දරුවා ගෙන යහනින් නැඟුවෙමි. මට සන්සුන් වීමට ඕනෑ වී තිබේ. මා ඉදිරියේ ඉන්නා ආදරණීය විශ්ව දැසට උරා ගන්නට සිරුරට ස්පර්ශ කර ගන්නට ඕනෑ වී තිබේ. සහතිකයි, ඒක අසික්ෂිත ආසාවක් නම් නෙමෙයි....

මට මගේ හිතට ඔහුව සමීප කොට ගෙන ඒකාත්මික වන්නට, එහි නිරාමිස සුවය අත් විඳින්නට ඕනෑ වී තිබේ. සියලුම අතීත වගවළ ස් සැමරුම් පෙඳ පැල්ලම් මෙන් මකා දැමීම පහසු නොවේ. මට සියලු නිරශ්විත හැඟීම් මුලිනුපුටා දමා නැවතත් ආදරයේ සංස්පර්ශයේ ඇති ගැඹුරු ආත්මීය හැඟීම මගේ ජීවිතයට අවශෝෂණය කර ගන්නට ඕනෑ වී තිබේ..

පහත මාලයේ ඝෝෂාව කළකෝලාහලය මගේ සිතේ ධ්‍යානය බිඳින මොහොතක් මොහොතක් පාසා මම තිගැස්සිමි. හදවතේ ආශ්වාස ප්‍රශ්වාස වේගයේ රිද්මය මට බොහෝ විට පාලනය කර ගත නොහැකි ප්‍රවේගයකින් ඉහළ නගියි. මම නැවතත් සුසුමක් හෙළා විශ්ව දෙසට ළංව ඔහුගේ ඇඟිලි තුඩකින් අල්ලා ගතිමි.

For E-Pusthakalaya

'විශ්ව...'

මම දෙතොල සෙලවීමි. වියළී දෙතොලතර අකුරු සැඟවී හරියට ම එය උච්චාරණය වූයේ නැත. මම කිසි යම් මානසික පීඩාවකින් සිටින බව විශ්වට ඒත්තු යතැ යි බිය වීමි.

මා මෙසේ හැසිරීම විශ්ව නැවතත් රෝගී කිරීමට හේතුකාරක වෙතැ යි වරෙක සිතිමි. මම විශ්වගේ සුරත ගෙන මගේ දෑත අතර තබා තදින් සිර කර ගතිමි. නොකිලිටි ඔහුගේ රත් පැහැ පවිත්‍ර ඇඟිලි තුඩු සදාකාලික යෞවනය පිළිබඳ ආදරණීය සංකේතයක් වැන්න....

දඩාං.... ඩෝං... දඩං.... දඩාං... ගා පහත මාලයේ දොරට යමකින් තඩි බානු මට ඇසේ. මම එය නෑසුණාක් මෙන් විශ්වට කතා කළෙමි.

'ඔයා ඉස්ස ඉස්සෙල්ලාම අපි ආදරේ කියපු දවසේ මට දුන්න තෑග්ග මතකද?'

විශ්ව දෙතොලත සිනහව විකසිත කරවමින් උණුසුම් මතකයක් සිහිපත් කරනු මට දැනේ. මම ඔහුට උදව් කළෙමි. පහත මාලයෙහි ඝෝෂාව තව ම නිම වී නැත.

'පුංචි උදව්වක් කරන්නම්.... නුවරදී....'

'ඇපල් ගෙඩියක්?'

'නෑ... නෑ... ඊට ඉස්සර'

'ක්ලෝන් බෝතලයක්?'

'ඊටත් හුඟක් ඉස්සර.'

'හේමචන්ද්‍ර එකෙන් ගත්ත මුද්ද?'

'ඊටත් කලින් දවසෙ ය...?'

'නෑ... ය් වෙන්නත් ඉස්සර'

'හාද්දක් දුන්නා...?'

'එකක් නෙමෙයි හාදු වැස්සක්.'

මම සිනහ සීමට නොමේරූ උත්සාහයක් ගතිමි. විශ්ව ද එකී උත්සාහයේ ම නිමග්න වී ය. අප දෙදෙනාට ම සිනහ ගියේ නැත. තවත් මොහොතක් අපි නිහඬව සිටියෙමු.



අප දෙදෙනාට ම අපේ ජීවිත පිළිබඳ අවසරයක් නැතුවාක් මෙන් අවකාශයේ කාලය වියැකෙන්නට හැර තවත් මොහොතක් අපි නිහඬ වීමු. මට අතීතයට යන්නට ඕනෑ වී තිබේ. මම විශ්ව ද සමඟ අතීතයට යමි.

'දවසක් අපි නුවර වැව රවුමෙ වාඩිවෙලා ඉද්දී...'

මම පෙර ගමන් ගියෙමි. විශ්ව පසු පස එයි. ඔහු ඉතිරිය සම්පූර්ණ කළේ ය.

'අන්නාසි කෑව්වා...'

'මම ඔයත් එක්ක තරහවෙලා වගේ හිටියා. ඔයා කළේ...?'

'වැව් කණ්ඩියට වැටිලා තිබ්බ මැයි මල් එකතු කර කර ඔයාගේ ඔඩොක්කුවෙ පිරෙව්වා. එතකොට තාත්තා ඇවිල්ලා... පර බල්ලා.... තිරිසනා.... මගේ නේත්‍රා මගෙන් උදුරගෙන..... මං ඕකව මරනවා...'

විශ්ව හිස අත බදා ගත්තේ ය. මම ඔහුව සැනසුවෙමි. අප දෙදෙනා ම එක ම පීඩාවක කොටස්කරුවන් බව මම අවබෝධ කොට ගෙන සිටියෙමි. මම සොම්නස්ව සිහි කළෙමි.

'මං බේරිලා ඇවිල්ලා ඔයත් එක්ක අපේ ගෙදර ගියා. අම්මා තාත්තාට වැන්දා...'

නැවතත් විශ්ව සතුටින් කතා කිරීමට පටන් ගත්තේ ය.

'අපි කසාද බැන්දා. පුංචිම පුංචි අවන්හලක හිටියේ....'

'හරියට හරි .... එදා මං ඔයාගේ බිරිඳ වුණා. මේ ඉසිවර පුතා උපන්නේ ඒ නිසා...'

'පහුවදා එද්දී කාරෙක පෙරළෙන්න ඇති...'

'පෙරළෙන්න ඇති නෙමෙයි පෙරළුණා. අපි දෙන්නටම තුවාල වුණා. දැන් අපි දෙන්නටම හොඳයි.'

'එතකොට මං දිනුවා... අපේ තාත්තා පැරදුණා.'

විශ්ව මගේ දෙවුරින් අල්ලා ගත්තේ ය. විශ්වගේ දෑස උඩට ඉල්පී තිබිණි. ඔහුගේ දෑස ඇතුළින් රතු වෙමින් ටිකින් ටික කුඩා වී කඳුළක්, බර කඳුළක් එළියට පැන්නේ ය.

මම සැණෙකින් ඔහුව වැළඳ ගතිමි. ඔහු හුහුරු හුහුරුවූ ලෙස මා වැළඳ ගත්තේ ය. අපි බොහෝ වේලාවක් එසේ සිටියෙමු. මට අලුත් ම ශක්තියක් ලැබෙමින් තිබිණි. මම එය උකහා ගතිමි. තවමත් පහත මාලයේ වියරු ඝෝෂාව ඇසේ. එනී වියරු ඝෝෂාව මගේ ලය කිළිපොළා මුළු ගත ම හිරි වට්ටන එකකි.

'නෝනා ඉන්න මං ගිහින් බලලා එන්නම්... මොකක්ද සද්දෙ කියලා...'

'ඔයා තනියම යන්න එපා. අපි දෙන්නම යමු.'

එ වර මම කීවෙමි. කෙසේ නමුදු – තර්ක විතර්ක ප්‍රේමය ආදරය සියල්ල එකතුව අපි දෙදෙනා ම පැමිණ දුල්ලෑවගේ කාමරයේ දොර විවර කළෙමු. දුල්ලෑව දත්දිය දම දමා විකල් පිස්සෙකු මෙන් රවා ගෙන සිටියේ ය. කාමරයේ තිබුණු වීදුරු භාණ්ඩ කීපයක් කැඩී ගොසිනි. පුටුවක් කැලි කැලි කැඩී තිබුණේ ය. දොර පියන තැන් තැන්වල තුවාල වී ඇත. ඇඳ ඇතිරිලි – කොට්ට මෙට්ට සියල්ල අවුල් ය. විශ්ව ඉදිරියට නොදමා මම ඉදිරියට ගියෙමි.

'මේ මිනිහට පිස්සු.'

මා පසෙකට කරමින් විශ්ව කීවේ ය. එසේ කියා ඔහු කාමරය පුරාවට පරීක්ෂා කළේ ය. දුල්ලෑව හති දමා දමා සිටියේ ය.

'නෝනා අර එළියේ ඉන්න මිනිහෙකුට කියලා කන්න ටිකක් දෙන්න. ඔයා මේ කාමරයට එන්න එපා. මේ මනුස්සයා අනතුරක් කරයි.'

විශ්ව දුල්ලෑව දෙස බලමින් මගේ අතින් අල්ලා ගත්තේ ය. මට කරකියා ගත හැකි කිසිවක් නොවී ය මගේ පවිටු ජීවිතය තවත් ජීවිත කීයක් විනාශ කරන්න ද? මම ම මැදිහත් වීමි.

'තාත්තාට එහෙම කියන්න එපා විශ්ව.'

මම ඉදිරියට ගියෙමි. කැඩුණු වීදුරු කැබලි එකතු කළෙමි. කැඩී ගිය පුටුව එළියට දැමීමි. ඇඳ ඇතිරිලි සකස් කළෙමි. කොට්ටය පිළිවෙළකට තැබීමි.

'මිස්ට දුල්ලෑව බොරුවට කළබල කරන්න එපා. ගෙදර අනික් මිනිස්සු බය වෙනවා. පිටින් ඇවිත් ඉන්න වැඩකරන මිනිස්සු හිතයි මේක පිස්සන් කොටුවක් කියලා.'



මම ඔහුගේ සිත නිවන අටියෙන් කීවෙමි. දුල්ලෑවගේ සිත නිවා දැමීමට මට ඕනෑ වී ය. ඔහු වියරු මිනිසෙකු ලෙස හැසිරීමට පටන් ගත හොත් බොහෝ කරදර අප පසු පස හඹා ඒමට පුළුවන.

'තාත්තාට මොකුත් අසනීපයක් තියෙනවාද?'

එ වර විශ්ව කතා කළේ ය.

'උඹ කටවහපන් පාහරයා.'

දුල්ලෑව කඩා පැන්නේ ය. මම විශ්ව අසළට ගියෙමි.

'අපි යමු විශ්ව.... මං තාත්තාට කෑමට මොකුත් ගෙනත් දෙන්නම්.'

මම විශ්ව සමඟ කාමරයෙන් එළියට ආවෙමි. එන ගමන් මෙසේ කීවෙමි.

'මං ඉක්මනට එනවා...'

විශ්ව සමඟ කාමරයෙන් නික්මෙන ගමන් මම දුල්ලෑව දෙස බලා සිනා සීමි. සත්තකින් ම ඒ ඔහු රැවටීමට ය. ගැහැණියක ජීවිතයේ මුහුණ දෙන ඉතා ම අසීරු අසරණකමට මම මුහුණ දී සිටියෙමි.

For E-Pusthakalaya

## 25

මා මේ සදහන් කරන දින කීපය ගෙවී යන විට විශ්ව වෙතින් ඉතා ම අවංක සිනහවක්, ඉතා ම අවංක ඇල්මක් බැල්මක් ලැබීමට තරම් මම භාග්‍යවන්තියක් වීමි. ඔහු බොහෝ සන්සුන් ලෙස අපේ කාමරයට පිවිසෙයි. ඔහු පා තබන පියවර හඬින් ම ඒ එන්නේ 'ආගන්තුක තාත්තා' බව ඉසිවර හඳුනා ගනී. ඔහුගේ පියවර හඬ මට දනවන්නේ මා තනි වී නැති බවට සියුම් තාර්කික හැඟීමකි. සහනයකි.

ටික දිනක් ගෙවී යත් ම ඔහුගේ දැකීම ම මට සහනයක් වි ය. ඔහුගේ ඇල්ම බැල්ම මට අත්‍යවශ්‍ය වි ය. ඔහු ඇස දැවටීම මට දිව ඔසුවක් වි ය. අලුත් ප්‍රේමයක් අත් විඳින – කුළුඳුල් ප්‍රේමය පුදින යෞවනියක මෙන් මම ප්‍රේමය අභිභවා සෞම්‍ය ගැහැණියක වී සිටියෙමි. ඉරිකළා ගිය මගේ පිළුණු කය පොහොණි කර සුහුඹුල් ප්‍රේමයක් අත් විඳීමට මම පාරමී පුරමින් සිටියෙමි.

විශ්ව සිහින් මිස ගතින් පිරිමියෙකු වූයේ නැත. මා ද ඔහු වෙතින් රාගික සංස්පර්ශයක් අපේක්ෂා නොකළෙමි. එ වැනි අවැසිකමක ඉඟියක් වත් ඔහු වෙතින් පළ වූයේ නැත. නිරාමිස සුවයක් විඳීමට මිස අපි දෙදෙනා ම නිරුවත් මස්වැද්දන් වීමට අපේක්ෂා නොකළෙමු. එය අපට අසැප දෙයක් ලෙස අපි දෙදෙනා ම හැසිරීමට වග බලා ගත්තෙමු. විශ්ව හැසිරුණේ ද කායික සංස්පර්ශය අපවිත්‍ර ජීවිතයක කෙලෙස් ගොඩක් ලෙසට සලකා ගෙන ය. ඔහු වරක් දෙවරක් මගේ මුහුණ සිප ගත්තේ ය. මම ඇසිල්ලක් වත් පසු නොබා ඔහුට ඉඩ දුනිමි. එහෙත් ඒ හැම වාරයක ම මා තුළ පශ්චාත්තාපයක් ඉතිරි වි ය. විදර්ශනා පුරන මෙත් සිතැති සිල්වත් යතිවරයෙක් ඉඳුල් බත් පිළිගැනීමට උවැසියක් දක්වන සද්ධා ගුණ අකමැත්තක් වැනි හැඟීමක් මා තුළ ද වි ය.



විශ්ව මගේ ත් දරුවාගේ ත් ආත්මීය සුව පමණක් ආඝ්‍රාණය කරන්නේ නම් මට සදාකාලික ජීවිතයට ම එය ප්‍රමාණවත් ය. එහෙත් පිරිමියෙකු තම බිරිඳගෙන් එ පමණකින් ම සංතෘප්තිමත් වේ ද? පිරිමිකමට අවැසි නව නො තෙක් දේ ගැහැණියක පූරණය කළ යුතු ද? තම ස්වාමියා රෝගී වූ විට ගැහැණිය හෙදියක් විය යුතු ය. සඳරුවකු සේ සිත ඔද්දල් වූ විට මවක විය යුතු ය. පුදන්නට මලක් ගෙනෙන විට අති පූජනීය පූජාසනයක් විය යුතු ය. කුස ගින්නේ දැවෙන විට රස මසවුළු පිසින දිව්‍ය භෝජන සාදන්නියක විය යුතු ය. මම මින් කීයක් විශ්ව වෙනුවෙන් පූරණය කළෙම් ද? එ හෙයින් ම ඔහුගේ සදාකාලික ජීවනය වීමට මට හැකි ද?

මා පසු ගිය කාල වකවානුව ගෙවා දැම්මේ තුංමංසලක ආත්ම තුනක් සමඟ දැස් වසා ගෙන ය. එ හෙයින් ම මම මගේ අවැසිකම් සපුරා ගතිමි. මම විශ්වට ප්‍රේම කළෙමි. ඔහුගේ ප්‍රේමය මත්තේ ම හැපුණෙමි. තැවුණෙමි. වැළපුණෙමි. ඔහු ම පතා සිටියෙමි. ඔහු වෙනුවෙන් විවර කළ හද දොරටු තවමත් එසේ ම ය.

මැදි වයසේ ගැහැණියකට රාත්‍රිය පහන් කිරීමට තමන්ගේ තුරුලේ නිදන බිලිඳු සිහින්නෙකුගේ කිරි සුවඳ උණුසුම ම සුවදායක පහසකි. කිරි සුවඳැති රාත්‍රියක් උරුම නැති මැදි වයසේ ගැහැණිය අවාසනාවන්තියකි. මගේ ජීවිතයේ ගෙවී ගිය නෙවසරක කාලය පුරා තනි යහනේ කටුක සීතල මට නොදැනුණේ ඉසිවර නිසා ම නොවේ ද? උතුරා පිටාර ගලන ක්ෂීර සාගරයක් තරම් ස්නේහය ඔහු දෙතොලතරින් උරා බොන විට මගේ කයේ ත් සිතේ ත් තිබුණු බොහෝ කම්මැළි හැඟීම් පහව ගිය බව දන්නේ මා පමණි. සිපිරි ගෙයක් වූ මේ මහා මන්දිරය මට මාතෘ තවාතැනක් කළේ ඉසිවර පුතා ය. ඔහු පිරිමි දරුවෙකු වීම නිසා ම මම ඔහු වෙතින් විශ්ව දැක්කෙමි. මම ඔහු වෙතින් විශ්ව හැඳින්නෙමි. සිතට ත් කයට ත් දැනුණු පීඩාව විඩාව නොහොට්ටුව මම ඔහුගේ තළලතට මුදා හළ එක් සුසුමකින් නිවා ගත්තෙමි. ඔහු වෙතින් ම සැනසීමි. සත්තයි.... මම ඔහු නිසා ම ජීවත් වීමි.

දිගු කාලීන ඉවසීම, පීඩාව පුපුරා යාමකි. අළු යට සැඟවුණු ගිනි පුපුරු මෙන් මගේ ගැහැණු කය එ කල බොහෝ දේ ඉල්ලා සිටියේ ය. නිවෙන්නට ආසන්න රාගික හැඟීම් දුල්ලැව සූක්ෂ්ම ලෙස ප්‍රබෝධ කළ බව වෙන ම කාරණයකි. ඉවසිලිවන්ත පුතකියෙකු මෙන් දුල්ලැව

For E-Pusthakalaya

කල්යල් බැලූ බව ඇත්තකි. එහෙත් මම ඉතා ම තිරශ්චීන – අසික්කිත අපුරසිත් ඔහු වෙනුවෙන් සම්පූර්ණ රාත්‍රී කීයක් නම් පහත් කළා ද? දැන් මට ම මා ගැන ලැජ්ජා සිතේ. අකලංක ලෙස ගැහැණියකට ජීවත් විය හැකි ද යන සැකය මා තුළ ම මට ම ප්‍රශ්න නඟමින් මතු වී යට යයි. විශ්ව ඉසිවර දුල්ලෑව අතර මම දෝලනය වෙමි. සියල්ලට ම සරිලන යස ඉසුරු අප සතු වී ය. දැන් මම රංගනයක යෙදෙමි. එය බියකරු ය. ඒ හෙයින් ම මම මත්තුකාරියක සේ හැසිරෙමි. විටෙක මවක වෙමි. විටෙක පෙම්වතිය වෙමි. විටෙක අනියම් බිරිඳක වෙමි. කෙ තරම් කලක් මා මේ වංචනික පිළිවෙත රකින්න ද? මම තුංමංසලේ අතරමං වී සිටිමි.

මම ඉසිවරගේ කාර්යයන් නිමවා විශ්ව සොයා යමි. ඔහුට කෙහෙසෙ ද පුදමි. සාලයට කුස්සියට යමි. ඕනෑ එපාකම් සොයා බලමි. ඉහළට යමි. පහළට එමි. දුල්ලෑවගේ කාමරයට යමි. කාමරය තුළ දී සිනාසෙමි. එළිමහනේ දී රවමි. ගොරවමි. ආලෝකයේ දී විශ්වට ප්‍රේම කරමි. අඳුරේ දී දුල්ලෑව ඉදිරියේ මුනිවත රකිමි. ඉසිවර තුරුල් කොට නින්දට යමි.

මම පිස්සියක වී සිටිමි. ඉසිවර තුෂ්ණිම්භූත වී හැසිරෙයි. ඔහුට තාත්තලා දෙන්නෙකි. පහළ ඉන්නේ 'පුරුදු තාත්තා' දුල්ලෑව ය. කාමරයට එන්නේ 'ආගන්තුක තාත්තා' විශ්ව ය. මම ඔහුට මව වෙමි. මගේ ජීවිතය කෙ තරම් අපවිත්‍ර ද? අවලක්ෂණ ද? වංක ද?

මම උදේ ම ඉසිවරගේ ඇඳුම් සෝදා වියළෙන්නට දමමි. පසුව විශ්වගේ කාමරයට ගොස් ඔහුගේ කිලිටි ඇඳුම් ගෙන බොහෝ පවිත්‍ර සිතින් ඒවා දෝවනය කොට පිරුවට කරමි. කොහේ හෝ සිට දුල්ලෑව විත් ඔහුගේ කිලිටි ඇඳුම් ඒ මත දමයි. මම අසරණ වෙමි. කැමැත්තෙන් විශ්වගේ කිලිටි සෝදමි. අකමැත්තෙන් දුල්ලෑවගේ කිලිටි සෝදමි. සියලු ම ඇඳුම් එක ම රෙදි වැලක වේළෙන්නට දමමි.

'කොච්චර ලොන්ඩරියට දැම්මත් වැඩක් නෑ නේත්‍රාගේ ඇඟිලි තුඩුවලින් වගේ මිරිකේ කිලිටි හෝදන්න ඩෝබිට බෑ.'

දුල්ලෑව කිලිටි මගේ ඇඟට දමමින් කියයි.

'මං කැමැත්තෙන්ම නෙමෙයි හෝදන්නෙ?'

'අකමැත්තෙන්ම වුණාම මොකෝ කුණු යනව නම්.'



දුල්ලෑව ඔච්චමට කියයි. මම නිහඬ වෙමි. ඔහු නැවත කතා කරයි.

'ඔය පිළිවෙත හොඳයි. අසම්මතයත් ලස්සනයි.'

ඔහු මගේ පිට අත ගායි. මම කළබල වෙමි.

'කවුරුත් දකීවි.'

'බාත්රූම් එකට කවුරුත් එන්නේ නෑ.'

මම නැවතත් නිහඬ වෙමි.

'ඔයාගේ ඕනෑ එපාකම් සේරම විශ්වගෙන් කෙරෙන්නේ නෑ කියල දැන් තේරෙනවාද?'

'මට එයාගෙන් කෙරෙන ටික ඇති.'

'පිස්සු කෙල්ල.'

ඔහු නැවත තට්ටුවක් දමා යන්නට යයි. මම මගේ කාර්යයන් නිම කොට මිදුලට යමි. විශ්ව ඉසිවර සමඟ සෙල්ලම් කරයි. ඔහු ඉසිවරගේ දෙවුරින් අල්ලා වටේට කරකවයි. රිද්මයට මෙසේ කියයි.

'ජීවිතේ .... සුන්දර ද මෙතරම්...'

ඉසිවර මුහුණ පුබුදුවා ගෙන සිනා සෙයි. මම ඔවුන් අසළට යමි. ඉසිවර බිමින් තියා විශ්ව එක එල්ලේ ම මදෙස බලා සිටී. මම ඔහුට ඉඩ දෙමි. එහෙත් ප්‍රාණවත් දෑසක් වෙනුවට මගෙන් බොහෝ විට ඔහු වෙතට එල්ල වන්නේ ශූන්‍ය නෙත් සඟලකි. ටික වේලාවක් කල් යල් බලා ඔහු නැවතත් කතා කරයි.

'මට හොඳටම දැන් සනීපයි නේත්‍රා.'

ඔහු හැඟිම්බරව කියයි. මම බිම බලා දෙවනුව හිස ඔසවා පිළිතුරු දෙමි.

'දෙවියන්ගේ පිහිටයි විශ්ව.'

'ජීවිතේ පුදුමයි.'

ඔහු නැවත කල් යල් බලා කියයි.

'නෑ විශ්ව ජීවිතේ එහෙම තමයි.'

For E-Pusthakalaya

‘අපි මුල ඉඳලම පටන් ගමු.’

‘බැ එතකොට ඉසිවර.’

මම විහිළුවක ස්වරූපයෙන් කියමි.

‘නැ මම කිව්වේ මට දැන් ජීවිතේ මැද්දෙන් පටන් ගන්න තේරෙන්නෙ නැ.’

‘අපි ජීවිතේ පටන් අරන් තියෙන්නෙ විශ්ව. ඉස්සරහට යමු.’

‘එතකොට අතීතෙ වලදාන්න වෙනවා.’

‘මං කැමතියි ඒකට.’

‘මං ආසයි අපේ අතීතෙට.’

‘ඒක අවාසනාවන්ත සිද්ධි ගොඩක්.’

‘ඒ වුණාට සුන්දර ආරම්භයක්.’

අපි දෙදෙනා ම නැවතත් අලුත් පෙම්වතුන් මෙන් දොඩමලු වීමු. එහෙත් අපේ සංවාද අතර බොහෝ පරතරයක්, ඉඩක්, හිඩසක් තිබිණ. මේ පරතරය, ඉඩ, හිඩස පිරවීමට මම අකමැති වීමි.

‘මට බයයි.’

‘මං එකපාරක් මැරුණා. මිනිස්සු දෙපාරක් මැරෙන්නේ නැ නේන්නා..’

එහෙත් මා මේ වන විට ත් ඔහු මරා දමා ඇති බව ඔහු දන්නවා නම්...

කොහෙන් සිතුව ත්, කො තනින් සිතා නැවතුණ ත්, කම්පිත බවකින් හදවත ලබ්... ඩබ්.... ලබ්... හඬින් වැඩි ප්‍රවේගයක් ගනී. සීතල ම දවසක වුව ද එ විට මගේ ගතේ සිහින් උණුසුමක් ගලා ගොස් මම තිගැස්සෙමි. විදුලි එළියක සියලු කිරණ සැණෙකින් ශරීරය හරහා ගමන් කළාක් මෙන් මම ගල්හිත වෙමි. වියළි කටුක හැඟීම් ද එකිනෙක ගැටෙයි. ආදරය ද අනාදරය ද එකට විත් හදවතෙහි ලැගුම් ගනී. ශෘංගාරය සමඟ ජුගුප්සාව එක ම හිතකට එක්වර පිවිසෙයි. හදවතේ පැත්තක් මනුෂ්‍යාත්මයක බොහෝ යහගුණවලින් උතුරා යන විට, හදවතේ තවත් අර්ධයක් යක්ෂාරූඪ වී හදවත් කපාට පැළී හදවත් බිත්ති පුපුරා ජීවිතය සුන්නද්දූලි වෙයි.



‘අපි නුවර යමු විශ්ව...’

හිටි අඩියේ ම මම ඔහුගේ හදවත ආක්‍රමණය කළෙමි.

‘මං හිතුව ඔයා අකමැති කියලා..’

විශ්ව දුකින් තෙපළේ ය.

‘ඔයාටද...? නුවර යන්නද...!’

‘මට කැමතියි... නුවර යන්න අකමැතියි.... එහෙමයි හිතුවෙ...?’

විශ්ව උද්දාමයට පත් වී සිටියේ ය. මම ආරම්භක සංඥාව දුනිමි. ඔහු නිමාවට සූදානම් බව අඟවයි.

‘යමු .... අපි තුන්දෙනාම යමු...’

අපි නුවර යන්නට සියල්ල ලක ලෑස්ති කළෙමු. හුනෙක් ‘චුක්.... චුක්....’ ගෑවේ ගමනටත් බොහෝ පෙර සිට යි. දුල්ලැව දින කීපයක් කාර්යාලයට වත් බැංකුවට වත් නොගොසින් බළල් චර්යාවකින් ඉව අල්ලමින් නිවෙසට ම වී සිටියේ ය.

‘නුවර ගියාම කොහෙද ඉන්නෙ...?’

ඔහු මගෙන් ඇසුවේ ය.

‘ඒක තීරණය කරන්නෙ මගේ මහත්තයා...’

‘මේ මහත්තයාට ඒක කියල ගියොත් නරකද...?’

‘සර්පයන්ට කලින් කියල කුරුල්ලෝ කූඩුවෙන්නෙ නැ...’

‘හා... හා... එහෙනම් මධුසමයක් වගේ...?’

‘වගේ මොකක්ද...? එහෙම ගමනක් තමයි...’

‘අනිවාර්යයෙන්ම අසාර්ථකයි...’

ඔහු එසේ කියා මගේ නිතඹට තට්ටු කළේ ය. මම ඉදිරියට ඇදී ගියෙමි.

විශ්ව සමඟ නුවර ගිය හොත් එහි දී දෙමාපියන් ද සමග ජීවත් විය හැකි ය. මේ සියල්ල ම මගේ හිතේ හැටියට නිමා කර ගත හැකි ය. මම ක්ෂණිකව ඒ මොහොතේ පටන් සිතන්නට වීමි. මායා සිහිනය දකින්නට සිත බොහෝ කැමැත්තෙන් සිටී.

ආයෙත් සිහිල් සුළං හමා එන්නට පටන් ගෙන තිබේ. වියළි, ශුෂ්ක බවක් එළඹෙන්නට පෙර හේමන්තය එළඹුණාක් මෙනි. හාත්පස පරිසරයට මම ඇහැ යවමි. තෙත් බවක් ද දයාර්ද්‍ර බවක් ද හීන් හුළඟක් සමඟ චිත් ගත දැවටෙයි. මම විශ්වගේ නේත්‍ර විල්තෙර ලැගුම් ගන්නට වෙහෙස ගනිමි. දුල්ලැව කොහේ දෝ සිට මා ළඟට ම පාත් වෙයි.

'අසාධාරණයි...'

ඔහු අකුරින් අකුර ඉතා ඕනෑකමින් උච්චාරණය කළේ ය.

'මොකක්ද...?'

'නේත්‍රාගේ වැඩ පිළිවෙළ සම්පූර්ණයෙන්ම අසාධාරණයි...'

ඔහු එසේ කියා මගේ උරහිසට අත තැබුවේ ය. මම වටපිට නොබලා ම විරෝධය ප්‍රකාශ කළෙමි.

'අතගන්න පැත්තකට.... මම කැමති නෑ...'

'ඔයාට වැරදුණා.... කැමති නෑ නෙමෙයි.... මේක කැමති වෙන්න වෙලාව නෙමෙයි...'

'කොයි වෙලාවටත් ඔච්චර තමයි...'

'පිස්සු කෙල්ල...'

ඔහු උරහිසට බර දී නිතඹට තට්ටු කර ඒ තනින් ඉවත් වන්නට සැරසිණි.

මාත්, මගේ සිත ත්, මවිසින් ම සුන්දර යැයි මායාකාරීව සිතූ පරිසරය ත් එසේ ම තිබෙන්නට හැර විශ්ව මුනිවරයෙකු සේ හැසිරෙන්නට වූවේ ය. ඔහු මට ත් වඩා සත්පුත් ය. ඔහු වඩ වඩාත් පවිත්‍ර වී ය. නිරන්තරව මුව දෝවනය කොට පිරුවට ඇඟ ලෑවේ ය. ඔහුගේ ගමන් ලතාව ත් දැන් දැන් අපූර්ව රිද්මයකි. පරෙස්සමට උපුරුවන වචන ඔහු නාස්ති කරන්නේ නැත. එහෙත් ප්‍රේමයේ දී වචන පරෙස්සම් කළ හැකි ද? හද උල්පත් සිඳෙන තෙක් දෝරේ ගලන්නට දොඩමලු වන්නේ නම් මෙලහකටත් අපි විශ්වය ම දෝතට ගන්නෝ වන්නෙමු. නැත. ඔහු දෝත දිගු කරන්නේ නැත. නැත. ඔහු ඉස්සර වන්නේ නැත. ඔහුගෙන් යමක් ඉල්ලීමට: ඔහුට යමක් දීමට: ඔහු ම පතා ඔහු මත්තේ ම සැතපීමට මට ඉස්සර විය නොහැකි ය. නැත. ඔහුගෙන්



ඉඟියක් වත් නැත. ඉතිං ලැජ්ජා නැති ගෑහැණියක මෙන් මට ඉස්සර වීමට නොසිතේ.

ඒ හෙයින් ම නැවතත් මම පුරුදු තැන ම කැරකෙමින් සුසුමක, කඳුළක, තනිකමක, ශුන්‍යත්වයක පත් වී විශාල විශ්වයක තිතක් මෙන් තනි වීමි.

කාලය දින, සති, මාස බවට පත් වි ය. කාලයට සාපේක්ෂව වියපත් බව අපව වසා ගනිමින් අඳුරු තිමිර අතුරමින් සිටී. මම කාලයේ කවුළුවෙන් ම සහන් එළියක් සෙවීමි. ගොරබිරම් වූ නේක දසුන් නෙත්වල වැදී ස්පන්දනය වී නැවතත් පරිසරයට ම පරාවර්තනය වෙයි. අක්‍රිය කාලයක් ඔහේ ගෙවී ගියේ ය.

For E-Pusthakalaya

# 26

ආයෙත්: ආයෙත්: ආයෙත්: ජීවිතය වෙනසකට මුල පුරන්නට සැරසෙයි. අවැසි වෙනස මට නොවැටහේ. ඒත් නොවැටහෙන බොහෝ දේ අවැසි බව ඇත්තකි. මම දැන් මායා සිහින නොදකිමි. ඒ වුණත් සිහින දැකීම සහනයකි. වියපත් වෙමින් පවතින විට වඩ වඩාත් මට යෞවන සෞම්යක වීමට ඕනෑ වී තිබේ. දණ්ඩි පැටව් උඩ පනින: බටිති කුරුලු මියැසිය ඇසෙන: මුව පොව්වන් හුරතල් වන අලුත් තුරු ගොමුවක ඉසිවර හා විශ්ව සමඟ අම්මා ත්, පුතා ත්, තාත්තා ත් වීමට මම සිහින දකිමි. ආයෙත්: ආයෙත්: ආයෙත් ජීවිතය වෙනසකට මුල පුරන්නට සැරසෙයි.

ක්ෂීර සාගරයක් තරම් විශාල හැඟීම් මත උපන් සිතිවිලිවල කිමිදෙමින් මම කාලය මරා දැමීමි. මම නුවර ගමනට ඉන් පසුව කඩිනම් අදහසක් විශ්වට ඉදිරිපත් නොකළෙමි. විශ්ව සමඟ නුවර පදිංචි වීමට සිතුව ද මගේ කිලිටි කය ඔහු අස පූජා කරන්නට මට නොසිතේ. ඔහු කිසි යම් මොහොතක එ වන් යෝජනාවක් කරති යි මම බියෙන් පසු වීමි. මේ සංක්‍රාන්ති කාලය ගෙවී යන්නට පෙර ම විශ්ව මා සොයා පැමිණියේ ය.

'මම ආයෙත් ලෙඩෙක් වෙයි නේත්‍රා... මට එහෙම හිතෙනවා...'

'මගෙන් වරදක් වුණාද විශ්ව...?'

'නෑ.... මගෙන් වරදක් වෙනවා...'

මම ඔහු වදනින් සනසා කාමරයට ගියෙමි. ඇඳ ඇතිරිලි රැලි නොනැඟෙන්නට ඉතා හොඳින් සකසා එහි වාඩි වීමි. ඉසිවර මිදුලට වී දූල්ලැව සමඟ සෙල්ලම් කරයි. ඔහු දැන් තමන් සමඟ මිත්‍ර වන ඕනෑ ම කෙනෙකු සමඟ කෙළිදෙලෙන් සිටීමට ප්‍රිය කරයි. මම විශ්ව කැඳවා ගතිමි.



'එක්කෝ අපි තුන්දෙනාම මේ කාමරේ නිදාගමු. නැත්නම් තුන්දෙනාම ඔයාගේ කාමරේ ඉඳිමු...'

මම කීවෙමි. ඔහු ඉස්සර නොවන්නේ නම් මා ඉස්සර විය යුතු ය.

'එහෙම හොඳද..?'

'මං ඔයාගෙ බිරිඳනේ.... කමක් නෑ...'

'අපි පස්සෙ කල්පනා කරල බලමු....'

විශ්ව කීවේ ය. මට ක්ෂණිකව දුකක් ද පසුව කෝන්තියක් ද දැනිණ. මම ඔහුට මගේ අප්‍රසාදය හෙළි කළෙමි.

'ඔයාට තවම සනීප නෑ තමයි...'

මම කීවෙමි. නැත. මට කියැවිණි. විශ්වගේ මුහුණ රතු වි ය. දෙතොල සුදුමැළි වි ය. සිහින් දහ දිය බිඳු ඔහුගේ නළල් තලය පුරා මතු වි ය.

'නේත්‍රාට මං හරිම ආදරෙයි නේත්‍රා...'

විශ්ව බිම බලා ගෙන කීවේ ය. 'ඒ ආදරේ ඔයා ගන්න. මට දෙගුණයක් කරල දෙන්න.' වැනි හැඟීමක් එහි වි ය. 'ඔයා තවමත් මාව රිදවනවා.' වැනි නොකළ ප්‍රකාශයක් ද එහි වි ය. මම ඔහුට තේරුම් ගත නොහැකි පරිදි යටැසින් ඔහු දෙස බැලුවෙමි. මට ඔහු තේරුම් ගැනීමට ඕනෑ වි ය.

'මොකටද අපි නුවර යන්නෙ...?'

'මං දන්නෙ නෑ...'

ඔහු එ විට කියන්නට වි ය. මට ත් සෙසු අයට ත් මුවා වී දූල්ලැව විශ්වගේ සිතට විෂබීජ ඇතුළු කරනවා යැයි මම නැවතත් සැක කළෙමි. ඉව අල්ලමින් දූල්ලැව කාමරයට ආවේ ය.

'ඇයි...?'

මම ක්‍ෂණික තරහකින් විමසුවෙමි.

‘ඔය හැම දෙයක්ම විශ්වට කියන්න එපා නේත්‍රා... ඒ ළමය යන්තම් සනීප ගතියට ආව විතරයි. ඔයාට පුළුවන්නේ මට කියන්න. ඒ ළමයගේ හිත නරක් නොකර...’

‘මොනවද ගැනද? මේක අපේ කතාවක්...’

‘උඹ ආයෙත් රැවටෙන්න එපා පුතා. ඉස්සෙල්ල ළමයත් මගේ. දැන් නේත්‍රාගේ කුසේ ඉන්න දරුවත් මගේ...’

දුල්ලෑව ඇහට පතට නොදැනී කීවේ ය. මට දෙලෝ රත් වි ය.

‘මේක මහ අසික්කිත ගෙදරක්. ලෙඩ්ඩු පිස්සෝ පිරිලා. තමුසෙගේ ළමයෙක් මගේ බඩේ නෑ...’

‘තව ටික දවසකින් බලමු..’

දුල්ලෑව යන්නට ගියේ ය. හිරිකිතයකින් මෙන් ම බියකින් ද මම හිගැස්සීමි.

‘මට ඔයත් නැතිවෙයි නේත්‍රා..’

විශ්ව ඉසිවරට ත් වඩා බිලිඳු සිහිත්තෙකු මෙන් කීවේ ය.

‘මං මගේ පව්කාරකම්වලට වන්දි ගෙවනවා විශ්ව. ඔයා අවුරුදු ගානක් දුක්වින්දා. මං මගේ දරුවත් එක්ක මේ ගෙදරින් යන්න යනවා...’

මම සහතික වශයෙන් ම මගේ හිතට එ වේලේ පැමිණි හැඟීම් ඔහුට කීවෙමි.

‘මම ගියාට කමක් නැද්ද...?’

මම ඔහුගේ උරහිසට දෑත තබා විමසීමි.

‘කමක් නෑ.... පුතා කියල යන්න...’

විශ්ව එසේ කියා කාමරයෙන් නික්මුණේ ය. මම ඉක්මනින් කාමරයෙන් එළියට විත් ඉසිවර පුතා කොයි දැයි විපරම් කළෙමි.



මේ තෙක් මම තීරණාත්මක සාධකය වීමි. සිදු වූ සියලු දේට ද, සිදු වෙමින් පවත්නා දේට ද මම සෘජුව මැදිහත් වීමි. මේ නිසා ම දුල්ලෑවගේ ජීවිතයට මෙන් ම විශ්වගේ ජීවිතයට ත් මගේ මැදිහත් වීම තීරණාත්මකව බල පෑවේය. ගැහැණු ශරීරයකට බොහෝ දේ කළ හැකි බව මම මේ වන විට තේරුම් ගෙන සිටියෙමි. මම මගේ ගැහැණු කය ඔහේ නිකම් ම නිකං පරඬැලක් මෙන් නිවසේ පාවෙන්නට ඉඩ හැරියෙමි. සිත මා ළඟ ම නවතා ගතිමි. කාටත් හොරෙන් මෙන් ඉසිවර සමඟ පමණක් උතුරා යන සෙනෙහසකින් මාතෘත්වය පෑවෙමි. මව්වක්කළ ඔහුට බොහෝ දේ සම්පාදනය කළේ ය. තාත්තලා දෙන්නෙකු ඔහු වෙනුවෙන් ජීවත් වුව ත් මට මෙන් ම ඔහුට ත් වියළි කෘත්‍රිම බවක් දැනෙන්ට වී ඇත.

එ දින උදෑසන දුල්ලෑව මුණ ගැසුණු මොහොතේ මම කුස්සියේ බිත්තියට බර දී ඕනෑවට එපාවට මෙන් උදේ කිරි එක බොමින් සිටියෙමි. ඔහු මා දෙස බලා දැසින් විදුලි කොටත් ම මම බිම බලා ගතිමි.

‘මොනව උණත් මට දවසකට වතාවක්වත් ඔයාව දකින්න ඕන.’

පිරිමියෙකු ප්‍රේමය අයදින බයාදු පෞරුෂයක පහත් හඬින් ඔහු කීවේ ය. මා නිහඬ ය. ඔහු මට දැනෙන්නට සුසුමකින් විරාම තැබුවේ ය.

‘ඔහොම ඉන්න කොට වෙලාවකට මට අනුකම්පා හිතෙනවා. වෙලාවටක ඉරිසියා හිතෙනවා.

මම තේ කෝප්පය සෝදා රාක්කයේ එල්ලුවෙමි. අවුල් වූ කෙස් රොද ඔහේ නිකම් ම තිබෙන්නට හැර මුහුණේ මතු වූ දහදිය තෙත් ඇඟිලිවලින් ම පිස දා ගතිමි.

‘නුවර යන්න හදපු ගමන නවත්වන්න එපා. බයක් වගේ තියනව නම් මමත් එන්නම්.’

‘මම තාම හිතල නෑ.’

‘හිත හිතා හිටියොත් පෙරහැර යයි. මට නිකං සැකයක් තියෙනවා නේත්‍රාට ආයෙත් බබෙක් හම්බ වෙන්න ඉන්නවා කියලා.’

For EPusthakalaya

‘පිරිමි බඩදරු වෙන්නෙ නැතේ?’

‘ඒ වුණාට බඩදරු වෙච්ච ගෑණිගේ පිරිමියාට ඒ බර දැනෙනවා.’

‘මගෙ දේවල් මම බලාගන්නම්.’

‘මමත් හවුල් දේවල්වලට මටත් මැදිහත් වෙන්න වෙනවා.’

‘මට එහෙම සැකයක් නෑ.’

‘තව ටික දවසකින් තේරෙයි.’

නාඩිවේදය දත් මහලු බමුණෙකු මෙන් ඔහු මගේ ශරීරය දෑසින් ස්පර්ශ කොට කීවේ ය. සැකයක් පමණක් නැතත් මම සැකයේ වාසිය ඔහුට දීමට මැළි වීමි. කුස්සියේ එහා දොරින් මිදුලට ගිය මම ඉසිවරගේ ඇඳුම් ගෙන එකිනෙක අව්වේ වේලෙන්නට දැමීමි.

එ දින ම විශ්ව මූණ ගැසුණු මොහොතේ මම මිදුලේ, එළිමහනේ, අඹ ගසට බර දී සිටියෙමි. ඕනෑවට එපාවට මෙන් විටින් විට හමන සුළඟ සනීපවත් ස්පර්ශයක් දනවමින් හඹා යයි. විශ්ව පිරිසිදු වී, පිළිවෙළට රිද්මයට අඩි තබමින් මට සමීප වි ය.

‘ඔයාව දැක්කහමත් මට ඇති වගේ.’

ගැටවරයෙකු ප්‍රේමය අත් විඳින මායාකාරි සෞන්දර්යය වචන සමඟ මුසු කරමින් විශ්ව තෙපළේ ය. මම ඔහුට දැනෙන්නට සුසුමකින් විරාම තැබුවෙමි.

‘ඔහොම ඉන්න කොට මට මගේ ජීවිත කාලයටම ඔයා දිහා බලා ඉන්න පුළුවන්.’

මම ගස ළඟින් තරමක් මෑත් වී ඉසිවරගේ රෙදි ,දැමූ වැලේ ඒ රෙදි තිබූ ස්ථානයෙන් ගෙන නිකමට වෙනත් තැන්වල එළීමි.

‘නුවර ගමන හරියට පිළිවෙළක් නොවුණු නිසා ඔයා ඉන්නෙ කලකිරීමෙන්.’

‘නුවර ගමන හරියට නොකෙරුණොත්, පිළිවෙළකට වැඩක් නොකෙරෙන්නෙත් මගෙ වරදක් නිසා නෙමෙයි විශ්ව...



‘මං උත්සාහ කරනවා නේත්‍රා පිළිවෙළකට ඉන්න.’

‘ඔයා මූණ සෝදල, පවුඩර් දාල, පිළිවෙළකට ඇඳුම් පැළඳුම් ඇන්දම ඒක ජීවිතේ පිළිවෙළ නෙමෙයි විශ්ව.’

‘ඔයත් එහෙම මූණ සෝදල. පවුඩර් දාල ඉන්න.’

‘මම මෙතන දේවාලෙක වගේ පේවෙල ඉන්නෙ කවුරු මාව හොයාගෙන එනකල්ද?’

‘මම හැමදාම උදේම එනව ඔයාව බලන්න.’

‘කුඩුවක දාල ඉන්න සතෙක් බලන්න වගේ ඔයා උදේම එනව මාව බලන්න. ඔයා හිතන්නෙ ගෑණියෙකුට ඒක ඇති කියලද? පිරිමියෙක් ඉස්සෙල්ලම හිතන්න ඕන ගෑණිගේ ආරක්ෂාව.... ආදරය.... තව කොච්චර දේවල් තියෙනවද විශ්ව? අපි ඕව කතා නොකර ඉමු.’

‘මේ ගෙදර හොඳට ආරක්ෂාවයි නේත්‍රා. උස තාප්පෙ නිසා හොරුන්ට පනින්ඩ බෑ. ඇතුළට.... මිදුලට ආවත් ගෙට එන්ඩ බෑ. මම හැමදාම කාමරේ දොර වහලද කියල දෙපාරක් බලල තමයි නිදාගන්නෙ. ඔයත් එහෙම කරන්න. එතකොට ආරක්ෂාව ප්‍රශ්නයක් නෑ. ආදරේ අරගෙන මං උදේම එන්නම්...’

‘ඔයාට තේරෙන්නෙ නෑ විශ්ව. අපි කතා නොකර ඉමු. හොඳට දොර වහගෙන නිදාගන්න කියල කියන්න නෙමෙයි ගෑණියෙක් මිනිහෙක්ව කසාද බඳින්නෙ.... අනික ඔයා දන්නෙ කොහොමද හොරා ඉන්නෙ ගේ ඇතුළෙද එළියෙද කියලා?’

මා එසේ කියත් ම ඒ තනින් එහාට මා කියන්නේ කුමක් දැයි තේරුම් යාමට තරම් ඔහුට සියුම් කල්පනාවක් තිබුණේ නැත. කුඩා කාලයේ සෙල්ලම් ගෙවල් හදන කුඩා ළමයින් ‘සෙල්ලම් ගෙදර විවාහය’ පිළිබඳ සිතන මානසිකත්වයෙන් ම විශ්ව අපේ විවාහය දෙසට බලන්නට වි ය. තව ම ඔහුට ‘හොඳටම සනීප නෑ’ යන්න නැවත නැවතත් මට තහවුරු වෙමින් තිබිණ. ඔහුගේ ඇතැම් ප්‍රකාශ හා ක්‍රියාකාරකම් මහත් ම වූ වධයක් ලෙස මට දැනෙන්නට වි ය.

එහෙත් ඔහු එසේ සිටින්නේ තව ම නිවටාවට සුවපත් නොවී කිසි යම් මානසික ප්‍රහේලිකාවක සිරිව සිටින නිසා බව සිතන විට ආයෙන්, මගේ පසුව දැවෙන්නට ගනී.

For E-Pusthakalaya

'හොඳයි අපි එහෙනම් නුවර යමු.'

'යමු කියල කිව්වට බෑ විශ්ව.... පිරිමියෙක් වගේ ඉස්සෙල්ල හැසිරෙන්න ඕන. ඔයා තවම ඉන්නෙ හරියට ඉසිවරගෙත් බාල මල්ලි වගේ. ඔයා ඉසිවරගෙ තාත්තා. මගේ කසාද මිනිහ.... ඔහොම හිතන්න.'

'මට අමතක වුණා. මං ඉසිවරගේ තාත්ත තමයි. මං ඒක ඉසිවරට කිව්වා. ඉතිං ඔයාම කියනවනෙ මං ඔයාගේ මිනිහ කියලා. මං මොකටද ඒක ඔයාට කියන්නෙ. ඔයා ඒක දන්නවනේ. ඉතිං එතකොට ප්‍රශ්නෙ ඉවරයිනේ. මං ඉසිවරගෙ තාත්තා. ඔයාගෙ මිනිහා...අපි නුවර යමු. ඉතුරු හරිය ඊට පස්සේ...'

'ඔයාට ඕනකමක් තියනව නම් පිරිමියෙක් වගේ හැසිරෙන්න.... මේ ගෙදර... මේ පරිසරය හොඳටම ඇති කියල හිතෙන්නෙ නැද්ද?'

'බෑ.... බෑ.... අපි අර ඉස්සර දවසක් නුවර ගිහිල්ල හිටපු හෝටලේක හිටියේ. අන්න එතෙන්ට යන්න ඕන. මං එහෙ ගෙනියන්න රෙදි එහෙමත් ලෑස්ති කරල තියෙන්නෙ.'

විශ්ව උද්දාමයෙන් උඩ පනින්නට වි ය. මට යාන්තමට ඔහුගේ මානසික ව්‍යාකූලත්වය තේරුම් ගත හැකි වි ය. කාලයක් ජීවිතේ සියලුම හැඟීම් මරා දමා සිටි ඔහුට මරා දැමූ හැඟීම් යළි ජීවත් කිරීමේ නොහැකියාව මට තේරුම් යන්නට වි ය. හැකි ඉක්මනින් දොස්තර තිලක් ජයසෝම මුණ ගැසිය යුතු බව මම තීරණය කළෙමි.

දුල්ලෑව උදේ කාර්යාලයට ගිය විට මම දොස්තර තිලක් ජයසෝමට දුරකථනයෙන් කතා කළෙමි. මා කියූ සියල්ල ඔහු ඉතා ම සාවධානව අසා සිටියේ ය.

'හොඳයි එහෙනම් නේත්‍රා විශ්ව එක්ක හරි තනියම හරි ඇවිල්ල මාව මුණ ගැහෙන්න.'

'ගෙදරින් එන එක තමයි ඩොක්ටර් ප්‍රශ්නෙ?'



මම කීවෙමි.

'හොඳයි විවේකයක් ලැබුණම මම එන්නම්.'

'ඩොක්ටර් විශ්වගේ තාත්තා, මිස්ටර් දුල්ලෑව නැති වෙලාවක නම්, විශ්ව එක්ක කතා කරන්න ලේසියි.'

'මට තේරෙනවා, මට තේරෙනවා . මම එන්නම්.'

ඔහු රිසිවරය තබන්නට පෙර කීවේ ය. පසුව දා ම උදේ දහයට පමණ තිලක් ජයසෝම වෛද්‍යවරයා පැමිණියේ ය. විශ්වට කාමරයේ ඉන්නට හැර සාලයට වීත් මම ඔහුව පිළිගෙන කතා කළෙමි. පසු ගිය සිය පුවත් ඔහුට කීවෙමි.

'එයා ඔය මූණ සෝදල, රැවුල කපල, පිළිවෙළකට ඉන්නෙ, හැසිරෙන්නෙ අවුරුදු දෙක තුනක ඉඳල හුරු කරපු පුරුද්දට. දැන් විශ්වට තියෙන්නෙ වැඩිහිටියෙක් විදිහට හිතන්න බැරිකම. එයාට ඕනකමක් නැතුව නෙමෙයි. කොහොමටත් ඉතිං පිරිසිදුවට ඉන්න එක හොඳයි. මෙතන ප්‍රශ්නෙ තියෙන්නෙ එයා ඕනවටත් වැඩිය ඒ ගැන හිතන එක. නේත්‍රා... එකක් මතක තියා ගන්න ඕන. පිරිමියෙක් විදිහට විශ්ව ඉතාම පිරිසිදු චරිතයක්. ඒ නිසා එයාගේ හිතේ පිරිසිදුකම එයා මේ විදියට ඔය බාහිර සමාජයට පේන්න සලස්වනවා. ලෙඩෙක් නොවුණ නම් එයා ඉතාම උතුම් මනුස්සයෙක්. ගෑණියෙකුට පෙරුම් පුරලවත් ලබන්න බැරි ජාතියෙ පිරිමියෙක්.'

'මං ඒක දන්නවා ඩොක්ටර්.'

මගේ දෑසේ කඳුළු පිරී නළියන්නට වි ය. මේ උතුම් මිනිසාගේ ප්‍රේමයේ පූජාව වූ මා කො තරම් නම් කිලිටි අපවිත්‍ර ගැහැණියක් ද? මම දුල්ලෑවගේ විස්තර කිසිවක් වෛද්‍යවරයාට නොකීමට ප්‍රවේශම් වීමි. පිළිකුල් වසංගත රෝගයක් සඟවා ගෙන සිටින මුඩුම අපිරිසිදු ගැහැණියක මෙන් ම මගේ ජීවිතය හෙළි නොකොට සිටියෙමි.

'නුවර ගමන මීට ඉස්සර ගියා නම් සමහර විට මේ වෙද්දිත් විශ්ව වෙනස් වෙන්න තිබුණා. නුවර නගරයත්, නේත්‍රාගේ ගම නුවර වීමත්, ඔය දෙන්න ඇක්සිඩන්ට් වුණේ නුවර ඉඳල එද්දි වීමත්, ඉස්සරවෙලාම ඔය දෙන්න ගෑණියෙක් පිරිමියෙක් විදියට රාත්‍රිය ගත කළේ නුවරදී

විමත් ඉතාම වැදගත්. ඒ නිසාම තමයි විශ්ව නුවර යන්න හදන්නේ. නේත්‍රා බොහොම ප්‍රවේශමෙන් නුවර ගමන ලැස්ති කරල, විශ්ව එක්ක යන්න. එයාගේ හිතට පීඩාව දැනෙන්න දෙන්න එපා. මොකද එහෙම වුණොත් අසනීප තත්වෙ සුව කරන්න බැරි තරමට ඔඩු දුවන්න පුළුවන්. එයාගේ මැරිල තියෙන හැඟීම් ආයෙත් ප්‍රාණය ලබන්න ඕන. එයාගේ හිතේ තියෙන ළමාකම නැතිවෙන්න ඕන. එයාට නුවරවල් දෙකක් නෑ. නේත්‍රාල දෙන්නෙක් නෑ. එයාට දිව දෙකක් නෑ. හිත් දෙකක් නෑ. දැන් වෙදකම් කරන්න බෑ. හෙදකම් කරන්න විතරයි පුළුවන්. ස්ථිරවම මට හිතෙනව නුවර ගිහිල්ලා නේත්‍රා ඉස් ඉස්සරලාම විශ්ව එක්ක හැසිරුණු විදිහටම හිටියොත් සම්පූර්ණයෙන්ම මේ ප්‍රශ්නෙ ඉවරයි කියලා.'

'බොහොම ස්තුතියි ඩොක්ටර්.'

'දැන් ඉතිං අවුරුදු තුනකටත් වැඩිය නේත්‍රා ඉවසුවානෙ. ඒ නිසාම තමයි විශ්ව ඔය තත්වෙන් ඉන්නෙ. එයාගේ හිතේ ආදරය චමත්කාරය වගේ දේවල් පිරිල තියෙන්නෙ. නුවර යද්දී පුතාව අම්ම ළඟවත් තියල යන්න. නිදහසේ ඉන්න. ඔයා ටිකක් ඉවසලා වැඩ කරන්න.'

වෛද්‍යවරයා සමු ගැනීමට පෙර කීවේ ය. මම ඔහුට යළිත් ස්තුති කළෙමි. විශ්වට කතා නොකර ම ඔහු නිවසින් නික්මුණේ ය.

ඉතා ම තිරවුල් සහ පැහැපත් හෙටක් මගේ ඇස ඉදිරියේ පෙනෙන්නට වී ය. එහෙත් ඒ මග අවුරා දුල්ලැව තම් මහා ප්‍රතාපවත් පිරිමියෙකු තිරුවතේ විකාර කරනු ද මට එසේ ම මැවී පෙනෙන්ට වී ය.



# 27

එ දින අපි නුවර ගමනට සූදානම් වෙමින් සිටියෙමු. සියල්ල සැලසුම් කළේ මා ය. මට එයට අවසරය ද ඉඩ ප්‍රස්තාව ද ලැබිණි. තීරණ ගනු ලැබුවේ ද ක්‍රියාත්මක කරනු ලැබුවේ ද ම විසින් ම ය. උද්දාමයෙන් සිටි විශ්ව විටින් විට පැමිණ මට ආදරය පෑවේ ය. ඔහු ප්‍රේමය අත් විඳිමින් සිටියේ ය.

'මේ අහස ගොඩක් උසයි. පොළොව අනන්තයි. උසයි අනන්තයයි අතර උණුහුමයි. සුවයි. මං අද රෝසමලක් එක්ක නුවර යනවා. මං ඔයාට කොච්චර නම් ආදරේද නේත්‍රා.... ඔයාට තේරෙනවද?'

'ඔව්'

මම ඇඳුම් පැළඳුම් සකස් කර බෑග් ම වලට දමන අතර ම විශ්වට උත්තර දෙමි. ඔහුට කියන්නට තවත් බොහෝ දේ ඇතුවාක් මෙන් විශ්ව මා අසළ ම සැරිසරයි. දැවටෙයි.

'ඔයාට දැනෙනවාද නේත්‍රා මම සතුටින් ඉන්නේ කියලා.'

'ඔව් විශ්ව'

'ඇයි ඒක පෙන්වන්නෙ නැත්තෙ?'

ඔහු එසේ කියත් ම, මම අලුත් හැඟීමකින් පිබිදෙමි. මරා දමා තිබුණු විශ්වගේ හැඟීම් එකිනෙක උත්තේජනය වනු මට දැනේ. ඔහුගේ සුවඳ මම ආඝ්‍රාණය කරමි. ඔහුගේ සුසුම්වල උණුසුම මගේ දෙකම්මුල් ළඟ ම දැවටේ. මම ඔහුට මගේ කොඳුලත පාමින් සිටියෙමි. දැන් දැන් ඔහු සිටි සිටියේ මා වෙළා ගෙන සිප ගනිතැ යි මම සිතිමි. ඒත් මොහොතකින් ඔහු සුදුමැලි මළානික බවකින් යුතුව මගෙන් දුරස්

For E-Pusthakalaya

වන්නට පැරසිණ. මම ඔහුට යා නොදී ළඟට ගත්තෙමි. දෙවුරින් අල්ලා දෑසට එබුණෙමි.

'මට ආදරේ දැනෙනවා. ආදරේ තේරෙනවා. මටත් හදවතක් තියෙනවා.'

මම හෙමින් ඒත් උණුහුමින් තෙපළිමි. ඔහුට මගෙන් මිදෙන්නට ඉඩ නොදී අසළට හෙමින් ඇද ඔහුගේ දෙඅදර මගේ තෙත් දෙතොලින් සිප ගතිමි. මට බොහෝ වේලාවක් එසේ සිටින්නට ඕනෑ වි ය. ඒත් වතුරෙන් ගොඩ දැමූ මාළුවෙකු මෙන් විශ්ව දඟලා මගෙන් ඉවත් වි ය.

'ඇයි ආදරේ එපාද?'

මම තරහින් ද, දුකින් ද, කෝන්තියෙන් ද ව්‍යාකූලව ඇසුවෙමි.

'ආදරේ ඕන. පුතා දකීවි.'

'පුතා කාමරේ.'

'තාත්තා පහළ ඉන්නෙ දකීවි.'

'ඉතිං අපට මොකද?'

'තාත්තාටත් ඔයාගෙ ආදරේ ඕන වෙයි.'

'විකාර කියන්න එපා විශ්ව. මං ඔයාගෙනෙ.'

'තාත්තත් ඔයාට ආදරෙයි...'

'මං දෙන්නෙකුගේ ගෑණි නෙමෙයිනෙ?'

'තාත්තා දැක්කොත් ඔයා උස්සගෙන යයි.'

'ඔයා මොනවද මේ කියන්නෙ?'

'අර දවසක් නුවරදී ගෙනිච්චෙ බය කරලා.'

'ඒ ඉස්සරනෙ.'

'දැන් තාත්තා හොඳයිද?'

'ඔව් හරි හොඳයි.'

මම ඇතුළතින් නොසිතා මතු පිටින් වචන පිට කළෙමි.



ඔහු නැවතත් සන්සුන්ව මවෙතින් ඉවත් වි ය. මම ඔහු යන පසු මග බලා සිටියෙමි. විශ්ව ප්‍රකෘතියෙන් විකෘතියට ද, විකෘතියෙන් ප්‍රකෘතියට ද පත් වෙමින් සිටියි. මම රියැදුරාට කතා කොට බඩු මුට්ටු සියල්ල කාරයට පැටවීමි. එකතු කොට තිබූ සියලු මුදල් අතට ගතිමි. කාමරයට ගොස් ඉසිවරගේ ඇඟ සෝදා ඇඳුම් අන්දා අතින් අල්ලා පහළට කැඳවා ගෙන ආවෙමි.

'කොහෙද අම්මෙ අපි යන්නෙ?'.

'නුවර ආච්චියි සීයයි බලන්න.'

'වෙන කවුද යන්නෙ?'

'තාත්තත් යනවා.'

'කොයි තාත්තද?'

මම තුෂ්ණීම්භූත වීමි. ඒත් සැණෙකින් පිළිතුරු දිය යුතු වි ය. මම වචන ගැට ගැසීමි.

'පුතාගේ හොඳ තාත්තා. විශ්ව තාත්තා.'

'එතකොට අනිත් තාත්තා.'

'එයා ගෙදර. ගෙදර කවුරුත් නැනේ.'

'එයා පව්නේ?'

'පව් නෑ පුතා. හොඳ තාත්තා තමයි පව්.'

මම ඉසිවර කැඳවා ගෙන විශ්ව ඉන්නා කාමරයට ගියෙමි. ඔහු බලන්නෙකුට සිනා ගැන්වෙන තරමට පියරු මුහුණේ උළාගෙන සිටියේ ය. සුවඳ ගඳක් වන තරමට ම වත්සුණු තවරා තිබිණ. මම කිසිත් නොකීවෙමි. එහෙත් ලේන්සුව ගෙන විශ්වගේ මුහුණේ තිබුණු වැඩිපුර පුයර ඉවත් කළෙමි. පසුව ඔහු එහෙ මෙහ හරවා කෝල ලෙස හැඩ බැලීමි.

'දැන් හරි. එන්න.'

මම විශ්වට කතා කළෙමි.

'අපි තාත්තාට කියල යමු නේද්‍රා. තාත්තා දැන් හොඳයිනේ.'

For E-Pusthakalaya

ඔහු සැණෙකින් අනික් කාමරයට රිංගුවේ ය. ඉසිවර ද විශ්ව පසු පස වැටුණේ ය. මම සියල්ලන්ට ම පසුව දුල්ලෑවගේ කාමරයට ගියෙමි. මුලින් ම ඉසිවර කතා කළේ ය.

'අපි නුවර යනවා. ආච්චියි සීයයි බලන්න.'

දුල්ලෑව ඉසිවරගේ හිස ත් මුහුණ ත් අත ගෑවේ ය. පසුව නිකටෙන් ඔසවා ප්‍රශ්න කළේ ය.

'එතකොට පුතාගේ තාත්තා විතරයි ගෙදර.'

'අපි හොඳ තාත්තා එක්ක යන්නේ.'

'එතකොට මං තාත්තා පව්නේ...'

ඉසිවර විශ්වගේ මුහුණ බලන් ම, විශ්ව දුල්ලෑවට කතා කළේ ය.

'අපි නුවර යනවා තාත්තෙ.'

විශ්ව තිගැස්මෙන් යුතුව කීවේ ය. දුල්ලෑව හරි බරි ගැසී උත්තර දුන්නේ ය.

'මට උඹල දෙන්නම තාත්තා කියන්න ඕන නෑ. ඉසිවර පුතා තාත්තා කිව්වම ඇති.'

'ඉසිවරගේ තාත්තා මම'.

'උඹ වගේ පිස්සෙකුට පුළුවන්ද බං තාත්තා කෙනෙක් වෙන්න?'

දුල්ලෑව ගණනකට නොගෙන කීවේ ය. ඊන් විශ්ව එයින් ගිනි ගත්තේ ය. පිබිදී සිටි ඔහු හැකිළී ගියේ ය.

'මං නෙමෙයි. උඹයි පිස්සා?'

'පිස්සෙක් කවද්ද බං තමන්ට පිස්සු කියල කිව්වෙ?'

මා මැදිහත් විය යුතු වේලාව පැමිණ ඇතැ යි සිතා ඉක්මනින් මම කඩා වැදීමි. ඊන් සන්සුන්ව කතා කළෙමි.

'මේ ගමන අපිට හොඳින් ගිහිල්ල එන්න ඉඩ දෙන්න. පව්කාර කතා කියන්නෙ නැතුව.'

'හොඳින් ගියාට හොඳින් එන්න ලැබෙයිද මන්ද?'



'මූසල කතා'

'මූසල පිරිමින් එක්ක ගමන් යන්න එපා. තේරුණා... අනික ළමයෙක් හම්බවෙන්න ඉන්න අම්ම කෙනෙක් යන ගමනක්ද ඕක? පළවෙනි මාස තුනේ අම්ම කෙනෙක් ප්‍රවේශම් වෙන්න ඕන. ඉසිවර හම්බවෙන්න ඉද්දිත් මං ඔයාව කොච්චර පරිස්සම් කළාද? කමක් නෑ. ඔය යන ගමන ගිහිං එන්න. පරිස්සමින්. ඔය පිස්සා මොනව කරයිද කවුද දන්නෙ? මතකනෙ එක පාරක් හොඳටම ගැහුවා... එහෙනම් යන්න . මං ඩ්‍රයිවර්ට කියන්නම් නෝනා ළමයෙක් හම්බවෙන්න ඉන්න හින්දා ප්‍රවේශමෙන් යන්න කියලා. හා... හා.... හොඳයි එහෙනම් යනවා.'

දුල්ලෑව කාමරයෙන් එළියට යමින් කීවේ ය.

'අපි නුවර යන්න ඉස්සර මේ මිනිහ අංගොඩ දාන්න වෙයි. මෝඩයෙක් වගේ පල්හෑලි දොඩනව. අනුන්ගෙ සතුටට ඉරිසියා කරන තමන්ගේ දරුවන්ට ඉරිසියා කරන කුහකයා.'

මම එසේ කියා ගෙන ම කාරයට ගොඩ වීමට මිදුලට පැමිණියෙමි. විශ්වගේ ත් ඉසිවරගේ ත් සතුට හොරු ගත්තාක් මෙනි. දෙදෙනා ම මැලවුණු මුහුණින් ද කම්මැලි ගමනින් ද ඔතැනි ලෙස කාරය දෙසට ගමන් කළෝ ය. මම මගේ සිතේ කම්පනය පිටට නොපෙන්වීමට වෑයම් කළෙමි. අප කාරය දෙසට ගමන් කරන විට දුල්ලෑව රියැදුරුට යමක් කියා ගෙට ගොඩ වී ය. එ විට ම ඉසිවරගේ හිස අත ගෑවේ ය.

'මගේ පුතා බලන්න මමත් නුවර එන්නම්කෝ. මගේ පුතා අම්මව බලාගන්න. අම්මගේ බඩේ පැටියෙක් ඉන්නවානේ.'

දුල්ලෑව එසේ කියා මා දෙස ත් විශ්ව දෙස ත් හොරැහින් බැලුවේ ය. එහි තිබුණේ වනචර උපහාසයකි.

'සල්ලි තිබුණට පිට මිනිස්සුන්ට බෝධිසත්ව මුණු පෙන්නුවට තමුසේ අමනුස්සයෙක් තිරිසනෙක්.'

මම දුල්ලෑවට සමීප වෙමින් සෙස්සන්ට ඇසෙන නොඇසෙන හඬින් කීවෙමි.

ඊ ළඟට ඉසිවර කාරයේ ඉදිරි අසුනට දමා වාඩි කොට බඳ පටිය තද කළෙමි.

For E-Pusthakalaya

පුතාට ඒ කෙනාට හොඳට වටපිට පේනවා. ඔතන ඉන්න හොඳේ.'

මම ඉදිරි දොර වසමින් කීවෙමි. පසුව පසු පස දොර හැර පළමුව විශ්වට ඉඩ දුනිමි. ඔහු රොබෝ කෙනෙකු මෙන් වාඩි වී ඉදිරිය බලා ගත්තේ ය. මම අනෙක් පැත්තෙන් වින් කාරයට ඇතුළු වීමි.

'යමු.'

වඩා ඉක්මනින් විශ්ව දොඩමලු කර ගැනීමට මට ඕනෑ වි ය. ඔහුගේ සිතේ තිබූ ආනන්දජනීය ප්‍රේමය ද, සෙනෙහෙබර හැඟීම් ද, ප්‍රියාදර වදන් ද රුදුරු ගින්නකින් දැවී ගියාක් මෙන් නිහඬ වි ය. නිසසල ය. ජීවිතයේ මා බොහෝ වරක් ආදරය කළ, නිර්මල ලෙස ප්‍රේම කළ මේ උත්තම මිනිසා නිහඬව සිටීනු මට දරා ගත නොහැකි කනස්සල්ලක් ම ගෙනාවේ ය. ඔහුගේ මුහුණ මත ඇඳි වේදිකාව මට කුමන රංගනයකට මග සකස් කරන්නේ දැයි මම හොරැහින් බැලුවෙමි. මා දුටුවේ ඔහුගේ ශාන්තවත් මුහුණ අඳුරු වී ඇති සැටියෙකි.

මුහුණට මුසු වන්නට සැරසුණු සිනාව ඒ මත ම කුනී වී ඔහුගේ මුහුණ වෙස් මුහුණක සිරි ගෙන තිබිණ. මට අවැසිව තිබුණේ දැඩි ප්‍රේමයෙන් බැඳී පෙම් සුව විඳින්නට ය. දුකින් අත් මිදෙන්නට ය. අවසන ඔහු සමඟ නැවත ජීවිතය පටන් ගන්නට ය. පණ අදින අහිංසක අසරණයෙකු තරමට ම විශ්ව අඳුරු දැසින් යුතුව වියළී ගොස් සිටියේ ය. මම දැවෙමින්, පිච්චෙමින් සිටියෙමි.

'විශ්ව ජීවිතය දුෂ්කරයි. මගේ පැත්තට එන්න. ළඟට එන්න. ඔළුව මගේ උකුළේ තියා ගන්න.'

මම ඔහුගේ කණට කොඳුරා කීවෙමි. දෙසවන ද බිහිරි වූවා සේ ඔහු නිසසල ය. නිහඬ ය. මගේ දෑස මට ත් හොරෙන් හඬන්නට වි ය. හඬන මගේ ඇස් එක් ඉරියව්වක සිට ඔහු දෙස බලන්නට වි ය. ඔහුගේ නැහැ, දෙඅදර, දෙකොපුල්, දෙනුවන්, දෙබැම ඔහුගේ ආශ්වාස ප්‍රශ්වාසය.

'විශ්ව'

මම කෙඳිරුවෙමි.

මගේ දෑස වෙනත් කවර දාකට ත් වඩා තෙත් වන්නට වි ය. බර කඳුළු උණු උණුවේ දෙකොපුල් දිගේ ගලා යයි. පිහියකින් මගේ ළය



සිදුරු කර ගන්නට මට සිතේ. බ්ලේඩ් තලයකින් දෙකම්මුල් ඉරා ගන්නට සිතේ. මගේ දෑත සට සට ගා වෙව්ළන්නට වි ය.

මම විශ්ව ළඟට හෙමින් සමීප වී දෑත එකතු කොට ඔහුට වැන්දෙමි.

'ඔයා හරි පූජනීයයි විශ්ව. දැන් ඉතිං කතා කරන්න.'

මම පහත් ස්වරයෙන් මිමිණුවෙමි. ඔහුගේ සිත අවකාශයේ පාවෙනු මට දැනේ. මා එය එක්තැන් කොට දෙන්නේ කෙසේ ද?

For E-Pusthakalaya

# 28

ඒ වූ කලී ඉතා දිගු නිහැඬියාවකි. හැඟීම්වල බර පීඩිතව හදවතට වධ දුන් ගැඹුරු කාල අන්තරයකි. මා ළඟ හුන් විශ්ව මෙ තරම් ම සංවේදී මෙ තරම් ම දයාර්ද්‍ර කෙනෙකු බව මට දැන් දැනුණා මෙන් ය. ඉතාමත් ම අපහසු ඉරියව්වකින් මම විශ්ව දෙස බලා සිටියෙමි.

මග තොට බොඳ වන නගර, මංමාවත්, ගහකොළ කිසිවක් මගේ දෑසට හසු වූයේ නැත. ශාන්ත ගමනින් කාරය නුවර දෙසට ඇදී යයි. රියදුරා අකුරට ම, සීරුවට රිය පදවයි. නන්නාඳුනනා සිව් දෙනෙකු මෙන් අපි බොහෝ දුරක් ගමන් කළෙමු. ඇහි පිල්ලම්වල මකුළු දැලක් බැඳෙනවාක් මෙන් මගේ දෑස දැල ම නළියයි. මම ඇහි පිල්ලම් ගසා දෑසට ප්‍රකෘතිය දුනිමි. ජනෙල් අතරින් මට ඉත්තක වසා සිටින කළු හිසක් සහිත කහ කුරුල්ලෙකු පෙනේ. මොහොතකින් තවත් නගරයක්, වංගුවක්, වීදියක් අප පසු කරයි. ඉසිවරට හොඳටෝ ම නින්ද ගොස් ය.

'විශ්ව.'

මම හුදෙකලාව බිඳිමි. මා තුළ ම දෝංකාර දුන් ආමන්ත්‍රණය මම දෙතොලතරින් හිමිහිට මුදා හරිමි. ඔහු යාන්තමට මා දෙස බලයි.

'අපි කාරෙක නවත්වලා තැඹිලි බොමුද?'

විශ්වගේ දෑස මා මග හරින්නට නොහැකි තරමට මා තුළට ම එබුණු විටෙක මම කීවෙමි. බොහෝ වේලාවකට පෙර සිට ම ඔහු මා වෙත දෑස එල්ල කරන තෙක් මම බලා සිටියෙමි.

'තැඹිලි සීතලයි.'

මගෙන් මුදවා ගත් ඇස් අවකාශයේ තනි කරමින් විශ්ව කීවේ ය.



තමන්ට ප්‍රතිපක්ෂ ප්‍රතිමල්ලවයෙකුට මෙන් විශ්ව උත්තර දුන්නත්, මගේ අදහසට රුචියට ඔහු විරුද්ධ වුණ ත් මම විශ්ව කතා කිරීම නිසා ම සතුටු වීමි. සත්තකින් ම මට තැඹිලි බොන්නට ඕනෑ වී තිබුණේ නැත. ඔහු කැමති දේ හෙළි වන තෙක් ම මම කතා කළෙමි.

'එහෙනම් තේ එකක් බීල යමුද?'

'බෑ.'

'ඔයාට බඩගිනි නැද්ද විශ්ව?'

'නෑ'

'අපි කජුගමින් කජු අරන් කමුද?'

'ඕන නෑ.'

'කාලෙකින් හින්ද ගෙදර යන්නෙ, මොනව හරි අරන් යන්න වෙයි.'

කතා කොට, කතා කොට, ප්‍රශ්න සහ උත්තරවලින් නෙහෙට්ටු වන්නට පෙර මම ඔහු කොටු කර ගත්තෙමි.

'මගදී මොනව හරි ගමු.'

මග දී යැයි කීව ද ඒ වන විට අපි වරකාපොළ, අඹේපුස්ස තානායම ද පසු කරමින් සිටියෙමු. කෑගල්ල ආසන්නයේ ඇති කඳුගැටය නගින විට මට කඩුගන්නාව පල්ලම මතක් වි ය. එදා ප්‍රපාතයේ නැහැණු විශ්වගේ විලාපය සිහි වි ය. රෝහලේ විඳි වේදනා සිහි වි ය. ඔහු රෝගියෙකු වීම: විශ්වගේ මව: දුල්ලෑව: කුස ඔත් දරුවා: ලීලා... පීඩනය.... විශ්වගේ නිවසේ ගත කළ වසර කීපය, හිර ගෙදරකින් නිදහස් වී නිවසට යනවා වැනි සරල සැහැල්ලුවක් මා තුළ නළියන්නට වි ය. මම ඉදිරිය බලා ගෙන ම ගමන් කරමින් සිටියෙමි. විශ්වගේ මුහුණේ ඉරියව් පැති කන්නාඩියේ පිළිබිඹුව මට පෙනේ.

මම හිමින් හිමින් විශ්වගේ අත අල්ලා ගතිමි.

'විශ්ව...'

'මම ඔබේ, මාව සුරකින්න, මම ඔබට ආදරෙයි' වැනි හැඟීම් රසක මිහිර මට ඔහුට කියන්නට ඕනෑ වි ය. මා 'විශ්ව' යැයි කීවේ එකී සියල්ල ම ආදරණීය අකුරු තුනකට එක්කාසු කොට ගනිමිනි.

For E-Pusthakalaya

'ගෙදරට ගන්න ඕන දෙවල් නුවර ටවුමෙන් ගනිමු.'

ඒ වූ කලී විශ්වගේ පිළිතුර යි. මා ඔහු වෙතින් නැවතත් දුරස් වන බවක් හැඟිණි.

'ඔයා තරහින් ඉන්න එපා විශ්ව.'

'නැ.'

'මං ප්‍රශ්නයක් ආවම ඔයා ගැන හිතල හිත සැහැල්ලු කර ගන්නවා. හිතට දුකක් දැනුණම ඔයා ගැන හිතල ඒකට සතුට මුසුකර ගන්නවා. ඔයා නිසා දුකක් ආවොත් ඉසිවර පුතා ගැන හිතනවා. අපි ගැන හිතල ඔයත් සතුටින් ඉන්න.'

මම ටිකක් දුරට වත් ඔහු සැහැල්ලු වෙතැ යි සිතා බොහෝ දුරක් යන තෙක් දිගට ම කතා කරමින් ගියෙමි. ඉසිවර ද ඇහැ නිදිමතේ ම අඩ නින්දේ ම වටපිට විපරම් කරමින් සිටී. හිටි හැටියේ ම විශ්ව රියදුරාට අණ කළේ ය.

'ඔතන ඔය උඩ වංගුවේ වම් පැත්තට කරල නවත්වන්න....'

සැණෙකින් විශ්වගේ අණ පිළිගත් රියදුරා කාරය වංගුවේ දී වමට හරවා නතර කළේ ය.

'ඔක්කොම කාරෙකෙන් බහින්න.'

විශ්ව අණ කළේ ය. මාත් විශ්ව ත් එදා අනතුරකට ලක් වූ ස්ථානයේ දකුණු පැත්තේ වැට කැඩී ගිය තැන තවමත් එහෙම ම ය. අපි සිව් දෙනා ම එ තනට ගමන් කළෙමු. එ තැන සිට බලන විට පහත බොහෝ ඈත ගම් දනව් ද පෙනේ. මාවනැල්ල මිටියාවත ද සිහින් කඳුගැට කීපයක් ද එ තැනට පෙනේ. අප කාරය ත් සමඟ පෙරළුණු ප්‍රපාතය දෙස විශ්ව බොහෝ වේලාවක් බලා සිටියේ ය. රියදුරා ඉසිවරගේ අතින් අල්ලාගෙන සිටී. විශ්ව තනිව ම කතා කළේ ය.

'මෙතනදි තමයි මම මැරුණේ. මෙතනදි තමයි මගේ පෙම්වතිය මැරුණේ. මෙතනදි තමයි අපේ ආදරේ මැරුණේ. මේ ප්‍රපාතයේ කොතන හරි මම හැංගිලා ඇති. තේජාත් ඇති. අපි දෙන්නගේ ආදරේත් ඇති. පොඩිවෙලා කුඩුපට්ටම් වෙච්ච ගහකොළ පණ දාල කොළම කොළ පාටට හැදිල තියෙන්නේ අපේ ආදරේ රස පොහොර ලැබිලා.'



විශ්ව කියා ගෙන ගියේ ජපන් හයිකූ කවියෙකුගේ ප්‍රේමනීය මනෝලෝකයක භූතාත්මයක් සිහි ගන්වමිනි. විශ්වගේ [illegible] කවර දාකට වත් වඩා තෙත් වී තිබිණ.

'ඇයි අම්මා?'

ඉසිවර ඈත සිට ප්‍රශ්න කළේ ය. උත්තර දුන්නේ විශ්ව යි.

'ඉසිවර ... පුතේ. උඹ මෙතන තමයි ඉපදුණේ.'

විශ්ව එසේ කී සැණින් ඉසිවර දුව විත් මගේ අතෙ [illegible].

'මං ඉපදුණේ මේ කැලේද අම්මේ ?'

ඉසිවර ප්‍රශ්න කළේ ය. විශ්වට පෙර පිළි[illegible] වූ බව මට වැටහිණ.

'ඒක ඉස්සර වෙච්ච සිද්ධියක් පු[illegible]'

'ඇයි මං මේ කැලේ ඉප[illegible]?'

'නැ පුත , පුතා උපන්නේ [illegible] කොළඹදී. මෙතන තමයි මමයි, තාත්තයි නුවර ඉඳලා එද්දි [illegible] පෙරළුණේ.'

'කොයි තාත්තද?'

'මෝඩ ප්‍රශ්න අහන්න එපා. තාත්තයි. මමයි.'

මම පිළිතුරු දුනිමි. තව දුරටත් කතා කිරීමට පෙර විශ්ව සුසුමක් පිට කළේ ය. සීතල කඳු මුදුනේ සිට එකී සුසුම සිහින් මඳනළට එකතු වන්නට ඇත.

'යමු.'

විශ්ව අණ කරත් ම අපි නැවතත් කාරයට ගොඩ වීමු.

නුවර දී කාරය නවතා ගෙදරට අවශ්‍ය බඩු භාණ්ඩ ද, නැඟි බෝග ද, කෑම බීම ද අපි මිල දී ගතිමු. ඉසිවරට සෙල්ලම් බඩු කීපයක් ද මම මිල දී ගතිමි. කාරයෙන් බැස නුවර පදික වේදිකාවට පය තබත් ම මගේ ඇඟ කිළිපොළා ගියේ ය. 'මගේ මහ පොළොව' වැනි හැඟීමක් මට දැනිණ. ඇදී ඇදී, නැවත නැවතී සුසුමක් විරාම තබමින් මගේ මුවින් ගිලිහිණි. ටික වේලාවකින් අපි කටුගස්තොට ගෙදරට පිවිසියෙමු.

ගැටලු සිය දහස් ගණනක් පොදි ගසා ගෙන ගෙට ගොඩ වූ අපි නැගි බෝග සියල්ල සාලයේ ටීපෝව මත තැබුවෙමු. ගෙදර සිටියේ අම්මා පමණි. අපි මුලින් ම අම්මාට දණනමා වැන්දෙමු. අම්මා ඉසිවර වඩා ගත්තේ ය.

'අපි ටික දවසක් නවතිනව අම්මේ.'

විශ්ව කතා කළේ ය. ඔහුගේ ප්‍රකාශය මගේ සතුට වැඩි කරන්නක් වි ය.

'ටික දවසක් නෙමෙයි හැමදාම වුණත් හිටියම මට මොකෝ. මගේ දරුවෝ අපිව බලන්න ආපු එක මොන තරම් දෙයක්ද? මං ගිහිල්ල තාත්තට කියල එන්නම්.'

'ඕන නෑ අම්මේ. තව ටිකකින් මං විශ්වත් එක්ක කඩේට ගිහිං එන්නම්.'

කාරය ගෙදරට හැරවීමට පෙර මම තාත්තාගේ කඩය දෙස හොරැහින් විපරම් කළෙමි. 'සරස්වතී ග්‍රොසරි' නම් දැවැන්ත නාම පුවරුව තාත්තාගේ දියුණුව රටට ම පෙන්වන්නක් මෙන් වි ය.

'අද හෙට ආවෙ නැත්නම් තාත්ත කොළඹ යන්න හිතාගෙන උන්නේ. තාත්තා ගිය සුමානෙ වෑන් එක ගත්තා. ඒක උඹලට පෙන්නන්න බොහොම තදියමේ උන්න. ඔක්කොමත් එක්ක වෑන් එකේ කතරගම යන්න ඕන කියල තමයි ඔය කිය කියා ඉන්නේ.'

සවස් වන විට අපි කටුගස්තොට ගෙදර දින කීපයක් නැවතීමට අවශ්‍ය වන පරිදි අත්‍යවශ්‍ය සියලු දේ සම්පාදනය කොට ගත්තෙමු. ඉසිවර තාත්තා සමඟ කඩයට ම වී සිටී. මම ඉස්සරහා කාමරය අපිට අවශ්‍ය පරිදි සකස් කළෙමි. විශ්ව බොහෝ සැහැල්ලුවෙන් සක්මන් කරමින් මිදුලේ සැරිසරයි. වැව දෙසට යයි. ඉස්තෝප්පුවට පිවිසෙයි. මා ඉන්නා කාමරයට එබෙයි. අම්මා ඉන්නා කුස්සිය පැත්තට ගමන් කරයි..

.අම්මා කාමරයට විත් මගෙන් මේ ගැන විමසුවේ ගුප්ත මිනිසෙකු පිළිබඳ විමසන පිරිසර ගැහැණියක මෙනි.

'තවම සනීප නැද්ද දුවේ?'

'දැන් හොඳයි. ඔය කම්මැලිකමට ඇවිදිනව ඇත්තේ. අම්ම මගෑර මගෑර ඉන්නෙ නැතුව ගිහිං කතා කරන්නකෝ.'



අම්මාට විශ්ව සමඟ කතා කළ යුතු බව වැටහුණේ දැන් වගේ, කාමරයෙන් නික්මුණා ය. මම අම්මා ත් සමඟ ම මිදුලට ගියෙමි. මා දුටු සැණින් විශ්ව කතා කළේ ය.

'නේත්‍රා කොහෙද අර ඔලිඳ ඇළ තියෙන්නෙ?'

'ඔය ඉස්සරහ හංදියෙන් දකුණට ගිහිල්ල ගුරුපාර දිගේ යන්න ඕන.'

'තවමත් ගුරු පාරේ කුත්තිරි තියෙනවද දන්නෙ නෑ?'

'නියර දිගේ ගියොත් කුත්තිරි තියෙනවා.'

මම පිළිතුරු දුනිමි. අම්මා මැද්දට පැන්නා ය.

'මොකටද පුතේ කුත්තිරි. ඕනකමකට නම් ඔය කොල්ලන්ට කිව්වම ලොරියක් වුණත් එකතු කරගන්න බැරියෑ.'

මම අම්මාට රැව්වෙමි. අම්මාට තේරුණේ නැත. එහෙත් අම්මාගේ කතාව නිසා විශ්ව අම්මා සමඟ කතාවට වැටුණේ ය. විශ්ව දිගින් දිගට ම අම්මා සමඟ කතා කළේ ය.

'මේ ළඟපාත හොඳ දොස්තර කෙනෙක් ඉන්නවද අම්මා...?'

'හොඳ දොස්තරල හොයන්න නම් ඉතින් නුවරටම යන්න වෙනවා. ඇයි විශ්ව පුතාට මොකුත් වුවමනාවක්ද?'

'නෑ අම්මෙ.... නේත්‍රාව පෙන්නන්න ඕන. යූරින් ටෙස්ට් එකකට. නේත්‍රා ආයෙත් අම්ම කෙනෙක් වෙන්න යනවලු.'

විශ්ව කියා ගෙන ගියේ ය. මම හිරි වැටී ගියෙමි. අම්මා මා දෙස බැලුවා ය. විශ්ව නැවත නැවතත් කතා කළේ ය.

'දොස්තර කෙනෙකුට පෙන්වන එක කෝකටත් හොඳයි පුතේ.'

අම්මා මා දෙස බලා කීවා ය.

'මමත් හිතා ඉන්නෙ දොස්තරටම පෙන්වලා දැන ගන්න. අපේ තාත්තා කියන ඒව විශ්වාස කරන්ඩ බෑ. බොරුකාරයානේ.'

විශ්ව නිකමට කියා ගෙන ගියේ ය. මට මහ පොළොව පළා ගෙන යන්නට ඕනෑ වි ය.

For E-Pusthakalaya

# 29

මට සිය දිවි නසා ගන්නට සිතෙන්නේ මගේ පෞද්ගලිකත්වය බාහිර සමාජය ඉදිරියේ දිග හැරෙන්නට පටන් ගන්නා විට ඇති වන මානසික නොසන්සුන්කම නිසා ය

විශ්ව මා එවන් තත්ත්වයකට නොසිතා ම තල්ලු කරමින් සිටී. නැහැ. ඔහු මට ආදරය කිරීමට මගේ පවිත්‍රත්වය සොයන විට මම අති බිහිසුණු ඉරණමකට තල්ලු වෙමින් සිටිමි. මම ගැඹුරු අගාධයකට පෙරළෙමින් සිටිමි. එහෙත් විශ්වට එය සරල එදිනෙදා සිද්ධියකි. මා ගැබ් ගෙන ඇතැ යි ඔහු තුළ ද ලියැවුන් පවතින සැකය ඔහුට අල්ලාප සල්ලාපය සඳහා උණුසුම් මාතෘකාවකි. 'නෝනා ඩොක්ටර් කෙනෙකුට පෙන්වන්න ඕන.' යනුවෙන් ඔහු සීයට අම්මා ඉදිරියේ බැඳීම් රහිත වචන පෙළක් වමාරමිනි.

තමන්ගේ ම ආදරණීය බිරිඳට තමන් සම්බන්ධ නොමැති සීමාවක දී දරුවෙකු ලැබීමට යයි ඇතැ යි සිතීම ම පිරිමි ශරීරය, මිනීමරු ශරීරයක් කිරීමට ප්‍රමාණවත් සිතුවිල්ලකි. බිරිඳගේ ගෙල කපා මරා දැමීමට තරම් පිරිමියෙකුගේ ආත්මාර්ථකාමී ලිංගික කෝපය අවුස්සන්නකි. එහෙත් එකී සංසිද්ධිය ම විශ්වට සරල සමීකරණයකි. ඔහු දිගින් දිගට ම අම්මා සමඟ කතා කරමින් සැහැල්ලු කයින් යුතුව සක්මන් කරයි. කයින් සැහැල්ලු විශ්ව කෙතරම් ප්‍රමාණයක් සිතින් මානසික බර දරා සිටී ද යන්න මම නොදනිමි.

එය මෑ: එකී සංසිද්ධිය ම අපේ අම්මාට තමන් පින්වන්ත ආත්තම්මා කෙනෙකු කරන සංතෘප්තිදායක සුභාරංචියකි. මගේ පවුල් ජීවිතයේ සාර්ථකත්වය පිළිබඳ දෙවන සාක්ෂිය මගේ කුස තුළ තහවුරු වීමකි. අම්මාගේ මුහුණේ ඉරියව් හා සතුටු සිනා රැල්ල ඇ සැඟවීමට උත්සාහ නොකරයි. ජීවිතයේ කටුක අගාධයේ දරිද්‍රතා පත්ලේ සිට 'පවුල ගොඩ ගත්තේ උඹ තමයි දුවේ' වැනි නියමතක අම්මාගේ ගාථා පොතේ පවා සටහන වෙයි. 'සරස්වතී ග්‍රොසරිය' අපේ පවුලේ දියුණුව පිළිබඳ කටුගස්තොට නගර වැසියන්ට ඇති ප්‍රත්‍යක්ෂ සාධකය යි. තාත්තාගෙ අලුත් වෑන් රථය නුවර වැසියන්ට අපේ දියුණුව පෙන්වන ජංගම ප්‍රාග්ධනය යි. මේ සියල්ල සඳහා මා සින්නක්කර ම දුල්ලෑට පරම්පරාවට ලියා දී තිබේ. මේ නිසා ම ඔවුහු ඔවුන්ගේ ඒක පාර්ශ්වික ආශාවන් මගේ ශරීරය මත බලහත්කාරයෙන් ම ලියාපදිංචි කරති.

මේ දෙබිඩි තුංමංසලේ අතුරු පාරවල ඉසිවර දුව පැන ගත්තේ වයි. ඔහු අපේ තාත්තා සමඟ මුළු සවස් වරුව ම 'සරස්වතිය' ට වී කාලය ගත කළේ ය. ඔහු ගත කළේ චොක්ලට්, සීනි බෝල හා ලොලි පොප් අතර දියුවුණු අපේ තාත්තාගේ සෙනෙහෙවත් ප්‍රාග්ධනය අතර යි. එහෙත් ඒ නියම ප්‍රාග්ධන හිමිකරුවා ඔහුගේ නාමික හිමිකාර තාත්තා නොව දුල්ලෑව බව ඉසිවර දන්නේ නැත.

ඉසිවර, විශ්ව, දුල්ලෑව, අම්මා හා තාත්තා මවෙතට දක්වන ප්‍රතික්‍රියා ඉලෙක්ට්‍රොනික කිරණ සමූහයක් මෙන් මා වෙත ම සංකේන්ද්‍රණය වෙයි. යමෙකුට අවකාශයක තබා බිහිසුණු ලෙස පහර දීමක් බඳු ගන්ධබ්බ ප්‍රහාරයකට මම හසු විමි. සත්තකින් ම මම බිම් බෝම්බයකට හසු වී අතරමං වූවෙකු මෙනි.

'අම්මේ මම විශ්වත් එක්ක ගිහිල්ල ඩොක්ටර් කෙනෙක් මුණ ගැහිලම එන්නම්. කෝකටත් හොඳයිනේ.'

මා අම්මාට කීවේ විශ්ව දෙස බලා ගෙන ය.

'මමත් එන්නම් පුතේ...'

අම්මා ඉස්සර වූවා ය.

'ඕන නෑ. අසනීපයක් නෙමෙයිනේ. ඩ්‍රයිවර් එක්ක අපි දෙන්න ගිහින් එන්නම්. අම්ම පොඩ්ඩක් ඉසිවර පුතා ගැන කල්පනාවෙන් ඉන්න.'

මම සූදානම් වෙමින් කීවෙමි. විශ්ව ඒ සමඟ ම රියදුරාට කතා කොට මටත් පෙර කාරයේ ඉදිරි අසුනේ වාඩි වූයේ ය.

මම නැති ගතිමි.

මම මධුසමය ගත කිරීමට ගොස් පිරිසුදු බව ඔප්පු කොට ගත නොහැකි වූ අවිහිංසාවියක මෙන් තැති ගතිමි. එහෙත් මම අවිහිංසකාවියක් නොවෙමි.

For E-Pusthakalaya

මම උග්‍ර සමාජ රෝගයකින් පෙළෙතැ යි සලකා වෛද්‍යවරයෙකු හමුවට පත් කිරීමට සැරසෙන පාසල් ළදැරියක මෙන් විස්සෝප වීමි. එහෙත් මම පාසල් ළදැරියක නොවෙමි. ව්‍යාධියකින් පෙළෙමි. වෛද්‍ය සහතිකය ලබා ගත යුතු ම ය:

'යමු'

මම කාරයට නැඟ දොර වසා ගතිමි. කාරය 'සරස්වතිය' දෙස නොබලා ම වාගේ නුවර දෙසට හැරවෙයි. විශ්ව ඉදිරි අසුනේ සිට ම හිස මා දෙසට හරවයි.

'නේත්‍රා...'

'ඇයි විශ්ව.'

'මම වලාකුළ වෙන්නම්. ඔයයි සඳ. එහෙම කිව්වෙ කවුද?'

'මම දන්නෙ නැ විශ්ව.... මට මතක නැ...'

'මම මගේ දෑතින්ම ඔබ වසා ගන්නම්. එවිට අපේ ගෙයි පියස්ස අහස බවට පත්වෙයි. එහෙම කිව්වෙ කවුද?'

'මට හරියටම දන්නෙ නැ.'

'මම දියරැලි වෙන්නම්, ඔයා නාදුනන වෙරළක් වන්න. මම දිගටම පෙරළි, පෙරළී සිනාසී ගෙන ඔබේ ඔඩොක්කුවේ වැටෙන්නම්. එහෙම කිව්වෙ කවුද?'

'මම ඒව ගැන ඔයා තරම් දන්නෙ නැ විශ්ව. මම අහල නැ මට මතක නැ. තරහ ගන්න එපා.'

මම හැඬුම්බර, හැඟිම්බර, ආයාචනා හඬක සුසුම් ස්වරයෙන් කීවෙමි.

'මම තරහ ගන්නෙ නැ. ඔයාට ළමයෙක් ලැබෙන්න ඉන්නවද? මගේ සම්බන්ධයක් නැතුව එහෙම වෙලා කියල ඔයා දන්නවද? එහෙම වෙන්ඩ පුළුවන් කියල ඔයා දන්නවද? ඇත්ත නැත්ත වෙන් කර ගන්ඩ පුළුවන් ඩොක්ටර් කෙනෙක් ඉන්න තැනක් ඔයා දන්නවද?'



'ඔව්. සේනානායක මාවතේ වම් පැත්තෙ ඩොක්ටර් සිල්වා ගාවට යමු.'

මම එසේ කියා පිටු පස අසුනට බර වීමි.

මරණ දඬුවම නියම කිරීමට දඬුවමේ ස්වභාවය තීරණය කරන සහතිකය ලබා ගැනීමට විත්තිකාර මම ත්, පැමිණිලිකාර විශ්ව ත් ඩිස්පෙන්සරියේ සැලුන් දොර විවර කොට වෛද්‍යවරයා හමුවට පිවිසියෙමු.

'එන්න වාඩි වෙන්න.'

වෛද්‍යවයාගේ කාරුණික වෘත්තික හඬ අපට අණ කළේ ය.

'කවුද අසනීපකාරයා?'

වෛද්‍යවරයා අප දෙදෙනා දෙස ම මාරුවෙන් මාරුවට බලද්දී අසනීපකාරයා, රෝගියා තෝරා ගැනීමට මෙන් මම ත් විශ්ව ත් අපි දෙදෙනාගේ ම මුහුණු බලා ගතිමු.

'මම'

අසුනේ වාඩි වෙත් ම මා පිළිතුරු දුන්නේ, මට පෙර විශ්ව එම අසුනේ ඉඳ ගැනීමට ඉඩ ඇතැ යි සැක සිතුණු හෙයිනි.

'කාරණය?'

වෛද්‍යවරයා තම රෝග පරීක්ෂා නළාවේ දෙකෙළවර කණේ රුවා ගනිමින් විමසී ය. මම නතනද්දී විශ්ව ඉස්සර වි ය.

'ඩොක්ටර්... මම විශ්ව. මෙයා නේත්‍රා. අපේ තාත්තා ඉලංගකෝන් දුල්ලෑව. මම මෙයාව බැඳල ඉන්නෙ. අපි ඉන්නෙ කොළඹ. රාජගිරියේ. මෙයාගෙ ගම නුවර. මෙයාගෙ තාත්තටයි කටුගස්තොට සරස්වතී ග්‍රොසරිය අයිති. අපේ පුතා ඉසිවර. අපි නුවර ආවෙ අද උදේ.'

'මොකක්ද අසනීපය?'

වෛද්‍යවරයා මට ත් වඩා විශ්ව තෝරුම් ගන්නා අටියෙන් විමසා පුටු ඇන්දට බර වූයේ අසනීපයට පෙර තවත් බොහෝ දේවල් ඇසීමට සූදානමින් මෙනි.

'අපේ ගෙදර කලින් හිටිය ලීලා කියල වැඩකාරියක්. එයා දැන් ඉන්නෙ නුවර. මේ ගමන්ම අපි එයා බලන්නත් යන්න ඕන. අපේ ගෙදර

For E-Pusthakalaya

උඩ තට්ටුවෙ කාමරයක තමයි නේත්‍රයි, පුතයි ඉන්නෙ. මමයි තාත්තයි ඉන්නෙ පහළ තට්ටුවේ. [illegible] ඉස්සර අපේ අම්මා එල්ලිල මැරුණා. ඉතින්...

'මගෙන් මොකක්ද කෙරෙන්න ඕන'

වෛද්‍යවරයා විමසුවේ ය. මම විශ්වට පෙර පිළිතුරු දුනිමි.

'යූරින් ටෙස්ට් එකක් ගන්න.'

'කාගෙද?'

'මගේ'

විශ්ව නැවතත් අප අතරට පැන තොරතුරු කියන්නට වි ය.

'අපේ තාත්ත කියනව නේත්‍රට බබෙක් හම්බ වෙන්න ඉන්නව කියලා. තාත්ත කිව්වට විශ්වාස කරන්න බැහැනේ. ඒකයි ඩොක්ටර් කෙනෙකුට පෙන්වන්න අපි තීරණය කළේ. නේත්‍රගෙ අම්මටත් කියලයි අපි ආවේ.'

වෛද්‍යවරයා සියල්ල නිශ්චය කර ගත්තාක් මෙන් තලාව මේසය මත තැබුවේ ය.

'හොඳයි... මහත්මියා එළියෙන් ඉන්න. නෝන මේ බෝට්ල් එකට යූරින් ටිකක් අරගෙන එහා පැත්තෙ ලැබ් එකට දීලා එන්න. රිපෝර්ට් එක පැය බාගයකින් දෙන්නම්.'

මම තවත් මොහොතක් වත් නොරැඳී නියමිත කාර්යය සඳහා සූදානම් වුණෙමි.

'බය වෙන්න එපා නේත්‍රා. තව පැය භාගයකින් ප්‍රශ්නෙ ඉවරයිනේ.'

විශ්ව මගේ අතින් අල්ලා ගෙන කීවේ ය. මගේ දෑස ගිනි පිට කරමින් සිටී. දෑත අඬසියෙන් සෙත් වී ගොස් ය. මම ලේන්සුවෙන් දහදිය සෙත මාත්තු කොට ගතිමි. දෙකොපුල හරහා දහදිය සමඟ කඳුළු ගලන්නට පටන් ගත්තේ ය. තව ස්වල්ප වේලාවකින් වැදූ පිඳූ දෙවොල හිස මත කඩා වැටෙනු ඇත. පූජාසනය ඉරී තැළෙනු ඇත.

'මට කලන්තෙ වගේ විශ්ව.'



මම ඔහුට බර වීමි. ඔහු මගේ හිස පිරි මදින්නට වි ය.

'බය වෙන්න එපා. මම ඉන්නවනේ.'

ඔහු ගැටවර පෙම්වතෙකු මෙන් කීවේ ය. මම දෑස පියා බොහෝ වේලාවක් සිටි ඉරියව්වේ ම සිටියෙමි. සන්නිපාත උණ රෝගියෙකුට මෙන් මට විකාර සිහින පෙනෙන්නට වි ය. ඩිස්පෙන්සරියේ තැන තැන සිටින සියලු ම රෝගීන් මා තරම් අසරණ නැතැ යි මම සිතමි. මේ මොහොතේ ලොව සිටින අසරණ ම අසාධ්‍ය ම රෝගියා මම වෙමි.

'ඔයාගෙ රිපෝට් එක හරි.'

හෙදියක් අපේ මුහුණු නොබලා ම කොරිඩෝව දිගේ කඩිනමින් ගමන් කළා ය. කෙ තරම් අකාරුණික ද?

අපි දෙදෙනා ම නැවතත් වෛද්‍යවරයා අභිමුවට ගියෙමු.

'මහත්තයා පොඩ්ඩක් එළියෙන් ඉන්න.'

දොස්තර කී සැණින් විශ්ව ඒ තැනින් නික්මුණේ ය.

'ඇවිල්ල ඉන්නෙ තමන්ගෙ මහත්තයනේ.'

'ඔව් ඩොක්ටර්.'

මම පිළිතුරු දුනිමි.

'දැන් ලොකු ළමයගෙ වයස කීයද?'

'අවුරුදු තුනට ළඟයි.'

'තව ළමයෙක් ගැන බලාපොරොත්තුවක් තියෙනවද? රිපෝට් එක පොසිටිව්. බබෙක් තමයි.'

මම පොළොවේ සිට අහසට පතිත වීමි. සැණෙකින් අගාධයට මා මුදා හැරෙනු ඇත. විශ්ව කාමරයට පිවිසියේ ය. වෛද්‍යවරයා විශ්වට ආමන්ත්‍රණය කළේ සතුට මුසු සැකයකිනි.

'තාත්ත වාසනාවන්තයා. රිපෝට් එක පොසිටිව්.'

විශ්ව කලබල වූයේ නැත. පසු පසට අත දමා පර්ස් එක ගෙන වෛද්‍යවරයාගේ ගාස්තුව ගෙව්වේ ය.

'මගෙන් සුබ පැතුම්.'

For E-Pusthakalaya

'තැන්ක් යූ ඩොක්ටර්.'

විශ්ව සතුටින් ප්‍රතුව කීවේ ය.

විශ්ව මගේ අතින් දැඩිව අල්ලා ගෙන වින් කාරයේ පිටු පස දොර හැර මා පරිස්සමින් වාඩි කරවී ය. ඔහු ත් පසු පස අසුනට ම වින් මගේ ගෙල වටා අත දමා ගත්තේ ය. කාරය පණ ගැන්විණ. විශ්ව සිහින් ගී පදයක් මුමුණන්නට පටන් ගත්තේ ය.

නිල් නෙළුම් නිදා වැටේ
මානෙල් මල් පිපී...
ලස්සනයි පුරා හඳේ....
රැස් විහිදිලා....
මල් විසිරිලා අගේ....
තාරකා සිරී....
ලස්සනයි පුරා හඳේ....
රැස් විහිදිලා....

මගේ මෘත දේහය රැගෙන යන ගිලන් රථයක් මෙන් කාරය හෙමි හෙමින් අපේ නිවස කරා ළඟා වි ය.

ටික වේලාවකින් අපි දෙදෙනා ඉස්තෝප්පුවට පැමිණියෙමු. මම පාරට මුහුණ ලා විශ්ව ත් සමඟ ඉස්තෝප්පු පඩියේ වාඩි ගතිමි. මා එසේ කළේ මගේ නිතඹ ඔහුගේ ශරීරයේ ගැවී නොගැවී යන හුරතල් ඉරියව්වකිනි.

'ඔයාට තේ එකක් ගේන්නද...?'

'එපා.... රස්නෙයි...'

මම ඔහුගේ ප්‍රකාශය, ප්‍රතික්ෂේපය, ගණන් නොගෙන ඔහුගේ බාහුවට හිස එබීමි.

'ගෙදර කුල් නම් නෑ. තාත්තා ගෙදර තිබ්බ ෆ්‍රිජ් එකත් කඩේට ගෙනියලා...'

මම ඔහුගේ අත සෙමින් අල්ලා ගනිමින් කීවෙමි.

'විශ්ව ඔයා දන්නවාද ආදරේ වැඩිපුරම දැනෙන්නේ කොහොම දෙන්නෙකුටද කියලා...?'



'ඔයාටයි.... මටයි වගේ දෙන්නෙකුටද...?'

'එහෙමත් හරි.... මෙහෙම වුණොත්...? එක්කෙනෙකුගේ හැඟීම් සීතල වෙලා.... තව කෙනෙකුගේ හැඟීම් උණුසුම් වුණාම...'

'ඔයා තවම උණුසුම්ද...?'

විශ්ව මගේ මුහුණ බලා ඇසුවේ ය.

'මං කැමති මං සීතල වෙලා, ඔයා උණුසුම් වෙනවට...'

මම මගේ පැහිච්ච දැනුවත් අත්දැකීම් ඔහුට කියා දුනිමි. සත්තකින් ම මා ඔහුට උගන්වමින් සිටියේ දුල්ලැව මට කියා දුන් බොහෝ දේ අතර තිබූ ප්‍රාථමික කරුණු ය.

අම්මා බ්‍රොයිලර් කුකුළකු එල්ලා ගෙන මිදුලේ කෙළවරින් මතු වී ආවා ය. ඇය කඩේට ගොස් මේ පැමිණෙන්නේ හෝරාවක් පමණ පමා වි ය. කටුගස්තොට හන්දියේ තාත්තාගේ ප්‍රාග්ධනයට ත්, අම්මාගේ පුරසාරමට ත් අලුත් මාතෘකා කීපයක් ම ඇති නිසා අම්මා පමා වන්නට ඇත. බ්‍රොයිලර් කුකුළා වඩාත් ප්‍රදර්ශනාත්මක ස්වරූපයකින් රැගෙන අම්මා අප සමීපයට ආවා ය.

'දැන් තියෙන කුකුල් මස් සත පහකට වැඩක් නෑ.... පස් වගේ...'

අම්මා එසේ කියා බ්‍රොයිලර් කුකුළා බැගය පිටින් ම උස්සා විශ්වගේ මුහුණ ඉදිරියට දමා පෙන්නුවා ය.

'ඩ්‍රයිවර් නුවරට යැව්ව නම් හොඳ කුකුළෙක් ගේන්න ගන්න තිබුණා...'

මම අම්මාගේ ක්‍රියාව අහවර කිරීමට ත්, ඇගේ කතස්සල්ල දුරු කිරීමට ත්, විශ්ව පත් වූ අපහසුතාවෙන් ඔහු මුදා ගැනීමට ත් එක ම පිළිතුරක් දුනිමි.

'තාත්තා කඩේට නරක දේවල් ගේන්නේ නෑ...'

යැයි කියා ගෙන ම ඇය අප පසු කළා ය. අම්මාගේ මුහුණේ ආඩම්බරය මිශ්‍ර උද්දාමයක් තිබිණ. ඇය අප පසු කොට ගිය පසු මම නිස්කලංකය සොයන මත් මුවදෙනක් මෙන් ඇහැ එහෙ මෙහෙ යැව්මි.

අනාරාධිත ගිරවෙකු ගෙඩි නැති ජම්බු ගසකට වී හොට පිරි මදිමින් සිටියේ ය. මම ටික වේලාවක් ගිරවා දෙස බලා සිටියෙමි. තද

කොළ පාටකින් යුතු පරණ ජම්බු කොළ ත් අලුත් තඹ පාට ජම්බු දළු ත් අතර ගිරා පෝතකයා අත්තෙන් අත්තට පනිමින් හරත නැටුමක් මෙන් හිස පමණක් ගෙලට ඉහළින් හරව හරවා එහෙ මෙහෙ බලයි. අපගේ දහවල් ආහාරය සඳහා පොල් ගාන, ලිප මොළවන, සිටිපුම් අරින, සාස්පාන් එහෙ මෙහෙ කරන, කුස්සියේ සැරිසරන අම්මාගේ කඩිසර බවේ හඬවල් එකිනෙක ඒකාත්මික බවක් නොමැතිව ඈත ඇහේ. අම්මාට උදව් කිරීමට කුස්සියට යා යුතු වුව ත් විශ්ව තනි කොට මෙ තනින් නැගී සිටීමට මට සිත් නොදේ. අවසානයට මට ඇසුණේ සරාස් ගා ඉඳුල් වතුර කොරහක් පිළිකන්න පැත්තෙන් රම්පෙ ගහ මුලට ගලා හැළෙන හඬ යි.

මගේ ශරීරය මතුපිට දහදිය මිදි තැන තැන පහළ වී ඇත. කොහොමටත් මට මගේ ශරීරය ඉක්මනින් පිරිසිදු කොට ගැනීමට ඕනෑ වී තිබේ. නෑවුම් දිය ටිකක් හා සීතල වීමට ත්, දහදිය සිදුරු විවර කොට අලුතින් පරිසරයේ ඇති දේ ශරීරයට උකහා ගැනීමට ත් මට ආශාවක් ඕතිණි.

'විශ්ව අපි දෙන්නා නාන්න යමුද...?'

'ඔලිඳ ඇළට යනවා නම් මාත් එනවා...'

'යමු...'

දුහුවිලි නැංවා ගෙන මිදුලට පිවිසි දුල්ලෑවගේ කාරය සෙවණක් බලා නතර වි ය. නැති ගත්තා ම නොව මම සියුම් සසල වීමකින් බලා සිටියෙමි. ජම්බු අත්තක තනිපංගලමේ සිටි ගිරවා පියාඹා ගියේ ය. දුල්ලෑව ගුරුළු වෙසින් බෙන්ස් රථයෙන් බැස්සේ ය. උකුසු ඇසින් අප දෙස බැලුවේ ය. මම තරමක් නැති ගතිමි. සියල්ල අනපේක්ෂිත ම නොවේ. එහෙත් අනාරාධිත ය.

'ඉතිං... ඔන්න අපිත් ආවා...'

දුල්ලෑව ඉස්තෝප්පුවට පය තබමින් කීවේ ය. විශ්ව ඔහු දෙස නොබලා ම නැගී සිටියේ ය. මම ද ඔහුගේ සුරතට බර වී නැගී සිටියෙමි. විශ්ව කාමරයට යෑමට මට පිටු පා හැරුණේ ය. ඔහු දෙස මොහොතක් බැලූ මම එසේ බලමින් ම හිස දුල්ලෑව දෙසට හැරවීමි. පයක් ඉදිරියට නොතබා ම දුල්ලෑව බලා සිටියේ ය. මම ඔහු පිළිගැනීමට පියවර කීපයක් ඉදිරියට තැබීමි.



'ඉතිං ... කොහොමද...?'

දුල්ලෑව සුරත මදෙසට දිගු කරමින් කීවේ ය. පිළිතුරු නොදුන් මම හිස තරමක් ඇල කොට ඔහුට මගේ සැහැල්ලුව ප්‍රකාශ කළෙමි. ඒ විට ත් ඔහු මගේ අතින් දැඩිව අල්ලා ගෙන අවසන් ය.

'කෝ ඉසිවර...?'

'තාත්තත් එක්ක උදේ ඉඳල කඩේට වෙලා ඉන්නවා...'

'ඒක හොඳයි.... එතම සියා කෙනෙක්නේ ඉනනෙ...'

අපි දෙදෙනා ම ඉස්තෝප්පුවට වීමු. විශ්ව කලබලයකින් තොරව හෙමින් ඉස්සරහ කාමරයේ දොර වසා ගත්තේ ය. ඔහු එසේ කළේ අපට ඉඩ දෙන්න ද? නැත්නම් ඔහුට තනිව විඳවන්නට දැයි මම නොදනිමි.

'මම ආවෙ ඔයාට කරදරයක් වෙන්න නෙමෙයි නේත්‍රා. පරක්කු නිසා එක්ක යන්න. පාලුයි. ඔයා නැතුව ගෙදර ඉන්න අමාරුයි...'

දුල්ලෑව මගේ දෑසට එබෙමින් කීවේ ය.

'අපි අදම කොළඹ යමුද නේත්‍රා...?'

දුල්ලෑව ඉල්ලීමක් කළේ ය. එහෙත් මට කොළඹ යෑමට පෙර ඔහුට කියන්නට බොහෝ දේ තිබේ. මම මගේ සිතුවිලි ඔහේ තිබෙන්නට හැර සියල්ලේ ම කේන්ද්‍රීය පුවත ඔහුට කීවෙමි.

'මම යූරින් ටෙස්ට් කළා... පොසිටිව්....'

දුල්ලෑව වචනයකුදු කතා නොකර අහකට ගෙන තිබූ අතින් නැවතත් මගෙ අත තදින් අල්ලා මිරිකන්නට වි ය. මට රාජගිරියේ නිවසේ බලයක් ලැබීමට ත්, මගේ එකී බලය තහවුරු වීමට ත් දුල්ලෑවගේ ආශාවෝ ඒ දවස පාර කියා දුන් හ. මම ටික කලකින් එකී පාරේ ගමන් කරන්නට වීමි. දැනුදු ගමන් කරමින් සිටිමි.

අතීතයේ එක්තරා දිනෙක මා දුල්ලෑවට අවනත වීම වූ කලී අවිනිශ්චිත තීරණාත්මක මොහොතක මම බඳල් න්‍යායට මී පැටවකු වීමකි. මගේ ආත්ම දමනය මිථ්‍යාවක් කොට 'ගොදුරු වෙයං' යනුවෙන්

මගේ සිත ත් ශරීරය ත් ඔහු ම ඉල්ලා කෑ ගසන්නට වි ය. එහෙත් මාගේ අතීතය හෝ විශ්ව සුවපත් කොට ඔහුගේ අමරණීය බිරිඳ වීමට මා කළ සියලු කැපවීම් හෝ දුල්ලෑවට අවනත වීමේ පාපයට අවලංගු කළ හැකි ද? මම නොදනිමි.

'නේත්‍රා...'

දුල්ලෑව කොඳුරන්නට වි ය. මම නොඇසුණු, නොදැනුණු සිතින් ගතින් සිටියෙමි.

මම දිගින් දිගට ම ඔහුට පිවිසෙන්නට ඉහළ මාලයේ දොර විවර කොට තැබීමි. මම පූර්වයෙන් විඳි සියලු අවමාන, උපද්‍රව, පීඩා ආදී සියල්ලක් ම දැස පියා මුදා හැරියෙමි.

දුල්ලෑව ද මා ද කළේ එක ම ක්‍රියාවක ප්‍රතික්‍රියා දෙයාකාරයකට මුදා හැරීමකි.

එහෙත් මා එසේ නොවී සිටියා නම්.

'විශ්ව ඔක්කොම දේ දන්නවාද...?'

'ඔව්...'

මම පිළිතුරු දී ඉස්සරහ කාමරය දෙස බැලීමි. තවමත් දොර වැසූ ගමන් ය. කිසිදු හැලහොල්මනක් නැත.

'මං ඕන තරම් ගෑණු ආශ්‍රය කරලා තියෙනවා. උන්ට මං වගේ පිරිමියෙක් දවා අළු කරන්න බෑ. ඒත් මං වගේ පුරසාරම් දොඩන පිරිමියෙක් ඔයා ඉස්සරහා මොන තරම් අසරණද...?'

'මට ඔය එකක්වත් වැඩක් නෑ...'

'හරි හරි... ඔයාට නෙමෙයි.... ඔයා ඕන මට...'

එ සැණින් මම නැඟී සිටියෙමි. දුල්ලෑවගේ පැමිණීම කුස්සියේ සිටි අම්මාට සැල කළෙමි. සාලයට වත් කාමරයට වත් නොගොස් කුස්සියට වී කාලය මැරුවෙමි. මට විශ්වට මෙන් ම දුල්ලෑවට ද වෙන් වෙන්ව මුහුණ දීමට පුළුවන. එහෙත් දෙදෙනා ම එක්වූ විට මා ඔවුන්ට මුහුණ දෙන්නේ කෙසේ ද....?



වලිගය කැඩුණු හූනෙක් පියාපත් සිඳුණු මෙරුවෙකු ඩැහැ ගත්තේ ය. අපහසුවෙන් මුත් මෙරුවා තුළ රුවා ගත් හූනා, එකදු මස් කැබැල්ලක් වත් බිම නොවැටෙන්නට ළපටි මෙරුවා උගුරට දමා ගත්තේ ය. හූනාගේ ගෙල මහත් වී තිබිණ. මෙරුවාගේ පියාපත් බිම වැටී තිබිණ. හූනා අහිංසක වණ්ඩියෙකි.

'එහෙනම් යමු.'

අනාරාධිත දුල්ලෑව, බලහත්කාර නඩේ ගුරා විය. මම එකඟ වීමි. විශ්ව කීකරු වී සිටියේ ය.

අම්මා ත්, තාත්තා ත් තරගයට මෙන් ඉසිවරට නොතකු වැස්සකුත් දෙන්නට වූ හ. උණුසුම් සිප ගැනීම්වලින් ඉසිවර හෙම්බත්ව රතු වි ය. ආශිර්වාද බහුල ය. තෑගි ද, කෑම ද කාරයේ ඩිකිය පහත් කළේ ය. උද්දාමයේ හරසර වදන් අපට බොහෝ වේලා අසා සිටින්නට සිදු වි ය. දුල්ලෑවගේ බෙන්ස් රථයට වට වූ අම්මා ත්, තාත්තා ත් ප්‍රාර්ථනා සුභාශිංසනවලින් අප ත් රථය ත් නහවන්නට වූ හ.

'යමු'

නඩේ ගුරා අණ කරමින් ම රථය පණ ගැන්වී ය. මම ඉදිරි අසුනේ ඉසිවර සමඟ වාඩි වීමි. විශ්ව පසු පස අසුනට බර වි ය. මම පැති කණ්නාඩියෙන් ඔහුගේ මුහුණ බැලීමි. සිනා මුසු තාරුණ්‍යය පිරි ඔහුගේ මුහුණේ කොහේ දෝ කළු වලාවක් තිබේ. කඳුළක් නැති ඇහි පිල්ලම බිමට බර වි ය.

'ඔයාට ඔතන අපහසු නම් ඉස්සරහට එන්න විශ්ව.'

මම නොරත රතු යා කරන අට්යෙන් කීවෙමි.

'තනියම හොඳයි.'

'මං පිටිපස්සට එන්නද?'

'තනියක් නෑ. ඔයා ඉස්සරහ ඉන්නවනේ.'

කිසිවෙකුට කිසිවක් රහසක් නොවූව ද, යටි සිත එකිනෙකාගෙන් සඟවා ගත් අපි වැර වෑයමකින් තොරව ගමන් ආරම්භ කළෙමු. විශ්වගේ කාරය ගෙන අපටත් පෙර රියදුරා කොළඹ බලා පියෑඹුවේ ය. කටුගස්තොට ගෙදර ඉස්තෝප්පු බිත්තියේ සිටි හූනා කුස පිරී එහෙ මෙහෙ සැරි සරනවා වන්නට පුළුවන.

For E-Pothakalaya

වෛජයන්ත ප්‍රාසාදය තරම් ඉසුරු පිරි තේජවන්ත බෙන්ස් ගුරුළා කඩුගන්නාව මහ වංගුව පසු කළේ ය. ගමන ගම්භීර ය. තේජවන්ත ය.

'අන්න මං මැරිච්ච තැන'

විශ්ව හිටි අඩියේ ම කතා කළේ ය. මම ත් දුල්ලෑව ත් එකිනෙකාගේ මුහුණු බලා ගතිමු.

කඩුගන්නාව පල්ලමේ දී අන්නාසි ද, ජම්නාරං ද, අලිගැටපේර ද, සිදුරං, ජම්බෝල විකුණන පෙට්ටි කඩ බොහෝ ය. දුල්ලෑව රිය නවතා විගසින් ගොස් දුම් දමමින් තැම්බෙමින් තිබූ කිරි ඉරිඟු කරලක් ගෙන සකසුරුවමට ඇටය ඇටය බුදින්නට වි ය. ඔහු විශාල ජම්බෝල ගෙඩියක් පොත්ත නොගලවා විශ්ව ඉන්නා පසු පසු ආසනයට දැම්මේ ය. ඉසිවර සිරි නරඹමින් සිටී. මම දික් හැඩැති අලිගැටපේර ගෙඩි කීපයක් මිල දී ගතිමි. අපි කාරයට නගින විටත් විශ්ව ජම්බෝල ගෙඩියේ පොත්ත ඉවත් කිරීමට නියපොතු ආයුධයක් කොට ගෙන හුන්නේ ය.

'ඕක දැන් කන්න ඕන නම් සුද්ද කරලම ගේන්න තිබුණනේ.'

මම කීවෙමි.

'කමක් නෑ. තනිවම සුද්ද කර ගන්නදෙන්. කොළඹට යනකල් කරන්න දේකුත් එපායැ.'

දුල්ලෑව නැවත රිය පණ ගන්වමින් කීවේ ය.

'පව්.'

මම දුල්ලෑවට පමණක් ඇසෙන්නට කීවෙමි.

අපි අඹේපුස්සේ දී තේ බීවෙමු. ඒ වන විට ජම්බෝල ගෙඩියේ කොටසක් ඔහු සුද්ද කොට ගෙන තිබිණ. මේ ජම්බෝල හටන නිසා විශ්ව කාරයෙන් බැස්සේ නැත. ඉසිවර බෙන්ස් රථයේ වෙල්වට් සීට් උඩ වූ දමා තිබිණ. මම ත්, දුල්ලෑව ත් දෙවතාවක දී අවන් හලට ඇතුළු වීමු. තේ බීවේ අප දෙදෙනා පමණි. විශ්ව නැති ඉසව්වේ අපි දෙදෙනා විනාඩි කීපයක් හුදෙකලාව තේ බොමින් කතා කළෙමු.

'ගෙදර ගිහිල්ලා පිළිවෙළක් වෙනකල් එයාගේ හිත රිදෙන විදිහට හැසිරෙන්න එපා.'



කාරයට නගින්නට පෙර මම් දුල්ලෑවගෙන් ඉල්ලීමක් කළෙමි. ඔහු මගේ ඉල්ලීමට ප්‍රතිචාර දැක්වූවේ මහ පාරේ දී ම මගේ නිතඹට තට්ටුවක් දමමිනි. පුදුම විය යුතු නැත. මම දැන් ඒ නාකි මනමාළකමට කැමැති වී සිටිමි. ප්‍රසිද්ධියේ කිව නොහැකි ගුප්ත සුවයක් මම ඔහුගෙන් ලබමින් සිටින්නෙමි. මට මෙන් ම ඔහුට ද ඉක්මනින් රාජගිරියේ නිවසට යෑමට අමුතු හදිස්සියක් දැනී තිබේ.

කජුගමට එන තෙක් ම මම ඒ අමුතු හදිස්සියේ ගැලී මානසික අධි පීඩනයකට හසු වී සිටියෙමි. කජු ගමේ කජු කෙල්ලෝ නුවර පාරේ යනෙන රථ වාහනවලට නොපැන පනිති. එකිනෙකා ළඟ රථය නවතන්නට මෙන් වේගය අඩු කළ දුල්ලෑව ඊ ළඟ අංගනාව ළඟට ද ගොස් එය ම කළේ ය.

'ඇයි?'

මම පිබිදුණු විමතියෙන් ඇසීමි.

'ඉස්සර තරං දැන් කජු කෙල්ලො ලස්සන නෑ.'

ඔහු ඊ ළඟ වෙළෙන්දිය ළඟ රථය නතර කළේ ය. සත්නකින් ම ඔවුහු ඩුබායි මෝස්තර දමා සිටියෝ ය.

'ඔයාටත් ඕනද?'

මම විශ්ව දෙසට හැරෙමින් ඇසුවෙමි.

'සුද්ද කරපුවාද?'

විශ්ව අහිංසක ලෙස තෙපළේ ය. ඔහු ජම්බෝල ගෙඩිය සමඟ හෙට්ටු වී නොහෙට්ටු වී සිටියේ ය.

විශ්වගේ නොහෙට්ටුව ත්, ඉසිවරගේ නින්ද ත්, අපේ අමුතු හැඟීමු ත් සමඟ රෑ බෝ වන්නට පෙර අපි රාජගිරියේ ගෙදරට පිවිසියෙමු.

For E-Pusthakalaya

# 30

මහා පිපිරුම ආසන්නයට වෙඩි බෙහෙත් නූල් රැගෙන යන සෙබළ මුළුවක් මෙන් අපි නිවසට ගොඩ වීමු. සරල රේඛාවක් තරම් සුන්දර සිහින් ඉරකට පැවති ගමන් මග සංකීර්ණ අගාධයක් අභියස නතර වී තිබිණ. මම විශ්වගේ බෑගය ගෙන ඔහුගේ කාමරයට ගොස් එය ලෙහා අස්පස් කළෙමි.

'අස්පස් කළාට ආයෙත් බෑග් එකට දාන්න වෙයි.'

ටික වේලාවක් මදෙස බලා සිටි විශ්ව කීවේ ය. මම 'ඇයි' යැයි ප්‍රශ්න නොකර ඔහුගේ මුහුණට, ඇස්වලට එබුණෙමි.

'මට ඔයත් එක්ක තනියම නුවර ඉඳල කොළඹ එන්න ඕන'

විශ්ව කනස්සල්ලෙන් කීවේ ය. ඔහුගේ නියපොතු අසළ ඇඟිලි තුඩු රතු වී තිබිණ. වධ දීමකට හසු වූ වරදකරුවෙකුගේ මෙන් ඔහුගේ මුහුණ මුස්පේන්තු වී තිබිණ. පුළුටු වී තිබිණ. පුපුරා හැලෙන්නට ආසන්න බැලූනයක් මෙන් මුහුණ පිම්බී තිබිණ. මම ඔහුව සැනසුවෙමි.

'නිකං විකාර නොකර ඇඟ සෝදගෙන ඇඳුම් මාරු කර ගන්න. එක පාරක් තනියම නුවර ඉඳල ඇවිල්ල කර ගත්ත හරිය මදිවට. දැන් තියන දෙයක් කාල නිදාගන්න.'

මම ඔහුට අණ කළෙමි. එසේ කළේ විශ්ව පාලනය කර ගැනීම, මහා පිපිරුම වළක්වා ගැනීමේ එක ම උපාය මාර්ගය වූ බැවිනි. ඉතින් මා එසේ නොකර කුමක් කරන්න ද? අවැසි විටෙක මිස හැම විට ම ඔහු හුරතල් කරන්නට ගිය හොත් මේ හවුල් කැම කළ නොහැකි වනු ඇත. මම මායාකාරියක වී සිටියෙමි. ඉන්ද්‍රජාලියක මලයාලම් ගැහැණියක මෙන් ආරූඪ වී සිටියෙමි. මට විශ්වගේ මව සිහිපත් වේ.



ඈ හැම විට ම මට බැණ වැදුණේ '....උඹ මායාකාරියක්. අපේ පවුල නැති කරන්න ආව ගැහැණියෙක්' යනුවෙනි. ඇය කිවේ සත්‍යයක් ද සිතෙන තරමට ම මම මායාකාරී වී සිටිමි.

'ඔයා එක එක විදියයි නේත්‍රා.... නුවරදී කිබ්බ ආදරේ නැතිවෙලා. මේ ගෙදර මුසලයි...'

විශ්ව කනස්සල්ලට හේතු දක්වමින් කීවේ ය. මම කල්පනාකාරී වීමි. ඔහුට ටිකෙන් ටික අප මුහුණ දිය යුතු යථාර්ථය පෙන්වා දිය යුතු ය. සත්තකින් ම මා ඔහුට ආදරේ නැතුවා නොවේ. එහෙත් දෙදෙනෙකුට එකවර ආදරය පෙන්වන්නේ කෙසේ ද? මම පරෙස්සම්කාරී පිළිතුරක් දුනිමි.

'එහෙම නැතුව බැහේ විශ්ව. කොච්චර වැඩ තියෙනවද? ඔයාවම හුරතල් කර කර ඉඳල බැහේ. පුතා ගැන බලන්න ඕන. ඉපදෙන්න ඉන්න දරුව ගැන හිතන්න ඕනි. කුස්සියේ දේවල් බලන්න ඕන.'

මම සූක්ෂ්ම පිළිතුරක් දුනිමි. දෙවියනි, සත්තකින් ම මා ඒ කිවේ සත්‍යයක් ම නොවේ. මම විශ්ව සමඟ දැවටෙන්නට, ඔහුව ම හුරතල් කරන්නට, ඔහුගේ ම අඩුපාඩු බලන්නට කැමැත්තෙන් සිටිමි. මා ඔහුගේ ම බිරිඳ ය. ඔහුගේ ම පෙම්වතිය ය. මා උරුම ඔහුට ම ය. ඔහු උරුම මට ම ය. එහෙත් ඒ මායාමය සිහිනය විසිරී ගොස් බොහෝ කල් ය.

පුපුරා යන්නට ආසන්නව තිබූ විශ්වගේ හැඟීම් ගබඩාව ඉතා ම භාවාතිශය ලෙසින් දෙදරා ගියේ ය. ඔහු 'අනේ මගේ අම්මේ' යැයි කියමින් හඬන්නට වි ය.

මට තවමත් දරා ගත නොහැකි ඔහුගේ හෘද සංවේදී භාවයන් ගණනකට නොගත් සෙයියාවකින් මම ඔහුව මැඩ පැවැත්වීමි.

'බොරුවට් අඬන්න එපා... මේ ගෙදර පුංචි එවුන් නැතුවා වාගේ. දැන් නිදාගන්න.'

මම එසේ අණ කොට කාමරයෙන් නික්මීමට සැරසුණෙමි. දුල්ලැව ඇත සිට මට හඬ ගසනු ඇසේ.

'නේත්‍රා..'

'දැන් ඉතින් දොර හොඳට වහගෙන නිදා ගන්න.'

යැයි කියා මම කාමරයෙන් නික්මුණෙමි.

දූල්ලෑව පිජාමා ඇඳුමෙන් සැරසී සාලයට වී කම්මුල් අත ගාමින් සිටියේ ය. ඔහු වෙනින් අලුත් සැලුන් සුවඳක් දැනේ.

ඔය මනුස්සය කරදර කරනව නම් තව ජම්බෝල ගෙඩියක් දෙන්න සූද්දු කරකර ඉන්න.

ඔහු ඔව්වමට කියා මා දෙසට ඉඟි මැරුවේ ය.

'මොනව කළත් කමක් නෑ. ඕනෑ නැති විදිහට ඒ මනුස්සයට හිරිහැර කරන්න එපා.'

මම එසේ කියමින් ම දූල්ලෑව වෙතට ගමන් කළෙමි.

පුර හද නැවතත් පැහැසර වන්නට අර අඳියි. මම ජනෙල් කවුළුවෙන් පරිසරයට අත පොවමි. සීතල පරිසරය මා මෙන් ම සීතල ය. ඔහේ පාවෙන සරත් කාලයේ කෙඳි වලාකුළක් දෙස මම බලා සිටිමි. කම්මැලි ගමනක යෙදෙන වලාකුළ බලා සිටියදී ම නෙක නෙක හැඩ ගනී. අඳුරු මේඝ වලාවකට තරම් කෙඳි වලාකුළකට බරක් දැනෙන්නේ නැත. සැහැල්ලු ය.

මා විශ්වගේ කාමරයෙන් නික්මුණේ ඔහුව ආදරයෙන් සිප ගැනීමෙන් අනතුරුව යි. මගේ කෙස් රොද අතර ඇඟිලි පිරි මැද ඔහු මට සමු දුන්නේ ය.

'ඔයාගේ ඇඟිලිවල සීතල.'

මම කීවෙමි.

'ඔව් සීතලයි.'

විශ්ව පිළිවදන් දුන්නේ ය. මම ඔහුගේ කාමරය වසා දොර අගුලු ලෑවෙමි. ඊට පෙර ඔහුට රාත්‍රිය සඳහා අවැසි සියල්ල කාමරයට ගෙන ගොස් සූදානම් කොට තැබීම මම පුරුද්දක් කොට ගෙන සිටිමි. උණුවතුර බෝතලය, අවශ්‍ය වුව හොත් ගැනීමට පැනඩෝල් පෙති කීපයක් ආදිය ඒ අතර වෙයි. කෝපි කුඩු ද, සීනි ද වෙන ම ප්ලාස්ටික් බෝතල කීපයක තබා එන්නේ ඔහුට අවශ්‍ය නම් රාත්‍රියට කෝපි එකක් සාදා ගෙන බොන්නට ය.

'ඔක්කොම හරිනේ... මම යන්නම්'

මම විශ්වට කීවෙමි. ඔහු දුකින් ද නොවන සතුටකින් ද නොවන සැහැල්ලු සරල මතුපිට හැඟීමකින් මට සමු දෙයි.



'ගුඩ් නයිට් නේත්‍රා... උදේම හමුවෙමු.'

අසම්මත පෙම්වතකුගෙන් සමු ගන්නවාක් මෙන් මම විශ්වගෙන් සමු ගනිමි. බොහෝ විට රාත්‍රී මා මගේ කාමරයට යන විට ඉසිවර නින්ද ත් නොනින්ද ත් අතර යහනේ එහෙ මෙහෙ පෙරළෙමින් සිටී. මා දුටු සැණින් ඔහු නොනිදා සිටීම නිසා මා ඔහුට බණිතැ යි බියෙන් දෑස තදින් වසා ගනියි.

'ඉසිවර.... හොඳ පුතානේ නිදා ගන්න. අම්මට තව ගොඩක් වැඩ තියෙනව ඉවර කරන්න.'

මම ඔහුට ඇසෙන නොඇසෙන හඬින් එසේ කියා කාමරය අස්පස් කරමි. රෙදිපිළි පිළිවෙළකට නවා තබමි. තැන තැන තිබෙන ඔහුගේ සෙල්ලම් බඩු රාක්කයේ අසුරමි. දුහුවිලි බිඳක් නොනැඟෙන්නට කාමරය නැවත අමදිමි. දූල්ලෑව ඒ වන විටත් කාමරය ඉදිරියේ සක්මන් කරන බව මම දනිමි.

මා මේ කියන්නට තතනන්නේ නේත්‍රා වන මාගේ වර්තමාන දිවි පැවැත්මේ අංශුවකි. තව ස්වල්ප මොහොතකින් අඳුරු රාත්‍රියේ මම දූල්ලෑව සමඟ සුපුරුදු පරිදි ම එකතු වෙමි. දහවල විශ්ව සමඟ එකට සිටිමි. මට දැන් මේ ජීවිතය පිළිබඳ පිළිකුලක් දැනෙන්නේ නැත. මාගේ සංස්කෘතිය ද ඔවුන්ගේ සංස්කෘතිය ද නොදත් අමුරු පැවැත්මකට :පි හුරු වී සිටිමු.

අද දින වන විට නුවර සිට අප රාජගිරියේ නිවසට පැමිණ මාසයකට ආසන්න කාලයක් ගෙවී තිබිණ. මේ මාසය ගෙවී යමින් පවතින මේ මොහොතේ මගේ කතාව කෙළවර විය හැක්කේ කෙසේ දැයි දැන් මට සිතේ. මේ මාසය ඉක්ම යන තුරු ද මම මගේ ජීවිතය සහ අනාගතය පිළිබඳ යම් අවිනිශ්චිත සිතුවිලි දාමයක සිර වී සිටියෙමි.

මේ කතාව කිසි යම් සතුටුදායක පරිසමාප්තියකින් අහවර වෙතැ යි කිසිවෙකු සිතන්නට ඇත. විශ්ව සමඟ ප්‍රේමයෙන් වෙළුණු මුල් කාලයේ මම ද එසේ සිතුවෙමි. විශ්ව සහ දූල්ලෑව අතර ගැටුමෙන් මා මිය යා හැකි යැයි ද සිතුවිල්ලක් කලෙක මා තුළ වී ය. ඉසිවර පිළිබඳව ද මෙ වැනි ම බියක් කලෙක මගේ සිතේ හොල්මන් කළේ ය. තාත්තා ත් පුතා ත් අතර වෛරය මෝරා වැඩී ඔවුන් දෙදෙනා මරා ගනිතැ යි ද මා නොසිතුවා ම නොවේ. එහෙත් දූල්ලෑව හා විශ්ව එකිනෙකා හා කතාබහ නොකළත් දැන් ඔවුන් යම් එකඟතාවකට පැමිණි සෙයකි.

For E-Pusthakalaya

මම ඇතැම් විටෙක දහවල විශ්වට බත [illegible] හාතේ ම [illegible] ම ඔවුහු රාත්‍රියට දුල්ලැවට බත් බෙදා දෙමි. රස බොජුන් ඉදුල වළඳිති.

දුල්ලැව් මෙන් ම විශ්ව ද ඉසිවරට 'පුතා' යැයි අමතය්. [illegible] ස් බිහි වෙන්නට සිටින දරුවාට ද පියවරු දෙදෙනකු හිමි වෙතැ දැන් උපකල්පනය කොට සිටිමි.

නේත්‍රා වන මා දැන් එහෙම ය. එය මේ කාලයේ නේත්‍රාලා වන අපේ පැවැත්මේ හැටි ය.

සැනසීමක් පෙනෙන තෙක් මානයක නැත. ඒ නිසා ම පිළුණු ජීවිතය මම රස මසවුලක් කොට ගතිමි. පවිත්‍ර බිරිඳක, පෙම්වතියක වීමේ සිහිනය වර්තමානයේ දී බොළඳ පුරාවෘත්තයක් වෙමින් තිබේ. මම පවිත්‍ර කන්‍යාවියක මෙන් දෙදෙනාට ම පෙම් කරමි.

දැන් සඳ හොඳට ම මෝදු වී අවසන් ය. හෙට උදේ පෙර දා මෙන් ම හිරු පිබිදෙනවා ඇත. මම කවුළු සියල්ල වසා දැමීමි. කොට්ටයක් කකුලකට හිර කර ගත් ඉසිවර සෙල්ලම් කාරයක් තුරුලු කොට තද නින්දේ පසු වෙයි.

'නේත්‍රා..'

දුල්ලැව් නොඉවසිලිමත් ලෙස දොර කවුළුව ළඟට විත් කොඳුරයි. මම රාත්‍රී දුහුල් ඇඳුම ලා ගෙන කඩි මුඩියේ කාමරයෙන් නික්මුණෙමි. අපි දෙදෙනා ම හඬ නොනැගෙන්නට තරප්පුව බැස පහළ කාමරයට පිවිසුණෙමු. මගේ දින චරියාවේ සුපුරුදු අංගයක් මෙන් මම හෝරා කීපයක් දොර අගුලු වසා සිර කළ දුල්ලැවගේ මහලු කාමරයේ ගත කළෙමි. මැදියම් රැයේ ඔහුගේ තළල සිප ඉහළ මාලයට පිවිසියෙමි. දැන් මට ඉසිවර සමඟ මව් සෙනෙහසින් හිමිදිරිය වන තෙක් තුරුලුව නිදන්නට හැකි ය. හෙට උදේ හිරු ස්ථිරව ම පායනවා ඇත.

කොහොමටත් මට යහනට වැටුණු සැණින් නින්ද යන්නේ නැත. ස්වාභාවික වූ කිසිවක් නැතැ යි මම දැන් සිතා සිටිමි. ස්වාභාවික නින්ද පවා දැන් සැකයකි. චමත්කාරයක් – සැහැල්ලුවක් – විචිත්‍ර වූ යමක් මගේ නෙත් මානයේ – දෑස මායිමේ හඳු වන්නේ නැත.

ඉසිවර තවත් තුරුලු කොට ගත් මම ඔහුගේ තළල [illegible] සිප ගතිමි.

For E-Pusthakalaya

අනේ මගේ දරු...

වැනි සියුම් සිතුවිල්ලක් මගේ හද පෙළන්නට වි ය. තරමක් කුස ඉදිරියට නෙරා ඒම නිසා මට දැන් එක ඉරියව්වකින් නිදන්නට බැරි ය. දහදිය පෙරෙන සිරුර සිසිල් කර ගැනීමට මම පොරෝනය ඉවත් කළෙමි.

ජීවිතය එහෙම ය. එහෙත් මේ මා බලාපොරොත්තු වූ ජීවිතය නොවේ. දිය ඇල්ලකින් පහළට ඇද වැටී සමුද්‍රකට වැටුණාක් මෙන් මම පාවෙමින් සිටිමි. ඇද වැටීමේ දී වූ අනේක තුවාල තවමත් මා රිදවයි. මම ඒවා විඳවමි. මට ඕනෑකම තිබුණේ පාවෙන්නට නොව යාත්‍රා කරන්නට ය. එහෙත් දිය සුළි මගේ ජීවිතය ඔවුනට අවැසි ඉසව්වකට පා කර හරිමින් තිබේ. දැන් ඉතින් කිසි විටෙක මට යාත්‍රා කළ නොහැකි ය.

හිරු නැගෙන්නට අර අඳින ප්‍රභාතයේ ම මම අවදි වීමි. පවිත්‍ර සිරි යහනකින් පිබිදීමට ඒ දවස් මම පෙරුම් පුරමින් සිටියෙමි. අදත් මගේ හද ගැබේ කෙළවරක එකී පවිත්‍ර ප්‍රේම උන්මාදය නැතුවා නොවේ. යෞවන පෙම්වතියක මෙන් පෙම් බස් දොඩමින් මුමුණන්නට මගේ හිතට අවැසි නැතුවා නොවේ. එහෙත් මම දැන් පිරිමින් දෙදෙනෙකුට ...රිඳ වී පිරිමියෙක් නැති යහනකින් උදේට අවදි වෙමි. ඔවුහු මට දරු ...දෙනෙකු උරුම කොට දී තිබේ. එකී බර මම සිතින් ද කයින් ද විඳවමි.

අසීරුවෙන් බිමට හෙළූ මම ඉසිවර යහනින් නොවැටෙන්නට දේ ලෙ...ක් තබා කාමරයෙන් නික්මුණෙමි.

... කියා ...

මුලින් ම ... ලැවගේ කා... ටෙ ගොස් උදේ කෑම සකස් කිරීමට අවැසි කෝප්පය ටීපෝව මත ... තුනක් සාදා එය බන්දේසිය මත තැබිමි.

...යට ගොස් ඔහු අවදි කොට ඔහුගේ තේ

ගුඩ් මෝනින් නේත්‍රා...

ගුඩ් මෝනින්...

මම පිළිතුරු දුනිමි.

මට අද දවල් කෑම එවන්න එපා. ...න් එකේ කොන්ෆරන්ස් එකක් තියෙනවා. සමහර විට එන්න රෑ වෙයි. ටෙලිෆෝන් කෝල්ස් ආවොත් මගේ සෙල් එකට කතා කරන්න කියන්න. ඔය ලා නිල්පාට ෂර්ට් එකත් එක්ක තද නිල් බතික් ටයි එක අයන් කරන්න. පියත්

යවන්න...

ඔහු සියල්ල කියා තේ එක උගුරු කීපයකට බී නාන කාමරයට වැදී දොර වසා ගත්තේ ය. එකී සියල්ල ඔහු කී නොකී සියල්ල කිරීමට මම දැන් බැඳී සිටිමි. මම සියල්ල නොපිරිහෙළා ඉටු කරමි.

ඉතිරි වූ තේ දෙකත් සමඟ මම විශ්වගේ කාමරයට ගියෙමි.

"ගුඩ් මෝනින් විශ්ව."

"ගුඩ් මෝනින් නේත්‍රා.."

අපි දෙදෙනා ම සුබ උදෑසනකට සුබ පතා ගතිමු.

"සීතල වෙන්න ඉස්සර තේ එක බොන්න."

මම තේ කෝප්පය ඔහු සුරතට දෙන ගමන් ම කීවෙමි. විනාඩි කීපයක් ම ඔහුත් සමඟ කාමරයට වී සිටියෙමි.

"අපි දවාලට පොලොස් ඇඹුල් හදමුද?"

විශ්ව හිටි ගමන් කීවේ ය.

"ඔයාටද දොළදුක් තියෙන්නේ මටද?"

මම ප්‍රශ්න කළෙමි. එ විට අපි දෙදෙනා ම සිනා සීමු. ප... වි ය. මහත් සති කීපයේ දී ම දවල් වරුවේ විශ්ව මගේ කාර්යයන්ට උදව් ... මුහුණ බොහෝ විට ඔහු ඉසිවර සමඟ දහවල සෙල්ලම් කරයි. එ...ගේ සහනයකි. උයන්නට පිහන්නට මට උදව් කරයි. දැන් ඉසිව... සෝදා උදේ ම ඇඳුම් අන්දන්නේ ද ඔහු ...

"තාත්තා ගියාද?"

විශ්ව අසයි.

"නෑ තව ටිකකින් යයි."

...මි.

මම කාම...යෙන් නික්මුණෙ... වර්තමානය ගෙවෙමින් පවතී

අතීතය ගෙවී ... ය.

තව ම උදා වී නැත.

ජේ. ජේ. සමන් කුමාර



පොතක්
මිල රු. 300/-
ISBN - 955-955-96478-0-6

UPUL SHANTHA SANNASGA